323 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 323 - இல. 09
Volume 323 - No. 09

2025 නොවැම්බර් 25 වන අඟහරුවාදා
2025 நவம்பர் 25, செவ்வாய்க்கிழமை
Tuesday, 25th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1737-1756]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පෙර පාසල් අධ්‍යාපනය ප්‍රමිතිකරණය කිරීම [තීරුව 1762]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම** [තීරුව 1765]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 - [පහළොස්වන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 126, 212–215, 335 (අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 1767-1939]

**රුහුණ විශ්වවිද්‍යාලය:**
වාර්ෂික වාර්තාව (2022) [තීරුව 1939]

**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය:**
වාර්ෂික වාර්තාව (2022) [තීරුව 1940]

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය:**
වාර්ෂික වාර්තාව (2022) [තීරුව 1940]

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය:**
වාර්ෂික වාර්තාව (2023) [තීරුව 1941]

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය:**
වාර්ෂික වාර්තාව (2023) [තීරුව 1941]


---

# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1737-1756]

**தனி அறிவித்தல் மூல வினா:**
முன்பள்ளிக் கல்வியைத் தரப்படுத்தல் [ப: 1762]

**மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பையினது சொந்த விளக்கம்** [ப: 1765]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பதினைந்தாம் நாள்]:**
[தலைப்புக்கள் 126, 212-215, 335 (கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி)] – குழுவில் ஆராயப்பட்டது [ப: 1767-1939]

**ருகுணு பல்கலைக்கழகம்:**
வருடாந்த அறிக்கை (2022) [ப: 1939]

**இலங்கை கிழக்குப் பல்கலைக்கழகம்:**
வருடாந்த அறிக்கை (2022) [ப: 1940]

**இலங்கை ரஜரட்ட பல்கலைக்கழகம்:**
வருடாந்த அறிக்கை (2022) [ப: 1940]

**பேராதனைப் பல்கலைக்கழகத்தின் விவசாயப் பட்டப்பின் படிப்பு நிறுவகம்:**
ஆண்டறிக்கை (2023) [ப: 1941]

**பேராதனைப் பல்கலைக்கழகம்:**
ஆண்டறிக்கை (2023) [ப: 1941]


---

# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Cols. 1737-1756]

QUESTION BY PRIVATE NOTICE:
Standardization of Preschool Education [Col. 1762]

PERSONAL EXPLANATION BY HON. M.S. UTHUMALEBBE [Col. 1765]

APPROPRIATION BILL, 2026 - [Fifteenth Allotted Day]:
Considered in Committee - [Heads 126, 212-215, 335 (Education, Higher Education and Vocational Education)] [Cols. 1767-1939]

UNIVERSITY OF RUHUNA:
Annual Report (2022) [Col. 1939]

EASTERN UNIVERSITY OF SRI LANKA:
Annual Report (2022) [Col. 1940]

RAJARATA UNIVERSITY OF SRI LANKA:
Annual Report (2022) [Col. 1940]

POSTGRADUATE INSTITUTE OF AGRICULTURE OF THE UNIVERSITY OF PERADENIYA:
Annual Report (2023) [Col. 1941]

UNIVERSITY OF PERADENIYA:
Annual Report (2023) [Col. 1941]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 25වන අඟහරුවාදා***
*2025 நவம்பர் 25, செவ்வாய்க்கிழமை*
*Tuesday, 25th November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.00 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### EPF සාමාජිකයින්ගේ දායකත්ව තොරතුරු ලබා ගැනීම: මාර්ගගත යෙදුම
### EPF உறுப்பினர்களின் பங்களிப்புகள் குறித்த தகவல்களைப் பெற்றுக்கொள்ளல்: நிகழ்நிலையூடாக அணுகுதல்
### ACCESS TO INFORMATION ON MEMBERS' CONTRIBUTIONS TO EPF: ONLINE APP

1435/2025

**1.**ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට අර්ථසාධක අරමුදලේ ශේෂය සහ දායක මුදල් ගිණුම්ගත වීම ආදී තොරතුරු මාර්ගගත ක්‍රමය ඔස්සේ දැන ගැනීමට හැකි ක්‍රමවේදයක් තිබේද;
(ii) නොඑසේ නම්, එවැනි ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;
(iii) එම ක්‍රමවේදය ආරම්භ කරනු ලබන දිනය කවරේද;
(iv) අරමුදලේ සාමාජිකයන්ට ස්වයංක්‍රීය උත්පාදන පණිවිඩ (Auto Generated Messages) යැවීමේ ක්‍රමවේදයක් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ අවධානය යොමුවී තිබේද;
(v) එසේ නම්, එලෙස අවධානය යොමුවී ඇති ක්ෂේත්‍ර කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் சேமலாப நிதிய அங்கத்தவர்களுக்கு சேமலாப நிதியத்தின் மீதி மற்றும் பங்களிப்புத் தொகையை கணக்குப் பதிவுவைத்தல் போன்ற தகவல்களை நிகழ்நிலையூடாக அறிந்துகொள்ள ஏதேனும் வழிமுறை உள்ளதா என்பதையும்;
(ii) இன்றேல், அவ்வாறானதொரு வழிமுறையை அறிமுகப்படுத்துவதற்கு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;
(iii) மேற்படி வழிமுறை ஆரம்பிக்கப்படும் திகதி யாது என்பதையும்;
(iv) சேமலாப நிதியத்தின் உறுப்பினர்களுக்குத் தானாக உருவாக்கப்பட்ட தகவல்கள் (Auto-Generated Messages) அனுப்பப்படும் வழிமுறை தொடர்பாக தொழில் திணைக்களம் கவனம் செலுத்தி உள்ளதா என்பதையும்;
(v) ஆமெனில், அவ்வாறு கவனம் செலுத்தப்பட்டுள்ள துறைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House -
(i) whether there is a method for the members of the Employees' Provident Fund to check their information online, such as their Provident Fund balance and contributions credited to their accounts;
(ii) if not, the steps that have been taken to introduce such a method;
(iii) the date on which the said method will be initiated;
(iv) whether the Department of Labour has paid its attention towards a method for sending auto-generated messages to the members of the Fund; and
(v) if so, the specific areas that are being focused on?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි සාමාජිකයකුට අන්තර්ජාල සේවාව මඟින් හෝ ජංගම දුරකථන කෙටි පණිවුඩ මඟින් සේවක අර්ථසාධක අරමුදලේ ගිණුම්වලට අදාළ තොරතුරු ලබා ගත හැකි ක්‍රමවේදයක් දැනට ක්‍රියාත්මක වෙනවා.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් පිළිබඳ තොරතුරු සාමාජිකයා වෙත ලබා දීමේදී, ඒ අරමුදලේ මුදල් කළමනාකරණය කරනු ලබන ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සාමාජිකයින්ට ස්වයංක්‍රීය උත්පාදන පණිවුඩ - auto-generated messages - යැවීම සඳහා අවශ්‍ය දුරකථන අංක හෝ ලිපිනයන් මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සතුව නොපවතින එබැවින්, එවැනි පණිවුඩ යැවීමේ හැකියාවක් දැනට නැහැ. එහෙත්, ප්‍රතිලාභ ලබා ගන්නා අවස්ථාවන්හිදී සහ සංශෝධන කටයුතු සඳහා ලේඛන භාර ගැනීමේදී සාමාජිකයින්ගේ දුරකථන තොරතුරු සේවක අර්ථසාධක අරමුදල විසින් ලබා ගන්නවා. ඒ අනුව, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට ස්වයංක්‍රීය උත්පාදන පණිවුඩ යැවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි පවතින ක්‍රමවේද අනුගමනය කරමින් තිබෙනවා. ඒ සඳහා පහත ක්‍රම අනුගමනය කරනවා.

i. සියයට 30 EPF පූර්ව ප්‍රතිලාභ අයදුම්පත සහ EPF ප්‍රතිලාභ අයදුම්පතෙහි වර්තමාන තත්ත්වයට - status - අදාළව ස්වයං උත්පාදන SMS පණිවුඩ යොමු කරනු ලබනවා.

ii. සාමාජික නම්/ජාතික හැඳුනුම්පත් අංක/ සාමාජික ගිණුම් සංශෝධන, එයට අදාළ ලේඛන භාර දෙනු ලබන අවස්ථාවේදීම සිදු කිරීමට නොහැකි විටදී පසුව අදාළ සංශෝධනයේ තත්ත්වය - status - පිළිබඳ කෙටි පණිවුඩ - SMS - මඟින් සාමාජිකයා දැනුවත් කිරීම සිදු කරනවා.

(v) සේවක අර්ථසාධක අරමුදලේ දැනට පවතින තොරතුරු පද්ධතිය 2000 වර්ෂයේදී පමණ සංවර්ධනය කිරීම ආරම්භ කර ඇති අතර, එය වර්තමාන හා අනාගත අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි පද්ධතිය නවීකරණය වී නැහැ. ඒ නිසා ශ්‍රී ලංකා මහ බැංකුව හා කම්කරු දෙපාර්තමේන්තුව වෙන වෙනම දත්ත පද්ධති දෙකක් පවත්වා ගෙන යනවා දැනට. ඒ හේතුව නිසා සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට මෙන්ම, සේවා යෝජකයන්ටද යම් දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. එම නිසා රජයේ ඩිජිටල්කරණ සැලැස්මටත් අනුකූල වන පරිදි, සමස්ත රාජ්‍ය සේවයේ මේ ඩිජිටල් ප්‍රවේශය කියන වැඩසටහන යටතේ මහජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් හා කම්කරු දෙපාර්තමේන්තුවට අදාළ අනෙකුත් සේවාවන් ද මාර්ගගතව ලබා ගත හැකි වන පරිදි අදාල මෘදුකාංගවලින් සමන්විත ඩිජිටල්කරණ පද්ධතියක් හඳුන්වාදීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබෙනවා. එම පද්ධතිය පහත සඳහන් පහසුකම්වලින් සමන්විත වනවා.

i. සේවා යෝජකයන්ට EPF/ETF ගෙවීම එක් යෙදවුමක් මඟින් සිදු කිරීමට හැකි වීම.

ii. දැනට ශ්‍රී ලංකාවේ මහ බැංකුවට හා කම්කරු දෙපර්තමේන්තුවට වෙන වෙනම කළ යුතු යාවත්කාලීන කිරීම් තවදුටත් අවශ්‍ය නොවන පරිදි දත්ත පද්ධති අතර අන්තර් සම්බන්ධීකරණයක් ඇති කිරීම.

iii. සේවකයන්ට තම රැකියාවට අදාළ තොරතුරු තම සාමාජික ගිණුම මඟින් දත්ත පද්ධතිය වෙත ඇතුළත් කිරීමට අවස්ථාව සැලසීම සහ EPF/ETF ශේෂ යාවත්කාලීන වීම මාර්ගගතව පරීක්ෂා කිරීමට සහ ස්වයං උත්පාදන පණිවුඩ මඟින් දැනගැනීමට අවකාශය සැලසීම.

iv. පැමිණිලි කළමනාකරණ පද්ධතිය - Complaints Management System - හා සම්බන්ධ කරමින් කම්කරු පරීක්ෂණ යෙදවුමක් සකස් කිරීම හා එමඟින්, දෙපාර්තමේන්තු සේවකයන්ට නිශ්චිත කාලරාමුවක් තුළ අදාළ කාර්යය ඉටු කිරීමට වගකීම පැවරීමට හා එම කාල සීමාව තුළ ඉටු නොකරන කාර්යයන් පිළිබඳව පද්ධතිය මඟින් සිහිකැඳවීම් යොමු කිරීම හා dashboard ක්‍රමවේදයක් මඟින් ඉහළ කළමනාකරණයට මනා අධීක්ෂණයක් පවත්වා ගැනීමට හැකිවීම තුළින් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවක කළමනාකරණ සහ කාර්ය කළමනාකරණ - work management - ක්‍රමවේදයක් හඳුන්වා දීම.

v. සේවාලාභීන්ට තම පැමිණිලි/ ගැටලු සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය ස්වයං උත්පාදන පණිවුඩ මඟින් දැනුවත් කිරීම.

vi. පුද්ගලයන් හඳුනා ගැනීම - KYC, Know Your Customer, පුද්ගලයන් ලියාපදිංචි වීම, දත්ත පද්ධතිය හා සම්බන්ධ වීම තුළින් සිදු කිරීම නිසා දෙපාර්තමේන්තුවට ඒ සඳහා සේවාලාභින්ගෙන් තොරතුරු ලබා ගැනීමේ සහ අනන්‍යතාව තහවුරු කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවීම.

(ආ) පැන නොනඟී.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. යම් අයෙක් සේවයට බැඳුණු පසු ABH form එක fill කරනවා. බොහෝ වෙලාවට තමන්ගේ first job එකේදී තමයි, ABH form එක fill කරන්නේ. ඒ වෙලාවේ තමන් සතු වරප්‍රසාදය, එම අරමුදල තවත් අයෙකුට percentage එකක් විධියට පවරන්න පුළුවන්. බොහෝ අවස්ථාවල තරුණ වියේදී පසු අයිතිය

පවරන්නේ දෙමාපියන්ට හෝ සහෝදර සහෝදරියන්ට. ඉන්පසුව, ඔවුන් විවාහ වෙලා දරුවන් ඉන්න කාලයකදී ඒ පසු අයිතිය වෙනත් කෙනෙකුට පවරද්දී වෙනත් form එකක් තිබෙනවාද, එහෙම නැත්නම් automatically ඒක පැවරීමක් වෙනවාද? බොහෝ අවස්ථාවලදී ස්වාමිපුරුෂයා හෝ wife - කලත්‍රයා - මිය ගිය පසු එම අයිතිය ලබා ගැනීමට යැමේදී තමයි ඔය කියන ගැටලු මතු වෙන්නේ. සමහර අයට මතක නැහැ, තමන් පසු අයිතිය පැවරුවේ කාටද කියලා. ඒ නිසා සේවකයන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කළ යුතුයි. කම්කරු අමාත්‍යාංශය හරහා ඒකට නිසි ක්‍රමවේදයක් සකස් කර තිබෙනවාද කියා මා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සේවක අර්ථසාධක අරමුදලේ සේවකයාට හිමි ප්‍රතිලාභ, ඔහු නම් කරන කෙනෙකුට; nominee කෙනෙකුට - පසුව ලබා ගන්නා කෙනෙකුට - පමණක් නොවෙයි, ඒ සේවකයා සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීමටත් වැඩ පිළිවෙළක් තිබෙනවා. විශේෂයෙන්ම nominee සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමේදී නිශ්චිත ආකෘති පත්‍රයක් - form එකක් - තිබෙනවා. එය ලබා ගන්න පුළුවන් download කරලා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ online ක්‍රමවේදය මඟින් පමණක් ඉදිරිපත් කරලා අවශ්‍ය කටයුතු කර ගන්න බැරි වීමයි. මොකද, වෙනත් තුන්වෙනි පාර්ශ්වයක් ඒ ප්‍රතිලාභ ලබා ගන්නවා නම් වගකීමක් තිබෙනවා, එහි නිවැරැදිතාව පරීක්ෂා කරලා යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති නොවීම සඳහා නියමිත ක්‍රමවේදයක් අනුව ඒ වෙනස් කිරීම සිදු කිරීමට. නමුත් අපි දන්නවා මේ පිළිබඳව මහ ජනතාවගේ, සේවකයන්ගේ, ඒ ප්‍රතිලාභීන්ගේ දැනුවත්භාවයේ අඩුවක් තිබෙන බව. කම්කරු දෙපාර්තමේන්තුව විධියට ඒ දැනුවත්භාවය ලබා දෙන්න ඉදිරියේදී අපි වැඩ කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, raise your second Supplementary Question.

**ගරු ඕෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොඩක් වෙලාවට සේවාදායකයා සේවකයාගෙන් අරමුදලට මුදල් කපා ගත්තත් ඒවා Central Bank එකට ගියාද කියලා double-check වෙන ක්‍රමයක් නැහැ. ඔවුන්ගෙන් EPF දායකත්ව මුදල කපාගෙන තිබෙන නමුත් ඒවා තමන්ගේ accountsවලට බැර වෙලා නැහැ. ඒ සම්බන්ධව සේවකයාට දැන ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර තිබෙනවාද? එහෙම නැත්නම් ඉදිරියේදී එවැනි ක්‍රමයක් සකස් කරන්න බලාපොරොත්තුවක් තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ලබා දුන් පිළිතුරේදීත් සඳහන් කළ පරිදි සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් දැනට දත්ත පද්ධති දෙකක් පවතිනවා. මොකද, පරිපාලන වැඩ කටයුත්ත කරන්නේ කම්කරු අමාත්‍යාංශයේ කම්කරු දෙපාර්තමේන්තුව යටතේයි. ඒ අරමුදලේ මූල්‍ය කළමනාකරණ වගකීම තිබෙන්නේ මහ බැංකුව සතුවයි. එහිදී අදාළ අරමුදල් ලැබීම සහ ගිණුම්ගත කිරීම පිළිබඳව කාලීන වශයෙන් අදාළ සේවකයන්ට තොරතුරු ලැබුණත්, නිරන්තරයෙන් ලබා ගැනීමේ ක්‍රමවේදයක් නැහැ. ඒ අනුව අපි ඒ දත්ත පද්ධති දෙක ඒකාබද්ධ කිරීමේ වැඩසටහනක් දැනටමත් පටන් ගෙන තිබෙනවා. ඒ සඳහා මහ බැංකුවත්, මහ බැංකුව යටතේ අරමුදල් කළමනාකරණය කරන අංශයත්, කම්කරු දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ඒ වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යනවා. අපි ඉදිරියේදී එක දත්ත පද්ධතියක් හරහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මේ තාක්ෂණයේ ප්‍රතිලාභ සේවකයන්ටත්, ඒ වාගේම සේවා යෝජකයන්ටත් ලබා දෙමින් කටයුතු පහසු කරන්න බලාපොරොත්තු වෙනවා. ඔවුන්ට ඒ අදාළ අරමුදල් බැර කිරීමේ, ප්‍රතිලාභ ලබා ගැනීමේ ක්‍රමවේදය, භෞතිකව තැන් තැන්වල රස්තියාදු වෙන්නේ නැතුව තාක්ෂණය ඔස්සේ ලබා ගැනීමේ ක්‍රමය ඉදිරියේදී අනුගමනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

## ජාතික තරුණ සේවා සභාව: දෙමළ භාෂා මාධ්‍ය පුහුණු මධ්‍යස්ථාන

## தேசிய இளைஞர் சேவைகள் மன்றம்: தமிழ் மொழிமூல பயிற்சி நிலையங்கள்

NATIONAL YOUTH SERVICES COUNCIL: TAMIL-MEDIUM TRAINING CENTRES

1464/2025

**2. ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ජාතික තරුණ සේවා සභාව විසින් දෙමළ භාෂා මාධ්‍යයෙන් පුහුණු මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, එම පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුහුණු මධ්‍යස්ථාන කවරේද;

(iv) ඒවා අතරින් දෙමළ භාෂා මාධ්‍යයෙන් පවත්වා ගෙන යනු ලබන පුහුණු මධ්‍යස්ථාන කවරේද;

(v) ඉහත පුහුණු මධ්‍යස්ථානවල පවත්වනු ලබන පාඨමාලා කවරේද;

(vi) එම මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய இளைஞர் சேவைகள் மன்றத்தால் தமிழ் மொழிமூலம் பயிற்சி நிலையங்கள் நடாத்திச் செல்லப்படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய பயிற்சி நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) தேசிய இளைஞர் சேவைகள் மன்றத்தால் பதுளை மாவட்டத்தில் நடாத்திச் செல்லப்படுகின்ற பயிற்சி நிலையங்கள் யாவை என்பதையும்;

[ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය]

(iv) அவற்றுள் தமிழ் மொழிமூலம் நடாத்திச் செல்லப்படுகின்ற பயிற்சி நிலையங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி பயிற்சி நிலையங்களில் கற்பிக்கப்படுகின்ற பாடநெறிகள் யாவை என்பதையும்;

(vi) அந்த நிலையங்களை நடாத்திச் செல்வதற்காக ஒதுக்கப்படுகின்ற நிதி ஒதுக்கீடுகள் போதுமானவையா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) whether the National Youth Services Council operates Training Centres in Tamil medium;

(ii) if so, the number of such Training Centres;

(iii) the names of the Training Centres that are operated by the National Youth Services Council in the Badulla District;

(iv) out of the said Training Centres, the names of those that are operated in the Tamil medium;

(v) the names of the courses that are conducted at the above Training Centres; and

(vi) whether the provisions allocated for the operation of such Centres are sufficient?

(b) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) පුහුණු මධ්‍යස්ථාන 13කි.

1. සයින්දමරුදු පුහුණු මධ්‍යස්ථානය
2. පුදුකුඩිඉරුප්පු පුහුණු මධ්‍යස්ථානය
3. ඔඩ්ඩමාවඩි පුහුණු මධ්‍යස්ථානය
4. ත්‍රිකුණාමලය (ලව්ලේන්) පුහුණු මධ්‍යස්ථානය
5. වවුනියාව පුහුණු මධ්‍යස්ථානය
6. මන්නාරම පුහුණු මධ්‍යස්ථානය
7. පූනගරී පුහුණු මධ්‍යස්ථානය
8. යාපනය පුහුණු මධ්‍යස්ථානය
9. කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානය
10. ලෙව්වේගොඩ පුහුණු මධ්‍යස්ථානය
11. දඹුල්ල පුහුණු මධ්‍යස්ථානය
12. බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය
13. නෝර්වුඩ් පුහුණු මධ්‍යස්ථානය

(iii)
- ඔරුබැදිවැව පුහුණු මධ්‍යස්ථානය
- ලෙව්වේගොඩ පුහුණු මධ්‍යස්ථානය
- හල්දුම්මුල්ල පුහුණු මධ්‍යස්ථානය
- පතනවත්ත පුහුණු මධ්‍යස්ථානය

(iv) ලෙව්වේගොඩ පුහුණු මධ්‍යස්ථානය.

(v)

| අ/අ | මධ්‍යස්ථානය | පාඨමාලාව |
|---|---|---|
| 01 | ඔරුබැදිවැව | • කෘෂි ක්ෂේත්‍ර සහායක පාඨමාලාව • වෙල්ඩින් පාඨමාලාව • මෝටර් කාර්මික පාඨමාලාව • යන්ත්‍රෝපකරණ කාර්මික පාඨමාලාව |
| 02 | ලෙව්වේගොඩ | • කෘෂි ක්ෂේත්‍ර සහායක පාඨමාලාව |
| 03 | හල්දුම්මුල්ල | • තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව • රූප ලාවණ්‍ය පාඨමාලාව • කේශ ලාවණ්‍ය පාඨමාලාව • පරිගණක චිත්‍රක පාඨමාලාව • ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව |

(vi) භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැත.

පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම සඳහා ප්‍රතිපාදන ප්‍රවාහ 2ක් පවතී.

- භාණ්ඩාගාර ප්‍රතිපාදන
- අභ්‍යන්තර ප්‍රතිපාදන

භාණ්ඩාගාර ප්‍රතිපාදනවලට අමතරව අභ්‍යන්තර ආදායම් මඟින් හිඟ කළමනාකරණය කරනු ලබයි.

(ආ) පැන නොනඟී.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික තරුණ සේවා සභාව මඟින් පාඨමාලා පවත්වන පුහුණු ස්ථාන පිළිබඳව අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කය තුළ මම දැකපු කාරණයක් තිබෙනවා. එම පාඨමාලා හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් - විශේෂයෙන්ම ඒගොල්ලන්ට අවශ්‍ය පහසුකම් සඳහා, ඒ අයගේ කෑම සඳහා - වෙන් කරන මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා.

මම දන්නා තරමට බණ්ඩාරවෙල, නෙළුව මධ්‍යස්ථානයේ අලුතින් පාඨමාලාවක් පටන් ගත්තා. ඒ පාඨමාලාව හදාරන දරුවන්ට වෙන් කරන මුදල රුපියල් 300යි. අනෙක් තැන්වල කෑමට සමහර වෙලාවට මුදලක් වෙන් කරන්නේ නැහැ. මුළුමනින්ම දරුවන්ට ඒ මුදල වැය කරන්න සිදු වන අවස්ථා බොහොමයක් තිබෙන බව තමයි මට කිව්වේ. ඒ වෙන් කරන මුදල ප්‍රමාණවත් නැති නිසාම ඒ ස්ථානයේ ඒ පාඨමාලාව කරගෙන යන්න බැරුව නැවතුණා. ඒ නිසා ජාතික තරුණ සේවා සභාව සඳහා මේ අවුරුද්දේ හරි ඊළඟ අවුරුද්දේ හරි ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා, ඒ පාඨමාලා කරගෙන යන්න පහසුකම් ලබා දෙන්න පුළුවන්ද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

අපි මේ අවුරුද්දේ අය වැයෙන් ඒ සමහර පාඨමාලා ප්‍රවර්ධනය කරන්නත්, සමහර ආයතනවලට වැඩිපුර මුදලක් වෙන් කරන්නත් කටයුතු කරලා තිබෙනවා. මොකද, සමහර තැන්වල පොඩි පොඩි වෙනස්කම් තිබෙනවා, ඔය පාඨමාලාවලදී. ඒ ටික නිවැරදි කරන්න අපි මේ අවුරුද්දේ දැනටමත් කටයුතු කරලා තිබෙනවා. ඒ තැන්වල ඒ පාඨමාලා ගාස්තු ගෙවීම, වෙන් කිරීම් ඊළඟ අය වැයේදී අපි වෙනස් කරනවා.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි.

ජාතික තරුණ සේවා සභාවේ පාඨමාලා සිංහල මාධ්‍යයෙන් විතරයි තිබෙන්නේ. එතකොට දෙමළ ළමයින්ට තමුන්ගේ භාෂාවෙන් ඉගෙන ගැනීමට අමාරු තත්ත්වයක් තිබෙනවා. ඒ නිසාම සමහර අය ඒ පුහුණුවෙන් අයින් වන අවස්ථා බොහොමයක් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම බදුල්ල, නුවරඑළිය වාගේ Tamil අය ගොඩක් ඉන්න දිස්ත්‍රික්කවල සිසුන්ට ඒක ගැටලුවක්. ඒ නිසා NAITA එක, VTA එක, ඒ වාගේම ජාතික තරුණ සේවා සභාව වාගේ ආයතනවල Tamil sections වැඩි දියුණු කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

බණ්ඩාරවෙල, නෙළුවේ අලුතින්ම කෘෂිකර්ම පාඨමාලා පටන් ගත්තා. ඒ වාගේ agricultureවලටයි, tourism පැත්තටයි යොමු වෙන පාඨමාලා තිබෙනවා. විශේෂයෙන්ම Tamil අයට ඉතා ඉක්මනින් භාෂා ඉගෙන ගැනීමට පුළුවන් ප්‍රවණතාවක් තිබෙන නිසා ඒ අයට එවැනි භාෂා පුහුණුවක් දීලා tourism පැත්තටත්, agriculture පැත්තටත් යොමු කරන්න පුළුවන් centres Tamil අය වෙනුවෙන් පටන් ගන්න පුළුවන් ද කියන එකත් දැනගන්න කැමැතියි.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ප්‍රතිපත්තිය හැටියට මේ සමහර පාඨමාලා එක තැනකට ගෙනැල්ලා කරන්න ඕනෑ කියලා අපි අවබෝධ කරගෙන තිබෙනවා. ඒකට අපි අමාත්‍යාංශ කිහිපයක් එක්ක මේ වෙලාවේ සාකච්ඡා කරමින් යනවා programme එකක් හදන්න. එහිදී අපි බලාපොරොත්තු වෙනවා, තැන් තැන්වල තිබෙන ඒ පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩි කරලා ඒවා ඒ ප්‍රදේශවල ඉන්න දරුවන්ට ප්‍රයෝජනවත් විධියට නැවත හදන්නේ කොහොමද කියලා සොයා බලන්න. ඒ වැඩසටහන දැන් මේ වෙනකොට සාකච්ඡා කරමින් යනවා. පාර්ලිමේන්තුවේත් ඒ වෙනුවෙන් කමිටුවකුත් පත් කර තිබෙනවා. ඒවා හරහා අපට ලැබෙන පිළිතුරුත් එක්ක මේ පාඨමාලා සංවර්ධනය කරන්න අපි ක්‍රියාමාර්ග ගන්නවා. විශේෂයෙන්ම දෙමළ මාධ්‍යයෙන් මේ පාඨමාලා ඉගැන්වීමට අවශ්‍ය ගුරුවරුන්ගේ හිඟකමත් අපි දැක්කා. මේ කාරණා දෙකම සලකා බලා ලබන අවුරුද්දේ ඉඳලා මේ පාඨමාලා සංවර්ධනය කරලා ඒ මාධ්‍යවලින් උගන්වන්න පුළුවන් ගුරුවරු සොයාගෙන කටයුතු කරන්න අපි දැනටමත් වැඩසටහනක් සකස් කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 3 - 1498/2025 - (1), the Hon. B. Ariyawansha - *[Not in the Chamber.]*

## යටියන්තොට, ගරාගොඩ පාලම ප්‍රතිසංස්කරණය: ප්‍රමාදය
யட்டியாந்தோட்டை, கறாகொட பாலத்தைப் புனரமைத்தல்: தாமதம்
RENOVATION OF GARAGODA BRIDGE, YATIYANTOTA: DELAY

1539/2025

**4.** **ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කැළණි ගඟ හරහා ඇති, වර්ෂ 120ක් පමණ පැරණි, යටියන්තොට, ගරාගොඩ පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීම සඳහා ගිවිසුම්ගතවී ඇති කාලය කොපමණද;

(ii) 2023 සැප්තැම්බර් මාසයේ පමණ සිට වාහන ධාවනය සීමා කරමින් එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇති අතර ඒ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවකට පත්වී සිටින බව දන්නේද;

(iii) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමාදවීමට හේතු කවරේද;

(iv) ඉහත පාලම ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී, නිසි ක්‍රම අනුගමනය කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vi) ගිවිසුම්ගත කොන්ත්‍රාත් සමාගම අදාළ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර තිබේද;

(vii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(viii) ඉහත පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களனி கங்கை ஊடாக அமைந்துள்ள, சுமார் 120 வருடங்கள் பழைமைவாய்ந்த, யட்டியாந் தோட்டை, கறாகொட பாலத்தின் புனரமைப்புப் பணிகளை நிறைவுசெய்வதற்கு ஒப்பந்தம் செய்துகொண்டுள்ள காலம் எவ்வளவு;

(ii) 2023 செப்ரெம்பர் மாதமளவிலிருந்து வாகனப் போக்குவரத்து மட்டுப்படுத்தப்பட்டு, மேற்படி பாலத்தின் புனரமைப்புப் பணிகள் ஆரம்பிக்கப் பட்டுள்ளதுடன், அதன் காரணமாக பிரதேச மக்கள் கடும் அசௌகரியங்களுக்கு ஆளாகியுள் ளார்கள் என்பதை அறிவாரா;

(iii) மேற்படி பாலத்தின் புனரமைப்புப் பணிகள் தாமதமடைவதற்கான காரணங்கள் யாவை;

(iv) மேற்படி பாலத்தைப் புனரமைப்புச் செய்வது தொடர்பான ஒப்பந்தத்தைக் கையளிக்கும் போது, உரிய நடைமுறை பின்பற்றப் பட்டுள்ளதா;

[ගරු නන්දන මිල්ලගල මහතා]

(v) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

(vi) ஒப்பந்தம் செய்துகொண்ட கம்பனி உரிய உடன்படிக்கைக்கு அமைய நடவடிக்கை மேற்கொண்டுள்ளதா;

(vii) இன்றேல், அது சம்பந்தமாக மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(viii) மேற்படி பாலத்தின் புனரமைப்புப் பணிகளைத் துரிதமாக நிறைவுசெய்வதற்கு மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the contracted time for completing the renovation work of the approximately 120-year-old Yatiyantota, Garagoda Bridge across the Kelani River;

(ii) whether he is aware that the bridge renovation, which began in September, 2023 with restricted traffic, is causing severe difficulties for residents;

(iii) the reasons for the delay in the renovation work of the said bridge;

(iv) whether the proper procedure has been followed in awarding the relevant contract for the renovation of the said bridge;

(v) if not, the reasons for that;

(vi) whether the contractor company under contract has acted in accordance with the relevant contract;

(vii) if not, the actions that have been taken in that regard; and

(viii) the steps that have been taken to complete the renovation work of the aforementioned bridge expeditiously?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளு மன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) • මෙම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීම සඳහා ගිවිසුම්ගත වී ඇති කාලය - දින 699 (මාස 23)

• 2023.08.31 - 2024.11.29 (දින 456) දක්වා මුලදී ගිවිසුම්ගතව තිබුණු නමුත්, පසුව 2025.07.30 දක්වා එම ගිවිසුම දීර්ඝ කරන ලදී. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ කලාට පසුව තමයි දින 456, දින 699 වෙන්නේ.

(ii) • 2023.08.31 දින මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් එම පාලමේ ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර, ඒ හේතුවෙන් එම පාලම හරහා රථවාහන ධාවනය සබරගමුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සීමා කර පදිකයන්, පාපැදි, යතුරුපැදි හා ත්‍රිරෝද රථ ධාවනයට පමණක් ඉඩ දී තිබුණි.

• මහ ජනතාවට වන අපහසුතාව අවම කිරීම සඳහා මේ වන විටත් පාපැදි, යතුරුපැදි හා ත්‍රිරෝද රථ ධාවනයට ඉඩ ලබා දී ඇත.

(iii) 2023 හා 2024 වර්ෂවල පැවති අධික වර්ෂාව හේතුවෙන් කැලණි ගඟ ආශ්‍රිතව නිතර ඇති වන ජල ගැලීම් හා ජල මට්ටම වෙනස් වීම් හේතුවෙන් අලුතින් ගඟ මැද ඉදිකළ යුතු කණු - piers - ඉදිකිරීම් සඳහා අදාළ ස්ථානයන්ට ළඟා වීම අපහසු වීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක එක උත්තරයක් තමයි. හැබැයි, මම ඉතා පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. නමුත්, මේ කොන්ත්‍රාත්කරුවනුත්, මාර්ග සංවර්ධන අධිකාරියේ අයත් කැලණි ගඟෙන් ගංවතුර ඇති වන බවත්, සාමාන්‍යයෙන් මේ වාගේ කාලයක - මැයි මාසයේදී, ජූනි මාසයේදී - ගංවතුර වැඩි වන බවත් දන්නවා. ඒක අමුතු phenomenon එකක් නොවෙයි. ඒක දැනගෙන තමයි මේ contract එක award කරන්නෙත්, භාර ගන්නෙත්. ඒ නිසා මේ ගඟේ වතුර වැඩි වුණා කියන එක abnormal, අමුතු දෙයක් නොවෙයි. නමුත්, ඒකත් බලපාන්න ඇති. මේ ප්‍රශ්නවල තිබෙන අර්ධ පිළිතුරුමය බව නිසායි මම ඒක කිව්වේ.

(iv) ඔව්.

(v) අදාළ නොවේ.

(vi) ගිවිසුම්ගත සමාගම අදාළ ගිවිසුමට අනුව කටයුතු කරමින් සිටී. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා ඉල්ලීම් කර ඇති අතර මේ වන විට එම ඉල්ලීම පරීක්ෂා කරමින් පවතී.

මෙම සමාගම ගැන කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මාර්ග සංවර්ධන අමාත්‍යාංශයත්, ගොඩක් අමාත්‍යාංශත් සුවිශාල අර්බුදවලට මුහුණ දීලා තිබෙනවා, මේ සමාගමේ ඉතාම අඩු කාර්ය සාධනය නිසා. ඒ නිසා ජනතාව පුදුමාකාර පීඩාවට පත් වෙලා තිබෙනවා. ඒ ගැනත් සඳහන් කරන්න ඕනෑ. මේ ගංවතුර තත්ත්වයට වඩා තිබෙන්නේ එම සමාගමේ තිබෙන ප්‍රශ්නයක්.

(vii) අදාළ නොවේ.

(viii) 1. මහජනතාව අපහසුතාවට පත්වීම අවම කිරීම සඳහා තාවකාලික පාලමක් ඉදිකරමින් පවතින අතර පැරණි පාලමේ දිරාගිය යකඩ තට්ටුව ගලවා එය නැවත කොන්ක්‍රීට් යොදා ඉදිකිරීමට සූදානම් කිරීම.

2. ඉදිකිරීම් ප්‍රගතිය පරීක්ෂා කිරීම සහ අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්,

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම්), ක්ෂේත්‍ර ඉංජිනේරු සහ අදාළ නිලධාරින් සමඟ සති දෙකකට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඉදිකිරීමට අදාළ ඉලක්ක ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන්, එතුමාගේ අතුරු ප්‍රශ්නයට කලින් මේ කාරණයත් කියන්න ඕනෑ. පැහැදිලිවම, මීටත් වඩා ප්‍රබල සමාගම් 04ක් අපි blacklist කළා. මේ සමාගම ඇතුළුව, සමහර සමාගම් කොතරම් අකාර්යක්ෂම ද කියනවා නම්, subcontracts දෙන්නවත්, ඊට වඩා අඩු කොන්ත්‍රාත්කරුවෙක්වත් මේගොල්ලන් එක්ක වැඩ කරන්නේ නැහැ. ඒ නිසා තමයි මේ ප්‍රශ්න උද්ගත වෙමින් තිබෙන්නේ. මේ දූෂිත දේශපාලන සම්බන්ධතා මත කරපු කොන්ත්‍රාත් සහ ඒවාත් එක්ක තමයි මේ ප්‍රශ්නවලට කෑගල්ලේ මිනිස්සු මුහුණ දීලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ඔබතුමාගේ පිළිතුරට බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

ඇත්තටම යටියන්තොට-ගරාගොඩ නව පාලම කියන්නේ සාමාන්‍යයෙන් අපි දන්නා ආකාරයට සරල සේවාවක් සැපයූ පාලමක් නොවෙයි. ඒක වර්ෂ 102ක් පමණ පැරණි පාලමක් වාගේම, එමගින් නගරාසන්න පාසල් 5ක්, පොලිසියට, සෞඛ්‍ය නිලධාරි කාර්යාලයට, පනාවත්ත රෝහලට වාගේම ග්‍රාම නිලධාරි කාර්යාලයට සම්බන්ධ වෙනවා. ඒ වාගේම මිනිස්සු දහස් ගණනක් දවසකට එහා මෙහා යන පාලමක්, ඒක. ඒ නිසා තමයි මේ පාලම කඩිනමින් ඉදි කර ගැනීම අවශ්‍යයි කියන එක පැහැදිලි කළේ. අපි 2023 වර්ෂයේ ඉඳලා දින 600 ගණනකින් පාලම ඉදි කර ගැනීම ඉවර කරන්න භාර ගත්තා. නමුත්, තුන්වෙනි අවුරුද්ද තමයි මේ ගෙවෙමින් තිබෙන්නේ. මේක ජනතාවට මහත් පීඩාවක් බවට පත් වෙලා තිබෙනවා. අපේ අමාත්‍යතුමා පිළිතුර ලබා දෙනකොට පැහැදිලි කළා, සාමාන්‍යයෙන් මේ වාගේ ඉදි කිරීමක් කරනකොට, එම ඉදිකිරීම අවසන් කරනතෙක් මහජනතාවට තාවකාලිකව මාර්ග පහසුකම් කඩිනමින් සලසා දිය යුතුයි කියලා. ඒකටවත් එකඟතාවක් ඇති වෙලා තිබුණේ නැහැ. මේ වෙනුවෙන් විශේෂ සම්බන්ධීකරණ කමිටු දෙකක් අපි රැස්වුණා. සමාගම් ගෙන්වලා කථා කළා. ඒ කථා කළ අවස්ථාවෙන් පසුව තමයි මේ තාවකාලික ගමනාගමන පහසුකම් සලසා දෙන්න ඔවුන් සූදානම් වෙන්නේ. මෙම පාලම ගලවන්න කටයුතු කරන මේ අවස්ථාවේදී ඒ සඳහා තාවකාලික පාලමක් ඉදි කරන්න කොන්ත්‍රාත් සමාගම පොරොන්දු වෙලා කටයුතු කරමින් ඉන්නවා. මේ ඉදි කරන තාවකාලික පාලම අපි නිරීක්ෂණය කළා. ගරු අමාත්‍යතුමනි, ඒ ඉදි කර තිබෙන පාලම නම් දහස් ගණන් මිනිස්සුන්ට යන්න තරම් සුදුසු තත්ත්වයක ඇත්තටම නැහැ. ගඟ තුනෙන් එකක් ගොඩ කරලා, ඒ ගොඩ කරලා තිබෙන වැලි මත තමයි ඉතිරි පාලම අටවලා තිබෙන්නේ. මේ මහ වැස්සට ඒ වැලි ටික ගඟගෙන ගිහිල්ලා තිබෙන්නේ. ඒ හින්දා මේ ඉදි කරන තාවකාලික පාලම මහජන ආරක්ෂාවට සුදුසු පරිදි ඉදි කිරීමට මෙහි වගකීම දරන මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අදම උපදෙස් දෙන්නම් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට, සතියක් ඇතුළත මේ ස්ථානයට ගිහිල්ලා නිරීක්ෂණය කරලා, අදාළ නිලධාරින් එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය පියවර ගන්න කියලා. ගරු මන්ත්‍රීතුමාත් ඒකට සම්බන්ධ වන්න.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු අමාත්‍යතුමනි, වාහන ගමනාගමනයේදී නගරයේ සිට ගරාගොඩ ප්‍රදේශයේ තිබෙන මේ පාලමට සම්බන්ධ වන්න යන්න තිබෙන්නේ මීටර් 250ක විතර දුර ප්‍රමාණයක්. හැබැයි, සංවර්ධන කටයුත්තක් නිසා වාහන ගමනාගමනයේ යෙදෙන මිනිස්සු යම් කැප කිරීමක් කරන්න සූදානම්. ඒ අනුව ජනතාව කැමැතියි, ගරාගොඩ සිට මාගම්මන දක්වා ගිහිල්ලා කරවනැල්ල හරහා යටියන්තොටට එන්න. ඒ සඳහා කිලෝමීටර 15ක විතර දුරක් එන්න ඕනෑ. මෙහි ගමනාගමන කටයුතු සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් බස් රථ සේවාවක් යොදවන්න ඒ කොන්ත්‍රාත් සමාගම පොරොන්දු වෙලා තිබෙනවා. දැන් පාලම ගලවන්න සූදානමින් ඉන්නවා කියන ආරංචිය තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒත් එක්කම මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයට සම්බන්ධ බස් රථ සේවාව ආරම්භ කරන්න බලාපොරොත්තු වන්නේ කවදාද, කොහොමද ඒක සිදු වන්නේ කියන එක පිළිබඳවත් ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඒ ගැන නම් විමසීමකින් තොරව පිළිතුරු ලබා දෙන්න බැහැ. මට වගකීමකින් උත්තරයක් දෙන්න අමාරුයි, SLTB බස් රථයක් දෙනවා කියලා. නමුත් මේ සඳහා බස් රථයක් යොදවන්න පෞද්ගලික අංශයේ කවුරු හරි කැමැති නම්, අන්න ඒ කෙනෙකුට මේ ප්‍රශ්නය ඉවර වෙනකල් තාවකාලික බලපත්‍රයක් ලබා දීමට ඇති හැකියාව ගැන සොයන්න පුළුවන්. ඒක තමයි මට දැනට කියන්න පුළුවන්කම තිබෙන්නේ. කොහොම නමුත්, මම මේ ප්‍රශ්නයේ මූලික කොටස විසඳීම සඳහා සතියක් ඇතුළත සභාපතිවරයා එම ස්ථානයට යවන්නම්. ගරු මන්ත්‍රීතුමනි, අනෙක් ප්‍රශ්නයට ඔබතුමාටත් මැදිහත් වන්න පුළුවන්, සබරගමුව පළාත් මගී සංවර්ධන අධිකාරිය හරහා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 5 - 1561/2025 - (1), the Hon. K. Ilankumaran. - *[Not in the Chamber.]*

Second round.

## රත්නපුර දිස්ත්‍රික්කයේ රෝහල්: පුරප්පාඩු
## இரத்தினபுரி மாவட்டத்திலுள்ள வைத்தியசாலைகள்: வெற்றிடங்கள்
## HOSPITALS IN RATNAPURA DISTRICT: VACANCIES

1498/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු බී. ආරියවංශ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு பி. ஆரியவங்ஷ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. B. Ariyawansha)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම රජය යටතේ සහ පළාත් සභාව යටතේ පාලනය වන රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) එම රෝහල්වල නම් කවරේද;

(iii) එම එක් එක් රෝහලේ මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) රත්නපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම රජය යටතේ පාලනය වන රෝහල්වල ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில், மத்திய அரசாங்கம் மற்றும் மாகாண சபையின்கீழ் நிருவகிக்கப் படுகின்ற வைத்தியசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாவை;

(ii) அத்தகைய வைத்தியசாலைகளின் பெயர்கள் யாவை;

(iii) மேற்படி ஒவ்வொரு வைத்தியசாலையிலும் தற்போது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை, பதவி ஒவ்வொன்றுக்கும் அமைய வெவ்வேறாக யாது;

(iv) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(v) இரத்தினபுரி மாவட்டத்தில் மத்திய அரசாங்கத் தின்கீழ் நிருவகிக்கப்படுகின்ற வைத்தியசாலை களில் எதிர்காலத்தில் அமுல்படுத்த உத்தேசிக்கப் பட்டுள்ள அபிவிருத்தி கருத்திட்டங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of hospitals in the Ratnapura District managed by the Central Government and the Provincial Council, separately;

(ii) names of those hospitals;

(iii) number of vacancies currently existing in each of those hospitals, separately for each post;

(iv) steps being taken to fill those vacancies; and

(v) development projects scheduled to be implemented in the future in hospitals in Ratnapura District managed by the Central Government?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මධ්‍යම රජය යටතේ (රේඛීය අමාත්‍යාංශය යටතේ) - 02

පළාත් සභාව යටතේ - 110

එකතුව - 112

(ii) ඇමුණුම 01** මඟින් දක්වා ඇත.

(iii) ඇමුණුම 02** මඟින් දක්වා ඇත.

(iv) දැනට රෝහල්වල පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු ඉදිරි බඳවා ගැනීම් සිදු කිරීමේදී සේවා අවශ්‍යතාව සලකා රෝහල් වෙත අනුයුක්ත කිරීම සිදු කරනු ලැබේ.

(v) ශික්ෂණ රෝහල රත්නපුර

- නව හෘද රෝග ඒකකයක් ඉදිකිරීම.
- පිළිකා රෝගී ඒකකයේ II වන අදියර ඉදිකිරීම.
- දිස්ත්‍රික් මහ රෝහල ඇඹිලිපිටිය
- මහල් පහකින් යුත් බාහිර රෝගී අංශය ඉදිකිරීම.

(ආ) පැන නොනඟී.

## යාපනය තික්කම් ස්කාගාරය: නැවත සක්‍රිය කිරීම
## யாழ்ப்பாணம், திக்கம் வடிசாலை: மீள இயக்குதல்
## THIKKAM DISTILLERY, JAFFNA: REACTIVATION

1561/2025

**5. ගරු ගයාන් ජනක මහතා (ගරු කේ. ඉලංකුමාරන් මහතා)**
(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு கே. இளங்குமரன் சார்பாக)
(The Hon.Gayan Janaka on behalf of the Hon. K. Ilankumaran)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය තික්කම් ස්කාගාරය අක්‍රිය වීම හේතුවෙන් පෙබරවාරි සිට අගෝස්තු දක්වා අධික වශයෙන් නිෂ්පාදනය වන තල් රා අපතේ යන බව දන්නේද;

(ii) එසේ නම්, එය නවීකරණය කර නැවත සක්‍රිය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලය 2016.06.28 දින රුපියල් මිලියන 112.5ක් අනුමත කර තිබේද;

(iv) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(v) එය අවසන් කිරීමට අපේක්ෂා කරන දින වකවානු කවරේද;

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

(vi) ස්කාගාරය නවීකරණය කිරීමෙන් උතුරු පළාතේ තල් රා නිෂ්පාදකයින්ට සහ තල් සංවර්ධන සමුපකාර සමිතිවලට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(vii) එමඟින් රැකියා, ආදායම සහ අපනයන ක්ෂේත්‍රවල දියුණුව ඇතිවන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) අතිරික්ත තල් රා, තල් රා යුෂ, සර්ජිකල් ස්ප්‍රීතු සහ වෙනත් අගය එකතු කළ නිෂ්පාදන බවට පරිවර්තනය කිරීමට පියවර ගෙන තිබේද;

(ii) උතුරු හා නැඟෙනහිර පළාත්වල කුඩා පරිමාණ තල් රා සැපයුම්කරුවන් සහ තල් ආශ්‍රිත නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம், திக்கம் வடிசாலை இயங்காத காரணத்தால், பெப்ருவரி மாதம் முதல் ஓகஸ்ட் மாதம் வரையான காலப்பகுதியில் அதிகளவில் உற்பத்தி செய்யப்படும் பனங்கள்ளு வீண்விரய மாவதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வடிசாலையை நவீனமயப் படுத்தி மீண்டும் இயங்கச் செய்வதற்கு மேற் கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்துக்காக ரூபாய் 112.5 மில்லியன் நிதியை ஒதுக்கீடு செய்வதற்காக 2016.06.28ஆம் திகதி அமைச்சரவை ஒப்புதலை வழங்கியுள்ளதா என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்தை நிறைவுசெய்வதற்கு எதிர்பார்க்கும் திகதி யாது என்பதையும்;

(vi) வடிசாலையை நவீனமயப்படுத்துவதன்மூலம் வட மாகாணத்தின் பனங்கள்ளு உற்பத்தியாளர் களுக்கும் பனை அபிவிருத்திக் கூட்டுறவுச் சங்கங்களுக்கும் கிடைக்கப்பெறும் பயன்கள் யாவை என்பதையும்;

(vii) அதன்மூலம் தொழில், வருமானம் மற்றும் ஏற்றுமதித் துறைகளில் எவ்வித வளர்ச்சி ஏற்படும் என்பதையும்;

அவர் குறிப்பிடுவரா?

(ஆ) (i) மேலதிக பனங்கள்ளை பனங்கள் சாறு, 'சர்ஜிகல் ஸ்பிரிட்' மற்றும் வேறு பெறுமதி சேர்க்கப் பட்ட உற்பத்திகளாக மாற்றுவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் சிறிய அளவிலான பனங்கள்ளு உற்பத்தியாளர்கள் மற்றும் ஏனைய பனை சார்ந்த உற்பத்தி யாளர்களை ஊக்குவிப்பதற்காக நடைமுறைப் படுத்தப்படும் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he state -

(i) whether he is aware that the excessive production of palmyrah toddy from February to August goes to waste due to the inactivity of the Jaffna Thikkam Distillery;

(ii) if so, the steps that have been taken to modernize and reactivate the said distillery;

(iii) whether the Cabinet of Ministers has approved Rs. 112.5 million for this project on 28.06.2016;

(iv) the current progress of the said project;

(v) the expected date of completion of the said project;

(vi) the benefits to palmyrah toddy producers and palmyrah development co-operative societies in the Northern Province from modernizing the distillery; and

(vii) the manner in which this leads to growth in job, income and export sectors?

(b) Will he inform this House -

(i) whether steps have been taken to convert surplus palmyrah toddy into palmyrah toddy juice, surgical spirits and other value-added products; and

(ii) the projects that will be implemented to encourage small-scale palmyrah toddy suppliers and palmyrah-based producers in the Northern and Eastern Provinces?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා සභාගත* කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දැනට තල් රා අපතේ යෑමක් සිදු වන බව දැනුවත්ය.

එයට විසඳුමක් ලෙස තික්කම් ස්කාගාරය සක්‍රිය කළ යුතු වේ. එමඟින් යාපනය දිස්ත්‍රික්කයේ පමණක් නොව, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් යන දිස්ත්‍රික්කවලද මදින තල් රා මෙම ස්කාගාරය වෙත යොමු කිරීමට බලාපොරොත්තු වේ.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

යෝජිත ස්කාගාරය සඳහා දිනකට අවශ්‍ය අවම තල් රා ධාරිතාව ලීටර් 30,000ක් පමණ වේ. එමඟින් උතුරු පළාතේ තල් රා අපතේ යෑම වළක්වා ගත හැක.

(ii) බොයිලේරු, නිස්සාරණ හා බෝතල් පිරවුම් ඒකකයන්හි පවතින සියලු යන්ත්‍රෝපකරණ 1984දී ස්ථාපනය කර ඇති අතර, වසර ගණනාවක් පුරා අවශ්‍ය අලුත්වැඩියා වරින් වර සිදු කර ඇත. එහෙත් වසර ගණනාවක් සිදු වූ ක්ෂයවීම හේතුවෙන් බොහෝ යන්ත්‍ර ක්‍රියා විරහිත වී ඇත. තික්කම් ස්කාගාරය 2012 සිට ක්‍රියාත්මක නොවේ.

තල් සංවර්ධන මණ්ඩලයේ පෙර කළමනාකරණය විසින් තික්කම් ස්කාගාරය නවීකරණය කර නැවත ක්‍රියාත්මක කිරීම සඳහා 2022 අප්‍රේල් මාසයේදී Royal Cast (Pvt.) Ltd. නමැති පෞද්ගලික සමාගමක් සමඟ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව අවුරුදු 25ක දිගු කාලීන බදු ගිවිසුමකට යොමු වී ඇත. එහෙත් ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය - තෙලිජ්ජ - සපයන තල් සංවර්ධන සමුපකාර සමිති විසින් කරන ලද විරෝධතා හේතුවෙන් එය තවමත් ආරම්භ කර නැත. ඔවුන් දන්වා සිටින්නේ, තික්කම් ස්කාගාරය ස්වාධීනව ඔවුන් හට පවත්වාගෙන යෑමට ඉඩ සලසා දෙන ලෙසයි.

ඒ අනුව, තල් සංවර්ධන සමුපකාර සමිති හා අදාළ පෞද්ගලික ආයතන සමඟ සුදුසු විසඳුමක් සඳහා සාකච්ඡා කරමින් පවතී.

(iii) නැත.

එවකට පැවති බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2018 වාර්ෂික අය වැය තුළ තික්කම් ස්කාගාරය නැවත ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 180ක මුදලක් වෙන් කර ඇත.

(iv) 2021 වසරේදී ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව මඟින් පරිපාලන ගොඩනැඟිල්ල, ජල ටැංකිය, ආරක්ෂක කුටිය, වැසිකිළි හා කම්කරුවන්ගේ විවේකාගාරය වැනි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර ඇත. ඒ සඳහා වැය වූ මුදල ආසන්න ලෙස රුපියල් මිලියන 66ක් පමණ වේ. නිෂ්පාදන කර්මාන්තශාලාව පෞද්ගලික සමාගමක් හරහා නැවත ක්‍රියාත්මක කිරීමට රේඛීය අමාත්‍යාංශය ගත් තීරණය අනුව ඉතිරි මුදල් 2023දී මුදල් අමාත්‍යාංශයට ආපසු ලබා දී ඇත.

(v) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වමින් සියලු කරුණු සලකා බලමින් පවතින අතර, එකඟතාවට පත්වීමෙන් අනතුරුව ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

(vi) (a) තල් රා සඳහා වන වෙළෙඳ පොළ ඉල්ලුම වැඩිවීම.

(b) නාස්තිය සහ පාඩුවීම් අවම කිරීම.

(vii) (a) ආදායම් වැඩිවීම සහ ජීවන වෘත්තීය සුරක්ෂිතභාවය.

(b) රැකියා අවස්ථා වැඩිවීම.

(c) නිෂ්පාදන ගුණාත්මකභාවය හා වෙළෙඳ පොළ තරගකාරිත්වය වැඩිවීම.

(d) විදේශ වෙළෙඳ පොළ ඉලක්ක කර ගත් ඉහළ ගුණාත්මකභාවය හා තරගකාරී නිෂ්පාදන බිහි කිරීම තුළින් අපනයන ආදායම ඉහළ නැංවීම.

(ආ) (i) ඔව්.

පෞද්ගලික අංශ මඟින් අතිරික්ත තල් රා යොදාගෙන තල් රා යුෂ, සර්ජිකල් ස්ප්‍රීතු සහ වෙනත් අගය එකතු කළ නිෂ්පාදන සකසනු ලබයි.

(ii) (a) උසස් තත්ත්වයේ බීජ පැළ සංවර්ධනය කර ස්ථායී වගාව ප්‍රවර්ධනය කිරීම.

(b) ආදර්ශ තල් ගොවිපොළවල් පවත්වාගෙන යෑම හා නීති විරෝධී තල් ගස් කැපීම නැවැත්වීම.

(c) නිෂ්පාදන තත්ත්වය හා විවිධාංගීකරණය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ සිදු කිරීම.

(d) "කට්පහම්" - Katpaham - වෙළෙඳ නාමයෙන් දේශීය සහ අපනයන වෙළෙඳ පොළ ප්‍රවර්ධනය කිරීම.

(e) කාන්තා, තරුණ සහ රැකියා විරහිත කණ්ඩායම් සඳහා තල් ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(f) තල් යුෂ, තල් පලතුරු සහ තල් කෙඳි යොදාගෙන සිදු කරන නිෂ්පාදන මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සහ ඊට සහාය ලබා දීම. (හකුරු, පැණි, යුෂ, ජෑම්, අත්කම් නිෂ්පාදන ආදිය)

(g) සමුපකාර සමිති සහ ප්‍රජා ව්‍යාපාර ශක්තිමත් කිරීම.

(h) තල් වගාව, නිෂ්පාදනය සහ වෙළෙඳ පොළ සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීම.

(i) ප්‍රාදේශීය කාර්යාල සම්බන්ධීකරණය කර ක්ෂේත්‍ර ප්‍රගති සමාලෝචනය සිදු කිරීම.

(j) තල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ප්‍රචාරණ වැඩසටහන්, ප්‍රදර්ශන හා මහජන උත්සව සංවිධානය.

(k) වාර්ෂික "තල් බීජ වගා මාසය" සහ අනෙකුත් ප්‍රජා වැඩසටහන් පවත්වාගෙන යෑම.

(ඇ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Question under Standing Order No. 27(2).

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sajith Premadasa?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 91(ඌ) යටතේ මෙසේ සඳහන් වනවා:

"කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය."

ඒ යටතේත්, ඒ වාගේම විශේෂයෙන්ම මා පිළිබඳව මේ සභාවේ කියපු කාරණා තුළත් මගේ වරප්‍රසාද කඩවීමේ පදනම මත මම මේ කාරණය ඔබතුමාට පුන පුනාම කියන්න කැමැතියි.

මේ සභාව තුළ මම යම් කිසි කාරණයක් ඉදිරිපත් කළාම, "ඒ කාරණය බොරු, ඒ කාරණය අසත්‍යයක්, විපක්ෂ නායකවරයා හැටියට ඇත්ත කථා කරන්න ඕනෑ" යනාදී වශයෙන් මට චෝදනා මුඛයෙන් කරුණු කාරණා එල්ල වුණා. මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා, ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න.

මම කිව්වේ බොරුවක් නොවෙයි, මම කිව්වේ සත්‍යයක්. විශේෂයෙන්ම පොලීසියකින් පොලිස් සහතිකයක් ලබා ගන්නකොට මහජන ආරක්ෂක කමිටුවේ, එහෙම නැත්නම් සිවිල් ආරක්ෂක කමිටුවේ -මම දන්නේ නැහැ, මොකක්ද භාවිත කරන වචනය කියලා- අනිවාර්ය නිර්දේශය ලබා දිය යුතුයි කියන කාරණාවයි මම ඉදිරිපත් කළේ.

ඒක බොරුවක් නොවෙයි. 2025.08.21 සහ 2025.08.30 දින හක්මන පොලිස් ස්ථානාධිපතිතුමාට යවපු ලිපි දෙක මම මේ මොහොතේදී **සභාගත*** කරනවා.

කොහෙන්ද ඒ ලිපි යවන්නේ? 280 බී, බඩබද්ද ග්‍රාම නිලධාරි වසමේ මහජන ආරක්ෂක කමිටුවෙන්. කවුද ඒ ලිපි යවන්නේ? මහජන ආරක්ෂක කමිටුවේ සභාපති, යසන්ත ආරියසේන. කවුරු වෙනුවෙන්ද යවන්නේ? අබේසේකර පතිරණගේ සකුෂා රොෂානි මහත්මිය වෙනුවෙන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, since you are tabling the document, I think you can make your explanation short.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Please allow me to express my views because I was accused of uttering falsehood; මට, බොරු කිව්වා කියලා චෝදනා කළා. ඒ නිසා කරුණාකරලා මට ඒ ගැන පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. මම බොරුවක් නොවෙයි මේ කරන්නේ. මගේ වරප්‍රසාද උල්ලංඝනය වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මගේ කට වහන්න හදන්න එපා. මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩ වුණාම ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරයක් තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්න උපදෙස් දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමතියි. මම කාරණා දෙකක් කිව්වා. මම Standing Orders යටතේ තමයි ඒ ඉල්ලීම කළේ. මම Standing Ordersවල අංකයත් එක්කම කිව්වා. ඒ යටතේ තමයි මම මේක raise කරන්නේ. ඒ නිසා කරුණාකරලා මට බාධා කරන්න එපා. මම දන්නවා, ඇත්ත කථා කරනකොට බාධා එනවා කියලා. සකුෂා රොෂානි මහත්මිය පිළිබඳව තමයි මහජන ආරක්ෂක කමිටුවෙන් ලිපිය යවලා තිබෙන්නේ. මම ඒ ලිපිය සභාගත කළා. ඒ වාගේම තමයි, තෙවුනි තෙසන්යා ජයවර්ධන. *[බාධා කිරීමක්]* මට බාධා කරන්න එපා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, please, මෙතැන precedents set කරන්න එපා. මෙතැන 91 (ඌ) ස්ථාවර නියෝගය යටතේ එතුමාට point of Order එකක් raise කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* නමුත්, 91 (ඌ) ස්ථාවර නියෝගය යටතේ එතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න බලයක් නැහැ. *[බාධා කිරීමක්]* එතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක්,- *[බාධා කිරීමක්]* එම නිසා මම කියන්නේ point of Order එකකට විනාඩියකට ඇහුම්කන් දෙන්න පුළුවන් කියන එකයි. ඒකට ඇහුම්කන් දුන්නා. *[බාධා කිරීමක්]* මට නම් කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමා කොහොමද වෙලාව තීන්දු කරන්නේ? *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට පුළුවන්. ඔරලෝසුවක් තිබෙනවා නේ. ඔරලෝසුවක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායක නොවෙයි කවුරු වුණත් අපි ඔක්කොම මන්ත්‍රීවරු. ඒකට Standing Orders තිබෙනවා. ඒ නිසා මට නම් කිසිම ප්‍රශ්නයක් නැහැ, මෙතුමා ටොන් එකක් සභාගත කළත්. මට තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමා precedents set කරන්න එපා, එක එක්කෙනාගේ ලොකු පොඩිකම් බලලා. Please, Standing Orders අනුව සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යන්න. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 91 (ඌ) ස්ථාවර නියෝගය යටතේ, මගේ අදහස්වලට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම මත තමයි මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ. මම මේ ලිපි දෙක කලින් සභාගත කළා. බඩබද්ද මහජන ආරක්ෂක කමිටුවේ සභාපතිවරයා අබේසේකර පතිරණගේ සකුෂා රොෂානි මහත්මියට වාගේම තෙසන්යා ජයවර්ධන මෙනෙවියට පොලිස් සහතිකය ලබා ගැනීම සඳහා දුන්නු ලිපි දෙක තමයි මා ළඟ මේ තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, විනාඩියක් දෙන්න. කරුණාකරලා මට බාධා කරන්න එපා. මට විනාඩියක් දෙන්න. මට කියන්න තව කාරණයක් තිබෙනවා. මම මේ ලිපි කලින් සභාගත කළා. කවුද බොරු කියන්නේ, කවුද සත්‍ය කථා කරන්නේ කියන එක මේ රටම දැනගන්නට ඕනෑ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

ඊළඟට මම කියන්න ඕනෑ, යසන්ත ආරියසේන කියන බඩබද්ද ග්‍රාම නිලධාරි වසමේ සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපතිවරයා දුන්නු ලිපිය ගැන. මීට සතියකට ඉහත වනතුරුම මේ වාගේ නිර්දේශ ලබා දුන්නාය කියන එක ඔහු සහතික කරනවා. 2025.11.24 දිනැති එම ලියුමත් මම **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න. අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මාතර පොලීසියේ එළියේ ප්‍රදර්ශනය කරලා තිබුණු මෙන්න මේ දැනුම් දීම බලන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. විනාඩියක්. පොඩ්ඩක් ඉන්න. කලබල වෙන්න එපා, ඇත්ත කථා කරනකොට. පොලිස් වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි ගැන මෙහි සඳහන් වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, now that you are going to table it -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විනාඩියයි ගන්නේ. බාධා කරන්න එපා. පොලිස් වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි මොනවාද කියා මෙහි සඳහන් වනවා. මෙන්න, "සිවිල් ආරක්ෂක කමිටුවේ ලිපිය" කියලා සඳහන් වනවා. මේ දැනුම් දීම කොහේද තිබෙන්නේ? මාතර පොලීසියේ noticeboard එකේ. ඊට පස්සේ මොකක්ද දන්නවාද වුණේ? මේ පාර්ලිමේන්තුවේ මේ කාරණාව මතු කළායින් පස්සේ අද උදේ ඉඳලා ඒ කොටස විතරක් මකලා තිබෙනවා. ඒ ලේඛන දෙකම මම **සභාගත*** කරනවා.

පැහැදිලිවම මම අහන්න කැමැතියි, මම බොරුවක් කිව්වාද කියලා. මම ඇත්ත කථා කළාද, බොරුව ඇත්ත කළාද, ඇත්ත බොරුව කළාද කියන එක රටේ ජනතාව තීන්දු කරයි. අපි එහෙම බොරු කියන්නේ නැහැ. අපි එහෙම අසත්‍ය කාරණා කියන්නේ නැහැ. මම මේ සියල්ලක්ම -

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Now, we will move onto the next Item. Hon. Leader of the Opposition, the next Item in today's Order Paper -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකද ඔබතුමා මේ වෙනදාට වැඩිය බාධා කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have finished up; you have said it once.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ ඇත්ත කියන්න හදන්නේ. මට අවස්ථාව දෙන්න. මට අවසාන තත්පර 30 දෙන්න. මම මේ කාරණය කියන්න ඕනෑ. මට චෝදනා කළා, බොරු කියනවා කියලා. බොරු නොවෙයි කිව්වේ. ඇත්ත කථා කළේ. ඇත්ත වාර්තා කරපු මාධ්‍යවේදීන්ව අද CID එකට කැඳවනවා. අසික්කිතයි, නින්දිතයි. මේක පහත් ක්‍රියාවක්. මේ ක්‍රියාවේ නියැළෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Question under Standing Order No. 27(2) to be raised by the Hon. Sajith Premadasa, Leader of the Opposition.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ රීති ප්‍රශ්නය ගෙනෙන්නේ ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ. ස්ථාවර නියෝග 28ත්, ඒ වාගේම ස්ථාවර නියෝග 91 (ඌ) යටතේත් පැහැදිලි කිරීමක් කරන්නේ. රීති ප්‍රශ්නයට අවස්ථාව ඉල්ලන්නේ ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ. 28වැනි ස්ථාවර නියෝගයේ ඉතා පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

"ස්ථාවර නියෝග අන් කිසි නියමයක් කර ඇතොත් මිස, මතු සඳහන් යෝජනා සම්බන්ධයෙන් හැර, ඉදිරිපත් කිරීමට අදහස් කරන කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම්දීමක් කරනු ලැබිය යුත්තේ ය:- "

ඒ කියන්නේ එහි (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) යෝජනා සියල්ලටම ගරු කථානායකවරයාගේ ලිඛිත අවසරය අවශ්‍ය

නැහැ. ගරු විපක්ෂ නායකතුමා 28 (ඊ) යටතේ ඉල්ලන්නේ වරප්‍රසාද පිළිබඳව කාරණයක් ඉදිරිපත් කරන්න. ඒ කියන්නේ එතුමා බොරුකාරයෙක් නොවෙයි කියන කාරණය තහවුරු කිරීමේ අයිතිය. හැබැයි සභානායකගේ නීතිය ඔබතුමා ක්‍රියාත්මක කරන්න යන්න එපා, කථානායකතුමා වාගේ. ඒ නිසා සභානායකටත් කියන්න රීති කියවලා එන්න කියලා. මෙතැනට ඇවිල්ලා ඔබතුමාට පාට් දාන්න, ඔබතුමාට අභියෝග කරන්න එතුමාට බැහැ. ඔබතුමාට නියෝග කරන්න බැහැ, සභානායකට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Question under Standing Order No. 27(2) to be raised by the Hon. Sajith Premadasa.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා තමන් බොරුකාරයෙක් නොවෙයි කියලා ඔප්පු කරන්න ඕනෑ අපිට නොවෙයි රටට. මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ගොඩක් සද්දේ දැම්මාම ඔබතුමා Standing Orders violate කරලා ඉඩ දෙනවා නම් එම අවස්ථාව අනෙක් අයටත් දෙන්න කියලා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කොහේද, කොහේද - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කිසිම Standing Orders එකකින් ඒ විදියට කථා කරන්න දෙන්න බැහැ. ඒක වැරදියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමාගේ නිහතමානීකම සභාව පවත්වා ගෙන යාමට බාධාවක් කරගන්න දෙන්න එපා. *[බාධා කිරීමක්]* එහෙම නම්, ඔබතුමා මතක තියාගන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* ඔබතුමා ඇහුම්කන් දෙන්න. මොකද, වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කරන්න මේ පාර්ලිමේන්තුවේ ක්‍රමයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා මෙතැන නියෝජ්‍ය කථානායක ධුරය දරන්නේ රීති අනුව කටයුතු කරන්නයි. ආණ්ඩු පක්ෂය වශයෙන් එහෙම නම් අපට පුළුවන් නේ, මීට වඩා ගන්න. අපේ නිහතමානීකම, ආචාර ධාර්මිකම තුළ එක එක්කෙනාට විකාර කරන්න ඉඩ දෙන්න එපා. සද්දෙන් කථා කළාම බය වෙන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
සද්දෙන් කථා කරන්නේ අපි නොවෙයි.*[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සද්දෙන් කථා කළාම බයවෙන්න එපා. ඔබතුමාට තිබෙන්නෙත් Standing Orders. මොකද, ඔබතුමා මේ කළ දේ මීටත් වඩා ඉතාම අවිචාරවත්ව හැසිරෙන මන්ත්‍රීවරු පාවිච්චි කරන්න ගත්තොත් ඔබතුමා කොහොමද මේ සභාව කරගෙන යන්නේ? සභානායකවරයා වශයෙන් මට වගකීමක් තිබෙනවා, ආණ්ඩුවේ කටයුතුවලට මුල් තැන දෙමින් සභාවේ කටයුතු පවත්වා ගෙන යන්න. විධායකය සහ Legislature එක සම්බන්ධ කරන්න තිබෙනවා. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. අපි Standing Orders violate කරන්නේ නැහැ. සද්දෙ නිසා Standing Orders violate කරන්න දෙන්න එපා කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Question under Standing Order No. 27(2) to be raised by the Hon. Sajith Premadasa, Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත වරක් ඔබතුමාට කියන්න කැමතියි, ස්ථාවර නියෝග යටතේ තමයි මම මේ කරුණු මතු කළේ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, would you raise your Question under Standing Order No. 27(2)?

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පෙර පාසල් අධ්‍යාපනය ප්‍රමිතිකරණය කිරීම
### முன்பள்ளிக் கல்வியைத் தரப்படுத்தல்
### STANDARDIZATION OF PRESCHOOL EDUCATION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ශ්‍රී ලංකාවේ මුල් ළමා විය සංවර්ධනයේදී පෙර පාසල් අධ්‍යාපනය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනවා. එසේ වුවද මෙම ක්ෂේත්‍රයේ නියාමනය උදෙසා පවතින ක්‍රමවේදයේ දුර්වලතාවත්, පෙර පාසල් ගුරුවරුන්ගේ වෘත්තියේ පවතින ආර්ථික අනාරක්ෂිතභාවයත් හේතුවෙන් මෙම ක්ෂේත්‍රය තුළ ගැටලු රාශියක් නිර්මාණය වී තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ පෙර පාසල්වල විෂයමාලා ප්‍රමිතිකරණය කිරීම හා ප්‍රජාපාදක මෙන්ම පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන පෙර පාසල් නියාමනය සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීම හරහා පෙර පාසල්වල ප්‍රමිතිය ඉහළ නැංවීම සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් හදිසි මෙන්ම පොදු වැදගත්කමක් ඉස්මතු වී

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

ඇති බැවින් මෙම නිශ්චිත ක්ෂේත්‍රය සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කිරීම පිණිස පහත සඳහන් ප්‍රශ්න මම යොමු කරනවා.

1. මෙරට ක්‍රියාත්මකව ඇති සියලුම පෙර පාසල්, ඒවා පවත්වාගෙන යන ස්ථාන, අදාළ ගුරුවරුන් සහ සහායක ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කර සභාවට ඉදිරිපත් කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?
2. පෙර පාසල් ගුරුවරුන්ට දැනට ගෙවනු ලබන මාසික දීමනාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් රජයේ ඉදිරි සැලසුම කුමක්ද?
3. දැනට ගෙවනු ලබන මාසික දීමනාව ලබා ගන්නා ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද යන්න 2024 සහ 2025 වසර අනුව වෙන් වෙන්ව දක්වන්නේද? පෙර පාසල් ගුරුවරුන් සඳහා එම මාසික දීමනාව ගෙවීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද?
4. නව රජය බලයට පත් වීමෙන් පසු පෙර පාසල් ගුරුවරුන් කොපමණ සංඛ්‍යාවක් මෙම දීමනාව ලබා ගැනීමෙන් ඉවත් කර තිබේද? ඊට හේතු මොනවාද?
5. පෙර පාසල් ගුරුවරුන්ගේ ආර්ථික හා වෘත්තීයභාවය ආරක්ෂා කර වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර මොනවාද?
6. පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීමට රජය ගෙන ඇති පියවර මොනවාද?

   මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මේ ක්ෂේත්‍රය සමහරවිට පෙර පාසල් කියලාත් හඳුන්වනවා. මුල් ළමාවිය අධ්‍යාපනය කියලාත් හඳුන්වනවා. ඒ දෙකම පාවිච්චි කරනවා. මම හිතන විධියට, මුල් ළමාවිය අධ්‍යාපනය තමයි වර්තමානයේ භාවිත කරන ක්‍රමවේදය.

7. පෙර පාසල් ගුරුවරුන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම සම්බන්ධව රජයේ යෝජිත වැඩ පිළිවෙළ කුමක්ද?
8. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව සමස්ත පෙර පාසල් සඳහා එකම විෂය මාලාවක් ක්‍රියාත්මක කිරීමට රජය අපේක්ෂා කරනු ලබන බව වාර්තා වෙනවා. ඒ සම්බන්ධයෙන් සියලුම පෙර පාසල් සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් මේ වනවිට දියත් කර ඇද්ද?
9. නව විෂය මාලාවන්ට අනුකූලව පෙර පාසල් ගුරුවරු පුහුණු කිරීම් මේ වනවිට ආරම්භකොට තිබේද? එහි ප්‍රගතිය කෙබඳු ද?
10. පෙර පාසල් ගුරුවරුන්ගේ දීමනාව මාසික වශයෙන් ලබා දීම ප්‍රමාදවීම් වාර්තා වන හෙයින්, එම දීමනාව ලබා දීම සඳහා නිශ්චිත දිනයක් වෙන් කිරීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කර තිබේද? ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
11. රජයේ සහ පෞද්ගලික පෙර පාසල් ප්‍රාදේශීය මට්ටමින් ස්ථානගත කිරීම සම්බන්ධයෙන් රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන තිබේද? ඒ හරහා වත්මන් පෙර පාසල් ගුරුවරුන්ගේ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රමවේදය කුමක්ද?

ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Sajith Premadasa?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍ය අවස්ථාවක කල් ඉල්ලීමක් යෝජනා වනවිට අපි ඒකට අවස්ථාව ලබා දෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සාකච්ඡාවට භාජන වෙන්නේ, අධ්‍යාපනය පිළිබඳවයි. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන අද දවසේ අපේ රටේ මුල් ළමාවිය සංවර්ධනය, එහෙම නැත්නම් පෙර පාසල් ක්ෂේත්‍රය ගැන ප්‍රශ්නයක් මම ඇහුවේ. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ මේ ප්‍රශ්නයට අධ්‍යාපන අමාත්‍යවරිය වශයෙන් ගරු අග්‍රාමාත්‍යවරිය පිළිතුරු ලබා දෙන්න අපොහොසත් වෙන්නේ ඇයි?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Prime Minister?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Deputy Speaker, the Question was not referred to me. It was referred to the Hon. Minister of Women and Child Affairs.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, it was referred to the Hon. Minister of Women and Child Affairs.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

On the subject of early childhood education, which is under the Ministry of Education, during the Debate, we will explain what we are doing. So, our part would be done. However, I just want to reiterate that this Question was not referred to me; it was referred to the Ministry of Women and Child Affairs.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Personal Explanation by the Hon. M.S. Uthumalebbe.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Speaker, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Leader of the Opposition? Now, you got an explanation.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන මොහොතක මුල් ළමාවිය අධ්‍යාපනය එන්නේ අධ්‍යාපන ඇමතිතුමිය යටතේද කියන එකත් මම අහන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You will have an appropriate Answer. - *[Interruption.]*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
That is what I clearly said. Early childhood education comes under the Ministry of Education and during the Discussion, we will be presenting our position on that. That is exactly what I said.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Personal Explanation by Hon. M.S. Uthumalebbe.

## ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பையினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. M.S. UTHUMALEBBE

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தொல்பொருள் சார்ந்து 19 பேர் கொண்ட ஓர் ஆலோசனைக் குழு நியமிக்கப்பட்டிருப்பது உங்கள் எல்லோருக்கும் தெரியும். இது தொடர்பான வர்த்தமானி அறிவித்தல் 2025 நவம்பர் மாதம் முதலாம் திகதி, சௌஜுரௌ வெளியிடப்பட்டிருந்தது. 2025.11.15ஆம் திகதி இடம்பெற்ற 2026ஆம் ஆண்டுக்கான பாதீட்டு மீதான விவாதத்தில் நான் பேசியபோது, தொல்பொருள் சார்ந்த ஆலோசனைக் குழுவில் தமிழ், முஸ்லிம் பிரதிநிதிகள் எவரும் உள்வாங்கப்படாமல், 19 நபர்களின் பெயர்கள் குறித்த வர்த்தமானியில் வெளியிடப்பட்டுள்ளது என்பதைக் குறிப்பிட்டு, இந்த ஆலோசனைக் குழுவில் முஸ்லிம் சகோதரர் ஒருவரை இணைத்துக்கொள்ள வேண்டுமென்பதைக் குறிப்பிட்டிருந்தேன். அதற்குப் பதிலளித்த கௌரவ பிரதி அமைச்சர் முனீர் முலாபர் அவர்கள், அதில் இரண்டு முஸ்லிம் பிரதிநிதிகளை நியமித்திருப்பதாகத் தெரிவித்தார். அதற்காக நான் அவருக்கு நன்றி தெரிவித்தேன். அதன் பின்னர் பேசிய கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் கௌரவ ராமலிங்கம் சந்திரசேகர் அவர்கள், தொல்பொருள் ஆணைக்குழு பற்றிய அந்த வர்த்தமானியைச் சரியாக வாசிக்காமல், நான் இங்கே வந்து இவ்வாறு சொன்னதாகவும், யாரோ எழுதிக்கொடுத்ததை - ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் எழுதித் தந்ததை - இந்தச் சபையில் வாசித்ததாகவும், முஸ்லிம்களுக்குத் 'தண்ணி' காட்ட வேண்டாம்' என்றும் எனது சிறப்புரிமையை மீறும் வகையில் இந்தச் சபையில் மிக மோசமான வார்த்தைகளைப் பிரயோகித்திருந்தார்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் அம்பாறை மாவட்ட மக்களால் தெரிவுசெய்யப்பட்ட ஒரு பாராளுமன்ற உறுப்பினர். நான் குறித்த வர்த்தமானி அறிவித்தலை வாசிக்காமலா மேற்குறித்த விடயத்தைக் கூறியிருப்பேன்? இவ்வாறான விடயங்களை அவருடைய மட்டத்தில் நான் பேச வரவில்லை. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தலைவர் மர்ஹூம் அஷ்ரஃப் அவர்களால் வழிநடத்தப்பட்ட நாங்கள், நாகரிகமான முறையிலும் அழகான முறையிலும் சபை நடவடிக்கைகளில் ஈடுபடுகின்றோம். எவருடனும் சண்டை பிடிப்பதுமில்லை; யாரையும் ஏமாற்றியதுமில்லை; எங்களுடைய மக்களின் பிரச்சினைகளையே நாங்கள் பேசுகின்றோம்.

இந்த நிலையிலே, ஒரு பொறுப்புவாய்ந்த அமைச்சரான அவர், இவ்வாறு இந்தச் சபையில் பேசியது எங்களுக்கு வேதனை அளிக்கின்றது. இதனால் எனது சிறப்புரிமை மீறப்பட்டிருக்கிறது. எனக்கு வாக்களித்த மக்கள் நினைப்பார்கள், நான் அந்த gazetteஐச் சரியாக வாசிக்காமல் இந்தப் பாராளுமன்றத்தில் பேசியதாக. அவர் பேசிய குறித்த விடயங்கள் பற்றிய ஒலிப்பதிவொன்றை நான் இப்பொழுது சபையில் ஒலிக்கச் செய்கின்றேன். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்கள் சொன்ன விடயத்தை மட்டும் கேளுங்கள்! நீங்கள் இதைக் கண்டிப்பாகக் கேட்க வேண்டும்.

***(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්නට සලස්වන ලදී.)***
*(இவ்வேளையில் ஒலிப்பதிவொன்று ஒலிக்கவிடப்பட்டது.)*
*(At this stage, an audio recording was played.)*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, stop that please. You have made your Explanation.

We will now move on to Item No. 1 in today's Order Paper - Committee Stage on the Appropriation Bill, 2026, Fifteenth Allotted Day.

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

Hon. Members, I wish to inform this House that no Motion at the Adjournment time has been submitted for today. As decided by the Committee on Parliamentary Business at its Meeting held on 11th September, 2025, the time allotted for the Adjournment Debate from 6.00 p.m. to 6.30 p.m. will be utilized for the Committee Stage Discussion on the Appropriation Bill, 2026, with leave of the House.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.- [ප්‍රගතිය: නොවැම්බර් 24]*
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 24]*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 24th November]*
*[HON. DEPUTY SPEAKER in the Chair.]*

**126 වන ශීර්ෂය.- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 41,948,000,000

**தலைப்பு 126.- கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 41,948,000,000

HEAD 126.- MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 41,948,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

First Schedule, the Ministry of Education, Higher Education and Vocational Education - Heads 126, 212 to 215 and 335. Consideration till 6.30 p.m.

The Cut is to be moved by the Hon. (Mrs.) Rohini Kumari Wijerathna. You have 22 minutes.

[පූ.භා. 9.50]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින, එනම් 2025.11.25 අඟහරුවාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 126, 212 සිට 215 දක්වා සහ 335 දරන වැය ශීර්ෂවලින් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහන්හි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනයට සියයට 6ක් දෙනවා කියන එකේ ප්‍රකාශිකාව ලෙස ගරු අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය මැතිතුමිය වාගේම පෙළපාළි, විරෝධතා, පා ගමන් ගිය 30දෙනෙකුට වැඩි පිරිසක් නියෝජනය කරන මේ පාර්ලිමේන්තුවේදී කථා කරන්න ලැබීම මම සුවිශේෂී අවස්ථාවක් හැටියට දකිනවා. 2009 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා මහාචාර්ය සුමනසිරි ලියනගේ මහත්මයා කී කථාව සංකල්පීය ඉල්ලීමක් බවට පත් කරගෙන 2012දී පෙළපාළි ගියා; විශ්වවිද්‍යාල මාස ගණන් වහලා තිබුණා. එදා මෙදා තුර ඒ සංකල්පීය ඉල්ලීම වෙනුවෙන් විශ්වවිද්‍යාල දරුවන්ගේ, විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලවල මිනිස් පැය දහස් ගණන්, මිලියන ගණන් නැති කළා; විනාශ කළා. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියපු අය ඉන්න මේ ආණ්ඩුව මෙවර අය වැයෙන් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ සියයට 2යි.

2024 ජනාධිපතිවරණයේදීත්, මහ මැතිවරණයේදීත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියයට 70ක්, සියයට 80ක් තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ ඒ කියපු සියයට 6ක මුදල අරගෙන අධ්‍යාපනයේ තිබෙන මේ ගැටලු විසඳා ගන්නයි. 76 වසරක ශාපය අවසන් කරන්න කියලා නේ ඔබතුමන්ලා ආවේ. දැන් ඔබතුමන්ලා කියන හැටියට මේ සැප විඳින මාස 13. හැබැයි ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඉතිහාසගත වෙනවා, 2025 වර්ෂයට අධ්‍යාපනය සඳහා වෙන් කළ අඩුම ප්‍රාග්ධන මුදල්වලින් සියයට 20ක්වත් වියදම් කර ගන්න බැරි වුණු ආණ්ඩුව විධියට. එයිනුත් සියයට 12ක් වෙන් කරලා තිබුණේ පසුගිය 2024දී කළ වැඩවලට. මේ ආණ්ඩුව බිහි කරන්න වැඩිම පොරොන්දු දුන්නු, වැඩිම බලාපොරොත්තු දුන්නු, ඒ වාගේම වැඩිම පිරිසක් රැවටුණු ක්ෂේත්‍රය හැටියට අධ්‍යාපන ක්ෂේත්‍රය මම දකිනවා. මහාචාර්යවරුන්, ආචාර්යවරුන්, අධ්‍යාපනඥයන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන්, උපාධි අපේක්ෂකයන්, උපාධිධාරීන් ආදී වශයෙන් ගත් විට සියලුදෙනා තොග පිටින් රැවටුණු යුගයක්, මේක. නාසා විද්‍යාඥයනුත් රැවටුණා, ඉතින්. අන්න ඒකයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි කියන්නේ. ලියන්න, කියවන්න විතරක් නොවෙයි, ලියපු දෙයක්, කියපු දෙයක් අවබෝධ කර ගන්නත් පුළුවන් වෙන්න ඕනෑ, ගරු ඇමතිතුමිය. අන්න ඒ විධියට ආකල්ප වෙනස් වෙන්න ඕනෑ. එහෙම වුණාම තමයි නිවැරැදි සාක්ෂරතාව එන්නේ. එහෙම නැති නිසා තමයි අමු කැලෑ ගිනි තියන්නේ.

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ ප්‍රධානම ව්‍යාපෘතිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණයි. ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයි, කැබ් ව්‍යාපෘතියයි දෙකම එක වාගෙයි. මොකද, කියන්නේ එකක්, කරන්නේ එකක්; පෙන්වන්නේ එකක්, කියන්නේ තව එකක්. මෙන්න මේ විධියට තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් තිබෙන්නේ.

ගරු ඇමතිතුමියනි, අද පෙන්වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට, අම්මෙක්, අප්පෙක් නැහැ; කරපු මිනිහෙක් නැහැ. එතකොට, මේක අවජාතකයි. මේක 2017දී ආරම්භ වුණා කියලා කියන්න කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. එහි මුල් පිටු තුන අයින් කරලා, ඒක පක්ෂ අභ්‍යන්තරයෙන් හදා තිබෙනවා කියලා මුලින් කිව්වා. ඒ නිසා මම කියනවා, අද මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ -එහෙම නැත්නම් අවජාතක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ- සම්බන්ධයෙන් අප කරන්නේ ජාතකය නැතුව බණ අහනවා වාගේ වැඩක් කියලා. ඒ නිසා ගරු ඇමතිතුමිය, මම ඔබතුමියට කියනවා, ඔබතුමිය ඔබතුමියගේ අමාත්‍යාංශය කරන්න කියලා. ගරු ඇමතුමියනි, අපි එකට ඉඳගෙන හදපු, කියපු ප්‍රතිසංස්කරණ ගැන ඔබතුමිය දන්නවා. ඔබතුමියට එය මතක ඇති. ගුරුවරයෙකු මාරු කරගෙන, දවසේ වැඩ ටික කරගෙන, voice-cut එකක් දී ගෙන හිටපු අවතාරවල බලපෑම්වලට ඔබතුමිය

මේ අධ්‍යාපන අමාත්‍යාංශය යට කරන්න එපා. හැළිය සූපයේ රස නොදන්නවා වාගේ මල් වටේ කැරකෙන, ගුරුවරුන් රවටපු බඹරුන්ට අධ්‍යාපන අමාත්‍යාංශයට සහ මේ අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපෑම් කරන්න දෙන්න එපා. මොකද, ඒ අයට තේරෙන්නේ නැහැ.

ගරු අමාත්‍යතුමියනි, ගරු ජනාධිපතිතුමාටත්, ඔබතුමියටත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවේ "කාබනික වගාව - 2" නාටකය වාගෙයි කියන එක. වර්තමාන ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණත් ඒ විධියයි කියලා මම කියන්න ඕනෑ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාබනික වගාවට විද්‍යාවක් තිබුණේ නැහැ; පිළිවෙළක් තිබුණේ නැහැ; වාරයක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි ඒ ආණ්ඩුව විනාශ වීම ආරම්භ වුණේ. මෙහෙම කළොත්, ඔයගොල්ලන්ටත් වෙන්නේ ඒකමයි. මොකද, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණම තමයි ඔබගේ ආණ්ඩුව විනාශයට ගෙන යන්නේ. ගරු ඇමතිතුමියනි, මම ඔබතුමියට මතක් කරන්න ඕනෑ, අධ්‍යාපනයට අත තියන කොට ප්‍රතිපත්ති හා මූලධර්ම අමතක කරන්න නරකයි කියන එක. අධ්‍යාපනය ආයෝජනයකට වඩා මූලික අයිතිවාසිකමක් හැටියට දකින්න ඕනෑ. අධ්‍යාපනයේදී හැමටම සම අවස්ථා ලැබෙන්න ඕනෑ.

මම ඔබතුමියට මතක් කරන්න සතුටුයි, අර අප හිටපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කමිටුවේ නිර්දේශ හතර ගැන. මම ඒ ගැන ඔබතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි. එහි අංක 1 තමයි, නිදහස් අධ්‍යාපනය මූලික මූලධර්මයක් වන අතර, ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව එය අභියෝගයට ලක් නොකරයි කියන එක. 2වැනි එක තමයි, අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් වන අතර, එය සියලු ප්‍රතිසංස්කරණවලදී තහවුරු කර ආරක්ෂා කළ යුතුයි කියන එක. 3වැනි නිර්දේශය, සමානාත්මතාව හා සමාජ සාධාරණත්වය සියල්ල ආවරණය කරන ධර්මතා හා සම්මතය වනු ඇති අතර, එය ජන විශ්වාස හා දෘෂ්ටිවාදාත්මක සාධක නොසලකා සම්පත් වෙන් කිරීම හා සියලු සිසුන්ට සමාන ප්‍රවේශ සහ අවස්ථා සහතික කිරීම ඇතුළුව ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව හා සියලු ප්‍රතිසංස්කරණයන් යන දෙකම පාලනය කරයි කියන එක. හැබැයි, විෂමතා ගොඩක් තිබෙනවා. ඊළඟට තිබෙනවා, අධ්‍යාපනය ඵලදායී වන්නේ සිසුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ඇත්නම් පමණි, එබැවින් ඕනෑම ප්‍රතිසංස්කරණයක් සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස පාසල් පෝෂණය හා සෞඛ්‍ය ආරක්ෂණය ඇතුළුව සමාජ ආරක්ෂණ ජාලයන් සියල්ලම වෙනුවෙන් සහතික කළ යුතුයි කියලා. ඒක තමයි 4වැනි නිර්දේශය.

ගරු අධ්‍යාපන ඇමතිතුමියගෙන් මම අහනවා, ඔබතුමිය හදලා තිබෙනවාය කියන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඉහත කියපු නිරීක්ෂණවලින් කොයි දේද ආමන්ත්‍රණය කර තිබෙන්නේ කියලා. ඔබතුමිය ඒ ගැන කියන්න. මේක හදපු කෙනෙක් නැහැ. කුමක් ඉලක්ක කරගෙන හැදුවාද කියලා ඇහුවාම, උත්තරයක් නැහැ. මේකේ තිබෙන්නේ විෂය නිර්දේශවල සංශෝධනයක් පමණයි. විෂමතා, gaps, අඩුපාඩු අවම කරන්නට අවධානය යොමු කිරීමක් හෝ ඒ වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කර තිබෙනවා කියලා අපට පෙනෙන්නේ නැහැ. මේ reforms කරන්න මුදල් කොහෙන්ද කියන එක පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැහැ.

අපි දන්නවා, මේ අවුරුද්ද අවසන් වෙනකොට ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ඩොලර් මිලියන 130කට ආසන්න මුදලක් ඉතුරු වෙලා තිබෙන බව. මේක එම මුදල වියදම් කරගන්න කරන වැඩ පිළිවෙළක් බව තමයි අද අධ්‍යාපන අමාත්‍යාංශයේ, ඒ වාගේම පළාත් අමාත්‍යාංශවල, අධ්‍යාපන කලාපවල සහ ගුරුවරුන්ගේ අදහස වෙලා තිබෙන්නේ. මේක ඉදිරිපත් කරන්න මාස 6ක් ගියා. නමුත් මූලික ගැටලු ඒක ඇතුළේ කථා කරලා නැහැ කියා මම බොහොම කනගාටුවෙන් කියන්න ඕනෑ.

මුදල් සැපයුම ගත්තාම, 2023දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.8ක් දුන්නා. 2025 වෙනකොට ඒක 0.9ට අඩු වෙලා තිබෙනවා. අධ්‍යාපනයට මුදල් වෙන් කිරීම ගත්තාම, ලෝකයේ රටවල් ශ්‍රේණිගත කිරීම්වලින් අපි ඉන්නේ අන්තිම තැන ඉඳලා 3වැනි තැන. ඒ නිසා මම කියනවා, මේ අධ්‍යාපනය තුළ අර මුලින් කථා කරපු සමබිම හැදිලා නැහැ කියලා. සම්පත් විෂමතාව ඉතාම ඉහළයි.

මම ඔබතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි පාසල් වර්ගීකරණයට. ජාතික පාසල් තිබෙනවා. ඒකට ලොකු හැන්දෙන් බෙදනවා. ඊළඟට, පළාත් පාසල් තිබෙනවා. ඒ පළාත් පාසල් ඇතුළේත් තිබෙනවා වතු පාසල්. ඒවාට පුංචි හැන්දෙන් බෙදනවා. Type 1AB පාසල් තිබෙනවා සියයට 9.8ක්. Type 1C පාසල් තිබෙනවා සියයට 19.6ක්. Type 2 පාසල් තිබෙනවා සියයට 32.4ක්. Type 3 පාසල් තිබෙනවා, සියයට 38.2ක්. බලන්න, කොච්චර වර්ගීකරණයක් තිබෙනවාද කියලා. ඊළඟට තිබෙනවා, හොඳ පාසල් සහ නරක පාසල්. මොනවාද හොඳ පාසල් කියන්නේ? ඉතා ජනප්‍රිය පාසල් තිබෙනවා, 10,096න් 880ක්. ජනප්‍රිය පාසල් තිබෙනවා, 10,096න් 3,379ක්. 10,096න් 4,259ක් හොඳයි. ඉතිරි සියල්ල ජනප්‍රිය නොවන, දුෂ්කර සහ අතිදුෂ්කර, එහෙම නැත්නම් ළමයින් නොයා බැරිකමට යන ඉස්කෝල විධියට අද දෙමව්පියන් අතර ආකල්පයක් ඇති වෙලා තිබෙනවා. ඒ ඉස්කෝල තිබෙනවා, 10,096න් 5,837ක්. ඒ කියන්නේ, සමස්ත පාසල් සංඛ්‍යාවෙන් සියයට 57.8ක්. ඒ කියන්නේ, මේ රටේ පාසල්වලින් භාගයකට වඩා negatively viewed schools. බලන්න, මේ විෂමතාව. Type 1AB පාසලක් කියන්නේ විෂය ධාරා හතරම හදාරන්න පුළුවන් පාසල්. හැබැයි එහෙම පාසල් තිබෙන්නේ සියයට 9.8යි. මෙන්න මේ තත්ත්වය වෙනස් කරන්න ඔබතුමියගේ ප්‍රතිසංස්කරණවල උත්තර තිබෙනවාද කියලා මම අහනවා, ගරු අගමැතිතුමියනි. දුෂ්කර පාසල්වල ගුරුවරුන්ට රුපියල් 1,500ක දීමනාවක් ලබා දීම ගැන කථා කරනවා. ගමන් ගාස්තු සහ බෝඩිං ගාස්තු බැලුවාම ඒ රුපියල් 1,500න් මොකක්ද කරන්න පුළුවන් කියලා පොඩ්ඩක් හිතලා බලන්න. දුෂ්කර දීමනාව අඩුම තරමින් රුපියල් 15,000ක්වත් නොකරනවා නම් මම හිතන්නේ නැහැ, ගුරුවරු ඒ පාසල්වල තවදුරටත් කටයුතු කරන්න කැමති වෙයි කියලා.

සිසුන් සංඛ්‍යාව අනුව ගත්තාම ගරු අගමැතිතුමියනි, සිසුන් 500ට අඩු පාසල් තිබෙනවා, 7,910ක්. සිසුන් 1,000ට අඩු පාසල් තිබෙනවා, 9,219ක්. එතකොට පාසල් 10,096න් 9,219ක්ම ළමයි 1,000ට අඩු පාසල්. එතකොට, අඩුම සම්පත් ලැබී තිබෙන්නේ අන්න ඒ පාසල්වලට. ඊළඟට, ළමුන් 1,000ත්, 4,000ත් අතර සංඛ්‍යාවක් සිටින පාසල් 844ක් තිබෙනවා. ළමුන් 4,000ට වැඩි පාසල් 33ක් තිබෙනවා. ඒවායින් වැඩිම සම්පත් ප්‍රමාණයක් ලැබී තිබෙන්නේ, අන්න අර 4,000කට වැඩිය ළමයි ඉන්න පාසල්වලට. ඒ පාසල් ප්‍රමාණය සමස්ත පාසල් ප්‍රමාණයෙන් සියයට 0.32ක්. ඒ කියන්නේ, ලොකු හැන්දෙන් බෙදලා තිබෙන්නේ ඒවාට. අර පුංචි පාසල්වලට swimming pool එකක් තිබෙනවාද? ඒ පුංචි පාසල්වල AI තාක්ෂණය ගැන කථා කරනවාද? වෙන දෙයක් ඕනෑ නැහැ, smart board එකක් තිබෙනවාද?

එහෙම නම් ඔබතුමිය හොයලා බලන්න ඔය ප්‍රතිසංස්කරණවල ඒ සම්පත් බෙදී යෑම ගැන ඉඩක් තිබෙන්නේ කොතැනද කියලා. දැන් ගුරුවරු සහ යටිතල පහසුකම් වැඩිපුර ගිහින් තිබෙන්නේ කොතැනටද කියන එක ඔබතුමිය සොයා බලන්න. ඊළඟට, ළමුන් 50ට අඩු පාසල් තිබෙනවා, 1,506ක්. ඒ

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

පාසල් වැසීම, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කමිටුවේ අපි ඉදගෙන ගත්ත තීරණ නොවෙයි. ඒක ගැටලුවට විකල්පයක් නොවෙයි කියන එක මම ඔබතුමියට කියනවා. මොකද, ළමුන් පාසල් හැර යෑම ගත්තොත්, සියයට 16ක් O/Lවලට කලින් පාසල් හැර යනවා. සියයට 35ක් O/Lවලින් පස්සේ පාසල් හැර යනවා. ඉතින් මේ කුඩා පාසල් ආරක්ෂා කර ගන්න ඕනෑ ඇයි කියලා මම ඔබතුමියට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. වලපනේ, විල්ගමුව, හසලක, දඹුල්ල, රත්තොට වාගේ දුෂ්කර ප්‍රදේශවලත්, වතුකරය වාගේ දුෂ්කර ප්‍රදේශවලත් සිසුන් 50ට අඩු පාසල් වහනකොට ඔබතුමිය බලන්න, සිසුන් 50ට අඩු පාසල්වල දරුවන් 43,986ක් ඉන්නවා. ඒ පාසල්වල ගුරුවරු 8,744ක් ඉන්නවා. දැන් ඒවාට බස් දෙනවා කියලා කිව්වා. මේ පාසල්වලට බස් කීයක් දෙන්න වෙනවා ද? ඒවාට රජයේ මුදල් කොතැනින්ද වෙන් කරලා තිබෙන්නේ? මෙන්න මේවා ගැන අපි ප්‍රායෝගික වෙන්න ඕනෑ. එතකොට අපේ රටේ සිසුන් 4,000ට වැඩි පාසල් තිබෙන්නේ සමස්තයෙන් සියයට 0.3යි. ඒ පාසල්වල සිසුන් 162,930ක් ඉන්නවා. එතකොට මේ පාසල් වහනවා නම්, පළමු වසරට සිසුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛය වෙනස් නොකර, මේ ළමයි ටික යන්නේ මොන පාසලට ද? දැන් පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීමේදී අරය ගැන, විෂ්කම්භය ගැන ප්‍රශ්න හදාගෙන තිබෙනවා. කිලෝමීටර තුනෙන් තුනට පාසල් හදනවා කිව්වා. දැන් කියනවා, අරය කිලෝමීටර 3යි කියලා. එතකොට විෂ්කම්භය කිලෝමීටර 6ක්. මේ විෂමතාවට උත්තර මේ ප්‍රතිසංස්කරණවලින් එන්න ඕනෑ; සමබිම හැදෙන්න ඕනෑ. එහෙම නොවුණොත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හදලා වැඩක් නැහැ.

ඊළඟට, ගුරුවරු 10ට අඩු පාසල් 3,117ක් තිබෙනවා. ගුරුවරු 100ට වැඩි පාසල් 278ක් තිබෙනවා. මේ ගුරු තුලනය සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි. 2020 අවුරුද්දට කලින්, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේදී අපි ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියක් හදලා තිබෙනවා. මෙන්න මේවා ක්‍රියාත්මක කරලා මේ ගුරු තුලනයට වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. එහෙම නැතිව මොන ප්‍රතිසංස්කරණ ගෙනාවත් ඔබතුමියලාගේ ඔය පාසල් පාදක කර ගත්ත ඇගයීම් ටික කරන්නට ඔය දුෂ්කර පළාත්වල ගුරුවරු කොහේද ඉන්නේ? දැන් සංවර්ධන නිලධාරීන් 16,000ක් පාරේ ඉන්නවා. ඒ සංවර්ධන නිලධාරීන් අවුරුදු 5ක්, 10ක් පාසල්වල සේවය කරපු අය. කවුරු හරි වරදක් කරලා ඒ අය පාසල්වලට දාලා තිබෙනවා. හැබැයි, දැන් ඒ අය පාසල්වල සේවය කරනවා. මේ සංවර්ධන නිලධාරීන් 16,000ත් ඉවත් කළොත්, ගුරුවරු 10ට වඩා අඩු පාසල් ප්‍රමාණය තවත් වැඩි වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, මෙන්න මේවාට විසඳුම් ඕනෑ. නැවත තව ගුරුවරු 16,000ක් හදන්න අපට විද්‍යාපීඨවලින් එළියට එන අය දිහා අවුරුදු 4ක් බලාගෙන ඉන්න වෙනවා. ඒ අවුරුදු 4 ඇතුළත පද්ධතියේ සිටින ගුරුවරු විශ්‍රාම යනවා. එතකොට ගුරු හිඟය තව වැඩි වෙනවා. ඉතින් දුෂ්කර පළාත්වල සිටින පාසල් දරුවෝ තව තවත් අසරණ වෙනවා කියන එක මම මේ වෙලාවේ ඔබතුමියට මතක් කරන්න ඕනෑ.

ලංකාවේ සමස්ත ගුරු හිඟය 38,346යි. විදුහල්පතිවරු 4,000කට ආසන්න ප්‍රමාණයක හිඟයක් තිබෙනවා. දැන් විභාග තියලා, සම්මුඛ පරීක්ෂණ තියලාත් ඉවරයි. හැබැයි, බඳවා ගන්නේ නැහැ. මධ්‍යම පළාත ගත්තොත්, මේ වනකොට ලංකාවේ වැඩිම ගුරු හිඟය තිබෙන්නේ මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව කොට්ඨාසයේ. 2019 අනුමත ගුරුවරු ප්‍රමාණයෙන් සියයට 90ක් සපයන්න අපට පුළුවන් වුණා. ගුරු පුරප්පාඩු 1,668ක් පුරවා ගන්න 2023දී මධ්‍යම පළාතේ ගුරුවරු බඳවා ගන්න විභාගයක් තිබුණා. විභාග ප්‍රතිඵල අනුව මැයි මාසයේ 532ක් බඳවා ගත්තා. ජූලි මාසයේ 493ක් බඳවා ගත්තා. තව 643ක් බඳවා ගන්න පුළුවන්. ඒ අය විභාගය ලියලා පාස් වෙලා, සම්මුඛ පරීක්ෂණයටත් ගිහිල්ලා බලාගෙන ඉන්නවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, කරුණාකරලා ඒ අයව පද්ධතියට එකතු කරන්න. මොකද, ආණ්ඩු විසින් ඉස්කෝලවලට ගුරුවරු එවන කල් අපට දරුවන්ගේ වයස නවත්වා ගන්න විධියක් නැහැ. ඒ ඒ වයසට දෙන්න ඕනෑ කුසලතා, ආකල්ප සහ සංකල්ප තිබෙනවා. ඒවා ඒ ඒ වයසට දෙන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඒ පිළිබඳවත් මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා.

ඊළඟ කාරණය තමයි ගුරු විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමැතිතුමනි, ඒ කාලයේ ඔබතුමන්ලා සහ අපි එකඟ වෙච්ච සුබෝධනී වැටුප් වාර්තාව දැන් නරකද? දැන් ඒක නරකද? එම වාර්තාව පිළිගන්නවාද, නැද්ද? ඒ ගැන හැමෝටම කියන්න. මොකද, ගුරු විදුහල්පති වැටුප් විෂමතාව සම්බන්ධයෙන් සුබෝධනී වාර්තාව ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා කළ උද්ඝෝෂණයකදී අපේ ගුරුවරියක් පාරේ මැරුණා, ඔබතුමාට මතක ඇති. එම උද්ඝෝෂණවලට ඇවිල්ලා ගුරුවරියක් පාරේ මැරුණා. ඒ වාගේම තමයි, ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව විසඳා ඉතිරි තුනෙන් දෙකක හිඟ වැටුප දෙන්නේ කවදාද කියලා මම ඔබතුමන්ලාගෙන් අහනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා මේ ගරු සභාව සහ රට දැනුවත් කරන්න. විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු හා ගුරුවරුන්ගේ ආර්ථිකය පහළ දමලා. ඒ අයට ජීවත් වෙන්න පුළුවන් විධියට ඉහළ වැටුපකට ගෙනෙන්නේ නැතිව ඔවුන්ගේ මනස බිඳ දමලා ඔබතුමන්ලා මොන ආකාරයෙන්ද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්නේ කියලා මම මේ වෙලාවේ අහන්න කැමැතියි.

O/L විභාගය ලියන ළමුන්ගෙන් හතරෙන් එකක් ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි කියන විෂයයන් ෆේල්. ඒකට එක හේතුවක් තමයි, ගුරුවරු නැතිකම. එහෙම නම් ඔබතුමියගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මේවාට විසඳුම් තිබෙනවාද කියලා මම අහනවා.

ඒ වාගේම, සියලු විෂයයන් අසමත් වන දරුවන් ප්‍රමාණය ගත්තොත්, ත්‍රිකුණාමලයේ සියයට 3.8යි; මන්නාරමේ සියයට 0.8යි; මාතලේ සියයට 2.9යි. මෙහෙම විෂමතාවක් එන්නේ කොහොමද? ත්‍රිකුණාමලයේ ළමයි මන්නාරමේ ළමයින්ට වඩා බුද්ධියෙන් අඩුද? නැහැ, එහෙම එකක් නොවෙයි. මෙතැන තිබෙනවා මොකක් හෝ අපට ගළපාගන්න වෙන, අපෙන් වෙච්ච අඩුපාඩුවක්. මේ රටේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී, මේ රටේ ප්‍රතිපත්ති හැදීමේදී වෙච්ච වැරදිවලට දඬුවම් විඳින්නේ මේ රටේ දරුවෝ. ඒ නිසා මේ විෂමතාවන්ට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල උත්තර තිබෙන්නේ කොතැනද කියලා මම අහනවා. මොකද, එකම පෙළ පොත ඉගෙන ගත්තේ, එකම විද්‍යාපීඨවලින් ආපු ගුරුවරු ඉගැන්නුවේ. එහෙම නම්, මේ විධියේ disparity එකක් තිබෙන්නේ කොහොමද කියන එක පිළිබඳව ඔබතුමිය මේ සමාජය, මේ රට දැනුවත් කරන්න.

ඒ වාගේම, O/L ප්‍රතිඵල අනුව එකම කලාපයේ පාසල් ශ්‍රේණිගත කිරීම්වල සිටින තැන ගැන මම ඔබතුමියට මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. National rank එක අංක 01, දේවි බාලිකාව. එම පාසල තිබෙන කොළඹ කලාපයේම කොළඹ 14, විජයබා මහා විද්‍යාලයේ national rank එක 3,643. කිලෝමීටර 10ක්, 15ක් අතර එහෙම වෙන්නේ කොහොමද? මේ, එකම කලාපය ඇතුළේ තිබෙන පාසල්. මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, විද්‍යා විද්‍යාලය අංක 01, ඇල්කඩුව දෙමළ විද්‍යාලය 3,456. සිංහල ළමයිනුයි, දෙමළ ළමයිනුයි අතර මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ කොහොමද? මම මීට වඩා පැහැදිලිව තව දෙයක් කියන්නම්. ශ්‍රේණිගත කිරීම්වල හැටියට නාඋල කලාපයේ තිබෙන හොඳම පාසලේ national rank එක 610, ආඳාවල විද්‍යාලය

3,325. මෙහෙම වුණේ කොහොමද? ඔබතුමියගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මෙන්න මේවාට හේතු තිබෙනවාද කියන එක මම අහනවා.

ඊළඟට, type 1AB පාසලක ඉගෙන ගන්න තිබෙන අයිතිය ගත්තොත්, විල්ගමුව කලාපයේ ළමයෙකුට තිබෙන අවස්ථාව සියයට 14.69යි, ගලේවෙල කලාපයේ ළමයෙකුට තිබෙන අවස්ථාව සියයට 19.8යි, මාතලේ කලාපයේ ළමයෙකුට තිබෙන අවස්ථාව සියයට 46.5යි. මේ වාගේ විෂමතා තුළ අධ්‍යාපනයේ සම අයිතිය, සම බිම සකස් වෙලා තිබෙනවාද කියලා මම ඔබතුමියගෙන් අහනවා. ලග්ගල, පල්ලේගම ගත්තොත්, විද්‍යා විෂයන්ගෙන් ඉගෙන ගන්නට දරුවෙකුට අවස්ථාව නැහැ. ඔහු නාඋලට යන්න ඕනෑ, නැත්නම් විල්ගමුවට යන්න ඕනෑ, නැත්නම් බකමූණට යන්න ඕනෑ. හැබැයි, Advanced Level ප්‍රතිඵල ඇවිල්ලා campus එකට යනකොට ඒ ළමයා අයත් වන්නේ මාතලේ දිස්ත්‍රික්කයට. බකමූණට ගියොත් මාතලේ දිස්ත්‍රික්කයේ ඉගෙන ගත් විධියට තමයි බලන්නේ. ඒ නිසා, ඔබතුමියගේ අමාත්‍යාංශයේ මේ ප්‍රතිසංස්කරණ තුළ තිබෙන්නේ, විෂය නිර්දේශයේ සංශෝධනයක් විතරයි කියා මම කියනවා. Policy reforms නැහැ. අවුරුදු 8කට සැරයක් මේ reforms ගෙනෙන්න ඕනෑ. ඔබතුමියට මතක ඇති, 2023දීයි මේවා කෙරෙන්න තිබුණේ. මේවා ආරම්භ කරන්න ගත්තා 1-6 පන්තිවල සහ 6-10 පන්තිවල. හැබැයි, එහෙම කරන්න දුන්නේ නැහැ. එහෙම කරන්න දුන්නා නම් ළමයි 2029 අවුරුද්දේ අලුත් syllabus O/L Exam එක කරනවා. මේවාට විරුද්ධ වුණේ කවුද කියලා ඔබතුමියලා හෘද සාක්ෂියට තට්ටු කරලා අහලා බලන්න.

විභාග ක්‍රමයේ අඩුපාඩු මිසක GPA එක ගැන විශ්වාසනීයත්වය හදන්නේ කොහොමද කියන එක මේ ප්‍රතිසංස්කරණවල නැහැ. මොඩියුල ගැන කථා කරනවා. හැබැයි, මේ මොඩියුල ඇතුළේ QR code එක කියවා ගන්න මේ අහිංසක දෙමව්පියන්ට device එකක් තිබෙනවාද? එහෙම නැත්නම්, ඔබ මේ තුළ කරන්නේ නිදහස් අධ්‍යාපනය කියන එක; නොමිලේ අධ්‍යාපනය කියන එක වළ පල්ලට යැවීමක්. මොකද, පොත් බෑගයේ බර අඩු කරලා දෙමව්පියන්ගේ පොකට් එකට තට්ටු කරන වැඩ පිළිවෙළක් හැටියට විතරයි මම මේක දකින්නේ.

ගරු සභාපතිතුමනි, මම මේ සියලු තොරතුරු ඇතුළත් ලේඛන **සභාගත*** කරනවා.

මට තව පුංචි වෙලාවක් ලබා දෙන්න, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. මෙහෙම හංගලා ගහන අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් සම්බන්ධයෙන් ආරම්භයේදීම කථා කරන්නට ලැබීම සතුටක් හැටියට මම දකින්නේ නැහැ. දැනට විශ්වවිද්‍යාලවල තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි බාහිර කථිකාචාර්යවරුන්ට සල්ලි ගෙවා ගන්න බැරි එක. ප්‍රථම හා විශේෂවේදී උපාධියක බාහිර කථිකාචාර්යවරුන්ට පැයකට ගෙවන්නේ රුපියල් 1,500යි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Mrs.) Rohini Kumari Wijerathna, your time is up now.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු සභාපතිතුමනි, එතුමියට තව මිනිත්තු 5ක කාලයක් ලබා දෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු සභාපතිතුමනි, ගමන් වියදම කිලෝමීටරයට රුපියල් 12.50යි. මේවා අවුරුදු 20කට ඉස්සර දාපු ගණන්. දැන් රුපියල් 200ක සංයුක්ත දීමනාවක් ගෙවනවා. කොළඹ, කැලණිය, ජයවර්ධනපුර universities තුන අරගෙන බලන්න. මේ විශ්වවිද්‍යාල තුන අතරේවත් PickMe එකක, Uber එකක රුපියල් 2,000කින් ගිහින් එන්න පුළුවන්ද කියලා මම අහනවා. මේ සොච්චම් මුදලෙනුත් - 1,500න් - සියයට 36ක් බදු කපනවා, සංයුක්ත දීමනාවට සියයට 36ක් බදු ගහනවා. ගණන් හදලා බලන්න, මේ දෙන හිඟන දීමනාව මොකක්ද කියලා. මේ රටේ රුපියල් කෝටියකට වඩා බදු පැහැර හැරපු අය 4,570ක් ඉන්නවා. කෝටි 100ට වඩා බදු පැහැර හැරපු අය 90දෙනෙක් ඉන්නවා. හැබැයි, ඒ කාටවත් නඩු දාලා නැහැ.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමන්ට මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ මේ කාරණයත්. Visiting lecturersලාට අවුරුදු 2කින් මුදල් ගෙව්වේ නැති විශ්වවිද්‍යාල තිබෙනවා. මේක තමයි අද ඇත්තම පෞද්ගලීකරණය කියන එක. ගරු සභාපතිතුමනි, මොකද, කොළඹින් පේරාදෙණියට, වයඹට, රුහුණට කිලෝමීටරයකට රුපියල් 12.50 ගණනේ ගොන් කරත්තයකවත් යන්න බැහැ. ඒක තමයි ඇත්ත. ඒ නිසා එක්කෝ, මේ අයට ගැළපෙන විධියට ඒ දෙන දීමනාව වැඩි කරන්න ඕනෑ, එහෙම නැත්නම් පර්මිට් එකවත් දෙන්න ඕනෑ. මොකද, ළමයින්ගේ අර කියන නිබන්ධන ටික අරගෙන යන්නේ කොහොමද? ඒවා බස් එකේ ගෙනියන්න බැහැ. එහෙමත් බැරි නම්, driver, ඉන්ධන, බටා ඇතුළුව Toyota double cabsවලින් 4,244ක් විශ්වවිද්‍යාලවල අයටත් දෙන්න කියලා මම ඉල්ලනවා. මම කනගාටු වෙනවා, මේ පාර්ලිමේන්තුවේ දොස්තරලා 26කට වඩා ඉන්නවා. හැබැයි, කවදාවත් වෛද්‍යවරු ගැන, රෝගීන් ගැන සහ රෝහල් ගැන කථා කරන්නේ නැහැ. ඒ වාගේම ගුරුවරු ඉන්නවා, ඒ අයත් ඇත්ත අර්බුදය කථා කරන්නේ නැහැ. ආචාර්යවරු, මහාචාර්යවරු, විශ්වවිද්‍යාල නියෝජනය කරමින් ආපු කට්ටිය මෙතැන ඉන්නවා. හැබැයි, තම වෘත්තිකයා සහ ඒ ආයතනය ගැන කථා කරන්නේ නැහැ. මෙන්න මෙහෙම ප්‍රශ්න අද විශ්වවිද්‍යාලය ඇතුළේ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඉස්සර විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු රට ගියේ මොකක් නිසාද? ආර්ථික තත්ත්වයක් නැති නිසා. ගරු සභාපතිතුමනි, හැබැයි අද විශ්වවිද්‍යාල ආචාර්යවරු රට යන්නේ වැඩ වැඩි නිසා. මොකද, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හිඟය නිසා අද ඒගොල්ලන්ට සප්ත වාර්ෂික නිවාඩු අනුමත කරන්නෙත් නැහැ. ඒ නිසා, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔයගොල්ලන් දුන් පොරොන්දුවලින් ඉෂ්ට කළේ මොනවාද කියලා මම අහනවා. පාසල්වලට උපකරණ ටික දුන්නාද, VAT අඩු කළාද, ගුරුවරයාට තුනෙන් දෙකක හිඟ වැටුප දුන්නාද, සියයට හය දුන්නාද, කථිකාචාර්ය හිඟය නැති කළාද? ඒ වාගේම, බදු නැති වාහනයක් දුන්නාද, පර්මිට් එකක් දුන්නාද, ආකල්ප, කුසලතා වර්ධනය කරන්න වැඩ පිළිවෙළවල් හැදුවාද, හැකියාවට තැනක් දුන්නාද, ගොඩනැඟිලි හැදුවාද, භාණ්ඩ හැදුවාද? මේ කිසිම දෙයක් සිද්ධ වුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ දවස්වල විශ්වවිද්‍යාලවල මරු වැඩක් වෙනවා. රාජ්‍ය පරිපාලන ඇමති චන්දන අබේරත්න මැතිතුමාට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

මම සුබ පතනවා. ජීවත් වෙලා ඉන්න තාක්කල්ම පාවිච්චි කරන්න පුළුවන් විධියට කැලණිය විශ්වවිද්‍යාලයෙන් "සම්මානිත මහාචාර්ය" ගෞරව පදවියක් එතුමාට පිරිනමා තිබෙනවා. මීට පස්සේ හැමෝම එතුමාට මහාචාර්යතුමා කියලා අමතන්න ඕනෑ. රටටම දැන ගන්න එක නිලධාරියෙකු ලිපියක් එවලා තිබෙනවා. මුළු රටම දැන ගන්න ඕනෑ නිසා මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

මීට පස්සේ හැමෝම චන්දන අබේරත්න රාජ්‍ය පරිපාලන ඇමතිතුමාට "සම්මානිත මහාචාර්ය" නැත්නම්, "මහාචාර්ය" කියලා අනිවාර්යයෙන්ම කියන්න. ගරු අගමැතිතුමියනි, පුළුවන් නම් කැලණිය, සපුගස්කන්ද ප්‍රදේශයේ පුරවැසියෙක් වන අපේ හිටපු කථානායකතුමාටත් කොතැනින් හරි කමක් නැහැ සම්මානිත මහාචාර්ය පදවියක් අරන් දෙන්න. මොකද, එතුමා අසරණ වෙලා ඉන්නවා, උපාධි සහතිකය හොයා ගන්න බැරුව. ඒකටත් මොකක් හරි වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම හොර ආචාර්ය උපාධි ලබා දීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වහාම මැදිහත් වෙන්න ඕනෑ. මොකද, ඔයගොල්ලන් ඒ කාලයේ පෝස්ටර් ගැහුවා, "හොර උපාධි කඩ නවත්තන්න" කියලා. ඉන්දියාවෙන් ඇවිල්ලා මුදලට උපාධිය ලබා දෙන ව්‍යාපාර කිරීම අද එළිපිටම සිදු වනවා. ආණ්ඩුව අද කථිකාචාර්යවරුන් බඳවා ගන්න ඉඩ දෙන්නේ නැහැ. ප්‍රතිඵල ප්‍රමාද කරනවා. අලුත් පාඨමාලා පටන් ගැනීම ප්‍රමාද කරනවා. ඊට සාපේක්ෂව මුදල් තිබෙන ඇති හැකි අයට විකල්ප අධ්‍යාපන මාර්ග ඇති තරම් තිබෙනවා. ඒ සඳහා පෞද්ගලික අංශය ගොඩනඟා තිබෙනවා. දරුවෝ ඒවාට වේගයෙන් යනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Mrs.) Rohini Wijerathna, you have exhausted your time.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධිය හදාරන දරුවන්ට දේශන පවත්වන කථිකාචාර්යවරුන්ට දීමනා ගෙවීම නවත්වා තිබෙනවා. විශ්වවිද්‍යාලවල පවතින ආචාර්යවරුන්ගේ හිඟය පියවන්න නොහැකි වෙලා තිබෙන්නේ වැඩ බැරි අංශ ප්‍රධාන මහත්වරුන් ඉන්න නිසාය කියන එකත් මේ වෙලාවේ මම මතක් කරනවා. විශේෂයෙන්ම අද වනකොට කිහිපදෙනෙක් මේ බඳවා ගැනීම් පිළිබඳව නඩු මාර්ගයකට ගිහිල්ලා තිබෙනවා. මොකද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් විදේශ විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධි ලබා ගත් අය අපේ විශ්වවිද්‍යාලවල ආචාර්ය මණ්ඩලවලට බඳවා ගන්න මේ අය පසුබට වන නිසා.

ආචාර්ය බී.එම්.ඩබ්ලිව්. ජයසුන්දර කොළඹ විශ්වවිද්‍යාලයට එරෙහිවත්, දමිත් චතුරංග සහ ආචාර්ය නාමල් නිශාන්ත කැලණිය විශ්වවිද්‍යාලයට එරෙහිවත්, ආචාර්ය කුමුදුනී කාරියප්පෙරුම සබරගමුව විශ්වවිද්‍යාලයට එරෙහිවත් මේ විධියට නඩු පවරා තිබෙනවා. මේවා අතිශයින් බරපතළ චෝදනා. අද මේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මුහුණ දී තිබෙන තත්ත්වය පිළිබඳව විශ්වවිද්‍යාලයක සේවය කරපු කෙනෙකු හැටියට ඔබතුමියගේත් විශේෂ අවධානය යොමු කරන්න කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා. ඔබතුමිය මේ රටේ ඉන්න අධ්‍යාපනඥයන්, ප්‍රවීණයන් හැමදෙනාම එකතු කරගෙන මේ රටට වැඩදායී විධියට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හදන්න. විශ්වවිද්‍යාල පද්ධතියේ කඩා වැටීම අද සිදු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග කෙරෙහි මූලිකත්වය ලබා දෙන්න කියා ඉල්ලමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Prime Minister. You have 12 minutes.

[පූ.භා. 10.18]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Chairman, thank you for the time given.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය ගැන කථා කරන කොට ගුණාත්මක අධ්‍යාපනයක් රටක් තුළ ඇති කරන්න නම්, අධ්‍යාපනය පිළිබඳ තීරණ ප්‍රතිපත්ති මත ගත යුතුයි. ඒ, පළමුවැනි කාරණය. දෙවැනි කාරණය මෙයයි. ඒ ප්‍රතිපත්ති හදන එක පමණක් මදි. ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් ආයතනික ව්‍යුහයක් අවශ්‍යයි. ඒ දෙකම කරන්න මුදලුත් වෙන් වෙලා තිබෙන්න ඕනෑ. අපේ රටේ ඉතිහාසය පුරාම අරගෙන බැලුවොත්, මෙන්න මේ කාරණා තුන හරියට සිදු නොවීම තුළින් තමයි අද අපට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල ගැටලු ගණනාවක් මතු වෙලා තිබෙන්නේ.

නමුත් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ සියලු ගැටලු තිබියදීත්, විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන අපේ ගුරුවරුන්, විදුහල්පතිවරුන්, උසස් අධ්‍යාපන ආයතනවල නිලධාරින් අධ්‍යාපනය වෙනුවෙන් කරන සේවය තුළින් අධ්‍යාපන පද්ධතිය තුළ දරුවන්ට උගන්වන්නත්, දරුවන්ට උසස් අධ්‍යාපන අවස්ථා හදාගන්නත්, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ජාත්‍යන්තර මට්ටමින් රැකගෙන ඉදිරියට යන්නත්, ඒ quality එක පවත්වාගෙන යන්නත් අපට හැකිවෙලා තිබෙනවා. අපි 2025 වර්ෂය දෙස බැලුවොත්, එම වර්ෂය තුළ අපි ගත් ප්‍රධානම උත්සාහය තමයි, අධ්‍යාපන ප්‍රතිපත්ති අනුව තීන්දු තීරණ ගැනීම සහ ඒකාග්‍රතාවක් තුළ, ඒ ප්‍රතිපත්තිවල consistency එකත් එක්ක එකින් එකට ගැළපෙන විධියට ඒ ප්‍රතිපත්ති හරියට හදාගන්න එක. ඒ වාගේම මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට තිබෙන ආයතන සියල්ල තුළ ඇති ගැටලු විසඳමින්, එම ආයතන ශක්තිමත් කරමින්, ඒ ආයතන තුළ තිබෙන ව්‍යුහාත්මක ප්‍රශ්න හරියට හඳුනාගෙන ඒවා ආමන්ත්‍රණය කිරීමත්, 2025 වර්ෂය තුළ අපට ලැබුණු මුදල් නිසියාකාරව අදාළ ප්‍රතිපත්ති අනුව වියදම් කිරීමත්, 2026, 2027 වර්ෂවල සිට ක්‍රියාත්මක වීමට නියමිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සැලැසුම් සකස් කිරීමත් අපේ උත්සාහයන් වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සභාපතිතුමනි, ගුණාත්මක අධ්‍යාපනයක් ක්‍රියාත්මක කිරීමකදී අවශ්‍ය වන්නේ ප්‍රතිපත්ති හදන එකම විතරක් නොවෙයි, ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හොඳ සැලසුමකුත් අවශ්‍යයි. ඒ සඳහා නිලධාරින්ට නිසි විධියේ ඉලක්ක ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම වගකීම් හරියට බෙදා ගන්නත් ඕනෑ. ඒ අනුව planning system එක - ප්‍රතිපත්ති අනුව තිබෙන plan එක හදන එක - අතිශයින්ම වැදගත් වනවා. අපේ ඉතිහාසය තුළ තිබුණු ප්‍රතිපත්ති දිහා බැලුවොත්, විශේෂයෙන්ම 1994න් පස්සේ පාසල් අධ්‍යාපනයේ විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීමට ඉදිරිපත් වෙලා තිබෙන යෝජනා බොහොමයක් එකින් එකට සමානයි. ඒ තුළ විශාල වෙනස්කම් නැහැ. නමුත් අපට ඒවා හරියට ක්‍රියාත්මක කරන්න බැරි වුණු ප්‍රධාන හේතු තමයි, ප්‍රතිපත්ති නිර්මාණය වුණාට ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම්කරණයත්, ආයතනික ව්‍යුහයත්, මුදල් වෙන් කිරීමත් හරියට සිද්ධ නොවීම.

ගරු සභාපතිතුමනි, 2025 වර්ෂය තුළ අන්න ඒ ප්‍රශ්න විසඳන්න සාධනීය පියවර කිහිපයක් ගන්න පුළුවන් වීම පිළිබඳවත්, ඒකාග්‍රතාවෙන් යුතුව ප්‍රතිපත්ති අනුව, ඉලක්ක අනුව, සැලසුම් අනුව ක්‍රියාත්මක වන ආයතනික පද්ධතියක් ගොඩනඟන්න අපට පුළුවන් වීම පිළිබඳවත් මම සතුටු වනවා. ඒ සඳහා එකතුවෙලා වැඩ කරපු නිලධාරින් සියලුදෙනාත්, මේ පරිවර්තනය කරන්න මැදිහත් වෙච්ච නිලධාරින් සියලුදෙනාත් මේ අවස්ථාවේදී මම අගය කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශය මූලික කරගෙන අප ගන්නා සියලුම තීන්දු තීරණවලට අදාළ වන thrust areas 4ක් තිබෙනවා. ඒ කියන්නේ අපි focus කරන මූලධර්ම, thrust areas 4ක් ඔස්සේ තමයි අපි ක්‍රියාත්මක කරන්නේ. පළමුවැනි එක, සමානාත්මතාව. ඒ කියන්නේ, අධ්‍යාපනය තුළ තිබෙන විෂමතා අඩු කරන්න මැදිහත් වීම. දෙවැනි එක, ගුණාත්මකභාවය වැඩි කිරීම. තුන්වැන්න, අධ්‍යාපන පාලනය, ආණ්ඩුකරණය දියුණු කිරීම. හතරවැනි එක, දත්ත සහ විද්‍යාත්මක පදනමක් මත ප්‍රතිපත්ති සකස් කිරීම. 2025 වර්ෂය තුළ අපට පුළුවන් වෙලා තිබෙනවා, මෙන්න මේ කරුණු වෙනුවෙන් මැදිහත්වෙලා සැලසුම්කරණයක් තුළ, ශක්තිමත් ආයතනික ව්‍යුහයක් තුළ, විද්‍යාත්මක පදනමක් මත නිර්මාණය වන ප්‍රතිපත්තිවලට ගැළපෙන විධියට අනෙකුත් තීන්දු තීරණ අරගෙන වැඩ කරන්න. ඒ ගැන මම සතුටට පත් වනවා.

ගරු සභාපතිතුමනි, ආයතනික ව්‍යුහය දුර්වල වීම නිසා ඇතිවෙලා තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් මම මේ අවස්ථාවේදී උදාහරණයක් කියන්නම්. මීට පෙර මේ පාර්ලිමේන්තුවේදී විපක්ෂයෙන් සහ ආණ්ඩුවෙන් මතු කර තිබුණා, Gampaha Wickramarachchi University of Indigenous Medicine එක තුළ පැන නැඟී තිබෙන ප්‍රශ්නය. ගරු සභාපතිතුමනි, ඊට අදාළව අපි පත් කරපු කමිටුවක් විසින් ඉදිරිපත් කර තිබෙන වාර්තාව මම සභාගත කරන්නම්. ඒ වාර්තාවෙන් පෙන්නුම් කරනවා, පසුගිය කාලය තුළ මේ තීන්දු තීරණ ගන්නා ක්‍රියාවලිය කොච්චරදුරට කඩා වැටිලා තිබුණාද කියලා. අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රතිපත්ති මත, මූලධර්ම මත තීන්දු තීරණ ගන්නේ නැතිව, අතිශයින්ම පෞද්ගලිකහේතු මත, අතිශයින්ම පටු දේශපාලන පදනම් මත, දේශපාලන සම්බන්ධතා මත, යහළු මිත්‍රකම් මත තීන්දු තීරණ ගත් යුගයක් නිසා විශ්වවිද්‍යාලවල ගුණාත්මකභාවය විතරක් නොවෙයි, උපාධිය බලාපොරොත්තුවෙන් ඇතුළත් වෙලා සිටින ඒ දරුවන්ට සිදුවෙලා තිබෙන අසාධාරණය පිළිබඳව දැනගන්නත් මේක ඉතාම හොඳ වාර්තාවක්. ඒ නිසා මම ඒ වාර්තාව **සභාගත*** කරනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

ගරු සභාපතිතුමනි, මෙන්න මේ විධියට තමයි අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ සියලු ආයතන එකින් එක අරගෙන බැලුවාම ඒ කඩා වැටීම දක්නට ලැබෙන්නේ. අපි හිතනවා, 2025 වර්ෂය තුළ අපට ඒක reverse කර ගන්න පුළුවන් වුණා කියලා. ප්‍රතිපත්ති මත තීන්දු තීරණ ගන්න, සහයෝගීතාවෙන්, කණ්ඩායමක් හැටියට ඉලක්ක සහගතව, සැලසුම් අනුව වැඩ කරන තැනකට මේක ගන්න අපට සෑහෙන දුරකට පුළුවන් වුණා කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවේදී කථා වුණා, අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරපු මුදල් ගැනත්. එතැනදී අපට පිළිගන්න වෙනවා, අවුරුදු ගණනාවකට පසුව අධ්‍යාපනයට වෙන් වුණු වැඩිම මුදල 2026 අය වැය තුළින් වෙන් වෙලා තිබෙන බව. අධ්‍යාපනයට 2026 අය වැය තුළින් තමයි වැඩිම මුදල වෙන් වෙලා තිබෙන්නේ, ගරු සභාපතිතුමනි. ඒ, රුපියල් බිලියන 7.04ක්. Rs. 704,308 million has been allocated for education. That is 2.04 per cent of GDP. ගරු සභාපතිතුමනි, අපි කොතැනකදීවත් කිව්වේ නැහැ, අපේ පළමුවන වසර තුළ අධ්‍යාපනයට සියයට 6ක් දෙනවා කියලා. 2012 අවුරුද්දේ සිට ඒ සටන වෙනුවෙන් පෙනී හිටපු අය මෙතැන ඉන්නවා. අපි ඒ වෙලාවේදීවත් කිව්වේ නැහැ, අපේ පළමු වසර තුළ එක වතාවටම අධ්‍යාපනය වෙනුවෙන් සියයට 6ක් දෙන්න ඕනෑ කියලා. මොකද, අපි දන්නවා, ප්‍රතිපත්ති හදමින්, ආයතනත් ශක්තිමත් කරමින් තමයි එතැනට යන්න පුළුවන් වෙන්නේ කියලා. නිකම් මුදල් දැම්මාට මේ ප්‍රශ්න විසඳන්න බැහැ. එම නිසා ගරු සභාපතිතුමනි, අපි පසුගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ අධ්‍යාපනයට වැඩියෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මේක තමයි, trend එක. ආයතන ශක්තිමත් කරමින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන වේගයත් සමඟ අපි වෙන් කරන මුදල් ප්‍රමාණය අනිවාර්යයෙන්ම වැඩි වෙනවා. මේ අවුරුද්දේ වෙන් කළ 2.04 per cent පසුගිය වසර ගණනාවක් තුළ අධ්‍යාපනයට වෙන් වුණු වැඩිම මුදල කියන එකත් මම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම අපේ අමාත්‍යාංශයට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රාග්ධනය වෙනුවෙන්ම රුපියල් මිලියන 3,000ක් වෙන් වෙලා තිබෙනවා. ඒ අනුව තමයි අපි මේ සියල්ලම සැලසුම් කරගෙන යන්නේ.

ගරු සභාපතිතුමනි, අපි 2025 වසරේ කරපු වියදම පිළිබඳව මේ සභාවේ කථා වෙනවා. මම මතක් කරන්න ඕනෑ, අපි මේ වියදම් ඉදිරිපත් කරන්නේ 2025 මැයි මාසයේ සිට කියන එක. මාර්තු අග තමයි අපේ අය වැය සම්මත වුණේ. මැයි 01වැනි දා ඉඳන් ඔක්තෝබර් මාසයේ 15වැනි දා දක්වා තමයි අපි මෙතැනදී මේ මුදල් වියදම් කිරීම පිළිබඳව වාර්තා කරන්නේ. අපි බිල් සියල්ලම ගෙවලා සම්පූර්ණ කරලා තිබෙනවා. ඒ අනුව අපේ completed financial progress එක සියයට 18ක්. ඒ වාගේම, with commitment, වැඩ ආරම්භ කරලා දෙසැම්බර් මාසය වෙනකොට අවසන් කරන්න බලාපොරොත්තු වන ඒ ව්‍යාපෘති ටිකත්, ඒ මුදල් ප්‍රමාණයත් ගත්තාම, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගතිය සියයට 69යි, ගරු සභාපතිතුමනි. මීට පෙර කිසි අවස්ථාවක මේ විධියේ කාර්යක්ෂමතාවක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පෙන්නුම් කරලා නැහැ. එවැනි කාර්යක්ෂමතාවක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පෙන්නුම් කරන්න හැකි වෙලා තිබෙන්නේ ඇත්තවශයෙන්ම නියෝජ්‍ය ලේකම්වරු, අතිරේක ලේකම්වරු ඇතුළු නිලධාරින් සියලුදෙනාටම targets දීලා, department අනුව ඉතාම කිට්ටුවෙන් monitor කරලා, අපිට මේ ඉලක්කවලට යන්න පුළුවන් වුණු නිසායි. අපිට ලොකු විශ්වාසයක් තිබෙනවා, 2026 - 2027 වනකොට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මීට වඩා ප්‍රගතියක් පෙන්නුම් කරයි කියලා. ගරු සභාපතිතුමනි, මම ඒ සම්බන්ධයෙන් ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ, මම අවසානයට පිළිතුරු කථාව කරන්න කාලය ඉතුරු කරගන්න ඕනෑ නිසාත්, අපේ කථිකයින් බොහෝදෙනෙක් මේ කරුණු තවදුරටත් ඉදිරිපත් කරන්න සූදානමින් ඉන්න නිසාත්.

[ගරු හරිනි අමරසූරිය]

මේ කාරණයත් කියලා මගේ කථාව නතර කරන්නම්, ගරු සභාපතිතුමනි. අපිට අභියෝග තිබෙනවා, අභියෝග නැතුවා නොවෙයි. අපි විශාල වැඩක් මේ ආරම්භ කරලා තිබෙන්නේ. දුර්වලතා බොහොමයක් තිබෙන ක්ෂේත්‍රයක් තමයි, අපි මේ දියුණු කරමින් ඉදිරියට ගෙනියන්න උත්සාහ කරන්නේ. අපි හඳුනාගෙන තිබෙනවා, තව දියුණු විය යුතු ක්ෂේත්‍ර ගණනාවක්. විශේෂයෙන්ම ජනතාවට ලබා දෙන සේවාවේ කාර්යක්ෂමතාව - efficiency එක - වැඩි වෙන්න ඕනෑ. පාසලකට යන ඕනෑම දරුවෙකුට, දෙමව්පියෙකුට දැනෙන්න ඕනෑ, ඔවුන්ගේ මොකක් හරි ගැටලුවක් ඉක්මනින් විසඳෙනවා කියලා. ගුරුවරයෙක්, විදුහල්පතිවරයෙක් ප්‍රශ්නයක් මතු කළාම, විශ්වවිද්‍යාලයක, උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රශ්නයක් පිළිබඳව මතු කළාම ඒ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න බැරි වුණත්, අඩුම තරමින් ඒ සම්බන්ධයෙන් ඉක්මනින් ප්‍රතිචාරයක් දක්වන්න ඕනෑ කියලා අපි හිතනවා. ඒකට අපේ responsiveness වැඩි වෙන්න ඕනෑ; ඉහළ සිට පහළ දක්වාම ඉලක්ක සහගතව, එකම ප්‍රතිපත්තියක් අනුව වැඩ කිරීමේ ප්‍රවණතාව අපි තව දියුණු කරන්න ඕනෑ. Disparities අඩු කරන්න අපට තව මහන්සි වෙන්න වෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, disabled community වෙනුවෙන් අපි පියවර ගණනාවක් ගත්තා. නමුත්, ඒ ගත්ත පියවර ප්‍රමාණය මදි. ඒවා තව දියුණු වෙන්න ඕනෑ. විෂය මාලාවේ ප්‍රතිසංස්කරණය 2026 අවුරුද්දේ ඉඳන් ක්‍රියාත්මක වෙනකොට operational ගැටලු එයි. ඒවා වෙනුවෙන් අපි ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත්, අපි මේ අභියෝග භාරගෙන ප්‍රතිපත්ති පිළිබඳ පැහැදිලි අදහසක් එක්ක කටයුතු කළ යුතුයි. ඒවා හුදෙක් ප්‍රතිපත්ති ලෙස පමණක් නොව, ඒවා සැලසුම් බවට පත් කරගෙන ඉලක්ක -target- එක්ක යන ගමනක් අපි මේ වනකොට ආරම්භ කරලා තිබෙනවා. 2025 අවුරුද්ද තුළ ලබා තිබෙන ප්‍රගතිය ගැන අපි සතුටු වන අතර, මේක අපේ දීර්ඝකාලීන වැඩක් නිසා අවුරුද්දෙන් අවුරුද්ද මේ ප්‍රගතිය පෙන්නුම් කරන්න, රටේ සියලු දරුවන්ට, තරුණයින්ට, වැඩිහිටියන්ට අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු වෙන විධියට වැඩ කරන්න අප අධිෂ්ඨාන කරගෙන ඉන්නවා. අපිට ඒක කරන්න පුළුවන් කියන විශ්වාසයත් අපි තුළ තිබෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Thurairasa Ravikaran. You have seven minutes.

[மு.ப. 10.32]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தவிசாளர் அவர்களே, கௌரவ கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சர் அவர்களே, கல்வியில் தரம், சமத்துவம் மற்றும் தனிச்சிறப்பை அடைதல் எனும் இலக்கில் 2026க்கான கல்விச் செயற்பாடுகள் நகர்கின்றன. உலகளாவிய நியமங்களுக்கு ஒத்திசைந்து, இலங்கையின் பொதுக்கல்வி நிலைமாற்றத்துக்கான புதிய கல்வி மறுசீரமைப்பு மாணவர்களுக்குக் கூடுதல் திறன், வாய்ப்புகளை அளிக்க முயல்கிறது. இலங்கையில் 2026இலிருந்து தொடங்கவுள்ள கல்வி மறுசீரமைப்பு முயற்சிகளை நாம் வரவேற்கின்றோம். மாணவர்களுக்கான காகிதாதிகள் கொடுப்பனவு, மாற்றுத்திறன் மாணவர்களுக்கான உதவுதொகை, உயர் கல்வி பயிலும் மாணவர்களுக்கான உதவுதொகை, கஷ்டப் பிரதேச பாடசாலைகளில் கற்பிக்கும் ஆசிரியர்களுக்கான கொடுப்பனவு, அதிபர்களுக்கான நிருவாகக் கொடுப்பனவில் அதிகரிப்பு உள்ளிட்ட முயற்சிகளும் வரவேற்புக்குரியன.

கௌரவ தவிசாளர் அவர்களே, சிறந்ததோர் எதிர்காலத்தைக் கட்டமைப்பதற்கு நிகழ்காலத்தின் மாணவர்கள் சிறந்த அறிவு, திறன், மனப்பாங்கு உடையவர்களாக இருக்க வேண்டும். மாணவர்களின் அடித்தளம் முன்பள்ளிக் கல்வியில் இருந்து தொடர வேண்டும். முறையாக மேற்பார்வை செய்யப்படாத அத்திவாரத்தோடு பல மாடிக் கட்டடங்களைக் கட்டுவதற்கு ஒப்பான ஒரு கலைத்திட்ட நடைமுறையே இங்குள்ளது. எந்தக் கட்டடம் எப்போது விழுமெனத் தெரியாதிருப்பதற்கு ஒப்பான ஒரு கலைத்திட்ட நடைமுறையே இது.

தரம்-1 தொடக்கம் நடைமுறைப்படுத்தப்படும் இலவசக் கல்வி நடைமுறை இதுவரை முன்பள்ளிகளில் உறுதிப்படுத்தப்படவில்லை. முன்பள்ளிகளின் தரத்தை உறுதிப்படுத்தல், முன்பள்ளிகளிடையே நிலவும் வளச் சமச்சீரற்ற நிலையை இழிவளவாக்கல் என்பவற்றுக்கான எட்டக்கூடிய தீர்வுகளை 2026க்கான வரவு செலவுத்திட்டம் காட்டவில்லை. 2027இலிருந்து முன்பள்ளிகளில் நடைமுறைப்படுத்தப்படவுள்ள பொதுக் கலைத்திட்டத்தை முன்னிட்டு, ஆசிரியர்களுக்கான பயிற்சிகள், முன்பள்ளிகளுக்கான வள ஒதுக்கீடுகள் என்பவை தொடர்பிலும் தெளிவான நிலைப்பாட்டை 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் காட்டவில்லை. பொதுக்கல்வி வலுவூட்டலிலும் தாங்கள் முன்வைக்கும் தரம், சமத்துவம் மற்றும் தனிச்சிறப்பை அடைதல் என்பன வன்னியில் உள்ள பெரும்பாலான பாடசாலைகளுக்கு 2026இலும் சவாலாகுமா? என வினவுகிறோம். பொதுக்கல்வி நிலைமாற்றத்துக்கான புதிய கல்வி மறுசீரமைப்பில் ஒரு கணினியேனும் இல்லாத பாடாசலைக்கு, ஒரு திறன் வகுப்பறையேனும் இல்லாத இடைநிலைப் பாடசாலைக்கு, இணைய வசதியற்ற பாடசாலைக்கு, விஞ்ஞான ஆய்வுகூட வசதிகள் நடைமுறைச் சாத்தியமற்றிருக்கின்ற இடைநிலைப் பாடசாலைக்கு 2026இல் நீங்கள் சொல்லும் பதில் என்ன? வாய்ப்புப் பார்த்தலா! வன்னியில் உள்ள பெரும்பாலான பாடசாலைகள் தீவின் கல்விச் சமத்துவத்தில், தீவின் கல்வித் தரத்தில், தீவிலே தனிச்சிறப்பை அடைவதற்கான வாய்ப்பைப் பெறுவதில் மிகுந்த சவால்களை எதிர்நோக்குகின்றன.

வட மாகாணத்தில் ஆரம்பக் கல்வியில் மட்டும் 300க்கும் மேற்பட்ட ஆசிரியர் பற்றாக்குறை காணப்படுகின்றது. அரசின் கலைத்திட்ட நடைமுறையில் முன்பள்ளிக் கல்வி மீதான முறையான மேற்பார்வை இல்லை. இந்நிலையில், ஆரம்பக் கல்விக்குப் பாடசாலைக்குள் நுழைகின்ற மாணவர்களுக்கு அங்கும் போதுமான ஆசிரியர் இல்லாதிருப்பதால் மாணவர்கள் பத்து வயதுக்குள் பெறவேண்டிய எண், எழுத்தறிவுத் திறன் மிகவும் கேள்விக்குள்ளாகின்றது. கொரோனா இடர்காலத்தில் கற்றல் தடங்கல் தொடர்பில் 3ஆம் வகுப்பு மாணவர்களின் எண், எழுத்து தொடர்பாக கல்வி அமைச்சால் மேற்கொள்ளப்பட்ட ஆய்வில், வட மாகாணத்தில் 16 சதவீத மாணவர்களும் கிழக்கு மாகாணத்தில் 25 சதவீத மாணவர்களும் மட்டுமே வயதுக்கேற்ற வாசிப்புத் திறனைக் கொண்டிருப்பதாகச் சுட்டிக் காட்டப்பட்டது. கடந்த தரம் 5 புலமைப் பரிசில் பெறுபேற்றின் முடிவுகளின் அடிப்படையில், இரண்டு பகுதிகளிலும் 35இலும் கூடிய புள்ளியை எடுத்த மாணவர்களின் சதவீதத்தில், தேசிய அளவிலான 70.43

வீதத்திலும் குறைவான சதவீதத்தையே வட, கிழக்கிலுள்ள அனைத்து மாவட்டங்களும் பெற்றுள்ளன. மேற்படி அடைவுநிலையானது, ஒப்பீட்டளவில் வட, கிழக்குப் பகுதிகளில் ஆரம்பக் கல்வியில் மாணவர்களின் எண், எழுத்துத் திறனை மேம்படுத்த வேண்டிய தேவையைச் சுட்டிக் காட்டுகின்றது.

பல ஆண்டுகளுக்கு முன்னர் கட்டத் தொடங்கி கிடப்பில் போடப்பட்டு முழுமையடையாத வகுப்பறைக் கட்டடங்களைக் கட்டி முழுமைப்படுத்துவதற்கு இன்னும் எத்தனை ஆண்டுகள் உங்கள் அரசுக்குத் தேவை? வவுனியா தெற்கில் 10 பாடசாலைகள், மன்னாரில் 5 பாடசாலைகள், வவுனியா வடக்கு மற்றும் முல்லைத்தீவு கல்வி வலயங்களில் தலா 2 பாடசாலைகளில் முழுமைப்படுத்தப்படாத கட்டடங்கள் வகுப்பறைத் தேவைகளோடு காணப்படுகின்றன. மன்னார் கல்வி வலயத்தில் மட்டும் இணைய வசதிகளற்ற 45 பாடசாலைகள், ஒரு மேசைக் கணினிகூட இல்லாத 26 பாடசாலைகள், 72 பழுதடைந்த மடிக் கணினிகள், 126 பழுதடைந்த வரைபட்டிகைகள், 22 பழுதடைந்த திறன் தளங்கள், 539 பழுதடைந்த மேசைக் கணினிகள், 13 பழுதடைந்த திறன் தொலைக்காட்சிகள் என மொத்தமாக 772 கணினிச் சாதனங்கள் பழுதடைந்து காணப்படுகின்றன.

முல்லைத்தீவு கல்வி வலயத்தில் மட்டும் மேற்படி வகையில், 522 மேசைக் கணினிகள் அடங்கலாக மொத்தம் 870 இலத்திரனியல் சாதனங்கள் பழுதடைந்து காணப்படுகின்றன. வவுனியா தெற்கு வலயத்தில் மேற்படி வகையில், 318 மேசைக் கணினிகள் அடங்கலாக மொத்தம் 488 இலத்திரனியல் சாதனங்கள் பழுதடைந்து காணப்படுகின்றன. இவ்வாறு ஏனைய 3 கல்வி வலயங்களிலும் காலங்கடந்த, பழுதடைந்த, பதிவழிக்கப்பட வேண்டிய கணினிகள் ஏராளமாகக் காணப்படுவதோடு, கலைத்திட்ட நடைமுறைக்கான இரத்திரனியல் சாதனத் தேவையும் மிகுதியாக உள்ளது. ஆரம்பப் பாடசாலைகளில் நிருவாகத் தேவைகளை ஆற்றுவதற்கு ஒரு கணினியையேனும் ஒவ்வொரு பாடசாலையும் கொண்டிருப்பதைத் தங்களது 2026ஆம் ஆண்டுக்கான வரவு செலத்திட்டம் உறுதிப்படுத்தாதா? பொதுக்கல்வி நவீனமயப்படுத்தல் திட்டம் உள்ளிட்ட சில திட்டங்கள் ஊடாக தெரிந்தெடுக்கப்பட்ட சில பாடசாலைகளுக்கு மட்டும் ஒவ்வொரு கணினி வீதம் வழங்கி எப்போது பாடசாலைகளில் கல்வி நிலைமாற்றத்தை ஏற்படுத்தப் போகின்றீர்கள்?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Thurairasa Ravikaran, your time is up.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
தயவுசெய்து ஒரு நிமிடம் தாருங்கள்!

100 மாணவர்களுக்கு ஒரு மலசலகூடம் என்ற விதிமுறையில் பாடசாலைகளுக்குரிய மலசலகூடங்களை மட்டுப்படுத்துகின்றீர்கள். 100, 200 மாணவர்களைக்கொண்ட பாடசாலைகளுக்கு இது எவ்வாறு பொருந்துமென எண்ணிப் பாருங்கள்! 15 நிமிட இடைவேளையில் ஒன்றன்பின் ஒன்றாக எத்தனை மாணவர்கள் சிறுநீர் கழிக்க முடியும்? அதன் பின்னரும் கை, கால் கழுவி எத்தனை பேரால் அந்த 15 நிமிட இடைவேளையில் சாப்பிட முடியும்? போதியளவு நீர் குடிக்காது, சிறுநீரைக் கட்டுப்படுத்தி பிள்ளைகளுக்கு உடல் உபாதைகளைத்தான் இந்த முறைமை தோற்றுவிக்கும். பாடசாலைகளில் போதியளவு மலசலகூடங்களின் நிர்மாணத்துக்கும் அதேபோல, மலசலகூடங்களின் திருத்தங்கள் மற்றும் பராமரிப்புக்கும் போதுமான நிதி ஒதுக்கீடு கடந்த காலங்களிலும் கிடைக்கப் பெறவில்லை; 2025இலும் கிடைக்கப் பெறவில்லை. 60 பாடசாலைகளைத் திருத்தத் தேவையுள்ள கல்வி வலயம் ஒன்றுக்கு, 20 பாடசாலைகளுக்கே அந்த நிதி ஒதுக்கப்படுகின்றது.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon, Member, would you please wind up?

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, 30 செக்கன் தாருங்கள்!

திருத்தம் மற்றும் பராமரிப்புக்கான மட்டுப்படுத்தப்பட்ட நிதி ஒதுக்கீடுகளால் மலசலகூடங்கள் உள்ளிட்ட பல பௌதிக வளங்கள் பாவனைக்கு உதவாத நிலைக்கு மாறுகின்றன. மட்டுப்படுத்தப்பட்ட பௌதிக வளம், மட்டுப்படுத்தப்பட்ட மனித வளம், 2026இல் நடைமுறைக்கு வரவுள்ள கல்வி மறுசீரமைப்புக்கு மட்டுமல்ல, தற்போதுள்ள கலைத்திட்டத்தை நடைமுறைப்படுத்தவே போதியளவு தொழில்நுட்ப வசதிகளின்றி, விஞ்ஞான ஆய்வுகூட வசதிகளின்றி, மற்றோர் ஆண்டு அதாவது 2026இலும் நீங்கள் இலக்கு வைத்துள்ள கல்வியில் தரம், கல்வியில் சமத்துவம், கல்வியில் தனிச்சிறப்பை அடைதல் என்பன வன்னிக்கு எட்டாக்கனியாகவே அமையவுள்ளதா?

கௌரவ அமைச்சர் அவர்களே, ஒரு காலத்தில் மொத்தத் தேசிய உற்பத்தியில் 6 சதவீதம் கல்விக்கு எனப் போராடிய ஒருவரே நீங்கள்! இன்று கல்வி அமைச்சராகும்போது, அதன் பாதியைக்கூட கல்விக்காக ஒதுக்க இயலவில்லை.

'சொல்லுதல் யார்க்கும் எளிய அரியவாம்
சொல்லிய வண்ணம் செயல்!'

நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Chamara Sampath Dasanayake. You have 15 minutes.

[පූ.භා. 10.41]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභාපතිතුමනි, අද අධ්‍යාපන අමාත්‍යාංශය ගැනයි කථා කරන්නේ. ඒ, අපේ රටේ අග්‍රාමාත්‍යතුමියගේ අමාත්‍යාංශය. කනගාටුවෙන් වුණත් මම මේ වෙලාවේදී යම් කාරණයක් කියන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරන සමහර අයට පොඩ්ඩක් හැසිරීම ගැනත් කියලා දෙන්න වෙයි. මොකද, කාන්තාවන්ගේ ඇඟ ගැන, කැත, ලස්සන ගැන කථා කරලා පත්තරවල හැම විධියකින්ම පහර ගහනවා. උදේත් ගහනවා. ගිය සතියේත් පහර ගැහුවා. මගේ ඇඟ ගැන නම්

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

අධිකරණ ඇමතිතුමා කිව්වා. මගේ ඇඟ ගැන කිව්වාට කමක් නැහැ. අපි පිරිමි නේ. හැබැයි, කාන්තාවන් ලස්සනයි, කැතයි, මහතයි කියන්නේ, ඒවා නිකම් අනවශ්‍ය කථා. එතුමාට හැදෙන්න කියන්න. ජනාධිපතිතුමාට කියන්න අයින් කරන්න කියලා. ඔය වාගේ මිනිස්සු අධ්‍යාපන ක්ෂේත්‍රයේ තියාගෙන කටයුතු කරන්නේ කොහොමද? අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කටයුතු කරන්න බැහැ ඔය වාගේ අය තියාගෙන. ඒක අපි මේ වෙලාවේ කියන්න ඕනෑ. අපි විතරක් නොවෙයි, අද රටේම මිනිස්සු කියනවා, ඒ කථාව. මෙතැන වැදගත් මිනිස්සු ඉන්නේ. NPP එකේත් සභානායකතුමන්ලා, අනෙක් කට්ටිය ගැන අපි ඉතිහාසයේ ඉඳන් දන්නවා. ඒ අයට වැදගත්කමක් තිබෙනවා. අර විධියට හැසිරෙන්න ගියාම ඒක එච්චර හොඳ නැහැ. අපේ පක්ෂයක නම් අද එයාව අයින් කරනවා. අපේ පක්ෂයේ එක්කෙනෙක් ගැන මම කිව්වා. ඒ, ඊයේ පෙරේදා මැයි පෙළපාළියට අලුතෙන් ආපු එක්කෙනෙක්. මම කිව්වා, එයා පක්ෂයෙන් අයින් කළේ නැත්නම් මම පක්ෂයට එන්නෙත් නැහැ කියලා. ඒක තමයි ඇත්ත කථාව.

මෙන්න මේ කාරණයත් ඇමතිවරුන්ට කියන්න. මේ රටේ මිනිස්සු බලාගෙන ඉන්නවා. මේ අයට ඉංග්‍රීසි බැරි නම් class එකකට ගිහිල්ලා ඉගෙන ගන්න කියන්න. දැන් ඇමතිවරුන්ට උගන්වන්නයි වෙලා තිබෙන්නේ. ළමයින්ට උගන්වන එක කෙසේ වෙතත් ඇමතිවරුන්ට උගන්වන්නයි වෙලා තිබෙන්නේ. ඒ ගැනත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, අගමැතිතුමියගේ ප්‍රශ්නයක් නැහැ. අපට එහෙම එකක් නැහැ. අගමැතිතුමිය ඉන්දියාවේ ගියා. එතුමිය ඉගෙන ගත්ත විශ්වවිද්‍යාලයට ගියා. මෝදි අගමැතිතුමා එතුමියට ගෞරව කළා. මෝදි කියන්නේ, රටක නායකයෙක්. එතුමා අගමැතිතුමියව මුණ ගැහුණා. ඒවාට අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ. අපේ ඇඟේ මයිල් කෙළින් වෙනවා එහෙම වුණාම. අපේ රටේ කාන්තාවකට නිසි ගෞරවය දුන්නාම අපි සතුටු වෙනවා. හැබැයි, වැරදි වැඩ කරන්න එපා. හිත හිතා, වරද්ද වරද්දා මොනවාද මේ පාර්ලිමේන්තුවේ කියන්නේ? බැරි නම් මම වාගේ බැහැ කියලා සිංහලෙන් කථා කරලා නිකම් ඉන්න ඕනෑ. පව වෙන එකේ සීමාවක් තිබෙන්න එපායැ. ඕනෑම කෙනෙකුගේ පව වීමේ සීමාවක් තිබෙන්න ඕනෑ. ඒ ගැන මම තවත් කථා කරන්නේ නැහැ. කවුද කියලා මම නම කියන්නේ නැහැ. නම කියන්න වුවමනාවක් නැහැ. ඒක එතුමා දැනගන්න ඕනෑ. නිකම් ඇඹලයෝ වෙන්න ඕනෑ නැහැ. ඇඹලයෝ වුණාම ඒක හරි නැහැ.

ඔබතුමිය කිව්වා, මේ, අධ්‍යාපනයට වැඩි මුදලක් වෙන් කරපු වර්ෂය කියලා. ගරු ඇමතිතුමියනි, බන්දුල ගුණවර්ධන තමයි ඒ වාර්තාව තියාගෙන හිටියේ. බන්දුල ගුණවර්ධනගේ කාලයේ තමයි අධ්‍යාපන අමාත්‍යාංශයට වැඩිම මුදලක් වියදම් කරලා තිබ්බේ. ඊට පස්සේ 2016-2019; අකිල විරාජ් කාරියවසම්ගේ කාලයේ තමයි වැඩිම මුදලක් වියදම් කළේ කියන එක මම මේ වෙලාවේ කියනවා. එතුමා අද මේ පාර්ලිමේන්තුවේ හිටියත් නැතත් මම ඒක කියනවා. ඒ කාලයේ මම පළාත් සභාවේ මහ ඇමති. එතුමාගේ දේශපාලන පක්ෂය මොකක් වුණත්, කොයි තැනක හිටියත්, එතුමා "ළඟම පාසල - හොඳම පාසල" සංකල්පය ගෙනාවා. මම ඌව පළාතේ මහ ඇමති විධියට කටයුතු කළ කාලයේ ඔය ළඟම පාසල - හොඳම පාසල ව්‍යාපෘතියට මට මිලියන 15,000කට වඩා දීලා මොනරාගල සහ බදුල්ල කියන දිස්ත්‍රික්ක දෙකේ පාසල් ශීඝ්‍රයෙන් සංවර්ධනය කළා. ඒක අපට අමතක කරන්න බැහැ. අපි දේශපාලනයේදී මොන තැනක හිටියත්, කරන හොඳ වැඩවලට, කරපු හොඳ වැඩවලට ගෞරවය දෙන්න ඕනෑ.

ඊළඟ කාරණය තමයි, සංවර්ධන නිලධාරින්ගේ ප්‍රශ්නය. අදත් සංවර්ධන නිලධාරින් 16,000ක් එළියට බැහැලා ඉන්නවා. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබුණා. ඒ, සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ කාලයේ. මම හිතන විධියට, ඒ නඩුව දෙගොල්ලන් කථා කරලා බහා තැබුවා. ඒ කියන්නේ, අවුරුදු තුනක පශ්චාත් උපාධිය සම්පූර්ණ කළාම ස්ථිර කරන්නත්, එතෙක් ස්වේච්ඡා පත්වීම් දෙන්නත් කටයුතු කරනවා කිව්වා. ඔබතුමියලාත් මේවා ඡන්ද කාලෙදි පොරොන්දු වුණා. හැබැයි ඡන්දෙන් පසුව ඒවා අමතක වෙලා තිබෙනවා. අදත් 16,000ක් පාරේ. ඒ අය දුම්රිය පොළ ළඟ හිටියා. විපක්ෂ නායකතුමා ගියා, දුම්රිය පොළ ළඟට. දැන් ඒ අය ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහ ඉන්නවා. මේ ප්‍රශ්නය විසඳන්න තිබෙන කෙටිම මඟ මෙකයි. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දීලා තිබෙනවා නේ. දෙපැත්තම කථා කරලා ඒ නඩුව බහා තැබුවා. ඒ අය බඳවා ගෙන ඔවුන්ගේ පශ්චාත් උපාධිය සම්පූර්ණ වුණාම ස්ථිර කරන පදනම මත තමයි ඒ සාකච්ඡාව තිබ්බේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Postgraduate Diploma.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔව්, ඒක තමයි. ඒ ඩිප්ලෝමා එක කරලා, අවුරුදු තුන සම්පූර්ණ වුණාම ස්ථිර කරන්න තමයි සූදානම් කර තිබුණේ. නමුත් ඒ ප්‍රශ්නය ඔබතුමියගේ පැත්තෙන් විසඳුණේත් නැහැ. ආණ්ඩුවත් තවම ඒ වෙනුවෙන් මැදිහත් වෙන්නේ නැහැ. ඒ මිනිස්සු පාරට වෙලා ඉන්නවා. දැන් මාස තුනක් තිස්සේ ඒ මිනිස්සු පාරේ ඇවිදිනවා. දැන් ඔබතුමියලාගේ ආණ්ඩුවයි තිබෙන්නේ. මේවා පොඩි පොඩි ප්‍රශ්න. හැබැයි, මේවා කරන්න අමාරුයි. මොකද, ආණ්ඩුවටත් අමාරුකම් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. නමුත්, මේ ආණ්ඩුවට අමාරුකම් තිබෙනවා කියලා බේරෙන්න බැහැ. මොකද, මේවා ඔයගොල්ලන්ම පුරුදු කරපු ඒවා. එදා ඔබතුමන්ලා උපාධිධාරින්ට රස්සා දෙන්න කියලා පෝලිමේ ගියා. මම පළාත් සභාවේ ඉන්නකොට ඇවිල්ලා පළාත් සභාව වට කළා. මේවා ඔයගොල්ලන්ම පුරුදු කරපු ඒවා. මේවා පුරුදු නොකර හිටියා නම් ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා මේ කියපු ප්‍රශ්නයටත් උත්තරයක් දෙන්න ඕනෑ.

ගරු අගමැතිතුමියනි, ඊළඟ ප්‍රශ්නය අධ්‍යාපන ප්‍රතිසංකරණ ගැනයි. කොළඹ කලාපයට අයත් රාජකීය විද්‍යාලය අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව ඉන්නේ පළමුවැනි තැන. එම කලාපයේම ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ හෝ මෝදර ප්‍රදේශයේ හෝ ඉස්කෝලයක් ගත්තාම 4,000 වෙනි තැන. බලන්න, එකම කලාපයේ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ හෝ දෙමටගොඩ ප්‍රදේශයේ හෝ පාසල් 4,000 වෙනි තැන; එම කලාපයේම රාජකීය විද්‍යාලය ලංකාවෙන්ම එක. එතකොට මේ රටේ අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කරන්නේ කොහොමද? කොළඹ කලාපයේ එක ඉස්කෝලයක් උසස්ම මට්ටමකත්, තව ඉස්කෝලයක් පහළම මට්ටමකත් තිබෙන කොට අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් වෙන්නේ නැහැ. අපේ බණ්ඩාරවෙල කලාපය ගත්තොත්, Bandarawela Central College එක තිබෙන්නේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිශතය අනුව ලංකාවේ දහවැනි තැන. එහා පැත්තේ කරඳගොල්ල මායිමේ තිබෙන, වැල්ලවාය මායිමේ තිබෙන, නැත්නම් හල්දුම්මුල්ල මායිමේ තිබෙන ඉස්කෝලයක් තිබෙන්නේ 5,000 වෙනි තැන. මේවා එකම කලාපයේ ප්‍රශ්න. හැබැයි, අපේ ප්‍රදේශවල නම් දුෂ්කරභාවය, ගුරු හිඟය තිබෙනවා කියලා හිතන්න පුළුවන්. කොළඹ රාජකීය විද්‍යාලය විභාග ප්‍රතිඵලවලින් පළමු තැන ගන්න කොට ග්‍රෑන්ඩ්පාස්, දෙමටගොඩ අවට ඉස්කෝල ගන්නේ 4,000 වෙනි තැන; 4,500 වෙනි තැන. ඒ ගැනත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමියනි, ඔබතුමිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ගැන කතිකාව ඇතිකර ගෙන තිබෙන්නේ ජාතික අධ්‍යාපන ආයතනයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් සමඟ පමණයි. උගතුන්, බුද්ධිමතුන්, විශ්වවිද්‍යාලවල අය, නීතිඥවරුන්, රටේ තිබෙන ස්වේච්ඡා සංවිධානවල අය, පක්ෂ විපක්ෂ අය කිසිම කෙනෙකු සම්බන්ධ කර ගන්නේ නැතිව තමයි ඔබතුමිය මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අත තියලා තිබෙන්නේ.

මම මේ වෙලාවේ තවත් කාරණයක් කියන්න ඕනෑ. 12වැනි දා රට පුරා උද්ඝෝෂණයක් පැවැත්වෙනවා. ලබන 12වැනි දා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව ගුරුවරු ලෙඩ නිවාඩු දමන්න සූදානම් වෙලා ඉන්නවා. ඒ නිසා මම මේ වෙලාවේ කියනවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුත්ත ජාතික අධ්‍යාපන ආයතනයේ අයත් එක්ක, එහෙම නැත්නම් ඔබතුමියගේ අමාත්‍යාංශයේ අයත් එක්ක එකතු වෙලා විතරක් කරන්න බැරි බව. මේ රටේ පක්ෂ විපක්ෂ, උගතුන්, බුද්ධිමතුන්, වියතුන් ඇතුළු හැම කෙනාටම සවන් දීලායි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන්න වෙන්නේ. මට ලැබී තිබෙන වෙලාව අනුවයි මම ඒ ගැන කෙටියෙන් සඳහන් කළේ.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමියනි, ඒ වාගේම මම ඔබතුමියට කියන්න ඕනෑ, රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන් බඳවා නොගැනීම සම්බන්ධවත්. අදාළ අනෙක් විශ්වවිද්‍යාල සියල්ලම සම සෞඛ්‍ය විද්‍යාපීඨ සිසුන් බඳවා ගෙන ඉවරයි. හැබැයි, රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨයට යන්න ඉන්න ළමයි 250ක් අවුරුදු ගණනක් තිස්සේ ගෙවල්වලට වෙලා ඉන්නවා. තවමත් ඒ අය බඳවා ගෙන නැහැ. රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨයට ඒ සිසුන් 250 තවම බඳවාගෙන නැහැ. මේක කවදාවත්, කොයි අවුරුද්දකවත් සිදු නොවෙච්ච දෙයක්. ඒ නිසා මේ ගැනත් ඔබතුමියගේ අවධානය යොමු කරන්න. මොකද, ඒ ළමයි විභාගය පාස් වෙලා ඊළඟට යන්න තිබෙන තැනට යන්න ප්‍රමාද වුණාම ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා තමයි මම රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨ සිසුන්ගේ ප්‍රශ්නය ගැන අද කථා කළේ.

මම මේ වෙලාවේ කියන්න යන ඊළඟ කාරණය රටේ දැන් කථා බහට ලක් වෙලා තිබෙන එකක්. ඔබතුමිය මේ ගැන සොයන්න, ගරු ඇමතිතුමියනි. මේක හරිද, වැරැදිද කියන්න බැහැ. නමුත් අපට අයිතියක් තිබෙනවා මේක කියන්න. මේ සැරේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය ගැනයි මේ කියන්නේ. නුගේගොඩ "සක්යා" එකෙන් ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයක් දීලා තිබෙනවා, ළමයින්ට. විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් ආර්ථික විද්‍යාව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 50න් 27ක් අර උපකාරක පන්තියේ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න හා සමානයි. ගරු අගමැතිතුමියනි, රජයෙන් ලබා දීපු I වන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 27ක් උපකාරක පන්තියේ දීපු ප්‍රශ්නවලට සමානයි; එකම විධියයි. ඊළඟට, උසස් පෙළ "ආර්ථික විද්‍යාව II" ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 10න් ප්‍රශ්න 5කුත් හරියටම සමානයි. මෙන්න, මා ළඟ ඒ උපකාරක පන්තියේ ප්‍රශ්න පත්‍ර දෙකත් තිබෙනවා; රජයේ ප්‍රශ්න පත්‍ර දෙකත් තිබෙනවා. ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ දැන ගැනීම සඳහා මම මේ ප්‍රශ්න පත්‍ර සභාගත කරන්නම්. මේ ගැන රටේ කතිකාවක් යනවා. මෙහෙම ගියොත් අධ්‍යාපනය, සැමට සමාන අධ්‍යාපනයක් වෙන්නේ නැහැ නේ. මෙහෙම වුණාම නුගේගොඩ "සක්යා" එකේ ආර්ථික විද්‍යාව ඉගෙන ගත්තු ළමයින්ට එක විධියක්; Badulla Central College එකේ ළමයින්ට, මහියංගනයේ ළමයින්ට වෙන විධියක්. මහියංගනයේ ළමයින්ට නුගේගොඩ "සක්යා" එකට එන්න බැහැ නේ. මොනරාගල, දොඹගහවෙල ළමයාට නුගේගොඩ "සක්යා" එකට ඇවිල්ලා ඉගෙන ගන්න බැහැ නේ. එහෙම නම්, මේක තමයි මේ රටේ අධ්‍යාපනයේ තිබෙන අසාධාරණය. ඒ ප්‍රශ්න පත්‍රවලට අදාළ කාරණය නිවැරැදිද වැරැදිද කියන එක ගැන සොයා බලමු. හැබැයි, අප මේ කියන එකේ වැරැද්දක් තිබෙන්නත් පුළුවන්; නිවැරැදි වෙන්නත් පුළුවන්. නමුත්, අපට මේවා ගැන සොයන්න වෙනවා, පළමුවැනි ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 50න්, 27ක් එකම විධියයි නම්. දෙවැනි ප්‍රශ්න පත්‍රයේ ලකුණු දෙන්නේ ප්‍රශ්න 5කටයි. ප්‍රශ්න 5කට උත්තර ලිව්වොත් ඇති. ඒ ප්‍රශ්න 5ට මේ කියන උපකාරක පන්තියෙන් දීපු ප්‍රශ්න 5 ඇවිල්ලා තිබුණොත්, ප්‍රතිඵලය සම්පූර්ණයෙන් වෙනස් වෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඊළඟ කාරණය තමයි, ගම්පහ අනුර මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රශ්නය. ගම්පහ අනුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාට විරුද්ධව ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඔහුට විරුද්ධව audit query එකක් ඇවිල්ලා තිබෙනවා. දැන් ගුරුවරු විරුද්ධයි, නියෝජ්‍ය විදුහල්පතිවරු ඇතුළු සියලුදෙනා විරුද්ධයි. එතුමාට විරුද්ධව ලොකු පැමිණිල්ලක් තිබෙනවා. ඊට අදාළ ලේඛනයත් මම සභාගත කරන්නම්. ඊළඟට, නුගේගොඩ ශාන්ත ජෝන් මහා විද්‍යාලයේ විදුහල්පතිට විරුද්ධව ලොකු ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. ඊට අදාළ ලිපියත් මම සභාගත කරන්නම්.

මේවා රටේ තිබෙන ප්‍රශ්න. අධ්‍යාපන අමාත්‍යවරිය හැටියට ඔබතුමිය මේවා ගැන සොයා බලන්න ඕනෑ. අධ්‍යාපන අමාත්‍යාංශය තරම් විශාල අමාත්‍යාංශයක් තවත් නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයේ තරම් ප්‍රශ්න තිබෙන වෙනත් තැනකුත් නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශ විෂයය කියන්නේ හරිම අමාරු විෂයයක්. අපි ඒක හොඳින්ම දන්නවා. ඒ අමාත්‍යාංශය කරගෙන යනකොට ප්‍රශ්න, ගැටලු එනවා. ඔබතුමිය මේවා ගැන සොයා බලන්න. මොකද, විභාග දෙපාර්තමේන්තුවෙන් මේ වාගේ දේවල් වෙනවා නම් ලොකු ගැටලුවක්. මේවා බොහෝ දුරට Press එකෙන් වෙන්න පුළුවන්. මෙහෙම වුණාම කොළඹට කිරි ගමට කැකිරි තමයි. ඇයි? කොළඹ නුගේගොඩ class එකට යන ළමයි උසස් පෙළ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට ලියලා ඉහළ ලකුණු ගනීවි. ගම්වල ළමයි කොහොමද, නුගේගොඩ "සක්යා" එකට එන්නේ? ගමේ අහිංසක ළමයින්ට කොහොමවත් එහෙම එන්න බැහැ නේ. ගරු අගමැතිතුමියනි, ඉහත කී සිදුවීම් තුනට අදාළ ලිපි ලේඛන, එනම් 2025 අ.පො.ස. (උසස් පෙළ) ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍ර, ගම්පහ අනුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාට කර ඇති චෝදනාවට අදාළ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු ඇතුළත් ලේඛනය, ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පතිතුමා හා සම්බන්ධ ලිපිය යනාදිය ඔබතුමියගේ දැන ගැනීම සඳහා මම මේ වෙලාවේදී **සභාගත*** කරනවා.

ඊළඟ එක තමයි, වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය. ගරු අග්‍රාමාත්‍යතුමියනි, වැඩ බලන විදුහල්පතිවරුන් කියන්නේ මේ රටේ බොහෝ දුකක් විඳින අයයි. ඒ අය පොඩි දීමනාවක් අරගෙන කැලෑබද ඉස්කෝලවල, නොදියුණු ඉස්කෝලවල සේවය කරනවා. ශ්‍රේණිධාරී විදුහල්පති පත්වීම් ලැබූ ඕනෑම කෙනෙක් ඒ පත්වීම අරගෙන ගිහිල්ලා නගරයේ පාසල්වලයි ඉන්නේ. මේ පාර්ලිමේන්තුවේත් NPP එකේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා, කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩ බලන විදුහල්පතිවරයෙකු ලෙස සේවය කරපු. එතුමා ඒ විද්‍යාලයේ වැඩ බලන විදුහල්පතිවරයා වශයෙන් සේවය කරන්න ගත්තාට පස්සේ, ඒ ඉස්කෝලයට හොඳම, ඉහළම ප්‍රතිඵල අරගෙන දුන්නා. ඒ මන්ත්‍රීතුමා ඒ ඉස්කෝලයේ වැඩ බලන විදුහල්පතිවරයෙකු හැටියට හිටියේ. හඳපානාගල

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඉස්කෝලයේ අවුරුදු 20ක් තිස්සේ වැඩ බලන විදුහල්පතිවරයෙක් ඉන්නේ. එහේ අලි ගහනවා. වැල්ලවාය හඳපානාගල ඉස්කෝලෙට තවමත් යන්නේ නැහැ, ශ්‍රේණිධාරී විදුහල්පතිවරයෙක්. අම්බිකා මන්ත්‍රීතුමියනි, කන්ද උඩ තිබෙන හපුතලේ දඹේතැන්න වාගේ ඉස්කෝලවලත් වැඩ බලන විදුහල්පතිවරුන් ඉන්නේ. ද්‍රවිඩ පාසල් බොහොමයකත් වැඩ බලන විදුහල්පතිවරුයි ඉන්නේ. නමුණුකුලත් එහෙමයි. ඒ ඉස්කෝලවල වැඩ බලන විදුහල්පතිවරුයි ඉන්නේ, ගරු අගමැතිතුමියනි. වැඩ බලන විදුහල්පතිවරුත් විභාගවලට ගියා. මම ඒ කාලයේ අපේ ආණ්ඩුව එක්ක, මේ පාර්ලිමේන්තුවේදී සුසිල් ප්‍රේමජයන්ත හිටපු ඇමතිතුමා එක්ක විශාල ප්‍රශ්නයක් ඇති කර ගත්තා, වැඩ බලන විදුහල්පතිවරුන් III, II හෝ කුමන හෝ ශ්‍රේණියකට දාලා ඒ අයගේ ප්‍රශ්නය විසඳන්න කියලා. තවම වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නයට අධ්‍යාපන අමාත්‍යාංශය අතවත් තියලා නැහැ. අලුතින් මේ ඊයේ පෙරේදා ආපු තරුණ ළමයින් බඳවා ගන්නවා.

ගරු අගමැතිතුමියනි, මට ඊයේ පෙරේදා දවසක විදුහල්පතිවරයෙක් ප්‍රශ්නයක් කිව්වා. ඔහු 2006 වසරේ විද්‍යාපීඨයෙන් ඇවිල්ලා තිබෙන්නේ. ඒ අවුරුද්දේම තවත් එක්කෙනෙක් එහෙම ඇවිල්ලා තිබෙනවා. 2006දී ඒ දෙදෙනාම එකට ගුරු සේවයට බැඳෙනවා. 2018දී එක්කෙනෙක් විදුහල්පති ශ්‍රේණිය හිමි කරගෙන තිබෙනවා. මට මේ ප්‍රශ්නය කිව්වේ ඇඹිලිපිටියේ කෙනෙක්. එතකොට, අලුත් වැටුප් වැඩි කිරීම අනුව විදුහල්පතිගේ පඩිය 67,000යි. හැබැයි, ගුරුවරයාගේ පඩිය 73,000යි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chamara Sampath Dasanayake, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

එකට සේවයට බැඳිලා, විදුහල්පතිට 67,000යි. ගුරු සේවයේ ඉන්න කෙනාට 73,000යි. අපේ රටේ තිබෙන්නේ පුදුම ක්‍රමයක්.

ඊළඟට, විශ්‍රාම වැටුප් ගැන බලමු. දැන් 153,000ක් උද්ඝෝෂණය කරනවා. ගරු අගමැතිතුමියනි, ඉංජිනේරුවෝ දෙන්නෙක් කියමුකෝ. 2024දී දෙසැම්බර් 31 විශ්‍රාම ගිය කෙනාගෙයි, ඊට දවස් තුනකට පස්සේ 2025 ජනවාරි 02වන දා ගිය කෙනාගෙයි පෙන්ෂන් එකේ 70,000ක වෙනසක් තිබෙනවා. එකම ක්ෂේත්‍රයේ, එකම කාලයේ, එකටම බැඳිලා, එක විධියට වැඩ කරපු දෙන්නාගෙන් එක්කෙනෙකුට පෙන්ෂන් එක 70,000ක් අඩුයි, අනෙක් කෙනාට 70,000ක් වැඩියි. දෙන්නම එකම කඩෙන් බඩු ගන්නේ, එකම බෝතලේ ගහන්නේ. ඉතින් දෙන්නාම ඒක කථා වෙනවා නේ. ඒක මහා අසාධාරණයක්.

ඒ වාගේම තමයි වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නයත්. දුෂ්කර ගම්වලට, කඳු මුදුන්වල තිබෙන වතු පාසල්වලට ගුරුවරු යන්නේ නැහැ, ශ්‍රේණිධාරීන් යන්නේ නැහැ. මම හොඳට මේවා දන්නවා හිටපු මහ ඇමති හැටියට. මෙතෙක් කල් ඒවා කරගෙන ගියේ වැඩ බලන විදුහල්පතිවරු. ඒ නිසා ඒ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ, විදුහල්පතිවරියන්ගේ ප්‍රශ්නයටත් ඇහුම්කන් දීලා වැඩ කරන්න කියන ඉල්ලීම කරනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය කියන්නේ රටේ හදවත. අපි වාගේ දුප්පත් රටවල ඌව වෙල්ලස්ස වාගේ ප්‍රදේශවල මිනිස්සු දුප්පත්කමින් මුදවා ගන්න පුළුවන් අමාත්‍යාංශයක් මේක. ගරු අගමැතිතුමියනි, 1988 දී අපේ පළාතේ පළමුවෙනි මහ ඇමති පර්සි සමරවීර. පර්සි සමරවීර මහ ඇමතිකම ගන්නකොට බදුල්ල, මොනරාගල දිස්ත්‍රික්කවල පරිපාලන සේවයේ එක්කෙනෙක්වත් හිටියේ නැහැ. 1988 පළමුවෙනි පළාත් සභාව හදනකොට බදුල්ලේ සහ මොනරාගල පරිපාලන සේවයේ එකම නිලධාරියෙක්වත් ඉඳලා නැහැ. දැන් පරිපාලන සේවයේ නිලධාරීන් 500ක් විතර ඉන්නවා බදුල්ලේ සහ මොනරාගල. ඊට පසසේ පර්සි සමරවීර මහත්තයා මොකක්ද කළේ? ගෙදරට වාහනයයි, එයාට වාහනයයි දෙකක් දෙනවා කියලා තමයි බදුල්ලට පරිපාලන සේවයේ මිනිස්සු ගෙනාවේ ඌව පළාත් සභාවේ වැඩ කරන්න. අන්න එහෙම පළාතක් ඌව කියන්නේ. ඌව අසාධාරණයට ලක් වෙච්ච පළාතක්, සුද්දන්ගෙන් බැට කාපු පළාතක්. ඒ වාගේ පළාත් අද මේ රටේ තිබෙනවා. ඒ වාගේ පළාත්වල අධ්‍යාපනය ගොඩ නැඟුවේ නැත්නම්, මේ රට එක තැන.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, would you please wind up now?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තත්පරයක් දෙන්න.

ගරු අගමැතිනිය ඡන්ද කාලයේ කිව්වා සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරනවා කියලා. හැබැයි සියයට 6 නැහැ. අද ලෝකයේ රටවල් 200ක් තිබෙනවා නම්, දත්ත අනුව අධ්‍යාපනයට වෙන් කරන මුදල් අතින් අපි ඉන්නේ 180වෙනි තැන. අපි ඉන්නේ 180වෙනි ස්ථානයේ, රටේ අධ්‍යාපනයට වෙන් කරන විමධ්‍යගත මුදල් අතින්. ඒ ගැන මම කනගාටු වෙනවා. ඔබතුමිය ගැන අපි කනගාටු වෙන්නේ නැහැ. රටේ මුදල් අමාත්‍යාංශය ඒක දැන ගන්න ඕනෑ, අධ්‍යාපනයට විශාල මුදලක් වෙන් කරන්න.

ගරු සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sugath Wasantha de Silva. You have nine minutes.

[පූ.භා. 11.00]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු සභාපතිතුමනි, අතිශයින්ම වැදගත් අමාත්‍යාංශයක කාරක සභා අවස්ථාවේ අදහස් දැක්වීමට මිනිත්තු 9ක් ලැබීම භාග්‍යයක් විධියට මම සලකනවා. අපි විශ්වාස කරන විධියට, අධ්‍යාපනය තමයි දැනුම් පද්ධතිය පරම්පරාවෙන් පරම්පරාවට ගෙනියන්නේ, කුසලතාව පරිපූර්ණත්වයට ගේන්නේ, ආකල්ප ධනාත්මක දිශාවට ගෙනියන්නේ. එහිදී අධ්‍යාපන ධාරාවට එකතු වුණු තවත් කණ්ඩායමක් තමයි විශේෂ අවශ්‍යතා තිබෙන කණ්ඩායම. දැනුම, කුසලතා සහ ආකල්ප පුද්ගලයෙක් තුළට සම්ප්‍රේෂණය වෙන්නේ

පංච ඉන්ද්‍රියන් හරහා. ඒ පංච ඉන්ද්‍රියන්වල යම් යම් දුබලතා, ඌනතා තිබෙන කණ්ඩායම තමයි විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා තිබෙන දූවා දරුවෝ. ඔවුන් කෙරෙහි විශේෂ අවධානයක්, විශේෂ සැලකිල්ලක්, විශේෂ බර තැබීමක් කරන්න ඕනෑ. ආබාධ සහිත වූවන් සඳහා වන පර්ලිමේන්තු සංසදය විධියට අපි විශේෂ පාසල්, විශේෂ අධ්‍යාපන ගුරුවරු, ක්ෂේත්‍රයේ කණ්ඩායම්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් ගෙන්වලා සාකච්ඡා මාලාවක් පැවැත්වූවා. එහිදී අපි හඳුනා ගත්ත දේවල්, අපි අත්දැකපු දේවල් ඉතාම ගැඹුරු ප්‍රශ්නගත ඒවා. ඒ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ අවධානය යොමු කරලා තිබෙනවා, ගරු සභාපතිතුමනි.

ඔවුන් කියනවා, ප්‍රවේශයේ තිබෙන අසමානතාවත්, විශේෂ අධ්‍යාපනය කෙරෙහි සංවේදීතාවේ තිබෙන ගැටලුවත් නිසා මේ කලාපය අර්බුදයකට පත් වෙලා තිබෙනවා කියා. ඒක නිවැරදි කරන්න නම්, අනිවාර්යයෙන්ම මානව සම්පත, අධ්‍යාපන පරිපාලනය, විෂය මාලා, භෞතික සම්පත් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. මොකද, මේ දූවා දරුවන්ට අර මම කියපු දැනුම, කුසලතා, ආකල්ප දීම වැදගත්. නමුත් තමන්ගේ අවයවවල තිබෙන යම්කිසි ඌනතාවක්, ආබාධ බවක් ඉක්මවා යමින් මේ දැනුම සම්ප්‍රේෂණය කිරීම සුළුපටු වැඩක් නොවෙයි. ඒක විශාල වගකීම් සහගත වැඩක්. ඒ සඳහා පුහුණු මානව සම්පතක් අවශ්‍යයි, භෞතික සම්පත් රාශියක් අවශ්‍යයි, සහායක උපකරණ අවශ්‍යයි, විකල්ප අධ්‍යාපන ක්‍රම අවශ්‍යයි. මේ අවශ්‍යතාවලට ආමන්ත්‍රණය කරමින්, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ විශේෂ අධ්‍යාපනය කෙරෙහි විශාල බර තැබීමක් කරමින්, විශාල වගකීමක් දරමින් ක්‍රියාත්මක කිරීමට සූදානම් වීම ගැන ගරු අග්‍රාමාත්‍යතුමිය ඇතුළු අධ්‍යාපනඥයන්ට ස්තුතිවන්ත වෙමින් එය ඉතාම ගෞරවයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, අන්තර්කරණීය අධ්‍යාපන ක්‍රමයක් තමයි මේ විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය බලාපොරොත්තු වෙන්නේ. මේ සංකල්පය අවකාශයේ පවතින සංකල්පයක් විතරයි. මේක පොළොවට ගේන්න නම්, මේක පොළොවේ පැළ කරන්න නම්, එහි ඵලදායීතාව විශේෂ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දෙන්න නම්, අනිවාර්යයෙන් අර මම කියපු මානව පුහුණුව සමඟ උපකරණ සහ විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් විය යුතුයි. ඒ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන බවට හොඳම සාක්ෂිය තමයි මේ 2026 අය වැය ලේඛනය. ඉතා ඉහළ වටිනාකමක් සහිත ප්‍රතිපාදනයක් වෙන් කරලා තිබෙනවා, පාසල් අධ්‍යාපනයේ යෙදෙන දරුවන්ට, උසස් අධ්‍යාපනයේ යෙදෙන විශ්වවිද්‍යාලවල ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට; විද්‍යාර්ථීන්ට. ඔවුන්ට රුපියල් 5,000ක දීමනාවක් දීමට සූදානම් වෙනවා, මේ අය වැය ලේඛනයෙන්. ඇයි ඒ? ඔවුන්ට අධ්‍යාපනය උකහා ගැනීම සඳහා සාමාන්‍ය ශිෂ්‍යාට වැඩිය වැය බරක් දැරීමට සිද්ධ වෙනවා. අනික් පැත්තෙන්, මේ දූවා දරුවන් පාසල් පද්ධතිය තුළට, විශ්වවිද්‍යාලය තුළට යොමු කිරීම සඳහා එම පවුල්වලට විශාල බර පැනක් දරන්න වෙනවා. ඒකට සහනයක් සැපයීම සඳහා තමයි මේ දීමනාව ලබා දෙන්නේ.

මීට අමතරව, විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර නිර්මාණය කිරීම සඳහාත් විශාල මුදලක් එන අවුරුද්දේ වියදම් කරනවා. ඒකේ වැදගත් කාරණාවක් තිබෙනවා. මේ ගොඩ නැඟෙන නේවාසිකාගාර විතරක් නොවෙයි, ඉදිරියේදී ගොඩ නැඟෙන පාසල්, උසස් අධ්‍යාපන ආයතන, විශ්වවිද්‍යාල යන මේ සෑම පරිශ්‍රයක් තුළ ආබාධ සහිත ප්‍රජාවගේ ප්‍රවේශය සඳහා පහසුකම් ලබා දෙන්න මුදල් ප්‍රතිපාදන මේ අය වැය ලේඛනය තුළ තිබෙනවා. ඒ භෞතික ප්‍රවේශය විතරක් නොවෙයි, කියන්න සතුටුයි, අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වෙන ඩිජිටල්කරණය සඳහා වන කාර්ය සාධන බලකායටත් දෘෂ්‍යාබාධිත විද්වතුන් ඇතුළත් කර ගනිමින් ඒ අයට අවකාශයක්, ඒ අයට ආමන්ත්‍රණයක්, නියෝජනයක් ලබා දීලා තිබෙනවා. මේ සෑම අංශයකින්ම මොකක්ද කියන්නේ? විශේෂ අධ්‍යාපනයට වැය බර අතිනුත්, අවධානය අතිනුත්, සංවේදීතාව අතිනුත් අපේ ආණ්ඩුව පොරොන්දු වෙච්ච විධියට ඔවුන්ගේ ප්‍රාර්ථනා දල්වමින් විශාල වගකීමක් සහ වැඩ කොටසක් ඉෂ්ට කරන්නට සූදානම් වන බවයි. ඒක හුදු වචනවලට විතරක්, ප්‍රතිපත්තියට විතරක් සීමා නොකර, ඒ සඳහා ප්‍රතිපාදනමය වශයෙන් මූල්‍ය සම්පත් වෙන් කරමින් මේ දූවා දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතාව, ඒ අයගේ මානව අයිතිය තහවුරු කරන්න අපි සූදානම් වෙලා ඉන්නවා. උසස් අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාල පද්ධතියට ආබාධ සහිත තැනැත්තන් ඇතුළත් කර ගැනීමේ යම් වැඩ පිළිවෙළක් තිබුණාට, ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ඒ ප්‍රතිපත්තිය, ඒ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් සෑම විශ්වවිද්‍යාලයකටම, සෑම විෂය ධාරාවකටම, සෑම පීඨයකටම ඇතුළත්වීමේ අවකාශය පුළුල් කරන ප්‍රතිපත්තියක් අපි ගොඩනඟලා තිබෙනවා. ඉතින් ගරු සභාපතිතුමනි, මේ ප්‍රතිපත්තිය තුළ අනිවාර්යයෙන්ම ඉතා දුෂ්කර ගමනක් ඔස්සේ පාසල් හරහා පොදු අධ්‍යාපන ධාරාව ඔස්සේ ගමන් කරන ශිෂ්‍යයාට විශ්වවිද්‍යාලයේ දොර විවෘත වන බව ඉතා සතුටින් දන්වන්නේ, අපි ඒ දුෂ්කරතාව විඳපු මිනිස්සු විධියටයි. ඒ දුෂ්කරතාව අතික්‍රමණය කරලා ඉතා ඉහළ සාමර්ථ්‍යයන් පෙන්වූ මිනිසුන් විධියට අප සඳහන් කරන්න කැමැතියි, අනාගතයේදී විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති හරහා ආබාධ සහිත විද්‍යාර්ථීන්ට විශාල ඉඩක්; පුළුල් අවකාශයක් සැලසෙනවා කියලා.

ගරු සභාපතිතුමනි, මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මේ විශේෂ අධ්‍යාපන පාසල් ගැන කාරණාව. මේ විශේෂ අධ්‍යාපන පාසල් තුළ විශාල ප්‍රශ්න සමුදායක් තිබෙනවා. මම ඉහත කී පාර්ලිමේන්තු සංසදයට ගෙනා යෝජනා අතර ඉතා වැදගත් යෝජනාවක් තිබෙනවා, ඒ පාසල්, අධ්‍යාපන අධ්‍යක්ෂ පාලිත පාසල් බවට පත් කිරීමට. හැකි නම් අපි ඒ උත්සාහය දරමු. ඒ හරහා මේ පාසල්වල ඉගෙනුම ලබන ආබාධ සහිත දරුවන්ට විශාල සේවයක් වේවි.

අනෙක් කාරණය තමයි, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට ලබා දෙන දීමනාව ප්‍රතිශතාත්මකව යම් මට්ටමකට කප්පාදු කරයි කියන ගැටලුව. දැනට ඒ සම්බන්ධව මැසිවිල්ලක් නැඟෙනවා. අපි ඒ ගැන මුදල් අමාත්‍යාංශයත් එක්ක දිගින් දිගටම සාකච්ඡා කරනවා. ගරු අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන්, අපට ඒ ගුරුවරුන්ට ස්ථිර වශයෙන්ම කියන්න පුළුවන්, එම දීමනාවේ ප්‍රතිශතාත්මක අඩුවීමක් සිද්ධ වුණාට, ආබාධ සහිත දූවා දරුවන්ව ඔසවා තබන්නට, අධ්‍යාපන ධාරා ඔස්සේ උඩට ගෙනෙන්න ඔබ කායිකව සහ මානසිකව දරන ප්‍රයත්නය අපි කිසි සේත්ම ලඝු කරන්නේ නැති බව; අපි එය අඩුවෙන් තක්සේරු කරන්නේ නැති බව. අපි එහි වටිනාකම ඉතා ඉහළින් පිළිගන්නවා. අපි එයට ගෞරව කරනවා. ඒ වටිනාකමට සරිලන විධියට ඔබට මූල්‍යමය වශයෙන් කිසිසේත්ම පාඩුවක් නොවන විධියට ප්‍රතිපත්තියක් අනුව ඒ මූල්‍යමය දීමනාව ගෙවීමට ආණ්ඩුවක් විධියට අපි සූදානම්. ගරු අධ්‍යාපන අමාත්‍යතුමියත්, මුදල් අමාත්‍යාංශයත් එක්ක අප කරන සාකච්ඡා හරහා ස්ථිර වශයෙන්ම ඵලදායී විසඳුමක් ඔබට ලබා දෙන බව මා සහතික කරන්න කැමැතියි. ඔබ කරන සේවයේ ප්‍රතිඵලය, ඔබ කරන දායකත්වය ආබාධ සහිත පුරවැසියෙක් වුණත් ශ්‍රමය සහ බුද්ධිය සංවර්ධනයට එකතු කරන ඵලදායී පුරවැසියෙක් නිර්මාණය කරන්න අනිවාර්යයෙන්ම ඉවහල් වේවි. ඒ සඳහා මේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් විශාල ඉඩක්, විශාල වපසරියක් අපට ලැබෙනවා. ඒ අවකාශය පාසල්වල, උසස් අධ්‍යාපන ආයතනවල, වෘත්තීය පුහුණු ආයතනවල විතරක් නොවෙයි, විශ්වවිද්‍යාල තුළත් සැලසෙනවා. ඒ අනුව අනිවාර්යයෙන්ම හෙට දවස ආබාධ සහිත විද්‍යාර්ථීන්ට සුබ බවත් මා විශ්වාස කරනවා.

මට තව කාරණයක් කියන්න තිබෙනවා, වෘත්තීය පුහුණුව සම්බන්ධව. අපි අනිවාර්යයෙන්ම එම පාඨමාලා පැවැත්වෙන පරිශ්‍ර

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

තුළ ආබාධ සහිත වෘත්තීය පුහුණුලාභීන්ට තිබෙන අවකාශය පුළුල් කරනවා. එසේ පුළුල් කරන්නේ රැකියා වෙළෙඳ පොළට ගැළපෙන පුහුණු පාඨමාලාවලට යොමු කරමින් ඔවුන්ව බලගැන්වීම සඳහායි. මේක සමාජයීය වගකීමක්. මේක මානව වර්ගයේ වගකීමක්. ඒක ඉෂ්ට කරන්න ඇප කැප වුණු ගරු අධ්‍යාපන අමාත්‍යතුමියට, නියෝජ්‍ය අමාත්‍යවරුන්ට, නිලධාරින්ට මගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කරමින්, අපි මේ ආබාධ සහිත ප්‍රජාව බුද්ධියෙන්, කායික සහ මානසික ශක්තියෙන් ප්‍රබුද්ධ, ශක්තිමත් ප්‍රජාවක් බවට පත් කර ගනිමු කියන කාරණයත් මේ අවස්ථාවේ මා සඳහන් කරනවා. එය හෙට දවසේ සංවර්ධනයේ සුබ ලකුණක් වේවි.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have 14 minutes.

[පූ.භා. 11.12]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම රටේ වර්තමානයටත්, අනාගතයටත් බලපාන වැදගත් විෂයයක් තමයි මේ මොහොතේ සාකච්ඡාවට භාජන වන්නේ. අපි හැමෝම පිළිගන්නවා, අධ්‍යාපනය නිදහස්, නිවහල් විය යුතුයි කියා. ඒ නිදහස්භාවය, නිවහල්භාවය ආරම්භ විය යුත්තේ පෙර පාසල් අධ්‍යාපනය සහ මුල් ළමාවිය අධ්‍යාපනය කේන්ද්‍ර කරගෙනයි. නමුත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාද වෙන අද දවසේදී, පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් විධිමත් ප්‍රශ්නයක් යොමු කළ අවස්ථාවක එයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලා සිටින තත්ත්වයක් වර්තමාන රජයට උද්ගත වෙලා තිබීම පිළිබඳව මම කනගාටු වෙනවා.

එතැනින් අපට ලැබෙන අවබෝධය තමයි අද මේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තිබෙන බෙදවාචකය. මේ බෙදවාචකය තමයි, ක්‍රමවත් සැලැස්මක් නොමැතිව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් නිර්මාණය කරලා, ප්‍රශස්ත ප්‍රතිපත්තිමය වෙනසක් ඇති කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග අනුගමනය කරන්නේ නැතුව තමන්ගේ හිතුමතේට, අවිධිමත් ආකාරයට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නට කටයුතු කිරීම. ඒ පිළිබඳව අපි මේ අවස්ථාවේදී අපේ බලවත් අප්‍රසාදය රජයට පළ කර සිටිනවා.

මේ ප්‍රතිසංස්කරණවල තිබෙන ඌනතාවන්, විෂමතාවන්, අඩු ලුහුඬුකම් පිළිබඳව අපේ කවිරත්න මැතිනියත් ඉතාම ප්‍රශස්ත ලෙස මනා විග්‍රහයක් කළා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අනධ්‍යයන, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, ගුරු අධ්‍යාපනඥ සහ අධ්‍යාපන පරිපාලන ආදී වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවය කරන විවිධ කණ්ඩායම් පිළිබඳව මම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. අපි අහන්න කැමැතියි, ගුරුවරුන්ට පොරොන්දු වුණු, සුබෝධනී වාර්තාවෙන් ඉදිරිපත් කරපු සියයට 60ක් වැඩි කිරීමේ යෝජනාවේ ඉතිරි 2/3 කෝ කියලා. ඒක ක්‍රියාත්මක නොකරන්නේ ඇයි? අපේ රටේ 250,000කට වැඩි ප්‍රමාණයක් ගුරුවරුන් මෙහෙම රවටන්නේ ඇයි? පිරිවෙන් ගුරුවරුන්ගේත් ගැටලු රාශියක් තිබෙනවා. පිරිවෙන් ගුරු ක්ෂේත්‍රයටත් විධිමත් අවධානයක් යොමු කර විසඳුම් ලබා දී නැහැ. විදුහල්පති සේවයේ බරපතළ විෂමතා තිබෙනවා. 2019දී විදුහල්පති සේවයට බඳවා ගැනීම ආරම්භ කරලා 1,800ක් බඳවා ගත්තා. ඊට පස්සේ 4,800ක් බඳවා ගත්තා. නීතිමය බලපෑම තුළ තවත් 117ක් බඳවා ගන්නවාය කියලා කියනවා. නමුත් පුරප්පාඩු 4,500ක් තිබෙනවා. හැබැයි, 2019දී විභාගය සමත් වුණු 1,216දෙනෙක් සම්පූර්ණයෙන්ම අතරමං කරලා තිබෙනවා. ඇයි, මෙහෙම කරන්නේ? ගුරු අධ්‍යාපනඥ සේවයේ නවක කථිකාචාර්යවරුන්ගේ වැටුප දැනට සේවයේ නිරත වී සිටින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගේ වැටුපට වඩා ඉහළ අගයක් ගැනීම නිසා ගුරු අධ්‍යාපනඥ සේවයේ බරපතළ වැටුප් විෂමතාවක් තිබෙනවා. ඊට අමතරව තවත් ගැටලු රාශියක් තිබෙනවා. කාල වේලාව සීමාසහිත නිසා ඒවා ඉදිරිපත් කිරීමට වෙලාවක් නැහැ. ඒ කරුණු කාරණාවලට අදාළ ලේඛන සියල්ලක්ම මම **සභාගත*** කරනවා.

ඒ වාගේම ගුරු උපදේශක සේවය තුළත් බරපතළ වැටුප් ප්‍රශ්නයක් තිබෙනවා. ගුරු උපදේශක සේවයේ වැටුප් ප්‍රශ්නයටත් නිසි අවධානය යොමු වෙලා නැහැ. එයටත් විධිමත් විසඳුමක් ලබා දීම වැදගත් කියලා අපි යෝජනා කරනවා. අනධ්‍යයන සේවයේ බරපතළ අඩුපාඩුකම් තිබෙනවා; විෂමතා තිබෙනවා. ක්‍රීඩා පුහුණුකරුවන් වශයෙන් සේවයට බඳවා ගනු ලැබූ 3,000කට අධික සංඛ්‍යාවක් ස්ථිර කරලා නැහැ. පාසල්වල කාර්යාල කාර්ය සහායකයන්ගේ බරපතළ ප්‍රශ්න තිබෙනවා. පාසල් මුරකරුවන්ගේ ප්‍රශ්න තිබෙනවා. ඒවාට නිසි විසඳුමක් නැහැ. අධ්‍යාපන පරිපාලන සේවයේ බරපතළ වැටුප් විෂමතා තිබෙනවා. ඒකටත් මේ රජයේ අවධානය යොමු වෙලා නැහැ. ඒ පිළිබඳවත් විධිමත් වැඩ කටයුතු ආරම්භ කරලා මේ අයට සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

ඒ වාගේම විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ 14,000ක් පමණ වූ අනධ්‍යයන සේවයේ නිරත වන කණ්ඩායමක් සිටිනවා. මේ අයට හිමි වුණු MCA නම් වූ දීමනාව සියයට 45 ඉඳලා 36 දක්වා අඩු කර තිබෙනවා. කොමිෂන් සභා චක්‍රලේඛ 07/2014 මඟින් ලබා දුන් සියයට 20ක දීමනාව කප්පාදු කර තිබෙනවා. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ මහාචාර්යවරුන්ට, ආචාර්යවරුන්ට, කථිකාචාර්යවරුන්ට, දේශකවරුන්ට ලබා දෙන දීමනාවල බරපතළ අඩුපාඩු තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ සියලු කරුණු කාරණා ඇතුළත් ලේඛන මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

ඒ අඩුපාඩුවලටත් විසඳුම් ලබා දෙන්නට මේ රජය අපොහොසත් වෙලා තිබෙනවා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. කොවිඩ්-19 වසංගතය පැවති සමයේ සහ ඊට පෙරත් අපේ රටේ පැවති ගුරු හිඟය මඟහරවා ගන්නට විශාල සේවාවක් ඉෂ්ට කරමින් ඉන්නවා, සංවර්ධන නිලධාරින් 16,600ක්. රාජ්‍ය පාර්ශ්වයේ සිටින ඇමතිවරුන් බොහෝදෙනා පසුගිය කාලයේ මේ අය සම්බන්ධයෙන් මොකක්ද කිව්වේ? ඒවායේ වීඩියෝ පට මා සතුව තිබෙනවා. ඒවා ප්‍රසිද්ධියේ කරපු ප්‍රකාශ. ඒවායේ හඬපටත් මා සතුව තිබෙනවා. එක්කෙනෙක් කියනවා, ජනාධිපතිවරණය අවසන් වෙනකම් ඉන්න ලූ. තව කෙනෙක් කියනවා, මහ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මැතිවරණය අවසන් වෙනකම් ඉන්න ලු. තවත් කෙනෙක් කියනවා, මහ මැතිවරණය අවසන්, කැබිනට් ඇමතිකම් ටික දෙනකම් ඉන්න ලු. ඊට පස්සේ කියනවා, පළාත් පාලන මැතිවරණය අවසන් වෙනකම් ඉන්න ලු. වර්තමාන රජය මේ 16,600ම නොමඟ යැව්වා.

මේ සම්බන්ධයෙන් අධිකරණය ලබා දුන් සමථකරණ තීන්දුවක් තිබෙනවා. එහි තිබෙනවා, අභ්‍යාසලාභී ගුරුවරුන් හැටියට 2-II ශ්‍රේණියේ මේ අයව පිහිටුවා වසර 3ක් ඇතුළත postgraduate diploma එක සමත් වුණාට පස්සේ ගුරු සේවයට ස්ථිර බඳවා ගැනීම කරන්න කියලා. මේක ක්‍රියාත්මක නොකරන්නේ ඇයි? මැතිවරණ කාලයේ ලබා දුන් පොරොන්දුව ක්‍රියාත්මක නොකරන්නේ ඇයි? උපාධිධාරින් 35,000ක් ඉන්නවා. ඒ කිසි කෙනෙකුට මේ ආණ්ඩුව රැකියා දීලා නැහැ. ඔයගොල්ලන්ගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 72වැනි පිටුව බලන්න. එහි තිබෙනවා, රැකියා විරහිත උපාධිධාරින් 20,000ක් ගුරු වෘත්තියට බඳවා ගන්නවා; විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත උපාධිධාරින් 3,000ක් බඳවා ගන්නවා; STEM නොවන උපාධිධාරින් 9,000ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට බඳවා ගන්නවා. ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට තවත් 3,000ක් බඳවා ගන්නවා කියලා. 35,000කට රැකියා ලබා දෙනවා කියලා දුන් පොරොන්දු මේ රජයේ ඉන්න අයට අද අමතකද? මේ වාගේ බොරු කරන්නේ ඇයි? මේ වාගේ රවටන්නේ ඇයි? මේ වාගේ අන්දවන්නේ ඇයි? දිගින් දිගටම බොරුවෙන් -ප්‍රෝඩාවෙන්- ඔබතුමන්ලාට ඉදිරියට යන්න පුළුවන් කියලා හිතනවාද?

ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීම සඳහා 1997දී පත් කරන ලද බී.සී. පෙරේරා වැටුප් කොමිෂන් සභා වාර්තාව ගැනත්. ඒ කොමිෂන් සභා වාර්තාවට අනුව සියයට 60ක වැටුප් වැඩි කිරීම ගැන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 (III)හි 3.10 යටතේ කියා තිබෙනවා, "ගුරු-විදුහල්පති ක්ෂේත්‍රයට අදාළ වැටුප් පරිමාණ ලබා දීම පසුව දන්වනු ලැබේ" කියලා. හැබැයි, 2021 සුබෝධනී කමිටු වාර්තාවේ සියයට 60ක වැඩිවීමේ පළමුවැනි තුනෙන් එක වැඩි කිරීම තුළ බරපතළ විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. 1997-2021 අතර හිටපු ඒ විශ්‍රාමික ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ වර්තමානයේ විශ්‍රාමික ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් අතර විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. මේක 85,000කට බලපාන ප්‍රශ්නයක්. විශ්‍රාමික දිනය ඇතුළු අවස්ථා ගණනාවකදී වර්තමාන ජනාධිපතිවරයා පොරොන්දු වුණා, මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා කියලා. හැබැයි, එතුමා කිව්වා, “පාරේ ඉන්න එපා, ගෙදර යන්න” කියලා. එතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට කවදාවත් කිව්වේ නැහැ, “පාරේ ඉන්න එපා, ගෙදර යන්න” කියලා. එදා කිව්වේ, ඉල්ලීම් ටික දිනාගන්න පාරට බහින්න කියලායි.

බලන්න, මේ රජය ගුරුවරුන්ට කියනවා SMS එකක්වත් ගහගන්න බැරි කොට්ඨාසයක් කියලා. SMS එක කෙසේ වෙතත්, ඒ අය ඔබට කතිරය ගැහුවා නේද? ඔබට ඡන්දය දුන්නා නේද? අපේ රටේ ගුරු විදුහල්පති ක්ෂේත්‍රය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවකටම ඇයි මේ විධියට ඔබ අසාධාරණයක් කරන්නේ? ඉන් බැහැර වෙලා කරුණාකරලා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළී සිටින ඒ අයට හොඳ චිත්ත ධෛර්යයක්, මානසික ශක්තියක් ලබා දීලා, නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන්න කටයුතු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

2023 වර්ෂයේ සංඛ්‍යාලේඛනවලට අනුව අපේ රටේ තිබෙනවා නිදහස් අධ්‍යාපනයේ පාසල් 10,096ක්. ප්‍රකාශ කළා, සිසුන් සංඛ්‍යාව 50ට අඩු පාසල් 1,506ක් තිබෙනවා, ඒවායෙන් වැඩක් නැහැ, ඒවා වහලා දමන්න ඕනෑ කියලා. මම අහන්න කැමැතියි, සිසුන් සංඛ්‍යාව 50ට අඩු පාසල් 1,506 සඳහා ඔබ ගන්නා පියවර මොකක්ද කියලා. එම පාසල් වසා දමනවාද? මේ රටේ පාසල් පද්ධතියෙන් සියයට 14.9ක් වසා දමන්නට ඔබ කටයුතු කරනවාද? එහෙම කරන්නට බලාපොරොත්තු වන ක්‍රමවේදය මොකක්ද? මේවා ඔබතුමන්ලා කළ ප්‍රකාශ.

ගරු සභාපතිතුමනි, අපි අහලා තිබෙනවා ප්‍රසිද්ධ කියමනක්, එක පාසලක් ඉදි වනකොට එහෙම නැත්නම් බිහි වනකොට හිර ගෙවල් සියයක් වැහෙනවා කියලා. අපි අහන්න කැමැතියි, ඔබ බලයට එන්නට පෙර මේ රටේ පාසල් 10,096න් සියයට 14.9ක් වහනවාය කියන ප්‍රකාශය කළාද, ඒකට ජන වරම ලැබුණාද කියලා. අපි අහන්න කැමැතියි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රමවේදය තුළ ඔබ කොහොමද STEAM - Science, Technology, Engineering, Arts and Mathematics කියන ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කරන්නට කටයුතු කරන්නේ කියලා. අද artificial intelligence ඇතුළු නව තාක්ෂණ ක්ෂේත්‍රය ලෝකයේම දැවැන්ත ඓතිහාසික පරිවර්තනාත්මක වෙනස්කම් සිදු කරනවා. එවන් මොහොතක අපේ රට දූපතක මානසිකත්වය තුළ මහා කොටු පවුරු බැඳගෙන, හුදෙකලාව සිටිමින්, “අපි හොඳයි, අපට හොඳටම හොඳයි” කිය කියා ඉන්නවාද, නැත්නම්, ලෝකයත් එක්ක ඉදිරියට යන්න ඉෂ්ට සිද්ධ කළ යුතු වෙනස්කම් කරනවාද? ඒ වෙනස්කම් කරනකොට අපේකම, ගමේකම, රටේකම, සංස්කෘතිය හා සභ්‍යත්වය, ඒ ඒ ජන කොට්ඨාසවලට ආවේණික වූ ඒ ගුණාංග අපි රැක ගන්නට ඕනෑ. අද ප්‍රසිද්ධියේ කියන්න, අපේ විෂය ක්ෂේත්‍රයෙන් ඉතිහාසය විෂය ඉවත් කරන්නට කටයුතු කරනවාද, නැද්ද කියන කාරණාවත්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sajith Premadasa, your time is up.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ලෝකයේ සිදුවන පරිවර්තන තුළ අපි වෙනස් වනකොට, අපි අලුත් ගමනක් යනකොට අපි විශ්වාස කරනවා, අපේ මූලාරම්භය, අපේ ඉතිහාසය දැනගැනීම අවශ්‍යයි කියා. අපේ සංස්කෘතිය, අපේ සභ්‍යත්වය, අපි ආපු ගමන, ඉපැරණි රජ සමය තුළ අපේ රට සුරක්ෂා කළේ කොහොමද, අපේ ඉපැරණි රජවරුන් අපේ රටේ ස්වෛරීභාවය තහවුරු කළේ කොහොමද, ස්වයංපෝෂිතභාවය ක්‍රියාත්මක කළේ කොහොමද, සංවර්ධනය ක්‍රියාත්මක කළේ කොහොමද කියන ඒ ඉතිහාසය දැනගැනීම අලුත් පරපුරට අවශ්‍ය නැද්ද කියන එක අපි අහන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම කියන්න ඕනෑ, විශේෂයෙන්ම ජාතිය, ආගම හා භාෂාව මුල් කරගෙන 50 දශකයේ සිදු වුණු ඒ වෙනස තුළ අද අපේ රටේ අධ්‍යාපනයේ බරපතළ බෙදීමක් ඇති වෙලා තිබෙන බව. අධ්‍යාපනය තිබෙනවා, ඇති හැකි අධ්‍යාපනයත්, නැති බැරි අධ්‍යාපනයත් විධියට. අද වන විට විවිධ අය උත්සාහ දරනවා, ඉංග්‍රීසි භාෂාව හොඳින් හදාරන්න. ඇත්තවශයෙන්ම ඉංග්‍රීසි භාෂාව හසුරුවන්නට අමාරු වුණු අයට අපි උසුළු විසුළු කරනවා වෙනුවට ඒ ප්‍රශ්නය උද්ගත වුණේ කොහොමද, ඒ බරපතළ ප්‍රශ්නය නිර්මාණය වුණේ කොහොමද කියන එක ගැන අප ප්‍රශ්න කරන්නට ඕනෑ. මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, මමත් එක්තරා අවස්ථාවක එවන් විවේචනයක්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ සභාවේ ඉදිරිපත් කළ බව. මම ඒක ආපසු අද දවසේ withdraw කර ගන්නවා. මොකද, මම ඒ නුසුදුසු කාරණාවක් ඉදිරිපත් කළේ. ඇයි, අපි මෙතැන ඉන්නේ, ඉංග්‍රීසි භාෂා ක්ෂේත්‍රය තුළ? ඇත්තවශයෙන්ම අපි දැන්වත් මේ අඩුපාඩුව අවබෝධ කර ගන්නට ඕනෑ. එදා භාෂාව කේන්ද්‍ර කරගෙන ගත් දේශපාලන තීන්දුව මත ලක්ෂ ගණනින්, දසලක්ෂ ගණනින් අපේ රටේ දූ දරුවන්ගේ ඒ අධ්‍යාපන වරම අද වනකොට අහිමි කර තිබෙනවා. අපි අග්‍රාමාත්‍යතුමියට මේ යෝජනාව ඉදිරිපත් කරනවා. ඔබතුමියගේ පාර්ශ්වයෙන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවාය කිව්වා. ඒ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදනකොට මූලික අයිතිවාසිකම්වලට, නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය, සමාජ සුබසාධනය, කෘෂි කර්මාන්තය, කර්මාන්ත, සේවා වාගේම ව්‍යවසායකත්වය කියන මේ හැම අංශයක්ම ඇතුළත් වුණු පුළුල් මානව අයිතිවාසිකම් පරිච්ඡේදයක්, මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් අපි ඊට ඇතුළත් කරගන්නට ඕනෑ.

අපි දැනුත් කියනවා, විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂාවට ප්‍රමුඛතාව ලබා දිය යුතුමයි කියන එක. ඒක අපි ආරම්භ කරන්නටම ඕනෑ. දූ දරුවන් ජාත්‍යන්තර පාසල්වලට යවලා, ඒවායේ අධ්‍යාපනය ලබා ඔවුන් සමත් වෙනකොට දෙමාපියන් වශයෙන් අපි සතුටක් ලබනවා. එහෙම කරමින් අපට කියන්න බැහැ, අපේ රටේ අධ්‍යාපන ක්‍රමය තුළ ඉංග්‍රීසි භාෂාවට ප්‍රමුඛතාව ලබා දීම අවශ්‍ය නැහැ කියලා. තමන්ගේ දරුවාට හොඳ නම් ඒක මේ රටේ 4,100,000ක් වන නිදහස් අධ්‍යාපනය ලබන දූ දරුවන්ටත් හොඳ වෙන්න ඕනෑ. අද සත්‍යය, යථාර්ථය මොකක්ද? අපි, අපේ රාජ්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපනය නූතනවාදී කරන්නට ඕනෑ; යාවත්කාලීන කරන්නට ඕනෑ; දැවැන්ත ප්‍රතිසංස්කරණ කරන්නට ඕනෑ. ගෝලීය ශ්‍රම වෙළෙඳ පොළේ ඉල්ලුමට සහ සැපයුමට සරිලන අධ්‍යාපන ක්‍රමයක් අපේ රටේ නිර්මාණය කර, මේ STEAM subjectsවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් ඉතිහාසය වැනි විෂයයනුත් අමතක කරන්නේ නැතුව අපි, අපේ ඉදිරි ගමන ක්‍රියාත්මක කළ යුතුයි.

විශේෂයෙන්ම තමන්ට අධ්‍යාපන සුදුසුකම් නොමැති වුවත්, වැඩිපුර පුස්තකාලයේ වේලාව ගත කර තමන්ගේ භාෂා ප්‍රවණතාව ප්‍රගුණ කරන්නට හැකියාව තිබෙන්නට ඕනෑ. එයට හොඳම උදාහරණය තමයි, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා. එතුමා තමන්ගේ ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය කරගත්තේ මේ පාර්ලිමේන්තුවේ පුස්තකාලයේ වැඩි කාලයක් ගත කරලා. තමන් ලබා ගත් self-education එක තුළ තමයි එතුමා එදා එක්සත් ජාතීන්ගේ සභාවලට ගිහිල්ලා ඒ ආමන්ත්‍රණය කිරීම්, ඒ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම් සිදු කළේ.

අවසාන වශයෙන් මම ඉන්දියාවේ අධ්‍යාපනය ලබපු අපේ ගරු අග්‍රාමාත්‍යතුමියට කියන්න කැමැතියි, අපට ඉන්දියාවෙනුත් ඉගෙන ගන්න පාඩම් තිබෙන බව. Indian Institute of Technology, Indian Institute of Management වැනි උසස් අධ්‍යාපන ආයතන ඉන්දියාවේ හැම ප්‍රාන්තයකම පිහිටුවා තිබෙනවා. ඒවා හරහා අද දැවැන්ත මධ්‍යම පන්තියක් ඉන්දියාවේ නිර්මාණය වෙලා තිබෙනවා; උගතුන්ගෙන් සමන්විත උසස් මධ්‍යම පන්තියක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ඉලක්කය කරා යෑම අපේ රටේත් අභිලාෂය වෙන්නට ඕනෑ. අපේ පොදු ජනතාවත්, පොදු ජනතාවගේ දූ දරුවනුත් අපි දැනුමෙන්, බුද්ධියෙන්, ඥානයෙන් සවිබලගන්වන්නට ඕනෑ. එවන් පරිවර්තනයක් අපට නම් පෙනෙන්නේ නැහැ, මේ රජය ක්‍රියාත්මක කරන අවිධිමත් වැඩ පිළිවෙළ තුළ.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Hesha Withanage Ankumbura Arachchi. You have 14 minutes.

[පූ.භා. 11.32]

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු සභාපතිතුමනි, ඉතාම වැදගත් වැය ශීර්ෂයක් වන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වෙනුවෙන් අදහස් දක්වන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අය වැය පිළිබඳව මාසයක් පුරා විවාද කෙරෙනවා. ඒ අතුරින් අද දිනයේ විවාද කරන මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අතිශය වැදගත් එකක් ලෙස හඳුන්වන්න පුළුවන්. මේ වැය ශීර්ෂය පිළිබඳව පළමුවෙන්ම අදහස් දැක්වීම ආරම්භ කරමින් ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය අපේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මේ වනවිට තිබෙන විෂමතා ගැන පැහැදිලි කිරීමක් කළා.

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමියත් මේ සභාවේ ඉන්න වෙලාවේදී මම කියන්න කැමතියි, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා විධියට මම පසුගිය මාස කිහිපය පුරාවටම විටින් විට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන සුවිශාල අවබෝධයක් ලබා ගනිමින්, සමාජය තුළ මේ සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන කථා බහට උත්තර හොයන්න ඉතා විශාල වෙහෙසක් ගත්තාය කියන එක. මම ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, නාලක කලුවැව මැතිතුමාට පළමුවෙන්ම ගෞරවය පිරිනමනවා. මොකද, එතුමා ඉතා ඕනෑකමින් මේ වෙනුවෙන් සක්‍රිය දායකත්වයක් ලබා දුන්නා. ගරු ඇමතිතුමිය ඒ වෙනුවෙන් ගන්නා උත්සාහයට අපි පක්ෂයක් විධියටත්, මම පෞද්ගලිකවත් ගෞරවය පළ කරනවා. මොකද, මේ රටට අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් අවශ්‍යයි. ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දවසින් දෙකෙන් විසඳලා ගෙනෙන්න පුළුවන් කියන එක ක්ෂණික නූඩ්ල්ස් හදනවා වාගේ දෙයක් නොවෙයි. වසර ගණනාවක් තිස්සේ එන දිගුවක් විධියට සමාජයට ගැළපෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව අපේ රටට තිබෙනවා කියන තැන අපි පක්ෂයක් විධියටත් ඉන්නවා. එහෙම නැතුව මේ ආණ්ඩුව විසින් ගෙනෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතික්ෂේප කරලා, ඒ වෙනුවෙන් විරෝධතා ප්‍රකාශ කරන්න වුවමනාවක් අපට නැහැ. අපි කියන්නේ, අපේ රටේ දරුවන්ට වාගේම ජාත්‍යන්තරයට ගැළපෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ටිකක් ගෙනෙන්න අවශ්‍ය වනවාය කියන එකයි. හැබැයි, සමහර වෙලාවට මේ සම්බන්ධව අධ්‍යයනය කරගෙන යද්දී අපිට පෙනෙනවා, ආරම්භක අවධියේ තිබුණු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දින කිහිපයක් ගත වෙනකොට ආපසු හාත්පසින්ම වෙනස්වීම්වලට ලක් වන බව. සමහර විට අපි දන්නේත් නැහැ, කොතැනද මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මේ වෙනකොට නතර වෙලා තිබෙන්නේ කියලා.

උදාහරණයක් විධියට පහ වසර ශිෂ්‍යත්ව විභාගය ගත්තොත්, මුල් කාලයේදී ප්‍රකාශ කරනවා අපි දැක්කා ශිෂ්‍යත්ව විභාගය ළමයින්ට බොහොම අහිතකරයි, ළමයින්ට ලොකු පීඩාවක් දෙනවා, ඒ නිසා ශිෂ්‍යත්ව විභාගය සහමුලින්ම අත්හැර දානවාය කියලා. නමුත්, ඒ සම්බන්ධයෙන් මහජන පැමිණිලි ආවා. එලෙස ආපු පීඩනය දරා ගන්න බැරිව ආණ්ඩුව දැන් කියනවා, ශිෂ්‍යත්ව විභාගය අහෝසි කරන්නේ නැහැ කියලා. ඇමතිතුමියම එහෙම කියනවා අපි අහගෙන හිටියා. මේ සම්බන්ධයෙන් වෙන්න ඕනෑ සැබෑම වෙනස මොකක්ද කියලා අධ්‍යයනයකින් පසුව අවබෝධයෙන් යුතුව කටයුතු කරනවා නම් මේ වාගේ ආපහු ඒවා හකුළා ගන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියලා මම හිතනවා.

මේ වෙනකොට සමාජය තුළ ඉතිහාසය විෂයය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. පාසල් පවත්වන කාලය විනාඩි 30කින් වැඩි කිරීම පිළිබඳව සමාජය තුළ වාගේම ගුරු ප්‍රජාව තුළත් කතිකාවක් ඇති වෙනවා අපි දැක්කා. ඒක යම් යම් වෙනස්කම්වලට භාජන වෙලා තිබෙනවා. ප්‍රතිසංස්කරණයක් කරනකොට ඒක යම් යම් වෙනස්කම්වලට භාජන වෙන්න ඕනෑ. එය සාධනීය තැනකට ගෙනෙන්න ඕනෑ. හැබැයි, ඒ හදන වැඩසටහන ආපහු මුළුමනින්ම වෙන තැනකට මාරු වෙන විධියට ගෙනෙනවා නම් ඒ ප්‍රතිසංස්කරණවල දුර්වලකම් තිබෙනවාය කියලා මම හිතනවා. ඒ නිසා මම එම කාරණය ගරු ඇමතිතුමියගේ අවධානයට යොමු කරනවා. මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරනකොට ඉස්සෙල්ලාම බලන්න ඕනෑ, බස්නාහිර පළාතේ කොළඹින් එහාට ගිහිල්ලා, මේ රටේ දුප්පත් අම්මලා, තාත්තලාගේ දරුවන්ට මේ ප්‍රතිසංස්කරණවලට මුහුණ දෙන්න පුළුවන්ද, ඔවුන් මේ ප්‍රතිසංස්කරණ තුළින් හිරවීමක් වෙනවාද කියලා. උදාහරණයක් විධියට ගත්තොත්, මම නියෝජනය කරන ඇඹිලිපිටිය, තණමල්විල වාගේ ප්‍රදේශවල ජීවත් වන අම්මලා QR කිව්වාම ඒ මොකක්ද කියලාවත් දන්නේ නැහැ, ගරු ඇමතිතුමියනි. මම දන්නේ නැහැ, ඒ අධ්‍යාපනය එම ප්‍රදේශවල ජීවත් වන මිනිස්සුන්ට ලබා දෙන්නේ කොහොමද, ඒ දෙමව්පියන්ගේ දරුවන්ට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගළපන්නේ කොහොමද කියලා. අපි ලෝකයත් එක්ක බද්ධ වෙලා ඉස්සරහට යන්න ඕනෑ. හැබැයි, අපේ සමාජයේ තිබෙන ඒ වපසරිය මොකක්ද කියන එක ගැන අවබෝධයක් තිබෙන්න ඕනෑ. එහෙම නැතුව මේ ප්‍රතිසංස්කරණ ගෙන ඒම තුළින් අපේ අහිංසක ශිෂ්‍ය ප්‍රජාව සම තලයකට ගෙනෙන්න තවදුරටත් ඔබ උත්සාහ කළත්, සම තලයකට නොව තිබෙන තැනිනුත් පහළට යන්න සිද්ධ වෙන නිසා අපි කියනවා, මේ හැම ප්‍රතිසංස්කරණයක්ම රටේ හැම ජන කොට්ඨාසයකටම ගැළපෙන විධියට සකස් කරගෙන යෑම අනිවාර්යයෙන්ම වැදගත් වන බව.

ගරු සභාපතිතුමනි, අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත් පෙර පාසල් අධ්‍යාපනය ගැන කථා කරනවා අපි අහගෙන හිටියා. පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධව යම්කිසි ප්‍රතිසංස්කරණ යෝජනා කිහිපයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. අලුතින් ආරම්භ වෙලා තිබෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පෙර පාසල් අධ්‍යාපනයට කොතැනින්ද පටන් ගන්නේ, පෙර පාසල් දරුවන්ට එය ගළපා ගන්නේ කොහොමද කියන එක ගැන මම හිතන විධියට පැහැදිලි ප්‍රකාශයක් ආණ්ඩුවෙන් සිදු කළේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, අද දිනයේවත් මේ රටේ පෙර පාසල් අධ්‍යාපනය ගැන - මොකද, මෙතැනින් තමයි දරුවා අධ්‍යාපනයට යොමු කරන මග පටන් ගන්නේ- ඒක මොන විධියටද වෙන්නේ, ඒක අලුත් ප්‍රතිසංස්කරණත් එක්ක කොහොමද ගැළපෙන්නේ කියන කාරණාව ගැන යම් නිශ්චිත මතයක් ඉදිරිපත් වෙයි කියා. ආදරණීය දෙමව්පියන් දරුවන් ගැන විශාල බලාපොරොත්තු තියාගෙන කටයුතු කරද්දී, දරුවා පළමුවෙනි පියවර තබනකොටම කෙතනටද යන්නේ කියලා අවබෝධයක් නැති වන එක ඛේදනීය තත්ත්වයක්. එම නිසා ඒ ගැන උත්තරයක් දෙයි කියලාත් අපි බලාපොරොත්තු වනවා.

අපි දැක්කා දුන් මැතිවරණ පොරොන්දුවක්. මැතිවරණ පොරොන්දු ඉටු කරනවාද, නැද්ද කියනවාද කියන එක ආණ්ඩුවේ වගකීමක්. මේ වනකොට ආණ්ඩුවේ ලොකුම අභියෝගය වෙලා තිබෙන්නේ විපක්ෂයෙන් කරන ප්‍රකාශවලට උත්තර දෙන එක නොවෙයි, ආණ්ඩුව විසින්ම මැතිවරණ වේදිකාවලදී කියන ලද ප්‍රකාශවලට උත්තර සපයන්නේ කොහොමද කියන එක. ඒ කියන්නේ, තමන් කියපු කථාවට තමන්ට උත්තර දෙන්න වෙලා තිබෙනවා. අපි දැක්කා අපේ ගරු ඇමතිතුමියත්, සියයට 6ක් අධ්‍යාපනය සඳහා වෙන් වෙන්න ඕනෑ කියලා ප්‍රධාන මතයක ඉන්න කණ්ඩායමකට නායකත්වය දුන්නා. අධ්‍යාපන ඇමතිවරිය විධියට අද එතුමිය අසමත් වෙලා තිබෙනවා, ඒකෙන් සියයට 50ක්වත් ළඟා කර ගන්න. අපි කියනවා, ඔය ඔක්කොම පොරොන්දු ඉටු කරන්න බැරි වුණත්, ඉටු කළ යුතු වැදගත්ම කාරණයක් තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ ඉඳලා හැම කෙනෙකුම මේ රටේ පාසල් දුවා දරුවා වෙනුවෙන් විශාල වශයෙන් කථා කරලා කිව්වා, "දරුවන්ගේ අධ්‍යාපනයට දෙන්න පුළුවන් උපරිම හයිය දෙන්න අපි පාසල් උපකරණවලට තිබෙන VAT එක අයින් කර දමනවා" කියලා. අද VAT එක අයින් කරන කථාව හීනයක් වෙලා තිබෙනවා. ඒ ගැන කථා කරනකොට ගැරඬින්ට බූමිතෙල් ගහනවා වාගේ තත්ත්වයක් තමයි දකින්න තිබෙන්නේ. ආණ්ඩුව එක එක උත්තර දෙන්නේ. ඔබ බැරි බව දැනගෙන ප්‍රකාශ කළා නම් ඒක සමාජයට, රටට කියන්න. මේක අස්වැසුම ලබාදෙන පවුලකට රුපියල් 5,000ක් දෙනවාට වඩා පින් සිද්ධ වන වැඩක්. තමන්ගේ දරුවාගේ අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය අධ්‍යාපන උපකරණ කට්ටලයේ මිල සියයට 25කට ආසන්න ප්‍රමාණයක්, සියයට 18 VAT එක අයින් කළාම අඩු වෙනවා. ඒක වැදගත්, මාසයකට ලබාදෙන ඔය රුපියල් 5,000 මුදලට වඩා. මොකද, දරුවන් හතරපස් දෙනෙකු ඉන්න පවුලකට ඒක දරා ගන්න හරි අමාරුයි. ඒ නිසා සමාජය විශ්වාස කළා, මේ නව ආණ්ඩුව ඇවිල්ලා පාසල් උපකරණවල VAT අඩු කරලා, අපේ දරුවන්ට ඉගෙන ගන්න තිබෙන පරිසරය තව ටිකක් පහසු කරයි කියලා.

ඒ වාගේම ඔබේ ප්‍රධාන වේදිකාවේ කළ කථාවක් තිබුණා. අපි දන්නේ නැහැ, ඒක කොහොම වෙන්න ඕනෑ ද කියලා. මොකද, ඒක අපි නොවෙයි ආණ්ඩුව කථා කළේ. ඒ තමයි, මේ රටේ අමතර පන්ති සංස්කෘතිය. නැත්නම්, ටියුෂන් මේ සමාජය ගිලගෙන තිබෙන්නේ කොහොමද කියලා ඔබේ වේදිකාවේ දිගින් දිගටම කථා කළා. මේ, එදා ලබා දුන් පොරොන්දු. ඒ හරහා දරුවන්ට තිබෙන, දෙමව්පියන්ට තිබෙන පීඩනය නැති කරන්න ඔබ විකල්ප කිව්වා. අද අපට පෙනෙනවා, ඒක තවදුරටත් එහාට ගිහිල්ලා මේ සමාජය තුළ කථා වනවා. මම මේක වැඩිය විග්‍රහ කරන්න යන්නේ නැහැ. චාමර සම්පත් මන්ත්‍රීතුමාත් කිව්වා, අද උසස් පෙළ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය පිළිබඳව ගැටලුවක් තිබෙන බව. මේ සමාජය තුළ කියනවා, ඒ ගුරුවරයාව ආරක්ෂා කරන්න ආණ්ඩුවේ ප්‍රබල හස්තයක් පිටුපස්සෙන් ඉඳගෙන හයිය දෙනවා කියලා. ටියුෂන් පන්ති නවත්වන්න ආපු ආණ්ඩුව ටියුෂන් පෝෂණය කරනවා විතරක් නොවෙයි, විශ්වවිද්‍යාලයට යන්න ඉන්න දරුවාගේ අවස්ථාව අහිමි කරමින් තවත් සිසු ප්‍රජාවකට විශේෂතාවක් ළඟා වන විධියට ටියුෂන් පන්ති කරන්න ලයිසන් එක දීලා තිබෙනවා කියන එක තමයි මේ කාරණාවත් එක්ක පෙනෙන්නේ.

ඔබේ දේශපාලන සටන් පාඨවල පෙරමුණේ හිටියේ උපාධිධාරී දරුවන්. මේ රටේ උපාධියක් ලබා ගන්න ගම්මානවල දරුවෝ කොච්චර දුක් විඳිනවාද කියන කාරණාව සමාජයට අකුරෙන් අකුර පෙන්වලා දුන්නා. අපට මතකයි, කඳුළු වක්කරගෙන කථා කළේ. නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවා. ඒ කථා කරපු සාකච්ඡාවල voice-cuts තිබෙනවා, අහන්න පුළුවන්. තමන් බලයට ආපු ගමන් මේ රටේ දුක් විඳින පරම්පරාවේ අම්මලා, තාත්තලා වෙනුවෙන් සාධාරණයක් ඉටු කරන්න විශ්වවිද්‍යාලයේ අවුරුදු 3, 4ක් දුක් විඳපු දරුවන්ගේ රැකියා සිහිනය සැබෑ කරන හැටි කිව්වා. අද ඒ රැකියා සිහිනය සැබෑ කරන හැටි නොවෙයි, රැකියාලාභීන් විධියට උපාධි අරගෙන පාසල්වල අවුරුදු 4ක්, 5ක් උගන්වන සංවර්ධන නිලධාරින්ගේ වෘත්තීයභාවය ස්ථිර කරන්න ක්‍රමවේදයක් නැහැ. ජනාධිපතිතුමා කියනවා, පාරේ ඉන්න එපා, ගිහිල්ලා විභාගවලට පාඩම් කරන්න කියලා. උපාධි තිබෙන කොල්ලෝ කෙල්ලන්ට කියන්නේ, පාඩම් කරලා, ආපහු ලැහැස්ති වෙලා, තව විභාග ලියලා, රැකියාවලට එන්න කියලායි. එදා උපාධිධාරීන්ට කියපු කථාව මෙච්චර ඉක්මනට වෙනස් කරන්න තරම් ආණ්ඩුව දරදඬු වුණේ කොහොමද කියලා මම දන්නේ නැහැ.

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන පරිපාලන සහ ගුරු අධ්‍යාපනඥ සේවා නිලධාරින්ට වැටුප් විෂමතාවක් වෙලා තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, අපි හිතුවේ මේ අය වැයෙන් ඒකට උත්තරයක් ලැබෙයි කියලායි. 2022 ජනවාරි 01වැනි දා වෙනකොට සේවයේ හිටපු මේ නිලධාරින්ගේ වැටුපට වඩා වැඩි වැටුපක් අලුතින් බඳවා ගන්න නිලධාරින්ට ලැබෙනවා. මේක බොහොම නරක තැනකට යන දෙයක්. ඒ වැටුප් විෂමතාව නිවැරදි කරන්න මේ අය වැයේ සාකච්ඡා වෙයි කියලා අපි හිතුවා. ඒක අපි දැක්කේ නැහැ. ඒ විතරක් නොවෙයි, දීර්ඝ කාලයක් -වසර ගණනාවක්- තිස්සේ පාසල්වල විදුහල්පතිවරුන්ගේ ගැටලුවට මහා විශාල බලපෑමක් කරලා තිබෙන කාරණාවක් තමයි, අපි හැම දාම කථා කරන ගුරු සේවයේ සහ විදුහල්පති සේවයේ තිබෙන වැටුප් විෂමතාව. ගුරු සේවයේ I පන්තියේ ගුරුවරයෙකුට සහ විදුහල්පති සේවයේ III පන්තියේ විදුහල්පතිවරයෙකුට පාසලක විදුහල්පතිවරයෙකු විධියට වැඩ භාර ගන්න වුවමනාවක්, උනන්දුවක්, උත්තේජනයක් දෙන්න බැරි වෙලා තිබෙන මේ වැටුප් විෂමතාව නිවැරදි කරන්න වසර ගණනාවක් තිස්සේ බැරි වෙලා තිබෙනවා. ඔබත් ඊට අසමත් වෙලා තිබෙනවා කියලා අපි හිතනවා.

ඊළඟට, අධ්‍යාපනඥ සේවයේ ඉහළ ඉන්න නිලධාරියෙකුට - 2014දී වාගේ බැඳුණු නිලධාරියෙකුට- 2020දී තමයි වාහන බලපත්‍රයක් හම්බ වෙන්නේ. මේ වාහන බලපත්‍රය කියන එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එදා කෝටි 10, 15 වාහන ගන්න දුන්නු එක වාගේ එකක් නොවෙයි. මේක සාමාන්‍ය වාහනයක් ගන්න ලැබෙන එකක්. ඔහුගේ විශ්‍රාම ජීවිතය වෙනුවෙන් යම්කිසි ඉතිරියක් විධියට තමයි ඒ අධ්‍යාපනඥයා මේක දැක්කේ. ඒ අවස්ථාව එදා දීලා තිබුණා. හැබැයි, 2020දී දීපු ඒ බලපත්‍රය අද කොළ කෑල්ලකට සීමා කරලා තිබෙනවා, ඒ ගැන මායිම් නොකොට. විශේෂයෙන් මේ රටේ අධ්‍යාපන සේවයේ කටයුතු කරන, තමන්ට විදෙස්ගත වෙන්න අවස්ථාව තිබෙද්දී, විශාල වැටුප්වලට වෙන වෙන අවස්ථා තිබෙද්දී, තමන් ඉගෙන ගත් නිදහස් අධ්‍යාපනයට ගරු කරමින් ඉන්න මහාචාර්යවරු, ආචාර්යවරු ඇතුළු මේකට සුදුසුකම් ලබා සිටින සියලුදෙනාට ආණ්ඩුව කනේ පහරක් ගහලා තිබෙනවා. අපි හිතනවා, ඒ වෙනුවෙන් මේ මොහොතේ හෝ සලකා බලලා, අර වාහන 1,775ක් ගෙන්වන්න අනුමැතිය දෙන්න තිබුණු හදිස්සිය මේකටත් ලබා දීලා මේ රාජ්‍ය සේවකයන්ට ඒ අවස්ථාව ලබා දීම කළ යුතුයි කියලා.

ගරු සභාපතිතුමනි, මම උසස් අධ්‍යාපනය ගැන යමක් කථා කරන්න කැමැතියි. ඊයේ පෙරේදා දවසක අපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා එක්ක කථා කළා. එතුමා එක්ක කථා කළාම තමයි අපට කාරණය මොකක්ද කියලා තේරුණේ. මම ඒ කාරණය එක දවසක් ගරු අගමැතිතුමියගෙන් ප්‍රශ්නයක් විධියටත් ඇහුවා. එතුමිය උත්තරයකුත් දුන්නා. හැබැයි, මේ දීපු උත්තරයයි, ඒකයි අතර ලොකු වෙනසක් තිබෙනවා කියලා තේරුණා. එක කාරණයක් තමයි, විශ්වවිද්‍යාලවලට උපකුලපතිවරුන් පත් කිරීම. විශ්වවිද්‍යාලයක උපකුලපති කෙනෙක් පත් කිරීම පාසලක විදුහල්පති කෙනෙකු පත් කරනවාටත් වැඩිය යටට ගිහිල්ලා තිබෙනවා, ගරු අගමැතිතුමියනි. මේ සඳහා වෙනම panel එකකින් නම් කරලා එවනවා. රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත් කරන එකට -VC පත් කරන එකට- කමිටුව විසින් නිර්දේශ කරලා නම් තුනක් එවනවා. නැවත UGC එකෙන් දන්වා යවනවා, වෙන නමක් එවන්න කියලා. නැත්නම්, ඒ නම් තුන පිළිගන්නේ නැහැ. ඒක නිසා අපි අහනවා, මේ කමිටුවේ ඉන්න කට්ටිය කවුද කියලා. කමිටුවේ ඉන්න අයට තිබෙන සුදුසුකම් මොනවාද?

මම මේක කියන එක හරිද දන්නේ නැහැ. සබරගමුව විශ්වවිද්‍යාලයේ VC පත් කරන එකේදී ඒ කමිටුවට සරමක් ඇඳගත්තු කෙනෙකුත් වාඩි වෙලා, ගරු ඇගමැතිතුමියනි. සාමාන්‍ය පෙළ සමත් නැති මිනිස්සුත් මේ කමිටුවේ ඉන්නවා. ඒක ඔබතුමියගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක නිවැරදි වෙන්න ඕනෑ කාරණාවක්. අපි හිතනවා, විශ්වවිද්‍යාලයක උපකුලපති පත් කිරීම ඉතාම විනිවිදව වෙන්න ඕනෑ දෙයක් කියලා. මේ රටට උගතුන්, විද්වතුන් බිහි කරන, නිර්මාණය කරන තැන පරිපාලන බලධාරියා දේශපාලන හෙංචයියෙක් වෙනවා නම් අපේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට මොකක්ද වෙන්නේ කියන කාරණාවට උත්තරයක් නැහැ.

ඊළඟට තව කාරණයක් තිබෙනවා. මේක අපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගෙනුත් ඇහුවා. මම ගරු ඇමතිතුමියගෙනුත් ඇහුවා. මේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල 18 වාගේම උපාධි පිරිනමන රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල 31ක් තිබෙනවා, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ අනුමැතිය තිබෙන.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

ගරු අධ්‍යාපන ඇමතිතුමියනි, විදෙස් විශ්වවිද්‍යාලවලට මේ රටේ අවසරය දෙන ක්‍රමය තමයි ඒ අදාළ විදෙස් විශ්වවිද්‍යාලයේ ranking එක බලන එක. එතැනින් එහා කිසිම නියාමනයක් වෙන්නේ නැහැ. ඒ විශ්වවිද්‍යාලයේ අදාළ ඉඩ පහසුකම් තිබෙනවාද, මේ programmes උගන්වනවාද ආදී කාරණා මොකුත් නැහැ. උපාධි කඩ විශාල සංඛ්‍යාවක් ඇරලා තිබෙන්නේ මේක නිසායි. ඒ සඳහා නීති නිර්මාණය කර ගන්නේ නැතුව, ඒකට අවශ්‍ය නීති හදා ගන්නේ නැතුව UGC එකට ඒකට මැදිහත් වෙන්න බැහැ කියලා එතුමන්ලා කියනවා. මම දන්නේ නැහැ, අපේ උසස් අධ්‍යාපනය කොතැනින් නරක තැනකට තල්ලු වෙච්ද කියලා. ඒක නිසා ඔබතුමියගේ දැඩි අවධානයට ලක් කරනවා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඒ තිබෙන බාධාව - ඒ නීති නොමැතිකම - වෙනුවෙන් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. අපේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් මහා විශාල කැපකිරීමක් කළ යුතු කාලයක ඒක නිවැරදිව, අවංකව දේශපාලනයෙන් තොරව මේ රටේ සිසු ප්‍රජාව වෙනුවෙන්, මේ රටේ අධ්‍යාපනඥයන් වෙනුවෙන් කරන්න හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Mahinda Jayasinghe, you have 15 minutes.

[පූ.භා. 11.48]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු සභාපතිතුමනි, අද දවසේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳ

විවාදයට එක් වෙමින් අදහස් දැක්වීමට මට අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

2026 වසර තමයි මෑත ඉතිහාසයේ අය වැයක් මඟින් අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව වැඩිම මුදලක් වෙන් කරපු වසර. ඒ කියන්නේ, දළ දේශීය නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා සියයට 2.04ක් වෙන් කරපු වසර බවට ලබන වසර පත් වෙලා තිබෙනවා. අද විපක්ෂයේ ඉඳගෙන අපට උපදෙස් දෙන අයගේ ආණ්ඩු කාලවල අධ්‍යාපනය සඳහා මුදල් වෙන් කළේ කොහොමද කියලා අපට මතකයි. එම ප්‍රමාණය එක වෙලාවක සියයට 0.98යි, තව වෙලාවක සියයට 1.02යි. ඒ විධියට තමයි ඔවුන් අය වැය හරහා ප්‍රතිපාදන සිදු කළේ. හැබැයි, ඉතිහාසයේ පළමු වතාවට මෙතෙක් වෙන් කළ වැඩිම මුදල විධියට සියයට 2.04ක් අපේ ආණ්ඩුව වෙන් කර තිබෙනවා. අපේ ගරු අගමැතිතුමියත් කිව්වා වාගේ පසුගිය ආණ්ඩු කාලවලත් අප ඉල්ලුවේ, අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල ක්‍රමානුකූලව වැඩි කරන්න කියලායි. ඉතින් අපි දැන් එය ක්‍රමානුකූලව වැඩි කරමින් තිබෙනවා. ඒ අනුව අධ්‍යාපනයට පසුගිය වසරේ රුපියල් බිලියන 619ක් සහ මේ වසරේ රුපියල් බිලියන 704ක් වෙන් කර තිබෙනවා. ගිය වසරට වඩා මේ වසරේ අධ්‍යාපනයට වෙන් කළ මුදල වැඩියි. සහතිකයි, 2027 වසරට අධ්‍යාපනය සඳහා ඊටත් වඩා වැඩි මුදලක් වෙන් කරන ආණ්ඩුව බවට මේ ආණ්ඩුව පත් වන බවට. මෙහිදී අපි කියන්න ඕනෑ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කළා වාගේ අධ්‍යාපනය තමයි අපේ අංක එකත්, දෙකත්, තුනත්. අපේ ප්‍රමුඛතාව, අධ්‍යාපනයයි. ඒ වෙනුවෙන් තමයි අප මේ ආකාරයට මුදල් වෙන් කරලා අදාළ කටයුතු කරමින් ඉන්නේ. ඒ අන් කිසිවක් නිසා නොව, අධ්‍යාපනය කියන්නේ රටක අනාගතයේ තීරණාත්මක සන්ධිස්ථානයයි, එහෙම නැත්නම් අනාගතය තීරණය කරන තැනයි කියලා අප දන්නා නිසායි. ඒ නිසාම තමයි අපි අධ්‍යාපනයට අවශ්‍ය තරම් බරක් තබලා තිබෙන්නේ. ඒ නිසාම, පසු ගිය කාලය තිස්සේ විවිධ විධියට ඇණහිටලා තිබුණු බඳවා ගැනීම් සිදු කරන්න අපි කටයුතු කළා. මතක තියාගන්න, අධ්‍යාපන පරිපාලන සේවය සඳහා 2017න් පසුව බඳවා ගැනීම් කරලා තිබුණේ නැති බව. ඒ කියන්නේ, ඔය එහා පැත්තේ ඉන්න අය නායකත්වය දුන්නු 2015-2019 ආණ්ඩුව කාලයේත් එහෙමයි. අපි අධ්‍යාපන පරිපාලන සේවය සඳහා අලුතින් 502ක් බඳවා ගත්තා; ඒ වාගේම ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා 580ක් බඳවා ගත්තා. මේ වසර තුළ ගුරුවරුන්, විද්‍යාපීඨ ගුරුවරුන් 4,134ක් බඳවා ගන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, විදුහල්පතිවරුන් බඳවා ගැනීම සඳහා වන තරග විභාගය අපි ගැසට් කරලා තිබෙනවා. පසුගිය 14වන දා එම තරග විභාගය ගැසට් කළා. ඒ විතරක් නොවෙයි, අධ්‍යාපන පරිපාලන සේවයේ, ගුරු අධ්‍යාපනඥ සේවයේ ඉතිරි පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කරන්නත්, ගුරුවරුන් බඳවා ගන්නත්, ගුරු උපදේශකවරුන් බඳවා ගන්නත් අවශ්‍ය කරන ගැසට් පත්‍රය නිකුත් කරන්න අපි ඉතා කෙටි කාලයක් ඇතුළත සූදානම් වෙලා ඉන්නවා.

ඒ වාගේම, මා තවත් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. මේ සභාවේ විපක්ෂය පැත්තේ ඉන්නවා, මුල් ළමාවිය පසු කරපු නැති පිරිසක්. මොකද, මේ පාර්ලිමේන්තුව ඇතුළේ අප නොයෙක් කරුණු පිළිබඳව විවිධ අවස්ථාවල දිගින් දිගටම, විටින් විට පැහැදිලි කිරීම් කළා. එක්කෝ, ඒ පැහැදිලි කිරීම් ඇහිලා නැහැ, එහෙම නැත්නම් ඇහුණත් තේරිලා නැහැ, එහෙමත් නැත්නම් තේරුණත් නොතේරුණා වාගේ නිකම් බොරු සන්දර්ශන මවනවා. අපි ඒ ගොල්ලන් හැමෝටම කියනවා, ඉස්සෙල්ලාම මුල් ළමාවිය සංවර්ධනය කරගෙන එන්න කියලා.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මීට පෙර කථා කරපු විපක්ෂයේ හැමෝම වාගේ කථා කළා, උපාධිධාරීන් බඳවා ගැනීම ගැන. ගරු සභාපතිතුමනි, 2023.01.27 තමයි උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා ගැසට් මඟින් applications call කළේ. 2023.03.25වන දා තමයි විභාගය පවත්වන්න නියමිතව තිබුණේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 4ක් ගොනු කරලා, එදින විභාගය පවත්වන්න නොදී 2023.03.23වන දා -විභාගය පවත්වන්න දින 2ක් තිබියදී- වාරණයක් ගත්තා. එහෙම නම්, මේක අපි නවත්වපු එකක්ද? මේක අපේ ආණ්ඩුව නතර කරපු එකක් නොවෙයි. ඒ උපාධිධාරීන්ගෙන්ම කොටසක් තමයි ඒක කළේ. අපි දන්නවා, ඒකට පාරාජිකා වෙච්ච සමහර කුඩා දේශපාලන කල්ලි කිහිපයකුත්, ඒවායේ නීතිඥයනුත් සම්බන්ධ වුණා කියලා. කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් අරගෙන එම විභාගය පවත්වන එක වැළැක්වූවා. එදා විභාගය පැවැත්වූවා නම්, අවුරුදු තුනකට ආසන්න කාලයක් තිස්සේ උද්ඝෝෂණය කරන, විවිධ අරගළ කරන ඒ උපාධිධාරීන් අද ගුරු සේවයට ඇවිල්ලා. නමුත්, එදා විභාගය පවත්වන්න දුන්නේ නැහැ. පස්සේ මොකක්ද වුණේ? ඒ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු 4ම ප්‍රතික්ෂේප වුණා.

විපක්ෂ නායකතුමා මොකක්ද සමථයක් ගැන කියනවා. මම දන්නේ නැහැ ඒ මොකක්ද කියලා. ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහට ගිහිල්ලාත් සමථයක් ගැන කියනවා මම දැක්කා. කොහේ වෙච්ච සමථයක්ද? ඒ සමථය සභාගත කරන්නකෝ. දැන් ගොඩක් දේවල් එතුමා සභාගත කළේ. ඒ වාගේම පාර්ලිමේන්තුවේ සභාගත කරන්නකෝ, ඔය කියන සමථය. එවැනි සමථයක් කොහේදීවත් වෙලා නැහැ. ඒ නඩු 4ම ශ්‍රේෂ්ඨාධිකරණය නිෂ්ප්‍රභ කළා. පසුගිය 20වන දා අභියාචනාධිකරණයේදී අවසන් නඩුව තිබුණා. ඒ තමයි, DOsලා නොවන අනෙකුත් උපාධිධාරීන් දාපු නඩුව. දැන් ඒ නඩුවේ අවසන් තීරණය ඇවිල්ලා තිබෙනවා. එම නිසා ලබන වසර වන කොට ඒ සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට බඳවා ගන්න ඕනෑ කරන විභාග පවත්වන්නත් අපි සූදානම් වෙලා ඉන්නවා. අපි විභාග දෙකක් පවත්වන්න සූදානම් වෙලා ඉන්නවා. දැනට පාසල්වල සංවර්ධන නිලධාරීන් ලෙස කටයුතු කරන උපාධිධාරීන් 2022.12.31 දක්වා වන පුරප්පාඩු සඳහා බඳවා ගන්නත්, ඉන් පසුව ඇති වන -2025.06.30 දක්වා ඇති වන- පුරප්පාඩු සඳහා අනෙකුත් උපාධිධාරීන්ගෙන් බඳවා ගන්නත් අවශ්‍ය සැලසුම් අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් සකස් කරමින් තිබෙනවා.

ඒ වාගේම, විපක්ෂය මෙහිදී තවත් කාරණයක් කියනවා මම දැක්කා. මම තව මොහොතකින් - ඊළඟ අවස්ථාවේදී - සභාගත කරනවා 1994, ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය. මේ තිබෙන්නේ එයයි. මම මේ නෝනා මහත්වරුන් ඔක්කෝටම කියනවා, මෙන්න මේක හොඳට කියවා එන්න, ඊට පසුව විවාද කරන්න කියලා. එතුමන්ලා මෙතෙක් කල් මේ පාර්ලිමේන්තුව ඇතුළේ රැඟුවා, මේවා සම්බන්ධයෙන් නිවැරදිව උත්තර දෙන්න පිරිස් හිටියේ නැති නිසා. ඉතිහාසයේ එහෙම වුණු බව අපට මතකයි. ඒවාත් එක්ක හැප්පෙනවා නම් අපි හරියට හැප්පෙමු.

1994, ගුරු සේවා ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව තිබෙනවා, ගුරුවරයෙකු බඳවා ගන්නේ කොහොමද කියලා. විපක්ෂ නායකතුමා කියනවා මම දැක්කා, ගුරු සේවයේ 2-II ශ්‍රේණියට පත්වීම් දෙන්න ඕනෑ කියලා. ඒක, එදාත් කිව්වා නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔව්, ඔව්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
අදත් කිව්වා, එදාත් කිව්වා. එතුමන්ලා මේවා ගැන දන්නේ නැහැ. අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය සභාවේ

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ඉන්නවා. අඩුම තරමින් එතුමියවත් ගුරු සේවා ව්‍යවස්ථාව ගැන එතුමන්ලාට කියලා දෙන්න ඕනෑ. එතුමියත් දන්නවාද කියලා මම දන්නේ නැහැ. ඒක ගැන කියලා දෙන්න, නොදන්නා අයට. අප්පච්චියේ, මෙහෙම පව වෙන්න එපා! එතුමා, විපක්ෂ නායකතුමා නේ. "විපක්ෂ නායක" කියන්නේ රටේ ගරු කටයුතු තනතුරක්. මීට කලින් අපේ ගරු සභානායකතුමාත් මේ ගැන කිව්වා. "සජිත් ප්‍රේමදාස sourcesවලින්" කරුණු කියනවා. ඒවා, පට්ටපල් බොරු; වැරැදි ඒවායි කියන්නේ. එතුමාට ඕනෑ නම්, නිවැරැදි sources අපි දෙන්නම්. අපේ ඒවා නොවෙයි; ඒවා "මහින්ද ජයසිංහ sources" නොවෙයි; ඒවා රජයේ ගැසට් නිවේදන. අපි ඒවා දෙන්නම්. ඒවා හරියට අධ්‍යයනය කරලා එන්න. ගුරු සේවයේ 2-II ශ්‍රේණියට බඳවා ගන්නේ අධ්‍යාපනවේදී උපාධිධාරින්; B.Ed. කරපු අය. එහෙම නැතිව සාමාන්‍ය උපාධිධාරින් ගුරු සේවයේ 2-II ශ්‍රේණියට බඳවා ගන්නේ නැහැ. ඒකවත් දන්නේ නැතිව නිකම් කියවනවා.

මේ අය වැය, අධ්‍යාපනයට වැඩි මුදලක් වෙන් කිරීම අතින් ඉදිරියට පියවර තබපු අය වැයක්. ඒ වාගේම මේවාට අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. අධ්‍යාපන පරිපාලන සේවය තවත් පුළුල් වෙන්න ඕනෑ; ඒවායේ පුරප්පාඩු පිරවෙන්න ඕනෑ. ගුරු අධ්‍යාපනඥ සේවය, ගුරු උපදේශක සේවය ගත්තත් එහෙමයි. තවත් ගුරුවරුන් අවශ්‍යයි. ඒ සියලු දෙනා විධිමත්ව බඳවා ගැනීම කරන්න ඕනෑ.

ඒ වාගේම විපක්ෂය අද කථා කළා, විදුහල්පති සේවය ගැන. ඔව්, ඇත්ත. ගුරු සේවයේ ඉඳලා විදුහල්පති සේවයට ආපු අයගේ වැටුප් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වැටුප් ප්‍රශ්නය ගැනවත් විපක්ෂය හරියට දන්නේ නැහැ. මොකක්ද ඒ වැටුප් ප්‍රශ්නය? 2019දී විභාගය පවත්වනවා; ඊට පස්සේ ඒ එකම විභාගයෙන් විටින් විට විදුහල්පතිවරුන් බඳවා ගන්නවා. අන්න ඒ නිසා අපේ ආණ්ඩුව තීරණය කර තිබෙනවා පවත්වනු ලබන විභාගය ඒ අදාළ වසරේ බඳවා ගැනීම්වලට සීමා කරන්න. මේ ප්‍රශ්නයට වෙනත් උත්තර සොයන්න බැහැ. ඊළඟ වසරට බඳවා ගන්න ඕනෑ වනකොට, ඒ වසරට අදාළව විභාගය පවත්වා බඳවා ගන්නවා. වසරෙන් වසර විභාග පවත්වන්නේ නැතිව, එක විභාගයෙන් විටින් විට -තුන් හතර වතාවක්- බඳවා ගන්න යනකොට මේ විධියේ ප්‍රශ්න මතු වෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, ගුරු සේවයේ ඉඳලා විදුහල්පති සේවයට ආපු අයගේ වැටුප් ප්‍රශ්නය විසඳීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, සැලසුම් ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඉදිරි කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන්නයි අප දැන් සූදානම් වෙලා ඉන්නේ. අමාත්‍යාංශය පැත්තෙන් කියූ පරිදි ඒක දැන් Sinahala සහ Tamil translationsවලට යොමු කර තිබෙනවා. ඒ Cabinet Paper එකත් ඉදිරිපත් වනවා කියන කාරණය සඳහන් කරන්න ඕනෑ.

මේ අය වැය මඟින් විද්‍යාපීඨ ගුරු සිසුන්ගේ දීමනාව රුපියල් 2,500කින් වැඩි කළා. ඒ විතරක් නොවෙයි, ගුරුවරුන්ගේ දුෂ්කර දීමනාව රුපියල් 1,500කින් වැඩි කළා. ඒ රුපියල් 1,500 මදි තමයි. ඒක ඇත්ත. අපි කියන්නේ නැහැ, "දැන් හරි ෂෝක්, මේක ප්‍රමාණවත්" කියලා. අර කියනවා වාගේ, රුපියල් 15,000ම දෙන්න පුළුවන් නම් හොඳයි. 2015-2019 කාලයේදීත් ආර්ථික වර්ධනය සියයට 5 ඉඳලා සියයට 2 දක්වා වැට්ටුවා; එහෙම වට්ටවලා, ණය අරගෙන, ණය බරින් පිරිච්ච රටක් බවට මේ රට පරිවර්තනය කළා. මුළු මහත් ආර්ථිකයම කාබසිනියා කරපු රටක් භාර ගත්තාට පසුව මේ කියන හැම දෙයම එකවර කරන්න බැහැ. අවුරුදු 20කට පස්සේ දුෂ්කර දීමනාව රුපියල් 1,500කින් වැඩි කරන්න අපි කටයුතු කළා. ඒකත් මතක තබා ගන්න. විදුහල්පති දීමනාවත් රුපියල් 1,500කින් වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. උත්සව පූර්ව දීමනාව රුපියල් 15,000ක් දක්වා වැඩි කර තිබෙනවා. ආපදා ණය සඳහා රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙනවා. දේපොළ ණය රුපියල් ලක්ෂ 50 දක්වා වැඩි කළා, සියයට 4ක පොලී සහනයකුත්, සියයට 2ක පොලී සහනයකුත් එක්ක. ඒ සියලු දේවල් ගුරු විදුහල්පතිවරුන් ඇතුළුව අද මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න සියලු දෙනාට ලැබෙනවා. මේ අය වැය, කිසිදු ඉල්ලීමකින් තොරව, කිසිදු අරගළයකින් තොරව ගුරු විදුහල්පතිවරුන් ඇතුළුව අපේ රටේ රාජ්‍ය සේවකයාගේ අයිතිවාසිකම් ලබා දීපු අය වැයක්.

ඒ විතරක් නොවෙයි. මම කියන්න ඕනෑ, වැටුප් වැඩි කිරීම ගැනත්. මොකද, දැන් දිගින් දිගටම කථා කරමින් ඉන්නවා වැටුප් ගැන. ගුරු සේවයේ 1 පන්තියේ ගුරුවරයෙකුට දැන් ලැබෙනවා රුපියල් 78,063ක වැටුපක්. ඒක ලබන අවුරුද්දේ ජනවාරිවල වැඩි වෙනවා, රුපියල් 88,322ක් දක්වා. මම මේ කියන්නේ ගුරු සේවාවේ පළමුවැනි පියවරේ ඉන්න කෙනාගේ විතරයි. පියවර දෙකක්, තුනක්, හතරක්, පහක් ඉහළට ගිය අයගේ වැටුප් වැඩි වීම මීට වඩා වැඩියි. ගුරු සේවයේ 2-I ශ්‍රේණියට ඇති රුපියල් 66,482 වැටුප රුපියල් 76,158 දක්වා වැඩි වෙනවා. පළමුවැනි පන්තියේ වැටුප රුපියල් 10,259කින් වැඩි වෙනකොට, ගුරු සේවයේ 2-I වැටුප රුපියල් 8,022කින් ලබන ජනවාරිවල වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි, 2-II ශ්‍රේණියේ වැටුප රුපියල් 56,237 ඉඳලා රුපියල් 61,559 දක්වා රුපියල් 5,322කින් වැඩි වෙනවා, ලබන ජනවාරි සිට. 2027 ජනවාරි මස මේ හා ප්‍රමාණයකින් තව වතාවක් වැඩි වෙනවා. අපි ඊළඟ අය වැයේදී ඒක කියන්නම්. 3-I ශ්‍රේණියේ වැටුප රුපියල් 50,020 ඉඳලා රුපියල් 53,940 දක්වා රුපියල් 3,920කින් වැඩි වෙනවා. 3-II ශ්‍රේණියේ වැටුප රුපියල් 46,771 ඉඳලා රුපියල් 49,886 දක්වා රුපියල් 3,177කින් වැඩි වෙනවා.

විදුහල්පති සේවයේ පළමු පියවරේ වැටුප රුපියල් 79,994 සිට රුපියල් 90,667 දක්වා රුපියල් 10,673කින් වැඩි වෙනවා. විදුහල්පති සේවයේ දෙවැනි පන්තියේ වැටුප රුපියල් 68,021 ඉඳලා රුපියල් 75,996 දක්වා රුපියල් 7,975කින් වැඩි වෙනවා. තුන්වැනි පන්තියේ වැටුප රුපියල් 59,957 ඉඳලා රුපියල් 66,119 දක්වා රුපියල් 6,162කින් වැඩි වෙනවා. මේ හා සමානව ගුරු උපදේශක සේවයේත් වැටුප් වැඩි වෙනවා.

අපි දැක්කා, ගොඩක් අය දැන් වැටුප් විෂමතාව පිළිබඳව දිගින් දිගටම කථා කරන බව. ඒ ගැන යමක් කියන්න ඕනෑකම තිබෙනවා. බලන්න, මා සතුව මේ තිබෙන්නේ 1994 ගුරු සේවා ව්‍යවස්ථාව. එහා පැත්තේ ඉන්න, මේ සභාව ඇතුළේ නිතර නිතර එකම බොරුව කියන හැමෝටම බලා ගන්න, අදින් පසුවවත් මේක ඉගෙන ගන්න මම 1994 ගුරු සේවා ව්‍යවස්ථාව ඇතුළත් ගැසට් පත්‍රය **සභාගත*** කරනවා.

මීට අදාළ 1994 ඔක්තෝබර් 31වැනි දා පළමුවැනි ගැසට් එකත්, 1995 අප්‍රේල් 03වැනි දා ගැසට් එකත් තිබෙනවා. 1995 අප්‍රේල් 03 දිනැති ගැසට් පත්‍රයේ ඉතාම පැහැදිලිව ගුරු සේවාව තුළ ඉහළට යන්න ඕනෑ කරන, උසස්වීම් ලබන්න ඕනෑ කරන ක්‍රියාදාමය, පටිපාටිය සඳහන් කරලා තිබෙනවා. එකක් තමයි, ගුරු සේවයේ 3-I ශ්‍රේණියේ ඉඳලා 2-II ශ්‍රේණියට යෑම. තරග විභාගයක ප්‍රතිඵල මත තමයි ඒක වෙන්නේ. ඊට පස්සේ 2-I

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ශ්‍රේණියේ ඉඳලා 1 ශ්‍රේණියට යන්නේ තරග විභාගයක ප්‍රතිඵල හා වෘත්තීය සමාලෝචනයක ප්‍රතිඵල මත. මේ ව්‍යවස්ථාවේ 8 වැනි කොටසේ මේ පිළිබඳව ඉතාම පැහැදිලිව සඳහන් වෙනවා. ඉතින්, ඔය එහා පැත්තේ ඉන්න වැටුප් විෂමතාව ගැන කියන අයට මේක අධ්‍යයනය කරන්න පුළුවන්කම, බලා ගන්න පුළුවන්කම තිබෙනවා.

දැන් මොකක්ද වුණේ? ඔය එහා පැත්තේ වාඩි වෙලා ඉන්න අය මතක තබා ගන්න, 1997 ඉඳලා 2024 දක්වා අවුරුදු 19ක් එක්කෝ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ -පොහොට්ටුවේ-, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඔයගොල්ලෝ තමයි රට කළේ කියන එක. අවුරුදු 7ක් රට කළේ යූඑන්පී එකේ, සජබයේ ඔයගොල්ලෝ. 2015 - 2019 කාලයේ රනිල්-මෛත්‍රී-සජිත්; ඔයගොල්ලන්ගේ හවුල් ආණ්ඩුව තිබුණේ. ඒ කවුරුවත් මේ ප්‍රශ්නය විසඳුවේ නැහැ. අවුරුදු 26ක් මේ ප්‍රශ්නය විසඳුවේ නැහැ. මතක තබා ගන්න. අවුරුදු 26ක් විසඳපු නැති ප්‍රශ්නයක් තමයි අපට පැවරිලා තිබෙන්නේ විසඳන්න. සහතික ලෙසම අපි මේ ප්‍රශ්නය විසඳනවා කියන සහතිකය අද මේ රටේ ගුරු විදුහල්පතිවරුන්ට ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Mahinda Jayasinghe, you have only two more minutes.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු සභාපතිතුමනි, මේ තරග විභාගයෙන් ඉහළට යන්න ඕනෑ කොහොමද? සියයට 75ක් තරග විභාගයෙන්, සියයට 25ක් කුසලතාව මත. එහෙම තමයි 1994 ගුරු සේවා ව්‍යවස්ථාවේ තිබුණේ. ඒක හරි පැහැදිලිව තිබෙනවා. ඒ නිසා ඒක කියවන්න.

ඊළඟට මා ළඟ තිබෙනවා, සුබෝධනී වාර්තාව. ඒක ගැනත් දැන් කියනවා නේ, ඔබතුමන්ලා. මම මේකත් **සභාගත*** කරනවා. කියවන්න වෙලාව නැහැ.

ගුරු සේවයේ ඉහළට යන්න සුදුසුකම් සම්පූර්ණ කර ගන්න ඕනෑ කොහොමද කියන එක මේකේත් සඳහන් වෙනවා. ඒකත් කියවන්න. *[බාධා කිරීමක්]* මට වෙලාව නැහැ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ area එකේ -

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි. පැහැදිලියි, ඒක.

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය විසඳීම සඳහා මේවා තමයි අපි අර ගෙන තිබෙන ක්‍රියාමාර්ග. ජූලි 8වැනි දා මගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තුවේ පත් කළා, අධ්‍යාපන සභාව පිහිටු වීම සඳහා වන අනුකමිටුව. මේ දවස්වල අපේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය ගොඩක් අය කියවනවා. බොහොම හොඳයි. අපි සතුටුයි. හැබැයි, හරියට කියවන්න. 16වැනි පිටුවේ හරියට පැහැදිලිව කොහොමද, වැටුප් විෂමතාව විසඳන්නේ කියලා අපි සඳහන් කරලා තිබෙනවා. ඒක කියවා ගන්න. ඒ අනුව අපි පත් කළා අධ්‍යාපන සභාව පිහිටු වීම සඳහා වන අනුකමිටුව. ඒ අනුකමිටුවට අමතරව අපේ අගමැතිතුමිය - අධ්‍යාපන ඇමතිතුමිය - අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්වත් කමිටුවක් පිහිටුවනු ලැබුවා, මහාචාර්ය ඕ.ජී. දයාරත්න මහත්මයාගේ ප්‍රධානත්වයෙන්. එතුමා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්යතුමා. ඒ කමිටුව මාස දෙකහමාරක වාගේ කාලයක් ඇතුළත අපට ඉතාම හොඳ වාර්තාවක් භාර දීලා තිබෙනවා. මොකක්ද මේ අධ්‍යාපන සභාව කියන්නේ? අපේ රටේ 1994 ඉඳලා 2024 දක්වා අවුරුදු 30ක් තිස්සේ එහා පැත්තේ ඉන්න විපක්ෂයේ මහත්වරුන්ට කරන්න අසමත් වෙච්ච වැඩේ මේකෙන් කෙරෙනවා. ගුරු සේවයේ ගුණාත්මකභාවය, වෘත්තිකභාවය ඉහළ නංවන්න ඕනෑ කරන පරිසරය නිර්මාණය කරන ඒ වැඩ පිළිවෙළ හදන එක තමයි, අධ්‍යාපන සභාවෙන් කරන්නේ.

ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, මට තව විනාඩි දෙකක වාගේ කාලයක් අරගෙන දෙන්න පුළුවන්ද?

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
හොඳයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මේක තමයි අධ්‍යාපන සභාව කියන්නේ. මේ අධ්‍යාපන සභාවේ ප්‍රධානම යෝජනාව තමයි, ගුරුවරයා - teacher - කියන එක වෙනුවට ලෝකයම පිළිගත්ත අධ්‍යාපනඥයෙක් කියලා, ගුරුවරයා අධ්‍යාපනඥයෙක් - educator කෙනෙකු - බවට පත් කරන එක. මේ අධ්‍යාපනඥයා කියන පුද්ගලයා විෂය ඉගැන්වීමට එහා ගිය සමාජ සංවර්ධන කාර්යභාරයක් ඉටු කරන කෙනෙක්, වෘත්තීය නාමකරණයේදී මේ අධ්‍යාපනඥයා කියන එක වැදගත් කියලා මේ කමිටුව මඟින් නිර්දේශ කරලා තිබෙනවා. ඒ වාගේම, මේ වෘත්තීය ප්‍රගතිය සඳහා සුදුසුකම, පුහුණුව, සේවා කාලය අනුව වෘත්තීය මට්ටම් කීපයක් යෝජනා කර තිබෙනවා. සහකාර අධ්‍යාපනඥයාගේ මට්ටමේ ඉඳලා ඉහළට යන වෘත්තීය මට්ටම් කීපයක් මේ සභාවෙන් යෝජනා කරලා තිබෙනවා.

ඊළඟට, මේ අධ්‍යාපන සභාව තුළ ගුරුවරුන්ගේ වෘත්තීයභාවය - professionalism, ප්‍රමිතිකරණය - standardization, තත්ත්ව ආරක්ෂණය - quality assurance - සහ ප්‍රතීතනය - accreditation - කියන කාරණා ඉතාම හොඳින් ආවරණය කරලා ඉතාම හොඳ වාර්තාවක් ලබා දී තිබෙනවා. දැන් ඒ අධ්‍යාපන සභාව හැදෙනවා. ඒ අධ්‍යාපන සභාව යටතේ හැදෙන තවත් ස්ථාවර කමිටු 4ක් ඔවුන් යෝජනා කරලා තිබෙනවා. වෘත්තීයභාවය - professionalism - සඳහා එක ස්ථාවර කමිටුවකුත්, ප්‍රමිතිකරණය - standardization - සඳහා තව ස්ථාවර කමිටුවකුත්, තත්ත්ව

---

** පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ආරක්ෂණය - quality assurance - සඳහා තව ස්ථාවර කමිටුවකුත්, ප්‍රතීතනය - accreditation - සඳහා තව ස්ථාවර කමිටුවකුත් යෝජනා කර තිබෙනවා. මේ අධ්‍යාපන සභාව ගැන කෙටියෙන් සඳහන් කළොත්, මේවා තමයි කියන්න පුළුවන්. ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න වෙලාව මදි.

ගුරුවරුන්ගේ වැටුප් විෂමතා ගැටලු විසඳීම ඇතුළු වෘත්තීය සංවර්ධනය සහ මිනුම් ලකුණු - benchmarks - මත වැටුප් ව්‍යුහය පදනම් කර ගැනීම වෙනුවෙන් තමයි මේ අධ්‍යාපන සභාව පිහිටුවන්නේ. පසුගිය ඔක්තෝබර් 10වැනි දා ඒක අප වෙත ලැබුණා. අපි ඒක අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දීලා තිබෙනවා. ඒක සිංහලට සහ දෙමළට පරිවර්තනය කරමින් තිබෙනවා. ඒ පරිවර්තන ලැබුණාට පස්සේ රටේ සියලු වෘත්තීය සමිතිවලට සහ අනෙකුත් stakeholdersලාට අපි ඒක ලබා දීලා ඔවුන්ගේ අදහස් සහ යෝජනාත් අරගෙන තවත් වර්ධනය කරන්න ඕනෑ. ඒක වර්ධනය කරගෙන, ලබන වසර තුළ මේ අධ්‍යාපන සභාව පිහිටුවීම සඳහා අපි අගමැතිතුමිය සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. එතැනින් එහාට අවශ්‍ය කැබිනට් තීරණ ගන්න, නීති කෙටුම්පත් සකස් කරන්න ඕනෑ කරන කටයුතු ටික කරමින් තිබෙනවා. අවුරුදු 27ක් විසඳපු නැති ප්‍රශ්නය වසරක් ඇතුළත විසඳීම සඳහා පළමු පියවර තබපු ආණ්ඩුව මේ ආණ්ඩුවයි කියන එක අපි මේ විපක්ෂයටත්, රටේ සියලුදෙනාටත් අවධාරණය කරන්න ඕනෑ.

අපට විසඳාගන්න තව ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Deputy Minister, you have exceeded your additional time.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ගරු සභාපතිතුමනි, මම තව එක විනාඩියයි ගන්නේ. ඊට පස්සේ අවසන් කරනවා.

අපේ රටේ ගුරු, විදුහල්පතිවරු ඉතාම පීඩාකාරී ලෙස මේ පාසල් තුළ සේවය කරමින් ඉන්නවා. අපි ඒ සියලු ප්‍රශ්න හඳුනා ගනිමින් තිබෙනවා. ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට තිබෙන අමතර කොළ පිරවීමේ ප්‍රශ්න ඇතුළු ඒ හැම ප්‍රශ්නයක් ගැනම අපට ඉතා හොඳ අදහසක් තිබෙනවා. ඔවුන්ට දුෂ්කර දීමනාව ලැබෙනවා. හැබැයි එය ලැබෙන්නේ දුර පදනම් කරගෙන නොවෙයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් හදන්න අපි අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. දුර පදනම් කරගෙනත් එම දුෂ්කර දීමනාව ලබා දෙන්න ඕනෑ.

මට තව කරුණු ගණනාවක් ඉදිරිපත් කරන්න තිබුණා වුණත්, කාල වේලාව ඉක්ම ගොස් තිබෙන නිසා මම කථාව අවසන් කරනවා. අපි මේ රටේ ගුරු, විදුහල්පතිවරු ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුදෙනාටම සහතිකයක් ලබා දෙනවා. පසුගිය සැප්තැම්බර් මාසයේ 21වැනි දාත්, නොවැම්බර් මාසයේ 14වැනි දාත් අපේ ආණ්ඩුව කෙරෙහි, අපි කෙරෙහි ඔබ තබපු විශ්වාසය අබමල් රේණුවකින්වත් බිඳ වට්ටන්නේ නැහැ. ඒ විශ්වාසය ඒ අයුරින්ම රකිමින් ඔබේ සියලු දේවල් දිනා දීම වෙනුවෙනුත්, ඒ අයිතිවාසිකම් රැක දීම වෙනුවෙනුත් කටයුතු කරනවා කියලා සහතික වෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have 15 minutes.

[பி.ப. 12.06]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு சில விடயங்களைச் சொல்ல விரும்பு கின்றேன்.

ගරු සභාපතිතුමනි, සමස්ත අධ්‍යාපනය ගැන කථා කරන්න ගොඩක් දෙනෙක් ඉන්නවා. නමුත් මලෙයහම් ජනතාව ගැන කථා කරන්න කිහිපදෙනායි ඉන්නේ. ඒකට අපි අටදෙනායි ඉන්නේ. ඒ අටදෙනා වෙනුවෙන් වචන කිහිපයක් කථා කරන්න මේ අවස්ථාව මම උපයෝගී කරගන්නවා. මම සිංහලෙනුයි, දෙමළෙනුයි කථා කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් තේරුම් ගන්න. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, ඔබතුමා මොකක්ද කිව්වේ? *[බාධා කිරීමක්]* ඒක හරි. නමුත් අපේ ප්‍රශ්න ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ කියලා තමයි මම මේ අවස්ථාව ඉල්ලා ගත්තේ. 1945දී සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මහතා මේ රටට නිදහස් අධ්‍යාපනය හඳුන්වලා දුන්නා. නමුත් වතුකරයේ ජනතාවට ඒක හම්බ වුණේ නැහැ. මොකද, ඒ දවස්වල සුද්දා තමයි මේ රට පාලනය කළේ. 1948දී මේ රටට නිදහස හම්බ වුණා. නිදහස හම්බ වුණාට පස්සේත් සුද්දා තමයි මේ වතු පාලනය කළේ. ඒක හින්දා වතුවල ළමයි පාසලට ගියේ නැහැ. සුද්දෝ ඒ ළමයින්ට පාසල් ඇති කරලා නැහැ. මොකද, ඒ ළමයි තේ දළු කඩනවා කියලා ඒගොල්ලෝ ඒවා block කරලා තිබුණේ. ඊට පස්සේ 1978දී තමයි education for plantation sector කියලා කොටසක් හඳුන්වලා දෙන්නේ. මම හිතන විධියට, ඒ දවස්වල හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමයි ඒක පටන් ගත්තේ. එතකොට, අර difference එක බලන්න. 1948 ඉඳලා අද වෙනකම් නිදහස් අධ්‍යාපනය තිබුණාට, වතුකරයේ ජනතාවට - මලෙයහම් ජනතාවට - 1978 ඉඳලා තමයි එය පටන් ගන්නේ. එතකොට difference එක තිබෙනවා, අවුරුදු 30ක්. ඒ අවුරුදු 30ක difference එක නිසා තමයි අපි අධ්‍යාපනයෙන් පහළට වැටී තිබෙන්නේ. ඒ කාරණය තමයි මට අධ්‍යාපන ඇමතිතුමිය වෙත යොමු කරන්න ඕනෑ. ඒ past එක අපට අල්ලන්න බැහැ. ඒ නිසා තමයි difference එක වැඩියෙන් තිබෙන්නේ. ඒ difference එක හදාගන්න අපි special attention දෙන්න ඕනෑ. ඒ special attention අනුව ඔබතුමන්ලා, ඔබතුමියලා වතුකරයට ගොඩනැඟිලි හදලා දෙන්න ඕනෑ; ඒ වාගේම ගුරුවරු පත් කරන්න ඕනෑ; science and mathematics teachersලා දෙන්න ඕනෑ. ඒකයි මම බලාපොරොත්තු වෙන්නේ. මම විස්තර කියන්නම්. දැනට ලංකාවේ ඉස්කෝල තිබෙනවා, 1,076,000ක්. ජාතික පාසල් 396ක් තිබෙනවා; provincial schools 9,700ක් තිබෙනවා. අපට තිබෙන්නේ, plantation schools. ඒවා 864ක් තිබෙනවා.

இந்த 864 பாடசாலைகளில் கிட்டத்தட்ட 100 பாடசாலை களில்தான் A/L இருக்கிறது. இந்த A/L உள்ள பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்கான நடவடிக்கைகளை எடுத்தால் மட்டுமே மலையகத்தில்

ஆசிரியர்களை உருவாக்க முடியும். ஆசிரியர் பற்றாக்குறை ஏற்பட்ட காரணத்தால்தான் கடந்த காலங்களில் பெருந்தோட்டப் பாடசாலைகளுக்கு teaching assistants எனப் பலர் நியமிக்கப்பட்டார்கள். ஒரு காலத்திலும் teaching assistants என எந்தவொரு சமூகத்துக்கும் வழங்கப் படவில்லை. Plantation schoolsக்கு மட்டும் teaching assistants வழங்கியமைக்குக் காரணம், அவர்களிடம் போதுமான கல்வித் தகைமைகள் இல்லை என்ற காரணத்தால்தான். இப்போது ஆட்சிக்கு வந்திருக்கின்ற அரசாங்கம் இந்த விஷயத்தைக் கவனத்திலெடுத்து, தொடர்ந்து உதவி ஆசிரியர்களை நியமிப்பதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

1970களில்தான் தோட்டப் பாடசாலைகளை அரசாங்கம் சுவீகரிக்கத் தொடங்கியது. 1977-1994 வரையான காலப்பகுதியில் தோட்டப் பாடசாலைகள் ஆரம்பிக்கப்பட்டன. அத்துடன், பெருந்தோட்டப் பாடசாலைகளை அரசாங்கம் பொறுப்பேற்றது. 1994-2020 வரையான காலப்பகுதியில் பெருந்தோட்டப் பாடசாலைக் கட்டமைப்பு அபிவிருத்தி செய்யப்பட்டதுடன், அமைச்சினூடாகப் பாடசாலைகளும் அபிவிருத்தி செய்யப்பட்டன. 1970ஆம் ஆண்டு முதன்முதலாக பெருந்தோட்டப் பாடசாலைகள் அரசாங்கத்தால் சுவீகரிக்கப் பட்டது. இதன்போது 14 பாடசாலைகள் சுவீகரிக்கப்பட்டன. 1977ஆம் ஆண்டு வரை 304 பாடசாலைகளும் 1978-1990 வரை 417 பாடசாலைகளுமென மொத்தம் 721 பாடசாலைகள் அரசாங்கத்தால் பொறுப்பேற்கப்பட்டது. எனினும், இவற்றுக்கு இலங்கை அரசாங்கத்தால் பெரியளவில் காசு கொடுக்கப் படவில்லை. அதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும்.

මේකට ලංකාවේ මුදල් ආයෝජනය කරලා නැහැ. මේකට මුදල් දුන්නේ Sweden Government එකෙන්. Sweden Government එකෙන් මිලියන 928ක් දීලා තිබෙනවා, මේක දියුණු කරන්න. උපකරණවලට මිලියන 100ක් දීලා තිබෙනවා. ඒ වාගේ තමයි GTZ එක, German Government එක දීලා තිබෙනවා, මිලියන 1,055ක්. ලංකාවේ නඩත්තු කිරීම් විතරයි කරලා තිබෙන්නේ. ඒ කාලයේ ඒ ගොඩනැඟිලි ඔක්කොම හැදුවේ ඒ කට්ටිය. මගේ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. එතුමාටත් මේ විස්තර ටික කියන්න මම මේ අවස්ථාව උපයෝගි කරගන්නවා. Sripada National College of Education එකත් හැදුවේ GTZ එක. ඒකෙන් තමයි ගුරුවරු බිහි වෙන්නේ. දැනට 100ක්, 150ක් විතර ඉන්නවා. අනෙක් ඔක්කොම teachersලා ගුරු සහායක, ඒ කියන්නේ teacher assistants විධියට තමයි එන්නේ. ගිය අවුරුද්දේත් අපි යෝජනා කර තිබුණා, ගුරු සහායකයින් 3,000ක් ගන්න කියලා. නමුත් අපේ මුස්ලිම් සහෝදරයෙක් නඩු දාපු නිසා ඒකත් නවත්වා තිබෙනවා. ඔබතුමිය දන්නවා ඇති, ගුරු සහායකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් නඩු දාපු නිසා දැන් ඒකත් නවත්වා තිබෙන බව. ඒ පිළිබඳවත් ඔබතුමියගේ අවධානය යොමු කරවනවා. ඔවුන් ගන්න ඕනෑ. එහෙම නැත්නම් අපට teachersලා නැහැ. 2015 - 2019 කාලයේදී අපි යෝජනා කළා, එක එක පළාතට අදාළ ඉස්කෝල 25ක් දියුණු කරන්න, science and maths teach කරන්න - ඒ දවස්වල අපි ඒ අවශ්‍ය උපකරණ - පුටු, මේස- දුන්නා; ඒවාට අදාළ උපකරණ ඔක්කොම දුන්නා. නමුත්, teachersලා දෙන්න බැරි වුණා. Teachersලා දෙන්න බැරි වුණා කියන්නේ, graduate teachersලා නැහැ. අපි උතුර, නැගෙනහිරත් try කළා. ඒත් නැහැ. ඉන්දියාවෙන් ගන්න ඕනෑය කියලා අපි කිව්වා කියලා පසුගිය දවස්වල පොඩි කවල් එකකුත් ගියා. මම එහෙම කිව්වේ නැහැ. නමුත්, කොහොම හරි ඒ teachersලා ගන්න ඕනෑ. එහෙම නැත්නම් teachersලා train කරන්න ඉන්දියාවට යවන්න ඕනෑ. මොනවා හරි පිළිවෙළක් කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඉදිරියේදී අපට තව ප්‍රශ්නයක් එනවා.

2015-2018 வரையான காலப் பகுதியில் பெருந்தோட்டக் கல்வி அபிவிருத்திக்கென 2,550 மில்லியன் ரூபாய் கொடுக்கப்பட்டது. உபகரணங்கள் மற்றும் தளபாட கொள்வனவுக்காக 162 மில்லியன் ரூபாயும் தொழில் நுட்பவியல் உபகரணங்களுக்காக 140 மில்லியன் ரூபாயும் கொடுக்கப்பட்டது. குறிப்பாக, பெருந்தோட்டப் பகுதியில் தேர்ந்தெடுக்கப்பட்ட 25 பாடசாலைகளைத் தரமுயர்த்த 250 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. රුපියල් මිලියන 250ක් දීලා තිබුණා. නමුත් teachersලා නැති නිසා ඒක block වෙලා තිබෙනවා. மேலும், "அருகிலுள்ள பாடசாலை சிறந்த

பாடசாலை" என்ற திட்டத்தின்கீழ் 580 பாடசாலைகள் தெரிவு செய்யப்பட்டன. அப்பாடசாலைகளில் பல வேலைகள் இப்போது முடிவடைந் துள்ளன. இன்னும் பல வேலைகள் செய்யப்படவேண்டி இருக்கின்றன. அவற்றையும் செய்வதற் கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

'மஹபொல' புலமைப் பரிசில் கொடுப்பனவு 2,500 ரூபாயால் அதிகரிக்கப்பட்டுள்ளது. அதற்காக அரசாங்கம் 2,750 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கின்றது. அதனை நாங்கள் பாராட்டுகின்றோம். கஷ்டப் பிரதேசங்களிலுள்ள பாடசாலைகளில் பணிபுரியும் அதிபர், ஆசிரியர்களுக்கான கொடுப்பனவை அதிகரிப்பதற்காக அரசாங்கம் 1,000 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது. அதனையும் நாங்கள் வரவேற்கின்றோம்.

கடந்த வரவு செலவுத்திட்டத்தில் பெருந்தோட்டப் பாடசாலைகளின் கட்டிடப் புனரமைப்புக்காக 105 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. அத்துடன், " அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்ற வேலைத்திட்டத்தின்கீழ், கைவிடப் பட்டிருந்த பாடசாலைகளும் புனரமைக்கப்பட்டன. அதற்கு என்னுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த முறை வரவு செலவுத்திட்டத்தில், ஆசிரியர் விடுதிகளைப் புனரமைப்பதற்கும் பாடசாலைக் கட்டிடங்களை நிர்மாணிப் பதற்குமென தோட்டப்புறப் பாடசாலைகளுக்கு ஒதுக்கப்பட்ட நிதி கிட்டத்தட்ட 1,065 மில்லியன் ரூபாயாகும். அடுத்த வருடம் இவ்வேலைகள் பூரணப்படுத்தப்படுமாக இருந்தால் வரவேற்கத் தக்கது.

எமது நாட்டிலுள்ள பெருந்தோட்டப் பாடசாலைகளின் எண்ணிக்கை 864. அவற்றில் சில பாடசாலைகளை மூடுவதற் கான திட்டம் இருப்பதாகச் சொல்கிறார்கள்.

සමහර පාසල් වහනවා කියලා අපට දැනටම කියලා තිබෙනවා. ගරු ඇමතිතුමියනි, studentsලා 100ක් ඉන්න පාසල්ද, studentsලා 50ක් ඉන්න පාසල්ද වහන්නේ?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු මන්ත්‍රීතුමනි, මේ මේ පාසල් වහනවා කියලා අපි පාසල් තෝරලා නැහැ. දරුවන් 50ට අඩු පාසල් ගැන අධ්‍යයනයක් කරලා merge කරන්න පාසල් කිහිපයක් අපි හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව දියුණු කළ යුතු පාසල් ගණනාවක් අපි නම් කරලා තිබෙනවා. ඒ නියමු ව්‍යාපෘතිය මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒකෙන් ලැබෙන ප්‍රතිඵල අනුව අපි ලබන අවුරුද්දේ merge කරන පාසල් ගණන වැඩි කරනවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

මගේ අදහස නම් පාසල් වහන්න එපා කියන එකයි. මොකද, වතුවල කිලෝමීටර 7කට, 8කට, 10කට එක පාසලයි තිබෙන්නේ.

[ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

වතුවල සිටින ඒ ළමයි ඒ පාසලට ගියේ නැත්නම් ඒගොල්ලන්ට ආයෙත් පාසල් යන්න විධියක් නැහැ. ආයෙත් වතුවලට ගිහින් දලු කඩන්න තමයි තිබෙන්නේ. ඒ නිසා පාසල් වහනවාට මම කොහොමත් කැමැති වෙන්නේ නැහැ, අනුමත කරන්නේත් නැහැ. දැනට මා සතුව plantation schoolsවල dropouts පිළිබඳ විස්තර තිබෙනවා. මම මේ කාරණා දෙමළ භාෂාවෙන් කියන්නම්, ඔබතුමියට.

மாணவர் இடைவிலகலானது, தேசிய ரீதியில் - nationally - 25,823. மத்திய மாகாணத்தில் - Central Provinceஇல் - 3,223; நுவரெலியா மாவட்டத்தில் 1,395; மாத்தளை மாவட்டத்தில் 1,108; ஊவா மாகாணத்தில் 2,472; பதுளை மாவட்டத்தில் 1,647; மொனராகலை மாவட்டத்தில் 927; சப்ரகமுவ மாகாணத்தில் 3,160; இரத்தினபுரி மாவட்டத்தில் 1,820; கேகாலை மாவட்டத்தில் 1,604. මේ විස්තර ටික බලන්න. විශේෂයෙන්ම plantation schools තිබෙන පළාත්වල තමයි වැඩිම dropouts වෙලා තිබෙන්නේ. ඒකට හේතුව, parentsලාට සල්ලි දෙන්න විධියක් නැහැ, ඉගෙන ගන්න. නමුත් අපි කියනවා, නිදහස් අධ්‍යාපනය කියලා. විදුහල්පතිවරුන් මොනවාද කියන්නේ? ළමයි තුන්දෙනෙක් ඉස්කෝලේ යනවා නම්, ඒ තුන් දෙනාගෙන්ම සල්ලි ගන්න බලනවා. අරකට ගේන්න, මේකට ගේන්න කියලා ඔවුන් කියනවා. පාසල්වලට සල්ලි ඕනෑ ඇති. නමුත්, රුපියල් 1,500ක් පඩි ගන්න කෙනෙකුට ළමයි තුන්දෙනෙකුගේ අධ්‍යාපන කටයුතු කරන්න හරි අමාරුයි; ඒගොල්ලන්ට වියදම් කරන්න අමාරුයි. ඒක නිසා drop out වෙනවා. එක්කෙනෙක් ඉස්කෝලේ යන්න එපා, වැඩ කරන්න කියලා යවනවා. එතකොට dropouts වැඩි වෙනවා. ලංකාවේ literacy rate එක සියයට 91.84ක් වෙනවා. මෙහෙම ගියොත් ඒක අඩු වෙනවා. ඒ නිසා මම මේ විස්තර ටික ඔබතුමියට කියන්නම්. මට අවස්ථාවක් දුන්නොත්, අධ්‍යාපන අමාත්‍යාංශයට ඇවිත් තව විස්තර කියන්න පුළුවන්.

'சீடா' செயற்றிட்டம் அறிமுகப்படுத்தப்பட்ட காலத்தி லிருந்து எங்களுடைய மலையகக் கல்வி வளர்ச்சிக்காகப் பாடுபட்ட சிலரை நான் இந்த நேரத்தில் ஞாபகப்படுத்த வேண்டும். அதற்காக நான் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்திக் கொள்கின்றேன். குறிப்பாக, திரு. சிவசிதம்பரம், திரு. நவரட்ணம், திரு. மெய்யநாதன், திரு. ராஜகோபால், திரு. முருகேஸ், திரு. மாரிமுத்து, திரு. எல். ஜோசப், திரு. எஸ். ஜோசப், திரு. தர்மலிங்கம், திரு. பாண்டுரங்கன், திரு. தனராஜ், திரு. சபாரஞ்சன், திரு. ஞானப்பிரகாசம், திரு. சத்யேந்திரா, திரு. விஜயாநந்தன், திரு. முரளி, திரு. விஸ்வநாதன் ஆகியோர் மலையகக் கல்வி வளர்ச்சிக்காகப் பாடுபட்டு இருக்கிறார்கள். எமது சமூகத்துக்குச் செய்த சேவைக்காக இவர்களுக்கு நன்றி தெரிவிப்பதுடன், ஹன்சாட்டில் பதிவுசெய்ய வேண்டும் என்பதற்காகவே இவர்களுடைய பெயர்களை இங்கு குறிப்பிட்டேன். இப்போதுள்ள சமுதாயத்தினர் என்னிடம் கேட்கின்றார்கள், "நீங்கள் கல்வி இராஜாங்க அமைச்சராக இருந்தபோது என்னென்ன விடயங்களைச் செய்தீர்கள்?" என்று. அப்போது நான் செய்த விடயங்களை முழுமையாக இந்த நேரத்தில் சொல்ல முடியாது விட்டாலும், சிலவற்றைச் சொல்கின்றேன்.

මම හිතන විධියට කොළඹ, බම්බලපිටිය Hindu College එක හදලා ඉවරයි. ඒකට මුල්ගල තිබ්බේ අපි. ඔබතුමිය දැන් ඒ කටයුතු අවසන් කරගෙන යනවා. ඒකට ගොඩක් ස්තුතියි. අනෙක් කාරණය මේකයි. ඔබතුමිය දැන් Rs. 1.5 million loan scheme එකක් introduce කරලා තිබෙනවා. මම ඒක අගය කරනවා. ඒක හොඳයි.

மலையகத்தில் பிறந்த பல இளைஞர்கள் இன்று பல்வேறு துறைகளில் சாதித்து வருகின்றார்கள். தற்போதுகூட, ஊடகவியலாளர் கலாவர்ஷ்னி கனகரட்ணம் அவர்கள், Earth Journalism Networkஇன் "Earth Shorts" நிகழ்ச்சித்திட்டத்துக்கு ஊடக வழிகாட்டுநராக நோர்வேயில் தெரிவு செய்யப் பட்டுள்ளார். தெற்கு மற்றும் தெற்காசிய நாடுகளைச் சேர்ந்த ஊடகவியலாளர்களுக்குச் சுற்றுச்சூழல் தொடர்பான கதைகளைத் தயாரிப்பதற்கு இவர் ஊடக வழிகாட்டுநராகச் செயற்படுகின்றார். இவ்வாறான ஒரு செயற்றிட்டத்துக்கு மலையகப் பின்னணியைச் சேர்ந்த ஒருவர் தெரிவு செய்யப் பட்டு இருப்பது இதுவே முதற்தடவை ஆகும். அவருக்கு எனது வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். மலையகத் தைக் கல்வியால் கட்டியெழுப்ப முடியும் என்பதற்கு இது சிறந்ததோர் உதாரணமாக இருக்கின்றது. இந்தப் புதிய அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒரு வருடமே கடந்திருக்கிறது. ஆகையால், அரசாங்கத்தை முற்று முழுதாகக் குறைசொல்ல முடியாது. அப்படிக் குறைசொன்னால், ඇඟිලි හතරක් අපේ පැත්තටත් දික් වෙනවා, "ඔයගොල්ලොත් හිටියා නේ, මොනවාද කළේ?" කියලා. ඒක නිසා මම දොස් කියන්න යන්නේ නැහැ. ඉදිරියට වැඩ කරන්න අවස්ථාව දෙන්න, අපි එකතු වෙලා වැඩ කරමු. මට කියන්න ඕනෑ එච්චරයි. මගේ හිතවත් Minister කෙනෙකුත් මෙතැන ඉන්නවා, එතුමාටත් මම ඒක තමයි යෝජනා කරන්නේ. අපි වැඩ කරමු, එකතු වෙලා වැඩ කරමු, දොස් කිය කියා ඉඳලා වැඩක් නැහැ.

நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 11 minutes.

[අ.භා. 12.23]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡාවට බඳුන් කරන මේ මොහොතේ වචන කිහිපයක් කථා කරන්නට ලැබීම භාග්‍යයක්. අද උදෑසන සිටම බොහෝ අදහස් යොමු වුණා, අධ්‍යාපනය සම්බන්ධයෙන්. මෙවර අපේ පූරවැසි අය වැයේ -ජාතික අය වැයේ - අධ්‍යාපනයේ තේමාව ලෙස සඳහන් වන්නේ, "අධ්‍යාපනයේ ගුණාත්මක බව සමානාත්මතාව සහ විශිෂ්ටත්වය" යන්නයි. අපේ අධ්‍යාපනය අපි කුලුනු පහක් ඔස්සේ ක්‍රියාත්මක කරනවා, විෂයමාලා සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ, තක්සේරුව සහ ඇගැයීම, මහජන දැනුවත්භාවය සහ ප්‍රවර්ධනය වශයෙන්. අද උදෑසන කිව්වා වාගේම, අපි මෙවර අය වැයෙන් වෙනදාට වැඩිය, ඉතිහාසයේ කවදාවත් තිබුණාට වඩා, අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. මුළු වෙන් කිරීම රුපියල් බිලියන 704ක්. එය රජයේ ප්‍රාථමික වියදම්වලින් සියයට 15.71ක්, රජයේ මුළු වියදමෙන් සියයට 7.84ක් සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.04ක් ලෙස කියන්න පුළුවන්. අද උදෑසන අපේ අග්‍රාමාත්‍යතුමියත් ප්‍රකාශ කළ විධියට, මෙය ක්‍රමයෙන් වැඩි වන වෙන් කිරීමක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඉදිරි අය වැයවලදී මේ මුදල අනිවාර්යයෙන් වැඩි වන බවට අප රජයක් ලෙස සහතික ලෙස පොරොන්දු වී තිබෙනවා.

අද අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් ගොඩක් කාරණා කියැවුණා. නමුත්, මට ලැබී තිබෙන කෙටි කාලය ඇතුළත අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් විශේෂ, වැදගත් අංශයක් වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගැන කථා කරන්න මම බලාපොරොත්තු වනවා. මොකද, මට කලින් කථා කරපු මන්ත්‍රීවරයෙකුත් කිව්වා, 'ගුරුවරයා' කියන තැනෙන් එහාට ගිහිල්ලා 'අධ්‍යාපනඥයා' කියන තැනට මේ සේවය දියුණු කරන්න ඕනෑ කියලා. අපි දන්නවා, ගියවර අය වැයෙනුත්, මෙවර අය වැයෙනුත් ගුරුවරුන්ගේ පඩි වැඩි කිරීමක් සිද්ධ වුණු බව. නමුත්, ඒකට එහා ගිහිල්ලා අපි ගුරුවරයෙකු පුහුණු කරන්නේ කොහොමද, ගුරුවරයෙකු නිර්මාණය කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඉතා ලොකු වගකීමක් සහ බරක් තිබෙනවා.

අපි 2026 අය වැයෙන් දිවයින පුරා තිබෙන පාසල් 10,191ක් හරහා සිසුන් මිලියන 4.1ක් වෙනුවෙන් ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දෙන්න ගුරුවරුන් 236,129ක් සේවයේ යොදවන්න බලාපොරොත්තු වනවා. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගත්තොත්, ලංකාවේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 19ක් තිබෙනවා. ඒකට තව එකක් එකතු වුණා, 2025 අවුරුද්දේදී. ඒ තමයි, කුලියාපිටිය ප්‍රදේශයේ කොරියානු රජයේ ආධාරය මත විශාල පහසුකම් සහිතව හදපු ගොඩනැඟිල්ල. එම ස්ථානයේ ගොඩනැඟිල්ලක් විතරක් හදලා ඒක කැලෑවට යමින් තිබුණා. ඒ බව ඔබ හැමෝම දන්නවා. 2025 අය වැය විවාදයේදීත් මම මේ ගැන සඳහන් කළා. මට කියන්න සතුටුයි, 2026 අය වැය විවාදයේ කථා කරද්දි අපි ඒක විවෘත කරලා ක්‍රියාත්මක කරන තැනට ගෙනැල්ලා තිබෙනවා. ඒකට කොරියානු රජයෙන් ඩොලර් මිලියන 15ක විදේශ ආධාර ලැබුණා. ඒ වාගේම දේශීයව අපේ රජයෙනුත් -අධ්‍යාපන අමාත්‍යාංශයෙනුත්- මුදල් යොදවා, දැනට එහි ගුරු ශිෂ්‍යයින් - අපි ඔවුන්ට කියනවා, ශික්ෂණවේදීන් කියලා - 210දෙනෙක් අධ්‍යාපනයට බඳවා ගෙන තිබෙනවා. තවත් 210ක් 2026 අවුරුද්දේ මාර්තු මාසයේදී බඳවා ගන්න බලාපොරොත්තු වනවා. එහි සිසුන් 650කට නැවතීමේ පහසුකම් පවා තිබෙනවා. විශේෂයෙන් අද ලෝකයේ දියුණුවත් එක්ක අපේ ඩිජිටල් අධ්‍යාපනය වැඩිදියුණු වනකොට smart lab, e-Library, multipurpose building වාගේ නවීන තාක්ෂණය සමඟ තමයි, මේ තාක්ෂණික ගුරු විද්‍යාලය ක්‍රියාත්මක වන්නේ.

සමස්තයක් ලෙස ගත්තාම ලංකාවේ ගුරු ශික්ෂණලාභීන් 6,400ක් පමණ දැනට අධ්‍යාපනය ලබමින් ඉන්නවා. 2023-2024 වර්ෂවල උසස් පෙළ හදාරපු සිසුන් ඒ සඳහා බඳවා ගැනීමේ ගැසට් පත්‍රය දැන් නිකුත් කරලා තිබෙනවා. 2026 පෙබරවාරි මාසයේදී තවත් ගුරු ශික්ෂණලාභීන් 5,317ක් බඳවා ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් ගුරු හිඟය ගැන අද උදේ ඉඳලාම කථා කළා. ගුරු හිඟයට විසඳුමක් ලෙස නිසි ලෙස පුහුණු කර ගුරුවරුන් බඳවා ගැනීමත්, ඔවුන් නිසි ලෙස ස්ථානගත කිරීමත් අපි විශාල වගකීමක් ලෙස භාර ගන්නවා. මම සභාපතිත්වය දරන, පාසල්වල පවතින මානව සම්පත් ඌනතාව පිළිබඳ අනුකමිටුවේදීත් අපි මේ ගැන සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබෙනවා.

මට කලින් කථා කළ මන්ත්‍රීවරයෙකුත් මේ කාරණය ගැන කිව්වා. ගුරු ශික්ෂණලාභීන්ට ලබා දුන් රුපියල් 8,000 දීමනාව අපි රුපියල් 10,500 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම අවුරුදු ගණනාවකින් මෙහි විෂය මාලා සංශෝධනය කරලා නැහැ. අන්තිමට 2010දී තමයි මෙහි විෂය මාලා යාවත්කාලීන කිරීම සිදු වුණේ, ගරු සභාපතිතුමනි. දැන් එහි නව විෂය මාලා සංශෝධනයක් කරමින්, එය යාවත්කාලීන කිරීම කරගෙන යනවා. 2026දී අපි බලාපොරොත්තු වෙනවා, නව විෂය මාලාව හඳුන්වා දෙන්න. ඒ වාගේම ඒ ගුරු ශික්ෂණලාභීන්ට පුහුණුව ලබා දෙන අධ්‍යාපනඥයින් 580ක් අපි මේ අවුරුද්දේ බඳවා ගෙන තිබෙනවා. අපි දන්නවා, තවත් පුරප්පාඩු තිබෙන බව. ඉදිරියේදී ඒ පුරප්පාඩුවලට අවශ්‍ය අය බඳවා ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම තවත් වැදගත් කාරණයක් කියන්න ඕනෑ. විද්‍යාපීඨවල සනීපාරක්ෂක කටයුතු, නේවාසිකාගාර වැනි පහසුකම් නංවන්න සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය නංවන්න 2025දී අපට ඇත්තටම වෙන් කරන්න පුළුවන් වුණේ රුපියල් මිලියන 389යි. මේ අවුරුද්දේ අපි ඒ සඳහා රුපියල් මිලියන 521ක් වෙන් කරලා තිබෙනවා. ගුණාත්මකභාවයෙන් යුතු ගොඩනැඟිලි හදන්නත්, භාගයට හදපු ගොඩනැඟිලි ටික ඉවර කරලා අලුත් ගොඩනැඟිලි හදන්නත් අපි මේ වතාවේ රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා. පසුගිය අවුරුද්දේ වෙන් කළ මුදලට වඩා විශාල මුදලක් අපි මේ අවුරුද්දේ ඒ සඳහා වෙන් කර තිබෙනවා. ඒ අනුව, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 8,604ක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන ගැනත් මම කියන්න ඕනෑ. සේවාස්ථ පුහුණුව කියන එක ගත්තොත්, සේවයේ යෙදී සිටින ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු සඳහා ඔවුන් පුහුණුවීම් කරන්නේ ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන මඟිනුයි. ඒවායේ ගුණාත්මකභාවය ඇති කිරීම සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 981ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 402ක් වෙන් කරලා තිබෙනවා. ඒ, ගොඩනැඟිලි පහසුකම් වැඩිදියුණු කිරීම, උපකරණ මිලදී ගැනීම වාගේ දේවලට.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් ඩිජිටල් යටිතල පහසුකම්වලට - digital infrastructureවලට - අපි වැඩි අවධානයක් යොමු කරලා තිබෙනවාය කියන එක මම කියන්න ඕනෑ. මොකද, අපේ රජයේ ඩිජිටල්කරණ ව්‍යාපෘතියත් එක්ක අපි විශ්වාස කරනවා, අධ්‍යාපනයත් ඩිජිටල්කරණයත් එක්ක ඉස්සරහට යන්න ඕනෑ, දියුණු වෙන්න ඕනෑ කියලා. අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ පත් කරන ලද ඩිජිටල් කාර්ය සාධක බලකායේ - Digital Task Force එකේ - සහයෝගය මේ වෙනුවෙන් ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම විභාග දෙපාර්තමේන්තුව ගැනත් මට නොකියාම බැහැ. විභාග දෙපාර්තමේන්තුව ඉතා සීමිත කාර්ය මණ්ඩලයක් සහ සීමිත පහසුකම් යටතේ අතිදක්ෂ ලෙස විභාග කටයුතු මෙහෙයවමින් ප්‍රතිඵල වඩාත් ඉක්මනින් නිකුත් කරන්න වැඩ කරගෙන යනවා. අපි මේ වෙනකොට ඒ වෙනුවෙන් සැලසුමක් හදලා තිබෙනවා. විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන ශාඛාව, ඇගැයීම් ශාඛාව, රහස්‍ය ශාඛාව සහ පරිගණක ශාඛාව එකතු වෙලා සැලසුම හදනවා, විභාගය පටන් ගන්න දිනයේ සිට විභාග ප්‍රතිඵල නිකුත් කරන දිනය දක්වාම. මේ වසරේ ප්‍රතිඵල නිකුත් කරන්න නියමිතව තිබුණු දිනයට කලින් එය නිකුත් කරන්න හැකි වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඇත්තටම විභාග දෙපාර්තමේන්තුව ඉතා හොඳ ප්‍රගතියක් පෙන්වනවා.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, සාමාන්‍යයෙන් 2016 ඉඳන් 2024 දක්වාම ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල නිකුත් කරන්න මාසයක්, දෙකක් ගත වුණා. ඒ වාගේම නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට තව මාස තුනක්, හතරක් සහ පහක් වාගේ කාලයක් ගත වුණා. නමුත් 2025දී අපි සමත් වෙලා තිබෙනවා, විභාගය පවත්වා දින 24ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කරන්නත්, නැවත සමීක්ෂණ ප්‍රතිඵල මාස 2ක් වාගේ කාලයක් ඇතුළත නිකුත්

[ගරු කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

කරන්නත්. ඒ වාගේම අපි මේ අවුරුද්දේ බලාපොරොත්තු වෙනවා, විභාග දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ වාහන පහසුකම් ලබා දෙන්න.

මේ වෙනකොටත් අපි නිකුත් කරලා තිබෙනවා, ලබන අවුරුද්දේ විභාග timetable එක. සියලු පාසල්, සියලු ආයතන එකවර වාර විභාගයේ සිට සාමාන්‍ය පෙළ, උසස් පෙළ දක්වාම විභාග පවත්වන විධියට එය සකස් කර තිබෙනවා. ඒ වාගේම ප්‍රායෝගික පරීක්ෂණ විභාග ඉවර වෙන්න කලින් පටන් ගන්නත්, ඇගැයීම් කාර්යය විභාග ඉවර වෙන්න කලින්ම පටන් ගන්නත් අවශ්‍ය කටයුතු අපි සකස් කර තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද අවසාන වනකොට ඉතා හොඳින් සංවිධානාත්මක ආකාරයට විභාග ප්‍රතිඵල ලබා දීමේ ප්‍රගතිය අපට දැක ගන්න පුළුවන් වෙයි කියලා. ඇත්තටම අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, විභාග දෙපාර්තමේන්තුවේ වැඩ කරන කාර්ය මණ්ඩලයට. මොකද, ඔවුන් වැඩ කරන්නේ ඉතා සීමිත සම්පත් ප්‍රමාණයක් යටතේ. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී ඒ තිබෙන අඩුපාඩුකම් මඟ හරවලා, අපේ රට තුළ හොඳ විභාග පද්ධතියක් ඇති කරන්නට.

ඒ වාගේම මේ දවස්වල බොහෝ දෙනෙකු කථා කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැනත් මට වචනයක් නොකියාම බැහැ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනකොට, අපි බොහෝ විට අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මේක අඩුයි, අරක නැහැ, මේක නැහැ කියලා එක තැනකින් අල්ලා ගන්නවා. නමුත්, අපි පැහැදිලිව කියා තිබෙනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්නේ සාමූහික ක්‍රියාවලියක් තුළයි කියන එක. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපි එක කාමරයක ඉඳගෙන හදන දෙයක් නොවෙයි. එම නිසා ඒ වැඩ කරන, ඒ ගැන උනන්දුවක් දක්වන සියලු දෙනාගෙන් මම මේ වෙලාවේදී ඉල්ලීමක් කරනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරගෙන යන්න අපට සහයෝගය ලබා දෙන්න කියලා. මොකද, අපේ අධ්‍යාපනයේ අසමානතාව ගැන කථා කළොත්, අධ්‍යාපනයේ ප්‍රතිඵල ඇත්තටම ශිෂ්‍යයින්ට ලැබෙනවාද, අධ්‍යාපනය විසින් හොඳ දරුවන්, හොඳ ශ්‍රම බලකායක් - workforce එකක් - බිහි කරනවාද, තරුණ ජීවිත අධ්‍යාපනය විසින් ප්‍රමාද කරනවාද කියන තර්ක සහ අදහස් ගොඩක් මේ සමාජයේ තිබෙනවා. ඒ නිසා මේ හැම දෙයටම උත්තර හොයන්න තමයි අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, your time is up.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
I will wind up, Sir.

ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ මොහොතේදී අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ප්‍රමුඛතාව ලබා දීලා කටයුතු කරයි කියලා. අපට පසුගිය කාලයේ හමු වුණා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව පුහුණුව ලැබූ ගුරුවරුන්. ඔවුන් ඉතාම සතුටින් කථා කළා, ඔවුන්ට තිබෙන පීඩනය සහ බර අඩු කිරීමට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් ලබා දෙන සහයෝගය ගැන. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියටත් සංවාද, විවාද, මතවාද කියන මේ හැම දෙයක්ම මධ්‍යයේ මේ කාර්යය සාර්ථක කරගෙන, දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීලා, රටේ සංවර්ධනයට, ඉදිරි ගමනට මේ අධ්‍යාපනයේ දායකත්වය ලබා ගන්න පුළුවන් වෙයි කියලා. මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! The ongoing Proceedings of the Committee of the whole Parliament shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය]සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද ඉතාම වැදගත් වැය ශීර්ෂයක් ගැනයි අප සාකච්ඡා කරන්නේ. අපි දන්නවා, අධ්‍යාපනය කියන්නේ මනුෂ්‍ය ජීවිතයේ සදාකාලික සංකල්පයක් බව. ඒ නිසා තමයි අධ්‍යාපනය අද ගංගාවක් වාගේ ඉදිරියට ගලන්නේ. සෑම විටම අලුත් වන විශ්වයේ අලුත් ඉසව් හරහා යන ක්‍රියාවලියක් විධියට තමයි අපට අධ්‍යාපනය හඳුන්වන්න පුළුවන් වන්නේ.

ඉතිහාසයේ මේ රටේ පැවැති ආණ්ඩු, මේ රටේ සිටි නායකයන් අධ්‍යාපනය වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයන් රැසක් කර තිබෙනවා. අපිට ඒවා අමතක කරමින් මේ කථාව ඉදිරියට ගෙනියන්න බැහැ. අපි ඒවා පිළිබඳවත් යම් සිහිපත් කිරීමක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි දන්නවා, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු අධ්‍යාපනයට තබපු ඒ බර, ඒ දායකත්වය තුළින් තමයි මේ අධ්‍යාපන ක්‍රමය හරහා අපට අද සාක්ෂරතාව සියයට 98ක් වැනි ඉහළ අගයකින් පවත්වා ගන්න පුළුවන් වී තිබෙන්නේ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එදා තිබුණු පාසල් අද වනවිට ඉතාම ශක්තිමත් පාසල් බවට පරිවර්තනය කරලා ඉතාම හොඳ පාසල් ව්‍යුහයක් මේ රට තුළ නිර්මාණය කරන්න හැකියාව ලැබුණේත් ඒ පසුබිම තුළයි කියන කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. ඒ පාසල් පද්ධති තුළට විද්‍යාගාර, පුස්තකාල, පරිගණක විද්‍යාගාර, සුහුරු පන්ති කාමර වාගේ විශේෂයෙන්ම අධ්‍යාපනය වෙනුවෙන් ලබා දිය හැකි භෞතික සම්පත් පැවැති සෑම රජයක් විසින්ම ඉතාම හොඳින් ලබා දුන්නාය කියන කාරණයත් මම සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ විය හැකි ශිෂ්‍ය සංඛ්‍යාවත් ඒ පාලන කාලවලදී වැඩි කළා. විශේෂයෙන්ම අපිට මතකයි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන කාලය තුළ උසස් පෙළ සමතුන්ගෙන් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ප්‍රමාණය වැඩි කළ බව. එවැනි කාර්යභාරයන් රැසක් ඒ ආණ්ඩු තුළින් සිදු වුණා.

ඒ වාගේම සුබසාධන කටයුතු විධියට විශේෂයෙන්ම දරුවන්ට අවශ්‍ය පෙළපොත්, නිල ඇඳුම්, දිවා ආහාරය, ශිෂ්‍යත්ව, ගමන් ප්‍රවේශ පත්‍ර, ඒ වාගේම මහපොළ ශිෂ්‍යාධාර, නේවාසික පහසුකම් ආදී පහසුකම් රාශියක් ලබා දුන්නා. ඔබේ ආණ්ඩුවෙනුත් අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන් වෙනුවෙන් රුපියල් 6,000ක දීමනාවක් මේ වසරේදී ලබා දුන්නා. එම දීමනාව ලබන වසරටත් වෙන්කර තිබෙනවා. ඒක ඉතාම හොඳ, වැදගත් කාරණයක් බව සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධ්‍යාපනය ගැන කථා කරනකොට, අධ්‍යාපනය අද පවතින තැන පිළිබඳවත් කථා කළ යුතු වෙනවා. කුසලතාවෙන් සපිරි මිනිසුන් ලෝකයට අවශ්‍යයි. හැබැයි, මෙවර අය වැය ලේඛනය තුළින් එවැනි කුසලතා සහිත පිරිසක් නිර්මාණය කිරීම සඳහා කිසිදු ආයෝජනයක් අමාත්‍යාංශ මට්ටමින් සිදු කර නැහැ කියන කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අධ්‍යාපනයට වෙන් කරන මුදල ආයෝජනයක්. එය ඵලදායී ආයෝජනයක්. නමුත් මෙවර අය වැය ලේඛනය තුළින් ඒ පිළිබඳව අවධානයක් යොමු කර නැහැ කියන කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. හෙට වැඩ ලෝකයට අවශ්‍ය ප්‍රායෝගික මිනිසා හදන්නට මේ අය වැය ලේඛනය තුළ ඔබ අවධානය යොමු කර නැහැ. විශේෂයෙන් පසුගිය වසරේ අය වැය තුළ අධ්‍යාපනය පැත්තෙන් ලබා තිබෙන ප්‍රගතිය අනුව තමයි අපට මෙවර ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය පිළිබඳව කථා කරන්න පුළුවන් වන්නේ. නමුත් පසුගිය අය වැය ලේඛනය තුළ එවැනි ප්‍රගතියක් අපට දකින්න ලැබෙන්නේ නැහැ කියන කාරණයත් සිහිපත් කරන්න ඕනෑ.

ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 13වැනි පිටුවේ සඳහන් වෙනවා, සෑම දරුවෙකුටම සිය නිවසේ සිට හෝ දෙමව්පියන්ගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර 2ක් ඇතුළත මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථානයක් ඉදිකරනවා කියන කාරණය. නමුත් අද ඒ කාරණය පිළිබඳව කථා බහ කරන බවක් අපට දකින්න නැහැ. ඔබගේ 2025 අය වැය ලේඛනය තුළවත්, 2026 අය වැය ලේඛනය තුළවත් ඒ පිළිබඳව කථා කර නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපි දන්නවා, මුල් ළමාවිය සංවර්ධනය කියන්නේ මේ රටේ වැඩියෙන්ම අවධානය යොමු කළ යුතු කරුණක් බව. මෙවර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළවත් මුල් ළමාවිය සංවර්ධනය වෙනුවෙන් වැඩි බරක්, වැඩි අගයක් තබා නැහැ කියන කාරණය තමයි අපිට පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා මුල් ළමාවිය වෙනුවෙන් විශාල බරක්, වැයක් රජයක් විධියට දරන්න ඕනෑය කියන කාරණය මා සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම පෙර පාසල් ක්ෂේත්‍රය තුළ අද්විතීය කාර්යභාරයක් කරන පෙර පාසල් ගුරුවරියන් දැනුමෙන්, කුසලතාවෙන් පෝෂණය කර ඔවුන් නවීන ලෝකයට ගැළපෙන ගුරුවරියන් බවට පත් කිරීම වාගේම ඔවුන්ට ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කළ හැකි ආකාරයට සරිලන වැටුපක් ලබා දීමත් ඉතාම වැදගත් කියන එකත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම මම මේ කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඔබතුමන්ලා සඳහන් කරලා තිබුණා, ප්‍රාථමික අධ්‍යාපනය හදාරන දරුවන් සඳහා සිය නිවසේ සිට හෝ දෙමව්පියන්ගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර තුනක් ඇතුළත ඉතාම හොඳ ප්‍රාථමික පාසල් පද්ධතියක් නිර්මාණය කරනවාය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ පිළිබඳව අපට තවම වැඩ පිළිවෙළක් දකින්න නැහැ. හැබැයි, පසුගිය ආණ්ඩු කාලය තුළ ඉතාම හොඳ සංකල්පයක් තිබුණා. ඒ තමයි පෝෂිත පාසල් සංකල්පය. ඒ පෝෂිත පාසල් සංකල්පය තුළ රට තුළ ඉතාම හොඳ ප්‍රාථමික පාසල්, දියුණු ප්‍රාථමික පාසල් ගොඩනැඟුණා. එක් ද්විතීයික පාසලක් වටා පෝෂිත පාසල් හතරක් පහක් ගොඩනැඟුණා. ඒ තුළ ඉතාම ශක්තිමත් ප්‍රාථමික පාසල් ජාලයක් ගොඩනැඟුණා. ඒ නිසා ඒ පෝෂිත පාසල් සංකල්පය තවත් ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් නම්, ඒක ගොඩක් වටිනවාය කියන කාරණයත් සිහිපත් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දැක්කා, ඔබතුමන්ලාගේ 2025 අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා, අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාතික සැලැස්මක් හදන්න. හැබැයි ජාතික සැලැස්මක් සකස් කිරීමේ ප්‍රගතිය සියයට 20යි. හැබැයි වියදම් කරලා තිබෙනවා, රුපියල් මිලියන 300ක්. අපට හැබැයි ඒ පිළිබඳව කථා කරන්නට මෙවර අය වැය ලේඛනයෙන් එහි දිගුවක් දකින්න ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ නිසා අධ්‍යාපනය වෙනුවෙන් ඔබතුමන්ලා තබන බර පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය ඉහළට ඔසවන්න විපක්ෂයේ ඉන්නකොට ඔබතුමන්ලා සටන් කළා; සටන් පාඨ කිව්වා. ඒ වෙනුවෙන් ඔබතුමන්ලා මහා කාර්යභාරයක් කළා. නමුත් අද ඔබතුමන්ලාට වගකීම ලැබිච්ච වෙලාවේ ඒ වගකීම පැහැර හරිමින් ඉන්නවා කියන කාරණය තමයි අපට දකින්න ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපට මතකයි, අද ඔබතුමන්ලාගේ අධ්‍යාපන ඇමතිතුමිය - අගමැතිතුමිය - එදා 2012දී විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සම්මේලනයේ හිටපු කාලයේදී මේ රටේ විශ්වවිද්‍යාල දරුවන්ගේ අධ්‍යාපනය ප්‍රාණ ඇපයට තියලා තමයි වැඩ වර්ජනය කළේ. එතුමිය අඛණ්ඩ වැඩ වර්ජනයට සහභාගි වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ පා ගමන්වල ඉදිරියෙන්ම ගමන් කළ ඔබලාගේ අගමැතිතුමිය ඒ තුළින් තමයි දේශපාලනයට ප්‍රවේශ වුණේ. ඒ තුළින් දේශපාලනයේ ඉදිරියට ඇවිල්ලා තමයි අද මේ රටේ වටිනා තනතුරක් වන අගමැති තනතුර දරමින් අධ්‍යාපනයට නායකත්වය දෙන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපට මතකයි, "සියයට 6" කියලා තැඹිලි පාට අකුරෙන් සටහන් කරපු කළු පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන තමයි එදා එතුමිය ඒ උද්ඝෝෂණවල ඉදිරියෙන් ගියේ; විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ එකතු වෙලා, අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කර ගැනීම වෙනුවෙන් සටන් කළේ. හැබැයි අද එතුමියට වගකීම ලැබිලා තිබෙනවා. අද එතුමිය ඒ සියයට 6 ගැන කථා කරනවාද? ඔබතුමන්ලා අවුරුදු දෙකක් සඳහා අය වැය ලේඛන ඉදිරිපත් කළා. හැබැයි, ඔබතුමන්ලා අධ්‍යාපනය වෙනුවෙන් සියයට 6ක් වෙන් කිරීම පිළිබඳවත්, අධ්‍යාපනය වෙනුවෙන් තබන බර පිළිබඳවත් අද අපට පැහැදිලිතාවක් නැහැ කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම අපට මතකයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ආණ්ඩුව පාසල් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පාසල් උපකරණ වැට් බද්දෙන් නිදහස් කරනවාය කිව්වා. අද ඒ පිළිබඳව කථාබහක් නැහැ. ඒ වාගේම ක්‍රීඩා උපකරණවල මිල බලන්න. අද ගමේ පාසල්වල ඉන්න දරුවන්ට ක්‍රීඩාව සඳහා යොමු වෙන්න අවකාශ නැති වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමන්ලා අවධානය යොමු කරලා නැහැ කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ආණ්ඩුව ඉතාම හොඳ වැඩ කටයුත්තක් කළා. එය අගය කරන්න ඕනෑ. ඒ තමයි පාසල් දරුවන්ට රුපියල් 6,000ක වවුචරයක් ලබා දීම. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ රුපියල් 6,000ක වවුචරය ලැබෙන්නේ අඩු ආදායම්ලාභී, ඒ වාගේම සිසුන් සංඛ්‍යාව 300ට අඩු පාසල්වල දරුවන්ට පමණයි. හැබැයි ගිය වර අය වැය ලේඛනය පිළිබඳ විවාදයේදීත් අපි මතු කළා, අද මේ රටේ අඩු ආදායම්ලාභීන් හඳුනා ගැනීම සඳහා වන සංගණනය නිවැරදිද කියන කාරණය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන බව. සමහර විට පවුලේ අම්මා හෝ තාත්තා දෙදෙනාගෙන් එක් අයෙක් රජයේ සේවකයෙක් වෙලා, අනෙක් කෙනා රැකියාවක් කරන්නේ නැති වෙන්න පුළුවන්. ගරු

[ගරු චානක මාදුගොඩ මහතා]

නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ පවුලේ දරුවන් හතරදෙනෙක් පස්දෙනෙක් ඉන්නවා වෙන්න පුළුවන්. නමුත් ඒ දරුවන්ට තමන්ගේ අම්මා හෝ තාත්තා රජයේ සේවකයෙක් වීම නිසා ඒ වවුචරය ලබා ගන්න හැකියාව ලැබෙන්නේ නැහැ. අපි ගිය වරත් මේ පිළිබඳව කථා කළා. ඒ වාගේම, ජනප්‍රිය පාසල්වල, එහෙම නැත්නම් ළමයින් 300ට වැඩි පාසල්වල ළමයින්ට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගිය වරත් අපි මේ පිළිබඳව මතු කළා. පුළුවන් නම් මෙවරවත් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. මොකද, මේ "අඩු ආදායම්ලාභී" කියන නිර්ණායකය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. රජයේ සේවකයන් මේ "අඩු ආදායම්ලාභී" ගණයට අයත් වෙන්නේ නැහැ. නමුත් ඒ රජයේ සේවකයාගේ පවුලේ දරුවන් දෙන්නෙක්, තුන්දෙනෙක් ඉන්නවා නම් ඔවුන් කොහොමද, මේ ආර්ථිකය සමඟ ගැටෙන්නේ? නිවාස ණය අරගෙන, විවිධ ණය අරගෙන ඉන්න ඒ රාජ්‍ය සේවකයාට පවුල නඩත්තු කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා විශේෂයෙන් සඳහන් කරනවා. ඒ සමස්ත දරුවන්ට රුපියල් 6,000ක වවුචරය ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීමත් මම මේ මොහොතේ කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම කථාව ඉක්මනින් අවසන් කරන්නම්, මේ මොහොතේ මේ රටේ විශේෂයෙන් පවතින ගැටලුවක් පිළිබඳව සඳහන් කරලා. මේ දවස්වල අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වෙනවා. විශේෂයෙන්ම එම විභාගය පැවැත්වෙන මේ මොහොතේ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. අපි දන්නවා, විශේෂයෙන් උසස් පෙළ විභාගයේ Z-score අගය මත ඒ දරුවන්ගේ ජීවිතය, අනාගතය තීරණය වන බව. අද ඒ විභාගයේ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය ගැන සමාජයේ කථා බහක් ඇති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මෙවර උසස් පෙළ විභාගයේ ආර්ථික විද්‍යාව බහුවරණ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 50න්, ප්‍රශ්න 24ක්ම උපකාරක පන්තියකින් දීපු ප්‍රශ්න පත්‍රයක තිබිලා තියෙනවා. ඒ වාගේම, රචනා ප්‍රශ්නවලින් 10න්, 5ක්ම කලින් දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම ඔබතුමියගේ අවධානය, ආණ්ඩුවේ අවධානය, විභාග දෙපාර්තමේන්තුවේ අවධානය වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ සියලු ආයතනවල අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා. මොකද, මේ සෙල්ලම් කරන්නේ අපේ රටේ දරුවන්ගේ අනාගතය සමඟයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ දරුවන්ගේ අනාගතය තීරණය කරන, අපේ රටේ දරුවන් විශ්වාසයෙන් යුතුව පෙනී සිටින, රටේ වැඩිම අවධානයක් යොමු වෙලා තිබෙන විභාගය තමයි, අ.පො.ස. (උසස් පෙළ) විභාගය. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියන කාරණය සඳහන් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.11]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා, මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙවර අය වැය 2025දී අප ඉදිරිපත් කළ මුල් අය වැයේම දිගුවක් විධියට සලකන්න පුළුවන්. අපේ මුල් අය වැය තුළින් අප උත්සාහ ගත්තේ ආර්ථිකය ස්ථායිකරණය කරන්නයි. දැන් අපි සංවර්ධන ඉලක්කයට යනවා. අවුරුද්දකටත් අඩු මේ කෙටි කාලය ඇතුළත අපි සංවර්ධන ඉලක්ක බොහොමයකට ගිහිල්ලා තිබෙනවා; සමහර ඉලක්ක සපුරාගෙනත් තිබෙනවා. එය බෙහෙවින් සන්තෝෂයට කාරණාවක්. අපි පරිපූර්ණ නැති වුණාට, මේ කෙටි කාලය ඇතුළත අපට කර ගන්න පුළුවන් වුණු දේවල් ටික ගැන ඉදිරියේදී අපි කථා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, උසස් අධ්‍යාපනය ගත්තොත්, උපාධිය කියන්නේ සහතිකයක් පමණක් නොවෙයි. උපාධි සහතිකයේ සඳහන් වෙනවා "විශ්වවිද්‍යාල" -university- කියන වචනය. ඒ කියන්නේ, විශ්වීය අධ්‍යාපනයයි. එම නිසා විශ්වීය අධ්‍යාපනයක් දක්වා යන මාර්ගයක තමයි අපි මේ උසස් අධ්‍යාපන රැගෙන යන්නේ.

අපට මුලින්ම අභියෝග රැසක් ආවා. ශිෂ්‍යයන්ගේ සුබසාධනය ගත්තොත්, අපට මුලින්ම ආපු ගැටලුවක් තමයි ශිෂ්‍යයන්ගේ නේවාසිකාගාර ගැටලුව. ශිෂ්‍ය නේවාසිකාගාර කියන්නේ නිකම්ම නවාතැන් පොළක් නොවෙයි. ශිෂ්‍ය නේවාසිකාගාර තුළ ඉඳගෙන ශිෂ්‍යයන්ට පුළුවන් වෙන්න ඕනෑ අධ්‍යයන කටයුතු කරන්න; අධ්‍යයන මානසිකත්වයක් හදා ගන්න; ඉගෙනුම් හැකියාවක් ලබා ගන්න. සමහර වෙලාවට, ඒවාට අන්තර්ජාල පහසුකම් ද තිබෙන්න ඕනෑ. මෙතෙක් එහෙම තැන් තිබුණේ නැහැ. ඒ වාගේම, ඒ කාලයේ සමහර පාඨමාලා පටන් ගත්තාට පීඨ තිබුණේ නැහැ. විපක්ෂය දැන් අපේ ප්‍රතිපත්තිමය කාරණා ගැන විවේචනාත්මකව කථා කරනවා. නමුත්, ඒ අයගේ ප්‍රතිපත්තිමය කාරණා මොන වාගේද? අපට ලැබුණේ පීඨ නැති වුණාට පාඨමාලා පටන් ගත්තු විශ්වවිද්‍යාලයි. මෙහිදී අපට ගන්න පුළුවන්, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සහ මොරටුව විශ්වවිද්‍යාලය. අපට ලොකු අභියෝග රැසක් තිබෙනවා, මෙන්න මේ කියන පාඨමාලා තිබෙන පීඨ හදා ගැනීම සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පීඨ නැතිව මේ ආකාරයට පටන් ගත්තු සියලුම පාඨමාලාවලට අදාළව පීඨ ලබා දෙන්නත් 2026 අය වැයෙන් යෝජනා වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශ්වවිද්‍යාල ගත්තොත්, ඒවායේ නේවාසිකාගාර ගැටලුව ගැනත් කථා කරන්න ඕනෑ. ඒ වාගේමයි, විශ්වවිද්‍යාලවල පුස්තකාල හා සම්බන්ධ ගැටලු. පුස්තකාල කියන්නේ, පොත් විතරක් තිබෙන නිකම්ම නිකම් තැනක් නොවෙයි. පොත් කියන්නේ දැනුම; මොළය. ඊළඟට, සනීපාරක්ෂක පහසුකම් සහ සෞඛ්‍ය පද්ධතිය පිළිබඳවත් ගැටලු තිබෙනවා. විශ්වවිද්‍යාලවල ආපනශාලා දෙස බලන්න. අපි දකිනවා, පාසල්වල වාගේම විශ්වවිද්‍යාලවල ආපනශාලාත් හැම තැනම හොඳ තත්ත්වයේ නැති බව. ඒ නිසා අපට ඒ අභියෝගවලටත් මුහුණ දෙන්න සිද්ධ වුණා. ඊළඟට වෛද්‍ය මධ්‍යස්ථාන සහ ක්‍රීඩා පිළිබඳ ගැටලු ද තිබෙනවා. ශිෂ්‍යයන්ට ඉගෙන ගැනීම පමණක්ම නොවෙයි, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමත් අවශ්‍යයි. ඒ සඳහා වෛද්‍යවරුන් වාගේම වෛද්‍ය

මධ්‍යස්ථානත් අවශ්‍යයි. ඒ වාගේම, ක්‍රීඩාව වෙනුවෙන් ක්‍රීඩා පිට්ටනි සහ ක්‍රීඩා උපකරණ අවශ්‍යයි. ඊළඟට, විශ්වවිද්‍යාලවලට අන්තර්ජාල පහසුකම් අවශ්‍යයි. පිට රට විශ්වවිද්‍යාල සියල්ල මේ වනකොට අන්තර්ජාලය හරහා එකතු වෙලා පොදු විශ්වවිද්‍යාල පද්ධතියක් විධියට තමයි තිබෙන්නේ.

අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය වෙනුවෙන් අප කරපු දේවල් මොනවාද කියලා බලමු. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2025 වර්ෂයේදී අපි යාපනය විශ්වවිද්‍යාලයේ කිලිනොච්චියේ පිහිටි ඉංජිනේරු තාක්ෂණවේදය සහ ජීව පද්ධති තාක්ෂණවේදය උගන්වන තාක්ෂණ පීඨය සඳහා රුපියල් මිලියන 491ක් යෙදෙව්වා. රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා රුපියල් මිලියන 1,660ක් යෙදෙව්වා. නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ සන්නිවේදනය හා ව්‍යාපාර අධ්‍යයන පීඨය සඳහා රුපියල් මිලියන 701ක් යෙදෙව්වා. එයින් නවතින්නේ නැතිව අපි 2026 මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පීඨ ගොඩනැඟිල්ල සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කළා. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨ ගොඩනැඟිල්ල සඳහා රුපියල් මිලියන 800ක් වෙන් කළා.

ඊළඟට, වෛද්‍ය පීඨ සංවර්ධනය සඳහා 2025 වර්ෂයේ අපි ඉටු කළ දේවල් කියන්නම්. අපි කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා රුපියල් මිලියන 5,413ක් වියදම් කර තිබෙනවා; යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා රුපියල් මිලියන 649ක් වියදම් කර තිබෙනවා; රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා රුපියල් මිලියන 2,488ක් වියදම් කර තිබෙනවා. 2026දී ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා රුපියල් මිලියන 600ක්, නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකකය සඳහා රුපියල් මිලියන 300ක්, මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකකය සඳහා රුපියල් මිලියන 640ක් වැය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කියන කාරණය ගනිමු. අපි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජලනළ පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා 2025 වර්ෂයේදී රුපියල් මිලියන 1,422ක් යොදවා තිබෙනවා. එය අවුරුදු 50කට එහා පැරණි නවීකරණය කළ යුතු ජලනළ පද්ධතියක්. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ අප ඉහතින් කථා කළ පුස්තකාල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 53ක් යොදවා තිබෙනවා. සබරගමුව විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය සඳහා අපි රුපියල් මිලියන 121ක් යොදවා තිබෙනවා. 2025 ඉතිරි වූ මුදල්වලින් රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පහසුකම් සැකසීම සඳහා අපි රුපියල් මිලියන 200ක් වියදම් කර තිබෙනවා.

2026 වර්ෂය ගත්තොත්, 2026දී යටිතල පහසුම් සංවර්ධනය වෙනුවෙන් අප කරන්න යන දේවල් මා කියන්නම්. වවුනියාව විශ්වවිද්‍යාලයේ ආපණශාලාවේ මේ වෙලාව වන කොට බිත්ති 4 විතරයි තිබෙන්නේ. අපි එම ආපණශාලාව වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 64ක් යොදවනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨයේ වෛද්‍ය රසායනාගාර, විද්‍යාගාර සඳහා විද්‍යාගාර සංකීර්ණයක් ලබා දීමට රුපියල් මිලියන 120ක් යොදවනවා. වවුනියාව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය ගොඩනැඟීම සඳහා රුපියල් මිලියන 45ක් යොදවනවා. පොදුවේ ගත්තාම, විශ්වවිද්‍යාල පද්ධතියේ වෛද්‍යවරුන්ගේ අඩුවක් තිබෙනවා. අපි සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා එකඟතාවක් ඇති කරගෙන තිබෙනවා, සියලු විශ්වවිද්‍යාලවල වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් වෛද්‍යවරුන් ඇතුළත් කර ගැනීමට.

ඊළඟට, අපට තිබුණු ලොකුම ගැටලුවක් තමයි, නේවාසිකාගාර ගැටලුව. මේ වෙද්දී අපට පුළුවන් වෙලා තිබෙනවා නේවාසිකාගාර 55ක් සඳහා 2026 වර්ෂයට රුපියල් මිලියන 1,500ක් වෙන් කර ගන්න. එතකොට පුළුවන් 16,000ක් 18,000ක් අතර ශිෂ්‍ය ප්‍රමාණයකට නේවාසික පහසුකම් ලබා දෙන්න. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අවුරුදු 50ක් විතර පරණ නේවාසිකාගාරයකුයි තිබෙන්නේ. එය නවීකරණය කර ගන්න අපි රුපියල් බිලියන 1.5ක් යොදවනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ තමයි ඉතිහාසයේ එකවර නේවාසිකාගාර 55ක් දියුණු වන පළමු වතාව.

අධ්‍යාපනය සඳහා මුදල් බාධකයක් විය යුතු නැහැ. අපි මහපොළ ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යාධාර දීමනා වැඩි කර තිබෙනවා. ඊළඟට, අපි තවත් විශේෂිත දෙයක් කරනවා. ඒ මොකක්ද? අපට විදේශීය දැනුම අවශ්‍යයි; විදේශීය දැනුම ලංකාවේ ආර්ථිකයට, ලංකාවේ මානව ප්‍රාග්ධනයට - human capital සඳහා - ලබා ගන්න අවශ්‍යයි. ඒ සඳහා වන අපේ උපාය උපක්‍රම මෙසේයි. 2025 අය වැය යෝජනාවල තිබෙනවා, විදේශ විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව පිරිනමන බව. ඊට අදාළ පාඨමාලා විශේෂිතයි. ඊට අදාළ පාඨමාලා හැදෑරීමේ අවස්ථා අප ලබා ගන්නේ ලෝකයේ තිබෙන හොඳම විශ්වවිද්‍යාලවලින්. විශ්වවිද්‍යාලවල ශ්‍රේණිගත කිරීම් තිබෙනවා. QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව, ඒ Top 500 ඇතුළත වූ විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අපි ශිෂ්‍යත්ව ප්‍රදානය කරනවා. පාඨමාලා ගාස්තු, ආහාර, සෞඛ්‍ය රක්ෂණය, නේවාසික පහසුකම් වෙනුවෙන් අවුරුද්දකට රුපියල් මිලියන 20ක් දක්වා, උපරිමය රුපියල් මිලියන 80ක් දක්වා මුළු කාලය සඳහා වැය කරනවා. මේ වෙද්දී, ශිෂ්‍යයන් තිස්දෙදෙනෙක් ඇතුළත් කර ගැනීමේ මූලික ක්‍රියාවලිය කර ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපි මෙන්න මෙහෙම දෙයක් කරනවා. ශිෂ්‍යයා යනවා, දැනුම ගන්නවා, නැවත එනවා, අපි බැඳුම්කර ගිවිසුමකට එළඹෙනවා. එතකොට ශිෂ්‍යයා ඇවිල්ලා අපට සේවය කරනවා, අලුත් දැනුම අරගෙන. මේක අපේ එක ඉදිරි සැලැස්මක්, දැනුම වැඩි කර ගන්නට කරන.

ඒ වාගේම විශ්වවිද්‍යාල සුරක්ෂිත ගෞරවාන්විත තැනක් විය යුතුයි. තෘතීයික අධ්‍යාපන ආයතනවල ඇති සියලු හිංසා වැළැක්වීම සඳහා අපි ඒකාබද්ධ ව්‍යුහයක් හදලා තිබෙනවා. ඒ වාගේම තමයි අන්තර්කරණ අධ්‍යාපනය. ඒක දැන් ලෝකයේ තිබෙන විධිය. මේ අන්තර්කරණ අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනයේත් තිබෙනවා. නමුත් පීඨ හතරකට සීමා කරපු මේ අන්තර්කරණ අධ්‍යාපනය, ඒ කියන්නේ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා තිබෙන බඳවා ගැනීම අපි මුළු විශ්වවිද්‍යාල පද්ධතියට විවෘත කරලා තිබෙනවා. ඒක සියලු විශ්වවිද්‍යාලවල සියලු පීඨවලට අපි විවෘත කරලා තිබෙනවා. මේක තමයි ලංකාවේ තිබෙන සුවිශේෂී අවස්ථාව. මේක ගැන ජාත්‍යන්තරවත් කථා කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඊළඟ එක, පර්යේෂණ සහ පශ්චාත් උපාධි. අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ ශ්‍රේණිගත කිරීම් ගත්තොත්, ඒ ශ්‍රේණිගත කිරීමට බලපාන එක කාරණාවක් තමයි කොච්චර පර්යේෂණ ප්‍රමාණයක් සිද්ධ වුණාද කියන එක. අපට සංවර්ධන ඉලක්කවලට යන්නත් පර්යේෂණ සහ නව නිපැයුම් අවශ්‍ය වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට අතිරේක විනාඩි දෙකක කාලයකුත් ලැබී තිබෙනවා. ඒ අනුව, ඔබතුමාට තව විනාඩි 4ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මෙන්න මේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ඉතිහාසයේ වැඩිම මුදල වෙන් වෙනවා 2026 අය වැයෙන්. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 11,500ක් වෙන් කරනවා. මෙන්න මේ ආයෝජනය තමයි අපි කර්මාන්ත කරා, ගොවිපොළ කරා ගෙන යන්නේ. ගොවිපොළ සහ විශ්වවිද්‍යාලය, කර්මාන්ත සහ විශ්වවිද්‍යාලය අතර තිබුණු තාප්පය බිඳ දමලා අපි ආර්ථිකයේ තිබෙන ලොකුම පිම් පනින්නේ මෙන්න මේ පර්යේෂණ සහ සංවර්ධන ඉලක්ක මඟින්. මේක අපි ලබන සුවිශේෂ ජයග්‍රහණයක්.

ඒ වාගේම අපි මෙතැන කථා වෙනවා, පෞද්ගලික විශ්වවිද්‍යාල, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන නියාමනය විය යුතුයි කියලා. ඒවායේ ප්‍රමිතිකරණය සඳහා 2026දී අපි රුපියල් මිලියන 40ක් වෙන් කර තිබෙනවා.

ඊළඟට තිබෙනවා, විවෘත සහ දුරස්ථ අධ්‍යාපනය. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධ්‍යාපනය නවතින්න බැහැ, පාසලෙන් හෝ විශ්වවිද්‍යාලයෙන්. අධ්‍යාපනය ලබාගන්න පුළුවන් වෙන්න ඕනෑ ආයතන තුළදීත්. ඒ වුණාට, මේ සියලු විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා ප්‍රමිතිකරණයක් තිබිය යුතුයි. ඒ නිසා අපි බාහිර උපාධි ආයතනවල තිබෙන මේ සියලු පාඨමාලා නවීන ලෝකයේ පවතින උපාධිවලට සමාන්තරද, ඒවායෙන් රැකියා උත්පාදනයක් සිද්ධ වෙනවාද සහ මානව ප්‍රාග්ධනයට - human capital සඳහා - මෙය කොච්චර දුරට දායක වෙනවාද කියා සලකා බලනවා. ඒකෙන් තමයි අපි ඉදිරි පිම්ම පනින්නේ. අපි අධ්‍යාපනයට යන වියදම නව ආයෝජනයක් කරගන්නේ මෙන්න මේ විධියටයි.

ඒ වාගේම ඩිජිටල්කරණය ගැන කථා කළොත්, අපි සියලු විශ්වවිද්‍යාල fibre ජාලගත කරනවා. කැලණිය විශ්වවිද්‍යාලය ඩිජිටල්කරණය සඳහා 2026 වර්ෂයට රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා.

ඊළඟට, ශිෂ්‍ය පොලී රහිත ණය වෙනුවෙන් ගිය අවුරුද්දේ රුපියල් මිලියන 2,785ක් වෙන් කළා. 2026 වර්ෂයේ ඒ සඳහා රුපියල් මිලියන 3,057ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව රුපියල් මිලියන 250ක වැඩි කිරීමක් කරලා තිබෙනවා, අධ්‍යාපනයට මුදල බාධාවක් නොවෙන්නත්, ශිෂ්‍යයන්ට අවස්ථාව ලබන්නත්. අපට අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා බඳවා ගැනීම් කරන්න බැරි වෙලා තිබුණා 2022 වර්ෂයේ ඉඳලා. මේ අය තමයි විශ්වවිද්‍යාලවල කොඳු නාරටිය. 2022 ඉඳලා බඳවා ගැනීම නැවතිලා තිබුණු අධ්‍යයන කාර්ය මණ්ඩල 1,284ක්, අනධ්‍යයන කාර්ය මණ්ඩල 1,868ක් වශයෙන් 3,152ක් බඳවා ගැනීමට අවස්ථාව දෙන අතරතුර, නව බඳවා ගැනීම් 307ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අපට අවසර ලබා දී තිබෙනවා. ඊට අමතරව අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනවල ශිෂ්‍යයන්ට ලබාදෙන දීමනාව අපි මහපොළ ශිෂ්‍යාධාරවලට සමාන්තරව රුපියල් 5,000 දක්වා වැඩි කර තිබෙනවා. මේ අවුරුද්දේ අපි ගිය අවුරුද්දට වඩා ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 400ක වැඩි කිරීමකුත් කරලා තිබෙනවා. අපි මෙන්න මේ විධියට උසස් අධ්‍යාපන අංශයේ කටයුතු සිද්ධ කරනවා, නවීන තාක්ෂණයට අනුකූලව.

මේ සභාවේ පැන නැඟුණු කාරණා දෙක තුනකටත් උත්තර දෙන්න ඕනෑ කියා මම හිතනවා. එකක් තමයි, වතු පාසල් සම්බන්ධයෙන් පැන නැඟුණු කාරණාව. අපි 2026 වර්ෂය සඳහා ගොඩනැඟිලිවලට විතරක් රුපියල් මිලියන 741ක් වෙන් කර තිබෙනවා. ගුරු හිඟය නැති කිරීම සඳහා වතු පාසල්වල ගුරු නිවාස සඳහා රුපියල් මිලියන 465ක් වෙන් කර තිබෙනවා. ඊළඟට ඉන්දියානු ආධාරවලින් වතු පාසල් නවීකරණය සඳහා රුපියල් මිලියන 236ක් වෙන් කර තිබෙනවා. සපත්තු වවුචර් ලබා දීමටත්, ළමුන් 300ට අඩු සියලු පාසල්වලට ලිපි ද්‍රව්‍ය ලබා දීමටත් කටයුතු කරනවා. ගුරු හිඟයට පිළියම් වශයෙන් ශ්‍රීපාද විද්‍යාපීඨයෙන් ගුරුවරු 308ක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මම යෝජනා කරනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අධ්‍යාපන කොටසට අදාළ යෝජනා ටික එකින් එක කියවන්න කියලා. මම කියනවා ඒ තිබෙන වචනවලින් ගත්තත්, මුළු අර්ථයෙන් ගත්තත් ඒ තිබෙන සියලු ප්‍රතිපත්ති මේ අවුරුද්දේ කෙටි කාලයක් ඇතුළත නිම කරලා අවසන් බව. අපි එහෙම කියන අතරතුර, ඔබට එම ප්‍රතිපත්ති ප්‍රකාශනය බැලුවාම ඒ ගැන මනා අවබෝධයක් ගන්න පුළුවන්.

අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා අපේ අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු සියලු ආයතනවල කාර්ය මණ්ඩලවලට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇතුළු සියලු විශ්වවිද්‍යාලවලට සහ ශිෂ්‍ය ප්‍රජාවට අපේ මේ දැවැන්ත කාර්යභාරයට සහයෝගය ලබා දීම වෙනුවෙන්.

ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.28]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දකුණු අප්‍රිකාවේ හිටපු ශ්‍රේෂ්ඨ නායකයෙකු වූ නෙල්සන් මැන්ඩෙලාගේ ප්‍රකාශයකින් මගේ කථාව ආරම්භ කරනවා.

"ලෝකය වෙනස් කිරීමට පාවිච්චි කළ හැකි බලවත්ම ආයුධය අධ්‍යාපනය යි."

මම බොහොම සතුටු වුණා, අපේ වත්මන් අධ්‍යාපන ඇමතිතුමිය -ගරු අගමැතිතුමිය- එදා නවවැනි පාර්ලිමේන්තුවේ දී අපේ පැත්තේ ඉඳගෙන අධ්‍යාපනය ගැන කථා කරනකොට. එතුමිය ඒ වෙනුවෙන් කථා කළා විතරක් නොවෙයි, අධ්‍යාපනය

සඳහා දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් වෙන් කරනවා කියලා ප්‍රකාශ කළා. ඉතින් මම ඇත්තටම සතුටු වුණා. මේ ආණ්ඩුව ජයග්‍රහණය කරලා අගමැතිතුමිය රටේ අධ්‍යාපන ඇමතිතුමිය විධියට පත් වෙනකොට එදා මේ පැත්තේ ඉඳලා කථා කරපු දේවල් අනුව දැන් වැඩ කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා කියලා මම සතුටු වුණා. ජනාධිපතිතුමා උපරිම සාධාරණයක් එතුමියගේ අමාත්‍යාංශයට ඉෂ්ට සිද්ධ කරලා දීලා තිබෙනවා. දැන් ඒ කියපු කරුණු මහපොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න එතුමිය කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. මම සුබ පතනවා අධ්‍යාපන ඇමතිතුමියට. 2026 අය වැයේ තිබෙන මේ ඉලක්කම් ටික යථාර්ථයක් බවට පත් කරයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අධ්‍යාපනය ගැන කථා කරනකොට පාසල් ගැන කියන්න ඕනෑ. අද සමස්ත පාසල් 10,076ක් තිබෙනවා. ඒ අතර ජාතික පාසල් 396ක් තිබෙනවා. මේ ජාතික පාසල් 396න්, පාසල් 48කට විදුහල්පතිවරු නැහැ. එතකොට විදුහල්පතිවරු නැති වෙනකොට දරුවන්ට නැණ නුවණ දෙන්න බැහැ වාගේම, අනෙකුත් දේවල් කර ගන්නත් බැරි වෙනවා. ඒ වාගේම පරිපාලන කටයුතුවල දී විශාල ගැටලු ඇති වෙනවා. ගුරුවරු 36,000කට ආසන්න ප්‍රමාණයක් මේ පාසල්වල නැහැ. 2025.12.31 වන විට ගුරුවරු 8,000කට ආසන්න ප්‍රමාණයක් විශ්‍රාම යනවා. එතකොට ගුරුවරු 44,000ක හිඟයක් ඇති වෙනවා. ඒ නිසා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගන්න අපහසු වෙනවා. එතකොට මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරගෙන යන්න පුළුවන්ද? 2023-2024 වර්ෂයේ තොරතුරු අපට ලැබිලා තිබෙනවා. ඒ අනුව, ළමයි 25,000ක් පාසල් අතහැර දාලා ගිහිල්ලා තිබෙනවා. ඌව සහ නැගෙනහිර පළාත් හැර, අනෙක් පළාත්වල පාසල් 101ක් 2025 වර්ෂයේ වැහිලා තිබෙනවා. ඉතින්, මේ වෙන් වෙච්ච මුදල ප්‍රමාණවත්ද මේ වැහිච්ච පාසල් ටික නැවත ආරම්භ කරන්න? 44,000ක වාගේ ගුරු හිඟයකුත් තිබෙනවා. ඒ සඳහා පිරිස් බඳවා ගෙන ඒ අයට ඒ පුහුණුව ලබා දීලා ඒ කටයුතු කරන්න විද්‍යාපීඨවලට වෙන් කර ගත්ත මුදල ප්‍රමාණවත්ද කියලා මම මේ අවස්ථාවේ ගරු අධ්‍යාපන ඇමතිතුමියගෙන් අහනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, එහි තිබෙන මුළු පාසල් සංඛ්‍යාව 256යි. ජාතික පාසල් 9ක් තිබෙනවා; විදුහල්පති පුරප්පාඩු 121ක් තිබෙනවා; ගුරු පුරප්පාඩු 1,126ක් තිබෙනවා. ගරු අගමැතිතුමියනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විතරක් ගුරුවරු 1,126ක් නැහැ. පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් පාසල් අතරින් පානීය ජලය නැති පාසල් 93ක් තිබෙනවා. ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නැති පාසල් 131ක් තිබෙනවා.

විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් 27ක් තිබෙනවා. පරිගණක පුස්තකාල පහසුකම් නොමැති පාසල් 144ක් තිබෙනවා. ක්‍රීඩා පිට්ටනි නොමැති පාසල් 69ක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අය වැය විවාදයේදී තමයි අපට මේවා පෙන්වලා දෙන්න වෙන්නේ. දීර්ඝ කාලයක් තිස්සේ මේ දේවල් නොකෙරුණු නිසා තමයි අද අපේ අහිංසක දරුවන්ට මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. හැබැයි, ඔබතුමිය විරුද්ධ පාර්ශ්වයේ ඉඳලා එදා කියපු දේ අද යථාර්ථයක් බවට පත් කරන්න, මේ රටේ අහිංසක දරුවන් වෙනුවෙන් වැඩ කටයුතු කරන්න ඔබතුමියට ලොකු අවස්ථාවක් ලැබිලා තිබෙනවා.

ගරු අගමැතිතුමියනි, මේ අය වැයෙන් වෙන් කළ මුදල්වලින් උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කය ඇතුළු පළාත් 9ටත්, අපේ නැණ නුවණ පාදන ගුරුවරුන්ටත්, ඒ වාගේම දරුවන්ටත් ඔබතුමිය සාධාරණයක් ඉෂ්ට කර දෙයි කියලා මම විශ්වාස කරනවා. ගුරුවරු ගැන කථා කළොත්, ගුරුවරු රැඳෙන්නේ නැති පළමුවෙනි හේතුව තමයි, ඒ අයට ඉන්න නිල නිවාස නැති එක. උතුරු මැද පළාත ගත්තොත්, විදුහල්පතිවරුන්ට අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිල නිවාස 548ක් තිබෙනවා. මෙයින් ක්‍රියාත්මක වෙන්නේ 41යි. ඒ වාගේම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ නිල නිවාස 240ක් තිබෙනවා; ක්‍රියාත්මක වෙන්නේ 33යි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගුරු නිල නිවාස 263ක් තිබෙනවා; ක්‍රියාත්මක වෙන්නේ 154යි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 218ක් තිබෙනවා; ක්‍රියාත්මක වෙන්නේ 130යි. මෙහෙම වුණාම ගුරුවරු ඇවිල්ලා මේවායේ රැඳෙන්නේ නැහැ. අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, ත්‍රිකුණාමලය ආදී ප්‍රදේශ ගත්තාම ගුරුවරුන්ට ඉන්න පහසුකම් නැහැ; ඒ අයට ඉන්න සුදුසු නිවාස නැහැ. ඒ නිසා මම යෝජනාවක් කරනවා. ගුරුවරුන්ට තිබෙන නිල නිවාස ටික මේ අය වැයෙන් මුදල් වෙන් කරලා ඉක්මනින්ම හදලා දුන්නොත්, ගුරුවරු ගිහිල්ලා මේවායේ රැඳේවි. ගරු අගමැතිතුමියනි, ඔබතුමිය මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරයි කියලා මම විශ්වාස කරනවා.

ලංකාවේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 20ක් තිබෙනවා. කථිකාචාර්යවරු 263ක පුරප්පාඩු තිබෙනවා. අනුමත සෙසු කාර්ය මණ්ඩලයේ 602ක පුරප්පාඩු තිබෙනවා. විද්‍යාපීඨ ගත්තාම, ඒවායේ ඉගෙනුම ලබන දරුවන්ට කථිකාචාර්යවරුන්ගේ අඩුපාඩුවත් එක්ක, ඒ සෙසු නිලධාරීන්ගේ අඩුපාඩුවත් එක්ක ඒ වැඩ කටයුතු කරගෙන යන්න බැරි වෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, ගැටලුව තිබෙන්නේ මෙතැනයි කියලා. මම හිතන විධියට එදා ඔබතුමිය මේ ගැන දැකලා තමයි, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරන්න ඕනෑ කියලා යෝජනා කළේ. හැබැයි, ඇත්තටම සියයට එකයි වෙන් වෙලා තිබෙන්නේ. ඉතින්, මේක කරන්නේ කොහොමද කියන එක ලොකු ප්‍රශ්නයක්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
සියයට දෙකයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
නැහැ. සියයට දෙකක් නොවෙයි, ගරු අධ්‍යාපන ඇමතිතුමියනි. මොකද, සියයට දෙක එන්නේ අනෙක් ආයතනවලත් තිබෙන සියලු දේම එකතු කරලා. මම මේ කථා කරන්නේ අධ්‍යාපන විෂය ගැන. අධ්‍යාපන විෂය ගත්තාම සියයට එකයි. මම ඒක කථාවේදී පැහැදිලි කරන්නම්. සියයට එකයි වෙන් කර තිබෙන්නේ.

විශේෂයෙන්ම කථිකාචාර්යවරුන් ගත්තාම, අවුරුදු 10ක්, 15ක් සේවය කරපු අයට දෙන දීමනාවම තමයි අලුතින් බඳවා ගන්න අයටත් ලැබෙන්නේ. වැටුප් විෂමතාවක් තිබෙනවා. එම ක්ෂේත්‍ර 6ටම මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා ඔබතුමිය මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා, කථිකාචාර්යවරුන් වාගේම මේ ක්ෂේත්‍ර හයේම සිටින අයගේ වැටුප් විෂමතාව පිළිබඳ සලකා බලා සාධාරණයක් කරයි කියලා මම හිතනවා.

අනෙක් කාරණය තමයි, අවුරුදු ගණනාවක් සේවය කරපු අයට උසස්වීම් ලැබෙන්න අවුරුදු 17ක් යනවා. අලුතින් බඳවා ගත් කථිකාචාර්යවරුන්ට උසස්වීම ලබා ගන්න යන්නේ වසර 12යි. මෙතැන ලොකු ගැටලුවක් තිබෙනවා. අවුරුදු ගණනාවක් සේවය කරපු අයට උසස්වීම් ලැබෙන්න අවුරුදු 17ක් යන්නත්, අලුතින් බඳවා ගත්ත අයට අවුරුදු 12න් උසස්වීම් ලැබෙන්නත් හේතුව මොකක්ද? එතැන ගැටලුවක් තිබෙනවා. මම හිතන විධියට, මේ

[ගරු කිංස් නෙල්සන් මහතා]

සම්බන්ධව ඔබතුමිය දැනුවත් වෙලා ඇති. ඒ නිසා මේ සම්බන්ධවත් විශේෂ අවධානයක් යොමු කරන්න කියා මා ඉල්ලනවා.

ඊළඟට, නේවාසික පහසුකම් ගත්තාම, විද්‍යාපීඨවල නේවාසික පහසුකම් තිබෙන්නේ 215යි. නමුත් ක්‍රියාත්මක වෙන්නේ කීයද? 110යි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පිරිමි ළමුන් සඳහා නේවාසිකාගාරයක් නැහැ. ඒ නිසා මේ දරුවන් දැඩි අපහසුතාවට පත් වෙනවා. ඒගොල්ලන් කුලියට ඉන්න ගියොත් අනිවාර්යයෙන්ම මාසයකට රුපියල් 30,000ක 40,000ක අමතර වියදමක් යනවා, නේවාසිකාගාර පහසුකම් නොමැතිවීම නිසා. එම නිසා, ඒ සම්බන්ධවත් විශේෂ අවධානයක් යොමු කරන්නය කියා මා ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අරලගංවිල විලයාය ජාතික පාසල ගැනත් මම කියන්න ඕනෑ. ගරු අධ්‍යාපන ඇමතිතුමියනි, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන මේ පාසල තමයි සිංහල, දෙමළ, ඉංග්‍රීසි කියන භාෂා මාධ්‍ය තුනෙන්ම තිබෙන පළමුවැනි පාසල. මේ පාසලේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා දරුවන්ට උගන්වන්න කිසිම ගුරුවරයෙකු නැහැ. ජාතික පාසලක් වුණාට දරුවන්ට ක්‍රීඩා කරන්න ක්‍රීඩාංගණයක් නැහැ. අපි පසුගිය කාලයේත් ඒ ගැන කිව්වා. විපක්ෂයේ සිටි කාලයේ ඔබතුමියත් ඒ ගැන කථා කළා. පසුගිය කාලයේ ජාතික පාසල් ඇති කළා. ඉස්සරහා තාප්පය දැම්මා, වැට දැම්මා, ගේට්ටුව දැම්මා, ජාතික පාසලක් කියලා නම් කරලා ලස්සන බෝඩ් එකක් ගැහුවා. හැබැයි, ජාතික පාසලක් විධියට තිබෙන ගුණාංග ඒ පාසල්වල තිබෙනවාද? ජාතික පාසලක් වුණාට මේ විලයාය ඉස්කෝලේ ගුරු පහසුකම් නැහැ, පානීය ජලය නැහැ, ක්‍රීඩා කරන්න පිට්ටනියක් නැහැ, English medium උගන්වන ඉංග්‍රීසි ගුරුවරයෙක් නැහැ කියන එක තමයි එම විදුහල්පති සහ ඒ ප්‍රදේශයේ දෙමව්පියන් අපට කියන්නේ. ඔබතුමිය ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරයි කියලා මම හිතනවා. ඒ වාගේම තමයි මැදිරිගිරිය ජාතික පාසලත්. එහි සිසුන් 3,263ක් ඉන්නවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන එම පාසල සමස්ත ලංකා තරගවලට ගිහිල්ලා විශිෂ්ට ජයග්‍රහණයක් ලබපු පාසලක්. නමුත් එහි ක්‍රීඩා කරන්න පිට්ටනියක් නැහැ. ඉතින්, ජාතික පාසලක් වෙන්නේ කොහොමද? ඔබතුමිය පොළොන්නරුව දිස්ත්‍රික්කයට කිහිප විටක් ආවා; ඔබතුමිය ත්‍රෛභාෂා පාසල විවෘත කරන්න ආවා. ඒ ත්‍රෛභාෂා පාසල නැවත වැහිලා. ඔබතුමිය ඇවිල්ලා එදා ඒක විවෘත කළා. හැබැයි, ඒ විවෘත කරපු දවසේ විතරයි. ගොඩනැඟිලිවල වහල නැහැ. ඒ වැඩ කටයුතු කිසිම දෙයක් දැන් වෙන්නේ නැහැ. කාලයක් යන කොට ඒකේ තිබෙන බඩු මුට්ටු ටික ගලවාගෙන යයි. එහෙම වෙලා තිබෙනවා. ඒක නිසා මේ සම්බන්ධවත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම යෝජනා කරනවා.

ජනාධිපතිතුමා කිව්වා, උපාධිධාරින් 30,000කට රැකියා ලබා දෙනවා කියලා. එන වසර වනකොට මම ඉස්සෙල්ලා කියපු ගුරු හිඟය, විදුහල්පති හිඟය වැඩි වෙනවා. විශ්‍රාම යන ගුරුවරු ගත්තාම එන වසරේ ගුරුවරු 44,000ක් හිඟ වෙනවා. ජනාධිපතිතුමා කියපු ආකාරයට උපාධිධාරින් 30,000කට ඒ අවස්ථාව ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා. ඒ පුරප්පාඩු පිරවීම ඉක්මනින් කළොත්, අපේ රටේ අධ්‍යාපනය හොඳ තත්ත්වයට ගෙනෙන්න පුළුවන් වෙනවා කියලා මම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පෙර පාසල කියන එක අපි හැමෝටම අමතක වෙලා තිබෙනවා. උසස් අධ්‍යාපනය ලබලා, විශ්වවිද්‍යාලයට ගිහිල්ලා මේ පාර්ලිමේන්තුවට ආපු අපි, මුලින් පෙර පාසල් ගිය අය. මම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කදුරුවෙල ජයන්ති විහාරයේ පෙර පාසලට තමයි ගියේ. කටුමැටි ගහපු බිත්ති එහි තිබුණේ. මට ඒක තවමත් චිත්‍රයක් වාගේ මතකයි. හැබැයි, අද පෙර පාසල කියන එක අපි හැමෝටම අමතක වෙලා තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමියනි, ඔබතුමියලා පෙර පාසල් පාලිකාවන්ට රුපියල් 2,500ක් ලබා දෙනවා කිව්වා. හැබැයි, ඒ රුපියල් 2,500 ප්‍රමාණවත්ද? සමහර පෙර පාසල් තිබෙනවා, ඒ ප්‍රදේශයේ පෙර පාසලට යන දරුවන්ගේ දෙමව්පියන්ගෙන් කීයක් හරි එකතු කරලා තමයි ඒ පෙර පාසලේ පාලිකාවට දෙන්නේ. මම යෝජනා කරනවා, පෙර පාසල් පාලිකාවට අවම වශයෙන් රුපියල් 6,000ක්වත් ලබා දෙන්න කියලා. කම්කරු අමාත්‍යාංශයෙන් දැන් අවම වැටුපක් නිශ්චය කරලා තිබෙනවා. අඩුම ගණනේ කම්කරු අමාත්‍යාංශයෙන් නියම කරලා තිබෙන ඒ නිශ්චිත වැටුප එම පෙර පාසල් පාලිකාවන්ට ලබා දෙන්න. නමුත් ඒ පාලිකාවට ඔබතුමියලා ලබා දෙන්නේ රුපියල් 2,500යි. ඒක ලබා දෙන දිනයක් නැහැ. අපේ ගුරු ක්ෂේත්‍රය ගත්තොත් හැම මාසයකම 20වැනි දා වෙන කොට ඒ අයට වැටුප් ලැබෙනවා. පෙර පාසල් පාලිකාවන්ට නිශ්චිත දිනයක් නැහැ, කවදාද ඒ වැටුප ලැබෙන්නේ කියලා. ඔවුන්ටත් නිශ්චිත දිනයක ඒ මුදල ලබා දෙන්න. ඒ වාගේම එම පාලිකාවන්ට විශ්‍රාම වැටුපක් ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පෙර පාසල් නඩත්තු කිරීම සඳහා 2025 වර්ෂයට රුපියල් මිලියන 80ක් වෙන් කළා. ඒ මිලියන 80න් සත පහක්වත් පොළොන්නරුව දිස්ත්‍රික්කයට ආවේ නැහැ. ඇයි උතුරුමැද අමතක වෙලා තිබෙන්නේ? මම නියෝජනය කරන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කය. ඒ මුදලින් පොළොන්නරුව දිස්ත්‍රික්කයට මුදලක් ආවේ නැත්තේ ඇයි කියන එකයි මම අහන්නේ. මෙවර අය වැයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයට සාධාරණයක් ඉෂ්ට කරයි කියලා මම විශ්වාස කරනවා.

පෙර පාසල් දරුවෝ 8,660ක් ඉන්නවා. ඒ අයට ආහාර වේලක් ලබා දෙනවා. එය දරුවන් 3,112දෙනෙකුටයි ලැබෙන්නේ. ඉතිරි දරුවන් 5,548කට ඒ ආහාරවේල ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම උතුරුමැද පළාත ගත්තොත්, කෘෂභාවයෙන් පෙළෙන දරුවන් වැඩිම ප්‍රමාණයක් වාර්තා වෙන්නේ මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන්. ඒ වාගේම මන්දපෝෂණයෙන් පෙළෙන වැඩිම දරුවන් ප්‍රමාණය වාර්තා වෙන්නේ පොළොන්නරුවෙන්. මේක කියන්නත් ලජ්ජයි. මේ රටට බත සපයන අපේ ගොවියන්ගේ දරුවන්ට මන්දපෝෂණය කියලා අපට කියන්න පුළුවන්ද? මම දන්නවා, විශේෂයෙන්ම ඔබතුමන්ලා දරුවන්ගේ දිවා ආහාරය සඳහා යම් මුදලක් වෙන් කර තිබෙන බව. එදා මේ සඳහා වෙන් කළේ රුපියල් 60ක් වාගේ පොඩි මුදලක්. ඔබතුමන්ලා ඒක රුපියල් 110 දක්වා වැඩි කිරීම බොහොම හොඳ දෙයක්. මොකද, රුපියල් 60කින් අඩුම ගණනේ දරුවෙකුට බිත්තරයක්වත් කන්න දෙන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. හැබැයි, දැන් ඒක රුපියල් 110ක් කරලා තිබෙනවා. ඒක හොඳයි. ඒ වාගේම පෙර පාසල් සියල්ලම හඳුනාගෙන, පෙර පාසල් දරුවන්ට උදෑසන ආහාර වේල ලබා දුන්නොත් හොඳයි කියන යෝජනාවත් මම මේ අවස්ථාවේදී කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මතකයි, එදා ජනාධිපතිවරණය කාලයේ වත්මන් ජනාධිපතිතුමා හැම රූපවාහිනී නාළිකාවකම බොහොම සංවේදී advertisement එකක් ප්‍රචාරය කළා. එම advertisement එකෙන් කියවුණේ, "අපි වාගේ මිනිසුන්ට අධ්‍යාපනය කියන්නේ අත්තටු. අත්තටු තිබෙනවා නම් ඕනෑම තැනකට පියාඹන්න පුළුවන් පුතේ" කියන එකයි. වත්මන් ජනාධිපතිතුමාට ඡන්දය දෙන්න කියලා එදා ඒ විධියේ බොහොම

සංවේදී advertisement එකක් රූපවාහිනියේ ප්‍රචාරය වුණා. ඒ advertisement එක ප්‍රචාරය වුණාම ඇත්තටම ඇස්වලට කඳුළු ආවා. අපේ නායකතුමාට බැරි වුණා නේ, මේ වාගේ advertisement එකක් හදන්න කියලා අපට හිතුණා. ඒ advertisement එක බලලා, රටේ දෙමව්පියන් පෙළගැහිලා අනුර කුමාර දිසානායක මැතිතුමා මේ රටේ ජනාධිපති බවට පත් කළා.

ඒ වාගේම එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් වුණා, පාසල් යන දරුවන්ගේ පාසල් උපකරණවලට සහ පොත් පත්වලට අදාළ VAT එක සියයට බින්දුවට ගේනවා කියලා. මේ advertisement එකේදි පාසල් යන දරුවා කිව්වා, "මට ඉස්කෝලේ යන්න විධියක් නැහැ" කියලා. ගුරුවරයෙක් ඇහුවාම තමයි ඒක ඒ දරුවා කියන්නේ. එතකොට ගුරුවරයා කියනවා, "අත්තටු තිබෙනවා නම් ඕනෑ තැනකට පියාඹන්න පුළුවන් පුතේ" කියලා. ඒ advertisement එක බලලා ඡන්දය දුන් මිනිසුන්ට අද මොකක්ද වෙලා තිබෙන්නේ? එදා ඇඬුවාටත් වඩා අද අඬන්න ඔවුන්ට සිදුවෙලා තිබෙනවා. ගරු අගමැතිතුමියනි, එම නිසා දරුවන්ගේ පාසල් උපකරණ සඳහා අය කරන සියයට 18 VAT එක අයින් කරන්න. ඔබතුමියත් එදා මේ පැත්තේ ඉඳලා ඒ ගැන කියලා කෑ ගැහුවා. ඔබතුමියට ඒ දේ නිවැරදි කිරීමේ අවස්ථාව දැන් ලැබී තිබෙනවා. එම නිසා මේ සියයට 18 VAT එක අයින් කරන්න කියන යෝජනාව කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.44]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, ஏழு நிமிடத்திற்குள் பேசவேண்டியிருக்கின்றது. எனவே, நேரடியாக இன்றைய விடயம் பற்றிய விவாதத்திற்கு வருகின்றேன். அந்த வகையில், நெல்சன் மண்டேலா அவர்கள் குறிப்பிட்ட ஒரு வாசகத்தைக் குறிப்பிட்டு எனது பேச்சை ஆரம்பிக்கலாமென்று நினைக்கின்றேன்: "Education is the most powerful weapon which you can use to change the world. Therefore, we have to use the weapon of education to change our society". அதாவது, கல்வி வலிமையான ஓர் ஆயுதம்; அந்த ஆயுதத்தைப் பயன்படுத்திச் சமூகத்தை மாற்றியமைக்கவேண்டும் என்று அவர் சொல்லியிருக்கின்றார். எனவே, அந்த வலிமையான ஆயுதத்தைப் பயன்படுத்தி நாமும் எமது சமூகத்தை மாற்றியமைக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

முதலில் முன்பள்ளிகள் பற்றிய விடயத்தைச் சொல்ல வேண்டும். முன்பள்ளி என்பது மாணவர்களுக்கு அத்திவாரக் கல்வியைக் கொடுக்கின்ற ஒரு பாடசாலை. அது மாத்திரமல்லாமல், உளவியலோடு கூடிய ஆரம்பக் கல்வியைக் கொடுத்து, மாணவர்களைக் கற்றலுக்குத் தயார்படுத்துகின்ற பாடசாலைகளாக அவை இருக்கின்றன. எனவே, நாம் முன்பள்ளிகளை நன்கு வலுவூட்டவேண்டிய தேவையிருக்கின்றது. முன்பள்ளிகளில் கற்பிக்கின்ற ஆசிரியர்களைப் பொறுத்தமட்டில், அவர்கள் மிகக் குறைவான சம்பளத்தைப் பெற்றுக் கொண்டிருக்கின்றார்கள். அவர்களுக்கு ஒழுங்கான சம்பளமில்லை; இன்னமும் 4,000 - 5,000 - 7,000 ரூபாய் வரையான வேதனத்துடன்தான் பணியாற்றிக் கொண்டிருக்கிறார்கள். அந்த கற்பித்தல் தொடர்பான அணுகுமுறைகள்கூட ஒழுங்குபடுத்தப்படாததாக இருக்கின்றது. அபிவிருத்தி அடைந்த நாடுகளில் முன்பள்ளி அமைப்புகள் வலிமையாகக் காணப்படுகின்றது. ஆகவே, உண்மையில் அதனை நாம் ஒழுங்குபடுத்த வேண்டும். எமது நாட்டிலும் கல்வி அமைச்சு முன்பள்ளிகளைப் பொறுப்பேற்று, அவற்றை வலுவூட்டுவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று மிகவும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், நான் குறிப்பிட்டவாறு அது ஓர் அத்திவாரக் கல்வியாக அமைகின்றது. ஆகவே, கல்வி அமைச்சர் அவர்கள் புதிய கல்விச் சீர்திருத்தத்தில் முன்பள்ளிகளுக்கு முக்கியத்துவம் கொடுப்பாரென்று நான் எதிர்பார்க்கின்றேன்.

அடுத்து, பாடசாலைகளில் தொழிற் கல்வி என்பது மிக முக்கியமானது. பாடசாலைகளில் 12 - 13 ஆண்டுகள் கல்வி கற்று வெளியேறுகின்ற மாணவர்கள் வெறுமனே காகிதச் சான்றிதழ்களோடு வெளியேறுகின்ற தன்மை இருக்கக் கூடாது. அவர்கள் பாடசாலையைவிட்டு வெளியேறினால், ஒரு தொழிலைச் செய்யக்கூடிய தகைமையைப் பெற்றிருக்க வேண்டும்; அதற்கான திறன்களைப் பெற்றிருக்க வேண்டும். ஆகவே, தொழிற் கல்வி என்பது மூன்றாம் நிலைக் கல்வியாக மட்டுமல்லாமல், பாடசாலைகளில் tailoring, மணிக்கூடு திருத்துதல், கைத்தொலைபேசி திருத்துதல் போன்ற பல்வேறு பயிற்சிகளையும் வழங்கும் வகையில் அமையும்போது, அவர்கள் பாடசாலையிலிருந்து விலகிய பின்னர் தொழில் தேடி அங்குமிங்கும் அலைய வேண்டியதில்லை; வீட்டிலிருந்துகொண்டே சுய தொழில்களை மேற்கொள்ளக் கூடிய வாய்ப்புகள் இருக்கும் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அடுத்து, இன்றைய காலத்தில் மிக முக்கியமானதாக இருப்பது விஞ்ஞானக் கல்வி மற்றும் ICT தொடர்பான கல்விகள். ஆனால், கஷ்டப் பிரதேசங்களில் - கிராமியப் பிரதேசங்களில் - விஞ்ஞானம், கணிதம், தகவல் தொடர்பாடல் போன்றவற்றில் கல்வி அளிக்கின்ற ஆசிரியர்கள் பற்றாக்குறையாக இருக்கின்றனர். எனவே, இந்த விடயத்தில் கல்வி அமைச்சு கூடுதலான கவனம் செலுத்த வேண்டும். நகரங்களில் காணப்படுகின்ற தேசிய பாடசாலைகளோடு கஷ்டப் பிரதேசப் பாடசாலைகளை ஒப்பிடுகின்றபோது, மலையும் மடுவும் போன்ற வேறுபாடு காணப்படுகின்றது; கல்வியில் சமத்துவம் இல்லாத நிலை காணப்படுகின்றது. தேசியப் பாடசாலைகளில் வளங்கள் அதிகமாகக் காணப்படுகின்றன; கஷ்டப் பிரதேசப் பாடசாலைகளில் மிக மோசமான வளத் தட்டுப்பாடு காணப்படுகின்றது. எனவே, கல்வியில் சமத்துவம் அடைய வேண்டுமாக இருந்தால் கஷ்டப் பிரதேசப் பாடசாலைகள் போஷிக்கப்பட வேண்டும்; அவற்றுக்குரிய வளங்கள் வழங்கப்பட வேண்டும் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

நான் இங்கு குறிப்பிட்டவாறு தேசியப் பாடசாலைகளுக்கு வளங்கள் அதிகமாக இருக்கின்றன. மாகாணங்களுக்குக் கல்விக்காக ஒதுக்குகின்ற நிதி குறைவாக இருப்பதனால் மாகாணப் பாடசாலைகளில் வளப் பற்றாக்குறை காணப்படுகின்றது. எனவே, மாகாணப் பாடசாலைகள் தேசியப் பாடசாலையாக இணைய வேண்டும் என்பதில் ஆர்வம் காட்டி வருகின்றன. இந்த அரசாங்கம் மாகாணப் பாடசாலை, தேசியப் பாடசாலை என்ற பேதமில்லாமல் சகல பாடசாலைகளையும் சமமாகப் போஷிக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். உதாரணமாக மட்டக்களப்பை எடுத்துக்கொண்டால், பெற்றோர்கள் புனித மிக்கேல் கல்லூரியில் பிள்ளையைச் சேர்க்க வேண்டும், வின்சன்ட்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

மகளிர் உயர்தரப் பாடசாலையில் பிள்ளையைச் சேர்க்க வேண்டும் என்று நேர்த்திக்கடனோடு செயற்பட்டுக் கொண்டிருப்பதைக் காண முடிகின்றது. பன்சேனை, பாவற்கொடிச்சேனை, தாந்தாமலை, புல்லுமலை போன்ற இடங்களில் உள்ள பாடசாலைகள் வளப் பற்றாக்குறையால் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. எனவே, இந்தப் பாடசாலைகளை வலுவூட்ட வேண்டும்; எந்தப் பாடசாலையில் கற்றாலும் பிள்ளை கல்வியில் முன்னேறும் என்ற நிலையை ஏற்படுத்த வேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, மஞ்சந்தொடுவாயில் காணப்படுகின்ற தொழில்நுட்பக் கல்லூரியைப் பற்றி சொல்ல வேண்டும். மட்டக்களப்பு விவசாயத்திற்குப் பெயர்போன இடம். அங்கு கரடியனாறு விவசாயப் பண்ணை, சத்துருக்கொண்டான் விவசாயப் பயிற்சி நிலையம் ஆகியவை காணப்படுகின்றன. இந்தத் தொழில்நுட்பக் கல்லூரியில் பலவிதமான கற்கைநெறிகள் நடைபெறுகின்றன. குறிப்பாக, விவசாயக் கற்கைநெறியை எடுத்துக்கொண்டால், அங்கு NVQ 4 வரைக்கும்தான் இருக்கின்றது. NVQ 5, NVQ 6 போன்ற 'டிப்ளோமா' சான்றிதழுக்கான கற்கைநெறி, பட்டதாரிச் சான்றிதழுக்கான கற்கைநெறி என்பன அங்கு இல்லை. எனவே, நீங்கள் அந்தக் கல்லூரியை வலுப்படுத்த வேண்டும். தொழில்நுட்பக் கல்லூரி, பயிற்சித் திணைக்களப் பணிப்பாளர் நாயகம் எஸ்.சி. ஜகத் அவர்கள் NVQ 5, NVQ 6 மட்டக் கல்விநெறிகளை அங்கு வழங்க வேண்டுமென்பதில் அக்கறையாக இருக்கின்றார். எனவே, இதனைச் செய்வதற்கு வளங்களையும் காணிகளையும் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுக்க வேண்டுமென்று நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, தெஹிவளையில் உள்ள மீலாத் பாடசாலை பற்றி சொல்ல வேண்டும். இந்தப் பாடசாலை பிலியந்தலை கல்வி வலயத்திலுள்ள ஒரேயொரு தமிழ் மொழிமூலப் பாடசாலையாகக் காணப்படுகின்றது. 1952இல் ஆரம்பிக்கப்பட்ட இந்தப் பாடசாலை 73 வருடங்கள் பழைமை வாய்ந்தது. ஒரு 1C தரப் பாடசாலையான அங்கு தரம் 1 தொடக்கம் 13 வரையான வகுப்புகள் காணப்படுகின்றன. அந்தப் பாடசாலை 23 பேர்ச்சஸ் நிலத்தில்தான் இயங்கி வருகின்றது. ஒரேயொரு கட்டிடம்தான் காணப்படுகின்றது. அதுவும் தனியார் ஒருவர் அமைத்துக் கொடுத்தாகக் குறிப்பிடப்படுகின்றது. அந்தப் பிரதேசத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினராக இருக்கின்ற கௌரவ சமன்மலீ குணசிங்ஹ அவர்கள் இந்தப் பாடசாலையை முன்னேற்றுவதற்கு நடவடிக்கை எடுப்பாரென அங்குள்ள மக்கள் எதிர்பார்க்கின்றார்கள். அதேபோன்று, பிரதி அமைச்சராக இருக்கின்ற கௌரவ முனீர் முலாபர் அவர்களும் இந்தப் பாடசாலையை முன்னேற்றுவதில் கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். 120 மாணவர்கள் கற்பதற்கு வகுப்பறை வசதி இல்லாமல் திண்டாடுகின்றார்கள். ஆகவே, இந்தப் பாடசாலைமீது கரிசனை காட்ட வேண்டுமென்ற அந்த மக்களின் கோரிக்கையை உங்கள்முன் சமர்ப்பிக்க விரும்புகின்றேன்.

இன்னொரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, முறக்கொட்டாஞ்சேனையில் உள்ள ஒரு பாடசாலை 1990ஆம் ஆண்டிலிருந்து இராணுவ முகாமாக இருந்து தற்போது விடுவிக்கப்பட்டிருக்கின்றது. அந்தப் பாடசாலைக் கட்டடம் இருக்கின்றது. ஆகவே, அந்தப் primary schoolஐக் கட்டமைக்க வேண்டியிருக்கின்றது. அத்துடன், அதன் அருகாமையில் இருந்த 56 வீடுகள் இழக்கப்பட்டிருக்கின்றது. உண்மையில் அந்த வீடுகள் அந்தப் பாடசாலை மாணவர்களின் பெற்றோரது வீடுகளாக இருக்கின்றன. எனவே, அந்த 56 வீடுகளையும் புனரமைத்துக் கொடுக்க வேண்டியிருக்கிறது. இந்த விடயம் வீடமைப்போடு சம்பந்தப்பட்டதாக இருந்தாலும்கூட, பாடசாலை மாணவர்களோடும் சம்பந்தப்பட்டபடியால் அந்தப் பிரதேசப் பெற்றோர்கள் கல்வியமைச்சரிடம் இந்தக் கோரிக்கையை முன்வைக்குமாறு கேட்டிருக்கின்றார்கள். எனவே, அந்த விடயத்திலும் கவனம் செலுத்துமாறு கௌரவ அமைச்சர் அவர்களை மிகவும் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன். உண்மையில் தகுதியுள்ள ஒருவர் கல்வி அமைச்சராக இருக்கின்றார். கலாநிதிப் பட்டம் பெற்ற அவர் கல்வித்துறை பற்றி நன்றாக அறிந்த ஒருவராகவும் இருக்கின்றார்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Madam, please give me one more minute.

இந்த விடயங்களைக் கல்வியமைச்சரின் கவனத்துக்குத் தந்திருக்கின்றேன். கடந்த காலத்தில் 30 வருடங்கள் நானும் இந்தக் கல்வித் துறையில் ஆசிரியராக, விரிவுரையாளராக, பணிப்பாளராகப் பணியாற்றியிருக்கின்றேன். அந்த வகையில், தயவுசெய்து இந்தக் கஷ்டப் பிரதேசக் கல்வியை வளர்த்தெடுப்பதற்கு உரிய நடவடிக்கையை எடுத்து, கல்வியில் மறுமலர்ச்சியை - கல்விப் புரட்சியை - ஏற்படுத்துமாறு கல்வியமைச்சர் அவர்களை மிகவும் அன்பாகக் கேட்டு, எனது உரையை நிறைவு செய்கிறேன். நன்றி!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.52]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය තමයි පැවැත්වෙන්නේ. මම මුලින්ම මට කලින් කථා කරපු මන්ත්‍රීතුමාට උත්තරයක් දෙන්න කැමැතියි. එතුමා දෙහිවල ප්‍රදේශයේ මුස්ලිම් පාසලක් ගැන කිව්වා. දෙහිවල ප්‍රදේශයේ තිබෙන ඒ මුස්ලිම් පාසලට මෙපමණ කාලයක් මන්ත්‍රීවරයෙක් මුදලක් වෙන් කරලා තිබෙනවා නම්, එලෙස මුදල් වෙන් කරලා තිබෙන්නේ 2025 වර්ෂයේ මගේ විමධ්‍යගත අරමුදල්වලින් තමයි කියන එක මම සතුටින් කියනවා. ඒ වාගේම මම කියන්න කැමතියි, මේ පාසල තවදුරටත් ඉතා හොඳ මුස්ලිම් පාසලක් විධියට සංවර්ධනය කරන්නත් අපි බලාපොරොත්තු වෙන බව. එමෙන්ම මේ පාසලේ දැනට සිටින දරුවන්ගේ ධාරිතාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

ත්‍රෛභාෂා පාසල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් විධියට දෙහිවල, ජයසිංහ මධ්‍ය මහා විද්‍යාලයට ඒ අමතර දරුවන් ටික තාවකාලිකව හෝ අනුයුක්ත කරලා ඒ වෙනුවෙන් අපි තාවකාලික විසඳුමකුත් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අපි ඒ සඳහා ස්ථිර විසඳුමකුත් ලබා දෙනවා. අනිවාර්යයෙන්ම අපි මේ පාසල සංවර්ධනය කරනවා. ඒ කාරණය ගැන මතු කළාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මම කථා කරන්න බලාපොරොත්තුවෙන් සිටි මාතෘකාවට දැන් මම එන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අධ්‍යාපනය කියන්නේ, දරුවන්ට අත්තටු ලැබෙනවා වාගේ දෙයක්. ඒ අත්තටු දරුවන්ට දෙන්නේ කොහොමද කියන එක පිළිබඳවත් මේ අලුත් රජයට වැඩ පිළිවෙළක් තිබෙනවා. කඩාගෙන වැටෙන අත්තටු දීලා වැඩක් නැහැ නේද? ඒ නිසා ශක්තිමත් අත්තටු තමයි දරුවන්ට දෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි.

අපේ කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා පෙර පාසල් ගැන මතු කරපු නිසා මම පෙර පාසල් කියන විෂයයෙන්ම ඒ ගැන කියන්න පටන් ගන්නම්. මරියා මොන්ටසෝරි මැතිනිය කියා තිබෙනවා, "මුල් ළමාවිය අධ්‍යාපනයේ අරමුණ විය යුත්තේ දරුවාගේ ඉගෙනීමට ඇති ස්වභාවික ආශාව සක්‍රිය කිරීමයි" කියලා. ස්වාභාවික කැමැත්ත සක්‍රිය කරන්න ඕනෑ. ඒ සඳහා අපට වැඩ පිළිවෙළවල් ගණනාවක් ක්‍රියාත්මක කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ගැන ඔබතුමාට, මහජනතාවට වාගේම මේ සභාවටත් දැනගන්න මම කියන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් ගොඩනඟන්න නම් අපි ගුණාත්මක අධ්‍යාපනයක් ඇති කරන්න ඕනෑ. ඒ ගුණාත්මක අධ්‍යාපනය ඇති කරන්න නම් ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් අපි පටන් ගන්න ඕනෑ. සමහර අයට කොපි කරන්න පුළුවන් වුණාට සම කරන්න බැහැ නේද? කොපි කරන්න පුළුවන් වුණාට සම කරන්න බැහැ. එහෙම සම කරන්න බැරි ඇයි? අපි ඒක පටන් ගත යුත්තේම අධ්‍යාපනයෙන්. අපි ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් ගෙනෙන්න ඕනෑ. එහෙම වුණොත් විතරයි අපි බලාපොරොත්තු වන සමබර පුරවැසියෙක් ගොඩනඟන්න පුළුවන් වෙන්නේ. ඒ සමබර පුරවැසියා ගොඩනඟන්න අපි උත්සාහ කරන්නේම පෙර පාසල් අධ්‍යාපනය තුළින්ම තමයි. මොකද, ඔබ කවුරුත් පරිශීලනය කරන මේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව බොහොම ලස්සනට සඳහන් කරලා තිබෙනවා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර තිබෙනවා, අවුරුදු 3 සිට 5 දක්වා වන සියලු දරුවන් සඳහා විධිමත් මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයක් අපි ලබා දෙනවාය කියලා. දැන් කවුරුත් වාගේ කියනවා නේ, අපි මොනවාද කරපු වැඩ, මේ අවුරුද්දේ අපි වැඩ කරලා නැහැ කියලා. අපි ඔබතුමන්ලාට ඒ ගැන කියන්නම්.

මා ළඟ මේ තිබෙන්නේ, මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ජාතික විෂයමාලා රාමුව. අපි මේ ගැන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙනුත් කිව්වා. අපි 2025.11.21වැනි දින මේ මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ජාතික විෂයමාලා රාමුව මේ රටට හඳුන්වා දුන්නා. දැන් මුළු රටටම තිබෙනවා, මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ ජාතික විෂයමාලා රාමුවක්. ඒ වාගේම අපි ඉතා කෙටි කාලයකදී පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවකුත් හඳුන්වා දෙන්න නියමිතයි. එය, මේ වනවිට අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. එතකොට ඒකත් හරි. ඒ අනුව දැන් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කියපු දෙකක් හරි. ඉතුරු ටිකත් මම කියන්නම්කෝ.

ඊළඟ කාරණය තමයි, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම සඳහා ජාතික මුල් ළමාවිය සංවර්ධන නියාමන ආයතනයක් සකස් කිරීම. මුල් ළමාවිය කියන විෂයය 2024 නොවැම්බර් මාසයේ තමයි අධ්‍යාපන අමාත්‍යාංශයට එකතු වෙන්නේ. ඒක ජාතික කර්තව්‍යයක් විධියට අරගෙන මෙතෙක් කල් අධ්‍යාපන අමාත්‍යාංශය මේකට විෂය නිර්දේශයක් හදලා දුන්නා. ඉතිහාසයේ කිසිම දවසක මෙවැනි විෂය මාලාවක් තිබුණේ නැහැ. මෙන්න මේක තමයි, අපි ඇති කරන ගුණාත්මක වෙනස.

ඒ වාගේම ජාතික මුල් ළමාවිය සංවර්ධන ඒකකයක් පිහිටුවන්න ඕනෑ. ඒ පිළිබඳව දැනට අපි කථා බහ කරගෙන යනවා. මීට සම්බන්ධ ආයතන කීපයක් තිබෙනවා. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, පළාත් පාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය වාගේම අපි මේ කථා කරන අධ්‍යාපන අමාත්‍යාංශය කියන මේ සියල්ල එකතු කරගෙන අප ජාතික මුල් ළමාවිය සංවර්ධන ඒකකයක් අනිවාර්යයෙන්ම හදනවා. ඔන්න, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් තව යෝජනාවක් අපි ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. මේ කටයුත්ත දැන් අවසන් මට්ටමේ තිබෙන්නේ.

ඊළඟට, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලක පාලිකාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම් නිර්දේශ කරලා, ඔවුන්ව සවිබලගන්වලා, ඔවුන්ට නියමිත පුහුණුවක් හා වැටුපක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. පෙර පාසල් ගුරුවරුන්ට මේ අවුරුද්දේ මොනවාද කළේ කියලා කට්ටිය අහනවා නේ. මම හිතන විධියට, පළාත් මට්ටමින් හා අධ්‍යාපන අමාත්‍යාංශය මට්ටමින් අතිවිශාල මුදලක් ඒ අය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. පසුගිය අවුරුද්දේ පෙර පාසල් ගුරුවරුන්ට ලබා දුන් දීමනාව රුපියල් 1,000කින් වැඩි කරලා, රුපියල් 6,000ක් මේ වනකොට අපි ඔවුන්ට ලබා දෙනවා. ඒ වාගේම අපි පෙර පාසල් දරුවන්ට උදෑසන ආහාර වේල සඳහා දිනකට රුපියල් 60ක මුදලක් වෙන් කළා. අපි 2025 අවුරුද්දට පා තැබුවේම ඔවුන්ට අවශ්‍ය කරන විෂය නිර්දේශයක් හඳුන්වා දෙමින්. ඒ වාගේම 2025.11.25වැනි දින සිට අපි දින හතරක TOT වැඩසටහනක් පටන් ගත්තා, මේ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා. මම හිතන විධියට, මේක තමයි කරන්න අවශ්‍ය. ඒක රුපියල් 1,000කට, රුපියල් 2,000කට සීමා කරන්න බැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ගුරුවරුන්ට මේ විෂය නිර්දේශය පුහුණුව සඳහා ඊට වඩා විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම මම තවත් කාරණයක් කියන්න ඕනෑ. දැනට ලියාපදිංචි පෙර පාසල් 16,550ක් විතර තිබෙනවා. ඒ වාගේම දරුවන් 43,000කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඔබතුමන්ලා වැය ශීර්ෂ හොඳට කියවන්න. වතු පෙර පාසල් සංවර්ධනය කිරීම සඳහා අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, පළාත් මට්ටමින් පෙර පාසල් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. බස්නාහිර පළාත් සභාව රුපියල් මිලියන 40ක් වෙන් කරලා තිබෙනවා, පෙර පාසල් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා. ඒ වෙනුවෙන් ව්‍යාපෘති හදලා ඒ රුපියල් මිලියන 40ම අපි ඒ සඳහා යොදවා තිබෙනවා. ඒ වාගේම ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පළාත් නවයටම රුපියල් මිලියන 360කට වැඩියෙන් වෙන් කරලා තිබෙනවා.

විෂය භාර ඇමතිතුමිය විධියටත්, අධ්‍යාපන ඇමතිතුමිය විධියටත්, අපේ ගරු අගමැතිතුමියව හමු වෙන්න ඊයේ පෙර පාසල් ගුරු සංගම් කීපයක් ආවා. ඒ ගුරු සංගම්වල ඉල්ලීම වුණේ විශ්‍රාම වැටුපක් ලබා දෙන්න, ණය ක්‍රමයක් හඳුන්වා දෙන්න වාගේම ඔවුන්ට ගුරුවරු විධියට වෘත්තීය සහතිකයක් ලබා

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

දෙන්න කියන එකයි. අපි මේ සියල්ලම පිළිබඳව කථා බහ කරමින් දැන් විවිධ මට්ටම්වලින් සාකච්ඡා පවත්වමින් යනවා. ඒ වාගේම මුදල් අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා මේ සඳහා තීරණයක් ගන්න අගමැතිතුමිය පොරොන්දු වෙලා තිබෙනවා.

ඒ වාගේම මම තව කාරණාවක් ඔබතුමන්ලාට කියන්නම්. මේ සභාවේදී කියවුණා, ඉතිහාසය තුළ අධ්‍යාපනයට වැඩිම මුදලක් වෙන් කරපු වර්ෂය 2025 වර්ෂය කියලා. කවුරු කොහොම කිව්වත් 2023දී අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙන්නේ GDP එකෙන් සියයට 1.61යි. හැබැයි, GDP එකෙන් සියයට 2.4ක් වැනි විශාල මුදලක් අධ්‍යාපනයට වෙන් කරන්න අපට මේ වනවිට පුළුවන් වෙලා තිබෙනවා. එම නිසා රුපියල් බිලියන 703කට ආසන්න මුදලක් අධ්‍යාපනයට වෙන් කරන්න අපට පුළුවන් වුණා. එය ඉතිහාසය තුළ අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ වැඩිම මුදල වනවා.

ඊළඟට මම භෞතික සම්පත් පිළිබඳවත් කියන්නම්. මොකද, විවිධ අය අහනවා, පාසල් වහනවාද, විවෘත කරනවාද කියලා. අපි බලාපොරොත්තු වෙන්නේ පාසල්වල භෞතික සම්පත් හා මානව සම්පත් කළමනාකරණය තුළින් හොඳම විධියට අපේ දරුවන්ව පාසල්ගත කරලා, ඔවුන්ගේ අධ්‍යාපනය ප්‍රමිතිගත කරන්නයි. එහෙම කරද්දී අපි බලාපොරොත්තු වෙනවා, කලාප මට්ටමින් ඇති ව්‍යුහ කමිටුව තුළ තිබෙන භෞතික සම්පත් හා මානව සම්පත් කළමනාකරණය කරලා, හොඳම විධියට ඒ යෝජනා අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන්න. ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ විදුලි බලය නැති පාසල්වල භෞතික සම්පත් කළමනාකරණය කිරීම සඳහාත් අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා.

ඒ යටතේ අපි බලාපොරොත්තු වෙනවා, මේ පාසල්වල තිබෙන අඩුපාඩුකම් මේ අවුරුද්ද තුළ හා ලබන අවුරුද්ද තුළ සම්පූර්ණ කරන්න. ඒ වාගේම, පන්ති කාමර smart පන්ති කාමර බවට පත් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. කලින් තිබුණේ වතුර නැති, සනීපාරක්ෂක පහසුකම් නැති පන්ති කාමර. හැබැයි අපි වතුර නැති, විදුලිය නැති පන්ති කාමර smart පන්ති කාමර බවට පත් කරලා පාසල ළමයා කැමැත්තෙන් යන තැනක් බවට පත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, තව පුංචි කාරණාවක් කියන්න මට අවස්ථාව දෙන්න. පසුගිය කාලයේ; 2023, 2024දී, එහෙම නැත්නම් මීට කලින් අපේ අතරමැදි පන්තිවලට, විශේෂයෙන් 2 ශ්‍රේණියේ ඉඳන් 11 ශ්‍රේණිය දක්වා අතරමැදි පන්තිවලට ළමයින් ඇතුළත් කරගත්ත විධිය අපි දැක්කා. අපි දන්නවා, මේ අතරමැදි පන්තිවලට දරුවන් ඇතුළත් කිරීමේදී විවිධ වෘත්තිකයන්ට අවස්ථාවක් ලබා දී තිබෙනවා කියලා. හැබැයි මීට කලින් හරි අපූරු ක්‍රමවේද ටිකක් අනුගමනය කරලා තිබුණා. කැබිනට් මණ්ඩලයේ රහසිගත තීරණයක් අනුව දරුවන් එක එක විධියට මේ පන්තිවලට අරගෙන තිබුණා. ඒ වාගේම තමයි, 2024දී ළමයින් 724ක් එක එක ක්‍රමවලට අරන් තිබෙනවා. මේකෙදි කිසිම පොදු චක්‍රලේඛයක් හෝ විනිවිදභාවයක් තිබුණේ නැහැ. 2024දී දරුවන් 724ක් අරන් තිබෙන්නේ අනීතික ක්‍රමවලට. ඒ වාගේම තමයි, මීට අමතරව තව දරුවන් 1,000කට වැඩිය විවිධ විධියට මේ පාසල්වලට ඇතුළත් කරලා තිබෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි මේ සඳහා අලුත් චක්‍රලේඛයක් හැදුවා. මේවා තමයි විනිවිදභාවයෙන් යුක්ත දේවල්. මෙතැන ඉන්න සමහර දේශපාලනඥයින්ට; "මම තමයි මේකේ ඉන්න හොඳම සුදනා" කියන අයට මට ඇඟිල්ල දිගු කරලා කියන්න පුළුවන්, ඒ අයත් දේශපාලනඥයෝ විධියට 2024දී දරුවන් ඒ විධියට දාලා තිබෙනවා කියලා. හැබැයි මම ඉතාම වගකීමෙන් කියනවා, 2025 වර්ෂයේදී දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට කිසිම දේශපාලනඥයකුගෙන් ඉල්ලීමක් ගිහිල්ලා නැහැ කියලා. ඒක තමයි අපි මේ ක්ෂේත්‍රයේ කරන වෙනස. ඒක තමයි අපි මේ ක්ෂේත්‍රයට හඳුන්වලා දීලා තිබෙන වෙනස. ඒ නිසා අපිට සතුටුයි, මේ අලුත් චක්‍රලේඛය හරහා අපේ සියලු දරුවන්ට හා සියලු වෘත්තිකයන්ට සාධාරණයක් වෙන විධියේ අලුත් චක්‍රලේඛයක් හඳුන්වලා දෙන්න අපිට පුළුවන් වුණා. අනිවාර්යයෙන්ම අපි මේ අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරන වෙලාවේ වැරදි කරුණු වෙනුවට ඇත්ත කරුණුයි කියන්නේ. මේක තමයි අපේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන ඇත්ත වෙනස.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

Order, please! ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාට මූලසුන භාර කරනවා.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[பி.ப. 2.05]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பாராளுமன்ற உறுப்பினர் கௌரவ சமன்மலீ குணசிங்ஹ அவர்களது உரையைத் தொடர்ந்து எனக்குப் பேசச் சந்தர்ப்பம் கிடைத்திருக்கிறது. அந்த வகையில், அவரிடம் ஒரு விஷயத்தைப் பேச விரும்புகின்றேன். தெஹிவளை மீலாத் பாடசாலை சம்பந்தமாக அவர் சில முயற்சிகளை எடுத்திருக்கிறார்; அவரது DCBஇன் ஊடாக அதற்குப் பணம் ஒதுக்கியதாக இங்கு சுட்டிக் காட்டினார். அதற்காக அவருக்கு நான் நன்றி கூறுகின்றேன். பாராளுமன்ற உறுப்பினர் கௌரவ சமன்மலீ குணசிங்ஹ அவர்களே, 73 வருடங்கள் பழமைவாய்ந்த அந்தப் பாடசாலை 23 பேர்ச் அளவான நிலத்தில் அமைந்திருப்பது உங்களுக்கு நன்றாகத் தெரியும். அங்கே இருக்கின்ற ஒரு பெரிய கட்டடம் அரசாங்கத்தினால் கட்டிக்கொடுக்கப்பட்டதல்ல, தனிநபர் ஒருவரால் - ஒரு வியாபாரியினால் - கட்டிக் கொடுக்கப்பட்டது. தற்பொழுது சுமார் 500 மாணவர்கள் அங்கு கல்வி கற்கின்றார்கள். அவர்களில் 120 பேர் இடமில்லாத நிலையில் வெளியிலே நிலத்திலும், மழை வந்தால் car parkஇலும் தமது கற்றல் செயற்பாட்டில் ஈடுபடுகின்றார்கள். நமக்கும் பிள்ளைகள் இருக்கிறார்கள். அங்கு படிக்கின்ற மாணவர்களில் அதிகமானவர்கள் ஏழைகள். அந்தப் பாடசாலைக்கு மேலும் 240 பேர் application போட்டுவிட்டு அனுமதிக்காகக் காத்துக்

கொண்டிருக்கிறார்கள். எனக்குத் தெரிந்த ஒருவர் தன்னுடைய இரண்டு பிள்ளைகளை அந்தப் பாடசாலையிலே சேர்ப்பதற்கு முடியாமல் அந்தரப்பட்டபொழுது, அந்த அதிபர் என்னுடைய மாவட்டத்தைச் சேர்ந்தவர் என்பதனால் அவரோடு இதுபற்றி பேசுமாறு என்னிடம் கேட்டிருந்ததன் அடிப்படையில்தான் எனக்குக்கூட இந்தப் பாடசாலையுடன் ஒரு தொடர்பு ஏற்பட்டது. அந்த அதிபரிடம் அதுபற்றி நான் கேட்டபோது, "என்னால் சேர்க்க முடியாது, இடமில்லை" என்று அவர் சொன்னார்.

அதன்பிறகு, இந்தப் பாடசாலையின் வரலாற்றை நான் தேடிப்பார்த்தபொழுது, அங்கிருக்கின்ற நிலைமையைக் கருத்திற்கொண்டு, நீங்கள் ஆட்சிக்கு வருவதற்கு முன்னர், அங்கு பயன்பாடின்றி இருந்த சுமங்கல என்ற பாடசாலையைத் திருத்திவிட்டுப் பயன்படுத்துமாறு வலயக் கல்விப் பணிமனையால் கொடுக்கப்பட்டிருக்கின்றது. ஊரிலே உள்ளவர்கள் மற்றும் பெற்றோர் சேர்ந்து 30 இலட்சம் ரூபாய் செலவிலே அதை repair பண்ணி அங்கே நுழைய முற்படுகின்றபோது, தெஹிவளைப் பகுதியில் இருக்கின்ற, இந்த நாட்டிலே பெரிய குழப்பங்களை உருவாக்குவதிலும் இனங்களுக்கிடையே முறுகல் நிலையை உருவாக்குவதிலும் மிக முக்கியமானவராக இருந்த மதகுரு ஒருவரின் தலைமையில் அங்கு சென்ற சிலர் அந்தப் பாடசாலைக்குள் யாரும் போக முடியாதவாறு தடுத்திருக்கின்றார்கள். அவர் உங்களுடைய கட்சியைச் சார்ந்தவர் அல்ல. அதன்பிறகு, உங்களுடைய தலைமையிலே, அங்கிருக்கின்ற பிலியந்தலை வலயக் கல்விப் பணிப்பாளர், அதிகாரிகள் எல்லோருமாக அங்குள்ள 6 இடங்களை அந்தப் பாடசாலை அபிவிருத்திச் சங்கத்திற்குக் காட்டியிருப்பதாகவும் இறுதியாக அதிலே 4 இடங்கள் அடையாளப்படுத்தப்பட்டிருப்பதாகவும் நான் அறிந்தேன். அந்த 4 இடங்களில் ஓர் இடத்தையாவது வழங்க முடியுமாக இருந்தால், நாங்கள் வியாபாரிகளிடம் பணத்தைச் சேர்த்தாவது அந்த மாணவர்களுடைய கற்றல் செயற்பாட்டுக்குரிய கட்டடங்களைக் கட்டி வழங்க முடியும்.

கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள்தான் இந்த அரசாங்கத்தைப் பிரதிநிதித்துவப்படுத்தி அந்தப் பிரதேசத்தில் இருக்கின்ற ஒருவர். அங்கே அதிகமான தமிழ், முஸ்லிம் மக்கள் வாழுகிறார்கள் என்பது உங்களுக்குத் தெரியும். தமிழ் பேசுகின்ற மாணவர்களுக்காக இருக்கின்ற ஒரேயொரு சிறிய பாடசாலையாக அது அந்தப் பிலியந்தலை வலயத்தில் இருக்கிறது. இந்தப் பாடசாலை இப்போது இயங்கிக்கொண்டிருக்கின்ற நிலப்பரப்பிற்குள் மேலும் கட்டிடங்களைக் கட்ட முடியாது. எனவே, இதை ஒரு primary பாடசாலையாக மாற்றிவிட்டு, 6ஆம் தரத்திற்கு மேற்பட்ட மாணவர்களுக்காக நீங்கள் additionalஆக ஓர் இடத்தை வழங்கினால் நல்லது. இது சம்பந்தமாக கடந்த 19ஆம் திகதி நடைபெற்ற கூட்டத்திற்கு Governor ஹனீப் யூசுப், பிரதி அமைச்சர் கௌரவ முனீர் முலாபர், Deputy Speaker கௌரவ ரிஸ்வி சாலி போன்றவர்கள் போயிருக்கிறார்கள். ஆனால், போகவேண்டிய நீங்கள் அங்கே போகவில்லை என்பதுதான் கவலை! நீங்களும் போயிருந்தால் அதற்கு ஓர் இறுதி முடிவு எடுக்கப்பட்டிருக்கும்!

සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියනි, ඔබතුමිය එදා -19වැනි දා- ගිහිල්ලා හිටියා නම් ඒ ප්‍රශ්නය විසඳන්න තිබුණා. ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමායි, ගරු නියෝජ්‍ය කථානායකතුමායි, ගරු හනීෆ් ආණ්ඩුකාරතුමායි ගිහිල්ලා meeting එකක් තිබුණාට ඔබතුමිය හිටියේ නැති නිසා කිසිම තීන්දුවක් අරගෙන නැහැ. ඉඩම් 4ක් තෝරලා තිබෙනවා. ඇත්තටම Zonal Director of Education උනන්දුවෙන් කටයුතු කරනවා, මේ ළමයි වෙනුවෙන්. දේශපාලන නායකත්වයක් දරන ඔබතුමිය ඒ ඉඩම් 4න් එකක් තෝරලා දෙන්න. අපි මුදල් එකතු කරලා බිල්ඩිම හදලා දෙන්නම්. ඔබතුමිය කිව්වා ජයසිංහ මධ්‍ය මහා විද්‍යාලයට ගියාම හරියයි කියලා. ළඟදි ඒකට ගිහිල්ලා තිබෙනවා. Parentsලා ගිය වෙලාවේදී "හූ" කියලා එලවලා තිබෙන්නේ, එතැන සමහර අය. ඒ නිසා තව තව ප්‍රශ්න ඇති කරන්නේ නැතුව මේක කරන්න. අතැන ඉඩම් 4ක් තිබෙනවා ලු. ඒකෙන් එකක් තෝරලා දෙන්න කියලා කරුණාවෙන් ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා. අපේ අග්‍රාමාත්‍යතුමියත් මේකට උදවු කරනවා නම් හොඳයි. නැත්නම් අපි හරි මුදල් එකතු කරලා පාසල හදලා දෙන්නම් කියලා කියනවා, ඔබතුමියට. ඔබතුමිය උනන්දුවෙන් කටයුතු කරන කෙනෙක්. ඒ නිසා අපිට මේකට positive reply එකක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, කෙටියෙන් පිළිතුරු දෙන්න.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවේදී ඔබතුමාට කිව්වෙත් ඒකයි. අපි මේකට උත්තරයක් හොයමු. ඔය හැමෝටම වැඩිය වගකීමක් හා වුවමනාවක් මට තිබෙනවා. මොකද, මේ මගේ ප්‍රදේශයේ දරුවෝ. මම ඒ පාසලට හතරපස් පාරක් ගිහිල්ලා තිබෙනවා. මගේ පැත්තෙන් මම විශාල උනන්දුවක් ගන්නවා, මේකට විසඳුමක් හොයන්න. අනිවාර්යයෙන්ම අපි ඒ දරුවන්ට විසඳුමක් දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
எங்களுடைய பிரதமர் கௌரவ ஹரினி அமரசூரிய அவர்கள் கல்வி அமைச்சைப் பொறுப்பெடுத்துத் திறமையாகச் செயற்படுத்திக்கொண்டிருக்கின்றார். தகுதியான ஒருவருக்கு அந்த அமைச்சு கொடுக்கப்பட்டிருக்கிறது. கல்வித் துறையில் reforms, syllabus மாற்றங்கள் கட்டாயம் தேவையான ஒன்று. அதனூடாகத்தான் எமது நாட்டைக் கட்டியெழுப்ப முடியும். ஏனென்றால், எமது நாட்டில் கற்றுப் பட்டதாரிகள் ஆகிய பிறகு, "எங்களுக்குத் தொழில் தாருங்கள்!" என்று அவர்கள் ஆர்ப்பாட்டம் செய்கின்ற ஒரு நிலையைத்தான் இன்று நாங்கள் பார்க்கின்றோம். இந்த நிலை மாறவேண்டுமாக இருந்தால், நீங்கள் கொண்டுவருகின்ற reformsஇன் ஊடாக நிச்சயமாக அவரவர் தம் வாழ்வுக்கான வழியைத் தேடக்கூடியவர்களாக இருக்க வேண்டும். இன்று private sectorஇல் பல தொழில்களுக்கு ஆட்பற்றாக்குறை இருக்கிறது. நான் அமைச்சராக இருந்த காலத்திலே private sectorஇல் 200,000 ரூபாய் சம்பளம் எடுத்த சிலர், அந்தத் தொழிலை விட்டுவிட்டு, 20,000 ரூபாய் graduate சம்பளத்துக்காக அரசாங்க வேலைக்கு வந்ததை நான் கண்டிருக்கிறேன். ஏனென்று அவர்களிடம் கேட்டபோது, "private sectorஇலே pension இல்லை, அரச உத்தியோகம் என்றால் pension இருக்கிறது" என்று சொன்னார்கள். ஆகவே, reformsஇன் ஊடாகத்தான் இந்த நிலையில் மாற்றத்தை எதிர்பார்க்கலாம். எனவே, தயவுசெய்து

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

அந்த விஷயத்திலே கண்ணும் கருத்துமாகச் செயற்பட வேண்டும். Teachers' unionsஉடன் மோதிக்கொள்ளாமல் அவர்களோடும் கலந்துரையாடி, அவர்களுடைய விருப்பு வெறுப்புகளை, ஆலோசனைகளைப் பெற்று நீங்கள் அதை முன்னெடுங்கள் என்று நான் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து, எங்களுடைய குச்சவெளிப் பிரதேச சபை உறுப்பினர் யூசுப், றிசான், பிறிமன் மற்றும் அந்தப் பிரதேசத்தில் உள்ள இன்னோரன்ன பிறர் ஒரு கோரிக்கையை என்னிடம் முன்வைத்திருக்கிறார்கள். அதில் குச்சவெளிப் பிரதேசத்துக்காகத் தனியான கல்வி வலயம் ஒன்று தேவை என்று குறிப்பிட்டிருக்கின்றார்கள். Five hundred and four square kilometres நிலப்பரப்பைக்கொண்ட அந்தப் பிரதேசத்தில் தமிழ், முஸ்லிம், சிங்கள மாணவர்களுக்கான பல பாடசாலைகள் இருக்கின்றது. ஆகவே, அது சம்பந்தமாக நான் எழுத்துமூலமான ஒரு வேண்டுகோளையும் உங்களுக்குத் தருகிறேன். இது தொடர்பாக ஆக்கபூர்வமாக நடவடிக்கை எடுக்குமாறு நான் உங்களிடம் அன்பாக வேண்டுகோள் விடுக்கிறேன்.

அதேபோலதான், Vavuniya Muslim National Schoolக்காக இந்திய அரசாங்கத்தினால் பல வருடங்களுக்கு முன்னர் ஆரம்பிக்கப்பட்ட ஒரு 3 மாடிக் கட்டிடத்துக்கான வேலைகள் இப்போது அரைகுறையாக இருக்கிறது. சுமார் 70 சதவீதமான வேலைகள் முடிந்துவிட்டது; இன்னும் 30 per cent வேலை இருக்கிறது. அது ஒரு தேசியப் பாடசாலை என்பதால் மாகாண சபையால் அதற்கு நிதி ஒதுக்க முடியாத நிலை காணப்படுகின்றது. எனவே, அந்தக் கட்டிட வேலைகளைத் தயவுசெய்து முடித்துக்கொடுக்க வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன். கடந்த உயர்தரப் பரீட்சையில்கூட அந்தப் பாடசாலையிலே இருந்துதான் District first student ஒருவர் Medical Facultyக்கு தெரிவு செய்யப்பட்டிருக்கின்றார். அந்தப் பாடசாலைக்கு இடத் தேவை இருப்பதால், அதைக் கவனத்தில் கொள்ளுமாறு வேண்டுகோள் விடுக்கின்றேன்.

நான் அமைச்சராக இருந்த காலத்தில் 5 வருடங்களுக்கு முன்னர் 6 பாடசாலைகளில் கட்டப்பட்ட கட்டிடங்கள் அரைகுறையாக இருப்பதாக உங்களிடத்திலே பலமுறை சொல்லியிருக்கின்றேன். நீங்களும் அதைக் கவனத்தில் எடுப்பதாக வாக்குறுதி தந்தீர்கள். அந்த அடிப்படையிலே, இந்த வருடம் வட மாகாணத்துக்கு ஒதுக்கப்பட்ட நிதியிலே எஞ்சியிருக்கின்ற 8 கோடி ரூபாயை அந்த ஆறு பாடசாலைகளுடைய கட்டிடங்களின் நிர்மாணப் பணிக்கு ஒதுக்க வேண்டுமென உங்களுடைய அமைச்சின் செயலாளர் Mr. Nalaka Kaluwewe அவர்கள் வேண்டுகோள் விடுத்திருக்கின்றார். ஒரு மாதமாகியும் இன்னும் tender call பண்ணப்படவில்லை. இன்னுமொரு மாதத்தில் அந்தப் பணம் திருப்பி அனுப்பப்பட்டுவிடுமோ என்ற பயம் எனக்கு இருக்கின்றது. எனவே, அந்த விடயத்தில் நீங்களும் உங்களுடைய செயலாளரும் அதிகாரிகளும் கொஞ்சம் கவனம் செலுத்தி, அந்த 8 கோடி ரூபாயைத் தயவுசெய்து அந்த விடயத்துக்குப் பயன்படுத்த வேண்டுமென்பதோடு, அந்தப் பணம் இன்னும் 2 பாடசாலைகளுக்குப் போதாது என்ற காரணத்தால், இந்த வருட நிதி ஒதுக்கீட்டிலே அந்தப் பாடசாலைகளை உள்ளீர்த்து, அந்த 6 பாடசாலைகளின் கட்டுமானப் பணிகளையும் முடித்துத் தருமாறு அன்பாக உங்களிடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

ඇහෙනවාද, සිංහලෙන් කියන්න ඕනෑද?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

கௌரவ அமைச்சர் அவர்களுக்கு எல்லா மொழிகளும் தெரியும்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තූතියි. අපි ඒ කාරණය යොමු කරලායි තිබෙන්නේ. මුදල් වෙන් කරන්න කියලාත් අපි නියෝගයක් එවලා තිබෙනවා. අපි ඒක ලේකම්තුමා හරහා follow up කරන්නම්. කොහොමටත් අවසන් කරපු නැති ව්‍යාපෘති අවසන් කරන්න කියලා තමයි අපි කියලා තිබෙන්නේ.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

Thank you.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்கள் யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்கள் என்பது உங்கள் எல்லோருக்கும் தெரியும். அங்குள்ள பல பாடசாலைகளிலும் பல தேவைகள் இருக்கின்றன. ஆசிரியர் பற்றாக்குறை பெருமளவில் காணப்படுகின்றது. குறிப்பாக, மறிச்சுக்கட்டி அல்-ஜாசிம் முஸ்லிம் வித்தியாலயம், காக்கையன்குளம் முஸ்லிம் மகா வித்தியாலயம் ஆகிய தூர இடங்களிலுள்ள பாடசாலைகளிலே ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றது. இங்கே பல உறுப்பினர்கள் பாடசாலைகளுக்கிடையில் சமநிலை இல்லாதிருப்பது பற்றி சொன்னார்கள். தேசியப் பாடசாலைகளிலே, நகரப் பாடசாலைகளிலே சிறந்த, வளமான ஆசிரியர்கள் இருக்கிறார்கள். தூரப் பிரதேசங்களிலே உள்ள மாணவர்களுக்கு ஆசிரியர்கள் இல்லாத பிரச்சினை இருக்கின்றது. தூர இடங்களில் இருக்கின்ற, நகரத்தில் இருக்கின்ற சில ஆசிரியர்கள் அந்தப் பாடசாலைகளுக்குக் காலையில் வந்து, திரும்பிச் செல்வதற்கு வாகன வசதி இல்லாத நிலை காணப்படுகின்றது. இவ்வாறு பல வகையான பிரச்சினைகள் அங்கிருக்கின்றன. இந்த விடயம் தொடர்பில் SLTBக்குப் பொறுப்பாக இருக்கின்ற கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களும் கல்வி அமைச்சரும் பேசி - இரண்டு அமைச்சுக்களும் இணைந்து - தூரப் பாடசாலைகளுக்குச் செல்கின்ற ஆசிரியர், மாணவர்களுக்குப் போக்குவரத்து வசதியைச் செய்வதற்கு விசேட வேலைத்திட்டமொன்றைச் செய்ய வேண்டிய தேவைப்பாடு இருக்கின்றது. நாங்கள் DCCஇல் இது சம்பந்தமாகப் பேசும்போது, "ஆம்" என்று பதிலளித்து, அதைச் செய்ய முற்பட்டாலும் ஓரிரு நாட்களில் அந்தச் சேவை நிறுத்தப்படுகின்றது. அதனால் மாணவர்கள் பாதிக்கப்படுகிறார்கள்.

Mathematics, IT, English போன்ற பாடங்களுக்கு மாவட்ட ரீதியாக ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றது. நீங்கள் எவ்வளவுதான் நியமனங்களை வழங்கினாலும் அரசியல் செல்வாக்கினாலோ அல்லது வேறு செல்வாக்கினாலோ சிலர் அவ்வாறான பாடசாலைகளுக்குச் செல்வதில்லை. அவ்வாறு சென்றாலும், எப்போது அந்த ஊரைவிட்டு வெளியேறுவது என்ற சிந்தனையுடன்தான் அவர்கள் கற்பித்துக்கொண்டு இருக்கிறார்கள். எனவே, வேறு மாவட்டங்களைச் சேர்ந்தவர்களை அந்த மாவட்டங்களுக்கு அனுப்பாமல், ஒரு வித்தியாசமான systemஆக, உதாரணமாக மன்னார் மாவட்டமாக இருந்தால், அங்கிருக்கின்ற வெற்றிடங்களுக்கு அந்த மாவட்டத்தில் இருக்கின்ற தரமானவர்களுக்குச்

சந்தர்ப்பத்தைக் கொடுக்கின்றபொழுது நிச்சயம் பிரயோசனமாக இருக்கும். மாகாண ரீதியாக அவ்வாறு நியமிக்கின்றபோதுகூட இவ்வாறான பிரச்சினைகள் குறையும். யாழ்ப்பாணத்தில் உள்ள ஒருவரை மன்னாரில் நியமிப்பதால், அவர் 4 - 5 வருடங்களில் திரும்பி யாழ்ப்பாணத்துக்குச் சென்றுவிட்டால், அங்கு ஆசிரியர் பற்றாக்குறை தொடர்ந்தும் பிரச்சினையாகவே இருக்கும். எதிர்காலத்திலே மாவட்ட ரீதியாக நியமனம் செய்வதற்கான ஏற்பாடுகள் செய்யப்படுவதாக எங்களுடைய வன்னிப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஜெகதீஸ்வரன் அவர்கள், சொன்னார். ஆகவே, இந்த விடயத்தில் கவனம் செலுத்துமாறு நான் இந்த இடத்திலே வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து, இன்னுமொரு பிரச்சினை பற்றி இங்கே சொல்ல வேண்டும். கொழும்பு போன்ற நகரப் பகுதியில் இருக்கின்ற அரசாங்கப் பாடசாலைகளிலே கற்கின்ற மாணவர்களை ஏற்றிச் செல்கின்ற தனியார் school van service அமைச்சுடன் அல்லது வேறெந்த அரச நிறுவனத்துடனும் எந்தவொரு coordinationஉம் இல்லாமல், GPS வசதிகள் இல்லாமல், எத்தனை மணிக்குப் போகின்றது, வருகின்றது என்று தெரியாமல் இயங்குகின்றது. அவர்கள் தாங்கள் விரும்பிய தொகையைக் கட்டணமாக அறவீடு செய்கிறார்கள். சில பெற்றோரால், குறிப்பாக 2 - 3 பிள்ளைகள் இருக்கின்ற ஓர் அரச உத்தியோகத்தரால் அந்தக் கட்டணத்தைக் கொடுக்க முடியாத துர்பாக்கிய நிலை காணப்படுகின்றது. இன்று காலையில் ஒரு தாய், "நான் எடுக்கின்ற சம்பளத்தை இவ்வாறு 3 பிள்ளைகளுக்கும் போக்குவரத்துக்காக vanக்குக் கொடுப்பதால், என்னுடைய பிள்ளைகளுக்குச் சிறந்த சத்தான உணவைக் கொடுக்க முடியாத நிலையில் இருக்கிறேன்" என்று என்னிடத்தில் கவலையோடு சொன்னார். எனவே, இந்த school van serviceஐ எத்தனை பேர் செய்கிறார்கள், எவ்வாறு செய்கிறார்கள் என்ற விடயத்தில் கவனம் செலுத்த வேண்டும். அந்தப் பொறுப்பைப் பாடசாலை அதிபர்களுக்கோ அல்லது எதோவொரு வகையில் அதிகாரமுள்ளவர்களுக்குக் கொடுத்தோ school van serviceஐ ஒழுங்குபடுத்துவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். பாடசாலை நடைபெறாத ஏப்பிரல், டிசம்பர் மாத Leave காலங்களிலும் அவர்களுக்குக் கட்டணம் செலுத்த வேண்டுமாம்!

ஆனால், leave காலத்தில் schoolஇல் நடத்துகின்ற extra classக்குப் பிள்ளைகளை ஏற்றிச் செல்லுமாறு school van service நடத்துபவர்களிடம் சொல்கின்றபொழுது, "எங்களால் extra classக்குக் கொண்டுபோக முடியாது. School நாளில் மட்டும்தான் கொண்டு போவோம்" என்று சொல்கின்றார்களாம். ஆகவே, டிசம்பரில் extra classக்குப் போவதற்கு மேலதிகமாக பணம் கொடுக்க வேண்டும். அதேபோன்று, பாடசாலைக்குச் செல்லாத காலத்திலும் school van serviceக்குப் பணத்தைக் கொடுக்க வேண்டிய துர்ப்பாக்கிய நிலை இருக்கின்றது. எனவே, இந்த விடயத்தில் கவனம் செலுத்துமாறு கௌரவ கல்வி அமைச்சர் அவர்களிடத்தில் நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேபோல, அரச பாடசாலைகளில் சில பெற்றோரை ஒவ்வொரு வகுப்புக்கும் coordinator என்று பொறுப்பாக நியமித்துவிட்டு, ஒரு தொகைப் பணத்தை அந்தப் பெற்றோர்மூலம் collect பண்ணுகின்றார்கள். அரசாங்கம் collect பண்ணுவதில்லை; பெற்றோர் collect பண்ணுகின்றார்கள். ஏழை மாணவர்களால் அதைக் கொடுக்க முடியாத நிலை ஏற்படுகின்றபொழுது, அங்கு முன்னுரிமை, பின்னுரிமை என்ற பிரச்சினைகள் ஏற்படுகிறது. எனவே, அரசாங்கம் அதிகளவான பணத்தைக் கல்விக்காகச் செலவு செய்கின்றபொழுது, இவ்வாறு ஏழைப் பெற்றோரிடத்தில் பணம் அறவிடப்படும் விடயத்திலும் கவனம் செலுத்தி, இது தொடர்பாகவும் அதிபர்களுக்கு strictஆன அறிவுறுத்தல்களை வழங்குமாறு கேட்டுக்கொண்டு, சிறப்பான பணியாற்றும் நீங்கள் இன்னும் நல்ல முறையில் இந்த நாட்டில் கல்வித் தரத்தை உயர்த்தப் பாடுபட வேண்டுமென வேண்டி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.20]

**ගරු වරුණ ලියනගේ මහතා**
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතා සන්තෝෂ වෙනවා. මොකද, මේ අධ්‍යාපන ක්ෂේත්‍රය නඟා සිටුවීමේ වගකීම අපේ රටේ ප්‍රධාන තනතුරු තුනෙන් එකක් දරන ගරු අග්‍රාමාත්‍යතුමිය භාර ගෙන තිබෙන නිසා. අද අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා කාරණා රැසක් පහදා දීම ගැන ඇත්තටම අපි ඉතා සන්තෝෂ වෙනවා. ඇත්තටම කියපු කාරණා තමයි, විශාල වශයෙන්ම තිබෙන්නේ. හැබැයි, ඒ අස්සේ නොකියපු කාරණාත් ගරු අධ්‍යාපන අමාත්‍යතුමියගේ අවධානයට යොමු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, දැන් ළමයින් 50කට අඩු පාසල් වැසීමේ යෝජනාවක් ගැන කථා කරනවා. මම දන්නේ නැහැ, ඒක ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියලා. පාසල් 10,000කට ආසන්න සංඛ්‍යාවකින් එක්දහස් ගණනක් වැහෙයි කියන අදහසින් අපේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කථා කළා. රත්නපුර දිස්ත්‍රික්කයේ ගත්තාම, ශිෂ්‍ය ශිෂ්‍යාවන් 50කට අඩු පාසල් එකසිය ගණනක් තිබෙනවා. බැරි වෙලාවත් ඒ පාසල් වැසුණොත් මොකද වෙන්නේ? ඒ පාසල්වල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහොම අමාරුවෙන් තමයි ඒ පාසල්වලටත් ඇතුළත් වෙන්නේ. මොකද, ඒ දෙමාපියන්ගේ ආර්ථික තත්ත්වය නිසා තමයි ඒ දරුවන්ට නගරයේ පාසලකට එන්න බැරි වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි, දරුවන් 50කට අඩු පාසල්වලට ඒ දරුවන් යවන්නේ. ආණ්ඩුවේ අදහස වශයෙන් තිබෙන්නේ ඒ පාසල් වැහුණොත්, ඒ සියලුදෙනාටම යන්න බස් එකක් නොමිලේ සපයනවා කියන එක. ඒක ඉතා වැදගත්. ඇත්තටම අපිත් සන්තෝෂ වුණා, බස් එකක් නොමිලේ දෙනවා නම් ගැටලුවක් නැහැ කියලා. හැබැයි ගරු අග්‍රාමාත්‍යතුමියනි, අපේ දිස්ත්‍රික්කයේ ගත්තාම, රජයේ බස් රථයක් -සීටීබී බස් රථයක්- හෝ පෞද්ගලික බස් රථයක් යන්න බැරි තැන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා, ඒකටත් යම් විසඳුමක් හදලා දෙන්න පුළුවන් නම් හොඳයි කියන අදහස තමයි මම ඔබතුමියට පැහැදිලි කළේ.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ජනවාරි මාසයේ පාසල්වලට අලුතින් ළමයින් ඇතුළත් කර ගන්නවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමියටත් විශාල වගකීමක් තිබෙනවා. ඒ වාගේම දෙමාපියන්ද මේ වෙලාවේ ගැටලු රාශියක ඉන්නවා. ඇත්තටම අපේ දිස්ත්‍රික්කය ගත්තාම, වැවිලි කර්මාන්තයට - plantation industry එකට - අයිති වතු කිහිපයක් තිබෙනවා. ඒවායේ ඉන්න ජනතාවට ඉඩම් ඔප්පු නැති

[ගරු වරුණ ලියනගේ මහතා]

ප්‍රශ්නය විශාල වශයෙන් තිබෙනවා. ඒ පළාතේ Balangoda Plantations තිබෙනවා, Kahawatte Plantations තිබෙනවා, Kelani Valley Plantations තිබෙනවා, Udapussellawa Plantations තිබෙනවා. ඒ වාගේ වතු තිබෙනවා. මේ plantationsවලට LRC එකෙන් නඩු දාලා තිබෙනවා, ඒ කිසිම ඉඩමකට ඔප්පු ලබා දෙන්න බැරි වෙන්න. ළමයි පාසල්වලට ඇතුළත් කර ගැනීමේදී ඉඩමේ ඔප්පුවට ලකුණු 25කුත් දෙනවා. ඒ ලකුණු 25 ගන්න බැරිව දෙමාපියන් විශාල ගැටලුවක ඉන්නවා. පසුගිය කාලයේ තිබුණු ආණ්ඩුවලටත් අපි මේ කාරණය පෙන්වා දුන්නා. ඉඩම් සම්බන්ධව තිබෙන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවටත් අපි පෙන්වා දුන්නා මේක නිවැරැදි කරලා දෙන්න කියලා. හැබැයි, අද වනතුරු එය නිවැරැදි කරලා නැහැ. ඒ නිසා ඔබතුමියට තමයි මේ වගකීම තිබෙන්නේ කියලා හිතලායි ඔබතුමියට මම මේ කාරණය මතක් කළේ. ඒ ඉඩමේ පදිංචි වෙලා ඉන්නවා කියලා, ඉස්කෝලෙට විතරක් valid වෙන විධියට LRC එකෙන් ලියුමක් දෙන්න පුළුවන් නම්, ඒ ලකුණු 25 ලබා ගන්න කිසිම ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. ඔබතුමිය ඒක කරලා දෙයි කියලා මා විශ්වාස කරනවා. ඒක නිසා තමයි ඔබතුමියට ඒක මතක් කළේ. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

අද ජාත්‍යන්තර පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමට විශාල වශයෙන් උනන්දුවක් තිබෙනවා. ඒ ජාත්‍යන්තර පාසල් ලියාපදිංචි වෙලා තිබෙන්නේ, BoI project එකක් විධියටයි. ඒ නිසා ඇත්තටම, අධ්‍යාපන අමාත්‍යාංශයට මේකට මැදිහත් වෙන්න පුළුවන්කමක් නැහැ. නමුත් ඒවාට ගුරුවරු බඳවා ගැනීම් කරනවා. Monthly fee එක අය කිරීමත්, ඒගොල්ලන්ට ඕනෑ විධියට තමයි ඒ දේ කරගෙන යන්නේ. ඒ නිසා ඒවාත් යම් පාලනයකට - පාලනය අතට ගන්නම නොවෙයි - යටත් කරන්න පුළුවන් නම් හොඳයි. ඒ කාරණයත් ඔබතුමියගේ අවධානයට යොමු කරන්න කැමතියි. මොකද, මේ ගැටලුවට ලක්ෂ දෙකහමාරකට ආසන්න දරුවන් පිරිසක් මුහුණ දෙනවා. ඒ වාගේම ඒ ගැටලුව දෙමව්පියන්ටත් විශාල විධියට බලපා තිබෙනවා.

ගරු අමාත්‍යතුමියනි, VTA එකේ ඉගෙන ගන්න දරුවන් 30,000කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා, ලංකාවේම. ඒ අතර course fee එක ගෙවන්න බැරි විශාල පිරිසක් ඉන්නවා. සමහර වෙලාවට ඒ course fee එක ලොකු ගණනක් වෙනවා. ඒවා beauty culture වෙන්න පුළුවන්, metalwork වෙන්න පුළුවන්, woodwork වෙන්න පුළුවන්. නමුත් මොකක් හරි කාරණයක් නිසා ඒ course fee එක ගෙවන්න බැරිව ගැටලුවලට මුහුණ දෙන විශාල පිරිසක් ඉන්නවා. ඒ නිසා මම ඔබතුමියට යෝජනා කරනවා, අපේ දිස්ත්‍රික්ක 25න් අඩු ආදායම්ලාභින් ඉන්න දිස්ත්‍රික්ක 5ක්වත් තෝරා ගෙන, ඔවුන්ට ඒ අධ්‍යාපනය ලබා ගන්න නොමිලේ අවස්ථාව දෙන්න කියලා. එහෙම වුණොත් ඒක විශාල ශක්තියක් වෙයි ඒ දරුවන්ගේ අධ්‍යාපනයට.

ගරු අගමැතිතුමියනි, 2022දී ඇති වූ ආර්ථික අර්බුදයත් එක්ක VTAඑකට සේවකයන් බඳවා ගන්න බැරි වුණා. දැනට VTA එකට vacancies 1,219ක් අනුමත වෙලා තිබෙනවා. ඒකෙන් අපට බඳවා ගන්න පුළුවන් වෙලා තිබෙනවා, 698දෙනෙක්. තව 521ක් අපට බඳවා ගන්න පුළුවන්කම තිබෙනවා. ගරු අගමැතිතුමියනි, ඒ බඳවා ගැනීමට නියමිත අය අතර අවුරුදු 45 සම්පූර්ණ වෙච්ච 53දෙනෙක් ඉන්නවා. ආර්ථික අර්බුදය පැවැති නිසා ඒ අය නියම වයස් සීමාවේදී බඳවා ගන්න බැරි වුණා. අවුරුදු 45 වුණාට පස්සේ අපේ ප්‍රතිපත්ති තීන්දු එක්ක ඒ අය බඳවා ගන්න බැහැ. ඒ නිසා දැන් ඒ 53දෙනාට වයස වැඩිවීම නිසා රස්සාවට යන්න බැරිවෙලා තිබෙනවා. මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, Cabinet Paper එකක් දාලා ඒ 53දෙනාටත් අවස්ථාවක් හදලා දෙන්න කියලා. එහෙම වුණොත් ඒක ඉතාම වටිනවා.

NAITA එකේ ඉගෙන ගන්න දරුවන් වර්ෂයක course එකක් කරනවා නම්, රුපියල් 5,000ක දීමනාවක් දෙනවා. වර්ෂ 2ක් ඉගෙන ගන්න දරුවන්ටත් රුපියල් 5,000යි. වර්ෂ 3ක් ඉගෙන ගන්න දරුවන්ටත් රුපියල් 5,000යි. ඒ නිසා වර්ෂ 2ක් ඉගෙන ගන්නවා නම් රුපියල් 10,000කුත්, වර්ෂ 3ක් ඉගෙන ගන්නවා නම් රුපියල් 15,000කුත් දෙන්න පුළුවන් නම් ඒක ඒ අයට විශාල ශක්තියක් වෙයි, මේ තිබෙන ආර්ථික තත්ත්වයත් එක්ක. මොකද, අවුරුද්දකට රුපියල් 5000ක් කියන්නේ ඉතා අඩු මුදලක්. ඒ නිසා ඒකත් වැඩි කරලා දෙන්න පුළුවන් නම් ඒ අයට විශාල ශක්තියක් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු අමාත්‍යතුමියනි, රත්නපුර දිස්ත්‍රික්කය තුළ ද්‍රවිඩ භාෂාවෙන් ඉගෙන ගන්න දරුවන් ඉන්නවා. හැබැයි ඒ දරුවන්ට VTAඑකට යන්න අවස්ථාවක් නැහැ, ඒ ද්‍රවිඩ පාසල් නැති නිසා. ඒ නිසා රත්නපුර දිස්ත්‍රික්කයේ ඒ ද්‍රවිඩ පාසලකුත් ඇති කර දෙන්න පුළුවන් නම් ඒක අපට විශාල ශක්තියක්. රත්නපුර දිස්ත්‍රික්කයේ 120,000කට ආසන්න ජනතාවක් ජීවත් වෙනවා. ඒ වාගේම සබරගමුව පළාත තුළ Tamil stream එක සම්බන්ධයෙන් පරිපාලන ව්‍යුහයක් නැහැ. ඒකේ විශාල ගැටලුවක් තිබෙනවා. අපේ දිස්ත්‍රික්කය තුළ Tamil දරුවන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ නිසා Tamil stream එක සම්බන්ධයෙනුත් පරිපාලන ව්‍යුහයක් හදලා Tamil Director කෙනෙක් දෙන්න පුළුවන් නම් ඒක තවත් ලොකු ශක්තියක් වෙයි. දැනට අපේ පළාත් සභාවටම ඉන්නේ, එක Tamil Director කෙනෙක් පමණයි. ඒ නිසා ඔබතුමියගේ අවධානය යොමු කරලා මේ කටයුතු ටික කර දෙන්න පුළුවන් නම් ඒක විශාල ශක්තියක් වෙයි. මේ කටයුතු කරන්න ධෛර්යය, ශක්තිය ඔබතුමියට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

බෙහෙවින් ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.28]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අධ්‍යාපනය පිළිබඳ අපේ ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන්ම සකස් වෙලා තිබෙන්නේ ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් හා දියුණු මානව සම්පතක් බිහි කර ගැනීමේ අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන්. අධ්‍යාපනය පිළිබඳ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රධානතම මූලධර්ම 6 අතුරින් අධ්‍යාපනය සඳහා සම ප්‍රවේශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මම මේ සභාවට කරුණු දක්වන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජ සුබසාධන ක්ෂේත්‍රයක් විධියට සලකා, අධ්‍යාපනය වෙනුවෙන් රජය ආයෝජනය කළ යුතුයි කියන එක ප්‍රධාන වශයෙන් පිළිගන්නා දේශපාලන ව්‍යාපාරයක් තමයි අපි. අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් විධියට

සලකන්නේ නැහැ, අපි. රජය ඒ වෙනුවෙන් කරන්නේ ආයෝජනයක්. අපේ මානව සම්පත දියුණු කර ගැනීමේ ඉතාම අත්‍යවශ්‍ය සාධකයක් විධියට අපි අධ්‍යාපනය සලකනවා. රජය අධ්‍යාපනයට ආයෝජනය කරනවා වාගේම, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ක්ෂේත්‍රවල අධ්‍යාපනය රජයේ අධ්‍යාපනයට සමගාමී විධියට ගුණාත්මක තත්ත්වයට පත්කළ යුතුයි කියන එකත් අපි ප්‍රතිපත්තියක් විධියට පිළිගන්නවා. රජයේ මෙන්න මේ ප්‍රතිපත්තිවලට අනුකූලව තමයි අපි 2025 වර්ෂයේ අය වැය ලේඛනයේ අධ්‍යාපනය පිළිබඳව කරුණු ඉදිරිපත් කළේ. 2026 අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේත් ඒ විධියටම තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජ සංවර්ධන ක්‍රියාවලියේදී මානව සම්පත දියුණු කර ගැනීමකින් තොරව අපේ සංවර්ධන ඉලක්ක සපුරාගන්න හැකියාවක් නැහැ. විශේෂයෙන් අධ්‍යාපනය මඟින් අපේ සමාජයේ අසමානතාව අවම කරගන්න පුළුවන්. ඒ වාගේම සමාජයේ උඩුකුරු චලනතාව සම්බන්ධයෙන් ගත්තාම, උඩුකුරු චලනතාව දිනාගැනීමේ ක්‍රියාවලියේදී අපේ රටේ අවම වරප්‍රසාදිත සමාජ කණ්ඩායම්වල පවුල්වල දරුවන්ට තිබෙන ප්‍රධානම මාර්ගය තමයි අධ්‍යාපනය. මෙන්න මේ අරමුණ දිනාගැනීම වෙනුවෙන් තමයි 2026 වසර සඳහා ජනාධිපතිතුමා, මුදල් ඇමතිතුමා විධියට ඉදිරිපත් කළ විසර්ජන පනත් කෙටුම්පත මඟින් රුපියල් මිලියන 704,380ක්, එහෙම නැත්නම් රුපියල් බිලියන 704.3ක් වෙන් කළේ. මේ ප්‍රමාණයට තවත් රුපියල් මිලියන 4,000කට ආසන්න ප්‍රමාණයක් අය වැය කථාව මඟින් වෙන් කළා. ඒ අනුව 2026 වර්ෂයේදී අධ්‍යාපනය සඳහා ආසන්න වශයෙන් රුපියල් බිලියන 708ක් අපි වෙන් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අධ්‍යාපන ඇමතිතුමිය විධියට ගරු අගමැතිතුමිය අද උදෑසන විවාදයට එක්වෙමින් සඳහන් කළා, අධ්‍යාපනය සඳහා ලංකාවේ මෑත ඉතිහාසයේ වෙන් කළ ඉහළම මුදල තමයි 2026 වර්ෂයේ අපි අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙන්නේ කියලා. එය 2026 වසරේ අපේක්ෂිත රජයේ සමස්ත ආදායම වන රුපියල් බිලියන 5,355න් සියයට 13.16කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. ඒ වාගේම 2026 වසරේ සමස්ත ප්‍රාථමික වියදම්වලින් සියයට 15.7කට වැඩි ප්‍රමාණයක් අපි අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඉතාම සාධනීය කරුණු ඉදිරිපත් කරනවා, අපි දැක්කා. අපි ඒවා අමාත්‍යාංශයක් විධියට පිළිගන්නවා. සමහර මන්ත්‍රීවරු විවේචනයක් විධියට ඉදිරිපත් කළා, අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් වෙන් කරනවාය කියපු සියයට හය පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රජයක් විධියට අදටත් පිළිගන්නවා, අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කළ යුතුයි කියන එක. නමුත් අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉතා පැහැදිලිවම සඳහන් කළා, අද අපේ රටේ ආර්ථිකයේ තිබෙන තත්ත්වය අනුව ක්‍රමානුකූලව තමයි මේ සියයට හයේ ඉලක්කය ළඟා කරගත යුත්තේ කියලා. ඒ අනුව තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සියයට 6 කියන එක එලෙසම සඳහන් කරන්නේ නැතිව ක්‍රමානුකූලව අධ්‍යාපනය සඳහා රජයේ දායකත්වය වැඩි කළ යුතුයි කියන එක සඳහන් කළේ. අපි මෙවර දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.04ක් අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම, 2017 වර්ෂයෙන් පසුව වෙන් කළ ඉහළම අගය විධියට තමයි මෙය වාර්තා වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලෝකයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත්තාම, දියුණු රටවල් සහ අනෙකුත් රටවල් සාමාන්‍යයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4කට ආසන්න අගයක් දක්වා වෙන් කරනවා. මෙන්න මේ අගය අබිබවා යන විධියට අධ්‍යාපනය සඳහා රජයේ දායකත්වය ක්‍රමානුකූලව වැඩි කිරීම තමයි වර්තමාන රජයේ ප්‍රධානතම අභිප්‍රාය වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලංකාවේ උසස් අධ්‍යාපනය ලබා දෙන රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අපි පසුගිය වසරක කාලය තුළ කටයුතු කළා.

මම සඳහන් කළ උසස් අධ්‍යාපනය ලබා දෙන රාජ්‍ය විශ්වවිද්‍යාල, රාජ්‍ය නොවන සහ පෞද්ගලික විශ්වවිද්‍යාලවල අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අපි විද්වත් කමිටුවක් පත් කරලා, ඒ ඔස්සේ ප්‍රතිපත්ති රාමුවක් සකස් කරනවා. රාජ්‍ය අධ්‍යාපනයේත්, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ක්ෂේත්‍රයේ අධ්‍යාපනයේත් ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම සඳහා අපි බලයට පත් වුණු පළමුවෙනි වසරේ සිටම කටයුතු කළා. ඉදිරි වර්ෂය තුළදීත්, ඉදිරියටත් අපි ඒ කටයුතු කරනවා.

උසස් පෙළ සමත් සිසුන්ට, විශේෂයෙන්ම ඉහළම දක්ෂතා දැක්වූ තෝරා ගත් සිසුන්ට ජාත්‍යන්තර මට්ටමේ ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීම සඳහා අවස්ථාව ලබා දීමට අපි පසුගිය 2025 අය වැයෙන් යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාව අපි 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කළා. අපි ඒ සඳහා 2026 වර්ෂයේදීත් මුදල් වෙන් කරනවා. ඉදිරි වසර කිහිපය තුළම මේ ශිෂ්‍යත්ව වැඩසටහන දිගටම ක්‍රියාත්මක කිරීම තමයි අපේ කාර්යභාරය වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ විශ්වවිද්‍යාල දෙස බලනවිට, විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන විද්‍යාර්ථීන් දළ වශයෙන් 150,00ක් පමණ ඉන්නවා. මේ අතුරින් සැබෑ ලෙස නේවාසිකාගාර පහසුකම් ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 60,000ක් විතර ඉන්නවා. දළ වශයෙන් ගත්තොත්, සියයට 40ක් විතර නේවාසිකාගාර පහසුකම් ලබනවා. අපි මෙවර අය වැයෙන් විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර පහසුකම් ඇතුළු පොදු පහසුකම් වැඩි දියුණු කිරීමට රුපියල් මිලියන 4,000ක් වෙන් කළා. මොකද, විශ්වවිද්‍යාල සිසුන්ගේ නේවාසිකාගාර පහසුකම් පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ, ඔවුන්ගේ ඉගෙනුම් පරිසරය වැඩි දියුණු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි විශ්වවිද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවල පහසුකම් සහ පර්යේෂණ කටයුතු. විශ්වවිද්‍යාලවලින් දැනුම හුවමාරු කර ගැනීම විතරක් නොවෙයි, දැනුම ජනනය කරන්නත් ඕනෑ. දැනුම ජනනය කරන්න නම් අනිවාර්යෙන්ම අපට පර්යේෂණ අවශ්‍යයි. අන්න ඒ පර්යේෂණ කටයුතු සඳහාත් අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 11,500ක් වෙන් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ හරහා නව දැනුම ගවේෂණය කරන්නට, නව දැනුම ජනනය කරන්නට, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ටත්, සමාජයට අලුත් දැනුම ලබා දෙන්නත් මුල පිරීමක් කරන්න අපට අවස්ථාවක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 දත්ත අනුව විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් 65,830දෙනෙකු මහපොළ ශිෂ්‍යත්වලාභීන් විධියට ඉන්නවා. අපි බලයට පත් වෙනකොට මහපොළ ශිෂ්‍යාධාර ලෙස ලබා දුන්නේ රුපියල් 5,000යි. වසරක් ඇතුළත අප විසින් ඉදිරිපත් කළ අය වැය ලේඛන දෙක තුළ මේ ප්‍රමාණය මාසිකව සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. රුපියල් 5,000ක්ව තිබුණු මහපොළ ශිෂ්‍යාධාර මුදල පසු ගිය අය වැයෙන් රුපියල් 7,500 දක්වාත්, මෙවර අය වැයෙන් එය රුපියල් 10,000 දක්වාත් වැඩි කළා. ඒ අනුව අපි ඒක දෙගුණයක් කළා. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් 36,893ක් ශිෂ්‍යාධාර ලබනවා. අපි බලයට පැමිණෙන විට

[ගරු උපාලි පන්නිලගේ මහතා]

ශිෂ්‍යාධාර මාසික වාරිකය තිබුණේ රුපියල් 4,000යි. අපි 2025 සහ 2026 වසරවල මේ මුදල රුපියල් 9,000 දක්වා සියයට 125කින් වැඩි කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව අපි ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු පහසු කිරීම සඳහා පහසුකම් සැලසීමට කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආබාධ සහිත ශිෂ්‍යයින් සිටිනවා. දැනට තිබෙන දත්ත අනුව අපේ රටේ සියයට 8කට ආසන්න ප්‍රමාණයක් ආබාධ සහිත ප්‍රජාව ලෙස සිටිනවා. ඔවුන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීම පිළිබඳව ගත්තාම, ඇත්තටම ඒක සිහිනයක් සැබෑ වීමක් වාගේයි වෙලා තිබෙන්නේ. 2024 - 2025දී ආබාධ සහිත ශිෂ්‍යයෝ 112දෙනෙකු විතරයි විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙලා තිබෙන්නේ. ඒ වාගේම දැනට ජීව විද්‍යා, භෞතික විද්‍යා, වාණිජ කළමනාකරණ, කලා කියන ක්ෂේත්‍ර 4ට විතරයි විශ්වවිද්‍යාලවලට ආබාධ සහිත ශිෂ්‍යයෝ ගන්නේ. මෙන්න මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනම අනුකමිටුවක් පත් කරලා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමත් සමඟ එකතුව ප්‍රතිපත්තියක් හදලා ඒක ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒත් එක්කම විශ්වවිද්‍යාලවල ආබාධ සහිත සිසුන්ගේ අධ්‍යයන කටයුතු පහසු කිරීම සඳහා මෙවර අය වැයෙන් අමතරව මාසිකව, -ඒ අය දිරිමත් කිරීම සඳහා- රුපියල් 5,000ක දීමනාවක් ලබා දීමටත් කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින්ගේ පාසල් අධ්‍යාපනය දිරිමත් කිරීම සඳහාත් අපි අමතරව රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දීමට 2026 අය වැය ලේඛනය මඟින් යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ කාරණයත්. මේ සභාවේදී අපි බදු අඩු කරනවා කියපු එක ගැන කියැවුණා. පාසල් ලිපිද්‍රව්‍ය සහ උපකරණවල බදු අඩු කළේ නැතත් අපි පසුගිය අය වැයෙනුත් දරුවන්ට රුපියල් 6,000ක දීමනාවක් ලබා දුන්නා. අපි ඒ ක්‍රියාවලිය ඉදිරියට ගෙනිහින් 2026 අය වැයේදීත් ඒ රුපියල් 6,000 දීමනාව ලබා දීම සඳහා රුපියල් මිලියන 9,000ක් අමතරව වෙන් කරලා තිබෙනවා. මේ හරහා අපේ සමාජයේ පහළම ජන කොටස්වලට අධ්‍යාපනයේ සම අවස්ථා ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු අපි සලස්වා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගෙන් අද නොයෙක් අදහස් ඉදිරිපත් වුණා, විශ්වවිද්‍යාලවල අනුමත ආචාර්යවරුන්ගේ කාර්ය මණ්ඩලය පිළිබඳවත්, ඔවුන්ගේ වැටුප් සහ බදු ව්‍යුහ පිළිබඳවත්. මම ඒ ගැන ගොඩක් දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශ්වවිද්‍යාලවල අනුමත කාර්ය මණ්ඩලය 13,215ක් වුණත්, දැනට සේවයේ ඉන්නේ 10,466යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම නැවැත්වූයේ අපි නොවෙයි, පසුගිය රජයන් විසින් තමයි සම්පූර්ණයෙන්ම මේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම නැවැත්වූයේ. දැනට තිබෙන පුරප්පාඩු 2,749න් 1,345ක්ම බඳවා ගැනීම සඳහා වූ කැබිනට් පත්‍රිකාව මේ වනකොට කැබිනට් මණ්ඩලය විධියට අපි අනුමත කරලා එම බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් බඳවා ගැනීම අමාත්‍යාංශයට, එහෙම නැත්නම් UGC එකට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒක විශ්වවිද්‍යාලවලින් කරන්න ඕනෑ. ඒ කටයුතු මේ වනකොට සිදු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන් මම මේ කරුණත් කියන්න කැමැතියි. අපි අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුළුල් පරිවර්තනයක් කරමින් ඉන්නවා. 21වන සියවසට අපේ සමාජය සූදානම් කිරීමේදී, අපට අධ්‍යාපනය ඉතාම වැදගත් වනවා. ඒ අනුව, ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි කිරීම සඳහා අපේ රටේ මානව සම්පත දියුණු කිරීමේ ක්‍රියාවලියේ අපි අනිවාර්යයෙන්ම නිරත වෙමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතියි, කාලය ලබා දීම සම්බන්ධව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියනි, සාමාන්‍යයෙන් ඉතිහාසය දිහා බලනකොට හිටපු අධ්‍යාපන ඇමතිවරුන් බොහෝදෙනෙකුට ඊළඟ මැතිවරණය ලෙහෙසියෙන් දිනන්න බැරි වුණා කියන එක ඉතිහාසය තුළ අපි දැක්කා. මොකද, මෙය බොහොම අමාරු අමාත්‍යාංශයක්. ඒ අනුව ඔබතුමියගේ ඉරණම ගැන තමයි අපිත් කථා කරමින් හිටියේ. අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය කියන්නේ, ඉතා වැදගත් විෂයයක්. ඒ වාගේම ඉතාම පුළුල් සහ ගැඹුරු විෂයයක්. රටකට ආර්ථික වර්ධනය සහ ජීවන තත්ත්වය වැදගත් වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයත් ඉතාම වැදගත් වනවා. සදාචාර සම්පන්න, ගුණවත්, විනයානුකූල සමාජයක් සකස් කර ගැනීමට අධ්‍යාපනය ශක්තිමත් පද්ධතියක් විය යුතුයි කියා මම විශ්වාස කරනවා. මොකද, පසුගිය වසර තුන හතරක කාලයේ පැවති ගෝලීය තත්ත්වය තුළ සිදු වූ අරගළ කිහිපයක් අපි දැක්කා. ඒවා දේශපාලන අරගළ. මෙවැනි අරගළ සිදුවෙච්ච රටවල් අතරින් ලංකාවේ ඇති වූ අරගළයෙන් සමාජයට වෙච්ච හානිය, දේපළවලට වෙච්ච හානිය යම් ප්‍රමාණයකට සීමා වුණා. ඒ හානිය එලෙස සීමා වීමට ප්‍රධාන හේතුවක් විධියට මම දකින්නේ අපේ රටේ තිබෙන ආගම්. විශේෂයෙන්ම ඒ ආගමික බැඳීම්, සංස්කෘතික බැඳීම් සහ අපේ අධ්‍යාපන ක්‍රමය ඒ සඳහා ඉවහල් වුණා. ඒ දේවල් තුළින් යම් සදාචාර සම්පන්න සමාජයක් අපට හදන්න පුළුවන් වෙලා තිබෙනවා. හැබැයි පසුගිය අවුරුදු තුන හතර තුළ අපි දැක්කා, අපේ සමාජය තුළ, පාසල් පද්ධතිය තුළ ගුරු විදුහල්පතිවරුන්ටත් සිසුන් අභියෝග කරන හැටි, ජනප්‍රිය පාසල්වල දරුවෝ නැඟිටලා හැසිරෙන හැටි. මේවා හරි භයානකයි. මේවා අපේ සමාජයටම ලොකු අභියෝගයක් ලෙස මා දකිනවා. ඒ වාගේම විශ්වවිද්‍යාලවල මහාචාර්යවරුන්, ආචාර්යවරුන් ලබා දෙන නියෝගවලට, රෙගුලාසිවලට යටත් නොවන තත්ත්වයක්, ඒ වාගේම නවක වදය වර්ධනය වීම් වාගේ තත්ත්වයන්

වර්තමානයේ අපි විශ්වවිද්‍යාලවල දකිනවා. ඉතින්, මේවා සම්බන්ධයෙන් තීන්දු ගැනීම දේශපාලන වශයෙන් අමාරු වෙන්න පුළුවන්. හැබැයි, අපි මේවාට අත තිබ්බේ නැත්නම් මේවා රටටම බලපාන්න පුළුවන්. මේ පුළුල් විෂය තුළ තිබෙන අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය කියන ක්ෂේත්‍රය ගත්තාම, ඒ තුළ ප්‍රශ්න වැලක් තිබෙනවා. ඒ නිසා තෝරා ගත් ප්‍රධාන කරුණු දෙක තුනක් ගැන මම මේ වෙලාවේ කථා කරනවා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මම ප්‍රථමයෙන්ම අහන්න කැමැතියි, එක් කාරණයක් ගැන. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2022දී -ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේදී- වාර්තාවක් නිකුත් කළා. මම හිතන විධියට ඒ වාර්තාවේ තිබෙන්නේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව. ඒක ඉතා වැදගත් වාර්තාවක්. ඒක කරලා ඇත්තේ වෙන ආණ්ඩුවක් විසින්. ඒකට අපි සම්බන්ධ වුණේත් නැහැ. හැබැයි මම හිතනවා, ඒක මධ්‍යස්ථ වාර්තාවක් කියලා. ඇයි ඒ වාර්තාව පාවිච්චි නොකරන්නේ? මේ ජාතික ප්‍රතිපත්තිවලට මේවා අවශ්‍යයි. ඉතින් මම ඒ ගැනත් දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු මන්ත්‍රීතුමා, ඇත්තවශයෙන්ම අපි විෂය නිර්දේශය සඳහා පාදක කරගෙන තිබෙන්නේ, 2022දී ජාතික අධ්‍යාපන කොමිසම විසින් ඉදිරිපත් කරපු වාර්තාව. ඒකත් පදනම් කරගෙන, අපේ යෝජනාත් එකතු කරගෙන තමයි අපි ඉදිරියට යන්නේ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ඒක පාවිච්චි කරනවා නම්, වැදගත්.

ගරු අගමැතිතුමියනි, ඊළඟට මම තව දෙයක් අහන්න කැමැතියි. මේ ආණ්ඩුව බලයට එනකොට මාෆියා කිහිපයක්, ඒකාධිකාර කිහිපයක් බිඳිනවා, කඩනවා කියලා පොරොන්දු වුණා. ඒ සඳහා මම උදාහරණ කියන්නම්. හාල් මාෆියාව, ඖෂධ මාෆියාව, විදුලිබල මාෆියාව, රේගු මාෆියාව, කෝටිපති සමාගම් මාෆියාව වාගේම ටියුෂන් මාෆියාව එයින් කිහිපයක්. මේ, ඒකාධිකාර බලය බිඳිනවා කියලා ඔබතුමන්ලා කියපු ඒවා. හැබැයි, අද ටියුෂන් කර්මාන්තය දිහා බලන්න. මේ ආණ්ඩුවෙන් අය වැය ලේඛන දෙකක් ඉදිරිපත් කළා. නමුත් මේ ගැන කථා කරලා නැහැ. මේක ලොකු කර්මාන්තයක්. වාර්ෂිකව රුපියල් බිලියන 16ක් - රුපියල් මිලියන 16,000ක් - උපයන කර්මාන්තයක් බවට මේ කර්මාන්තය අද පත් වෙලා තිබෙනවා. ප්‍රශ්නය වන්නේ, මේ කර්මාන්තය හරහා සූරා කන්නේ, උපයෝජනය කරන්නේ ඉතාම දුප්පත් දෙමව්පියන් සහ දරුවන් වීම. ඒගොල්ලන්ගෙන් තමයි මේ මුදල් හම්බ කරන්නේ. වෙන කොහෙන්ද ගන්නේ? අනෙක් කර්මාන්ත තුළ තිබෙන ඒකාධිකාරී බලය කඩන්නත් ආණ්ඩුව අපොහොසත් වෙලා තිබෙනවා. මොකද, හාල් මාෆියාව කඩනවා කිව්වාට ඒක කළේත් නැහැ, වෙනත් කිසිම මාෆියාවක් කැඩුවේත් නැහැ. මේ ටියුෂන් මාෆියාවත් ආණ්ඩුව කඩන්නේ නැත්තේ ආණ්ඩුවට මොකක් හෝ රහසිගත ගනුදෙනුවක් තිබෙන නිසාද කියන සැකය අද පොදු ජනතාව තුළ ඇති වෙලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරද්දී මේකට මොකක්ද කරන්නේ කියලා මෙවරවත් කියා නැහැ. ජනතා විමුක්ති පෙරමුණ වාගේම සමාජවාදී වාමාංශික පක්ෂ පෞද්ගලික අධ්‍යාපනයට තදින් විරුද්ධයි. ඒ සම්බන්ධව එක එක දේවල් කියනවා වාගේම ඒ කාලයේ ඉඳලා ඒකට විරුද්ධවත් කටයුතු කළා. හැබැයි, නිදහස් අධ්‍යාපනයේ අර්ථය මුළුමනින්ම විකෘති කරන මේ ටියුෂන් කර්මාන්තයට ඔබතුමන්ලා අත් දෙකම ඔසවා ඉඩ දෙනවා. මේ තුළ ලොකු පරස්පරයක් තිබෙනවා. දුප්පත් දෙමව්පියන්ට, දරුවන්ට දැඩි පීඩනයක් දෙන මේ මාෆියාවට විරුද්ධව රජය පියවරක් නොගත්තේ ඇයි?

එක අය වැයක් ගියා කියමුකෝ, ඒකෙන් පියවරක් ගන්න බැරි වුණා. මේ, දෙවැනි අය වැය. දෙවැනි අය වැය තුළවත් ඇයි ඒ ගැන කථා කරලා නැත්තේ? ලක්ෂ ගණනක් වන දෙමව්පියන්ට මේක ලොකු ප්‍රශ්නයක්. මේ තත්ත්වය වෙනස් කරන්න ගන්නා පියවර මොකක්ද? එකවරම වෙනස් කරන්න බැරි නම්, මේ සඳහා රෙගුලාසි ගෙනෙනවාද, නියාමනය කරනවාද, මේක වෙනස් කරනවාද, නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්න වැඩ පිළිවෙළක් හදනවාද කියන දේවල් ගැන කථා කරන්නේ නැත්නම්, ඔයගොල්ලන් ඒ අයත් එක්ක එකතු වෙලා මේ වැඩේට බැහැලා ඉන්නවාද කියන එක ගැන අද වන විට ලොකු සැකයක් මතුව තිබෙනවා. සමහර අය කියනවා, මේ අය වෙනුවෙන් මැතිවරණවලදී වියදම් කළේ ටියුෂන් මාෆියාවෙන් කියලා. ඒක වෙන්න පුළුවන්. මොකද, මේක වාර්ෂිකව රුපියල් මිලියන 16,000ක් උපයන කර්මාන්තයක්.

මේ JVP ආණ්ඩුව කාලයේ තමයි වැඩියෙන්ම luxury cars ලංකාවට ගෙනැල්ලා තිබෙන්නේ. මේ වාගේ luxury cars මම මීට කලින් දැකලා නැහැ. මේ luxury cars අතර Rolls-Royce කියන කාර් දෙකක් ද ගෙනැල්ලා තිබෙනවා. Rolls-Royce කියන කාර් ලංකාවේම තිබෙන්නේ 4ක්, 5ක් වෙන්න ඕනෑ. මෑතක ගෙන්වූ Rolls-Royce කාර් දෙකෙන් එකක් ගෙන්වා තිබෙන්නේ ටියුෂන් ගුරුවරයෙක්. එතකොට හිතන්නකෝ, ඔහුගෙන් ඉගෙනුම ලබන දරුවන්ගේ දෙමව්පියන් වියදම් කරන සල්ලිවලින් තමයි ඒකට ගෙවා ඇත්තේ. හැබැයි ටියුෂන් මාස්ටර්ලා කී දෙනෙක් අද බදු ගෙවනවාද? හොඳයි, මේ කර්මාන්තය තිබෙනවා කියමුකෝ. කාට වුණත් බිස්නස් එකක් කරන්න පුළුවන්. මම ඒකේ වරදක් දකින්නේ නැහැ. එහෙම නම් මේ කර්මාන්තය නියාමනය කළ යුතුයි. මේ කර්මාන්තයේ යෙදෙන කී දෙනෙක් බදු ගෙවනවාද කියලා බලන්න.

මෙවරත් VAT එක වැඩි කළා. පොඩි සිල්ලර කඩේටත් VAT එක ගැහුවා. එළවලු කඩේටත් VAT එක ගහන්න පිරිවැටුම් සීමාව තවත් අඩු කළා. ඒ විධියට බදු වැඩි කළා. හැබැයි, මේ වාගේ සුපිරි පන්තියට කිසිම ප්‍රශ්නයක් නැහැ. මට හිතාගන්න බැහැ, ඒ ඇයි කියලා. අද කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ගෙනුත් බදු අය කරනවා. හැබැයි, මේ ක්ෂේත්‍රයේ අයට ඒ සම්බන්ධව කිසිම වැඩ පිළිවෙළක් සකස් කරලා නැහැ. ඒකෙන්ම තේරුම් යනවා, ආණ්ඩුව කොහේද ඉන්නේ කියන එක.

මේ රජය විසින් ඉදිරිපත් කළ අය වැය දෙකෙන්ම මේ කර්මාන්තය නියාමනය කිරීම ගැන කථා කළේ නැහැ. මම උදාහරණයක් කියන්නම්, මේ සම්බන්ධව ගන්න තිබුණු පියවර ගැන. ගාමිණී මහින්දපාල මහතා කියන්නේ ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්. මීට අවුරුදු දෙක තුනකට කලින් ගාමිණී මහින්දපාල මහතා චක්‍රලේඛයක් නිකුත් කළා, ප්‍රාථමික පාසල්වල ගුරුවරුන්ට ටියුෂන් කරන්න බැහැ කියලා. ඒක ඉතාම එඩිතර තීරණයක්. බලන්න, ඒ ලේකම්වරයා ගත් තීරණය. ආණ්ඩුවට අවස්ථාව තිබුණා, මේ අවුරුදු එකහමාරක කාලය තුළ අනෙක් පළාත්වලටත් එම තීරණය ව්‍යාප්ත කරන්නට. නමුත් ඔබතුමන්ලා ඒක කළේ නැහැ. ඊළඟට, බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ලේකම්වරයා 2024 දෙසැම්බර්වල චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා, පාසල් ගුරුවරුන්ට ටියුෂන් කරන්න බැහැ කියලා. හැබැයි, ඔබතුමන්ලාගේම නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වන මහින්ද ජයසිංහ මහත්තයා මොකක්ද කළේ? ඒකට විරුද්ධව කටයුතු කරලා ඒක අවලංගු කළා. එම චක්‍රලේඛය අවලංගු කර කියනවා, ටියුෂන් කරන්න පුළුවන් කියලා. එතකොට මේ ටියුෂන් කර්මාන්තයට සහාය දෙන්නේ ඔබතුමන්ලා නොවෙයිද?

[ගරු කබීර් හෂීම් මහතා]

මම දන්නවා, මේවා කථා කරන්න මිනිස්සු බයයි කියලා. මොකද, ටියුෂන් ගුරුවරුන්ට ලොකු බලපෑමක් කිරීමේ හැකියාව තිබෙනවා. හැබැයි, ඊට වඩා දෙමව්පියන්ට සහ දරුවන්ට මේ තුළින් ලොකු බලපෑමක් සිද්ධ වනවා. මේ වැඩ කරන හැම කෙනෙකුගේම දරුවන්ට ටියුෂන් වෙනුවෙන් මාසයකට රුපියල් 10,000ක්, 20,000ක් විතර ගෙවන්න වනවා. පවුලක ඉගෙන ගන්නා වයසේ ළමයි තුන්දෙනෙක් විතර හිටියොත්, ඒ දෙමව්පියන් ඉවරයි. එතකොට කවුද ඒකට පළි? මේක නිදහස් අධ්‍යාපනයද? ඔබතුමන්ලා නිදහස් අධ්‍යාපනයේ අර්ථය රකිනවාද කියා අපි අහන්න කැමැතියි.

Ceylon Teachers' Union එකේ ප්‍රධාන ලේකම්වරයා වන ජෝසප් ස්ටාලින් මහතා දිගටම මේ මාෆියාවට විරුද්ධව කථා කර තිබෙනවා; තවත් වෘත්තීය සමිති මේවා ගැන කථා කරලා තිබෙනවා; මේකට විරුද්ධ වෙලා තිබෙනවා. සුරේන් රාඝවන් මැතිතුමා උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ - 2023දී පමණ - මෙම කර්මාන්තය නියාමනය කිරීම සඳහා රෙගුලාසි ගෙනෙමින් නිර්ණායක කිහිපයක් ඉදිරිපත් කළා. ඔබතුමන්ලාට ඒකවත් බලලා මේ දේවල් ක්‍රියාත්මක කරන්න තිබුණා නේ. හැබැයි, ඔබතුමන්ලා ඒකවත් බැලුවේ නැහැ. ඒ නිසා, විපක්ෂය හැටියට අපි අග්‍රාමාත්‍යතුමියගෙන් මේ සඳහා උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

නිදහස ලැබුණාට පස්සේ අපි ශක්තිමත් විශ්වවිද්‍යාල පද්ධතියකුත් සකස් කළා. ඒ පද්ධතිය අපි හදලා තිබුණේ කොහොමද? ඇත්තටම උසස් අධ්‍යාපන ක්‍රමය නිරූපණය කළේ, සංකේතවත් කළේ, අපේ සමාජ සාධාරණත්වය. මොකද, අපි හැදුවේ හැමෝටම යන්න අවස්ථාව තිබෙන විශ්වවිද්‍යාල පද්ධතියක්. මානව ප්‍රාග්ධන වර්ධනයට කැපවීමක් කළා. ඒක අපි රජයක් හැටියට 1948 අවුරුද්දේ ඉඳලා දියුණු කරගෙන ආපු system එකක්. හැබැයි, මෑත කාලය තුළ අපි මේ විශ්වවිද්‍යාල ක්‍රමය තුළ බරපතළ විෂමතාවක් දකිනවා. විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලබන සිසුන් සහ විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව අතර ලොකු පරතරයක් නිර්මාණය වෙලා තිබෙනවා, විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා, due to lack of accessibility. Accessibility එක වැදගත්. ඒ කියන්නේ, විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම -ප්‍රවේශය- සීමා වෙනවා. මම දැකලා නැහැ, ආණ්ඩුව අද වෙනකල් ඒ ගැන කථා කරනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්; ආමන්ත්‍රණය කළ යුතු ප්‍රශ්නයක්. දැන් ජනතා විමුක්ති පෙරමුණ, පෙරටුගාමී සමාජවාදී පක්ෂය වාගේම අන්තරය ප්‍රගතිශීලී ගොඩක් විසඳුම්වලට විරුද්ධයි; ඒවා ඔවුන්ට allergic. මොකද, විශේෂයෙන්ම පෞද්ගලික අංශය ඒ සඳහා තරග කරනවා නම් ඒක හොඳ නැහැ කියනවා. යම් ප්‍රමාණයකට ඒගොල්ලන්ගේ භය, සැකය සාධාරණයි. මොකද, අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක් නොකර රැක ගත යුතුයි කියන සාධාරණ පැත්තක් තිබෙනවා. මම ඒක "නැහැ" කියන්නේ නැහැ. හැබැයි, ප්‍රගතිශීලී, සාක්ෂි, දත්ත මත පදනම් වූ සාධාරණ, යුක්ති සහගත විසඳුම් අවශ්‍යයි, අපට ඉස්සරහට යන්න නම්. ප්‍රායෝගික විසඳුම් ඕනෑ. එහෙම නැත්නම් අපි එක තැන පල් වෙනවා. අපි කොතැනද හිටියේ? ආසියානු කලාපය තුළ අධ්‍යාපනය පළමුවැනි තැනට තිබුණු රටක්, අපේ රට; සාක්ෂරතාව පළමුවැනි තැනට තිබුණු රටක්. හැබැයි, අද අපේ ළමයි ලෝකයේ හැම තැනටම අධ්‍යාපනය ලබා ගන්න යනවා. බොහොම දුකයි, ඒ ගැන බලනකොට. අපට වැරදිච්ච තැනක් තිබෙනවා. හැබැයි, ඒකෙන් අපි පාඩම් ඉගෙන ගන්න ඕනෑ. අගමැතිතුමිය මා සමඟ ඊට එකඟ වෙයි, කෙළින්ම ඒ ගැන කියන්න බැරි වුණාට.

රාගම, North Colombo Medical College එක 1981 සැප්තැම්බර් මාසයේ 21වැනි දා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, හීන්නිලමේ වෛද්‍යවරයාගේ සභාපතිත්වයෙන් විවෘත කළා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ ඒකට විරුද්ධ වෙලා, 1987දී බෝම්බයක් ගැහුවා. 1989දී ඒක වහලාම දැම්මා. 1990 අවුරුද්ද වෙනකොට මහතීර් මොහොමඩ් මොකක්ද කළේ? ලංකාවේ ඒ වෛද්‍ය විද්‍යාලයේ - faculty එකේ - හිටපු ආචාර්ය, මහාචාර්යවරු ඇතුළු ඔක්කෝම මලයාසියාවට අරගෙන ගිහිල්ලා, ක්වාලාලම්පූර්වල පටන් ගත්තා, International Medical University එක. අද වනකොට හැම වර්ෂයකදීම වෛද්‍ය සිසුන් 100ක් ලංකාවෙන් යනවා, එහි ඉගෙන ගන්න. රිසාඩ් බදියුදීන් මහත්මයාගේ දරුවාත් එහාට ඉගෙන ගන්න යනවා. ඩොලර් මිලියන ගණනක් වියදම් කරනවා, එහේ ගිහිල්ලා. ඒක මෙහේ තිබෙන්න ඕනෑ විශ්වවිද්‍යාලයක්. ඒක වැහුවේ ඔබතුමන්ලා.

අද ලංකාවේ තත්ත්වය ගැන බලන්න. ලංකාවේ විශ්වවිද්‍යාල 22ක් තිබෙනවා. ඒකෙන් 16ක් UGC එක යටතේ තිබෙන්නේ. විශ්වවිද්‍යාල 16ක උපාධි 126ක් තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, 2023-2024 වර්ෂයේ සිසුන් 194,336ක් සුදුසුකම් ලැබුවා, විශ්වවිද්‍යාලයට යන්න. හැබැයි, විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගත්තේ සිසුන් 43,882යි. ඒ කියන්නේ, විශ්වවිද්‍යාලය ඇතුළට ගත්තේ සියයට 22යි. සුදුසුකම් ලැබූ අය, pass වෙච්ච අය සියයට 77ක් ප්‍රතික්ෂේප කළා, ඉඩ නැති නිසා.

වෛද්‍ය පීඨය උදාහරණයකට ගන්න. 2023-2024 වෙනකොට ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨ තිබුණේ 12යි. ඒ වෛද්‍ය පීඨ 12න්, 2ක් යහ පාලන ආණ්ඩුව කාලයේ අපි තමයි විවෘත කළේ. හැබැයි, last intake එක දෙස බැලුවාම අපට පෙනෙනවා, වෛද්‍ය විද්‍යාලයට සුදුසුකම් ලැබූ - qualified - සංඛ්‍යාව 27,586ක් බව. නමුත්, ඇතුළත් කර ගත්තේ 2,106යි; සියයට 7.6යි. සියයට 92ක් ප්‍රතික්ෂේප වුණා. සුදුසුකම් ලැබුවත් සියයට 92ක් ප්‍රතික්ෂේප වුණා. ඒගොල්ලන් පව්. ඒගොල්ලන් කොහේ යන්නද? ලංකාවේ වෛද්‍ය උපාධියක් හදාරන්න වෙන තැනක් නැහැ. එතකොට කියනවා, රට පලයල්ලා කියලා. රට යනකොට මොකක්ද වෙන්නේ? ඩොලර් කෝටි ගණනක් අපි රටින් පිටතට වියදම් කරන්නේ නැද්ද? ඒ වෛද්‍ය විද්‍යාලවලට ගත්ත සියයට 7.6න්, සියයට 50ක් වරප්‍රසාද ලත් පවුල්වල ළමයි වෙන්න පුළුවන්. ඒ වාගේම ප්‍රතික්ෂේප වෙච්ච සියයට 92න්, සියයට 50ක්ම දුප්පත් ළමයි වෙන්නත් පුළුවන්. කොහොමද, ඒක ගණන් හදලා බලන්නේ? එතකොට ඒ දුප්පත් ළමයින්ට යන්න තැනක් තිබෙනවාද? එතැනින් ඒගොල්ලන්ගේ ජීවිතයම ඉවරයි. ඒ ළමයි වෙනුවෙන් ඉඩක් හදන්නේ නැද්ද? නැත්නම් ඔබතුමන්ලා සියයට 6ක්ම වියදම් කරලා තවත් වෛද්‍ය විද්‍යාල හදලා, රජයෙන්ම ඒ පහසුකම් ලබා දෙනවාද? අපට ඒකට උත්තරයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

British Council එකෙන් කරපු සමීක්ෂණයක් තිබෙනවා. ඒ සමීක්ෂණයෙන් පෙන්නුම් කර තිබෙනවා, එංගලන්තයේ ඉගෙන ගන්නා විදේශ සිසුන් අතරින් වැඩිම විදේශ සිසුන් සිටින රටවල් 10න්, ශ්‍රී ලංකාව දෙවැනි තැනට පත්ව තිබෙනවාය කියලා. ඉගෙන ගන්න පිට රටවලට වැඩියෙන්ම යන්නේ චීනයේ ළමයි. හැබැයි, චීනයේ ජනගහනය මිලියන 1,200යි. අපේ රටේ ඉන්නේ පොඩි ජනගහනයක්. නමුත්, ඒ ප්‍රමාණයෙනුත් ශ්‍රී ලංකාව දෙවැනි තැනට පත් වෙලා තිබෙනවා. වැරදි තීන්දු තීරණ නිසා අපට හිමි වෙච්ච දේ ඒකයි.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මඩකලපුව විශ්වවිද්‍යාලයේ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මගේ මිත්‍ර මහාචාර්ය යුවරාජ් තංගරාජා මැතිතුමා ඇවිල්ලා ඔබතුමියට ලිපියකුත් භාර දුන්නා. එතැන ක්‍රමවේදය ගත්තොත්, Department of Sociology and Anthropologyහි විභාග තියන්නේ නැතුව ලකුණු දෙනවා. ඒක නියාමනය කරන්නේ නැහැ. හොර වැඩ වෙනවා; සිසුන්ට බාධා කරනවා; කරදර කරනවා. සිසුන්ට නරක වැඩ ගොඩක් කරනවා. මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමිය විධියට කටයුතු කරන ගරු අගමැතිතුමිය මේ සභාවේ සිටින මොහොතේ මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මොකද, සමහර වෙලාවට මේ සභාවේ ඇමතිවරු ඉන්නේ නැහැ; එතුමන්ලාට එහෙම ඉන්නත් බැහැ. ඒකට කමක් නැහැ.

පළමුවෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමිය දැන් education reformsවලට යොමු වෙලා ඉන්නවා; ඒ වෙනුවෙන් මුළු අමාත්‍යාංශයම යොමු වෙලා ඉන්නවා. ඒක හොඳයි. ගරු ඇමතිතුමියනි, ඔබතුමිය මට කියන්න, ඔබතුමියගේ reform programme එක තුළ ජාතික සංහිඳියාවට විශේෂ අවධානයක් යොමු කර තිබෙන්නේ කොතැනද කියලා. ඒක, එකක්. දෙවැනි කාරණය හැටියට ගරු අගමැතිතුමියනි, underprivileged කණ්ඩායමට, ඒ කියන්නේ වරප්‍රසාද නොලත් කණ්ඩායමට විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ නේ. ඒක අපි පිළිගන්න ඕනෑ නේ. ඔබතුමියගේ Subcommittee එකේදීත් මම මේ ගැන කිව්වා. මේ කරුණු දෙකම සම්බන්ධයෙන් ඔබතුමියගේ මේ reforms තුළ අවධානය යොමු කර තිබෙන්නේ කොතැනද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, මගේ කාලයෙන් අඩු කරන්නේ නැත්නම් ඔබතුමිය කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලයෙන් අඩු කරන්නේ නැත්නම් එතුමියට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අගමැතිතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන්ම අපි මේ ප්‍රතිසංස්කරණ කරන එකේ මූලික පරමාර්ථයක් වෙලා තිබෙන්නේ ඔය තිබෙන විෂමතාව හඳුනාගෙන, සියලු දරුවන්ට ඒ ගුණාත්මක අධ්‍යාපනය වෙනසක් නැතුව ලබා දෙන එකයි. ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු සිදු වෙනවා. සංහිඳියාව කියන එක ගත්තොත්, අපේ curriculum එකේ තිබෙනවා, transversal skills modules කියලා දේවල්. ඒ කියන්නේ, පොදුවේ සියලුම ශිෂ්‍යයින්ට හොඳ පුරවැසියෙක් හැටියට ලැබිය යුතු දැනුම සහ අත්දැකීම්. ඒ හරහා අපි සංහිඳියාව වැනි විෂයයන් එකතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු අගමැතිතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි. ඔබතුමිය මේක එක කෝණයකින් දකිනවා. මම දකින්නේ මෙහෙමයි. දැන් බලන්න, මේ රටේ විශේෂයෙන්ම සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව එහෙම නැත්නම් හින්දු, ඉස්ලාම්, කතෝලික, බෞද්ධ ජනතාව මිශ්‍රවෙලා ජීවත් වෙනවා. ඔබතුමියත් කොළඹ දිස්ත්‍රික්කයේ. ඒ නිසා අපි කොළඹ දිස්ත්‍රික්කය අරගෙන බලමු. මේ දිස්ත්‍රික්කයේ අපි දකිනවා, බෞද්ධ පාසල්, හින්දු පාසල්, කතෝලික පාසල් තිබෙනවාය කියන එක. එහෙම නැත්නම් සිංහල, දෙමළ සහ මුස්ලිම් පාසල් තිබෙනවා. මේ සංකල්පය කඩලා දමන්න. ඒ අවස්ථාව මේකට ඕනෑ. අලුත් සංකල්ප මේකට ඕනෑ. මොකද, ළමයි කුඩා කාලයේදී අපි කියනවා, හින්දු පාසල්වල හින්දු ළමයි, Catholic පාසල්වල Catholic ළමයි, බෞද්ධ පාසල්වල බෞද්ධ ළමයි යවන්න ඕනෑ කියලා. එහෙම ළමයි හදලා ඒ දරුවෝ ලොකු වුණාට පස්සේ අපි කියනවා, "ඔක්කොම ශ්‍රී ලාංකිකයින් විධියට නැඟිටලා ඉන්න." කියලා. එතකොට වැඩක් නැහැ නේ. එතකොට කෝච්චිය ගිහිල්ලා ඉවරයි. මම ජාතික සංහිඳියාව කියන එක දකින්නේ එහෙම තමයි. ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා හිටපු ඇමතිවරයා හැටියට මම ඒක දකින්නේ එහෙම තමයි. එම නිසා ඒ ගැනත් පොඩ්ඩක් බලන්න. ඒ ඔක්කෝම එක වතාවට කරන්න බැහැ. නාලන්දා විදුහල, ආනන්ද විදුහල, හින්දු විදුහල, කතෝලික විදුහල ක්‍රියාත්මක කරන මේ ක්‍රමවේදය කඩලා මේ දේවල් කරන්න බැහැ. නමුත්, කොතැනින් හරි මේක පටන් ගන්න. ඒක පටන් ගන්න කියලා මම යෝජනා කරනවා. ඒක, එක කාරණයක්.

අනෙක් කාරණය මේකයි, ගරු අගමැතිතුමියනි. මම මීට පෙරත් මේ ගැන ඔබතුමියට කියලා තිබෙනවා. කොළඹ තිබෙන ජාතික පාසල් 3ක් ගැන මම කියන්නම්. එකක්, Royal College එක. අනෙක, D. S. Senanayake College එක. අනෙක් එක තමයි, Isipathana College එක. මේ පාසල් තුනම ආණ්ඩු හරහා දියුණු වෙච්ච රජයේ පාසල් 3ක්. මේ පාසල් තුනේම දෙමළ භාෂා මාධ්‍ය පන්ති අඩු කරගෙන, අඩු කරගෙනම එනවා. යහ පාලන ආණ්ඩුව කාලයේ මම කැබිනට් මණ්ඩලයේ ඉන්නකොටත් මේ සම්බන්ධයෙන් කබීර් හෂීම් මැතිතුමාගේ නායකයා එක්කත් මම සටන් කළා. මෙතුමාගේ නායකයා කවුද කියලා ඔබතුමිය දන්නවා නේ. එතුමාත් Royal College ගිය කෙනෙක්. අධ්‍යාපන ඇමතිතුමා එක්කත් මම මේ ගැන රණ්ඩු කළා; සාකච්ඡා කළා. ඒත් බැරි වුණා. මොකද, Royal College එකේ තිබෙන දෙමළ පන්ති ටික අඩු කරගෙන එනවා. ඒ ගැන බලන්න.

අනික් කාරණය මේකයි. පන්තිවල ඉන්න ළමයි සංඛ්‍යාව කීයද කියලා බලන්න. විස්සයි, විසිදෙකයි ඉන්නේ. සාමාන්‍යයෙන් පන්තියක ළමයින් 40ක්, 45ක් ඉන්නවා. හිතාමතා,

[ගරු මනෝ ගනේසන් මහතා]

systematically, they are bringing down the number of students in a class and the number of classes also. එතකොට, Sinhala-medium classes 12ක් තිබෙනවා. Tamil-medium පන්ති දෙකයි තිබෙන්නේ. කොළඹ නගරය තුළ දෙමළ භාෂාව කථා කරන ජනතාව තමයි බහුතරයක් ඉන්නේ; සියයට 60ක් ඉන්නවා. එහෙම බලනකොට දෙන්න ඕනෑ නේ. නමුත්, එහෙම අවස්ථාව දෙන්නේ නැහැ. සියයට 60කට වැඩිය ඉන්නකොට සියයට 50, 50 වාගේ දෙන්න ඕනෑ. පන්ති 10ක් තිබෙනවා නම්, class එකක ඉන්නේ ළමයි 40ක් නම් 400කට ඉගෙන ගන්න පුළුවන්. ඒ වාගේ එක වහලක් යට සිංහල ළමයින්ට, දෙමළ ළමයින්ට හා මුස්ලිම් ළමයින්ට අධ්‍යාපනය ලබා ගන්න අවස්ථාව තිබෙනකොට අපි ඒක කරන්නේ නැහැ. ඒක එතැනින් පටන් ගන්න. භය නැතුව පටන් ගන්න. ඒක තමයි ජාතික සංහිඳියාව හැටියට මම දකින්නේ. NPP එකේ ඔබතුමන්ලා system change කරනවා කියලා ආපු ආණ්ඩුවක් නේ. ඉතින් ඒක ඔබතුමන්ලා කරන්නේ නැතුව වෙන කවුද කරන්නේ?

ගරු අගමැතිතුමියනි, කන්නන්ගර මහත්මයා තමයි නිදහස් අධ්‍යාපනයේ පියා කියලා කබීර් හෂීම් මන්ත්‍රීතුමා ඇතුළු ඔක්කෝම කියනවා. මම නම් ඒක කියන්නෙ නැහැ. කාරණාව මොකක්ද? එතුමා රටට නිදහස් අධ්‍යාපනය ලබා දුන්නා වුණාට, එතුමා වතුකරයේ පාසල් ගැන හරියාකාරයෙන් අවධානය දැක්වූයේ නැහැ. ඒ සම්බන්ධව එතුමාට යෝජනා කළ අවස්ථාවේදීත් එතුමා ඒක පැත්තකට දැම්මා. "නැහැ, ඕනෑ නැහැ. අවශ්‍ය නැහැ" කිව්වා. එම නිසා අපි එතුමාව නිදහස් අධ්‍යාපනයේ පියා කියලා පිළිගන්නේ නැහැ. 1977දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ අවසාන කාලයේ තමයි වතු පාසැල් ඔක්කෝම ජාතික අධ්‍යාපන පද්ධතියට ඇතුළු වුණේ. එම නිසා, we are late starters; we started late. Therefore, our educational indices are low; all the educational indices are very low. ඒ වාගේ අඩු දියුණු වෙච්ච marginalized and underprivileged segments ගැන වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මේවා ඔබතුමියට කියලා දෙන්න ඕනෑ නැහැ. ඔබතුමිය දන්නවා world affirmative principles ගැන. ඒ කියන්නේ, අඩු දියුණු වෙච්ච අයට විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑ. සැලකිල්ලක් අවශ්‍යයි. බලන්න, ඉන්දියාව දිහා. ඒගොල්ලන් අධ්‍යාපනය වේවා, රැකි රක්ෂා වේවා, අඩු දියුණු වෙච්ච කණ්ඩායම් හඳුනාගෙන වැඩි අවධානයක් යොමු කරනවා; ඒ අයට attention දෙනවා. එහෙම වෙන්න ඕනෑ. මොකද, විවිධ කාරණා නිසා එලෙස වෙනවා. ජන වාර්ගික කාරණා නිසා, එහෙම නැත්නම් ඉතිහාස කාරණා නිසා අඩු දියුණු වෙච්ච කණ්ඩායම හඳුනාගෙන ඒ අයට විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑ. That is what is called World Affirmative Action, affirmative principles. ඒ විධියට දකින්න නැහැ නේ, අපේ රටේ. When the ground is not even, you cannot expect all of us to run equally. It can never happen, Madam Prime Minister. එහෙම වෙන්න බැහැ. මොකද, අපි late startersලා නිසා විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑ.

වතු පාසැල් ජාතික අධ්‍යාපන පද්ධතියට ඇතුළු වුණාට ඒවා තවමත් සම්පූර්ණ වෙලා නැහැ, ගරු අගමැතිතුමියනි. අනික, තව ප්‍රශ්න තිබෙනවා නේ. තවම පළාත් සභා ක්‍රියාත්මක වෙන්නේ නැහැ නේ. පළාත් සභාවලට වැඩියෙන්ම පැවරුණු බලතල තමයි, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පිළිබඳ බලය. ඒ දෙකම එහෙම තමයි ක්‍රියාත්මක වෙන්නේ. දැන් පළාත් සභා ක්‍රියාත්මක නොවන නිසා පාසල්වලට අවශ්‍ය අවධානය යොමු කරන්න බැරි වෙලා තිබෙනවා. ඒක වෙනම ප්‍රශ්නයක්. නමුත්, මම මේ කාරණය ඔබතුමියගේ අවධානයට ගෙනෙන්නේ ඔබතුමිය අධ්‍යාපන විෂය භාර ඇමතිතුමිය විතරක් නොවෙයි, මේ රටේ අගමැතිතුමිය නේ. එම නිසා මේ ප්‍රශ්නය ගැන බලන්න. පද්ධතියේ ජාතික පාසැල් කියලා කොටසක් තිබෙනවා. විශ්වවිද්‍යාල තිබෙනවා. පළාත් සභා යටතේ තිබෙන පාසල් තිබෙනවා. පළාත් සභා යටතේ තිබෙන පාසල් තමයි වැඩියෙන්ම තිබෙන්නේ. දැනට පළාත් සභා පාසැල් ඔක්කෝම බලන්නේ ආණ්ඩුකාරතුමා. ආණ්ඩුකාරතුමන්ලාට, ආණ්ඩුකාරතුමියලාට ඒවා බලන්න බැහැ. එම නිසා එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. මම මීට කලිනුත් ඔබතුමියට මෙය කියා තිබෙනවා. රටේ පළාත් නවයක් තිබෙනවා. සෑම පළාතකටම a Director of Education ඉන්නවා. එම නිසා කරුණාකරලා දෙවැනි භාෂාව සම්බන්ධව තිබෙන ප්‍රශ්න ටිකට අවධානය යොමු කරන්න Additional Director කෙනෙක් පත් කරන්න. භාෂා එක සමානවයි තිබෙන්නේ. මම කියන්නේ, බහුතරයක් කථා කරන භාෂාව හැර දෙවැනියට වැඩි ප්‍රමාණයක් කථා කරන භාෂාව ගැන. ඒ අය ගැන බලලා, ඒ අයට පාසල් සම්බන්ධව තිබෙන ප්‍රශ්න ටිකට අවධානය යොමු කරන්නට Additional Director කෙනෙක් පත් කරන්න. සෑම පළාතකටම පත් කරන්න. පළාත් නවයක් තිබෙනවා. උතුර, නැගෙනහිර දෙමළ පාසල් වැඩියෙන් තිබෙනවා නම්, දෙමළ භාෂාව කථා කරන කෙනෙකු Director of Education වෙනවා නම් සිංහල කථා කරන කෙනෙක් Additional Director වෙන්න ඕනෑ. අනික් පළාත්වලටත් ඒ වාගේ පත් කරන්න. එය එලෙසම පහළ මට්ටමට අරගෙන යන්න; කලාප මට්ටමට - zonal level එකට - අරගෙන යන්න. මොකද, අධ්‍යාපනය කියනකොට ළමයින්ගේ ප්‍රශ්න පමණක් නොවෙයි, ගුරුවරුන්ගේ ප්‍රශ්නත් තිබෙනවා. ඒ වාගේම administrative ප්‍රශ්නත් තිබෙනවා. ඒ ප්‍රශ්න හඳුනා ගන්න පුළුවන් වන්නේ, එම පාසලේ කථා කරන භාෂාව - medium එක - දන්නා සහ එම භාෂාව කථා කරන්න පුළුවන් නිලධාරියෙකුට.

ඒ නිසා එහෙම නිලධාරියකු පත් කරන්න. එහෙම දාලා, සෑම තැනම බලන්න. නුවරඑළිය ගත්තාම, නුවරඑළියේ දමිළ පාසල් වැඩියෙන් තිබෙනවා. හැබැයි, කලාප කාර්යාලවල දෙමළ අධ්‍යාපන අධ්‍යක්ෂවරු නැහැ. ඒ ගැන සොයා බලන්න. සොයා බලා ඒකට විසඳුමක් දෙන්න. එහෙම දෙමළ අය පත් කරන්න කියන්නේ ජාතිවාදය නිසා නොවෙයි. ඒක ඔවුන්ගේ අයිතිය. ජාතිවාදය නිසා කියනවා කියලා හිතන්න එපා. ඒක අයිතිය. ඒක ලැබෙන්න ඕනෑ අපට. ඒක නැහැ කියන එක තමයි ජාතිවාදය. ඒ ජනතාවට සාධාරණ බලාපොරොත්තුවක් තිබෙනවා තමන්ගේ පාසල්වල පරිපාලන කටයුතු සිදුවෙන්න ඕනෑ විධිය ගැන ඒ භාෂාව දන්නා කෙනෙක් එක්ක සාකච්ඡා කරන්න, වාඩිවෙලා කථා කරන්න. ඒක කරන්න විධියක් නැහැ. ඒ අයට භාෂාව තේරෙන්නේ නැහැ. ඒ ගැන පොඩ්ඩක් බලන්න. ඒක කරන්න අවශ්‍යයි.

නැවත මම කියන්න කැමැතියි, වතු ප්‍රදේශවල තිබෙන පාසල් ගැන. කොළඹ, අවිස්සාවේල්ල වාගේම කළුතර, කෑගල්ල, රත්නපුර, මහනුවර, මාතලේ, නුවරඑළිය, මොනරාගල, ගාල්ල, මාතර, කුරුණෑගල කියන දිස්ත්‍රික්කවල වතු තිබෙනවා. මේ ප්‍රදේශවල තිබෙන වතු පාසල් ගැන සොයා බලන්න වතු පාසල් පිළිබඳ විශේෂ කමිටුවක් පත් කර assessment එකක් කරන්න. ඒගොල්ලන්ට තිබෙන අඩුපාඩු සොයා බලන්න. ඒක කරන්න ඕනෑ. ඔවුන්ට ඕනෑ මොනවාද කියලා සොයා බලන්න. ඔබතුමියගේ reform programme එක ඒ අය අතරට අරගෙන යන්න. ඒක අරගෙන යන ගමන් මේ කටයුත්තත් කරන්න. එහෙම කරලා ඒ assessment report එක අරගෙන, ඒක පදනම් කරගෙන කරුණාකර ඒ ළමයින්ට සාධාරණය ඉෂ්ට කරන්න කියා ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා. ඒක අවශ්‍ය වෙනවා අපට. නැත්නම් මේක කරන්න බැහැ.

ඊළඟට, අනික් ප්‍රධාන ප්‍රශ්නය තමයි, මේ දමිළ භාෂාව කථා කරන ජනතාවගේ ළමයි ඉගෙන ගන්න පාසල්වල උතුර, නැඟෙනහිරින් පිට මම දැන් කියපු දිස්ත්‍රික්කවල,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
විනාඩි දෙකෙන් මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ පාසල්වල තිබෙන ප්‍රධානම ගැටලුව තමයි ගුරුවරුන්ගේ ප්‍රශ්නය. ගුරුවරුන් යොදවා තිබෙනවා. නමුත්, ඒ ප්‍රශ්නය විශේෂයෙන් තිබෙනවා මේ පාසල්වල. රත්නපුර, කෑගල්ල, කළුතර, මාතලේ, ගාල්ල, මාතර වාගේ දිස්ත්‍රික්කවල තිබෙන වතු පාසල්වල science teachersලා නැහැ; science subjects තිබෙන පාසල් නැහැ; science stream තිබෙන පාසල් නැහැ. මේවා ගැන ලජ්ජා වෙන්න ඕනෑ, අපි. ගුරුවරුන් නැහැ. අනික් එක ගුරුවරුන් නැහැ කියන එක පොදුවේ කියන්න බැහැ නේ, ගරු අගමැතිතුමියනි. ගුරුවරුන් නැති වුණාට ඒ subject එක උගන්වන්න ඕනෑ නේ. Science අධ්‍යාපනය ලබා දෙන්න Arts teacher කෙනෙක් දමන්න බැහැ නේ. මේ සම්බන්ධව දැනට අපි සාකච්ඡා කර තිබෙනවා, Indian High Commissioner සමඟ. ඒ අය ලැහැස්ති වෙලා ඉන්නවා, ඒ අය මේ වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. කරුණාකර, මේ සුවිශේෂ මුදල අරගෙන වෙන දෙයකට පාවිච්චි කරන්නේ නැතිව මේ සඳහා පාවිච්චි කරන්න. පාවිච්චි කරලා, ඒ ගැන සාකච්ඡා කරන්න. අපි විපක්ෂයේ ඉඳගෙන ඒ සම්බන්ධයෙන් ඔබතුමියට උදවු කරන්න ලැහැස්තියි. මොකද, underprivileged ජනතාවට අත දීලා, ඔවුන් උස්සලා ගන්න එකට කාටත් වගකීමක් තිබෙනවා නේ. ඒක කරන්න ඕනෑ. ඒ නිසා ඒ මුදල් අරගෙන විශේෂිත ගුරු පුහුණු පාසලක්, පද්ධතියක්, entity එකක් හදන්න. හදලා, ඒකෙන් විශේෂයෙන් Tamil-medium පාසල්වල ගුරු හිඟය address කරන්නට ඒක පාවිච්චි කරන්න. ඉන්දියාව ලැහැස්ති වෙලා ඉන්නවා, උදව් කරන්න. දැන් අපි වතුවල ගෙවල් හදනවා නේ. ඒක කරනවා නේ. ඒ ගැන ඉන්දියාවට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉන්දියාවට පෙන්වා දීලා, උදවු කරන්න කියන ඉල්ලීම කරලා, ඒ ගැන සාකච්ඡා කරලා, ඔය මුදල් ලබා දුන්නේ අපි. අපි නිකම් හිටියේ නැහැ. අපි විපක්ෂයේ හිටියා කියලා නිකම් හිටියේ නැහැ. කමක් නැහැ. නමුත්, ඒ මුදල දුන්නේ අපට නොවෙයි නේ, ලංකා ආණ්ඩුවට; ජනතාවට. මට නොවෙයි දුන්නේ. ඔබතුමියටත් නොවෙයි දුන්නේ. ලංකාවට දුන්නේ; ලංකාවේ ජනතාවට දුන්නේ. ඉන්දියාව මිත්‍රශීලී රටක්. ආණ්ඩුවක් හැටියට ඔබතුමිය ඒ කටයුත්ත කරන්න. ඒකට අවස්ථාව තිබෙනවා. ඒක කළොත් තමයි අපට මේ underprivileged ජනතාව; අපේ ජනතාව; ඔබේ ජනතාව; අපි කාගෙත් ජනතාව; ශ්‍රී ලාංකික ජනතාව උස්සලා ජාතික මට්ටමට ගෙනෙන්න පුළුවන් වෙන්නේ. අපේ මේ ගරු මන්ත්‍රීතුමා කථා කරනකොට මම අහගෙන සිටියා. අපි දැන් ජාත්‍යන්තර මට්ටමට යන්නේ කොහොමද කියන එක ගැන එතුමා කථා කළා. මම කථා කරන්නේ ඒ ගැන නොවෙයි. මම කථා කරන්නේ ජාතික මට්ටමට කොහොමද යන්නේ කියන එක ගැනයි. ලංකාව දූපතක්. ඒ දූපත තුළ එක් කොටසක් තමයි කඳුකරය. ඒ කඳුකරය ජාතික මට්ටමට ගෙනෙන්න ඕනෑ. ඒකටයි මම උත්සාහ කරන්නේ. එතුමා උත්සාහ කළේ වෙනත් දෙයකට. ඒකට කමක් නැහැ; ප්‍රශ්නයක් නැහැ. එතැනට ඇවිල්ලා නේ ඉස්සරහට යන්න ඕනෑ. ඒ නිසා ඒක කරන්න, ඔබතුමිය. අධ්‍යාපන ඇමතිතුමිය හැටියටත්, අගමැතිතුමිය හැටියටත් ඔබතුමිය ඒක කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. M.K.M. ASLAM took the Chair.*

[අ.භා. 3.09]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරන්න කලින් මම පුංචි කාරණයක් මතක් කරන්න කැමැතියි. අද මේ සභාවේදී Ragama Medical Faculty එක ගැන කථා කළා. ඇත්තටම ඒ මන්ත්‍රීතුමාට කරන නිසි ගෞරවය සහිතව මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වසා දැමුවේ නැහැ. ඒක රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළු කළා. අද රාගම Ragama Medical Faculty එක කියලා කියන්නේ ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාලවල තිබෙන Medical Faculties 12න් පස්වෙනි එක. එය මහජන අරගළයේ ප්‍රතිඵලයක් හැටියට තමයි ලැබුණේ. අද වන විට ළමයින් සිය ගණනක් වෛද්‍ය අධ්‍යාපනය ලබන වෛද්‍ය විද්‍යාලයක් හැටියට තමයි රාගම Ragama Medical Faculty එක ඉතිරි වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කථා කරන කොට වැදගත් වෙන්නේ, අය වැය තුළ එම ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගන්න රුපියල් ශත කොච්චර වෙන් කරලා තිබෙනවාද, එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා කොයි තරම් දුරට සාධනීය යෝජනා ඉදිරිපත් කරනවාද කියන එකයි. නමුත්, මම මේ වෙලාවේ විශේෂයෙන් අවධානය යොමු කරන්න කැමැතියි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන්. විශේෂයෙන් අධ්‍යාපනය පිළිබඳ පරිවර්තනීය වෙනසක් ගැන සාකච්ඡා ඇති වෙලා තිබෙන මොහොතක, ඒ පරිවර්තනීය වෙනස සඳහා වන සාධනීය පියවර මේ කාලය තුළ ගන්නේ කොහොමද සහ 2026 අය වැය ඒ සඳහා කොයි තරම් දුරට ඉවහල් වෙනවාද කියන කාරණාව ඉතා වැදගත් වනවා.

සාමාන්‍යයෙන් අපේ රටේ අධ්‍යාපනය දශක ගණනක් තිස්සේ පවත්වා ගෙන ගිය අයත්, ඒ වෙනුවෙන් දායක වෙච්ච අයත්, ඉන් පරිබාහිරව හිටපු අයත් කියන පොදු කාරණයක් තමයි පවතින

[ගරු අනුර කරුණාතිලක මහතා]

අධ්‍යාපන ක්‍රමය පිළිබඳව විවේචනය කිරීම. මේ ගරු සභාවේදී මට කලින් ගරු මන්ත්‍රීතුමෙක් කථා කළා. මට මතක හැටියට ඒ මන්ත්‍රීතුමාගේ තාත්තාත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් රාජ්‍ය ඇමතිවරයෙකු විධියට මේ ගරු සභාවේ කථා කළ මන්ත්‍රීතුමෙක්. හැබැයි, ඒ තාත්තාගේ පුතාට අද සිද්ධ වෙලා තිබෙනවා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පවතින අධ්‍යාපන ක්‍රමයේ තිබෙන අඩු පාඩුකම් ගැන කථා කරන්න. මේ විධියට පවතින අධ්‍යාපන ක්‍රියාවලියට දායක වෙච්ච අයට වාගේම, දායක නොවුණු අයටත් පවතින අධ්‍යාපන ක්‍රමය සම්බන්ධයෙන් තිබෙන්නේ විවේචනයක්. ඒ විවේචන අතර ප්‍රධාන එකක් තමයි, අපේ තිබෙන අධ්‍යාපනය මානව සංවර්ධනයට අදාළ වෙන්නේ නැහැ, ඒ වාගේම සේවා නියුක්තියට අදාළ වෙන්නේ නැහැ කියන එක. ඒකෙන් මම අදහස් කරන්නේ නැහැ, අධ්‍යාපනය කියන්නේ jobs හදන ෆැක්ටරි කියලා. හැබැයි, සේවා නියුක්තියට කිසියම් විධියකට දායකත්වයක් දැක්වීමක් සිදු වෙන්න ඕනෑ; ඒකට අදාළ පරිදි මානව සංවර්ධනයත් වෙන්න ඕනෑ. ඒ වාගේම තිරසාරත්වය සහ නවෝත්පාදනයට ඉඩ ප්‍රස්ථාව අපේ අධ්‍යාපන ක්‍රමයෙන් හදන්නේ අඩුවෙන්ය කියලාත් විවේචනයක් තිබෙනවා. අප නොමිලේ ලබා දෙන නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ගැන කථා කළත් ඒ වෙනුවෙන් දෙමාපියන්ට විශේෂයෙන් වැය බරක් දරන්න සිදු වෙනවා කියන විවේචනයත් තිබෙනවා. ඒ වාගේම යාවජීව අධ්‍යාපනය සඳහා අපේ ළමයින් හුරු කරන්න සිදු වීම සම්බන්ධයෙනුත් පවතින අධ්‍යාපන ක්‍රමයට විවේචනයක් තිබෙනවා.

සාමාන්‍යයෙන් අපේ රටේ අධ්‍යාපනය ඉලක්ක වෙන්නේ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් වෙතයි. විමර්ශනාත්මක ඉගෙනීම වෙනුවට විභාග සමත් වීම ඉලක්ක කර ගත් අන්තර්ගත දැනුම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක් පිළිබඳ විවේචනයක් තමයි අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන්නේ. මෙන්න මේ හේතුව නිසාම විෂය මාලාව අධික ලෙස විෂය කරුණුවලින් පිරිච්ච; න්‍යායාත්මක විෂය කරුණුවලින් පිරිච්ච එකක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම දරුවාගේ කුසලතාවන් හා විභවයන් ඔප් නංවා ගන්නවා වෙනුවට කිසියම් ආදර්ශයකට, mould එකකට නතු කිරීමක් අපේ අධ්‍යාපන ක්‍රියාවලියෙන් සිදු වෙනවා කියන විවේචනයත් සමාජය තුළ තිබෙනවා. මේ නිසාම දරුවා පිළිබඳ නිවැරදි, යථාර්ථවාදී තක්සේරුවක්, ඇගයීමක් කරන්න අපේ අධ්‍යාපන ක්‍රියාවලිය අසමත් වෙලා තිබෙනවා. න්‍යායාත්මක කුසලතා කට පාඩම් කිරීමට අනුබල දෙන විෂය කරුණුත්, ඒ විෂය කරුණු ප්‍රදානය කිරීම සඳහා, deliver කිරීම සඳහා අපේ අධ්‍යාපන ක්‍රමය සැකසීම නිසා ඇත්තටම ළමයා පිළිබඳ නිවැරදි තක්සේරුවක් ලබා ගන්න අපේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ අපි අසමත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙම අධ්‍යාපන ක්‍රමයේ තිබෙන තරගකාරිත්වය පිළිබඳවත් කිව යුතුයි. මෙම අධ්‍යාපන ක්‍රමය අතිශය තරගකාරී වීමත් දරුවාට විශාල බරක් වෙලා තිබෙනවා. මේ ගැන සමහර අයට විවේචනයක් තිබෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් අපි දන්නවා 11 වන ශ්‍රේණියෙන් ඔබ්බට පංති පවත්වන ඉස්කෝල අපේ රටේ තිබෙන්නේ සියයට 28යි කියලා. ඒ ඉස්කෝලවලින් සියයට 36ක් විතරයි විද්‍යා, වාණිජ, කලා, තාක්ෂණ විෂයධාරා උසස් පෙළ පන්ති තිබෙන Grade 1AB කියන පාසල් හැටියට තිබෙන්නේ. මෙතැනදී ගැටලුවක්ව තිබෙන කාරණාව තමයි, විද්‍යා විෂය ධාරාවන් සඳහා වන සීමිත ප්‍රවේශය අපේ පාසල් පද්ධතිය තුළ ගැටලුවක්ව තිබීම. ඒ වාගේම උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වන විද්‍යා, ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය වාගේ අංශවලින් සියයට 27ක් පමණයි ප්‍රවේශය තිබෙන්නේ. හැබැයි, ඊට සාපේක්ෂව අනෙක් ක්ෂේත්‍රවල එම ප්‍රමාණය සියයට 47ක් වනවා. මෙහෙම වෙන්න හේතුවකුත් තිබෙනවා. විද්‍යා විෂය ධාරාවේදී දරුවන්ගේ කාර්ය සාධනය අනෙක් විෂයන්ගේ කාර්ය සාධනයට සාපේක්ෂව පහළින් තිබෙන්නේ. උදාහරණයක් හැටියට විද්‍යා නොවන විෂය ධාරාවේ සමත් වීම සියයට 66.7යි. හැබැයි, ජෛව විද්‍යාව ගත්තොත්, සියයට 58.15ක් වනවා; භෞතික විද්‍යාව ගත්තොත්, සියයට 57.8ක් වනවා. ඒ කියන්නේ, ඒ අංශවල කාර්ය සාධනය අනෙක් ඒවාට සාපේක්ෂව ටිකක් පහළින් තිබෙනවා කියන එකයි.

මානව සහ භෞතික සම්පත් බෙදී යෑමේදී පාසල් අතර තිබෙන අසමතුලිතතාවත් අපේ රටේ පාසල් සම්බන්ධයෙන් තිබෙන විවේචනයක්. විශේෂයෙන් ග්‍රාමීය පාසල්වල STEM subjectsවලට ඇති පහසුකම් සීමා වී තිබෙනවා. අන්න ඒ හේතුව නිසාම ඒ දරුවන්ට සිද්ධ වෙනවා, මානව සහ සමාජයීය විෂය ධාරාවන්ට වැඩි නැඹුරුවක් දක්වන්න; තමන්ගේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ඒ පැත්තට යන්න. ඒ වාගේම, වසර 13ක පාසල් අධ්‍යාපනය අපේ benchmark එක වුණත් ඒ අවස්ථාව හිමි කර ගන්න සමත් වෙලා තිබෙන්නේ පළමු වසරට ඇතුළත් වන දරුවන්ගෙන් සියයට 52ක් විතරයි. උසස් අධ්‍යාපනය - විශ්වවිද්‍යාල අධ්‍යාපනය- ලබා ගන්න පුළුවන්කම තිබෙන්නේ සියයට 13ක පිරිසකට විතරයි. අපේ අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනස පිළිබඳ අවශ්‍යතාව අප විසින් තේරුම් ගත යුත්තේ මෙන්න මේ කියන වටපිටාව මතයි.

මේ ගරු සභාවේදී ටියුෂන් මාෆියාව ගැනත් කථා කළා. මේ අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් හැටියට තමයි, ටියුෂන් ක්‍රියාවලිය කියන එක අනිවාර්ය සාධකයක් ලෙස පෙනෙන්නේ. එතකොට අප මේ ටියුෂන් ක්‍රියාවලිය යම්කිසි විධියකට ආමන්ත්‍රණය කරනවා නම්, ඒක එක රැයකින්, එක දවසකින් නීති පනවලා විතරක් හදන්න පුළුවන් එකක් නොවෙයි. ටියුෂන් සඳහා මඟ පෑදුණු අධ්‍යාපන ක්‍රියාවලිය වෙනස් කරන්නේ නැතිව ටියුෂන් විතරක් නතර කරන්න අපට පුළුවන්කමක් නැහැ. ඇත්තටම මේ යෝජනා කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ සිදු වන්නේ, මා ඉහතින් සඳහන් කළ කරුණු ගණනාවක් ආමන්ත්‍රණය කරලා අපේ රටේ අධ්‍යාපන ක්‍රියාවලිය නිවැරදි තැනට ස්ථානගත කිරීමයි. ඒක තමයි අප බලාපොරොත්තු වෙන්නේ.

සමහරු හිතනවා, අධ්‍යාපනයේ මේ පරිවර්තනීය වෙනස කියන්නේ විෂය මාලා සංවර්ධනය විතරයි කියලා. ඒ නිසාම ඒ සම්බන්ධව එල්ල වන විවේචනයකුත් තිබෙනවා. නමුත්, මම මේ වෙලාවේ කියන්න කැමැතියි, ඕනෑම ප්‍රතිසංස්කරණයක, ඕනෑම පරිවර්තනීය වෙනසක වාගේම, මේ පරිවර්තනීය වෙනසේත් යෝජිත විෂය මාලා සංවර්ධනය කියන්නේ එක කුලුනක් විතරයි, එක අන්තර්ගතයක් විතරයි කියන එක. මේ යෝජිත විෂය මාලාව deliver කරන්න අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය, එය වෘත්තීය මට්ටමට ගෙනෙන්න අවශ්‍ය වන සැලසුම, ඒ වාගේම අවශ්‍ය වන යටිතල පහසුකම් සහ පරිපාලන ප්‍රතිසංස්කරණ අතිශය වැදගත් වනවා. විශේෂයෙන් මේ අධ්‍යාපන ක්‍රියාවලියේදී දරුවා පිළිබඳව - 10 වසර දක්වා සහ ඉන් ඔබ්බට- නිවැරදි තක්සේරුව ලබා ගැනීම අතිශයින් වැදගත් වනවා. දරුවා කොයි තරම් දුරට අඛණ්ඩතාවෙන් යුක්තව අධ්‍යාපන ක්‍රියාවලියේ යෙදෙනවාද යනාදි වශයෙන් දරුවා පිළිබඳ සාධාරණ හා විශ්වාසදායක කාර්ය සාධන තක්සේරුවක් ලබා ගැනීම ද අතිශයින් වැදගත්. අධ්‍යාපනයේ මෙන්න මේ කියන පරිවර්තනීය වෙනස් වීම් ඇති කරන්නේ මේ ප්‍රධාන කුලුනු 4ත් එක්ක තිබෙන මහජන දැනුවත්භාවය මතයි. මේ කුලුනු සියල්ල එක සැරේට ක්‍රියාත්මක වුණොත් විතරයි අපට මේ පරිවර්තනීය වෙනස අත්පත් කර ගන්න ඇත්ත වශයෙන්ම පුළුවන්කම ලැබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මට තවත් විනාඩි 2ක් ලබා දෙනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
එතුමාට තවත් විනාඩි 2ක් ලබා දෙන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඇත්තටම අප ඉහත කී කර්තව්‍යය සාර්ථක කර ගත්තේ නැත්නම් මොකද වෙන්නේ? පසුගිය කාලවල අප දැකපු දේ තමයි, විෂය මාලාව සංවර්ධනය සහ එහි වෙනස්කම් සිදු කිරීම. නමුත්, අනෙකුත් කරුණු සම්බන්ධයෙන් අප අවධානය යොමු කරන්නේ ඉතාම අඩුවෙන්.

කාලය පිළිබඳ සීමාවක් තිබෙන නිසා මම මේ ගැන කෙටියෙන් කියන්නම්. මෙහි ප්‍රධාන කොටස් හැටියට තිබෙන කනිෂ්ඨ, ද්විතීයික අධ්‍යාපනය සම්බන්ධයෙන් සමහරු කියනවා, 6වැනි ශ්‍රේණියේ සිට 9වැනි ශ්‍රේණිය දක්වා යෑමේදී විෂයන් 14ක් ම තිබෙනවා කියලා. හැබැයි, මේකේ අලුත් එකක් හැටියට තිබෙන්නේ ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව කියන විෂය කොටස විතරයි. මේකේ තිබෙන වැදගත්කම තමයි, පරිවර්තනීය කුසලතා මොඩියුල ඉදිරිපත් කරපු එක. අපි දන්නවා, හොඳ සින්දුවක් ඇසීම, සාහිත්‍ය රස වින්දනය, අධ්‍යයන පුහුණුව, සේවා අංශ අධ්‍යාපනය වාගේ ක්‍රියාවලියක් දෙසට මෙය යොමු වෙලා තිබෙන බව. ඒ වාගේම මේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ 9 වසර අවසානයේදී සිසුන්ගේ නිපුණතාව තක්සේරු කිරීමක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකෙන් ශාස්ත්‍රීය සාක්ෂරතාව, විද්‍යාත්මක සාක්ෂරතාව, ගණිතමය සාක්ෂරතාව, සන්නිවේදනය වාගේ ක්ෂේත්‍ර පිළිබඳ දරුවාගේ නිපුණතාව පිළිබඳ තක්සේරුවක් 9 වසර අවසානයේදී සිදු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම 10, 11 ශ්‍රේණි කියන්නේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවදියයි. ඇත්තටම අපි මෙතැනින් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ඉදිරියේදී දරුවා තෝරා ගන්නා විෂයය ක්ෂේත්‍රය සඳහා කිසියම් විධියක හැඩරුවක් සැකසෙන මූලික අධ්‍යාපන විෂයයන් පහක් ලබා දෙන අතරේම, වැඩිදියුණු මොඩියුලවලින් දරුවා ඉදිරියේදී ඉගෙන ගැනීමට බලාපොරොත්තුවන විෂය ධාරාව -ඒක විද්‍යාව හා තාක්ෂණයද, මානව හා සමාජ විද්‍යාවද කළමනාකරණ ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අධ්‍යයනයද එහෙම නැත්නම් වෘත්තීය අධ්‍යාපනයද- පිළිබඳ කිසියම් අදහසක් දරුවාට ලබා ගන්න පුළුවන් අවස්ථාවක් තමයි මේ අධ්‍යාපන ක්‍රියාවලියෙන් බලාපොරොත්තු වෙන්නේ.

මේ සම්බන්ධව සමහරු කරන විවේචනයක් තමයි සෞන්දර්ය අධ්‍යාපනය, ඉතිහාසය වාගේ දේවල් ඉවත් වෙලා තිබෙනවා කියලා. හැබැයි, මේක සැලකිල්ලෙන් හදාරන ඕනෑම කෙනකුට පෙනෙනවා, මේ සියලු විෂය ධාරා තුළ තමන් තෝරාගත් විෂය ධාරාව කුමක් වුවත් සෞන්දර්ය අධ්‍යාපනය සහ ඉතිහාසය පිළිබඳව හැදෑරීමට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් හදලා තිබෙන විෂය මාලා සංවර්ධනය තුළ අවස්ථාව හැදිලා තිබෙනවා කියලා. මේ ප්‍රතිසංස්කරණ දිහා බලන කොට තමන් කැමති ඕනෑ විධියකට බලන්න පුළුවන්. විපක්ෂයේ අයට තමන් විශ්වාස කරන දේශපාලන දෘෂ්ටිකෝණයකින් මේ දෙස බලන්න පුළුවන්. වෘත්තිය සමිතිවලට පුළුවන් තමන්ට බලපාන ආකාරය විධිය අනුව මේ දෙස බලන්න. ගුරුවරුන්ට හිතන්න පුළුවන්, වැඩි වුණු පැය භාගය පාසලේ ඉන්න වෙනවා. ළමයින්ගේ පුද්ගල කාර්යසාධනය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන්න සිදු වෙනවා කියලා. ඒ වාගේම ටියුෂන් මාස්ටර් කෙනෙකුට හිතෙන්න පුළුවන්, තමන්ගේ විෂයය ධාරාවේ විෂයයේ තිබෙන විභාග බර අඩු කරලා තිබෙනවා. ඒක මගේ පොකට් එකට බලපාන්න පුළුවන් කියලා. පරිපාලන නිලධාරින්ට හිතෙන්න පුළුවන්, තමන් සැහැල්ලුවෙන් කරගෙන ඉන්න රාජකාරියට වඩා මේ ප්‍රතිසංස්කරණය නිසා අපේ වැඩ වැඩි වෙලා කියලා. මම කලින් කිව්වා වාගේ සාමාන්‍ය කෙනෙකුට හිතෙන්න පුළුවන්, සෞන්දර්ය විෂයයට මොකක්ද වෙලා තිබෙනවා, ඉතිහාසය ඉවත් වෙලා ද, ඉතින් මේ මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මෙන්න මේ සියල්ල අතරේ අමතක කරන්න එපා, අපි අධ්‍යාපනයේ මේ පරිවර්තනීය වෙනස අත්පත් කර ගත්තේ නැති වුණොත්-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම විනාඩියකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ පරිවර්තනීය වෙනස්කම අත්පත් කර ගත්තේ නැති වුණොත්, ඇත්තටම අපේ දරුවා තවදුරටත් අධ්‍යාපනය අතර මැද නතර කරලා ත්‍රීවිල් පාර්ක් එකට යන තත්ත්වයට ගෙන යනවා ද, වෙනත් කිසිම වෘත්තීය හැකියාවක් නැතුව මොන්ටිසෝරියක වැඩට යන, garment factory එකකට යන ගැහැනු දරුවෙක් බවට පත් කරනවාද කියන ප්‍රශ්නය අපි හිතන්න ඕනෑ. ඒ නිසා පාසල් අධ්‍යාපනයට වාගේම උසස් අධ්‍යාපනයටත් මේ පරිවර්තනීය වෙනස අවශ්‍යයි. ඒ සඳහා ගැඹුරු සාකච්ඡාවක් ඕනෑ.

මම අගමැතිතුමියට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, විශ්වවිද්‍යාල පනත සංශෝධනය කරන්න කැබිනට් අනුමැතිය ලබාගෙන දැන් ඒක ගැසට් කරලා තිබෙන එක ගැන. ඒ පනත ගැන වචනයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ඇත්තටම මේ ප්‍රතිසංස්කරණ හරහා මේ පනත සංශෝධනය කිරීමෙන් බලාපොරොත්තු වෙන්නේ වඩා ප්‍රජාතන්ත්‍රවාදී පුළුල් වටපිටාවක් තුළ පීඨාධිපතිවරු පත් කිරීමේ අවස්ථාව හදන එකයි.

2012, ඒ ඓතිහාසික වෘත්තීය අරගළයෙන් පස්සේ කොළඹ විශ්වවිද්‍යාලයේ workshop එකක් තිබුණා. ඒ workshop එකේ වැඩියෙන් අවධානයට ලක් වෙච්ච ක්ෂේත්‍රයක් තමයි විශ්වවිද්‍යාල පද්ධතියට යහපත් ආණ්ඩුකරණයක් - good governance - හදන්න ඕනෑ කියන එක. ඒ workshop එකේ මතු වෙච්ච යෝජනාත් පදනම් කරගෙන තමයි ඇත්තටම ළඟදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන විශ්වවිද්‍යාල පනත සංශෝධන සඳහා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මීට දශක ගණනාවකට කලින් කරන්න තිබුණු එකක්. අපි අද කල්පනා කරන්න ඕනෑ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා

[ගරු අනුර කරුණාතිලක මහතා]

තුළ තමන්ට බලපාන පුද්ගලික පුංචි, පුංචි දේවල් ඉලක්ක කරගෙන ඒකට බාධා පමුණුවනවාද එහෙම නැත්නම් මේ සද්කාර්යයට එකට එකතු වෙලා වැඩ කරනවාද කියලා.

අවසාන වශයෙන් මම කියන්නේ මෙයයි. පිටතින් තිබෙන අභියෝගය අපට ජයග්‍රහණය කරන්න පුළුවන්. හැබැයි, ඇතුළතින් තිබෙන අභියෝගය තමයි මේ සාධනීය පරිවර්තනීය වෙනස අත්පත් කර ගැනීම සඳහා අපි අමාත්‍යාංශය හැටියට, රජය හැටියට මැදිහත් වෙලා කටයුතු කරන එක. ඒ සඳහා ශක්තියත්, ධෛර්යයත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇමතිතුමිය ඇතුළු ඒ සියලු කණ්ඩායමට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ அப்துல் வாசித் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 3.23]

**ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கிழக்கு மாகாணத்தில் புகழ்பூத்த கல்வியியலாளர்களை உருவாக்கிய பிரதேசங்களுள் பொத்துவில் பிரதேசமும் மிக முக்கியமானது. இது அமைவிட ரீதியாக ஏனைய பிரதேசங்களில் இருந்து சற்று தூரமாக தென்கிழக்கில் அமைந்திருக்கின்ற ஒரு பிரதேசமாகும். பாடசாலைக் கல்வியை நிறைவுசெய்கின்ற ஒரு மாணவன் எந்தவிதமான உயர் கல்வியையும் தொடர்வதற்கான வாய்ப்பு இந்தப் பிரதேசத்தில் இல்லை என்பது மிகவும் கவலைக்குரிய விடயமாகும். இங்கு பல்கலைக்கழகம் ஒன்றின் வளாகம் அமைக்கப்படவில்லை, உயர் தொழில்நுட்பக் கல்லூரி அமைக்கப்படவில்லை, தொழில்நுட்பக் கல்லூரி அமைக்கப்படவில்லை, கல்வியியற் கல்லூரி அமைக்கப்படவில்லை. எல்லாவிதமான உயர் கற்கைகளுக்கும் இப்பிரதேசத்து மாணவர்கள் பல கிலோ மீற்றர் தூரம் பயணம் செய்யவேண்டி உள்ளது. திறந்த பல்கலைக்கழகத்தின் பிராந்திய கற்கை நிலையமொன்றுகூட இப்பிரதேசத்தில் அமைக்கப்படவில்லை. கல்விக்கான சம வாய்ப்புகள் பரந்து வழங்கப்படுதல் வேண்டும். எல்லா வாய்ப்புகளையும் அமைவிட ரீதியாக சில பிரதேசங்களை இணைத்து அமைப்பது எமது பொத்துவில் போன்ற பிரதேசங்களில் கல்வியியலாளர்களை உருவாக்குவதில் சிரமத்தை ஏற்படுத்துகின்றது. எமக்கு நம்பிக்கையளிக்கும் தற்போதைய அரசாங்கத்தில், திறந்த பல்கலைக்கழகத்தின் பிராந்திய கற்கை நிலையமொன்றைப் பொத்துவிலில் அமைப்பதன்மூலம் பானம, பொத்துவில், கோமாரி, திருக்கோவில் போன்ற பிரதேச மாணவர்கள் நேரடியாகப் பல பயன்களைப் பெற்றுக்கொள்ள முடியும்.

உல்லாசத்துறைக்குச் சர்வதேச ரீதியாகப் புகழ் பெற்றிருக்கின்ற அறுகம்பை பிரதேசத்தை மையப்படுத்தி, இலங்கை தென்கிழக்குப் பல்கலைக்கழகத்தின் விருந்தோம்பல் மற்றும் சுற்றுலா முகாமைத்துவ பீடத்தை பொத்துவிலில் அமைத்து, உல்லாசத்துறைக் கல்விக்குப் பெறுமதி சேர்க்க முடியும். கௌரவ கல்வி அமைச்சர் அவர்களே, உயர் கல்வி தொடர்பாக என்னால் முன்வைக்கப்பட்டிருக்கும் மேற்படி இரு கோரிக்கைகளையும் பரிசீலனை செய்து, எமது பிரதேசத்தையும் கல்விக்கான வாய்ப்புகள் கொண்ட பிரதேசமாக மாற்றித் தாருமாறு இவ்வுயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

தற்போது அரசாங்கம் முன்னெடுத்து வரும் கல்வித் திட்ட மறுசீரமைப்பு வரவேற்கத்தக்க ஒரு விடயமாகும். நிருவாக மறுசீரமைப்பும் கல்வியில் அவசியமாக ஏற்படுத்த வேண்டிய ஒன்றாகும். ஆனாலும், அவ்வாறானதொரு நிருவாக மறுசீரமைப்பு மேற்கொள்ளப்படுவதற்கு முன்னர், பொத்துவிலின் நீண்ட கால கோரிக்கையான தனியானதொரு வலயக் கல்வி அலுவலகம் அமைக்கப்படுதல் வேண்டும். இக்கோரிக்கையானது, வெறுமனே கட்டடங்களிலான அலுவலகம் ஒன்றைப் பொத்துவிலில் அமைப்பதற்கான கோரிக்கையல்ல. மாறாக, பல்லாயிரக்கணக்கான மாணவச் சிறார்கள் சார்பாகவும் நூற்றுக்கணக்கான ஆசிரியர்கள் சார்பாகவும் மூவின மக்கள் சார்பாகவும் இதயசுத்தியோடு முன்வைக்கின்ற கோரிக்கையாகும். இரு தசாப்தங்களாக குறித்த கோரிக்கை முன்வைக்கப்பட்டு வருகின்றது.

பொத்துவில், கிண்ணியா, கோமரங்கடவல ஆகிய கோட்டங்கள் நிதி கையாளுகையுடன் செயற்பட்டன. பின்னர் 2008 காலப்பகுதியில் கிண்ணியா கோட்டமும் கோமரங்கடவல கோட்டமும் வலயங்களாகத் தரமுயர்த்தப்பட்டன. ஆனால், பொத்துவில் கோட்டம் இன்னும் வலயமாகத் தரமுயர்த்தப்படாமல், ஏற்கனவே வழங்கப்பட்ட நிதி கையாளுகை அதிகாரத்தையும் இழந்த கோட்டமாகச் செயற்பட்டுக்கொண்டு இருக்கின்றது.

கல்வியின் நோக்கம் தேசிய ஒருமைப்பாட்டை ஏற்படுத்துவதாகும்; இனங்களுக்கு இடையே ஐக்கியத்தைக் கட்டியெழுப்புவதாகும். எனினும், எமது பொத்துவில் பிரதேசத்தில் அமைந்திருக்கின்ற பாடசாலைகள் இன ரீதியாக வேறுபடுத்தப்பட்டு இருப்பது எனக்கு மிகவும் மனவேதனை அளிக்கின்றது. முஸ்லிம் பாடசாலைகள் அக்கரைப்பற்று வலயத்துக்கும், தமிழ்ப் பாடசாலைகள் திருக்கோவில் வலயத்துக்கும், சிங்களப் பாடசாலைகள் அம்பாறை வலயத்துக்கும் பிரித்தெடுக்கப்பட்டுள்ளன. ஒரு கிலோமீற்றர் தூர எல்லைக்குள் அமைந்திருக்கின்ற முஸ்லிம் பாடசாலை அக்கரைப்பற்று வலயத்தைச் சேர்ந்ததாம்; அதன் அருகாமையில் உள்ள தமிழ் பாடசாலை திருக்கோவில் வலயத்தைச் சேர்ந்ததாம்; அதன் அருகாமையில் உள்ள சிங்களப் பாடசாலை அம்பாறை வலயத்தைச் சேர்ந்ததாம்! மூன்று இன பாடசாலைகளும் ஒரு கிலோமீற்றர் தூரத்துக்குள் அமைந்திருக்கின்றபோது, ஏன் மூன்று வலயங்களுக்குப் பிரிக்கப்பட்டன? பொத்துவில் மற்றும் லகுகல பிரதேச செயலாளர் பிரிவுகளுக்குள் அமைந்திருக்கின்ற அனைத்து முஸ்லிம், தமிழ், சிங்களப் பாடசாலைகளையும் புவியியல் ரீதியாக இணைத்து, தனியான வலயக் கல்வி அலுவலகம் ஒன்றைப் பொத்துவிலில் அமைப்பதன்மூலம் மூவின மாணவர்களும் ஆசிரியர்களும் பயன் பெற்றுக்கொள்ள முடியும். 2008ஆம் ஆண்டு பொத்துவிலுக்கான தனியான வலயக் கல்வி அலுவலகத்துக்கான கோரிக்கை முன்வைக்கப்பட்டும் இன்று வரை நிறைவேற்றப்படவில்லை.

இடைப்பட்ட காலப்பகுதியில் பல வலயக் கல்வி அலுவலகங்கள் உருவாக்கப்பட்டமையை எவ்வகையில் நியாயமாகக் கருத முடியும்?

பொத்துவிலில் காணப்படுகின்ற சிங்களப் பாடசாலைகள் சேவைகளைப் பெற்றுக்கொள்வதற்காக 70 கிலோமீற்றர் தூரத்துக்கு அப்பாலுள்ள அம்பாறை வலயத்துக்குச் செல்கின்றன. பொத்துவிலில் காணப்படுகின்ற முஸ்லிம் பாடசாலைகள் சேவைகளைப் பெற்றுக்கொள்ள 45 கிலோமீற்றர் தூரத்துக்கு அப்பாலுள்ள அக்கரைப்பற்று வலயத்துக்குச் செல்கின்றன. பொத்துவிலில் காணப்படுகின்ற தமிழ்ப் பாடசாலைகள் சேவைகளைப் பெற்றுக்கொள்ள 35 கிலோமீற்றர் தூரத்துக்கு அப்பாலுள்ள திருக்கோவில் வலயத்துக்குச் செல்கின்றன. எனவே, பொத்துவில் பிரதேசத்தில் தனியான வலயக் கல்வி அலுவலகம் ஒன்று அமைக்கப்படும்போது, மூவின பாடசாலைகளும் உச்ச பயன் பெறும். மேற்படி வலயக் கல்வி அலுவலகங்களின் கல்விசார் உத்தியோகத்தர்களின் நெருக்கமான மேற்பார்வையையும் வழிகாட்டலையும் பொத்துவிலில் அமைந்திருக்கின்ற பாடசாலைகள் பெற்றுக்கொள்வதில் வலயக் கல்வி அலுவலகம் அமைந்திருக்கின்ற தூரம் தடையாக அமையும். இது எமது மாணவர்களின் நீண்ட கால கல்வி அடைவில் பாதிப்பை ஏற்படுத்தும். அரசியலுக்கு அப்பால், பொத்துவிலில் கல்வி கற்கும் மாணவன் ஒருவனின் தந்தையாக பொத்துவிலுக்கான தனியான வலயக் கல்வி அலுவலகத்தை அமைத்துத் தருமாறு அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

பொத்துவில் பிராந்தியத்தில் காணப்படுகின்ற ஒரேயொரு தேசிய பாடசாலை பொத்துவில் மத்திய கல்லூரியாகும். இக்கல்லூரியானது எதிர்வரும் வருடம் 75ஆவது ஆண்டு நிறைவு விழாவைக் கொண்டாட இருக்கின்றது. பொத்துவில் மத்திய கல்லூரியின் பழைய மாணவன் என்ற வகையில், 75ஆவது ஆண்டு நிறைவு விழாவை முன்னிட்டு எனது மனமார்ந்த வாழ்த்துக்களை இவ்வுயரிய சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். பொத்துவில் மத்திய கல்லூரி அண்மைக்காலமாக சமூகத்தின் நம்பிக்கைமிகு பாடசாலையாக மாற்றமடைந்து இருப்பதில் மகிழ்ச்சி அடைகின்றேன். பாடசாலையின் தற்போதைய வினைத்திறனான செயற்பாடுகளுக்காக பாடசாலையின் அதிபர் அவர்களுக்கும் ஆசிரியர்களுக்கும் வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். பொத்துவில் மத்திய கல்லூரியில் கற்பிக்கும் ஆசிரியர்களில் பலர் தூரப் பிரதேசங்களில் இருந்து வருகை தருகின்றார்கள். இப்பாடசாலையில் ஆசிரியர் விடுதி ஒன்று அமைக்கப்படும் போது, தூரப் பிரதேச ஆசிரியர்கள் பயன் பெற்றுக்கொள்ள முடியும்.

தற்போது இணைப்பாடவிதான செயற்பாடுகளில் திறமை காட்டி வரும் பொத்துவில் மத்திய கல்லூரியில், நவீன வசதிகளுடன்கூடிய ஒன்றுகூடல் மண்டபம் ஒன்று அமைக்கப்படும்போது, மாணவர்களின் இணைப்பாடவிதான செயற்பாடுகள் மென்மேலும் வளர்ச்சி அடையும். குறித்த பாடசாலையில் கல்விசாரா ஆளணியினரின் பற்றாக்குறை கடுமையாகக் காணப்படுகின்றது. பெரும் நிலப்பரப்பைக் கொண்ட இப்பாடசாலை நிரந்தர காவலாளிகள் இன்றி இயங்கி வருகின்றது. கல்விசாரா ஆளணியினரின் பற்றாக்குறை அவசரமாகத் தீர்க்கப்பட வேண்டிய ஒரு பிரச்சினையாகும் என்பதை நான் இந்தச் சபையில் பதிவுசெய்துகொள்ள விரும்புகின்றேன்.

கௌரவ கல்வி அமைச்சர் அவர்களே, பொத்துவில் பிரதேசத்தில் ஆசிரியர் வாண்மை விருத்தி மத்திய நிலையம் ஒன்றை நிறுவுவதன் அவசியத்தை வலியுறுத்தும் நியாயமான காரணங்களை உங்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். இப்பிரதேசத்தின் கல்வித் தரத்தை மேம்படுத்துவதற்கும் ஆசிரியர்களின் வாண்மையை உறுதிப்படுத்துவதற்கும் இந்த நடவடிக்கை அத்தியாவசியமானது. பொத்துவிலில் PDCT அமைக்கப்பட வேண்டியதற்கான பிரதான காரணங்களைப் பின்வருமாறு விபரிக்கின்றேன். பொத்துவில் மற்றும் அதன் சுற்றுவட்டாரப் பிரதேசங்களிலுள்ள ஆசிரியர்கள் தற்போது வாண்மை விருத்தித் திட்டங்களில் பங்கேற்க திருக்கோவிலுள்ள PDCTக்கு 45 கிலோமீற்றரும், அக்கரைப்பற்றிலுள்ள PDCTக்கு 65 கிலோமீற்றரும், அம்பாறையிலுள்ள PDCTக்குச் செல்வதற்கு 90 கிலோமீற்றரும் எனத் தொலைதூரம் பயணிக்க வேண்டியுள்ளது. இந்தத் தொலைதூரப் பயணமானது, ஆசிரியர்களுக்கு நேர விரயம், போக்குவரத்துச் செலவு மற்றும் உடல் ரீதியான சிரமம் ஆகியவற்றை ஏற்படுத்துகின்றன. பொத்துவிலில் PDCT ஆரம்பிக்கப்பட்டால், இந்தத் தடைகளைக் குறைத்து ஆசிரியர்களின் பங்கேற்பை அதிகரிக்கலாம்.

பொத்துவில் பிரதேசத்தில் தொடர்ச்சியாக ஆசிரியர் பற்றாக்குறை காணப்படுவதாக அறிக்கைகள் சுட்டிக் காட்டுகின்றன. தற்போது கடமையாற்றும் ஆசிரியர்களின் திறன், அறிவு மற்றும் கற்பித்தல் முறைகளை உள்ளூர் சூழலுக்கு ஏற்ப மேம்படுத்துவது அத்தியாவசியமானது. உள்ளூர் தேவைகளுக்கேற்ப விசேட பயிற்சிகளை PDCTமூலம் வழங்குவதன்மூலம் இப்பிரச்சினைக்குத் தீர்வு காணலாம். மேலும், புதிய கற்பித்தல் நுட்பங்கள் மற்றும் தகவல் தொழில்நுட்பப் பயன்பாடு போன்றவற்றைத் தொடர்ந்து புதுப்பித்துக் கொள்வதற்கு ஓர் உள்ளூர் வாண்மை விருத்தி மத்திய நிலையம் அவசியமானதாக இருக்கின்றது. பொத்துவிலின் தனித்துவமான சமூக, பொருளாதார மற்றும் கலாசார பின்னணிக்கு ஏற்ப, பாடசாலைகளின் குறிப்பிட்ட மற்றும் தனித்துவமான தேவைகளைப் பூர்த்திசெய்ய ஆசிரியர்களை வாண்மைப்படுத்த வேண்டும். இத்திட்டத்தின்மூலம் சுமார் 400 ஆசிரியர்களை வாண்மைத்துவம் அடையச் செய்யலாம். மேலும், பொத்துவிலில் PDCT அமைக்கப்படும்பொழுது, மத்திய நிலையத்தில் 400 ஆசிரியர்களுக்கு SBPTD - School Based Professional Teacher Development - பயிற்சிகளை வழங்க முடியும்.

அது மட்டுமன்றி, பொத்துவில் பிரதேசத்தில் இலங்கை ஆசிரியர் கல்வியியலாளர் சேவையைச் சேர்ந்த 7 உத்தியோகத்தர்கள் இருக்கிறார்கள் என்பதும் இந்த மத்திய நிலையத்தை அமைப்பதற்கு வளமும் உள்ளமையைக் காட்டுகின்றது. PDCT நிறுவப்படும்போது, அது ஆசிரியர்கள் சிறந்த நடைமுறைகள் தொடர்பான அனுபவங்களைப் - best practices - பகிர்ந்துகொள்ளவும், கருத்துப் பரிமாறல்களைச் செய்யவும், இடைத்தொடர்புகளை வளர்த்துக்கொள்ளவும் ஒரு மையப்படுத்தப்பட்ட தளத்தை வழங்கும். இது கூட்டுப் பிணைப்பை ஏற்படுத்தி, ஒட்டுமொத்த கல்விச் சமூகத்தின் தரத்தையும் உயர்த்தும். கடந்த கால அரசாங்கங்கள் பிரதேச ரீதியாகவும் இன ரீதியாகவும் வலயத்தைப் பிரித்தபோது, பொத்துவிலுக்கு நியாயமான ரீதியில் வழங்கப்பட வேண்டிய ஆசிரியர் வாண்மை விருத்தி மத்திய நிலையத்தை வழங்கத் தவறியுள்ளன. இந்த முக்கிய கோரிக்கையை நீங்கள் சாதகமாகக் கருத்திற்கொள்வீர்களென நம்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் கோட்டத்திலுள்ள அஸ்-ஸாதிக் வித்தியாலயம்,

[ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා]

உஸ்மானிய்யா வித்தியாலயம் ஆகியவற்றில் பூரணப்படுத்தப்படாமல் இருக்கின்ற கட்டிடங்களைப் பூரணப்படுத்திக் கொடுக்க வேண்டும். அல்-இர்பான் மகளிர் கல்லூரி, தாருல் பலாஹ் வித்தியாலயம், அல்-நூரானிய்யா வித்தியாலயம் ஆகியவற்றிலுள்ள இடப் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்காக 3 மாடிக் கட்டிடங்களை அமைத்துக் கொடுக்க வேண்டும். அதேபோன்று, அல்-மினா வித்தியாலயம், பொத்துவில் சிங்கள மகா வித்தியாலயம், துளசி வித்தியாலயம், அல்-மர்வா பாடசாலை போன்றவற்றுக்குச் சுற்றுமதில் அமைத்துக் கொடுக்கப்படல் வேண்டும். அக்கரைப்பற்று அர்-ரஹீமியா வித்தியாலயத்துக்கு அவசியமான நிலமொன்று அருகிலேயிருக்கின்ற MPCS Limitedக்குச் சொந்தமாக இருக்கின்றது. இந்த நிலம் அப்பாடசாலைக்கு அவசியமாக இருப்பதால், பிரதேச சபையின் தவிசாளர் ராசிக் அவர்கள் உட்பட அங்கிருக்கின்ற புத்திஜீவிகள் அந்நிலத்தைப் பெற்று, அவ்வித்தியாலயத்துக்கு வழங்க வேண்டுமென அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். அதேபோல, வரிப்பத்தான்சேனை அல்-அமீன் மகா வித்தியாலயத்துக்கு ஆராதனை மண்டபம், விஞ்ஞான ஆய்வுகூடம் என்பன அமைத்துக் கொடுக்கப்பட வேண்டும். 2019இல் இதற்கும் நிதி ஒதுக்கப்பட்டு இருந்தது. அதேபோன்று, அஸ்-ஸபா வித்தியாலயத்துக்கு playground, boundary wall என்பன அமைத்துக் கொடுக்கப்பட வேண்டும். மேலும், நாவிதன்வெளியில் இருக்கின்ற அல்-ஹிரா வித்தியாலயத்துக்கு stageஉம் வேலியும் அமைத்துக் கொடுக்கப்பட வேண்டும். அதேபோன்று, அமீர்அலி வித்தியாலயத்துக்கும் மைதானம், stage, வேலிகள் அமைத்துக் கொடுக்கப்பட வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னுமொரு விடயத்தைக் கூறுவதற்கு நீங்கள் எனக்குச் சந்தர்ப்பம் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நாட்டிலுள்ள பாடசாலைகளில் கடமைபுரியும் கல்விசாரா ஊழியர்கள் பல பிரச்சினைகளை எதிர்கொண்டு இருக்கிறார்கள். குறிப்பாக, புகையிரத ஆணைச்சீட்டு வழங்கும்போது, PL 1க்கும் முதலாம் வகுப்பு வழங்கப்படல் வேண்டும். அதேபோல், சேவைப் பிரமாணக் குறிப்பானது எல்லா மாகாணங்களுக்கும் ஒன்றாக இருக்க வேண்டும். இவர்களது பதவி உயர்வுகள் ஒரு கிரமமான முறையில் சாதாரணமாக இடம்பெற வேண்டும். இவர்களுக்கான பதவி உயர்வுகள் வழங்கப்படும்போது, சரியானதொரு முறை பேணப்பட்டு காலங்கள் குறைக்கப்பட வேண்டும். அதேபோன்று, மத்திய மற்றும் மாகாணம் என்றில்லாமல், எல்லா மாகாணங்களிலும் கடமைபுரிவதற்கான சந்தர்ப்பங்கள் ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එම්.එස්. අබ්දුල් වාසිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
தயவுசெய்து, எனக்கு இன்னும் 30 செக்கன் தாருங்கள்!

பொத்துவிலில் பல்வேறுபட்ட சிரமங்களுக்கு மத்தியில் ஆசிரியர்கள் மாணவர்களுக்கான கல்வியை வழங்கிக்கொண்டு இருக்கின்றார்கள். அந்த அடிப்படையில், SLEAS தரத்தைச் சேர்ந்த நபீஸ் முஹம்மத், ஆதீக் அவர்களுக்கும், SLTES தரத்தைச் சேர்ந்த எம்.ஏ. தாஜஹான், ஸலாஹுதீன் ஆலிம், காமிலா பேகம், அமீர்அலி, சமீம், பதியுதீன், பஸ்மின் அவர்களுக்கும், அதிபர்களாகக் கடமையாற்றிக் கொண்டிருக்கும் எம்.ஏ.எம். புஹாரி, ஹம்ஸா, பிர்தௌஸ், கலீல், ரபீக், கரீம், ஸபூர்தீன், ஸிஹாப்தீன், ஸஹாப்தீன், காலித், அஷ்ரப், அமீருதீன், ரபீன், அப்துல் ஹஸன், பஸீர், றிஸ்வான், ஏ.கே. றிஸ்வான், ஸிராஜ் அஸ்லம், றோயல் பாரி, அப்துல் ரஹீம், ஜுனைதீன் அவர்களுக்கும் விசேடமாக றஷீட், மஜீத் அவர்களுக்கும் விபத்தில் சிக்கி 2010.08.18ஆம் திகதி மரணித்த லாபில் மற்றும் ஜவாத் அவர்களுக்கும் முஹம்மது லெப்பைக்கும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வஸ்ஸலாம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்கள்! உங்களுக்கு 12 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[3.34 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் எனது பேச்சை ஆரம்பிக்க விரும்புவது regarding the Jaffna University, Hon. Prime Minister. There is a total cadre of 1,090 non-academic staff in the Jaffna University, but only 761 vacancies have been filled and there are 329 vacancies more to be filled and those vacancies have been in existence for years. Previous governments refused to accept any calls for the filling of those vacancies. In fact, the University administration came under severe pressure not to make these vacancies public. However, since your Government came into power, the Vice Chancellor and the administration managed to get some courage. I think, out of 329 vacancies, they sought only 170 of the vacancies to be filled. So, as a result, the non-academic staff and students are up in arms because in the last ten years, Hon. Prime Minister, there have been six new faculties that have been incorporated into the Jaffna University and they are already going on with cadres that have not been revised for decades. And of that, only 170 vacancies are asked to be filled, which is grossly inadequate; it makes things terribly unbearable. Therefore, we request you to, quite apart from revising the cadre, which has actually to be done, at the very least, to fill those 329 cadre vacancies. At the moment, the administration is filling some of that shortfall through private companies, paying exorbitant salaries to them. So, it just does not make sense why these cadres cannot be filled immediately. Therefore, I seek your intervention in this matter as a matter of urgency.

The other mater, Hon. Prime Minister, is this. I think you have been coming under fire from everybody in the Opposition and I am also going to add my logic to it. The biggest complaint has been with regard to the teachers' salary revisions. Whe you were in the Opposition, you yourself was a strong advocate of the Subodhini Salary

Commission’s recommendations and I remember speaking during Budgets, supporting a lot of what you said. Unfortunately, since this Government came into power, certain revisions have been made, but, I think, they fall grossly short of the Subodhini Salary Commission's recommendations.

Hon. Prime Minister, I think, education is something fundamental for a country. If we do not treat our teachers well, our country is not going to prosper, the students are not going to reach their potential and in the long-term, we are going to suffer. If there is any priority to be given to a particularly field, in my view, it has to be education and health. If the people who manage these two sectors are not taken care of, we will fail as a society and as a country, and therefore, it is no coincidence that educators and doctors are leaving this country in their numbers to the benefit of countries like Australia and Canada. So, Hon. Prime Minister, I think your Government, especially under your watch, must give due weight to education. After all, we fought along with you for an allocation of 6 per cent of GDP on education, but it is only an increase of 1.3 per cent this time. We are having only 6.8 per cent of the entire budgetary allocation on education. That is grossly short. So, I think you must prioritize it and we will support you and your Government; if you make those decisions, we will support you unconditionally on that feat and that assurance, I can give you. I can also assure you that you would have all the support of everybody in the Opposition, if the education sector is reformed, especially with regard to our teachers, along the Subodhini Salary Commission’s recommendations.

I will give you just one example. If you take Grade 2-II teachers, the shortfall between the Subodhini Committee and your Government’s recommendations for 2025 was Rs. 10, 489, for 2026, it will be Rs. 12, 879 and for 2027, it will be Rs. 15, 270. That is a lot of money, that is a hell of a lot of money! I have a whole list of shortfalls and I will **table*** it. I think you must rectify that.

Another complaint I get and the severe criticism that comes now, Hon. Prime Minister, is - the Ranil Wickremesinghe Government, in order to get funding from the Asian Development Bank, went through a process of unilaterally creating reforms, which was heavily opposed, including by the JVP and yourself; we opposed it as well - that it is more or less the same reforms that are being pushed by this Government. The question is, just for the sake of getting funds of the ADB, are we going to push for those reforms, which were made unilaterally and without any serious consultation with the stakeholders, through your Government? I do not think you should take that blame; I think you should look into that.

Hon. Prime Minister, with the school time being extended - I want to mention this - particularly the Muslim schools in the North and the East would function till 2.50 p.m. on Tuesdays, Wednesdays and Thursdays. Due to extending the time from 1.30 p.m. to 2 p.m., actually the students, not being able to have lunch, are going to suffer. Most of these students in this country, as you know, come from quite difficult areas and are not from economically established families. Most of them skip breakfast because the families cannot afford it after the economic crash. So, under those circumstances, extending the time, I think, is something that you have to seriously look at. If you are going to extend the time like you have suggested, then you have to have alternate means to make sure that those children have lunch or something to that effect. But, look at the situation of the Muslim students. They have to go on till 2.50 pm on three days of the week. That is just completely unacceptable and I would ask you to look at that also.

Then, Hon. Prime Minister, I would like to take up the matter of teachers serving in difficult areas. If you take Jaffna, the difficult schools have been revised; those have been revised on certain criteria, which, in a place like Jaffna, make no sense. Sixteen schools in the islands in Jaffna have been taken off this list of difficult areas simply because those areas have, for example, a post office, a hospital or something to that effect. But if you take those islands, Hon. Prime Minister, transportation is the biggest problem there. Having a hospital, a bank or a post office being the reason for those schools to be taken off that list of difficult areas makes no sense because the teachers who come from the mainland face that same problem of transportation. So, again, taking 16 schools off that list, I think, does not make sense; it just does not make sense. I can go through a whole list of schools in the Northern Province and the Eastern Province which have the same problem. Therefore, that criteria is just irrelevant for our areas.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two minutes more.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I have spoken for only nine minutes.

The other matter is with regard to the allowance that is paid to the teachers in difficult areas. Hon. Prime Minister, that allowance has been paid for 20 years now; it has been started to be paid, if I am not mistaken, in 2005. It was Rs. 1,500 for difficult areas and for the category of extremely difficult areas, it was Rs. 2,500. Now, I think there is only one category of difficult areas and the increment has been only Rs. 1500. In today’s economic conditions, that, again, is completely unrealistic. Most of the teachers who go to these difficult areas are those just starting their lives and to be given only a Rs. 1,500 increment, I think, once again, is unrealistic because that puts them into grave difficulty. Transportation is ridiculously remote in those areas. They usually have to go and stay there and Rs. 1,500, in

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

today's context, is insufficient. In Parliament - you have cut down a lot of the perks - one day's meal is Rs. 1,500! So, can you imagine getting an allowance of Rs. 1,500 for the whole month? I think, again, there is something wrong; blatantly, there is something wrong. Especially, if you are trying to encourage teachers to go out into difficult areas, this discourages them, making sure that they choose something else other than going and serving there. So, Hon. Prime Minister, under those circumstances, I urge you to look into those matters.

I do not want to be as harsh as I normally am. And, you are someone who is highly respected; certainly, in your field, you have been very highly respected. I can understand, that being in the Opposition and wanting things done is one thing, but when you go into Government, circumstances could be different.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am winding up, Sir.

But, this just does not make sense because the Ranil Wickremesinghe reforms and the gross inequalities on the question of education that we opposed still persist. Therefore, I think you must have a relook at that; I urge you to.

Then, I brought certain people from Australia, who are trying to help us with English education.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you very much, Hon. Member.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Give me two minutes, Sir.

They suggested certain reforms. I would like you to give me some sort of indication as to whether you have considered them. Whether you accept them or not is a different thing, but let me know whether you have, at least, considered them and if they are inadequate, in what way.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් හේවගේ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.47]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අය වැයට අදාළව අධ්‍යාපන විෂය සාකච්ඡාවට බඳුන් වන වෙලාවේ, අද උදේ ඉඳලා විපක්ෂය නඟන තර්ක දිහා හොඳට බැලුවාම අපට පෙනෙන කාරණාවක් තමයි, මෙතුමන්ලා 2025 වෙනකල් අධ්‍යාපන ක්ෂේත්‍රය ඉතාම හොඳට හදලා, හදලා අවුරුද්දක් ඇතුළත අපි කඩා වැට්ටුවා, ඒ කඩා වට්ටපු ප්‍රමාණය තමයි අද සාකච්ඡා කරන්නේ කියන එක. ඒ අය අවුරුදු 76ක්, එහෙම නැත්නම් දින 27,000ක් පුරා හදපු අධ්‍යාපනය, පසුගිය දින 365ක් ඇතුළත විනාශ කරපු ප්‍රමාණය ගැන තමයි දැන් ඒ අය කියන්නේ. මම කියන්නේ ඒ අය මේක අපට කියනවාට වඩා හොඳයි, කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා -පාර්ලිමේන්තුවේ පිටුපස ගේට්ටුවෙන් පිට වනකොට එතැන කණ්ණාඩියක් තිබෙනවානේ- ඔය කරුණු-කාරණා ටික කිව්වා නම් තේරුම් ගන්න පුළුවන්, ඒ කථා ටික කාටද කියන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කළේ කොහොමද කියලා මම පසුව කියන්නම්.

ඕනෑම රටක ඉදිරි මාවත තීරණය වන්නේ රටේ සංවර්ධනයත් එක්ක. ආර්ථික වශයෙන් රට සංවර්ධනය වෙලා නම් ප්‍රශ්න අඩුයි, ගමන දිගයි. හැබැයි, සංවර්ධනයෙන් අපි ටිකක් පසුපසින් නම් ඉන්නේ, ගමන කෙටියි, අභාවාවක තැනකටයි යන්නේ. ඒක තීරණය වන්නේ සංවර්ධනයත් එක්ක. ඕනෑම රටක සංවර්ධනය තීරණය වන්නේ ප්‍රධානම සාධක දෙකක් මත. එක, ඒ රටේ තිබෙන භෞතික සම්පත්වල ප්‍රමාණය. දෙක, ඒ රටේ මානව සම්පතේ ප්‍රමාණය සහ ඒ මානව සම්පතෙන් ඵල ප්‍රයෝජන ගන්නා ප්‍රමාණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ භෞතික සම්පත් ගත්තොත්, අපට මහා ආඪ්‍යයක් පාන්න පුළුවන් භෞතික සම්පත් ප්‍රමාණයක් නැහැ. එම නිසා අපේ රටේ සංවර්ධන මාවත ඉලක්ක කරනවා නම්, අපේ රටේ සංවර්ධන මාවතේ වැඩි බර ප්‍රමාණයක් තියන්න ඕනෑ දරුවන්ගේ අධ්‍යාපනයටයි කියලා අපි හිතනවා. අධ්‍යාපනයෙන් ගොඩ යන්න පුළුවන් රටක් හැටියට තමයි අපි මේ රට හඳුනා ගන්නේ. අපි අපේක්ෂා කරනවා, තව අවුරුද්දකින් දෙකකින් සියයට 7ක, 8ක growth rate එකක් ලංකාවට ගන්න. එහෙම rate එකක් ගන්න මේ වතාවේත් අපි අය වැයෙන් ආයෝජන හැටියට යොදවා තිබෙන්නේ GDP එකෙන් සියයට 4යි. මොකද, පෞද්ගලික අංශයේ ආයෝජන තමයි අපි බලාපොරොත්තු වන්නේ. හැබැයි අපි හිතනවා, එහෙම ආයෝජනයක් කර ගන්න පුළුවන් මට්ටමක නොවෙයි අපි ඉන්නේ කියලා. අපට ආයෝජනත් හිඟ නම්, අනිවාර්යයෙන්ම මානව සම්පතේ ඇති වන දියුණුව මත තමයි අපේ රටේ සංවර්ධනයට මාවත වැටිලා තිබෙන්නේ; අපේ රටේ සංවර්ධන මූලෝපායයන් තිබෙන්නේ. ඒ නිසා තමයි මේ රජය අධ්‍යාපනයට වැඩි බරක් තබන්නේ. මේ සියලුම අමාත්‍යාංශවල, සියලුම දෙපාර්තමේන්තුවල මව් අමාත්‍යාංශය බවට පත් වන්නේ අධ්‍යාපනය. අධ්‍යාපනය බිඳ වැටුණොත් සෞඛ්‍ය බිඳ වැටෙනවා, අධ්‍යාපනය බිඳ වැටුණොත් අනෙකුත් සියලු අංශ බිඳ වැටෙනවා. එම නිසා අපි ඒ බර තියලා තමයි මේ කටයුතු කරගෙන යන්නේ. විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමිය, නියෝජ්‍ය ඇමතිතුමා, අමාත්‍යාංශවල ලේකම්තුමන්ලා, සහකාර ලේකම්තුමන්ලා එක කුලකයක් හැටියට මැදිහත් වෙලා ඉදිරි අවුරුද්ද සඳහා අධ්‍යාපනය සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය කරලා තිබෙනවා කියලා අපි හිතනවා.

ඔබතුමන්ලා අද උදේ ඉඳලා කියපු කාරණා ටික අපට අදාළ කාරණා නොවෙයි. අපි ඇවිල්ලා අලුතින් මොකක් හෝ නුසුදුසු දෙයක් කළා නම් අපට කියන්න. අපි ඒක හදාගන්න කැමැතියි. ඔබතුමන්ලා උදේ ඉඳලා කියපු කාරණා අරගෙන බලන්න. ඉස්කෝල වැහිලා ලු, ඉස්කෝලවල desk නැහැයි ලු, පුටු නැහැයි ලු, ගුරුවරුන් නැහැයි ලු, ගුරු නිවාස හිස් ලු, ඒ ඔක්කෝම ඔබට අදාළ කාරණා.

මට මතක් වනවා, අක්කෝස භාරද්වාජ බමුණා පිළිබඳ වූ කථා පුවත. අක්කෝස භාරද්වාජ බමුණා බුදු හාමුදුරුවෝ හමුවුණු වෙලාවක බුදු හාමුදුරුවන්ට හොඳටම දොස් කිව්වා, නපුරු වචනවලින් බැන්නා. බුදු හාමුදුරුවෝ ඉවසීමෙන් අහගෙන ඉඳලා එම බමුණාගෙන් ඇහුවා, "ඔබගේ ගෙදරට කවුරු හරි ආවොත් ඔබ හොඳට සලකනවාද?" කියලා. "ඔව්, මම හොඳට සංග්‍රහ කරනවා" කියලා ඒ බමුණා කිව්වා. "ඔබේ නිවසට ආපු කෙනා ඒ සංග්‍රහය භාර ගත්තේ නැතොත් ඔබ මොකද කරන්නේ?" කියලා බුදු හාමුදුරුවෝ විමසා සිටියා. "එහෙම වුණොත් ඒ සංග්‍රහය මා විසින්ම භාර ගන්නවා" කියලා බමුණා කිව්වා. ඒ වාගේ අද උදේ ඉඳලා ඔබතුමන්ලා කියපු එකක්වත් අපි භාර ගන්නේ නැහැ. බුදු හාමුදුරුවෝ දේශනා කළා වාගේ ඒ ටික ඔබතුමන්ලාම භාර ගන්න. අධ්‍යාපනය විනාශ කරපු අය තමයි මේ ඉන්නේ. එවැනි අධ්‍යාපනයක් තමයි අපට තිබුණේ.

මට මතකයි, චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා, අධ්‍යාපනය වෙනුවෙන් වැඩිම මුදල වෙන් කළේ ඒ අය කියලා. මේ කියන්නේ, පට්ටපල් කෙප්ප කෙබර. මෙච්චර කාලයක් අධ්‍යාපනය සඳහා වෙන් කරපු වැඩිම මුදල වෙන් කළේ ඒ අයලු. ඒ විධියට වැඩිම මුදල වෙන් කළේ කවුද කියලාත් ඒ මන්ත්‍රීතුමා අද උදේ කිව්වා මට මතකයි. අකිල විරාජ්ලු වැඩිම මුදලක් වෙන් කළේ. අකිල විරාජ් කරපු ටික මම කියන්නම්. ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවෙන් ලබා ගත් වාර්තාවක් මගේ ළඟ තිබෙනවා.

2010 අවුරුද්දෙන් පස්සේ - අවුරුදු 16කට පස්සේ - මේ අවුරුද්දේ අපේ ආණ්ඩුව විසින් තමයි අධ්‍යාපනයට වැඩිම මුදල වෙන් කරලා තිබෙන්නේ. ඊට අදාළ වාර්තාව මම **සභාගත*** කරනවා.

අරගන්න, කියවන්න, දැනගන්න. ඒ විස්තර දැනගෙන කථා කරන්න. මහ බැංකු වාර්තාවේ තමයි ත්තේ. පාර්ලිමේන්තුවෙන් තමයි මම ඒ වාර්තාව ලබා ගත්තේ. 2010 අවුරුද්දෙන් පස්සේ මේ අවුරුද්දේ තමයි අධ්‍යාපනයට වැඩිම මුදල වෙන් කරලා තිබෙන්නේ.

අද උදේ පොහොට්ටුවේ මන්ත්‍රීතුමන්ලා අධ්‍යාපනය ගැන කථා කළා. අපි ඕනෑ නම් සංඛ්‍යා දත්ත ටිකක් කියන්නම්, අහගෙන ඒවා ඉගෙන ගන්න. 1994දී අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා, GDP එකෙන් සියයට 3.6ක්. 2006දී අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ GDP එකෙන් සියයට 2.90යි. පොහොට්ටුවේ මන්ත්‍රීවරු මෙතැන නැත්නම් ඒ අයටත් මේ ගැන කියන්න. 2012දී අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ සියයට 1.86යි. 2014 අවුරුද්ද වනකොට ඒක සියයට 1.82යි. GDP එකෙන් සියයට 2.90ක් අධ්‍යාපනයට වෙන් කළා, මහින්ද මහත්මයා ආණ්ඩුව ගන්නකොට. නාමල්ගේ අප්පොච්චිලා, බාප්පොච්චිලා බැහැලා යනකොට ඒක සියයට 1.82යි. සියයට 1කින් අධ්‍යාපනයට වෙන් කළ මුදල කපා හැරියා. ඒ ගැන කථා කරනකොට ඔය ඔක්කෝම අත් එසවූවා, ඔය පැත්තේ ඉඳගෙන. දරුවන්ගේ අධ්‍යාපනයට වෙන් කරපු මුදල කපා හරිනකොට ඒකට අත් ඔසවපු කට්ටිය තමයි, මේ. අවුරුදු 10ක් ගත වෙද්දී සියයට 1කින් අධ්‍යාපන වියදම කපා හරිනකොට ඒගොල්ලන්ට ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒගොල්ලන්ගේ ළමයි යන්නේ කේම්බ්‍රිජ්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලවලට එහෙම නැත්නම් වෙනත් රටවල විශ්වවිද්‍යාලවලට. භාණ්ඩාගාරයෙන් සල්ලි ටික අරගෙන, ඔවුන් පිට රට ගිහිල්ලා පිනට ඉගෙන ගන්නේ. එහේ ඉගෙන ගෙන ඇවිල්ලා තමයි මේ කථා කරන්නේ. සියයට 1කින් අධ්‍යාපනයට වෙන් කළ මුදල කපා හැරියා. සංඛ්‍යා දත්ත එක්කයි මම ඒ ගැන මේ කියන්නේ.

ඊට පස්සේ UNP එකේ අය කියනවා මට මතකයි, අපේ කාලයේ තමයි අධ්‍යාපනය හොඳම කියලා. ඒ ගැනත් මම කියන්නම්. 2015දී අධ්‍යාපනයට වෙන් කරනවා, GDP එකෙන් සියයට 2.01ක්. සජිත් මහත්මයා උදේ මහ ලොකුවට කථා කරපු අධ්‍යාපනය ගැන මම මේ කියන්නේ. 2015දී අධ්‍යාපනය සඳහා වියදම් කරනවා, GDP එකෙන් සියයට 2.01ක්. 2019දී බැහැලා යනකොට ඒක, සියයට 1.93යි. එහෙමයි අධ්‍යාපනයට වෙන් කරපු මුදල කපා හැරියේ. එතකොට ඔය මන්ත්‍රීවරු ඔක්කෝම අත එසවූවා. ගමේ දරුවාගේ අධ්‍යාපනයට වියදම් කරන්න වෙන් කරපු මුදල කපා හරිනකොට අත ඔසවපු කට්ටිය තමයි දැන් මේ කථා කරන්නේ.

අපි ඇවිල්ලා, මේ අවුරුද්ද ඇතුළත මොකද කරලා තිබෙන්නේ? මෙන්න, අධ්‍යාපනය වනසන කට්ටිය කරපු වැඩේ. මොකද, දැන් අපට නේ කියන්නේ, අධ්‍යාපනය වනසනවා කියලා. අපි 2024දී එනකොට අධ්‍යාපනයට වියදම් කළේ GDP එකෙන් සියයට 1.78යි. 2025දී වියදම් කරනවා, සියයට 1.94ක්. ඒක සියයට 1.78ට වඩා වැඩියි කියලා තේරුම් ගන්න. 2026 අවුරුද්ද සඳහා අපි අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරනවා, සියයට 2.04ක්. ඒ, මේ අවුරුදු දෙකට. දැන් අපට කියනවා, සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරනවාය කියලා අපි කිව්ව බව. ඔව්, අපි එහෙම කිව්වා තමයි. හැබැයි, අපි කොතැනකදීවත් කියලා නැහැ, ඒක එක අවුරුද්දෙන් කරනවා කියලා. ඔබතුමන්ලා අපට හොඳ භාණ්ඩාගාරයක් දුන්නා නම්, හොඳ සශ්‍රීක රටක් දුන්නා නම් අපට එහෙම කරන්න පුළුවන්. නමුත්, අපිට බුන්වත් වෙච්ච රටක් හම්බ වුණේ. එතැන ඉඳන් තමයි පියවරෙන් පියවර දැඩි අඩි තබලා, බර ගමනක් අපි යමින් ඉන්නේ. මේ, ඔබතුමන්ලා විනාශ කරපු රට. පසුගිය අවුරුද්දේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කළේ සියයට 1.94යි. මේ අවුරුද්දේ සියයට 2.04යි. මේ ළං වෙන්නේ සියයට 6ට මිසක් ඔබතුමන්ලා කපපු පැත්තට නොවෙයි, ගරු චාමර මන්ත්‍රීතුමනි. ඒ පැත්තට නොවෙයි අපි මේ ළං වෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඕක මට කියලා වැඩක් නැහැ.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
ඔබතුමා උදේ කිව්වා, අකිල වැඩියෙන් අධ්‍යාපනයට වියදම් කළා කියලා. අකිල වියදම් කපපු හැටි මම කිව්වා. ඒ නිසා කරුණු-කාරණා කියනකොට දැනගෙන කියන්න. සංඛ්‍යා දත්තයක් එක්ක කියන්න. එහෙම නැතුව කටට ආපු පලියට කියන්න එපා. අහුවෙන හැම දෙයකින්ම අපේ පක්ෂයට ගහන්න එපා. තොරතුරු බලලා ඒවා තේරුම් අරගෙන කියන්න. 2024දී අධ්‍යාපනයට වියදම් කළේ රුපියල් බිලියන 534යි. 2025 අවුරුද්ද වෙනකොට ඒ ප්‍රමාණය රුපියල් බිලියන 620යි. අවුරුද්දක් තුළ රුපියල්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නලින් හේවගේ මහතා]

බිලියන 86කින් අධ්‍යාපනයට වෙන් කළ මුදල වැඩිවෙලා තිබෙනවා. 2026 අවුරුද්ද වෙනකොට රුපියල් බිලියන 704ක් අධ්‍යාපනයට වියදම් කරනවා. එතකොට තවත් රුපියල් බිලියන 84කින් අධ්‍යාපනයට වෙන් කළ මුදල වැඩියි. මේ අවුරුදු දෙකට විතරක් අධ්‍යාපනයට වෙන් කළ මුදල රුපියල් බිලියන 170කින් වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ ළං වෙන්නේ අර පැත්තට නොවෙයි.

අපි අධ්‍යාපනය වෙනුවෙන් දැවැන්ත සේවාවක් කරලා තිබෙනවා. නමුත්, ප්‍රශ්න තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා මතක් කරපු සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ගැටලු තිබෙනවා. ඒවා අපි හදා ගනිමු. හැබැයි, අපි මේ අධ්‍යාපනය ළඟා කරමින් ඉන්නේ ඒ පැත්තට. ඊට පස්සේ ඔබතුමන්ලා කිව්වා, අධ්‍යාපනයට මුදල් වෙන් කරලා තිබෙනවා, හැබැයි ඒවා භාවිත කරලා නැහැ කියලා. මම ඔබතුමන්ලා මුදල් භාවිත කරපු හැටි කියන්නම්.

ඔබතුමන්ලා මම මේ කියන සංඛ්‍යා දත්ත ටික උදාහරණයකට ගන්න. අපේ අගමැතිතුමිය ඉතාම පැහැදිලිව කිව්වා, සියයට 69ක, 70ක වර්ධනයකට අපට යන්න පුළුවන් කියලා. අපට එහෙම වර්ධනයකට යන්න පුළුවන්. හැබැයි, 2005දී අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කළේ කීයද? 2005දී අධ්‍යාපනයට වෙන් කරනවා, රුපියල් මිලියන 9,782ක්; නමුත්, වියදම් කරන්නේ රුපියල් මිලියන 6,444යි; සියයට 65යි. 2008දී රුපියල් මිලියන 7,202ක් අධ්‍යාපනයට වෙන් කරනවා; ඒකෙන් වියදම් කරන්නේ රුපියල් මිලියන 3,530යි; සියයට 49යි. UNP එකේ හොඳම කාලය වන 2018දී ඒගොල්ලන් අධ්‍යාපනයට වෙන් කරනවා, capital එකෙන් රුපියල් මිලියන 43,109ක්; ඒකෙන් වියදම් කරන්නේ රුපියල් මිලියන 26,503යි; සියයට 61යි. මේවා අහගන්න. උදේ කථා කළා, අධ්‍යාපන වියදම් අඩුයි කියලා. ඒ කට්ටියට මම මේවා කියන්නේ. 2018දී පැවති ආණ්ඩුවේ සජිත් මහත්තයලා ඇතුළු ඔක්කෝම අය හිටියා. 2018 වසරේදී ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 43,109යි; නමුත්, වියදම් කළේ රුපියල් මිලියන 26,503යි; ප්‍රගතිය - progress එක - සියයට 61යි. ඔබතුමන්ලා අපට රාජ්‍ය සේවාවක් භාර දුන්නා. ඒ රාජ්‍ය සේවාව වෙනස් කරන්න තමයි අපි අවුරුදු 3ක් පඩි වැඩි කරන්නේ. ඒ රාජ්‍ය සේවාවත් එක්ක අපට ඉදිරියට යන්න බැහැ. බකල් ගහන රාජ්‍ය සේවාවක් එක්ක අපට ඉදිරියට යන්න බැහැ. එම නිසා තමයි අවුරුදු තුනක් තුළ රාජ්‍ය සේවකයින්ගේ පඩි වැඩි කිරීම සඳහා රුපියල් බිලියන 3ක් අපි වෙන් කළේ.

ඒ විතරක් නොවෙයි, මේ අවුරුද්දේ රාජ්‍ය සේවයට කැබ් රථ 1,775ක් ගේන්න අපි කටයුතු කරනවා. මම මේ ගැන පසුගිය සතියේ පාර්ලිමේන්තුවේදී කිව්වාට පස්සේ, Facebook එකේ දාලා තිබෙනවා මා දැක්කා, කැබ් ගේන්නේ මන්ත්‍රීවරුන්ට කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉතින්, ඇත්ත නේ.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
කැබ් රථ 1,775යි. එතකොට වැඩිපුර ගේන්නේ කාටද? ඒ ගැනත් දැන් ඇත්ත කියන්නකෝ. *[බාධා කිරීමක්]* ඔය නයි නාළිකාවේ ඒකත් දාන්නකෝ. *[බාධා කිරීමක්]* කැබ් රථ 1,775ක් ගේන්නේ රාජ්‍ය සේවකයින්ට. *[බාධා කිරීමක්]* ඔවුන්ට පඩි වැඩි කරලා දෙන්න ඕනෑ. පහසුකම් ටික දෙන්න ඕනෑ. එතකොට තමයි මේ වැඩ ටික අපට කර ගන්න පුළුවන්කම තිබෙන්නේ. *[බාධා කිරීමක්]* අධ්‍යාපනය වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් අපි කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* වාඩි වෙන්න, වාඩි වෙන්න. අධ්‍යාපනය තුළ අපි දැවැන්ත ගමනක් යනවා. එම නිසා තමයි පළමුවැනියෙන්ම අපි වෘත්තීය අධ්‍යාපනය පැත්තට විශාල අවධානයක් යොමු කරලා තිබෙන්නේ. මේ තුළ විශේෂයෙන්ම අපි අවධානය යොමු කළේ ඒ වෙනුවෙන් මුදල් වැඩි කරන්න වාගේම දැවැන්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ගෙන ඒමටයි. ඒ දැවැන්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ විශේෂයෙන්ම අපි වෘත්තීය අධ්‍යාපනය පාසලට හඳුන්වා දෙනවා. ඔබතුමන්ලා ඒවා මෙච්චර කල් කළේ නැහැ. 2021, 2022, 2023 වර්ෂවලදී ඔබතුමන්ලා වෘත්තීය අධ්‍යාපනය ලබා ගන්න දරුවන්ගෙන් පාඨමාලාවට සල්ලි ගත්තා.

බලන්න, කටුනායක IET එක. ඒකට ආපු ළමයින්ගෙන් භාගයට භාගයක් අඩු වුණා. ඔබතුමන්ලා එහෙමයි කටයුතු කළේ. ඔබතුමන්ලාගේ දරුවන්ට භාණ්ඩාගාරයට විදලා ගත්ත සල්ලිවලින් රට ගිහිල්ලා ඉගෙන ගන්න පුළුවන්. එහෙම ඔබතුමන්ලාගේ දරුවන්ට ඉගෙන ගන්න අවශ්‍ය කටයුතු කරන ගමන් VTA එකේ ඉන්න දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදල් කපා හැරියා. එහෙම තමයි ඔබතුමන්ලා කටයුතු කළේ.

අපි මේ අමාත්‍යාංශය භාර ගෙන අවුරුද්දකින් Chatbox එකක් හඳුන්වා දුන්නා. ඔබතුමන්ලාගේ දරුවන්ට එතැනින් අවශ්‍ය තොරතුරු ටික දැන් ගන්න පුළුවන්. "1966" කියලා line එකක් අපි හඳුන්වා දුන්නා. අධ්‍යාපන අමාත්‍යාංශය ඒ සඳහා වැඩ කළා. වෘත්තීය අධ්‍යාපනයට මේ අවුරුද්දේ තමයි අපි වැඩිම මුදලක් වෙන් කර ගත්තේ. 2024දී රුපියල් බිලියන 2යි; 2025දී රුපියල් බිලියන 4යි; මේ අවුරුද්දේ තවත් රුපියල් මිලියන 2,000ක් අපි වෙන් කර ගත්තා, වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථාන ටික හදන්න. ඒ අනුව වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථාන හදන්න අපි මේ වනකොට වෙන් කළ මුදල රුපියල් බිලියන 8ක්. ඔබතුමන්ලා මොකක්ද කළේ? ඔබතුමන්ලාගේ දරුවෝ ලන්ඩන් නැත්නම් කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ගිහිල්ලා ඉගෙන ගන්නකොට අපේ දරුවෝ පන්සලේ ධර්ම ශාලාවේ තමයි වෘත්තීය පුහුණුව ලැබුවේ. ඔබතුමන්ලා එහෙමයි අපට සැලකුවේ. මේ අවුරුද්දේ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථාන 50ක් හදන්න රුපියල් මිලියන 2,000ක් අපි වෙන් කර ගත්තා. පසුගිය අවුරුද්දට වඩා රුපියල් බිලියන 4කින් අපේ වෘත්තීය අධ්‍යාපනයේ වැය ශීර්ෂය වැඩි කරගෙන තිබෙනවා, capital එක වැඩි කර ගෙන තිබෙනවා. එම නිසා අපි මේ වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථාන හදනවා. භය වෙන්න එපා. අපි කිසිම දරුවෙකුට ගෙදර ඉන්න ඉඩ තියන්නේ නැහැ. කිසිම දරුවෙකුගේ ශ්‍රම සම්පත අපතේ යන්න ඉඩ තියන්නේ නැහැ. ලබන මාසයේ ඉඳලා CDC එක ක්‍රියාත්මකයි. CDC එකට මොකක්ද කරන්න තිබෙන්නේ? ගමේ තිබෙන භූමි සම්පත් ටිකයි, මානව සම්පතයි ආර්ථික ක්‍රියාවලියට ගැට ගහන්න 14,000කට අධික රාජ්‍ය සේවකයින් ක්‍රියාත්මකයි. එම නිසා හැම දරුවෙකුම හොයාගෙන අපි යනවා. මේ පාඨමාලා සම්බන්ධව ඔවුන්ට අපි කියා දෙනවා. හැම දරුවෙකුම ගෙනැල්ලා වෘත්තීය නිපුණතාවක් සහිත දරුවෙක් බවට ඔවුන් පරිවර්තනය කරන්න අපි කටයුතු කරගෙන යනවා. අපි විශාල වැඩ කොටසක් මේ කරගෙන යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශයට ආයතන 311ක් තිබෙනවා. පසුගිය අවුරුද්දේ විතරක් මම ආයතන 84කට ගියා. Ceylon German Technical Training Institute එකට තිබෙන්නේ ආයතන 4යි. කටුබැද්දේ, බොරැල්ලේ, කිලිනොච්චියේ තිබෙන ආයතන තුනටම මම ගියා. මට යන්න බැරි වුණේ ආණමඩුවේ තිබෙන ආයතනයට විතරයි. රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට, බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයට, සාගර විශ්වවිද්‍යාලයට වාගේම අනුරාධපුරේ,

මාතර, මට්ටක්කුලියේ, බුස්සේ, තංගල්ලේ, රාජගිරියේ පිහිටි ආයතනය වාගේ ආයතන 84කට මම ගියා. මම මේ ආයතනවලට යනකොට සභාපතිතුමා කිව්වා, මීට කලින් නම් ඇමති කෙනෙක් මේවාට ඇවිල්ලා නැහැ කියලා. ඔන්න, මෙතුමන්ලාගේ වැඩ. හැබැයි, කොළඹ club එකකට ගිහින් ඇහුවා නම් කියයි, ආපු නැති දවසක් නැහැ කියලා. ඔබතුමන්ලා මොකක්ද, ඇත්තටම කළේ? මම මේ අවුරුද්දට ආයතන 84කට ගියා. මම එලෙස ගිය ආයතන ඇතුළත් ලැයිස්තුව තිබෙනවා. ඕනෑ නම් මම ඒ ලැයිස්තුව සභාගත කරන්නම්. එහෙමයි අපි වැඩ කරන්නේ. සෑම සඳුදාම මහජන දිනය කළා. *[බාධා කිරීමක්]* ඒ වැඩ ටික කරනවා. භය වෙන්න එපා, අපි මේවා හදනවා. එහෙම ඒවා හදනකොට විපක්ෂය නැති වෙන භය විතරයි දැන් අපට තිබෙන්නේ.

අපි මේ ආණ්ඩුව ගන්නකොට කිව්වා, ඔබතුමන්ලාට හැම දෙයකින්ම සතුටු වෙන්න පුළුවන්, නමුත් එකම දුකක් ඇති වෙනවා කියලා. මට මතකයි, මම ඒ ගැන හැම වේදිකාවකම කිව්ව බව. ඔබතුමන්ලාට හැම දෙයකින්ම සතුටු වෙන්න පුළුවන්, ඔබතුමන්ලාට එකම දුකක් ඇති වෙන එක නවත්වන්න බැහැ කියලා මම කිව්වා. මොකක්ද, ඒ දුක? ඒ, මෙහෙම ආණ්ඩුවක් කලින් ගෙනාවේ නැහැ කියලා ඇති වෙන දුක විතරයි. දැන් එහෙම නොවෙයිද වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලාට දුකක් තිබෙනවා, හිරේ පෙනෙන හින්දා. හැබැයි, රටේ ජනතාවට එහෙම දුකක් නැහැ.

1981දී තමයි මහපොළ ශිෂ්‍යාධාරය දෙන්න පටන් ගත්තේ. අවුරුදු 45ක්ම මහපොළ ශිෂ්‍යාධාරය හැටියට ලබා දුන්නේ රුපියල් 5,000යි.

අපි ඇවිල්ලා අවුරුදු දෙකට රුපියල් 5,000ක් දුන්නා. හොඳයි නේද? උණ ගැනෙනවා නේද, චාමර සම්පත් මන්ත්‍රීතුමා? වෙනදා ඕවා දිනා ගත්තේ ශිෂ්‍යයෝ පාරට බැහැලා, ඔළු පලාගෙන. මෙදා පාර ඔළු පැලුවේ නැහැ, පාරට බැස්සේ නැහැ. කලින් අවුරුදු 45කට රුපියල් 5,000යි දුන්නේ. අපි ඇවිල්ලා අවුරුදු දෙකට රුපියල් 5,000ක් දුන්නා. දැන් රුපියල් 10,000යි. එහෙමයි කරන්නේ.

අපි මේ අධ්‍යාපනය හදන්න ඕනෑ. අධ්‍යාපනය හදද්දි විපක්ෂයේ මන්ත්‍රීවරු ටිකටත් අධ්‍යාපනයක් දෙන්න ඕනෑ. එහෙම නැත්නම් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. අද උදේම විපක්ෂ නායකතුමා කිව්වා, පෙර පාසල් දරුවන් වෙනුවෙන් මොකක්වත් කරලා නැහැ කියලා. පෙර පාසල් වයසේ ඉන්න දරුවෙකු ගෙනැල්ලා විපක්ෂ නායකකමේ වාඩි කිරීමම මදිද? "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු" කියලා රැකියා දෙන්නේ පෙර පාසල් වයසේ දරුවෙක් නොවෙයිද? මම කියන්නේ ඒ දරුවන්ට සලකන්න පුළුවන් ඉහළම සැලකිල්ල තමයි, විපක්ෂ නායකකමේ පුටුව දෙන එක. ඊට වඩා සැලකිල්ලක් ගැන අපිට තේරෙන්නේ නැහැ. අපි දැවැන්ත පියවරක් තියලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනයෙන් තමයි මේ රට ගොඩනහන්න පුළුවන්. ඒ විශ්වාසය තිබෙනවා. අපි ඒ වෙනුවෙන් වැඩ කරනවා. විශේෂයෙන්ම අපේ අග්‍රාමාත්‍යතුමිය, අපේ නියෝජ්‍ය ඇමතිතුමා, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, සහකාර ලේකම්තුමා ඇතුළු සියලුදෙනා මහන්සි වෙලා එක පවුලක අය වාගේ මේ වැඩේ කරන්නේ. අපි හිතනවා, මේ වැඩේ ගොඩදාන්න පුළුවන් වෙයි කියලා. හැමදෙනාටම හොඳ රටක් හදාගන්න හොඳ අධ්‍යාපනයක් හදමු. ඒ වෙනුවෙන් ප්‍රශස්ත යෝජනා භාරගන්න සූදානම් කියන පණිවුඩය ලබා දෙමින් මම නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම නිවැරදිම අවස්ථාවේ මට කථාව ලැබුණේ. අපේ නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා අපේ ගමේ. හැබැයි එතුමාට මම මේක කියන්නට ඕනෑ. *[බාධා කිරීමක්]* ඔව්. අපරාදේ. මේ පැත්තට වැටුණා නම් club එකකට හරි ගිහිල්ලා හොඳින් ඉන්න තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාත් ගාල්ලේ, මමත් ගාල්ලේ. මම ගියේ ශාන්ත ඇලෝසියස් විද්‍යාලයට. එතුමා දන්නවා. එතුමා කුහක නොවී අගය කරයි, මම ඒ ඉස්කෝලේ වෙනුවෙන් ඉතාම කැපවීමෙන් වැඩ කරපු ආදි ශිෂ්‍යයෙක්. අපි භෞතික සම්පත් ගොඩක් දියුණු කළා, ආදි ශිෂ්‍යයෝ හැටියට එකතු වෙලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමා දන්නවා අනෙකුත් ඉස්කෝල කිහිපයකමත් යම් යම් කටයුතු කළ බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ අමාත්‍යතුමිය පසුගිය අවුරුදු දෙක තුළ දුන් අර නියෝගය නිසා දැන් අපිට ඒ ඉස්කෝලවලට යන්න බැහැ. ගියාම අපිව දඬුකඳේ ගහනවා, ඔබතුමන්ලාගේ අර ගමේ නීතිය නිසා. අපි දන්නේ නැහැ, කොහේදි දඬුකඳේ ගහයිද කියලා. ඒක නිසා අපි ඉස්කෝලවලට යන්නේ නැහැ. පෞද්ගලික අංශය හැටියටත්, සමාජ සත්කාර ක්‍රියාවලියක යෙදුණු පුද්ගලයකු හැටියටත් මම ඉස්කෝල දහස් ගණනකට ගිහිල්ලා තිබෙනවා, මගේ මූණ පෙන්නුවේ නැති වුණාට. ඒ කාලයේ මට දේශපාලන වුවමනාවක් තිබුණේත් නැහැ, මූණ පෙන්වන්න. අපි ඔය ව්‍යාපෘති ගොඩක් කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘති හරහා ඉස්කෝල ගොඩක් දියුණු වුණා. ඒවා දියුණු කරන්න සල්ලි හම්බ වුණේ එහෙමයි. මම ඔබතුමන්ලාට කියනවා, අපිට ඉස්කෝලවලට යන්න තහනම් කරපු නීතිය ගැන නැවත සලකා බලන්න කියලා. මොකද, අපිට ගොඩක් දේවල් කරන්න පුළුවන්කම තියෙද්දි කරන්න විධියක් නැහැ.

මම මේ ළඟදි සංගීත භාණ්ඩ වගයක් දුන්නා, කෝරලේ පැත්තේ ඉස්කෝලෙකට. මට ඉස්කෝලෙදි ඒවා දෙන්න බැරි නිසා මට යන්න වුණා දහම් පාසලකට. තව සිද්ධියක් නුවර පැත්තෙත් වුණා. අපිට ඉස්කෝලවලට යන්න බැහැ. අපිට දහම් පාසල්වලට ගිහිල්ලා තමයි ඉස්කෝලවලට බඩු බෙදන්න වෙලා තිබෙන්නේ. අපි බොහොම හොඳ හිතින් ඒවා කරන්නේ. ඒක නොවෙයිද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙතැන වඩා වැදගත් කාරණය? ඔබතුමා බොහොම ආවේගශීලීව කිව්වා, "මේගොල්ලෝ කිසි දෙයක් කරලා නැහැ" කියලා. අපි ඒක පිළිගෙන කථා කරමු. එතැනින් එහාට යන්න නේ හදන්නේ. දැන් අපි හදන්නේ ඉන්න තැනින් ඉස්සරහට යන්න. ඉතිහාසයට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. අපි යමුකෝ, ඉස්සරහට. දැන් ඉස්සරහට යන වැඩ පිළිවෙළක් ජේනවාද, මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තුළ හෝ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නට ඕනෑ, මේ නිදහස් අධ්‍යාපනය ගැන අපි බොහොම සැලකිලිමත්, ඒ වාගේම ඒකට ආදරෙයි කියලා. මෙතුමාත් මේක දන්නවා. මෙතුමා මගේ ගෙදර ගැනත් දන්න නිසා දන්නවා. මගේ මව ගුරුවරියක්. නිදහස් අධ්‍යාපනයෙන් තමයි අපි ඉස්සරහට ආවේ. හැබැයි, නිදහස්

[ගරු දිලිත් ජයවීර මහතා]

අධ්‍යාපනයෙන් ඉස්සරහට එනකොට මේ නිදහස් අධ්‍යාපනයේ සිදු විය යුතු ව්‍යුහාත්මක වෙනස්කම් කරන්නට කවමදාවත් අපි හරියට උත්සාහයක් අරගෙන නැහැ. ඇත්ත කථාව ඒකයි. හැබැයි, මෙවර මේ ගන්නා උත්සාහය, මේ අද්භූත ප්‍රතිසංස්කරණය; අපි කවුරුත් නොදන්න ප්‍රතිසංස්කරණය; අපි කොළයක්වත් නොදැකපු ප්‍රතිසංස්කරණය; PowerPoint presentation එකකින් විතරක් දැකපු ප්‍රතිසංස්කරණය ගැන ඉතාම අවංකව කල්පනා කරලා බලන්න. මේ, ඉතාම අවදානම්සහගත ප්‍රතිසංස්කරණ, අපිට තේරෙන විධියට සහ අපි තේරුම් ගත්ත විධියට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ යෝජනාවලියේ කොහේවත් නැහැ, ලෝකයේ දියුණු වෙමින් එන ඒ ගෝලීය යථාර්ථයන්ට මුහුණ දිය හැකි දරුවෙකු ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමයෙන් බිහි කරගෙන විශේෂයෙන්ම අපි මේ Gen Z හැටියට, Gen Alpha හැටියට කථා කරන නව පරම්පාරාවේ අපේක්ෂාව මුදුන්පත් කරගන්න ආකාරයක්.

නව පරම්පරාවේ මහා පොදු සාධකය හැටියට එන්නේ entrepreneurship. ඔවුන් ව්‍යවසායකත්වය බලාපොරොත්තු වෙනවා, අධ්‍යාපන ක්‍රමය තුළින්. මොකද, ඔවුන් කැමති නැහැ තවත් කෙනෙකු යටතේ වැඩ කරන්න. ඔබතුමන්ලා කියවන්න Gen Z, Gen Alpha ගැන. මොකක්ද, ඒගොල්ලන්ගේ අපේක්ෂාව? ඒගොල්ලන්ට ඕනෑ රැකියාවක් කරන්න නොවෙයි. ඒගොල්ලන්ට ඕනෑ ස්වාධීනව වැඩ කරන්න; තමන්ට ධනයක් උපයා ගන්න. මේ ප්‍රතිසංස්කරණ තුළ කොතැනද සඳහන් වෙන්නේ, මේ ස්වායත්ත, ස්වාධීන දරුවා වැඩිහිටියෙක් හැටියට එළියට එන විධිය? ඔහු තවදුරටත් යැපුම් මානසිකත්වයෙන් එළියට එන ක්‍රමයක් තමයි මේ යෝජනා කර තිබෙන්නේ. මම වගකීමෙන් කියන්නේ. මෙහි කොහේවත්ම නැහැ, නිර්මාණශීලී දරුවෙක් බිහිවීමට ඇති අවස්ථාව. මම මේ අවංකවයි කියන්නේ. ඔබතුමන්ලාට ලොකු ලණු ගොඩක් දීලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව රූකඩ ආණ්ඩුවක් කියලා කියන්නේ ඒකයි. ඔබතුමන්ලා මහ පොළොවේ ඉඳගෙන නොවෙයි තීන්දු තීරණ ගන්නේ. ඔබතුමන්ලාට ආණ්ඩුවක් හදලා දුන්නා. හදලා දුන්නු අය ඔබතුමන්ලාට එක එක යෝජනා එවනවා. ඒවා ඔක්කෝම කරන්න යනවා. ලෝකයේ තිබෙන ඒවා කියලා මනස්ගාත ප්‍රතිසංස්කරණ තොගයක් පිටරටින් එවා තිබෙනවා. ඒවා පිටරටින් ගත්තාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිටරට දේවල් අපට එහෙමම ගැළපෙන්නේ නැහැ. හැම රටක්ම තමන්ට ආවේණික සංස්කෘතියට, සභ්‍යත්වයට ඒ ආපු ඓතිහාසික යථාර්ථයට ගැළපෙන විධියට තමයි ප්‍රතිසංස්කරණ කරලා තිබෙන්නේ. බරපතළ අවශ්‍යතාවක් තිබෙනවා, විශාල ප්‍රතිසංස්කරණයක් කරන්න. ඇත්තවශයෙන්ම කිව්වොත්, සුසමාදර්ශී වෙනසක්, paradigm shift එකක් අධ්‍යාපනයට අවශ්‍යයි. හැබැයි දැන් මේ මොකක්ද කරන්නේ? දැන් මේ කරන්නේ, තිබෙන අධ්‍යාපන ක්‍රමය විනාශ වෙන, අපට කිසිසේත්ම නොගැළපෙන, අපේ දරුවෙකු, අපේ වැඩිහිටියෙකු බිහි වෙන්නට අවශ්‍ය අපේ ඒ ආවේණික පෝෂණය විනාශ කර, අපේ සංස්කෘතිය විනාශ කර, අපේ ඒ ඓතිහාසික යථාර්ථවලින් ඈත් කර බටහිරින් හරි කොහෙන් හරි ගෙනාපු අටමගලයක් දමන්න හදන එක.

දැන් ඉස්කෝල ඔක්කෝම අවුල් වෙලායි තිබෙන්නේ. අවංකවම ගත්තොත්, දැන් ඉස්කෝලවල තත්ත්වය සම්පූර්ණයෙන්ම අවුල්. මොකක්ද හේතුව? යම්කිසි උපාය මාර්ගයක් ඉටු කරගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් ගෙනියනවා නම්, ඒක පටන් ගන්න තැනත්, ඉවර වෙන තැනත්, ඒකේ උපාය මාර්ගික වැඩ පිළිවෙළත්, එය ක්‍රියාත්මක වෙන විධියත්, ක්‍රියාත්මක වෙන අදියරත් තිබෙන්න ඕනෑ. ඒ පිළිබඳ යම්කිසි පරීක්ෂණයක් කලින් කළාද, ඒ පිළිබඳ දැනුවත් කළාද? නැහැ. අපේ අහිංසක මන්ත්‍රීතුමන්ලා ගමෙන් ගෙනැල්ලා දුන්නා, මෙතැන වාඩි වෙන්න කියලා. බළලුන් ලවා කොස් ඇට බාවනවා වාගේ දැන් ඒගොල්ලන් ලවා බටහිර තිබෙන ඔක්කොම දේවල් දමනවා. අපේ අධ්‍යාපන ක්‍රමයෙත් එහෙමයි. සංචාරක ක්‍රමයෙත් කියනවා, මෙය සමලිංගිකයන්ට එන්න පුළුවන් රටක් කියලා. අධ්‍යාපන ක්‍රමයෙත් මොනවා කථා කරනවාද කියලා මට තේරෙන්නේ නැහැ. හැබැයි, මේ රටට ආදරය කරන මිනිස්සු ඉන්නවා. අවංකව මම අපේ ඇමතිතුමන්ලාට යෝජනා කරනවා, අපි සාධාරණ සංවාදයකට එමු කියලා. මොකද මේ tamper කරන්න හදන්නේ, මහා බරපතළ දෙයක්; අපේ අනාගතය. අඩුම ගණනේ අපට මෙතැනට එන්න පුළුවන්කම ලැබුණා. ඒකත් නැති කරන වැඩ පිළිවෙළක් තමයි දැන් මෙතැන සිද්ධ වෙමින් පවතින්නේ. ඕනෑ ව්‍යාජයක්, ඕනෑ බොරුවක් ඕනෑ තැනක ඕනෑ විධියට කරන්න. හැබැයි, දරුවන් සම්බන්ධයෙන් ඒ දේවල් කරන්න එපා. මේක ව්‍යාජයක්; බොරුවක්; රැවටීමක්. මේ ප්‍රතිසංස්කරණයම වැරදීමක්. මේ ප්‍රවේශයම ලොකු බොරුවක්. ඉතින්, බොරු කරලා අපේ අනාගත පරම්පරාවක් විනාශ කරලා නැවත නිවැරදි කළ නොහැකි වරදක් කරන්න තමයි මේ ප්‍රතිසංස්කරණ යෝජනාවලින් කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබත් මමත් දන්නා යථාර්ථය මෙයයි. යල් පැන ගිය අධ්‍යාපන ක්‍රමයකට අමතරව අපට අද අත්වෙලා තිබෙන සැබෑ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන සුවිශේෂී අඩු පාඩු බොහොමයක් බැලූ බැල්මටම ඔබටත්, මටත් විද්‍යමාන වෙනවා. ඒවා එකිනෙක අරගෙන කථා කරන්න මට වෙලාවක් නැහැ. නමුත්, මම කියන්නේ ඒ අඩුපාඩු නැති කරගන්න උත්සාහ කරන්න කියලායි. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමිය මේ පිළිබඳව දරන මතය මොකක්ද කියලා මම දන්නේ නැහැ. එතුමිය මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමිය මොන මතයක් දරනවාද කියලා මම දන්නේ නැහැ. අවාසනාවකට, එතුමිය අපේ නිදහස් අධ්‍යාපනයේ product එකක් නොවෙයි. ඒ නිසා සමහර විට එතුමියට අපේ විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය පිළිබඳව පෞද්ගලික අත්දැකීම් නැතිව ඇති. නමුත් අද අපේ විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතිය වැටිලා තිබෙන මේ වළෙන් ගොඩ ගන්න නම් අප මොන තරම් දෙයක් කරන්න ඕනෑද කියලා බැලූ බැල්මටම පේනවා. ඉතින්, මෙතැනට ඇවිල්ලා ආවේගශීලීව කෑ ගහලා වැඩක් නැහැ, අපේ ආදරණීය ඇමතිවරු. කථා කරන්න ඕනෑ, මේකේ තිබෙන ඇත්ත ප්‍රශ්නය ගැනයි. ඇත්ත ප්‍රශ්නය කොතැනද තිබෙන්නේ? ඒ ප්‍රශ්නය විසඳාගන්නේ කොහොමද? ඒ ප්‍රශ්නය විසඳා ගන්න නම් අපි අවංකව, දේශීයව හිතන්නේ කොහොමද?

අපේ ඇමතිතුමා ඊයේ හෝ පෙරේදා ඉංග්‍රීසි භාෂාවෙන් කථාවක් කරමින් කියපු දේ ඇත්ත. අපේ අධ්‍යාපන ක්‍රමය තුළ අපට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් වෙලා නැහැ. නමුත්, එතුමා ඒ කථාව කරන අතරේ ඒක කරන විධිය කිව්වාද? කොහොමද ඒක කරන්නේ? මේ ක්‍රමය තුළ අනාගත දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබෙන්නේ කොහොමද? අන්න ඒ ව්‍යුහාත්මක වෙනස්කම සංවාදයට ලක් වෙනවාද? මේ මොඩියුල ක්‍රමය තුළ ඒක වෙනවාද? විදුහල්පතිවරයෙකුට දවසකට රුපියල් 50ක් වැඩියෙන් දුන්නා කියලා ඒක වෙනවාද? Smart boards බෙදන එක නැවැත්තුවාම ඕක හරියනවාද? අන්න ඒ වාගේ කාරණා මතුපිටින් අරගෙන අධ්‍යාපනය දිහා බලන්න එපා කියලායි අප අවංකව ඉල්ලා සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ ආණ්ඩුවෙන් එක ඉල්ලීමක් කරනවා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාව මොහොතකට නවත්වා, සැබෑ සංවාදයකට ගිහිල්ලා, මේ පිළිබඳ විවිධ පාර්ශ්වවලින් පාරදෘශ්‍ය ක්‍රමයකට අදහස් අරගෙන, ඒ තුළ නිර්මාණය කරන අවසන්

යෝජනාවලිය ජනගත කරලා, ජනතා සංවාදයකින් පසුව අපටත් ඒකට සම්බන්ධ වෙන්න ඉඩ දීලා, අපේ අදහසුත් අරගෙන, මේ රටට අවශ්‍ය වෙනස කරන්න ඉදිරියට යන්න කියන එකයි මගේ ඒ ඉල්ලීම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ கே. காதர் மஸ்தான் அவர்கள், உங்களுக்கு 6 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 4.14]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டின் கல்வி அமைச்சின் வரவு செலவுத்திட்ட குழுநிலை விவாதத்தில் எனக்கும் பேசுவதற்கு நேரம் ஒதுக்கித் தந்தமைக்கு நன்றியைக் கூறிக் கொள்கின்றேன். இந்த வரவு செலவுத்திட்டத்தில் கல்விக்காகப் பாரிய நிதி ஒதுக்கப்பட்டிருக்கின்றது. குறிப்பாக, கல்விக்காக 704 பில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. உண்மையிலே இது வரவேற்கக்கூடிய விடயம்தான்! இது GDPஇல் சுமார் 2.17 சதவீதமாகும். அதற்காக நாங்கள் அரசாங்கத்தை வரவேற்கின்றோம்; பாராட்டுகின்றோம். அதேபோல, கௌரவ பிரதமர் அவர்கள் கல்வி அமைச்சுக்குப் பொறுப்பானவர் என்ற வகையில் அவருக்கும் இந்த இடத்தில் பாராட்டுக்களைத் தெரிவிக்கின்றோம். கடந்த காலங்களில் கல்வி சம்பந்தமாகப் பல ஏற்பாடுகள் செய்யப்பட்டிருந்தாலும், இந்த முறை கல்வியில் ஒரு சீர்திருத்தத்தைக் கொண்டுவருவதற்கு நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றன. உண்மையில் அதுவும் சிறந்த விடயம்! காலத்துக்கு ஏற்றாற்போல் கல்வி முறைமையில் மாற்றம் கொண்டுவரப்பட வேண்டும்.

குறிப்பாக, எமது வடக்குப் பகுதியை எடுத்துக்கொண்டால், அங்கு பின்தங்கிய மாவட்டங்களான முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களில் பாரிய ஆசிரிய பற்றாக்குறை நிலவுகின்றது. அது சம்பந்தமாக நாங்கள் கல்வி அமைச்சர் என்ற அடிப்படையில் கௌரவ பிரதமர் அவர்களிடம் சம்பந்தப்பட்ட அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் கூறியிருந்தோம். எது எப்படியோ, தொடர்ச்சியாக எமது மாவட்டங்களுக்கு யாழ்ப்பாண மாவட்டத்தில் இருந்துதான் ஆசிரியர்கள் கூடுதலாக வந்து கடமை புரிகின்றார்கள். உண்மையில் நாங்கள் அதற்காக அவர்களைப் பாராட்டுவதோடு, நன்றியுடையவர்களாகவும் இருக்க வேண்டும். ஏனென்றால், அவர்கள் தூர பிரதேசத்திலிருந்து அங்கு வந்து கடமை புரிகின்றார்கள். அவர்களுக்கும் பிரச்சினைகள் இருக்கின்றன. எனவே, எதிர்காலத்தில் இந்தப் பிரச்சினையை நிவர்த்தி செய்வதற்கு ஏதுவாகக் கோட்டா முறையில் ஆசிரிய நியமனங்களை வழங்குமாறு நாங்கள் கேட்டிருந்தோம். அது சம்பந்தமாக என்ன நடவடிக்கை எடுக்கப்பட்டிருக்கின்றதென்று தெரியவில்லை. அது சம்பந்தமாகத் தெளிவுபடுத்த வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன். கட்டாயம் மாவட்ட அடிப்படையில் இந்தக் கோட்டா முறையில் ஆசிரிய நியமனங்கள் வழங்கப்பட்டால் பிரச்சினைகள் ஏற்படாது. ஆசிரியர்கள் கஷ்டப்பட்டு மாணவர்களுக்குக் கல்வியை ஊட்டினாலும், அவர்களும் பாரிய பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். அவர்களுடைய வாழ்க்கையிலும் அவை தாக்கத்தை ஏற்படுத்தும். அந்த அடிப்படையில், கோட்டா முறையைச் செய்வது பொருத்தமாக இருக்கும். எதிர்காலங்களில் ஆசிரிய நியமனங்கள் வழங்கப்பட இருக்கின்றது. மாவட்ட கோட்டா அடிப்படையில் அந்த நியமனங்களை வழங்குமாறு நான் கேட்டுக் கொள்கின்றேன்

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2018, 2019ஆம் வருடங்களில் பாடசாலைக் கட்டிடங்கள் அமைத்தல் தொடர்பான வேலைத்திட்டங்கள் ஆரம்பிக்கப்பட்டன. குறிப்பாகச் சொல்வதென்றால், NSBS programme, Indian assisted programmes, CFS 1000 programme, TFR programme மற்றும் programmes under Resettlement Unit போன்ற வேலைத் திட்டங்கள் ஆரம்பிக்கப்பட்டன. இதில் குறிப்பாக NSBS programme, Indian assisted programmes, CF 1000 programme போன்ற வேலைத் திட்டங்கள் பூரணப்படுத்தப்படாமல் இடைநிறுத்தப்பட்டிருந்தன. இப்போது அவற்றை மீண்டும் ஆரம்பிப்பதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டிருக்கின்றன. இருந்தாலும், TFR programme and programmes under Resettlement Unit வேலைத் திட்டங்களின் கீழாக ஆரம்பிக்கப்பட்ட 11 பாடசாலைகளின் கட்டுமான வேலைகள் இடைநிறுத்தப்பட்டுள்ளன. கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் அது சம்பந்தமாக நான் கௌரவ அமைச்சரிடம் கேட்டிருந்தேன். அதனடிப்படையில், அதற்குரிய ஏற்பாடுகளைச் செய்து தருவதாகக் கூறியிருந்தார்கள். அது தொடர்பாக, மாகாண கல்வித் திணைக்களத்துக்கு கடிதம் அனுப்பப்பட்டு estimate பெறப்பட்டுள்ளதோடு, அதற்குரிய வேலைத்திட்டங்களும் நடைபெற்று வருகின்றன. அதற்காக கௌரவ பிரதம அமைச்சருக்கு நன்றியைக் கூறிக் கொள்கின்றேன். அதில் சில பாடசாலைகள் தொடர்பாக கடந்த காலங்களில் செய்யப்பட்ட – estimate - மதிப்பீடு இல்லை என்று அதிகாரிகளால் கூறப்படுகின்றது. அந்த விடயத்தைப் பார்க்காமல், தற்போதைய நிலைமைகளைப் பார்த்து அவற்றைச் செய்து தருமாறு கேட்டுக் கொள்கின்றேன். அது சம்பந்தமான ஆவணங்கள் இருக்கின்றது. நான் அதனை ஹன்சாட் பதிவுக்காக **table*** பண்ணுகின்றேன்.

பல்கலைக்கழக மாணவர்களுக்கு வழங்கப்படும் 'மஹாபொல' கொடுப்பனவு 10,000 ரூபாயாக அதிகரிக்கப்பட்டுள்ளது. ஆனால், இதிலுள்ள பிரச்சினை என்னவென்றால், அரச உத்தியோகத்தர்களின் பிள்ளைகளுக்கு குறித்த கொடுப்பனவு கிடைக்காது. அதுவொரு பாரிய பிரச்சினை. அவர்களுக்கு இன்று கிடைக்கின்ற வருமானத்தில் தங்களுடைய வாழ்வாதாரத்தைக் கொண்டு செல்வது பாரிய பிரச்சினையாக இருக்கின்றது. எனவே அரச உத்தியோகத்தர்களின் பிள்ளைகளுக்கும் இந்த 'மஹாபொல',10,000 ரூபாய் கொடுப்பனவை வழங்குமாறு இந்த இடத்தில் பணிவாகக் கேட்டுக் கொள்கின்றேன்.

Kurunegala District, கிரியுல்ல கல்வி வலயத்தின்கீழுள்ள சியம்பலாகஸ்கொடுவ மதீனா தேசிய பாடசாலை அங்குள்ள பிரபல பாடசாலையாகும். அந்தப் பாடசாலையின் அதிபர் தரம் Iஇற்குரியவராகத்தான் இன்னும் இருக்கின்றார். எனவே நிர்வாக சேவைத் தரத்திலுள்ள அதிபரர் ஒருவர்தான் அந்தப் பாடசாலைக்குப் பொருத்தமானதாக இருக்கும். அது தொடர்பாகப் பல கடிதங்கள் சமர்ப்பிக்கப்பட்டுள்ளன.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

ஆனாலும், அதற்குரிய ஏற்பாடுகள் காலதாமதமாகின்றதாக அங்குள்ள சமூகத்தினர் கூறுகின்றார்கள். அதனை நிவர்த்திசெய்து, நிர்வாக சேவை தரத்திலுள்ள அதிபர் ஒருவரை நியமிக்குமாறு பணிவாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே! உங்களுக்கான நேரம் முடிவடைந்து விட்டது.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
தயவு செய்து எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!
குறிப்பாகக் கூறுவதென்றால், கல்வி மறுசீரமைப்புக்கூடாக பாரிய பிரச்சினைகளை இளம் மாணவ சமுதாயம் முகங்கொடுக்க வேண்டியுள்ளதாக அறிய வருகின்றது. பாடசாலை நேரத்தை அதிகரிப்பதால், எமது மாவட்டங்களில் இருக்கின்ற பின்தங்கிய பாடசாலை மாணவர்கள் பாரிய பிரச்சினைகளுக்கு முகங்கொடுப்பார்கள். அதேபோல், முஸ்லிம் பாடசாலைளும் அதனால் பிரச்சினைகளுக்கு முகங்கொடுக்க வேண்டியேற்படும். வரவிருக்கின்ற சனவரியில் இருந்து பாடசாலை நேர அதிகரிப்பானது அமுல்படுத்தப்பட இருப்பதாகத் தெரிவிக்கப்பட்டுள்ளது. எனவே, சம்பந்தப்பட்ட தரப்பினர் கலந்தாலோசித்து உரிய முடிவுகளை எடுக்குமாறு தயவாக வேண்டி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ ரஜீவன் ஜெயச்சந்திரமூர்த்தி அவர்கள்! உங்களுக்கு 8 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 4.38]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு ரஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சுத் தொடர்பான இன்றைய குழுநிலை விவாதத்தில் கலந்து கொள்வதில் பெருமிதமடைகின்றேன். முதலில், இந்த நாட்டினுடைய பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களுக்கு எங்களுடைய மக்கள் சார்பில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். ஏனெனில், கல்வியில் பாரிய முன்னேற்றத்தை ஏற்படுத்துவதற்காக அவர் அர்ப்பணிப்புடன் உழைக்கின்றார். மேலும், கல்வி மறுசீரமைப்பில் பாரிய தாக்கத்தைச் செலுத்துகின்ற ஒரு நபராகவும், இலங்கையில் மதிக்கப்படுகின்ற ஒரு கல்வியியலாளராகவும் அவர் விளங்குகின்றார். அந்த வகையில், கல்வியிலே மிகவும் அனுபவமுள்ள அவருடைய தலைமையில் இந்த நாட்டின் கல்வி அமைச்சு வீறுநடைபோடுமென்று நம்புகின்றேன்.

இந்த இடத்திலே நான் திருக்குறள் ஒன்றை ஞாபப்படுத்த விரும்புகின்றேன்.

> "கற்கக் கசடறக் கற்பவை கற்றபின்
>
> நிற்க அதற்குத் தக"

என்று அழகாகச் சொல்லப்பட்டு இருக்கின்றது. நாங்கள் குற்றமறக் கற்க வேண்டும். கல்வியின்பால் நின்று சரியாக ஒழுக வேண்டும்; நேர்மையாக இருக்க வேண்டும். கற்றவற்றைச் சரியாகக் கடைப்பிடிக்க வேண்டும் என்று இந்தத் திருக்குறள் சொல்கின்றது. இந்தத் திருக்குறளின்படியே, கல்வி அமைச்சின் தேசிய கல்விக் கொள்கையின் இலக்கும் காணப்படுகின்றது. நாங்கள் அந்தத் தேசிய கல்விக் கொள்கையின் இலக்கினூடாக ஆரோக்கியமான, உற்பத்தித்திறன் மற்றும் மனிதாபிமானமுள்ள, கல்வி மற்றும் விமர்சன ரீதியான சிந்தனைச் சிக்கல்களைத் தீர்க்கின்ற திறன் மற்றும் படைப்பாற்றல்மிக்க மற்றும் நாட்டின்மீது மரியாதை, நம்பிக்கைகொண்ட, சகிப்புத்தன்மையான, நற்பிரஜைகளை உருவாக்கக் காத்திருக்கின்றோம். கடந்த காலங்களில் கல்விக் கொள்கையின் இலக்குகளினூடாக இந்த விடயங்களை நாங்கள் அணுகினோமா என்று கேட்டால், இல்லை என்றுதான் சொல்ல வேண்டும். காரணம், கடந்த காலத்தில் இருந்த மாணவர் சமுதாயத்துக்கும் தற்போதிருக்கின்ற மாணவர் சமுதாயத்துக்கும் இடையே ஒழுக்க விழுமியங்களில் பாரிய வித்தியாசம் காணப்படுகின்றது.

நான் ஓர் ஆசிரியராக, அதிபராக 17 ஆண்டுகளுக்கும் மேலாக கல்விச் சேவையில் கடமை புரிந்திருக்கிறேன். அதிபராக இருந்துவிட்டுத்தான் அப்பணியிலிருந்து விலகினேன். அந்தக் காலப்பகுதியில் மாணவர்கள் மந்தியிலிருந்த மனநிலை தற்போது இல்லை. 2009ஆம் ஆண்டில் இருந்த நிலைமைக்கும் 2025ஆம் ஆண்டில் இருக்கின்ற நிலைமைக்கும் இடையில் பாரிய வித்தியாசங்கள் காணப்படுகின்றன. குறிப்பாகச் சொல்லப்போனால், கொழும்பு மாவட்டத்தில் மாத்திரம் 200,000க்கும் அதிகமான மாணவர்கள் போதைவஸ்த்துப் பாவனைக்கு அடிமையாகி இருக்கின்றார்கள். இதுதானா நாங்கள் கொடுக்கின்ற கல்வி? கல்வி மறுசீரமைப்பு மூலமாக மாணவர்களுக்கு கிடைக்கின்ற நன்மைகள் தொடர்பாகப் பார்க்க வேண்டும். அதன்மூலம் நல்ல பிரஜைகளை உருவாக்க வேண்டும்; நாட்டின் பொருளாதார வளர்ச்சிக்குப் பங்களிப்புச் செய்கின்ற சிறந்த பிரஜைகளை உருவாக்க வேண்டும். அதற்காகத்தான் எமது அரசாங்கம் கல்வி மறுசீரமைப்புப் பணிகளை மேற்கொண்டு வருகின்றது. இந்தக் கல்விக்காக ஏராளமான நிதியை நாங்கள் செலவுசெய்து வருகின்றோம். இங்கு பேசுகின்ற பலர் கல்விக்காக ஒதுக்கப்படுகின்ற நிதியை அதிகரிப்பது சம்பந்தமாக வாதப் பிரதிவாதங்களை முன்வைத்தார்கள். பொருளாதாரத் தடைகளுக்கு மத்தியிலும், எங்களுடைய அரசாங்கம் கல்விக்காக அதிக நிதியை ஒதுக்கியுள்ளது.

படிக்கின்ற காலம் முதல் இப்போது வரைக்கும், பெருமளவான பணத்தை நானும் கல்விக்காகச் செலவழித்திருக்கின்றேன். அந்த வகையில், மாணவர்கள் நல்ல கல்வியைப் பெற வேண்டும்; மாணவர் சமூகத்தை ஒழுக்கமிக்கவர்களாக மாற்றியமைக்க வேண்டும் என்பதற்காக நாங்கள் நிறைய பாடுபட்டு வருகின்றோம். அண்மையில்கூட, கல்விக்கான அர்ப்பணிப்புச் சம்பந்தமாக இடம்பெற்ற ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். துஷ்யந்தன் சாத்வீகன் என்ற மாணவன் யாழ். பருத்தித்துறை, ஹாட்லி கல்லூரிக்கு க.பொ.த உயர்தர பரீட்சைக்கு - இரசாயனவியல் - செல்கின்றபோது பாம்புக் கடிக்கு இலக்கானார். அங்கிருந்த கல்வி அதிகாரிகள் மற்றும் அதிகாரிகள் உடனடியாகச் செயற்பட்டு, அந்த மாணவனுக்கு முதலுதவியளித்து, அந்த மாணவனை மீண்டும் பரீட்சை நிலையத்துக்கு அழைத்துவந்து பரீட்சையெழுத வைத்தார்கள்.

அந்த மாணவன் சகிப்புத்தன்மையோடும், மன உறுதியோடும் exam எழுதியிருந்தார். இதேபோன்று, யுத்த

காலத்தில், வீதி விளக்குகளிலும், குப்பி விளக்குகளிலும் நாங்கள் கல்வி கற்றோம். கல்விக்காக எமது பெற்றோர்கள், எமது சமூகம் பாரிய அர்ப்பணிப்பையும், ஒத்துழைப்பையும் வழங்கியிருந்தார்கள். அந்த வகையில், கல்விக்காக ஏராளமான நிதியை நாங்கள் விடுவித்து வருகின்றோம். அதிலும் குறிப்பாக, திறன்களை- skill - வளர்ப்பதற்காக எதிர்காலத்தில் ஏராளமான நிதியை விடுவிப்பதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். நான் நினைக்கின்றேன், "Accelerating investments for a skilled tomorrow" என்ற விடயத்துக்காக, 2024ஆம் ஆண்டு 2,282 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருந்தது. 2025ஆம் ஆண்டு 4,691 மில்லியன் ரூபாயாக அத்தொகை உயர்த்தப்பட்டிருந்தது. 2028 ஆம் ஆண்டு அத்தொகை 9,360 மில்லியன் ரூபாயாக ஒதுக்கப்படவுள்ளது. எனவே, எமது அரசாங்கமானது கல்விக்கான நிதியை படிப்படியாக உயர்த்தி வருகின்றதென்பது அனைவரும் அறிந்த விடயம்.

முதலாம் ஆண்டில் மாணவர்களை அனுமதிக்கின்ற விடயத்தைப் பார்ப்போம். 2019ஆம் ஆண்டு 343,912 மாணவர்கள் முதலாம் ஆண்டில் அனுமதிக்கப்பட்டார்கள். 2030ஆம் ஆண்டிலே 196,209 மாணவர்கள் என்ற வகையிலே அந்த எண்ணிக்கை குறைவடைவதற்கான வாய்ப்புகள் காணப்படுவதாக எதிர்வு கூறப்படுகின்றது. அதாவது, 43 சதவீத வீழ்ச்சி இதிலே காணப்படுகின்றது. எனவே, எதிர்கால கல்வி நடவடிக்கைகள் தொடர்பாக அரசாங்கம் பாரிய முயற்சிகளையும் திட்டமிடல்களையும் மேற்கொள்ள வேண்டியிருக்கின்றது. அந்த வகையில், நாங்கள் சரியான முடிவை எடுத்து கல்வி சம்பந்தமான விடயங்களைக் கொண்டு செல்கின்றோம்.

அதேபோன்று, இன்னொரு விடயத்தை நான் சொல்ல விரும்புகின்றேன். அண்மைக்கால ஆய்வுகளின் பிரகாரம், சகோதர மொழி கற்கும் மாணவர்களோடு ஒப்பிடுகின்றபொழுது வடக்கு, கிழக்கு மற்றும் மலையகப் பகுதிகளில் எழுத்தறிவு வீதமானது குறைவாகக் காணப்படுகின்றது. குறிப்பாக, அவர்களின் வயதுக்கு ஏற்ப கருத்திற்கொள்கின்றபோது, வடக்கிலே 16 சதவீதமான வாசிப்பு வீதமும், கிழக்கிலே 25 சதவீதமான வாசிப்பு வீதமும், மத்திய மாகாணத்திலே 11 சதவீதமான வாசிப்பு வீதமும், தெற்கிலே 5 சதவீதமான வாசிப்பு வீதமான திறன்களும் காணப்படுகின்றன. சகோதர மொழி பேசுகின்ற மாணவர்களின் சராசரி வாசிப்பு வீதம் 52 ஆகக் காணப்படுகின்றது. இது பாடத்திட்டங்களை அமுலாக்குகின்ற விடயத்தில் காணப்படுகின்ற பாரிய பிரச்சினையா? என்பது தொடர்பில் நாங்கள் சிந்திக்கவேண்டி இருக்கின்றது.

அதேபோன்று, பேச்சுத்திறன் மற்றும் ஏனைய திறன்களிலும் மிகவும் பலவீனமாகக் காணப்படுகின்றார்கள். கல்வி அமைச்சினுடைய செயற்பாடுகள், பாட அமுலாக்கம் மற்றும் ஏனைய விடயங்களை நோக்கும்போது எதிர்காலத்தில் கல்வி வளர்ச்சியானது மேலும் அதிகரிக்கும் என நாங்கள் எதிர்பார்க்கின்றோம். அத்துடன், வடக்கு மற்றும் கிழக்குப் பகுதிகளில் யுத்தம் காரணமாக மக்கள் பாரிய நிதி நெருக்கடிகளையும் பொருளாதாரப் பின்னடைவுகளையும் சந்தித்து வந்துள்ளார்கள். அவர்களையும் நாங்கள் வளப்படுத்த வேண்டிய தேவை ஏற்பட்டுள்ளது. அவர்களுக்கான போக்குவரத்து மற்றும் ஏனைய வசதிகளை ஏற்படுத்தி, அனைவரும் சமனான கல்வியைப் பெறுகின்ற கல்வி முறையை உருவாக்கி, இலங்கை என்ற இந்த அழகிய நாட்டை எல்லோரும் வசிக்கக்கூடிய ஒரு நாடாக நாங்கள் மாற்றப் போகின்றோம் என்பதில் நான் பெருமையடைந்து, எனது பேச்சை முடித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

Sir, I had seven minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

No, you have only six minutes.

[4.30 p.m.]

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Presiding Member, I rise today to contribute to this Discussion on the Votes of the Ministry of Education, Higher Education and Vocational Education. At the outset, I wish to express my sincere appreciation to the Hon. Prime Minister and Minister of Education, Higher Education and Vocational Education, her two Deputy Ministers, the Secretary and other officials of that Ministry for the dedicated work carried out despite economic limitations and many structural challenges. The steps already taken to stabilize the education system, strengthen teacher recruitment and introduce digital learning initiatives are commendable and deserve recognition.

Hon. Prime Minister, our school curriculum must evolve with the changing needs of the 21st Century. The world has moved beyond memorization-based learning. Today's children need critical thinking, creativity, financial literacy, environmental awareness, STEM skills and technology literacy. I appreciate the Ministry's efforts to begin updating the curriculum, but we must accelerate these reforms so that every student gains the skills needed for future jobs and global competitiveness.

Sir, I acknowledge the progress in introducing smart classrooms, digitized textbooks and online learning platforms. However, the digital divide still affects thousands of students, especially in rural districts. Strengthening ICT education, computer labs, AI literacy and mathematics instruction is essential. No child must be left behind simply because they lack a device or Internet access.

I appreciate the Ministry's ongoing recruitments and training programmes. Teachers are the backbone of the education system. We need continuous skills development of teachers, transparent transfer procedures and urgent filling of teacher shortages in mathematics, science, English and ICT especially in rural and estate areas. A modernized system requires highly skilled, well-supported teachers.

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

Many schools, particularly in the Eastern Province, still lack science labs, libraries, IT facilities and even basic sanitation facilities. Therefore, I urge the Hon. Prime Minister to prioritize infrastructure investments so that the learning environment of a child in the Eastern Province is equal to that of a child anywhere else in the country. Education reform must begin by ensuring equal facilities for all.

Hon. Prime Minister, the job market is changing rapidly. Therefore, our education reforms must focus on equipping our youth with practical, employable skills. Strengthening Technical Colleges, NVQ pathways, apprenticeships and industry-linked training are essential. Sectors such as renewable energy, agriculture technology, maritime, health sciences and ICT would offer great opportunities for our youth, if we educate them properly.

Our education system must serve all communities equally. Strengthening our universities is essential for national development. We must expand university capacity, promote research and innovation and build a strong university-industry partnership. Supporting collaborations with international campuses would also help retain our talent within Sri Lanka.

Education reform is not a luxury; it is a national necessity. If we modernize the curriculum, empower teachers, digitize learning, strengthen infrastructure and provide equal opportunities for all communities, we can create a generation capable of leading Sri Lanka towards progress and prosperity.

Hon. Prime Minister, I also wish to highlight another important area in our higher education sector, the need to strengthen and expand non-State universities in Sri Lanka. Our national university system can admit only around 17 to 20 per cent of eligible students each year. That means thousands of our talented young people are left without an opportunity for higher education and many are forced to go abroad, taking valuable foreign exchange out of our country. Therefore, it is essential that the Government takes additional steps to promote, regulate and support non-State universities as a trusted partner in national development. Non-State universities play a key role by expanding access for students who cannot enter State universities, reducing money spent on foreign education, introducing modern programmes in ICT, health sciences, engineering and business, encouraging private investment and international collaboration and providing job-oriented, industry-linked education.

I respectfully request the Hon. Prime Minister to introduce stronger policies and incentives such as a clear, transparent regulatory framework, allocation of land for expansion of reputable institutions, tax incentives for research, labs and infrastructure, encouraging foreign university partnerships and scholarship schemes to support middle-income families, especially with bank loan facilities and quality assurance systems. Strengthening non-State universities is not privatization, but capacity-building; it is about giving more opportunities to our children.

Hon. Prime Minister, I would also like to talk about the Sri Lankan expatriate community.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over now.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Sir, I will wind up within two minutes.

Hon. Prime Minister, I respectfully draw your attention to a pressing and long-overlooked issue: the financial burden faced by children of Sri Lankans working abroad when seeking higher education in their own country. Despite their citizenship and deep ties to Sri Lanka, these children are categorized as foreign students at State universities due to their stay in foreign countries with their families and completing their studies abroad. As a result, they are subjected to exorbitant fees, often around US Dollars 15,000 per year for medicine and US Dollars 8,000 per year for engineering-related programmes. Those are staggering costs for most expatriate families with a very few exceptions. Therefore, Hon. Prime Minister, please consider their difficulties and propose a scholarship scheme or a policy of concessions for Sri Lankan children in overseas.

Finally, Sir, I would like to say a few words about Meelad Muslim Vidyalaya, Dehiwala. இந்தப் பாடசாலை தொடர்பில் நிறைய பாராளுமன்ற உறுப்பினர்கள் பேசினார்கள். கௌரவ சமன்மலீ குணசிங்ஹ அவர்கள் இந்த விடயம் தொடர்பில் நடவடிக்கை எடுத்திருப்பதாகச் சொன்னார். கௌரவ பிரதம அமைச்சர் அவர்களே, இது ஒரு முக்கியமான பாடசாலை யாகும். கிட்டத்தட்ட 230 parents தமது பிள்ளைகளை next year தரம் 1க்கு அனுமதிப்பதற்காக இந்தப் பாடசாலைக்கு apply பண்ணியிருக்கிறார்கள். ஆனாலும், அவர்களை அந்தப் பாடசாலைக்கு எடுப்பதற்கு எந்தவோர் இடவசதியும் இல்லை. அதாவது, no classrooms, no facilities. கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நீங்கள் personally இந்த விடயத்தில் கவனம்செலுத்தி, உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ மயில்வாகனம் ஜெகதீஸ்வரன் அவர்கள்! உங்களுக்கு 8 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 4.38]

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான இன்றைய குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதை யிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

எமது தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, கல்வியில் மிகவும் அக்கறைகொண்ட ஓர் அரசாங்கம் என்பதை இம்முறை

மேற்கொண்டுள்ள நிதி ஒதுக்கீட்டின்மூலம் மீண்டும் ஒருமுறை மக்களுக்குத் தெரியப்படுத்தி இருக்கின்றோம். அந்த வகையில், இலங்கையின் வரலாற்றில் அதிகூடிய நிதியை கல்விக்காக ஒதுக்கிய பெருமை எமது அரசாங்கத்தையே சாரும். 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் கல்விக்காக மொத்தத் தேசிய உற்பத்தியில் - GDPஇல் - 2.04 சதவீதத்தை ஒதுக்கியிருக்கிறோம். கிட்டத்தட்ட 704 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. கடந்த காலங்களுடன் ஒப்பிடும்பொழுது, இம்முறை பாரியளவு அதிகரிப்பு காணப்படுகின்றது. இதற்காக எங்களுடைய பிரதம அமைச்சரும் கல்வி அமைச்சருமான கௌரவ ஹரினி அமரசூரிய அவர்களுக்கு மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த வரவு செலவுத்திட்டத்தில் வடக்கு மாகாணம் சார்ந்து பல்வேறு விடயங்கள் உள்ளடக்கப்பட்டு இருக்கின்றன. குறிப்பாக, வவுனியா பல்கலைக்கழகத்தில் விடுதிகளுக்கான கழிவுநீர் சுத்திகரிப்புப் பொறிமுறைத் தொகுதி நிர்மாணத்துக்காக 100 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கின்றது. அதே பல்கலைக்கழகத்தின் பிரயோக விஞ்ஞான பீடத்தின் உணவகத்தைத் தரமுயர்த்துவதற்காக 64 மில்லியன் ரூபாயும், சுகாதார மைய நிர்மாணத்துக்காக 45 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டு இருக்கின்றது. இதற்காக கௌரவ அமைச்சர் அவர்களுக்கு மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கடந்த மாதம் தொழிற்கல்வி அமைச்சர் அவர்கள் யாழ்ப்பாணம் மற்றும் வவுனியா மாவட்டங்களுக்கு வருகை தந்திருந்தார். அதன்போது அவர் அங்குள்ள தொழில்நுட்பக் கல்லூரிகள் பல்வேறுபட்ட குறைபாடுகளுடன் இயங்கி வருவதை நேரடியாகப் பார்வையிட்டிருந்தார். அக்குறை பாடுகளை நிவர்த்தி செய்வதற்குத் தேவையான நிதியை 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கித் தருமாறு நான் அவரிடம் கோரிக்கை விடுத்திருந்தேன். அதற்கமைய, மேற்குறித்த இரண்டு தொழில்நுட்பக் கல்லூரிகளின் அபிவிருத்திப் பணிகளுக்காக தலா 40 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கின்றது என்ற மகிழ்ச்சி யான செய்தியை நான் இவ்விடத்தில் கூறிக் கொள்கின்றேன். மேலும், வவுனியா தேசிய கல்வியியல் கல்லூரியின் அபிவிருத்திக்கும் நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது.

நாங்கள் பொதுவாக நோக்குவோமானால், இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் கல்வி சார்ந்து பல்வேறுபட்ட நன்மைகள் கிடைக்க இருக்கின்றன. அந்த வகையில், 5,000 ரூபாய் வீதம் விசேட தேவைக்கு உட்பட்ட மாணவர்களுக்கான கொடுப்பனவை வழங்குவதற்கு 50 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அது மட்டுமல்ல, அதிபர்களுக்கு மேலதிகக் கொடுப்பனவாக 1,500 ரூபாய் வீதம் வழங்குவதற்கும் இந்த வரவு செலவுத்திட்டத்தில் வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட்டுள்ளன. மேலும், மாணவர் களுக்கான சப்பாத்து மற்றும் கற்றல் உபகரணங்களைக் கொள்வனவு செய்வதற்காக கடந்த வருடங்களில் போன்று இவ்வருடத்திலும் நிதி ஒதுக்கப்பட்டிருப்பது முக்கியமான விடயமாகும். பல்கலைக்கழக மாணவர்களுக்கு வழங்கப் படுகின்ற 'மஹபொல' கொடுப்பனவு கடந்த முறை 2,500 ரூபாயால் அதிகரிக்கப்பட்டது. அதேபோல், இந்த முறையும் 2,500 ரூபாயால் அதிகரிப்பதற்கு முன்மொழியப்பட்டுள்ளது. எமது அரசாங்கமானது, இரண்டு வருடங்களில் இந்த மாணவர்களுக்கான புலமைப் பரிசில் கொடுப்பனவை 5,000 ரூபாயால் அதிகரித்து வழங்கியிருக்கிறது. பல்கலைக்கழக மாணவர்கள் மிகவும் கஷ்டத்தின் மத்தியிலேயே கல்வி கற்று வருகின்றார்கள். இது அவர்களுக்கு வரப்பிரசாதமாக அமையுமென நான் நினைக்கின்றேன்.

அடுத்து, புதிய கல்விச் சீர்திருத்தம் தொடர்பாக ஒருசில விடயங்களைக் கூற விரும்புகின்றேன். ஒவ்வொரு வருடமும் 2 இலட்சத்துக்கும் மேற்பட்ட பாடசாலை மாணவர்கள் 13 வருடக் கல்வியில் பயனற்று, எந்தவித பெறுபேறுகளையோ, பயிற்சிகளையோ பெறாமல் வெறுங்கையுடன் வெளியேறு கின்ற நிலைப்பாடு காணப்படுகின்றது. ஆனால், நாங்கள் புதிய கல்விச் சீர்திருத்தத்தில் தரம் 9 இலிருந்து தொழிற்கல்வியை உட்புகுத்தி இருக்கிறோம். இதனூடாக ஏதோவொரு வகையில் அவர்களால் தொழிற்கல்வியைக் கற்கலாம். அந்த வகையில், வெறுங்கையோடு வெளியேறுகின்ற அந்தத் துர்ப்பாக்கிய நிலையிலிருந்து அவர்களை நாங்கள் மீட்டிருக்கிறோம். அதாவது, 13 வருடக் கல்வியை முடித்துவிட்டு பாடசாலை யிலிருந்து வெளியேறுகின்ற மாணவர்கள், ஏதோவொரு தொழிலைச் செய்வதற்குரிய திறன்களைப் பெற்று, நம்பிக்கை யுடன் செல்வதற்கான வாய்ப்பை நாங்கள் இந்தப் புதிய கல்விச் சீர்திருத்தத்தின் ஊடாக வழங்கி இருக்கின்றோம்.

எமது கிராமப்புறங்களில் வசிக்கின்ற மாணவர்களுக்குப் பல்வேறுபட்ட பிரச்சினைகள் காணப்படுகின்றன. அவர்கள் கற்றல் சூழலை விரும்பினாலும், க.பொ.த. உயர் தரத்தில் கணித, விஞ்ஞான பாடங்களைத் தெரிவுசெய்து கற்பதற்கான வாய்ப்புகள் குறைவாகவே இருக்கின்றன. காரணம், அதற்குரிய ஆளணி வளம் அங்கு இல்லை. குறிப்பாக. ஆசிரிய வளம் காணப்படுவதில்லை. அத்துடன், போக்குவரத்துப் பிரச்சினைகளும் இருக்கின்றன. ஆசிரியர் பற்றாக்குறையைத் தீர்த்து வைப்பதற்காக எதிர்வரும் வருடம் ஆசிரிய நியமனங்களை நாங்கள் வழங்க இருக்கின்றோம். ஆசிரியர்கள் தாங்கள் வசிக்கின்ற இடத்திலிருந்து பணியாற்றும் இடத்துக்குச் செல்கின்ற வகையிலேயே அவர்களுக்கான நியமனங்கள் வழங்கப்பட வேண்டுமென எமது தேசிய மக்கள் சக்தியின் கொள்கைப் பிரகடனத்தில் குறிப்பிடப்பட்டு இருக்கின்றது. இதனைக் கருத்திற்கொண்டு எதிர்வரும் காலங்களில் வடக்கு மாகாணத்தில் ஆசிரியர்கள் நியமிக்கப்பட இருக்கிறார்கள். அந்தந்த மாவட்டங்களைச் சார்ந்தவர்களுக்கு வாய்ப்புகள் வழங்கப்பட வேண்டும். அதற்கான வெட்டுப்புள்ளிகளை அந்தந்த மாவட்டங்களுக்கு ஏற்ற வகையில் குறைத்து, அவர்களுக்கான நியமனங்களை வழங்கும்பொழுது இடமாற்றப் பிரச்சினையைக் குறைத்துக் கொள்ளக்கூடியதாக இருக்கும். ஆசிரிய இடமாற்றமானது, நாட்டில் பாரிய பிரச்சினையாகக் காணப்படுகின்றது. இதை நிவர்த்தி செய்தவற்கு பொருத்தமான ஓர் இடமாற்றக் கொள்கையை ஏற்படுத்துவதற்கு எங்களுடைய அரசாங்கம் தயாராக இருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைகின்றது.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

தயவுசெய்து, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

வட மாகாணத்தை எடுத்துக்கொண்டால், அங்கு குறிப்பிட்ட இடங்களில் கடமையாற்றுகின்ற ஆசிரியர்களை இடமாற்ற முடியாத சூழ்நிலை இருக்கின்றது. ஆசிரியர்களுக்கு வேறு மாவட்டங்களுக்கு இடமாற்றம் வழங்கும்போது, 2 அல்லது 3 வருடங்கள் என்ற நிபந்தனையுடன் வழங்கினால், அவர்கள் விருப்பத்துடன் பணியாற்றச் செல்வார்கள். புதிதாக ஆசிரியர்களை நியமிக்கும்பொழுது, அவர்களை அந்த இடங்களுக்கு நியமித்தால், மேற்குறித்தவர்களுக்கு விடுவிப்பை வழங்கக்கூடியதாக இருக்கும். இவ்வாறானதோர் இடமாற்றக் கொள்கையை வகுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

இறுதியாக ஒரு விடயத்தைக் கூறி முடிக்கிறேன். Supernumerary principals நீண்ட காலமாக ஒரே பாடசாலையிலேயே கடமையாற்றிக்கொண்டு இருக்கிறார்கள். அதற்குக் காரணம், அவர்களுக்கு நியமனம் வழங்கப்படும்போது விதிக்கப்பட்ட நிபந்தனைதான். அதாவது, அவர்கள் அந்தப் பாடசாலையை விட்டு வேறு பாடசாலைக்குப் போக முடியாது என்ற நிபந்தனைதான். இந்த நிபந்தனையை நீக்குவதற்குரிய ஒழுங்குகளை மேற்கொள்ளுமாறு அன்பாகக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවේදී මගේ නම සඳහන් කරමින් වැරදි ප්‍රකාශයක් කරලා තිබුණා. මම ඒක නිවැරදි කරන්න ඕනෑ. ඒ සඳහා මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, විනාඩියෙන් අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි.

බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන ලේකම් නිකුත් කරන ලද ලිපියකින් පසුගිය වසරේ දැනුම් දුන්නා, එම පාසලේම උගන්වන ගුරුවරුන්ට, එම පාසලේ දරුවන්ට ටියුෂන් කරන්න එපා කියලා. ඔව්, ඒ වෙලාවේදී ඒකට මම මැදිහත් වුණා. මොකද, රටේ කොහේවත් එහෙම නීතියක් තහවුරු කරලා නැහැ. තමන්ගේ පන්තියේ දරුවන්ට ටියුෂන් කරන්න එපා කියන එකට තමයි බොහෝ පළාත්වල අවධානය යොමු කරලා තිබුණේ. ඒ නිසා ඒක වැරදියි කියන අදහස තිබුණා. මම මැදිහත් වෙලා ඒ ලිපිය ඉවත් කර ගන්න කිව්වා. මේ ගැන ගරු මන්ත්‍රීතුමාගේ පැත්තෙන් වැරදි අදහසක් සඳහන් කරලා තිබුණා. මට ඒක නිවැරදි කරන්නයි ඕනෑ වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ பத்மநாதன் சத்தியலிங்கம் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு 8 நிமிடங்கள் ஒதுக்கப்பட்டதாகச் சொல்லப்பட்டது. நீங்கள் 6 நிமிடம் என்று சொல்கிறீர்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ஆம். ஒவ்வொருவருக்கும் நேரம் குறைக்கப்பட்டு, 6 நிமிடங்கள் ஒதுக்கப்பட்டுள்ளது.

[பி.ப. 4.48]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சந்தர்ப்பத்தை வழங்கியமைக்கு நன்றி! கல்வி என்பது எல்லோருடைய அடிப்படை உரிமை. இலங்கையில் இலவசக் கல்வி என்பது எங்களுக்குக் கிடைத்த ஒரு வரப்பிரசாதம். இந்த வரப்பிரசாதம் தொடர்ந்தும் எமது மாணவர்களுக்குக் கிடைக்க வேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்கின்றேன். அதேநேரத்தில், தனியார் கல்வி நிலையங்களில் கல்வி கற்பதற்கான சந்தர்ப்பமும் மறுக்கப்படக் கூடாது. இருப்பினும், தனியார் கல்வி நிலையங்களால் வழங்கப்படுகின்ற கல்வியின் தரத்தை உறுதிப்படுத்த வேண்டிய தேவையிருக்கின்றது. அதேநேரம், இலங்கையில் இருக்கின்ற தனியார் கல்வி நிலையங்கள் மற்றும் சர்வதேசப் பாடசாலைகளில் வழங்கப்படும் கல்வித் தரத்தைக் கண்காணிப்பதற்கான, அதனை உறுதிப்படுத்துவதற்கான முறைமை அல்லது பொறிமுறை ஒன்று இல்லாமலிருப்பதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. ஆகவே, தனியார் கல்வி நிலையங்கள், international schools போன்றவற்றின் கல்வித் தரத்தை உறுதிப்படுத்தக்கூடிய ஒரு பொறிமுறையை உருவாக்க வேண்டும்.

கல்விச் சேவையில் வளங்கள் பங்கீடு என்பது எல்லா இடங்களுக்கும் சமனாகக் கிடைக்க வேண்டும். ஒரு குடும்பத்தின் பொருளாதார நிலைமை மாணவர்களின் கல்வியில் பாரிய தாக்கத்தை ஏற்படுத்துகின்றது. ஏற்கனவே நாட்டின் பொருளாதார வீழ்ச்சி காரணமாக அவதிப்படுகின்ற மக்களின்மீது கல்விக்கான பொருளாதாரச் சுமையும் சுமத்தப்படுமாக இருந்தால், பாடசாலை இடைவிலகல்கள் இன்னும் அதிகரிக்கும். இப்போதிருக்கின்ற நிலைமையின் அடிப்படையில், எங்களுடைய பிரதேசங்களில் க.பொ.த சாதாரண தரத்துக்கு வருவதற்கு முன்னரே கிட்டத்தட்ட 16% பாடசாலை இடைவிலகல்கள் - dropouts - இடம்பெறுகின்றது. GCE (A/L) தரத்துக்கு வருவதற்கு முன்னர் கிட்டத்தட்ட 35% பாடசாலை இடைவிலகல்கள் இடம்பெறுகின்றது. அந்த வகையில், குறைந்த பொருளாதாரப் பின்னணியுடன் வாழும் குடும்பங்களில் இருக்கின்ற பாடசாலை செல்லும் பிள்ளைகளுக்கான உணவு வழங்கல் மற்றும் சுகாதாரத் தேவைகளுக்கான நிதி ஒதுக்கீடு அதிகரிக்கப்பட வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். குறிப்பாக, பாடசாலையில் தனிநபர் சுகாதார - personal hygiene - மேம்பாட்டுத் திட்டங்களுக்கு அதிகளவான நிதி ஒதுக்கீடு வழங்கப்பட வேண்டும்.

அதுபோல, மாற்றுவலுவுடைய பிள்ளைகளின் கல்வி ஊக்குவிப்புக்காக குறைந்த வருமானக் குடும்பங்களுக்கான

கொடுப்பனவுத் தொகையை அதிகரித்தமை, எங்களுடைய வவுனியா பல்கலைக்கழக மாணவர் விடுதிகளை நிர்மாணிப் பதற்கான நிதி ஒதுக்கீடு, 'மஹபொல' புலமைப்பரிசில் கொடுப்பனவை அதிகரித்தமை, தேசிய கல்வியியற் கல்லூரி புலமைப்பரிசில் பெறுநர்களுக்கான கொடுப்பனவை அதிகரித்தமை போன்ற பல நல்ல விடயங்கள் இந்த வரவு செலவுத்திட்டத்தில் காணப்படுகின்றது. அதற்காக என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அதேபோல, கல்விச் சீர்திருத்தம் ஒன்றும் முன்மொழியப்பட்டிருக்கிறது. இருந்தாலும், இந்தக் கல்விச் சீர்திருத்தத்துக்குத் தேவையான கலந்தாய்வு நடக்கவில்லை என்ற ஒரு குறைபாட்டை வெளியிலே உள்ளவர்கள் சொல்லுகின்றார்கள். இருந்தாலும், இந்தக் கல்விச் சீர்திருத்தத்தை முன்னோக்கிக் கொண்டுசெல்வதற்கு நாங்கள் உங்களுக்கு முழுமையான ஒத்துழைப்பை வழங்குவோம் என்று இந்தச் சந்தர்ப்பத்திலே நான் சொல்ல விரும்புகின்றேன். முக்கியமாக, நவீன தொழிற் சந்தைக்கு ஏற்றவாறு பாடசாலைக் கல்வி விதானத்தில் திருத்தங்கள் செய்யப் பட்டிருப்பது வரவேற்கத்தக்க விஷயம்! நவீன உலக ஒழுங்கிற்கு ஒத்திசைவாக, தொழிற்சந்தைக்கு ஏற்றவாறு சமூகத்தைத் தயார்படுத்தவேண்டிய தேவை இருக்கிறது. அந்த வகையிலே, எங்களுடைய பிரதேசத்திலே காணப்படுகின்ற முக்கியமான சில பிரச்சினைகளை இங்கே எனக்கு வழங்கப்பட்ட இந்தக் குறைந்த நேரத்திலே நான் சொல்ல விழைகின்றேன்.

எங்களுடைய வவுனியா, முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களிலே பாரிய வளப் பற்றாக்குறை காணப்படுகிறது. எங்களுடைய வவுனியா பல்கலைக்கழகத்தில் 3,500க்கும் மேற்பட்ட மாணவர்கள் கல்வி பயிலுகின்றார்கள். ஆனால், 1,000 பேருக்குத்தான் தங்குமிட வசதி இருக்கிறது. அந்த வகையிலே, அங்கே ஒரு hostelஐக் கட்டுவதற்காகக் கௌரவ பிரதமர் அவர்கள் நிதி ஒதுக்கீட்டைச் செய்திருக்கின்றார். அதற்காக அவருக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதுபோல், பல்கலைக்கழகத்தின் வெவ்வேறு பிரிவுகளுக்கும் - health centre, canteen போன்றவற்றுக்கும் - நிதி ஒதுக்கப்பட்டிருப்பது நல்ல விடயம்! ஆனால், நானும் அந்த வவுனியா பல்கலைக்கழகத்தினுடைய ஊழியராக இருந்தவன் என்ற வகையில், அங்கே solid waste management system கழிவு நீர் வெளியேற்றல் மற்றும் மலசலகூட கழிவு முகாமைத்துவத்தில் பாரிய ஒரு குறைபாடு இருக்கிறது என்பதை இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன். Solid waste management system ஒழுங்காக இல்லாதபடியால் அந்தப் பல்கலைக்கழகத்தைச் சூழவுள்ள மக்கள் பல சுகாதாரச் சீர்கேடுகளை அனுபவிக்கிறார்கள். So, I kindly request the Hon. Prime Minister to allocate some money to establish a solid waste management system in the Vavuniya University. Its surroundings are always being polluted as there are a lot of people living around the University. Please, kindly note down this issue. I was working in the Vavuniya University for about six years. So, I know what is actually happening in the Vavuniya University. Therefore, Solid waste management system is a priority in our University.

அதேபோல, எங்களுடைய கல்வி வலயங்களிலே தமிழ், சிங்கள மொழிகளுக்கான ஆசிரிய வளப் பற்றாக்குறை மிகவும் கூடுதலாக இருக்கிறது. குறிப்பாக, சிங்கள மாணவர்கள் வவுனியாவில் இருந்து அனுராதபுரம் சென்று கல்வி கற்க வேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலைமை இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் தமிழ், சிங்கள மொழிமூல ஆசிரியர்களை நியமிக்கும்போது இதைக் கவனத்தில் எடுக்க வேண்டும் என்று நான் தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, எங்களுடைய வன்னித் தேர்தல் தொகுதியிலே 75 சதவீதத்திற்கும் மேற்பட்ட மாணவர்கள் மாகாணப் பாடசாலைகளில்தான் கல்வி கற்கின்றார்கள். அங்கு அதிபர் களுக்கு 25 சதவீதமும், ஆசிரியர்களுக்கு 18 சதவீதமும் பற்றாக் குறை காணப்படுகின்றது. அங்கு பாட ரீதியாகப் பார்க்கும் போது, 67 per cent of Primary English teachers' posts are vacant. So, there are not enough English teachers for the primary section. Around 32 per cent of mathematics teachers' posts are vacant in the secondary section.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்து விட்டது.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிகவும் முக்கியமான விடயத்தைக் குறிப்பிட வேண்டும். தயவுசெய்து ஒரு நிமிடம் தாருங்கள்!

அதேபோல, வவுனியா மாவட்டத்தில் க.பொ.த. உயர்தரம் கற்பிக்கின்ற ஆசிரியர்களுக்கு, around 43 per cent of the posts are vacant. Then, around 83 per cent of the posts for teachers in General English for GCE A/L are vacant. So, kindly take note of these matters.

மிகவும் முக்கியமான பாடங்கள் சம்பந்தமாக மாத்திரம்தான் நான் சொல்லியிருக்கிறேன். வவுனியா வடக்குக் கல்வி வலயம் மிகவும் முக்கியமானது. அங்கே பல தேவைகள் இருக்கின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, நேரம் முடிவடைந்து விட்டது.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
முடிக்கிறேன்.

அதேமாதிரி, தேசிய கல்வியற் கல்லூரியின் கட்டிடம் இடிந்து விழுந்த நிலையில் காணப்படுகின்றது. தேசிய கல்வியற் கல்லூரியின் மாணவர் ஒருவர் கௌரவ அமைச்சராக இங்கே இருக்கிறார். ஆகவே, இந்த விடயங்களை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අධ්‍යාපන වැය ශීර්ෂය පිළිබඳව අද දිනයේ විවාදය පැවැත්වෙනවා. අපි දන්නවා, ලංකාවේ දේශපාලනයේ වැඩිපුරම කියැවුණු, වැඩිපුරම වාද විවාද කෙරුණු. නැත්නම් වැඩිපුරම සටන්, අරගළ සිද්ධ වෙච්ච මාතෘකා, කරුණු කාරණා කිහිපයක් තිබෙන බව. ඒ අනුව, ලංකාවේ අධ්‍යාපනය කියන්නේ, පසුගිය දශක තුන හතරක කාලය තුළ දේශපාලනය තුළ වැඩිපුරම සාකච්ඡාවට බඳුන් වෙච්ච, වැඩිපුරම සිද්ධි සිදු වෙච්ච, වැඩිපුරම මාතෘකාවක් වෙච්ච කාරණයක්. ඒක සිදු වුණු හැටිත් අපි දන්නවා. ලංකාවේ අධ්‍යාපනය ගත්තොත්, මූලිකව එහි අවධි කිහිපයක් තිබෙන බව අපි දකිනවා.

1947දී නිදහස් අධ්‍යාපන පනත රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සම්මත වුණාට පසුව වාගේම අධ්‍යාපනය අයිතියක් විධියට පිළිගෙන ඒ කටයුතු සිද්ධ වුණාට පසුව ඊළඟ දශක කිහිපයේදී ලංකාවේ අධ්‍යාපනය වර්ධනය කිරීමේ දිශාවට ප්‍රතිපාදන වැඩි කරමින්, ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගනිමින් කටයුතු කළා. විශේෂයෙන්ම 1950 දශකය වාගේ වෙනකොට මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කරලා, විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් කරලා, මෙතෙක් කල් අධ්‍යාපනය නොලැබුණු ලංකාවේ පහළ පාන්තික දරුවන්ට, නැත්නම් මෙච්චර කාලයක් ඉස්කෝලේ නොගිය ලංකාවේ ඈත ගම්වල දරුවන්ට පාසල්වලට, විශ්වවිද්‍යාලවලට යන්න පුළුවන් විධියට භාෂාවෙන් අධ්‍යාපනය ලබා දෙන තැන්වලට මේ අධ්‍යාපනය අරගෙන ගිය බව අපි දන්නවා. 1950, 1960, 1970 දශකවලින් පසුව නැවත 1977දී වෙනසක් වෙනවා. එය අධ්‍යාපනයේ විතරක් සිදු වූ වෙනසක් නොවෙයි. නමුත්, 1977දී ලංකාවේ සිදු වෙච්ච ආණ්ඩු වෙනසත් එක්ක, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් ලංකාවේ ආර්ථික, සමාජයීය ක්‍රමවේදයේ මූලික වෙනසක් ඇති කළා. අපි "විවෘත ආර්ථිකය" කියලා හඳුන්වන්නේ ඒක. එතැනින් පස්සේ අපි හඳුනා ගන්නවා, අධ්‍යාපනයට තිබුණු ප්‍රමුඛත්වය, නැත්නම් ජනතාවගේ සුබසාධනවලට තිබුණු ප්‍රමුඛත්වය ඉතාම වේගයෙන් අඩු කරමින්, ඒක වෙන දිශාවකට හරවනවාය කියන එක. ඒක තමයි ඇත්ත. ඒ නිසා තමයි 1980-90 දශකය වෙනකොට අධ්‍යාපනයට වෙන් කරන ප්‍රතිපාදන බොහොම අඩු වුණේ. ඔය GDP එක ගැන කථා කරන කවුරු හරි හොයලා බලන්න, 1977 අවුරුද්දේ ඉඳන් කොහොමද chart එක පහළට හැදුණේ කියලා. මොකද, දිගින් දිගටම අධ්‍යාපනයට වෙන් කරපු ප්‍රතිපාදන අඩු වුණා. අධ්‍යාපනයේ දිශාව වෙනස් වුණා. මේක තමයි වැදගත්ම දේ. ඒ කියන්නේ, අධ්‍යාපනයේ දිශාව වෙනස් වුණා. එච්චර කාලයක් අධ්‍යාපනයේ දිශාව යොමු වෙලා තිබුණේ රටේ දරුවන්ට අධ්‍යාපනය ලබා දීම, එලෙස ලබා දෙන අධ්‍යාපනය වැඩි කිරීම, රටේ ජනතාවට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම කියන කටයුතුවලට. එතැනින් පසුව අධ්‍යාපනය ඒ දිශාවට නොවෙයි ගමන් කළේ. අධ්‍යාපනය කියන්නේ, අත්හැරිය යුතු, අඩු කළ යුතු, කරදරකාරී යමක් විධියට සලකා තමයි ඉන්පසුව කටයුතු කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකේ ප්‍රතිඵල ගොඩක් තිබෙනවා. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාව ගෙවපු මිලක් තිබෙනවා. එතැනින් පස්සේ දිගින් දිගටම මේ දේවල් ඇදීගෙන එද්දී, එහි ප්‍රතිඵලයක් හැටියට තමයි අධ්‍යාපනයට වෙන් කරන මුදල ගැන අද දවසේත් අපි වැඩිපුරම සාකච්ඡා කරන තැනකට පැමිණිලා තිබෙන්නේ.

විශේෂයෙන් අගමැතිතුමියගේ සියයට 6 කියලා දෙයක් ගැන අද කථා කළා නේ. ඒ කියන්නේ, අධ්‍යාපනයට වෙන් කළ සියයට 6 ගැන නොවෙයි, අගමැතිතුමියගේ සියයට 6 ගැන තමයි අද කථා කළේ. එතකොට දැන් මේක අගමැතිතුමියගේ සියයට 6ද? මේක අගමැතිතුමියගේ සියයට 6 නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ, අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කළ යුතුයි කියන මූලධර්මය. ඒ මූලධර්මය පිළිගන්න කියලා මීට අවුරුදු 13කට කලින් සිද්ධ වෙච්ච අරගළය, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මුල් වෙලා ගෙන ගිය ඒ උද්ඝෝෂණ, සටන් ව්‍යාපාරය තුළ අපිත් හිටියා.

මමත් පෞද්ගලිකව ඒ උද්ඝෝෂණවල අනන්තවත් ඉඳලා තිබෙනවා, ඒ අවුරුද්ද ඇතුළත. මේ විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඉඳලා තිබෙනවා. මෙතුමන්ලාත් ගාල්ලේ ඉඳන් කොළඹට පයින් ආවා. ඒ හැමෝම අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කළ යුතුයි කියන එක පිළිගත්තා. එහෙම පිළිගෙන ගත වෙච්ච අවුරුදු 13 තුළ මේ දෙගොල්ලම ආණ්ඩු කළා. රාජපක්ෂලා කරපු එක පැත්තකින් තියන්නකෝ. ඒගොල්ලන් කරන්නේ නැති නිසා නේ ඒගොල්ලන්ට විරුද්ධව මේක කළේ. හැබැයි, යහ පාලන ආණ්ඩුවකුත් තිබුණා. ඒ අවුරුදු පහේ මොකද කළේ? ඒ සම්බන්ධයෙන් අවුරුදු පහක Budgets පහක් අරගෙන බැලුවොත්, යන්නේ කොහේටද කියලා දිශාවක් පෙනුණාද? එහෙම නැහැ. ප්‍රතිපත්තියක්, මූලධර්මයක් විධියට අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කළ යුතුයි, මුදල වැඩි කළ යුතුයි කියන එක පිළිගත්ත, පිළිගන්න ආණ්ඩුවක් අපි. ඒ හින්දා තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඇතුළත් කරලා තිබුණේ කඩා වැටුණු, බංකොලොත් වුණු ආර්ථිකය තුළ ක්‍රමානුකූලව එතැනට යන්න ඕනෑ කියලා. ඒක අගමැතිතුමියගේ සියයට හය නොවෙයි. ඒක අපි හැමෝම - පක්ෂ, විපක්ෂ සියලු දෙනා - එකඟ වෙච්ච තැනක්. අපි දන්නේ නැහැ, එකඟ වුණේ ඇත්තටද, බොරුවටද කියලා. නමුත් අපි නම් ඇත්තටම තමයි ඒකට එකඟ වුණේ. 2024, 2025, 2026 වසරවල Budgets අරගෙන බැලුවොත් - සමස්ත මුදල නැතිව මම කියන්නම් - අධ්‍යාපන අමාත්‍යාංශයට ප්‍රාග්ධන වියදම් විධියට 2024 අය වැයෙන් රුපියල් මිලියන 41,561ක් වෙන් කරලා තිබෙනවා. 2025 අපේ පළමුවැනි අය වැයෙන් ඒක 65,893ක් දක්වා වැඩි කරලා තිබෙනවා; රුපියල් මිලියන 41,000, රුපියල් මිලියන 65,000 වෙලා තිබෙනවා. මේ අය වැයේ ඒක 70,000යි. ප්‍රාග්ධන වියදම් වැඩි කරන එක ඇතුළේ තමයි සංවර්ධනය වෙන්නේ. මේක වැඩි කරගෙන යනවා. වසර ගණනකට පසුව සියයට දෙකෙන් උඩට ගෙනැත් තිබෙනවා. උඩට ගිහිල්ලා තිබෙනවා; එහෙම තිබෙනවා. අපි මේක සලකන්න ඕනෑ, ඒ විධියට.

ඊළඟට, වෛද්‍ය පීඨ ගැනත් කථා කළා. වෛද්‍ය පීඨ 12න් දෙකක් එතුමන්ලා හැදුවා කියලා කිව්වා. හදනවාට හදන එක නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ප්‍රශ්නය. අපි මේ අය වැයෙන් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. රුපියල් මිලියන 11,000ක් වෙන් කරලා තිබෙනවා, සබරගමුව, මොරටුව, ඌව වෙල්ලස්ස, නැඟෙනහිර, වයඹ ඇතුළු වෛද්‍ය පීඨවල ගොඩනැඟීම් අවසන් කරන්න. එහෙම එකක් මේ අයගේ තිබුණේ නැහැ. මේගොල්ලන් පටන් ගත්තා. හැබැයි, 2005දී රජරට වෛද්‍ය පීඨය පටන් අරගෙන, අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විධියට ඉන්දෙද්දි, අවුරුදු පහකින් නිම කරන්න ඕනෑ පාඨමාලාව 2012දී - අවුරුදු හතකට පස්සේ- නිම කළේ. අවසන් වසරේ ගොඩනැඟිල්ල හදන්න කියලා ශිෂ්‍යයන් කොළඹ ඇවිල්ලා උද්ඝෝෂණ කරලා වතුර පාරවල් කාලා ගියේ. අවුරුදු අටකට, නවයකට පස්සේ තමයි උපාධිය අරගෙන ඉවත් වුණේ. අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙතුමන්ලාට තිබුණු දැක්ම ඒක. එතකොට අපේ වෙනස, දැක්ම හරි පැහැදිලියි. ජනතාව වෙනුවෙන්, මේ රට වෙනුවෙන් නිදහස් අධ්‍යාපනය තහවුරු කරන දිශාවකට අපි මේක අරගෙන යමින් තිබෙනවා.

ඒ වාගේම මේ ආණ්ඩුව ශිෂ්‍යයන් වෙනුවෙන් කළ දේවල් පිළිබඳත් කථා කළා. මේ ආණ්ඩුව ආවාට පස්සේ අධ්‍යාපනයේ

විෂමතාව වෙනස් කරලා සමානාත්මතාව හදන්න ඕනෑ කියන පදනමින් තමයි අපි වැඩ කරගෙන ආවේ. ඒ අනුව තමයි පළමුවන කාර්යය විධියට දුගී බව නිසා පාසල් හැරයන්න නියමිත ශිෂ්‍යයන්ට ප්‍රමුඛතාව දීලා කටයුතු කළේ. ඒ අනුව තමයි අධ්‍යාපනය ලබන මිලියන 3.8ක ශිෂ්‍යයන්ගෙන් තුනෙන් එකකට ආසන්න සංඛ්‍යාවකට පාසල් උපකරණ ගන්න රුපියල් 6,000ක වවුචරයක් ලබා දෙන්නේ. ඒක මේ අය වැයෙන් ලබා දෙනවා. මේ වසරෙත් ලබා දෙනවා. ඒ වාගේම දිළිඳු ශිෂ්‍යයන්ට පාසල් පාවහන් ලබා දෙනවා. සිසුන් 250ට අඩු පාසල්වලට, වතුකරයේ සියලු පාසල්වල දරුවන්ට, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඉගෙනුම ලබන පාසල්වලට, පිරිවෙන්වලට -ඒ සියල්ලටම- පාවහන් ලබා දෙනවා. ඊළඟට, පාසල් දිවා ආහාරය සඳහා දෙන මුදල වැඩි කරලා තිබෙනවා. පහ වසරේ ශිෂ්‍යාධාරය වැඩි කරලා තිබෙනවා. අපි මේ සියලු දේවල් කරන්නේ ප්‍රාග්ධන වියදම් වැඩි කිරීමට අමතරවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න. අවසාන වශයෙන් මම තව කාරණයක් කිව යුතුයි. අධ්‍යාපනයට අපි කරන දේ ගැන දිශාව තේරුම් ගන්න හොඳ උදාහරණයක් තමයි, මහපොළ ශිෂ්‍යාධාරය. අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ විධියට හිටියා. ඒ වාගේම අපි විශ්වවිද්‍යාල ශිෂ්‍ය ව්‍යාපාරයේ වැඩ කළා. 2008 වසරේ අපි විශ්වවිද්‍යාලයට එනකොට මහපොළ ශිෂ්‍යාධාරය වශයෙන් ලැබුණේ රුපියල් 2,500යි. ඒ කාලයේ මම අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු විධියට සිටියදී, - මට ඒකයි ඒක හොඳට මතක - අපි උද්ඝෝෂණයක් කළා, මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 2,500 සිට රුපියල් 5,000 දක්වා වැඩි කරන්න කියලා. ඒ උද්ඝෝෂණය හරි විශේෂයි. ඒ උද්ඝෝෂණය මේ පාර්ලිමේන්තුව ළඟ කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"දියත" උයන ළඟ ඉඳන් පාර්ලිමේන්තුව ළඟට ආවාට පස්සේ, ඒ ශිෂ්‍යයන්ට ආයෙත් "දියත" උයනට යනතුරු එළවා එළවා ගැහුවා. මම හිතන විධියට, ඒ උද්ඝෝෂණයට සහභාගී වුණු ශිෂ්‍යයෝ ගණනාවක්, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට අද ඉන්නවා. එහෙම කරලා සතියක් ඇතුළත, 2015 ජනාධිපතිවරණයට කලින් සතියක් ඇතුළත මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000ක් කළා. ගුටි කාලා තමයි, ශිෂ්‍යයෝ ඒක වැඩි කර ගත්තේ. එදා අපි ගුටි කාලා ඒක රුපියල් 5,000 කළාට පස්සේ, ඒක රුපියල් 7,500 දක්වා වැඩි කළේ අපේ ආණ්ඩුවක් හදලා මේ අවුරුද්දේ මාර්තු මාසයේ. අපි ඒක රුපියල් 7,500ක් කළා. ඒ රුපියල් 7,500 කරලා මාස හතක් ඇතුළත අපේ දෙවැනි අය වැයෙන් ඒක රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඒ වාගේම, අඩු ආදායම්ලාභී ශිෂ්‍යයන්ට තවත් රුපියල් 5,000ක් ලබා ගන්න පුළුවන් වෙන විධියට, රුපියල් 15,000ක් දක්වා ලබා ගන්න පුළුවන් වෙන විධියට ක්‍රමයක් නිර්මාණය කළා. ඒක තමයි අධ්‍යාපනය සම්බන්ධයෙන් අපේ දැක්ම, අපේ දිශාව. සියලු දේවල් පළමුවැනි මොහොතේ කරන්න බැරි එක හරි. අපි දිශාව පෙන්වලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි; කොහේටද යන්නේ කියලා පෙන්වා තිබෙනවා.

ඒ නිසා අවසාන වශයෙන් මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා, අනේ, ඒකටත් විරුද්ධව උසාවි හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යන්න ලැහැස්ති වෙන්න එපා කියලා. මොකද, එහෙම වතු කම්කරුවන්ගේ වැටුප සම්බන්ධයෙනුත් උසාවි ගියා. අපි දන්නේ නැහැ, ඒකට මොනවා හරි ප්‍රශ්නයක් වෙයිද කියලා. එහෙම වෙන්නේ නැහැ. නමුත්, තව මොකක් හරි වෙයිද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා මේකටත් එහෙම යන්න එපා. ජනතාවට දෙන සුබසාධන සම්බන්ධයෙන් හොඳ හිත ඇතිව වැඩ කරන්න කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත්.පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.04]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන සීමිත කාලය තුළ අද දවසේ එතරම් සාකච්ඡා නොවුණු කාරණයක් ගැන අවධානය යොමු කරන්න කැමැතියි. ගරු අධ්‍යාපන ඇමතිතුමියනි, ඒ තමයි ජාත්‍යන්තර පාසල් පිළිබඳ ප්‍රශ්නය. ජාත්‍යන්තර පාසල් හැම නගරයකම දැන් ඇති වෙලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ ගත්තොත්, අගලවත්තේ විතරයි ජාත්‍යන්තර පාසලක් නැත්තේ. අනෙක් හැම නගරයකම ජාත්‍යන්තර පාසලක් තිබෙනවා. පානදුරේ, කළුතර, බණ්ඩාරගම, හොරණ කිහිපය බැගින් තිබෙනවා. ජාතික පාසල්වල, ඒ වාගේම රජයේ අනෙකුත් පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ සැක සංකා නිසා, විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඇති දුර්වලතා නිසා දෙමාපියන් කල්පනා කරනවා, මූලිකව දරුවන්ට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම තමයි ජීවිතය ගොඩ යන මඟ කියලා. ඒකේ ඇත්තකුත් තිබෙනවා. ඉංග්‍රීසි හොඳින් දන්නවා නම්, දැනුම ලබා ගැනීම පහසුයි. අද ලෝකය පුළුල් වෙලා තිබෙනවා. ඒ නිසා ඉංග්‍රීසි බසින් ඉගෙන ගැනීම තමයි ප්‍රධාන දේ. නමුත්, එහෙම ගිහිල්ලා ඒ අය යන්නේ කිසිම ප්‍රමිතියක් බලන්නේ නැති, අධීක්ෂණයක් නැති, ඉතාම අන්ධකාර ලෝකයකට. සමහර ජාත්‍යන්තර පාසල් ඉතා ඉහළ ප්‍රමිතියකින් පවත්වා ගෙන යන අතර, තවත් ජාත්‍යන්තර පාසල් අතිශයින් නරක ප්‍රමිතීන් ඇතිව පවත්වා ගෙන යනවා. ළමයෙක්, දෙදෙනෙක්, 100ක් නොවෙයි, අද මේ වෙනකොට නිසැක ලෙසම ජාත්‍යන්තර පාසල් පද්ධතිය තුළ ළමයි ලක්ෂ ගණනක් ඉන්නවා. නමුත් ගරු ඇමතිතුමියනි, මේ අය වැයෙන් ජාත්‍යන්තර පාසල්වල අනාගතය ගැන, දිශානතියක් කථා කරලා නැහැ. ජාත්‍යන්තර පාසල්වල ප්‍රමිතිය සකස් කිරීම ගැන, ඒ දිශානතිය ගැන කථා කරලා නැහැ. අද ජාත්‍යන්තර පාසල්වලට යන්නේ වරප්‍රසාද තිබෙන පවුල්වල අය නොවෙයි. ඒ වරප්‍රසාද තිබෙන පවුල්වල අය, කොළඹ ඉතා වටිනා මාසයකට ලක්ෂ ගණනක් ගෙවන ජාත්‍යන්තර පාසල් කිහිපයක් තිබෙනවා, ඒවාට යනවා. ගම්වල සාමාන්‍ය පුංචි මිනිස්සු, මැද පෙරදිග වැඩ කරන රියදුරාගේ දරුවා, ගෘහ සේවිකාවගේ දරුවා ඒකට යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. ජාත්‍යන්තර පාසල්වල අනාගතය පිළිබඳ රජය ප්‍රතිපත්තියක් තීරණය කළ යුතුයි. ජාත්‍යන්තර පාසල්වල අධ්‍යාපන ප්‍රමිතිය සහ ඒවා අධීක්ෂණය කිරීම පිළිබඳ වගකීම රජය භාර ගත යුතුයි. ඒවා

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

Edexcel Exams කරනවාද, Cambridge Exams කරනවාද කියන ප්‍රශ්නය විතරක් නොවෙයි, මේ ළමයි අපේ ළමයි. ඒ අයගේ අනාගතය පිළිබඳ වගකීමක් රජයට තිබෙනවා. ඒ නිසා ජාත්‍යන්තර පාසල්වල ප්‍රමිතිය පවත්වා ගෙන යෑම සහ අධීක්ෂණය පිළිබඳව විශේෂයෙන් වගකීමෙන් ක්‍රියා කළ යුතුයි. අපි රජයෙන් මුදල් ඉල්ලන්නේ නැහැ. අපි කියන්නේ, මේ කාරණය පිළිබඳව වග කියන විශේෂිත අංශයක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත කරන්න කියලායි. නමට නොවෙයි ඒ පිළිබඳව වග කියන, සොයා බලන, බලය තිබෙන, ප්‍රතිඵල පෙන්වන අංශයක් ස්ථාපනය කරන්න. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළ ඒ පිළිබඳව සොයා බැලීම සඳහා විශේෂිත කාරක සභාවක් පත් කරන්න. මේක ලොකු ප්‍රශ්නයක්, බරපතළ ප්‍රශ්නයක්, රටේ අනාගතය තීරණය කරන ප්‍රශ්නයක්.

ගරු අගමැතිතුමියනි, මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මොකද, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පළමු ව්‍යාපෘතිය ආරම්භ කළේ බණ්ඩාරගම රඹුක්කන විද්‍යාලෝක විද්‍යාලයෙන්. පසුගිය අය වැය විවාදය අවස්ථාවේදී මම ඔබතුමියට ඒ පිළිබඳව කියා සිටියා. අපිට සම්පූර්ණ සැලැස්මක් තිබෙනවා, master plan එකක් තිබෙනවා. ඒ master plan එකෙන් කොටසක් විතරක් අපි ඉෂ්ට කරලා තිබුණා. ඔබතුමිය ඒ අඩක් නිම කළ ගොඩනැඟිලි සෑදීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ඒ කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙනවා. ඒ master plan එකේ තිබෙන ඉතිරි කොටසත් සම්පූර්ණ කරලා අංග සම්පූර්ණ ආදර්ශ පාසලක් රඹුක්කන විද්‍යාලෝක විද්‍යාලයේ ඉදි කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

ඔබතුමිය ගැන අද ගොඩක් විවේචන තිබුණා. මම අහගෙන හිටියා ඒ විවේචන. ඒ විවේචනවලින් සමහර ඒවා සාධාරණයි, සමහර ඒවා අසාධාරණයි. නමුත් ඔබතුමියට අධ්‍යාපනය නැංවීමට අවංක උනන්දුවක් තිබෙනවා. මම ඒ ගැන කිසිසේත් සැක කරන්නේ නැහැ. ඔබතුමියගේ චේතනාව මම කිසිසේත් සැක කරන්නේ නැහැ. අලුත් දැක්මක්, අලුත් වැඩ පිළිවෙළක් සඳහා ඉදිරියට යන්න අවශ්‍යයි.

මම ඔබතුමියට සුබ ප්‍රාර්ථනා කරනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි, අත්‍යවශ්‍යයි. විශේෂයෙන් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ප්‍රශ්නය ගැන අලුත් විධියට, විප්ලවීය ලෙස හිතන්න අවශ්‍යයි, අලුත් ආකෘතියක් අවශ්‍යයි. ඒ ගැන මතක් කරමින්, මම නැවත වාරයක් ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා ජාත්‍යන්තර පාසල් පිළිබඳ ප්‍රශ්නය විමර්ශනය කරලා, සොයා බලන්න අවශ්‍ය කරන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. ඒ හරහා විපක්ෂයේ ඉන්න අපටත් ඔබතුමියට සහාය වෙන්න පුළුවන්, ඒ ප්‍රශ්න විසඳීම සඳහා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு எம்.கே.எம். அஸ்லம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. M.K.M. ASLAM left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 5.09]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා ලාංකීය සමාජය වෙනස් කරන්න වෙර දරන මිනිසුන් ඒ වෙනුවෙන් අරගළ කළ ඉතිහාසයක් ලංකාවේ තිබෙන බව. 1971දී වෙන්න පුළුවන්, 1989දී වෙන්න පුළුවන්, ආසන්න වශයෙන් 2022දී වෙන්න පුළුවන්, මිනිසුන් වෙනසක් ඕනෑ කියන කාරණය දැඩි සේ මතු කළා. හුදෙක් දේශපාලන වෙනසක් විතරක් නොවෙයි, සමස්ත ආර්ථික, සමාජයීය සහ සංස්කෘතිකමය වශයෙන් සාකල්‍ය වෙනසක් වෙනුවෙන් තමයි මිනිස්සු ඒ අරගළ කරන්නේ. සමාජයේ යම් වෙනසක් කරනවා නම් ඒ වෙනසකට දායක වෙන්නේ ඒ රටේ පුරවැසියෝ. එහෙම නම් යම් රටක වෙනසක් සාධනීයව බලාපොරොත්තු වෙනවා නම් අපිට පුරවැසියා වෙනස් කරන්න වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ තිබෙන්නේ ඒ රටේ අධ්‍යාපනය තුළ. අන්න ඒ නිසා තමයි ශ්‍රේෂ්ඨ දේශපාලනඥයකු වන නෙල්සන් මැන්ඩෙලා කියන්නේ, අධ්‍යාපනය යනු ලෝකය වෙනස් කිරීමට ඔබ ළඟ ඇති බලවත්ම අවියයි කියලා.

අපේ රටේ අධ්‍යාපනය වෙනස් කරනකොට අපේ රටේ තිබෙන තත්ත්වයන් සහ වාතාවරණය විතරක් සලකා බලා මදි. මීළඟ පරම්පරාව ජීවත් වෙන්නේ අපේ රටේ විතරක් නොවෙයි. ඒ අය ජීවත් වෙන්නේ ගෝලීය සමාජයක. ඒ නිසා අපි ගෝලීය ප්‍රවණතා හොඳින් අධ්‍යයනය කරන්න ඕනෑ, අවබෝධ කර ගන්න ඕනෑ. අපි හිතන්න ඕනෑ, අද දවස වෙනකොට 10 පන්තියෙන් උඩ ඉන්න සේරම දරුවෝ "Z" පරම්පරාවේ කට්ටිය කියලා. 01 පන්තියේ ඉඳලා 10 පන්තිය දක්වා ඉන්නවා Alpha Generation එකේ දරුවෝ ටික. 2025 වර්ෂය හරි වැදගත්. මේ අවුරුද්දේ උපදින්න පටන් ගත්තේ Beta පරම්පරාවේ දරුවෝ. ඒ දරුවෝ ටික 2030 වෙනකොට මේ රටේ පාසල් පද්ධතියට ඇතුළත් වෙනවා. ආයෙත් සැරයක් 2045 වෙනකොට Gamma පරම්පරාවත්, 2060 වෙනකොට Delta පරම්පරාවේ කට්ටියත් මේ පාසල් පද්ධතියට එකතු වෙනවා. ඒ නිසා අද අප අධ්‍යාපනයේ වෙනසක් ගැන කථා කරනවා නම්, මෙන්න මේ අනාගත ලෝකයේ, අනාගත පරම්පරාවල වෙනස පිළිබඳවත්, අනාගතයේ මේ රටේ නිෂ්පාදනය, ලෝකයේ නිෂ්පාදනය කෙසේ විය යුතුද කියන කාරණය පිළිබඳවත්, මේ අයගේ භාවිතාවන් පිළිබඳවත් මනා අවබෝධයක් ඇතිව එය කළ යුතුයි. එසේ නොකර අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපට දැඩි වගකීමක් තිබෙනවා, දැඩි යුතුකමක් තිබෙනවා. දැනට මේ පාසල් පද්ධතියේ ඉන්න අවසන්, Z පරම්පරාවේ පිරිසත්, ඒ වාගේම Alpha Generation එකේ අයත් කොහොමද ඉගෙන ගන්නේ, ඒ අයගේ ඉගෙනුම් රටාව තුළ මොන වාගේ රටාවක්ද තිබෙන්නේ සහ ගෝලීය නිෂ්පාදන හා පරිභෝජන රටා මොන වාගේද හැසිරෙන්නේ කියාත් අධ්‍යයනය කර ඒවාට ගැළපෙන විධියට මේ රටේ අනාගත පුරවැසියා හදන්නේ කොහොමද කියන එක ගැන අපට විශාල වගකීමක් තිබෙනවා. අද පවතින පන්ති කාමර දිහා බැලුවාම අපට පෙනී යනවා, අර ආකිමිඩීස්ගේ පන්ති කාමරයේ ලක්ෂණ තිබෙන පන්ති කාමර තවමත් ඇති තරම් තිබෙන බව. ඒක Alpha Generation එකේ අයට, එහෙම නැත්නම් "Z" පරම්පරාවේ අයට ඒ තරම්

ගැළපෙන්නේ නැහැ. එහෙම නම්, මේ system එක මේ විධියටම පවත්වා ගෙන ගියොත් 6 වසරෙන් සිසුන් පාසල් හැර යන එක වළක්වන්න අපට බැරි වේවි. ඒ නිසා අලුත් පරම්පරාව හිතන පතන ආකාරය ගැන හිතලා, මේ අලුත් පරම්පරාවට ගැළපෙන විධියට, ඒ අයගේ visual, digital, mobile, social and global generation කියන තත්ත්වයන් සලකා බලා, ඒවාට ගැළපෙන විධියට අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න අපි 2025 වර්ෂයේ ඉඳලාම වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා.

නූතන ඉගෙනුම්ලාභියාගේ කාර්යභාරය වන්නේ දැනුම ගවේෂණය කිරීම, නව දැනුම නිෂ්පාදනය කර ගැනීම වාගේම ඒ උපයා ගත් දැනුම බෙදා හදා ගැනීමයි. Knowledge exploring, creating and sharing කියන කාරණා තුනට ගැළපෙන විධියට උගන්වන්නත්, ඒකට ගැළපෙන විධියට අධ්‍යාපනයේ පහසුකම් සපයන්නත්, ඒකට ගැළපෙන විධියට අධ්‍යාපනයේ ඇගයීම් ක්‍රමය වෙනස් කරන්නත් අපට විශාල වගකීමක් තිබෙනවා. අපි දන්නවා, මේ 21 වැනි ශතවර්ෂයේ දරුවන් වඩා කැමැති ස්වයං අධ්‍යයනයට - self-learningවලට - බව. ඒ අය gamification, inquiry-based learning, problem solving, creativity ආදී සම්මිශ්‍රිත ක්‍රමවලින් - blended learning තුළින් - තමයි ඉගෙන ගන්නේ. ඒ නිසා ගුරුවරයා උගන්වන හැම දේම ඒ ආකාරයෙන්ම ඉගෙන ගන්නවා කියලා ක්‍රමයක් නැහැ.

අද අපට ලොකු ගැටලුවක් තිබෙනවා. අපේ අධ්‍යාපනය ගැන හුඟක් දෙනා මෙතැන කථා කරනවා; "X" පරම්පරාවේ කට්ටිය, baby boomersලා, "Y" පරම්පරාවේ කට්ටිය කථා කරනවා. හැබැයි ඒ, ඊළඟ පරම්පරාවේ සිතුම් පැතුම් ගැන කිසි දෙයක් හිතන්නේ නැතුවයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවශ්‍යයි මෙන්න මේ වෙනස වෙනුවෙන් අප මොන වාගේ දෙයක්ද කරන්න යන්නේ කියන ගැන කියන්න.

අපේ රටේ පාසල් අතරින් smart boards තිබෙන්නේ පාසල් 1,813ක විතරයි. ද්විතීයික පාසල් 1,619ක අන්තර්ජාල පහසුකම් නැහැ. පාසල් 493ක් තිබෙනවා, ලැප්ටොප් පරිගණක හෝ ටැබ් පරිගණක ආදිය නැති. අන්තර්ජාල පහසුකම් නැති කොට්ඨාස කාර්යාල 160ක් තිබෙනවා. ඩෙස්ක්ටොප් පරිගණකයක් නැති පාසල් 80ක් තිබෙනවා. මෙහෙම අඩුපාඩුත් තියාගෙන තමයි අප මේ ගමන යන්න හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කනගාටුයි, මීට වඩා කාලය දෙන්න අපහසුයි.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැනටමත් ඔබතුමා විනාඩියක කාලයක් වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
අපි මේ වෙනස ඇති කිරීමට අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය සඳහා වූ වෙනම කාර්ය සාධක බලකායක් පිහිටුවා මේ කටයුත්ත ආරම්භ කර තිබෙනවා. එයින් පසුව ඉදිරි කාලයේදී ඩිජිටල්කරණයට අවශ්‍ය පහසුකම් පාසල් පද්ධතියට ඇතුළත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින්, අනාගතයට අවශ්‍ය, Alpha පරම්පරාවට, "Z" පරම්පරාවට වාගේම ඊළඟට එන Beta සහ Delta පරම්පරාවලට අවශ්‍ය අධ්‍යාපනය හදන බවත් පවසමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[පි.ප. 5.17]

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ பிரதமர் அவர்களின்கீழ் செயற்படுகின்ற கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சின் குழுநிலை விவாதத்திலே உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி கூறுகின்றேன்.

முதலில், கௌரவ பிரதமரும் கல்வி அமைச்சருமானவருக்கு நாங்கள் நன்றி கூறக் கடமைப்பட்டு இருக்கின்றோம். மூன்று மாதங்களுக்கு முன்பு, அகில இலங்கை மக்கள் காங்கிரஸின் தலைவர் றிஸாட் பதியுதீன் அவர்களும் நானும் அவர்களை நேரடியாகச் சந்தித்து, வவுனியா, மன்னார் மாவட்டங்களிலுள்ள அல்-அக்ஸா பாடசாலை, அல்-அமீன் பாடசாலை, ஆனைவிழுந்தான் பாடசாலை, காக்கையன்குளம் முஸ்லிம் மகா வித்தியாலயம், வேப்பங்குளம் முஸ்லிம் மகா வித்தியாலயம், சொர்ணபுரி மகா வித்தியாலயம் ஆகிய 6 பாடசாலைகளிலும் கட்டிடங்கள் அரைகுறையாகக் கட்டப்பட்ட நிலையில் இருப்பது பற்றி கூறியிருந்தோம்.

[ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා]

கடந்த கோட்டாபய அரசாங்கத்திலும் ரணில் விக்கிரமசிங்க அரசாங்கத்திலும் அந்தப் பாடசாலைகளின் கட்டிட வேலை இடைநிறுத்தப்பட்டிருந்ததற்குக் காரணம், அவர்கள் றிஸாட் பதியுதீன்மீது கொண்டிருந்த தனிப்பட்ட குரோதமாகும். ஆனால், தற்போது கௌரவ கல்வி அமைச்சர் அவர்கள் அந்த வேண்டுகோளை ஏற்றுக்கொண்டு நல்ல சமிக்ஞையை வெளியிட்டிருக்கிறார். அதற்காக அவருக்கு மீண்டும் நன்றி கூறுகின்றோம்.

அடுத்து, இன்னுமொரு முக்கியமான விடயத்தைக் கூற வேண்டும். 1924ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட ஒரு முஸ்லிம் மகா வித்தியாலயம் வவுனியா மாவட்டத்தில் இருக்கின்றது. நானும் அந்தப் பாடசாலையில்தான் கல்வி கற்றேன். அந்தப் பாடசாலையின் நூற்றாண்டு விழா கொண்டாடப்பட இருக்கின்றவேளையிலே, அதனைத் தேசிய பாடசாலையாகத் தரம் உயர்த்த வேண்டுமென நான் இங்கு கோரிக்கை விடுக்கவிருந்தேன். ஆனால், கௌரவ கல்வி அமைச்சர் அவர்கள், "எங்களுடைய அரசாங்கத்திலே 'தேசியப் பாடசாலைகள்' என்ற திட்டம் இல்லை" என்று கூறியிருந்தார். அதனால், அந்தப் பாடசாலையின் நூற்றாண்டு விழாவையொட்டி அங்கு ஆராதனை மண்டபமொன்றைக் கட்டித் தருமாறு அன்பாக வேண்டிக் கொள்கின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்களால் முன்வைக்கப்பட்ட 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்திலே கல்வித் திட்டங்களுக்காகவும் கல்வி அமைச்சினுடைய முக்கிய தேவைக்காகவும் பாடசாலைகளுடைய, ஆசிரியர்களுடைய, மாணவர்களுடைய, பல்கலைக்கழகக் கல்வித் தேவைக்காகவும் நிறையப் பணம் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. நாங்கள் அதற்கு நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றோம். ஆனால், எங்களுடைய பிரதேத்திலே இந்தத் திட்டங்களை நடைமுறைப்படுத்துவதில் பல தடைகளும் பிரச்சினைகளும் காணப்படுகின்றன. இந்தப் பிரதேசத்திலிருந்த மாணவர்கள் அகதிகளாக இடம்பெயர்ந்து வேறு மாவட்டங்களில் படித்து வருகிறார்கள்; 'கொவிட்' தொற்றால் பாதிக்கப் பட்டிருக்கிறார்கள்; பொருளாதாரச் சீர்கேட்டால் பாதிக்கப் பட்டிருக்கிறார்கள். அரசியல் மாற்றங்களால் பாதிக்கப்பட்ட நிறைய மாணவர்கள் இடைவிலகி இருக்கின்றார்கள். இந்த நிலையில், அங்குள்ள மாணவர்கள் கல்வியைத் தொடர்வதற்குத் தற்போது ஒதுக்கப்பட்டிருக்கின்ற பணம் எங்களுடைய பிரதேசத்தை வந்தடையுமா? என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது. ஆகவே, கௌரவ கல்வி அமைச்சர் அவர்களே, வட மாகாணப் பாடசாலைகள் தொடர்பில், குறிப்பாக வன்னி மாவட்டப் பாடசாலைகள்மீது உங்களுடைய விசேட கவனம் தேவைப்படுகின்றது என்பதை நான் சுட்டிக்காட்ட விரும்புகிறேன்.

யுத்த சூழ்நிலையின் பின் இப்போதுதான் அங்குள்ள மாணவர்கள் கல்வியில் விருப்பமுடையவர்களாக மாற்ற மடைந்திருக்கிறார்கள். ஆனால், அங்கு வளப் பற்றாக்குறை அதிகமாக இருக்கின்றது; ஆசிரியர் பற்றாக்குறை இருக்கின்றது. விசேடமாக கணித, விஞ்ஞான, ஆங்கிலப் பாடங்களுக்குரிய பயிற்சிபெற்ற ஆசிரியர்கள் இல்லாமை, அடிக்கடி ஏற்படுத்தப்படும் இடமாற்றம் போன்ற காரணங்களால் இந்த மாணவர்களுடைய கல்வி பாதிக்கப்படுகின்றது. மேலும், வன்னி மாவட்டத்தில் உள்ள பிள்ளைகளுடைய கல்வியில் போதைப்பொருளின் தாக்கம் பெரும் பிரச்சினையை ஏற்படுத்தியிருக்கின்றது. போதைப் பொருள் தொடர்பு காரணமாக மாணவர்களின் இடைவிலகல் அதிகரித்திருக்கின்றது. அதனால் இந்தப் புதிய கல்விச் சீர்திருத்தத்தின்மூலம் இந்தப் பிரதேசத்திலே உள்ள வளப் பற்றாக்குறையை நீக்கி, கல்வியை வளம் பெறச் செய்ய வேண்டுமென்று அன்பாக வேண்டிக் கொள்கிறேன்.

அத்தோடு, ஆசிரியர் நியமனமங்கள் மாவட்ட ரீதியிலே வழங்கப்பட வேண்டும். விசேடமாக, அதிபர்களுக்கான வெற்றிடங்கள் அங்கு அதிகமாகக் காணப்படுகின்றன. எனவே, அதிபர் நியமனங்களை வெகுவிரைவாக வழங்க வேண்டும். அத்தோடு, அவர்களுக்கு வழங்கப்படுகின்ற பாடசாலை முகாமைத்துவப் பயிற்சியை ஒவ்வொரு மாகாணத்திலும் உரிய காலத்திலே வழங்க முடிந்தால், பாடசாலைகளினுடைய முகாமைத்துவமும் மீத்திறனும் அதிகரிக்க வாய்ப்பு இருக்கின்றது.

எங்களுடைய வவுனியா மாவட்டத்தில் உள்ள பல்கலைக்கழகம் 120 ஏக்கர் பரப்பளவைக் கொண்டதாக மிகவும் இட வசதியுடன் இருக்கின்றது. அந்தப் பல்கலைக் கழகத்தில் வைத்தியத் துறையை அமைப்பதற்கான காணி ஒதுக்கப்பட்டபோதிலும், அதற்கான வேலைகள் இன்னும் ஆரம்பிக்கப்படவில்லை. அதுமாத்திரமன்றி, கௌரவ உறுப்பினர் டாக்டர் சத்தியலிங்கம் த கூறியதுபோல, அந்தப் பிரதேசம் துர்நாற்றம் வீசுகின்ற நிலையில் இருக்கின்றது. அதற்கண்மையில் காணப்படும் குளமும் பாதிப்புக் குள்ளாகின்றது. ஆகவே, அந்தக் காணியில் ஒரு பகுதியைப் பேராதனைப் பூங்காவைப்போல வளப்படுத்தி, அந்தப் பிரதேசத்தில் சுற்றுலாத் துறையை மேம்படுத்தக்கூடிய வாய்ப்பும் இருக்கின்றது என்பதைத் தங்களின் கவனத்திற்குக் கொண்டு வருகிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2008, 2009ஆம் ஆண்டு காலப்பகுதியிலே கோப்பாய், மட்டக்களப்பு, அட்டாளைச்சேனை, கொட்டகலை போன்ற ஆசிரிய கலாசாலைகளில் பயிற்சிநெறியை நிறைவுசெய்த 1,200க்கும் அதிகமானவர்களுக்கு இதுவரை சான்றிதழ்கள் வழங்கப் படவில்லை. அவர்களுக்கான சான்றிதழ்களை விரைவில் வழங்குவதற்கும் ஏற்பாடு செய்யுமாறு வேண்டி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.23]

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වැදගත්ම අමාත්‍යාංශයක් වන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී කථා කරන්න අවස්ථාව ලබා දීම වෙනුවෙන්.

මේ අය වැය විවාදයට සම්බන්ධ වූ විපක්ෂයේ මන්ත්‍රීවරු අද දවස පුරාම විවිධ අදහස් ඉදිරිපත් කළා; විවිධ කථා ඉදිරිපත් කළා. හැබැයි අපට මතකයි, මේ ලංකාවේ මිනිසුන්ට අමතක නැහැ, මේ අය වැය පිළිබඳව විවේචන ඉදිරිපත් කරන්නේ කවුද කියලා. පාසල් ගුරුවරියක් ප්‍රසිද්ධියේ දණ ගස්වලා ගුරු වෘත්තියට කැළැලක් එකතු කළ, ගුරු වෘත්තියට අපහාස කළ මිනිස්සු තමයි

අද සුදු පිරුවට ඇඳගෙන ඇවිල්ලා මේ වර්තමාන රජයේ අය වැය, අධ්‍යාපනය වෙනුවෙන් වැඩිම මුදලක් වෙන් කළ අය වැය විවේචනය කරන්නේ.

ඒ විතරක් නොවෙයි. අපට මතකයි, දැනට වසර කිහිපයකට පෙර වෘත්තීය අයිතිවාසිකම් ඉල්ලාගෙන පාසල් ගුරුවරු කොළඹට එනකොට කඳුළු ගෑස්වලින්, බැටන් පොලුවලින් ඒ පාසල් ගුරුවරුන්ට ගහපු, තලපු, අවමන් කරපු පාලකයෝ තමයි එදා හිටියේ කියන එක. එබැවින් එතුමන්ලාගේ විවේචන පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරන ගමන්, මට ලැබී තිබෙන කෙටි කාලය තුළ මෙවර අය වැයෙන් විශේෂයෙන්ම පාසල් දරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරලා තිබෙන යෝජනා කිහිපයක් පිළිබඳව අදහස් දක්වන්න මා බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ පාසල් දරුවන් වෙනුවෙන් ආරම්භ කරලා තිබුණා, "සුරක්ෂා" සිසු රක්ෂණ ක්‍රමය. ඒක 2017 වර්ෂයේදී ආරම්භ වුණේ. නමුත් 2022දී ඒක නවතා දැමුවා. නමුත් අපේ නව රජය නැවත ඒක ආරම්භ කරලා තිබෙනවා. 2026 වර්ෂයේ සිට නැවත ඒක ක්‍රියාත්මක වෙනවා, අලුත් අය වැය යෝජනා යටතේ. ඒ යටතේ ලබන වසරේ සිට රජයේ පාසල්, රජයේ අනුමත පෞද්ගලික පාසල්, උපකෘත පාසල් විතරක් නොවෙයි, පිරිවෙන්වලත් 1 වසර සිට 13 වසර දක්වා ඉගෙන ගන්නා සිසුන් ලක්ෂ 40ක් ආවරණය කරනවා. ඒ සඳහා ඉදිරි වසර 3ක කාලයට රුපියල් මිලියන 7,112ක් වෙන් කරලා තිබෙනවා. ඒ යටතේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්, අනතුරු රක්ෂණාවරණයක්, ජීවිත රක්ෂණාවරණයක් අන්තර්ගතයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරකුත් නොවෙයි. මේ වසරේ 2025.10.31 වන විට පාසල් සිසුල් 40,852දෙනෙකුට රුපියල් මිලියන 1,274ක් මේ රක්ෂණාවරණය යටතේ ගෙවා තිබෙනවා. පාසල් දරුවන්ට සිදුවන අනතුරුවලදී, දෙමව්පියන් අභිමිවීම්වලදී රජය ඇපකැප වෙලා රක්ෂණාවරණයක් ක්‍රියාත්මක වෙනවා. ඒ විතරකුත් නොවෙයි. ළමයි 300ට අඩු පාසල්වල සියලු දරුවන්ට රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙනවා. ඒ දීමනාව සිසුන් ලක්ෂ 16කට ලැබෙනවා. ඊට අමතරව අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල සියලු දරුවන්ට මුදල් අමාත්‍යාංශයෙන් රුපියල් 6,000ක දීමනාවක් ලැබෙනවා. ළමයි 250ට අඩු සියලු පාසල්වල දරුවන්ට, වතුකරයේ නම් ළමයි 500ට අඩු පාසල්වල දරුවන්ට පාවහන් ලබා දීමට යෝජනා වෙලා තිබෙනවා. ඒ සඳහා අපට මෙවර දේශීය නිෂ්පාදකයෙක් උපකාර වෙනවා. ඒ විතරක් නොවෙයි. ඉතාම සංවේදී කාරණයක් වන පාසල් සිසුවියන්ට අවශ්‍ය සනීපාරක්ෂක තුවා ලබා දීමත් සිදු කරනවා. 6 ශ්‍රේණියෙන් ඉහළ, අවශ්‍යතාව තිබෙන සියලු පාසල් සිසුවියන්ට සනීපාරක්ෂක තුවා ලබා දීම සිදු කරනවා.

ඒ එක්කම කියන්න අවශ්‍යයි, පිරිවෙන් අධ්‍යාපනය සඳහාත් අපි රුපියල් මිලියන 696ක් වෙන් කර තිබෙන බව.

මීට පෙර අදහස් දැක්වූ දිලිත් ජයවීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හදපු කෙනෙක් නැහැ, ඒවා ගැන දන්නේ නැහැ, ඒ ගැන slide එකක් විතරයි තිබෙන්නේ කියලා. කියන්න කනගාටුයි, එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා හවස නිවුස්වලට දමා ගන්න voice-cut එකක් දීලා යනවා. මේ මගේ අතේ තිබෙන්නේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව හදපු වාර්තාව. මේ පිළිබඳව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරු ගරු අගමැතිතුමියගෙන් කළ ඉල්ලීමට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලුදෙනාට මේ වාර්තාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මේ වාර්තාව වෙබ් එකේ පළ වෙලා තිබෙනවා. නමුත් මේක කවුද හැදුවේ කියලා එතුමා දන්නේ නැහැ ලු. කවුද හැදුවේ කියලා දන්නේ නැහැ තමයි ඉතින් නයි ගැන විතරක් හොය හොයා ඉන්නකොට. මේ මගේ අතේ තිබෙන්නේ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හදන්න මුල් වෙච්ච ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යන ආයතනවල සහභාගිත්වයෙන් හදපු වාර්තාව. මේ වාගේ පැහැදිලි ලේඛනයක් තිබෙද්දී, සාක්ෂි තිබෙද්දී, අධ්‍යාපනයේ අපි ගමන් කරන දිශාව මොකක්ද කියන එක පිළිබඳ පැහැදිලි අරමුණු 10ක් තිබෙද්දී තමයි එතුමා එහෙම කිව්වේ. ඉතින්, වඩු බාසුන්නැහේ කෙනෙකුගේ පැණියක් ගෙනැල්ලා කොරෝනා වසංගතය වළක්වන්න කටයුතු කළ එක්කෙනා, කැලණිගඟෙන් නයි ගෙනාපු එක්කෙනා ගැන අපි මීට වඩා කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඉතිරි වී තිබෙන අවසන් විනාඩියේදී මම කැමැතියි, ඉතාම වැදගත් කාරණාවක් කියන්න. ඒ, මෙන්න මේ කාරණය. පෙරවරුවේ කථා කරපු කබීර් හෂීම් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා ටියුෂන් මාෆියාවක් සම්බන්ධ කථාවක් කිව්වා. මමත් ටියුෂන් ගුරුවරයකු හැටියට හිටපු කෙනෙක්. "ටියුෂන් මාෆියාව" කියන වචනය එතුමා භාවිත කළේ ඇයි කියන්න මම දන්නේ නැහැ. මම ඒ පිළිබඳව කනගාටු වෙනවා. ටියුෂන් කියන්නේ, උපකාරක පන්ති. ලංකාවේ තිබෙන අධ්‍යාපන ක්‍රමයේම එක අතුරු ඵලයක් ලෙස තමයි ටියුෂන් පන්ති බිහි වුණේ. එහි තිබෙන ගැටලු පිළිබඳව අපි වෙනම සාකච්ඡා කරන්න අවශ්‍යයි. මේ ටියුෂන් වෘත්තියේ ඉන්න වැඩි දෙනෙක් උපාධිධාරින්, පශ්චාත් උපාධිධාරින්. කොරෝනා වසංගතය පැවති කාලයේ ලංකාවේ සියලු පාසල් වැහෙනකොට මේ අය online පන්ති පවත්වමින් මේ දරුවන්ට අධ්‍යාපනය දුන්නා. ඒ විතරක් නොවෙයි, මේ අය ලංකාවේ සතර දිග්භාගයේම සිටින දරුවන්ට අධ්‍යාපනය දෙන අය. ටියුෂන් ගුරුවරු සම්බන්ධයෙන් එතුමා විශේෂයෙන්ම යමක් සඳහන් කළා. ලංකාවට රෝල්ස් රොයිස් රථ දෙකක් ගෙනාවා, එකක් ගෙනාවේ ටියුෂන් ගුරුවරයෙක්,මේ ගැන සොයා බලන්න කියලා එතුමා කිව්වා. නිවැරදිව රජයට බදු ගෙවලා, ආදායම් බදු ගෙවලා තිබෙනවා නම්, ඒ ටියුෂන් ගුරුවරයාට රෝල්ස් රොයිස් රථයක් ගන්න තිබෙන ගැටලුව මොකක්ද? මේ රටේ ආර්ථිකය ගොඩ නැඟෙනවා නම් අපි කැමැතියි. සියලු ගුරුවරුන්ට රෝල්ස් රොයිස් රථයක් ගන්න පුළුවන් විධියට ආර්ථිකය හැදෙනවා නම් අපි කැමැතියි. ටියුෂන් ගුරුවරු බදු ගෙවන්නේ නැත්නම් ඒ පිළිබඳව වෙනම සලකා බලන්න. බදු අය කිරීම් විධිමත් කරන්න. මම ලංකාවේ ටියුෂන් ගුරුවරුන්ගෙන් සමාව ඉල්ලා සිටිනවා, එතුමා කරපු මේ ප්‍රකාශය සම්බන්ධයෙන්.

කරුණාකර "ටියුෂන් මාෆියාවක්" කියලා මේක හඳුන්වන්න එපා. මාෆියාවක් කියන්නේ මොකක්ද? කිසිම ටියුෂන් ගුරුවරයෙක් දරුවන්ගෙන් බලෙන් සල්ලි ගන්නේ නැහැ. ටියුෂන් ගුරුවරු බලෙන් තමන්ගේ පන්තිවලට ළමයි ගෙන්වා ගන්නේ නැහැ. ඒ වෘත්තීය ඇතුළේ ගැටලු තිබෙනවා නම්, එය මේ සමාජයේම එක පිළිබිඹුවක්; නිර්මිතයක්. අපි ඒ පිළිබඳව වෙනම සාකච්ඡා කරමු. නමුත්, ඒක සමඟි ජන බලවේගයේ මතය ද කියලා මම දැනගන්න කැමැතියි. සමඟි ජන බලවේගයට උදව් කරපු ටියුෂන් ගුරුවරු හිටියා. මම අහනවා, මේ සමඟි ජන බලවේගයේ මතය ද කියලා. ලංකාවේ ටියුෂන් වෘත්තියෙන් යැපෙන්නේ ටියුෂන් ගුරුවරු විතරක් නොවෙයි. පන්ති සංවිධායකයන්, මුද්‍රණකරුවන් ඇතුළු ලක්ෂ 5කට වැඩි පිරිසක් මේ ටියුෂන් වෘත්තියෙන් යැපෙනවා. ටියුෂන් වෘත්තියට සම්බන්ධ ලක්ෂ 5කට වැඩි පිරිසකටයි මේ අගෞරවය කළේ. අවසාන වශයෙන් මම දැනගන්න කැමැතියි, ඒක සමඟි ජන බලවේගයේ මතය ද කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.30]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சின் இன்றைய குழுநிலை விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்காக நன்றியைத் தெரிவித்துக்கொண்டு, எனக்கு ஒதுக்கப்பட்ட நேரம் மிகக் குறைவாக இருப்பதனால் விரைவாகவும் சுருக்கமாகவும் சில விடயங்களை நான் குறிப்பிட விரும்புகின்றேன்.

மிக முக்கியமாக, கல்வி அமைச்சினால் கொண்டுவரப்படவிருக்கின்ற புதிய கல்விச் சீர்திருத்தத்துக்கு எங்களுடைய ஆதரவை வழங்குகின்றோம். சமகாலப் பொருளாதாரச் சூழ்நிலையையும் விஞ்ஞான முன்னேற்றத்தையும் எதிர்கொள்ளக்கூடிய வகையிலே எங்கள் கல்விச் சமூகத்தைத் தயார்படுத்த வேண்டிய தேவையிருப்பதனால், புதிய கல்விக் கொள்கை மிக முக்கியமானது. அந்த வகையிலே, கல்விச் சீர்திருத்தத்தின் வசதி வாய்ப்புகள் நாடு முழுவதும் சமச்சீராகக் கிடைக்க வழிசெய்யப்பட வேண்டுமென்று நான் இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், கடந்த காலங்களிலே யுத்தத்தினாலும் பல பிரச்சினைகளினாலும் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கிலே பல பாடசாலைகள் கட்டிடங்கள், தளபாடங்கள் போன்ற உள்ளக வசதிகள் இன்றியும் மற்றும் ஆசிரிய வள வசதிகள் இன்றியும் இயங்கிக் கொண்டிருக்கின்றன. மிக முக்கியமாக, எனது மாவட்டமான மட்டக்களப்பில் கல்குடா கல்வி வலயத்திலே மிகப் பாரிய பிரச்சினையாக இருக்கின்ற ஆசிரிய வளப் பற்றாக்குறையைத் தீர்க்கும்படி பல இடங்களிலே வலியுறுத்திக் கேட்டிருக்கின்றேன். இந்த கல்வி வலயத்திலே கணித பாட ஆசிரியர்கள் 75 பேர் தேவைப்படுகின்ற இடத்திலே 25 பேர் மட்டும்தான் இருக்கின்றார்கள். உண்மையாக அந்த வளத்தினை வைத்துக்கொண்டு எவ்வாறு மாணவர்களுக்குக் கல்வியில் ஒரு சமச்சீரை அமுல்படுத்த முடியும் என்பது கேள்விக்குறியாக இருக்கின்றது. அங்கு தேசியப் பாடசாலைகளும் மாகாணப் பாடசாலைகளும் இருந்தாலும், மாகாணப் பாடசாலைகள்தான் மிக அதிகமாக இருக்கின்றன. அந்த வகையில், எதிர்காலத்தில் மாகாணப் பாடசாலைகளுக்கான நிதியொதுக்கீடுகளை அதிகரித்து, அவற்றுக்கான தேவைகளை நிவர்த்தி செய்ய வேண்டிய அவசியம் இருக்கின்றது. உண்மையில் கல்குடா கல்வி வலயத்தின் பல பாடசாலைகளில் அமர்வதற்குக்கூட தளபாட வசதியற்ற நிலைமையிலே பல மாணவர்கள் இருக்கிறார்கள். இந்த விடயங்களைக் கவனத்திற்கொண்டு சமச்சீரான வகையிலே எல்லாப் பிரதேசங்களுக்கும் தேவையான வளங்கள் கிடைக்கக்கூடியதாக ஏற்பாடு செய்ய வேண்டும்.

தேசியப் பாடசாலையைப் பொறுத்தவரையிலே, மட்டக்களப்பு மாவட்டத்திலே ஒவ்வொரு வலயத்திலும் தேசிய பாடசாலைகள் இருக்கின்றன. உண்மையில் பட்டிருப்பு கல்வி வலயத்திலே உள்ள பட்டிருப்பு மகா வித்தியாலயத்திலே விஞ்ஞான ஆய்வுகூட உபகரணங்களுக்குப் பற்றாக்குறை இருக்கின்றது. இதனைக் கருத்திற்கொண்டு, இக்குறைபாட்டை நீக்கித் தரவேண்டுமென்று இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன். மேலும், கல்குடா பிரதேசத்திலே வாழைச்சேனை இந்துக் கல்லூரியிலே ஆய்வுகூட கட்டிடம் கட்டப்பட்டுப் பூர்த்தி செய்யப்படாத நிலையிலிருக்கின்றது. அதனை நிறைவுசெய்வதற்கான நிதியொதுக்கீட்டையும் பெற்றுத்தர வேண்டுமென்று கௌரவ பிரதமரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்டுக் கொள்கின்றேன்.

அதற்கப்பால், மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற 150 வருடங்களைத் தாண்டிய புகழ்பூத்த புனித மிக்கேல் கல்லூரியிலே போதிய கட்டிட வசதியின்மை பாரிய பிரச்சினையாக இருக்கின்றது. அங்கு ஒரு 4 மாடிக் கட்டிடம் தேவையென்று விண்ணப்பம் கொடுக்கப்பட்டிருக்கின்றது. அது ஒரு தேசியப் பாடசாலை என்பதனால் உங்களுடைய அமைச்சின் ஊடாக நேரடியாக இந்தத் தேவையையும் எதிர்காலத்திலே நிறைவேற்றித் தரவேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

அதற்கப்பால், அதிகமான இடங்களிலே ஆசிரியர் தேவை இருக்கின்றது. நாட்டில் வேலையற்ற பட்டதாரிகள் இருக்கிறார்கள். அடுத்த வருடம் ஆட்சேர்ப்பின்மூலம் உரிய முறையிலே மிக விரைவாக அதனைச் செய்து முடிப்பதன்மூலம்தான் அந்தப் பிரதேசத்திற்குரிய ஆசிரிய வளங்களைப் பூர்த்தி செய்யக்கூடியதாக இருக்கும்.

அடுத்து, தொழிற்கல்வி விடயத்திலே, Vocational Training Centreஇல் பட்டதாரிகளுக்கு இணையாக NVQ Level 7க்குரிய வசதிகளை ஏற்படுத்திக் கொடுக்கவேண்டிய தேவையிருக்கின்றது. அதற்குரிய வளவாளர்கள் பற்றாக்குறையாக இருக்கிறார்கள். NVQ Level 6 வரைக்குமான வளவாளர்களே இருக்கிறார்கள். இதனையும் கருத்திற்கொண்டு, அந்த வசதியை ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

கிழக்குப் பல்கலைக்கழகத்தைப் பொறுத்தவரையில், அங்கு மருத்துவ பீடத்திற்கும், சுவாமி விபுலானந்த அழகியல் கற்கைகள் நிறுவகத்துக்கும் நிதி ஒதுக்கியமைக்காக நன்றியைத் தெரிவித்துக்கொண்டு, இன்னும் இரண்டு விடயங்களைக் குறிப்பிட விரும்புகிறேன். அதாவது, Faculty of Siddha Medicine மற்றும் Faculty of Graduate Studiesக்குரிய cadre creationஐச் செய்து, அதற்குரிய நிரந்தரமான Deanஐத் தெரிவுசெய்வதற்குரிய ஏற்பாட்டைச் செய்து தரவேண்டும். அதற்கு அப்பால் 3,000க்கும் மேற்பட்ட மாணவர்கள் படிக்கின்ற அந்த இடத்திலே தேவையான hostel வசதிகள் குறைவாக இருக்கின்றது. அத்துடன் அவை வந்தாறுமூலையில் இருப்பதனால், அந்தச் சூழலில் உள்ள வெளியிடங்களில் தங்குமிடங்களைப் பெற்றுக்கொள்வதில் சிரமங்கள் இருப்பதனால், வருகின்ற நிதியொதுக்கீட்டிலே அந்த hostel வசதியையும் செய்துகொடுக்க வேண்மென்றும் நான் கேட்டுக் கொள்கின்றேன்.

மிக முக்கியமாக, புதிய கல்விச் சீர்திருத்தத்தின் ஊடாக வளப் பங்கீடுகளை முழுமையாக மாகாணப் பாடசாலைகளுக்கும் தேசியப் பாடசாலைகளுக்கும் சமமாகக் கொடுப்பதன்மூலம்தான் எதிர்காலத்திலே கல்வியில் ஒரு சமத்துவம் நிலவக்கூடியதாக இருக்கும். அதற்கப்பால், வலயங்களுக்கிடையில் ஆசிரியர் எண்ணிக்கையிலே மிக வேறுபாடு இருக்கின்றது. மாகாணப் பாடசாலைகளில், குறிப்பாக கல்குடா கல்வி வலயத்தில் பாரிய வெற்றிடம் உள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

I will wind up, Sir.

அங்கு 75 ஆசிரியர் வெற்றிடங்கள் உள்ள இடத்தில் 25 பேர் மாத்திரம் கடமையாற்றுகின்றார்கள். அதிலும் அதிகமானவர்கள் DOs. அவர்கள்கூட இப்பொழுது போராட்டத்தில் ஈடுபட்டுள்ளார்கள். சற்றுச் சிந்தித்துப் பார்த்தால், இந்தப் பற்றாக்குறையான வளங்களுடன் கல்வி நடவடிக்கைகளைச் சீராக முன்னெடுக்க முடியாதென்பது புரியும். ஆகவே, பாடசாலைகளுக்கிடையில் சீரான வளப்பங்கீட்டை ஏற்படுத்தும் வகையில் மாகாண சபைகளுக்கு ஓர் அழுத்தம் கொடுத்து, ஆசிரியர்களை நியமனம் செய்வதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும். உங்களால் முன்வைக்கப்பட்ட structural meeting விடயம் இன்னும் அமுல்படுத்தப்படவில்லை. அதையும் மிக விரைவாக நடத்த ஏற்பாடு செய்ய வேண்டும் என்று கேட்டுக்கொண்டு, நன்றி கூறி முடித்துக் கொள்ளுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.36]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சுத் தொடர்பான குழுநிலை விவாதத்திலே கலந்துகொள்வதையிட்டுப் பெருமகிழ்ச்சி அடைகின்றேன். ஒரு நாட்டினுடைய அபிவிருத்தியிலும் அதன் சமூக அபிவிருத்தியிலும் கல்வி மிக முக்கிய பங்கினை வகிக்கின்றது என்பதனை நாம் அறிவோம். கடந்த காலங்களில் கல்விக் கொள்கையை உருவாக்கியோருக்கும் நிறுவனங்களுக்கும் இடையில் சரியான தொடர்பாடல் இல்லாமல் இருந்ததனாலும், அதற்கான போதிய நிதி ஒதுக்கீடுகளும் சிறந்த திட்டமிடலும் இல்லாத காரணத்தாலும் கல்விச் சீர்திருத்தத்தில் பாரிய சிக்கல் நிலை தோன்றியது. விஞ்ஞானபூர்வமான தகவல்களை மட்டும் சேர்த்துக்கொண்டு, நாட்டுக்குப் பொருத்தமான ஒரு சிறந்த கல்விச் சீர்திருத்தத்தை உருவாக்க இவர்களினால் முடியாமல் இருந்தது. இதனால் இந்த நாட்டின் கல்வித் தரம் குறைந்து சென்றதை நாம் அவதானித்திருக்கின்றோம். இதனடிப்படையில், 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்டம் மற்றும் 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் பாரியளவு நிதி கல்விக்காக ஒதுக்கப்பட்டிருக்கின்றது. குறிப்பாக, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் 704 பில்லியன் ரூபாய் இதற்காக ஒதுக்கப்பட்டுள்ளது. இந்த நிதியின்மூலம் எங்களுடைய நாட்டில் கல்வி அபிவிருத்தியை மேற்கொள்வது மாத்திரமன்றி, புதிய கல்விச் சீர்திருத்தத்தின்மூலம் எதிர்காலத்தில் சமூக மேம்பாட்டை ஏற்படுத்துவதற்காகவும் இதனை நாங்கள் முழுமையாகப் பயன்படுத்த வேண்டியிருக்கின்றது. கடந்த காலங்களோடு ஒப்பிடும்போது, குறிப்பாக 2010ஆம் ஆண்டுக்குப் பிறகு இப்போது பெருமளவு நிதி கல்விக்காக ஒதுக்கப்பட்டிருப்பதை நாங்கள் பார்க்கின்றோம். குறிப்பாக, 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் கல்விக்கான நிதி ஒதுக்கீடு 2.04 சதவீதமாகக் காணப்படுகின்றது. தொடர்ச்சியாக எதிர்வரும் காலத்திலும் இந்த அரசாங்கம் கல்விக்காக அதிகளவான நிதி ஒதுக்கீட்டை மேற்கொள்ளும் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

குறிப்பாக, இலங்கையினுடைய கல்விச் சீர்திருத்தமானது காத்திரமான சமூக மாற்றத்தின் அடிப்படையில் மேற்கொள்ளப்பட வேண்டியதாக உள்ளது. அந்த அடிப்படையில், இந்த நாட்டினுடைய குடித்தொகை மற்றும் பொருளாதார எதிர்பார்ப்புகளுக்கேற்றவாறு சமூக மாற்றத்தை மட்டுமன்றிக் கலை, கலாசார, விழுமிய மாற்றங்களையும் ஏற்படுத்தக்கூடிய வகையிலே இந்தக் கல்விச் சீர்திருத்தம் நடைமுறைப்படுத்தப்பட இருக்கின்றது. குறிப்பாக, சமூகங்களுக்கும், கல்விச் சீர்த்திருத்தத்துக்கும் இடையிலே மிக நெருக்கமான பின்னிப்பிணைந்த தொடர்புகள் காணப்படுகின்றன. எமது நாடு பல இனங்கள், பல மதங்கள், பல மொழி பேசுகின்றவர்கள் வாழ்கின்ற பல் வகைமைத் தன்மை கொண்டதாகக் காணப்படுகின்றது. அந்த அடிப்படையில், சமூக நல்லிணக்கத்தை ஏற்படுத்துவதோடு, சமூக ஏற்றத் தாழ்வைக் குறைக்கும் வகையில் இந்தக் கல்விச் சீர்திருத்தம் நடைமுறைப்படுத்தப்படவுள்ளது.

கடந்த காலங்களில், இந்த நாட்டில் பல்வேறு மட்டங்களில் ஏற்றத் தாழ்வுகளை அடிப்படையாகக் கொண்ட கல்விச் சீர்திருத்தத்தை மேற்கொண்டார்கள். அதனால் நகரப் பாடசாலைகளுக்கும், கிராமப் பாடசாலைகளுக்கும் இடையே பாரிய ஏற்றத் தாழ்வுகள் காணப்பட்டது. இதனால் கடந்த 76 வருடங்களாக எதிர்பார்த்த கல்வி இலக்கினை அடைய முடியாமல் இருப்பதை நாங்கள் பார்க்கின்றோம். அதுமாத்திரமல்ல, பாடசாலைக் கட்டமைப்புக்களை நாங்கள் பார்க்கின்றபோது, பல்லினத்தன்மை கொண்ட இந்த நாட்டில் சமூக வேறுபாடுகளை ஏற்படுத்துகின்ற விதத்திலே கடந்த காலத்தில் கல்வித் திட்டங்களை உருவாக்கியிருந்ததைக் காண முடிகின்றது. அந்த அடிப்படையில், எமது புதிய கல்விச் சீர்திருத்தத்தின் ஊடாக, இந்த நாட்டில் விரைவான அபிவிருத்தியை ஏற்படுத்த முடியும் என்று எதிர்பார்க்கின்றோம். கல்விச் சீர்திருத்தமானது, சமூகத்தின் தேவையைப் பூர்த்திசெய்யக் கூடியதாக இருக்க வேண்டும். 'எல்லோருக்கும் கல்வி' என்ற அடிப்படையில், கல்வியின் சிறந்த அடைவு மட்டத்தை அடைவதற்குத் தொழில்நுட்பத்தையும் ஏனைய வளங்களையும் பயன்படுத்தி, சிறந்த கற்றல்-கற்பித்தல் செயற்பாடுகளும் ஆசிரியர் மற்றும் அதிபர்களைப் பயிற்றுவிக்கும் செயற்பாடுகளும் இப்போது நடைபெற்றுக்கொண்டு இருக்கின்றன.

வகுப்பறையானது தாயின் கருவறைக்கு ஒப்பிடப்படுகின்றது. இந்த வகுப்பறையில் இருந்துதான் அரசியல்வாதிகள் உருவாகின்றார்கள்; நாட்டின் தலைவர்கள் உருவாகின்றார்கள்; சமூக ஆர்வலர்கள் உருவாகின்றார்கள். கடந்த காலங்களில் இந்த வகுப்பறைகளில் டிஜிட்டல் முறையிலான கற்றல் - கற்பித்தல் செயற்பாடுகளைக் காண முடியவில்லை. எனினும், நாங்கள் புதிய கல்விச் சீர்திருத்தத்தின்மூலம் வகுப்பறைகளில் பாரிய மாற்றத்தை ஏற்படுத்தி இருக்கின்றோம். கற்றல்-கற்பித்தல் செயற்பாடுகளில் online முறை, e-learning, Internet, virtual education, smart board system, digital drawing, digital painting, concept formation, 3D formation, animation எனப்

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

பல்வேறு திட்டங்களை நடைமுறைப்படுத்துவதற்கு இந்தப் புதிய கல்விச் சீர்திருத்தம் உதவும் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் கூறிக் கொள்கின்றேன்.

இங்கு எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் இந்தக் கல்விச் சீர்திருத்தம் தொடர்பாகப் பல்வேறு கருத்துகளைக் கூறிக்கொண்டு இருக்கிறார்கள். இவர்கள் தங்களுடைய ஆட்சிக் காலத்தில் இந்தக் கல்வியின்பால் எதைச் செய்தார்கள் என்பதை கண்ணாடிக்கு முன் நின்று தங்களைத் தாங்களே கேட்டால் விளங்கிக் கொள்ளக்கூடியதாக இருக்கும். எதிர்க்கட்சியினரோடு சேர்ந்து, இந்நாட்டில் இருக்கின்ற தமிழ் பேசும் மக்களுடைய வாக்குகளைப் பெற்றுக்கொண்டவர்களும் இந்தக் கல்விச் சீர்திருத்தத்தில் பல குறைகளைக் காண்கின்றார்கள். இந்தக் கல்விச் சீர்திருத்தமானது, நிச்சயமாக கடந்த கால கல்விச் சீர்திருத்தங்களைவிடவும் சிறந்ததாக அமையும். இந்த நாட்டின் பிரதம அமைச்சரும் கல்வி அமைச்சருமாக இருக்கின்ற, கல்வியோடு மிக நெருக்கமான தொடர்புடைய ஒருவரின் மேற்பார்வையின்கீழே இந்தப் புதிய கல்விச் சீர்திருத்தம் நடைமுறைப்படுத்தப்பட இருக்கிறது. அதற்காக அவருக்கு இந்தச் சந்தர்ப்பத்தில் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்தக் கல்விச் சீர்திருத்தத்தை முழுமையாக இந்த நாட்டில் நடைமுறைப்படுத்துவதன்மூலம் நாங்கள் எதிர்பார்க்கும் இலக்கை அடையலாமெனக் கூறி, விடை பெற்றுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.42]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

எனக்கு முன்பு பேசிய சகோதர பாராளுமன்ற உறுப்பினர் அவர்கள் கல்வி பற்றி மிக அழகாகப் பேசியிருந்தார். கிழக்கு மாகாணத்தில் நடக்கும் பிரச்சினைகள் பற்றியும், தமிழ் பேசும் மக்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள் பற்றியும் ஓரளவு பேசினால் சந்தோஷமாக இருக்கும். கல்வி அமைச்சின் குழுநிலை விவாதம் நடைபெறுகின்ற இந்தச் சந்தர்ப்பத்தில் கௌரவ பிரதமர் அவர்கள் இங்கு இருக்கிறார். கௌரவ பிரதமர் அவர்களே, வரலாறு பாடத்தை optional பாடமாக மாற்றப் போவதாக நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. வரலாறு பாடத்துக்கு முக்கியத்துவம் கொடுத்து, இந்த நாட்டின் சரியான வரலாற்றை இந்த நாட்டு மக்களுக்கும் எதிர்காலத் தலைமுறையினருக்கும் கற்பிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்ற அன்பான வேண்டுகோளை நான் இந்தச் சபையில் முன்வைக்கின்றேன்.

200 - 300 - 1000 ஆண்டுகளுக்கு முன்னர், தமிழ் மன்னர்கள் இந்த நாட்டின் பல பிரதேசங்களை ஆட்சி செய்த வரலாறு; பிரித்தானியர் இந்த நாட்டுக்குப் புதியதோர் அரசியலமைப்பைத் தந்தபொழுது அந்தக் காலப்பகுதியில் தமிழ் மக்கள் அதை ஏற்றுக்கொள்ளவில்லை என்ற வரலாறு; சமஷ்டி அடிப்படையிலான தீர்வுதான் இந்த நாட்டு மக்களின் பிரச்சினையைத் தீர்ப்பதற்கான வழியென முதன்முதலாக 1926ஆம் ஆண்டு எஸ்.டபிள்யு.ஆர்.டி பண்டாரநாயக்க அவர்கள் சொன்ன வரலாறு; Donoughmore Commissionஆக இருக்கட்டும், Constitution சம்பந்தமான ஏனைய விடயங்களாக இருக்கட்டும், அனைத்துச் சந்தர்ப்பங்களிலும் தமிழ் மக்கள் எவ்வாறு தமது எதிர்ப்பை வெளியிட்டார்கள் என்ற வரலாறு; அதனைத் தொடர்ந்து 1948ஆம் ஆண்டு இலங்கைக்கு சுதந்திரம் கிடைத்த காலப்பகுதியில் இருந்து தமிழ் மக்களுக்கு எதிராக நடந்த ஒவ்வோர் அநீதி பற்றிய வரலாறு என்பவற்றைப் பாடத்திட்டத்தில் உள்ளடக்கி, வரலாற்றுப் பாடத்தைக் கற்பித்தால் மாத்திரம்தான் எதிர்வரும் தலைமுறையினராவது இந்த நாட்டில் அனைத்து இன மக்களும் சமமானவர்கள் என்ற நம்பிக்கையுடன் வாழ்வதற்குத் தயாராக இருப்பார்கள். அவ்வாறு இல்லையென்று சொன்னால், இன்று தொல்பொருள் திணைக்களத்தால் எங்களுடைய மக்கள் படும் அவஸ்தைகள் போன்ற விடயங்கள் இன்னும் நூறு ஆண்டுகள் சென்றாலும் நடக்கும்.

கடந்த இரண்டு - மூன்று வாரங்களாக இந்த அரசாங்கத்தின் செயற்பாடுகள் தமிழ் மக்களுடைய மனதைப் புண்படுத்தி வருகின்றது. நிரந்தரமான ஓர் அரசியல் தீர்வை வழங்குவதனூடாக மாத்திரம்தான் இந்தக் காயங்களை - வடுக்களை - ஆற்றக்கூடிய ஒரு சூழ்நிலையை உருவாக்கலாம். கௌரவ பிரதமர் அவர்களே, நான் வரலாறு பாடம் சம்பந்தமான வேண்டுகோளை விடுக்கும்பொழுது, நீங்கள் headphoneஐ காதில் போட்டிருக்கவில்லை. அதனால் மீண்டும் சொல்கின்றேன். மன்னர்களின் காலத்தில் இருந்து சுதந்திரம் கிடைத்த காலம் வரைக்குமான உண்மையான வரலாற்றை வரலாறு பாடத்திட்டத்தில் உள்ளடக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු අගමැතිතුමියනි, මම දෙමළ භාෂාවෙන් කිව්වා වාගේම ඉතිහාසය පාඩම් උගන්වනකොට හරි ඉතිහාසය, ඉතිහාසයේ වෙච්ච සියලු සිදුවීම් උගන්වන්න ඕනෑ. මම එහෙම කිව්වේ මොකද, පසුගිය දවස් දෙක තුන ඇතුළත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් එක්ක ආන්දෝලනාත්මක කතිකාවක් ඇති වුණා. මම ඇත්තටම කනගාටු වනවා, සමහර මාධ්‍ය ඒ සිදුවීම වාර්තා කළ විධිය පිළිබඳව. සමහර මාධ්‍ය ඒ සිදුවීම පිළිබඳව වාර්තා කළ විධිය විතරක් නොවෙයි, සමහර වෙලාවට මට සැකයකුත් මතුව තිබෙනවා, ත්‍රිකුණාමලයේ සිදුවීමෙන් සති දෙකකට පස්සේ වූ සිදුවීම් පිළිබඳව. හදිසියේම වාගේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ සිදු කළ යම් යම් කටයුතු ආණ්ඩුවේ දැනුවත්භාවය ඇතුව සිදු වුණාද කියන එක ගැනත් මට සැකයක් තිබෙනවා. මොකද ඒ වුණු සිදුවීම් බලාගෙන යනකොට, පුරා විද්‍යාව කියන විෂය පිළිබඳව අද ඊයේ නොවෙයි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරම්භයේ සිටම ගැටලුසහගත තත්ත්වයක් පැවතිලා තිබෙනවා.

එවන් තත්ත්වයක් තුළදී මාධ්‍ය වාර්තා කළ ගොඩක් කරුණු සම්පූර්ණයෙන් වැරදියි. මාධ්‍යයෙන් කියලා තිබෙනවා මම දැක්කා, වාලච්චේනයි ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට උසාවියෙන් නියෝග කළා කියලා නැවත ඒ පුවරුව සවි කරන්න කියලා. නමුත් එහෙම නොවෙයි එය සිදු වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක්. මේ කාරණය නිසා පසුගිය දවස් දෙක තුන තුළ ජාතීන් අතර අසමගියක් ඇති වන තත්ත්වයක් මතු වෙලා තිබුණා. මේ කාරණය කියන්න මට විනාඩියක් දෙන්න.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හෝ ඕනෑම දෙපාර්තමේන්තුවක් නාම පුවරු සවි කිරීමේදී ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ගන්න ඕනෑය කියලා, Pradeshiya Sabhas Act එකේ තිබෙනවා. එහෙම

නැත්නම් ප්‍රාදේශීය සභාව දැනුවත් කරන්න ඕනෑ. ප්‍රාදේශීය සභාවට කිසිම දැනුවත් කිරීමක් නොකර, අඩුම තරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට කියන්නේවත් නැතුව නාම පුවරු සවි කිරීම තුළින් Pradeshiya Sabhas Act එක violate වෙලා තිබෙනවා. අද ගරු අධිකරණය දුන් නියෝගයෙන් ඉතා පැහැදිලිව කියලා තිබෙනවා, එම නාම පුවරු සවි කිරීමේ බලය තිබෙන්නේ ප්‍රාදේශීය සභාවේ සභාපතිට කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මේ කාරණය කියලා මම කථාව අවසන් කරනවා.

අපට දැනගන්න ලැබුණු ආකාරයට අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමේදී ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා authority එක violate කළා කියලා කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. එහිදී ගරු අධිකරණය කියලා තිබෙනවා, නැහැ, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට තමයි එම බලය තිබෙන්නේ කියලා. අද ගරු අධිකරණයෙන් දීලා තිබෙන නියෝගය තමයි, මෙන්න මේ නාම පුවරුව අපි සවි කරන්න යනවා කියලා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කරන්න කියලා. ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට කියලා තිබෙනවා, ඒ දෙන ඉල්ලීම, ඒකට attach කරලා තිබෙන documents ටිකත් එක්ක, ඒ ගැසට් එක බලලා එතැන නීත්‍යානුකූලව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නාම පුවරුවක් සවි කරන්න අයිතියක් තිබෙනවා නම් ඒකට ඉඩ දෙන්න කියලා. එතකොට අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා කියලා තිබෙනවා, එහෙම ඉල්ලීමක් කළොත් එය නීත්‍යානුකූල අයිතියක් තිබෙන නිවැරදි ස්ථානයක් නම් ඒ පිළිබඳව ගැසට් එකේත් සඳහන්ව තිබෙනවා නම් එතුමාම ඒ බෝඩ් එක නැවත සවි කරලා දෙන්නම් කියලා.

මම මාධ්‍යවලින් සහ සියලු කණ්ඩායම්වලින් ඉල්ලන්නේ, මේ විධියට වැරදි අදහස් සමාජගත කරන්න එපා කියලායි. වැරදි අදහස් සමාජගත කරලා තමයි අද රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. වැරදි අදහස් මාධ්‍යවල ප්‍රචාරය කරලා, වැරදි අදහස් සමාජ මාධ්‍යවල දාලා, කැරලි හදාගෙන, ගැන්සි හදාගෙන, බොරු ප්‍රචාර කරලා තමයි මේ තත්ත්වයට මේ රට පත් වෙලා තිබෙන්නේ. එම නිසා මම ගරු අගමැතිතුමියගෙන් ඉල්ලා සිටින්නේ, ඉදිරියේදී ඉතිහාස පාඩමට පුරාවිද්‍යාව පිළිබඳවත් කරුණු ඇතුළත් කරන්න කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.48]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි විවාද කරන්නේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ අපේ රටේ අනාගත සමාජයේ ගෘහ නිර්මාණ ශිල්පය - architecture - පිළිබඳවයි. එහෙම නැත්නම් අපේ රටේ අනාගත සමාජය නිර්මාණය විය යුත්තේ කෙසේද කියන එක සම්බන්ධයෙන් තමයි අද අපි විවාද කරන්නේ. අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය කියන්නේ, අපේ රටේ ජාතියේ විඥානය තීරණය කරන engine එක. ඒ පිළිබඳව විවාද කරනකොට යම් ආකාරයක අවංකභාවයක්, සද්භාවයක් පවත්වා ගන්න කියලා මම විපක්ෂයටත් කියනවා. මොකද, අපේ රටේ අධ්‍යාපන පද්ධතියේ කාලයක් තිස්සේ යම් blind spots ගණනාවක් තිබෙනවා.

අපි නිර්මාණශීලීත්වය ගැන කථා කරනවා; විචාරශීලීත්වය ගැන කථා කරනවා; නූතනත්වය ගැන කථා කරනවා. හැබැයි අපේ අධ්‍යාපන ක්‍රමවේදය, අධ්‍යාපන පද්ධතිය මේ කිසිම දේකට ගැළපෙන්නේ නැති, 19වන සියවසට ගැළපෙන විධියට තිබෙන්නේ. එම නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉල්ලපු අධ්‍යාපන ක්‍රමයේ සුසමාදර්ශී වෙනස වෙනුවෙන් වූ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරිවර්තනය අපි දැන් පටන් අරගෙන තිබෙනවා. එම නිසා අපි ඉල්ලා සිටිනවා, ඒ පරිවර්තනීය ක්‍රියාදාමයට විපක්ෂයේ සහයෝගයත් ලබා දෙන්න කියලා. මොකද, අපි 2025 අවුරුද්ද වෙන් කළේ ආර්ථික ස්ථාවරත්වය ගොඩනහා ගන්න. 2026 අවුරුද්දේ අපි බලාපොරොත්තු වන්නේ, මේ ආර්ථික ස්ථාවරත්වය ඔස්සේ අපේ රටේ සිද්ධ වෙන්න ඕනෑ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ව්‍යුහාත්මක වෙනස්කම් වේගවත් කිරීමට අදාළ කටයුතු ආරම්භ කරන්නයි. ඒ නිසා තමයි අපි අධ්‍යාපන ක්ෂේත්‍රයේත් මේ ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමට අත ගසා තිබෙන්නේ.

අපේ සහෝදර මන්ත්‍රීවරු ගණනාවක් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ නව යෝජනා ගැන කථා කරපු නිසා විපක්ෂය පැත්තෙන් පොදුවේ මතු කරපු චෝදනා කිහිපයකට පිළිතුරු දෙන්න මම, මගේ කාලය යොදා ගන්නම්. අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කිරීම ගැන යම් චෝදනා මුඛයකින් කථා කළා, අපි අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කිරීම ගැන කථා කළාට අපේ අය වැය තුළ එහෙම සියයට 6ක් වෙන් කර නැහැ කියලා. මම මතක් කරන්න කැමැතියි, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරන්න කියන ඉල්ලීම පිළිබඳව සටන් කළේ ජාතික ජන බලවේගය පමණක් නොවන බව. ලංකාවේ විශ්වවිද්‍යාල ආචාර්යවරු, ශිෂ්‍ය ව්‍යාපාර, සිවිල් සමාජය වැනි විශාල පිරිසක් අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කළ යුතුයි කියන සටන් පාඨය වෙනුවෙන් පෙනී හිටියා. දැන් මේ විපක්ෂයේ ඉන්න සමගි ජන බලවේගය, එදා එක්සත් ජාතික පක්ෂයේ සිටියදී, රාජපක්ෂ ආණ්ඩුවට විරුද්ධව පාගමන් යනකොට ඒවාට එකතු වුණා. හැබැයි, එතුමන්ලා අද වනකොට මේ සියයට 6ක සටන් පාඨය ජාතික ජන බලවේගයට පමණක් සීමා කර කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒකට කමක් නැහැ. අපි අදටත් ශක්තිමත්ව ඒ සටන් පාඨය අල්ලාගෙන ඒ වෙනුවෙන් වැඩ කරමින් ඉන්නවා. ඒ නිසා අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

මම මේ අවස්ථාවේදී මේ කාරණයක් මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරනවා කියන්නේ, අධ්‍යාපනයට වෙන් කරන රජයේ මුදල් ප්‍රමාණය වැඩි කිරීමයි. අපි උදාහරණයක් ලෙස ගත්තොත්, අද වෙනකොට අධ්‍යාපනයට සියයට 4ත්, 6ත් වාගේ ප්‍රමාණයක් වෙන් කරන ලෝකයේ රටවල රජයේ ආදායම කොච්චර තිබෙනවාද? අධ්‍යාපනයට සියයට 4ක්, 6ක් වාගේ ප්‍රමාණයක් වෙන් කරන්න නම් රජයේ ආදායම සියයට 25ක, 30ක පවතින්න ඕනෑ. හැබැයි, අපේ රටේ රාජ්‍ය ආදායම කොතැනට ගෙනැල්ලාද මොවුන් අපට භාර දුන්නේ? අපේ රටේ

[ගරු රොෂාන් අක්මීමන මහතා]

රාජ්‍ය ආදායම දළ දේශීයේ නිෂ්පාදිතයෙන් සියයට 8.3කට අඩු කළා. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.3කට රාජ්‍ය ආදායම අඩු කරලා, අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න කියලා ඉල්ලනවා. අපි උත්සාහ කරන්නේ අපේ රටේ අධ්‍යාපනයට වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩි කරන්නයි. ඒ සඳහා ආර්ථික වර්ධන වේගයත් පවත්වාගෙන ගිහින්, එලෙස වර්ධනය වන ආර්ථිකයෙන් අපි රජයේ ආදායම වැඩි ප්‍රමාණයකට ගෙනෙන්න ඕනෑ. අපි ඉලක්ක කරනවා, මේ අවුරුද්ද අවසාන වනවිට එය සියයට 16කට ගෙනෙන්න. ඒ විධියට රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වැඩි කර ගැනීමේ ක්‍රියාවලිය තුළ තමයි අපිට අධ්‍යාපනයට වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩි කරන්න වෙන්නේ. එහි ආරම්භක පියවරක් විධියට අපි මේ අවුරුද්දේ අධ්‍යාපනය සඳහා වෙන් කළ මුදල සියයට 2.04ක ප්‍රමාණයකට වැඩි කර තිබෙනවා. ඒ අනුව, මෑත ඉතිහාසය ගත්තාම අපි 2026 අවුරුද්දේ තමයි ආරම්භයක් විධියට වැඩිම මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනයට වෙන් කර තිබෙන්නේ. ඒ අනුව, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කිරීමේ දීර්ඝකාලීන ඉලක්කය කරා අපි අනිවාර්යයෙන්ම යනවා. ඒ වෙනුවෙන් අපි වැඩ කරනවා. ඒ වෙනුවෙන් තමයි අපි මේ සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නේ.

ඒ වාගේම, අපට තවත් චෝදනාවක් එල්ල කළා, අධ්‍යාපන උපකරණ මත පනවා තිබෙන VAT එක සම්පූර්ණයෙන් අයින් කරනවා කියලා අපි පොරොන්දු වුණා, නමුත් ඒක අයින් කළේ නැහැ කියලා. ඔව්, අපි එහෙම පොරොන්දු වුණා. අපි එහෙම ප්‍රකාශයක් කළා. අපි අපේක්ෂා කළා, පාසල් උපකරණ මත පනවා තිබෙන VAT එක සම්පූර්ණයෙන්ම අයින් කරන්න. එයින් අපි බලාපොරොත්තු වුණේ අපේ දරුවන්ට උගන්වන්න යනකොට තිබෙන ආර්ථික බර, ආර්ථික පීඩාව ඉවත් කරන්න වාගේම විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල දෙමාපියන් තමන්ගේ දරුවන්ට උගන්වන්න පොත් ටික, බෑග් එක ගන්න බැරිව අසරණ වෙන එක වළක්වන්නයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි එක්ක වාගේම අපේ රටේ ආදායම් ඉලක්ක එක්ක VAT එක අඩු කිරීමේ සීමා තිබුණා. හැබැයි, එහෙමයි කියලා අපි කර බාගෙන හිටියේ නැහැ. අපි ඒ අපේක්ෂාව ඉටු කරගන්න, ඒ ජනතාවට සහන ලබා දෙන්න පුළුවන් විකල්ප ක්‍රියාමාර්ග හෙව්වා. ඒ නිසා තමයි අපි පසුගිය අය වැයෙන් වාගේම මෙවර අය වැයෙනුත් පාසල් උපකරණ මිලදී ගන්න රුපියල් 6,000ක මුදලක් වෙන් කළේ. අපේ රටේ අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 16කට ගිය අවුරුද්දේත් රුපියල් 6,000ක දීමනාවක් අපි ලබා දුන්නා. පවුලේ එක් දරුවෙක් ඉන්නවා නම් රුපියල් 6,000කුත්, දරුවන් දෙදෙනෙකු ඉන්නවා නම් රුපියල් 12,000කුත්, දරුවන් තුන්දෙනෙකු ඉන්නවා නම් රුපියල් 18,000කුත් ලැබෙනවා. මේ අවුරුද්දේ ඒ දීමනාව තවත් වැඩි වෙයි කියා අපි අපේක්ෂා කරනවා. ඒ වාගේම සපත්තු මිලදී ගන්න රුපියල් 4,000ක වවුචරයක් ලබා දුන්නා, ළමයි 300ට වඩා අඩු පාසල්වලට. වැඩිවියට පත් වුණු සෑම ගැහැනු දරුවෙකුටම සනීපාරක්ෂක තුවා ලබා දෙන්න මේ අවුරුද්දේ අපි මුදල් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ආබාධිත දරුවන්ට රුපියල් 5,000ක අමතර දීමනාවක් ලැබෙනවා. මේ සියල්ල අඩු ආදායම්ලාභී දෙමාපියන්ගේ දරුවන්ට උගන්වන්න ගියාම මුහුණ දෙන්න සිද්ධ වන ආර්ථික අපහසුතාව මග හරවන්න ගත්ත ක්‍රියාමාර්ග. සියයට 18 VAT එක සම්පූර්ණයෙන්ම අයින් කළා නම් සාමාන්‍යයෙන් රුපියල් 5,000ක පාසල් උපකරණ, පොත් මිලදී ගන්න බිලකින් අඩු වෙන්නේ රුපියල් 750ක් වාගේ මුදලක්. දරුවන්ට පොත් මිලදී ගැනීමේදී රුපියල් 5,000ක බිලක් ආවොත් VAT එක සම්පූර්ණයෙන් අඩු කළත් රුපියල් 750ක් වාගේ මුදලක් තමයි අඩු වෙන්නේ. හැබැයි, අපි එක් දරුවෙකුට රුපියල් 6,000ක දීමනාවක් ලබා දී තිබෙනවා, පොත් මිලදී ගන්න. ඒ අනුව, ඊට වඩා ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග තමයි අපි අරගෙන තිබෙන්නේ.

පසුගිය මාසයේ G20 සමුළුවට ලෝකයේ දැනට සිටින හොඳම ආර්ථික විද්‍යාඥයින් ආර්ථික අසමානතාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු වාර්තාවක් තිබෙනවා. මේ Report එක තිබෙන්නේ "G20 Extraordinary Committee of Independent Experts on Global Inequality" නමින්. එහි යෝජනා කරනවා, ආර්ථික අසමානතාව වළක්වන්න වඩා හොඳම ක්‍රියාමාර්ගය වන්නේ මෙන්න මේ අඩු ආදායම්ලාභී පවුල්වලට සුබසාධන දීමනා ස්වරූපයෙන් සෘජුවම මුදල් ලබා දීම කියලා. එයින් තව ගොඩක් ඵලදායී ක්‍රියාමාර්ග ගන්න පුළුවන් කියලා මේ වාර්තාවෙන් ප්‍රකාශ කරනවා. මේ, Joseph Stiglitz, Jayati Ghosh වාගේ දැනට ලෝකයේ ඉන්න හොඳම ආර්ථික විද්‍යාඥයෝ ගෙනාපු යෝජනා. අපි ඒවා ගිය අවුරුද්දේ ඉඳලාම ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම අද ගුරු හිඟය ගැනත් කථා කළා. ඔව්, අපේ රටේ 30,000කට ආසන්න ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. මම නියෝජනය කරන නැඟෙනහිර පළාතේ විතරක් 5,000කට ආසන්න ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. මගේ දිස්ත්‍රික්කයේ 2,000කට ආසන්න ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒ, වැඩියෙන්ම ගණිතය, විද්‍යාව වැනි විෂයයන් සම්බන්ධයෙන්. හැබැයි, කාලයක් තිස්සේ මේ පුරප්පාඩු පුරවන්නේ නැතුව හිර වෙලා තිබුණේ. ඒ විතරක් නොවෙයි, අපි ගිය අවුරුද්දේ මේ පුරප්පාඩු පුරවන්න ගියාම නඩු කිහිපයක්ම ඇවිල්ලා ඒ බඳවා ගැනීම් නවත්වලා තිබුණේ. පසුගිය අවුරුද්දේ මේ ආණ්ඩුව වැඩිම කාලයක් වෙන් කළේ ඒ නඩු ටික විසඳා අවසන් කර ගන්නයි. මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ට. ඉතා ඉක්මනින් මේ නඩු කටයුතු අවසන් කරගෙන, ලබන අවුරුද්දේ මුල් මාස කිහිපය වෙනකොට ගුරුවරු 25,000ක් පමණ බඳවා ගන්න අපිට දැන් අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ අනුව ලබන අවුරුද්ද වනකොට අපේ රටේ ගුරු හිඟයට යම් සැලකිය යුතු ප්‍රමාණයක විසඳුමක් ලබා ගන්න අපට පුළුවන් වෙයි කියලා මම හිතනවා. අද දින අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වූ විවාදයට සම්බන්ධ වුණු සියලු ගරු මන්ත්‍රීවරුන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.57]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය සම්බන්ධයෙන් කරුණු දැක්වීම මම ආරම්භ කරන්නේ පසුගිය වසරක කාල සීමාව තුළ ආණ්ඩුවේ ප්‍රතිඵල දිහා බලන ගමන්. ඇත්තටම මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරන්න පුළුවන්කමක් නැහැ කියලා. එහෙම අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න බැරි නම් ඒක කිව්වේ මොකටද කියලා තමයි මට ඉස්සෙල්ලාම එතුමාගෙන් අහන්න තිබෙන්නේ. ඔබතුමා ඔය ටික අද කිව්වාට කලින් ආණ්ඩු කරපු අයත් ඒ ටිකම දැනගෙන හිටියා. ඔබතුමන්ලා බලය ලබා ගත්තේ අධ්‍යාපනයට සියයට 6ක් දෙන්නම් කියලා. ඒ කාලයේ මිනිස්සුත් මේ ටික නොකළේ ඔබතුමා කියපු ඔය හේතු ටික නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය මේකයි. අධ්‍යාපනයට සියයට 6ක් වැඩි කරන්න කලින් සියයට 2ක් ඉල්ලුවා නේ. ඒකෙන් වෙන් කරපු මුදල්වලිනුත් වියදම් කරලා තිබෙන ප්‍රමාණයක් මේ තුළ තිබෙනවා නේ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, පාසල් අධ්‍යාපනය නවීකරණය කරන්න රුපියල් මිලියන 500ක් පසුගිය අවුරුද්දේ වෙන් කරලා තිබෙනවා. එහි මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස බින්දුවයි. සියයට 20ක භෞතික ප්‍රගතියක් තිබෙනවා. ඒ කියන්නේ, මොනවා හෝ වැඩසටහනකට සම්බන්ධ වෙච්ච වියදම් ටික විතරයි. පාසල්වල වැසිකිළි නැහැ, පහසුකම් නැහැ කියලා ඒ ඔක්කෝම ටික කියනවා. නමුත්, ජනාධිපතිවරයා වෙන් කරන මුදල් ටික වියදම් කර ගන්න තරම් අග්‍රාමාත්‍ය ධුරය දරන, අධ්‍යාපන ඇමති ධුරය දරන කෙනාට කාර්යක්ෂමතාවක් නැහැ. ඒ නිසා ඉස්සෙල්ලාම මම මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, මේ රටේ අධ්‍යාපනය මෙහෙයවන, අධ්‍යාපන ඇමති ධුරය දරන කෙනාව පුළුවන් නම් වෙනස් කරලා, මේ රටට ගැළපෙන වෙන අධ්‍යාපන ඇමතිවරයෙක් පත් කරන්න කියලා. මොකද, මේ තොරතුරු දිහා බලන විට එහෙම කියන්න සිද්ධ වෙනවා. *[බාධා කිරීම්]* කරන්න බැරි නම් අපිට කමක් නැහැ. මොකද, අපි යෝජනාවක් නේ කළේ. *[බාධා කිරීම්]* කෑ නොගහා අහගෙන ඉන්න. කථා කරන්නේ නැතුව අහගෙන ඉන්නකෝ. ඔය කියන්නේ ඒක නේ. හරිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසස් ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලා හදාරන්න ශිෂ්‍යත්ව වැඩසටහනක් පැවැත්වුවා. මම හිතන විධියට ඒ වෙනත් රටවලට සිසුන් යවන ශිෂ්‍යත්ව වැඩසටහනක්. ඒ සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කළා. තවම එහි මූල්‍ය ප්‍රගතිය බින්දුවයි. ඒක සියයට සියයක් වෙනවා කියලා තිබෙනවා. ඒ කියන්නේ, මේ ඉතුරු මාස ටික ඇතුළත ඒ සල්ලි ටික වෙන් කරනවා වාගේ අදහසක් තිබෙනවා. මේවායෙන් පෙන්නුම් කරන්නේ පසුගිය මාස කිහිපයක කාල සීමාව තුළ කාර්යක්ෂමතාවයේ අඩුපාඩු තිබෙනවා කියන එකයි. ඉතින්, සියයට හයක් වියදම් කරන්න කලින් සියයට දෙක වියදම් කරන්න කියලා අධ්‍යාපන අමාත්‍යාංශය භාරව කටයුතු කරන අයට මම යෝජනා කරනවා.

ඒ වාගේම, අධ්‍යාපන ඇමති ධුරය දරන කෙනා දවසක් මේ ගරු සභාවටම ඇවිල්ලා කිව්වා, වැඩිම වැටුප් තිබෙන ක්ෂේත්‍ර 10 තුළට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න ගුරුවරු, විදුහල්පතිවරු ගෙනාවා කියලා. පුළුවන්කමක් තිබෙනවා නම් ලංකාවේ ඒ තනතුරු 10 මොනවාද කියලා කියන්න. මොකද, ගුරුවරුනුත් හොයනවා ඒ තනතුරු 10 මොකක්ද කියලා. නමුත්, ඊට පසු දවසක තවත් නියෝජ්‍ය ඇමති කෙනෙක් කිව්වා, අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ මේ ගුරුවරුන්ගේ වැටුප ඒ තනතුරු 10 අතරට ගෙනෙනවා කියලා. කවුරු හරි කෙනෙක් බොරු කියනවා. ඇමති කියනවා, වැඩිම වැටුප් තිබෙන ක්ෂේත්‍ර 10 තුළට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න ගුරුවරු, විදුහල්පතිවරු ගෙනාවා කියලා. ඇමතිකම බලා ගන්න කෙනා කියනවා, ඒ තනතුරු 10 අතරට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවාය කියලා. ඒ නිසා මේ යන විධියට ගියොත් එහෙම අනාගතයේ දවසක ගුරු විභාග ගැටලුවලදී ලංකාවේ අධ්‍යාපන ඇමතිකම දැරූ පුද්ගලයින් අතර නොගැළපෙන නම තෝරන්න කිව්වොත්, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර, බදියුද්දීන් මහ්මුද්, ලලිත් ඇතුලත්මුදලි, රනිල් වික්‍රමසිංහ, රිචර්ඩ් පතිරණ, සුසිල් ප්‍රේමජයන්ත වාගේ අය අතුරින් දැන් අධ්‍යාපන අමාත්‍ය ධුරය දරන කෙනාගේ නමට යටින් ඉරක් ගහයි, එතුමිය තමයි නුසුදුසුම කෙනා කියලා. ඒ නිසා තමන්ගේ කාර්යභාරය හරියට ඉෂ්ට කරන්න කියලා ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් නැවත නැවතත් මම ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණාව මෙයයි. අවුරුද්දක කාල සීමාවක් තුළ ඔබතුමන්ලා ලැබූ ප්‍රතිඵලත් එක්කම අපිට මේ ගැන කථා කළ හැකියි. මේ වනකොට මේ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දක් වෙනවා. ගුරු පුරප්පාඩු 38,000ක් තවම තිබෙනවාය කියනවා. ගුරු පුරප්පාඩු 38,000ම පුරවන්න අවශ්‍ය නැහැ. නමුත්, ගෙවුණු අවුරුද්ද තුළ මේ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙතෙක් ගත්ත ක්‍රියාමාර්ගවලට වඩා අලුතින් ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා තමයි අපිට ඉස්සෙල්ලාම අහන්න තිබෙන්නේ.

ඊළඟට, විශ්වවිද්‍යාල තුළ තිබෙන නවක වදය ගැන ඔබතුමන්ලා කිව්වේ මොකක්ද? ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේ තිබෙනවා, ඒ නවක වදය වැළැක්වීම වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා වාගේ කථා ගොඩාක්. මම ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවලාත් බැලුවා. මම අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් අහන්න කැමතියි, මේ සමාජවාදී දර්ශනය ළමයින්ගේ ඔළුවලට දාන්න නවක වදය භාවිත කරන එක, ඒ වාගේම වෙන කිසිම ආර්ථික හෝ දේශපාලන දර්ශනයක් විශ්වවිද්‍යාල තුළ ක්‍රියාත්මක කරන්න නොදී බලහත්කාරයෙන් මේ නවක වදය ආශ්‍රිතව කරන වැඩ ටික නවත්වන්න ඔබතුමිය අලුතින් අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා.

ඊළඟට ඔබතුමන්ලා කිව්වා, දේශපාලන හා වෙනත් සබඳතා වෙනුවට වෙනත් ක්‍රමවේදයක් අනුගමනය කරලා, උපකුලපතිවරු පත් කරනවා කියලා. ඒ අනුව උපකුලපතිවරුන් පත් කිරීම සඳහා අලුතින් ආරම්භ කරපු ක්‍රමවේදය මොකක්ද කියා මම අහන්න කැමැතියි. විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගන්නා ප්‍රමාණය ඉහළ නංවනවා කිව්වා. ගිය අවුරුද්දේ ඉඳන් මේ අවුරුද්දට එද්දී ඔබ මුදල් කොපමණ වෙන් කළාද, විශ්වවිද්‍යාල සිසුන් බඳවා ගන්න ප්‍රමාණය කවර ප්‍රතිශතයකින් ඔබට වැඩි කරන්න පුළුවන් වුණාද සහ එළඹෙන අවුරුද්දේ කවර ප්‍රමාණයකින් වැඩි කරන්න මුදල් වෙන් කළාද කියලාත් මම අහන්න කැමැතියි. පශ්චාත් උපාධි පර්යේෂණ සංවර්ධනය සඳහා නව විශ්වවිද්‍යාලයක් ආරම්භ කරනවා කිව්වා. මම ඉල්ලීමක් කරනවා. ගෙවුණු අවුරුද්දේ බැරි වුණා නම් මේ අවුරුද්දේ හරි එය පටන් ගන්න සල්ලි වෙන් කර ගත්තාද? එහෙම වෙන් කර ගත්තා නම්, අර කලින් වාගේ වියදම් නොකර ඉන්නේ නැතිව මේ අවුරුද්දේ වියදම් කරන්න කියලා කියනවා. ඒ වාගේම මේවාට උත්තර දෙයි කියලාත් මම බලාපොරොත්තු වෙනවා.

ජාතික හෙද විශ්වවිද්‍යාලයක් ආරම්භ කරනවා කිව්වා. ඒ සඳහා මුදල් වෙන් කරලාද තිබෙන්නේ කියලා මම නැවත නැවතත් අහන්න කැමැතියි. කලින් ආණ්ඩු කාලයේ, පසුගිය අවුරුදු දෙක තුනේ වාගේ නොවෙයි මේ අවුරුද්දේ ඔබේ සල්ලි මල්ල හොඳටම හොඳයි කියලා සමාජ මාධ්‍ය හරහා ඔබ විසින්ම දැවැන්ත ප්‍රචාරණයක් අරගෙන ගියා. සල්ලි හොඳට තිබෙද්දී ඇයි, අධ්‍යාපනයට ඕනෑ කරන සල්ලි ටික වෙන් කරන්නේ නැත්තේ කියලා මම අහන්න කැමැතියි. අධ්‍යාපනයට අත්තටු දෙනවා කියලායි ඔබතුමන්ලා බලයට ආවේ. එතකොට මේ අවුරුද්දක කාල සීමාව තුළ අලුත් අයට ලැබුණු අත්තටු ප්‍රමාණය කොච්චරක්ද, කොහෙන්ද ආවේ, මොන ක්ෂේත්‍රවලින් ද ඔබ අනෙක් ආණ්ඩුවලට වඩා ඉදිරියට ගියේ කියලා මම අහන්න කැමැතියි.

ඒ වාගේම ශිෂ්‍යත්ව විභාගය ගැනත් කියන්න ඕනෑ. ඔබතුමන්ලා ශිෂ්‍යත්ව විභාගය අහෝසි කරනවා කියලා ආපු කණ්ඩායමක්. මේ තරගකාරී බව ළමයින්ට හොඳ නැහැ කියලා ඔබතුමන්ලා කිව්වා. ඒ විධියට කියලා තමයි ඔබතුමන්ලා බලය ලබා ගත්තේ. ශිෂ්‍යත්වයට පෙනී සිටින දරුවන්ගේ අම්මලා, තාත්තලා හරි කැමැතියි, ගෙදර ඉඳන් කිලෝමීටර දෙකක් ඇවිදගෙන ගියාම ජනප්‍රිය, සියලු පහසුකම් සහිත පාසලක් තිබෙනවා නම්. ඒ නිසා අපේ දරුවා ශිෂ්‍යත්වයට මේ වාගේ

[ගරු අමිල ප්‍රසාද් මහතා]

තරගකාරීව යවන්නේ මොකටද කියලා හිතලා ඒ ගැන බලාපොරොත්තුවෙන් ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ගෙවුණු අවුරුද්දේ එහෙම අලුත් පාසල් ආරම්භ කළාද? ආරම්භ කළා නම්, ඒ ආරම්භ කරපු පාසල් ගණන කීයක්ද කියා මම අහන්න කැමැතියි. මේ අවුරුද්දේ ඔබ ආරම්භ කරන්න බලාපොරොත්තු වන පාසල් ගණන කීයක්ද කියා මම අහන්න කැමැතියි. හැබැයි, ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්නය ඊට වඩා ටිකක් වෙනස්.

මොකක්ද ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්නය? ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්නය තමයි, ගිය අවුරුද්දේ ශිෂ්‍යත්වය සමත් වෙලා තිබෙනවා, 51,244ක්. මේ අවුරුද්දේ සමත් වෙලා තිබෙනවා, 51,969ක්. 700ක විතර පොඩි ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, මෙහෙම 700ක් විතර වැඩි වෙලා තිබුණාට ලංකාවේ ප්‍රධාන පාසල් සියල්ලේම ලකුණු ගන්න ප්‍රමාණය ඔබ එකවරම ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ ලකුණු 5ක වාගේ ප්‍රමාණයකින් ඉහළ නංවලා තිබෙනවා. මම දැනගන්න කැමැතියි, ඒ ගත්ත තීරණය කුමක්ද, කොහොමද එහෙම වුණේ කියන එක. හේතුව, මම ඔබේ මේ වැඩසටහනත් එක්ක බලපු දෙයක් තිබෙනවා. බලන්න, අධ්‍යාපනය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබෙන මේ ප්‍රස්තාරය දිහා බැලුවාම පෙනෙනවා, වැඩි ලකුණු තිබෙන අය වැඩි වෙලා නැහැ කියලා. ඊළඟට, මෙතැන තිබෙන ඉලක්කම් ටික දිහා බැලුවාම, ගිය අවුරුද්දේ ලකුණු 70-100 අතර අය 7,910යි ඉන්නේ. මේ අවුරුද්දේ first paper එකට ඇවිල්ලා තිබෙනවා 8,275ක්. පොඩි ප්‍රමාණයක් වැඩි වෙලා තිබෙනවා. දෙවන ප්‍රශ්න පත්‍රයේ ඉහළ ලකුණු ලබාගත් අගයන් විධියට 55,000යි, 67,000යි. පොඩි ප්‍රමාණයක් වෙනස් වෙලා තිබෙනවා. හැබැයි, ඊට සමගාමීව ප්‍රධාන පාසල් සියල්ලේම ලකුණු ප්‍රමාණය විශාල වශයෙන් වැඩි කරලා තිබෙනවා. මේකට හේතුව මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි. ඇයි මම එහෙම අහන්නේ? පාසල්වලට බඳවා ගන්න ප්‍රමාණය ඒ හරහා අවම වනවා. මොකද, දරු දැරියන්, දෙමව්පියන් බලාපොරොත්තු තියාගෙන හිටපු ගණනට වඩා ලකුණු ගොඩක් ඉහළ නංවලා තිබෙනවා. ඒකට විද්‍යාත්මක හේතුව මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

ඒ වාගේම තව දෙයක් කියන්න ඕනෑ. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබෙන වාර්තාව, ප්‍රස්තාර දිහා බලනකොට ශිෂ්‍යත්ව විභාගයේ තිබෙන තව ගැටලුවක් පෙනෙනවා. ඒ තමයි, ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වන දරුවන් අතර ආර්ථික වශයෙන් ඉහළ ශක්‍යතාවක් තිබෙන පවුල්වල දරුවන් සමත් වීමේ සම්භාවිතාවේ ප්‍රතිශතය වැඩියි. දුප්පත් දරුවන්ට, සාමාන්‍ය පවුල්වල දරුවන්ට සමත් වෙලා හොඳ පාසලකට යන්න තිබෙන අවස්ථාව වෙනුවෙන් පවත්වන ශිෂ්‍යත්ව විභාගයේදී ඒ දරුවන්ට වඩා ඉහළ ආර්ථික තත්ත්වයක් තිබෙන පවුල්වල දරුවන්ගේ ප්‍රතිඵල වැඩියි කියලා ඒ වාර්තාව ඇතුළේ ප්‍රස්තාරයක් මඟින් පෙන්වලා තිබෙනවා මම දැක්කා. එහෙම නම්, ඒකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? ඉහළ ආර්ථික ශක්තියක් තිබෙන අයගේ දරු දැරියන්ට ටියුෂන් පන්ති වාසිය තමයි ඒ ඇවිල්ලා තිබෙන්නේ කියලා මම හිතනවා. ඒ නිසා ලංකාවේ අධ්‍යාපනයට ටියුෂන්වල බලපෑම මොන වාගේද කියලා වරින් වර කියන්න වුවමනාවක් නැහැ. ටියුෂන් පන්ති නවත්වන්න කාට හරි වුවමනා නම්, රටේ අධ්‍යාපන පද්ධතියේ තිබෙන තරගකාරිත්වය අඩු කරන්න ඕනෑ. විශ්වවිද්‍යාල සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ. ඊට අමතරව, පාසල්වල පහසුකම් වැඩි කරන්න ඕනෑ. ග්‍රාමීය පාසල් මීට වඩා ඉහළට ගෙනෙන්න ඕනෑ. ඔබගේ ආණ්ඩුව මේ අවුරුද්ද තුළ ඒ වෙනුවෙන් ගන්න බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග මොනවාද? මොකද, ගෙවුණු අවුරුද්දේ එවැනි කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නවා අපි දැක්කේ නැහැ.

ඊළඟට මම දැක්කා, මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා VAT එක පිළිබඳව අදහසක් කිව්වා. ඔව්, අවුරුදු 76කින් අවුරුදු 74ක් තුළම අධ්‍යාපනික ප්‍රකාශනවලට VAT එක දාලා තිබුණේ නැහැ. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය එන්නේ නව කථා සහ ඒ වාගේ දේවල් ලංකාව ඇතුළේ ලියන අයට. ඇයි අපි එහෙම කියන්නේ? VAT එක ගෙවන්නේ නැතුව එහෙම පොතක් එළිදක්වන කෙනෙක් ඇවිල්ලා කඩේකට ඒ පොත දුන්නාට ලාභයෙන් VAT එක ගෙවන්න වෙන නිසා කඩවල් කරන අය ඒ පොත් විකුණන්න කැමති නැහැ. හැබැයි, වෙන රටක ඉඳලා ලංකාවට පොතක් ගෙනෙනවා නම්, ඒක VAT එක ගෙවලා ගෙනෙන නිසා ඒ අය ඒ පොත් ගන්න කැමැතියි. එවැනි දේවල්වලට VAT එක පැනවීම හරහා ඊළඟට එන ප්‍රශ්නය මොකක්ද? පාසල් උපකරණවලට - stationaryවලට - VAT එක ගහන එක නොවෙයි ප්‍රශ්නය. පොත්වලට VAT එක ගහන එකයි ප්‍රශ්නය තිබෙන්නේ. කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වාට ඒක හරියට තේරුම් අරගෙන තිබුණේත් නැහැ. VAT එක තිබෙන කොට වෙන්නේ පොතේ මිල වැඩි වෙන එක. ප්‍රකාශන ආයතන පොත් ගැහුවාට වැඩක් නැහැ; ඒවා මිලදී ගන්නේ නැහැ. පොත් ප්‍රකාශන විකුණන සෑම තැන්වලම පොත් විකිණීමේ ප්‍රමාණය අඩු වෙලා තිබෙන බව ගිය අවුරුද්ද අරගෙන බැලුවොත් ඔබටම බලාගන්න පුළුවන්.

ඒ වාගේම bookshopවලට ලියුම් කවර වාගේ දේවල් ගෙනැල්ලා දෙන අය ඉන්නවා. කඩවල ඉන්න අය ගම්වල ඉන්න අය අලවා ගෙනෙන ලියුම් කවර දැන් ගන්නේ නැහැ. මොකද VAT ප්‍රශ්නය නිසා. ඊට වඩා ලාභයි, ඒගොල්ලන්ට VAT එක ගෙවපු ආයතනයකින් ඒවා ගන්න එක. මේ විධියට අනෙකුත් භාණ්ඩවලටත් ඔබතුමන්ලා මේ ප්‍රශ්නයම නිර්මාණය කළාම; ඔය රුපියල් ලක්ෂයක සීමාව එහෙම දැම්මාම, අල ගොවීන්ටත්, ලූනු ගොවීන්ටත් ලියුම් කවරවල තිබෙන ප්‍රශ්නය වාගේම ප්‍රශ්නයක් එනවා. ඔවුන්ගේ නිෂ්පාදන ලංකාවේ මාර්කට් එක ඇතුළේ මිලදී නොගෙන ඒ වෙළෙන්දන්ට පිට රටවල භාණ්ඩ මිලදී ගෙන වැඩි වාසියක් ගන්න අවස්ථාවක් තිබෙනවා කියලා මම හිතනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කියන කොට "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක්" කියලා පොතක් ගැන කිව්වා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරපු දවසේ මේක ඉදිරිපත් කරන්න තිබුණා නේ. Slides වගයක් ඉදිරිපත් කරලා කියන්න ඕනෑ නැහැ නේ. අධ්‍යාපන ඇමතිතුමියගෙන් මම අහනවා, මේක තියාගෙනද එදා ඔය කාරණාව කිව්වේ කියලා. මේ වාගේ document එකක් තිබෙනවා නම් පාර්ලිමේන්තුවට දෙන්න තිබුණා නේ, මෙන්න මේ කට්ටිය තමයි හැදුවේ කියලා. එදා කථා කරගන්න බැරුව බිල්ලෝ වාගේ ඉඳලා අද කියනවා, මෙන්න මෙහෙම එකක් තිබෙනවා කියලා. අපි අහනවා, එහෙම නම් ඒක තියාගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළේ ඇයි කියලා.

ඊළඟ කාරණාව මෙයයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව සාකච්ඡා කරන සෑම අවස්ථාවකම තවම ලංකාවේ උසස් පෙළ දරුවන්ට calculator එක අනිවාර්ය කරන්න බැරි වෙලා තිබෙනවා. තවම සුළු කිරීම් කරන්නේ ලඝු පොතෙන්. ලඝු පොතෙන් සුළු කරන එක නවත්වලා, කාලය ඉතිරි කරන්න, සංකල්ප පිළිබඳව අවධානය යොමු කරවන්න, විභාග පද්ධතිය ඇතුළට calculator එක ආදේශ කරන්න කියලා අපි ඉල්ලනවා. ඒවා තමයි ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විභාග නැවැත්වීම හරහා සාර්ථක වුණේ කොයි රටවල අධ්‍යාපනයද කියලා මම අහන්න කැමැතියි. ලංකාවේ අධ්‍යාපනික තරගය රජයේ පාසල් සහ පෞද්ගලික පාසල් කියලා වෙනම තිබෙනවා. Edexcel, Cambridge වාගේ අන්තර්ජාතික විභාග - exams - එක්ක ජාත්‍යන්තර පාසල් කටයුතු කරගෙන යනකොට, රජයේ

පාසල්වල විභාග නවත්වපු ගමන් පුළුවන්කමක් තිබෙන දෙමව්පියයන් සියලුදෙනා ජාත්‍යන්තර පාසල්වලට තමන්ගේ දරුවන් යවනවා. අවසානයේදී රජයේ පාසල්වලින් බලාපොරොත්තු වෙච්ච එකක්වත් කරගන්න බැරුව යනවා.

විභාග ක්‍රමය නැවැත්වීම හරහා ෆින්ලන්තයේ අධ්‍යාපනයට මොකද වුණේ කියලා හොයන්න පුළුවන්; නවසීලන්තයේ වුණේ මොකක්ද වුණේ කියලා හොයන්න පුළුවන්. ඒ අය අධ්‍යාපනයෙන් ඉදිරියට ආවාද, පස්සට ගියාද කියලා හොයන්න පුළුවන්. මේවා සාර්ථක වෙන ඒවා නොවෙයි. ඉන්දියාව, චීනය ඇතුළු ආසියාවේ රටවල් විශාල වශයෙන් ගණිත අංශයෙන් ඉදිරියට එන්නේම විභාග ක්‍රමය හරහා. විභාග අමාරු නම් arts කරන ළමයාටයි, maths කරන ළමයාටයි එකම ගණිත පේපර් එක තියන්නේ නැතුව කලා විෂය ධාරාව හදාරන දරුවාට ඊට වඩා අඩු දැනුමක් සහිත ගණිත පේපර් එකක් දෙන්න පුළුවන්. ඒවා තමයි බිමේ ප්‍රායෝගික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ. එහෙම නැතුව කොහේවත් තිබෙන අධ්‍යාපන ප්‍රතිංස්කරණ මෙහාට ගෙනැල්ලා අත්අරින්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තිබුණාට රටේ මිනිසුන්ට ඒ ඔළුවේ අමාරුවට බෙහෙත් ගන්න වුවමනාවක් නැහැ කියලා අධ්‍යාපන ඇමතිට කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සවස 2.00 වෙනකල් පාසල් පවත්වන්න තීරණය කරලා තිබෙනවා. සවස 2.00 වෙනකල් පාසල් පවත්වලා interval දෙකක් දුන්නාට පස්සේ ඔය පැය භාගය ආපසු යනවා නේ. කෝ, එලදායී කාලයක් ඉතුරු වෙලා? *[බාධා කිරීමක්]* Interval එකයි ද? හොඳයි, එහෙම නම් මම ඊළඟ ප්‍රශ්නයට එන්නම්. අද මීරිගම ආසනයේ පවා බොහෝ පාසල්වල වැසිකිළි පද්ධතිය, කැසිකිළි පද්ධතිය ක්‍රියාත්මක නැහැ. බොන්න වතුර ටික නැහැ. පාසල් කාලය තව වැඩි කරන්න කලින් අපි ඉල්ලා සිටිනවා, පාසල්වල යටිතල පහසුකම් දියුණු කරන්න කියලා. අපට කමක් නැහැ දෙක වෙනකල් හරි, තුන වෙනකල් හරි පාසල් පවත්වන එක ගැන. ඒක ඔබේ තීරණයක් නේ. හැබැයි, පාසල්වල යටිතල පහසුකම් දියුණු කරන්න, ඒ සඳහා වෙන් කරලා තිබෙන සල්ලි වියදම් කරන්න කියලා කියනවා. ඒ පාසල්වල විදුහල්පතිවරුන් අපට ලියුම් එවනවා, "ඔබතුමාගේ විමධ්‍යගත අරමුදල්වලින් අපට මේවාට උදව්වක් කරන්න" කියලා. විමධ්‍යගත අරමුදල් අපට දෙන්නේ නැහැ කියලා ඒ මිනිස්සු දන්නේ නැහැ. විමධ්‍යගත අරමුදල් දුන්නා නම් අපටත් පුළුවන් ඒවාට උදව්වක් කරන්න. ඒක කරන්නේත් නැහැ. දෙන මුදල් වියදම් කරන්නේත් නැහැ. වෙන කෙනෙක් වියදම් කරනවාට කැමතිත් නැහැ. හැබැයි, පාසල් පද්ධතිය ඇතුළේ මේ වාගේ යටිතල පහසුකම් අර්බුද තිබෙද්දී ඒවාට එකදු විසඳුමක්වත් දෙන්නේ නැතුව සවස 2.00 දක්වා පාසල් කාලය ඉහළ නංවනවා.

ඒ වාගේම ගුරුවරුන්ගේ පැත්තෙනුත් ප්‍රශ්නයක් එනවා. මේවා තමයි අද කථා කරන්න කියලා ඒ අය මට කියපු ඒවා. සවස 2.00 වෙනකල් පාසල් පවත්වන කාලය වැඩි කරන කොට ඒකට අදාළව වැටුප් වැඩි වෙනවාද කියන එක පිළිබඳව තවමත් කිසිදු අදහසක් ඉදිරිපත් කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසස් පෙළ සමත් වෙන අයගෙනුත් සියයට 10යි වෛද්‍ය විද්‍යාලවලට ගන්නේ කියලා අද උදේ මට අහන්න ලැබුණා. ඉතින් අපේ ප්‍රශ්නය තමයි, ඉතිරි සියයට 90ට මොකක්ද කරන්නේ කියන එක. රාජ්‍ය විශ්වවිද්‍යාල වැඩි කරනවාද? බැරි නම්, එතෙක් හෝ සියයට 100ටම අවස්ථාව දෙන්න පුළුවන් වන තෙක් හෝ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට හෝ ඉඩ දීලා මේ රටේ ළමයින්ට තමන්ගේ අධ්‍යාපන සිහිනය සැබෑ කර ගන්න අවස්ථාව සලසන්න. ඊට විරුද්ධව තීරණ ගන්නේ නැතුව ඉන්න, කකුලෙන් අදින්නේ නැතුව ඉන්න කියලා අපි ඉල්ලා සිටිනවා. අපි කියනවා, ලොකු තීරණයක් අරගෙන මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරලා ලොකු පිරිසකට ඇතුළු වෙන්න අවස්ථාව දෙන්න ඔබට පුළුවන් නම්, ඔබ වගේ අපි ඒකට විරුද්ධ වෙන්නේ නැහැ කියලා. මොකද, මේ රටේ ළමයින්ගේ අධ්‍යාපනය ඉහළ නංවන්න රජයේ සහයෝගය වාගේම පෞද්ගලික අංශයේ සහයෝගයත් අනිවාර්යෙන්ම ලබා දිය යුතුමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] took the Chair.*

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු සභාපතිතුමනි, මම කථා කරමින් හිටපු කාරණයට ආයෙත් එන්නම්. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) විභාග සමත් වෙලා හෝ අසමත් වෙලා විශ්වවිද්‍යාලයට හෝ එතැනින් එහා අධ්‍යාපනයකට යන්න බැරි අයට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, අවුරුදු කිහිපයක් ගියාට පස්සේ ඒගොල්ලෝ ළඟ තමන්ගේ සුදුසුකම් පෙන්වන්නට ලියවිල්ලක් නොමැති වීම. සමහර කෙනෙකුට welding workshop එකක welding වැඩ හොඳට කිරීමේ හැකියාව තිබෙන්න පුළුවන්. හැබැයි සහතිකයක් නැහැ, ඔහු අතේ. වෙනත් රටකට යන්න බලාපොරොත්තු වෙනවා නම්, ඔහුට ඒ සඳහා ඉදිරිපත් කරන්න document එකක් නැහැ. එම නිසා, මේ විධියට අධ්‍යාපනය මඟ හැරෙන අයට යළි අධ්‍යාපනය ඇතුළේ ඔය විධියට තාක්ෂණය ආශ්‍රිතව NVQ level එකට සමාන සහතික පත්‍රයක් දෙන්න, එහෙම නැත්නම් මොකක් හෝ certificate එකක් නිර්මාණය කරලා දෙන්න පුළුවන් ආයතනයක් රජයෙන් මුදල් වෙන් කරලා හදන්න කියා මම ඉල්ලා සිටිනවා. මොකද, ඒක සංචාරක ව්‍යාපාරයටත් අදාළයි. සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින සමහර අය ඉන්නවා, එම ව්‍යාපාරය තුළ දක්ෂ ලෙස යෙදෙන. හැබැයි, පෙන්වන්න තරම් සහතිකයක් ඒ අයට නැහැ. අධ්‍යාපනය සඳහා වෙන් කර තිබෙන සල්ලි වියදම් කරලා අන්න ඒ වගේ අයටත් මේ වාගේ සහතික පත්‍රයක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් හදන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණය මේකයි. අධ්‍යාපනය කියන්නේ අත්තටු කියලා කිව්වා, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා විශේෂයෙන් සලකන්න ඕනෑ කියලා කිව්වා. නමුත්, පූර්ණකාලීනව විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ලබා දෙන සියයට 10ක දිරි දීමනාව සියයට 6 දක්වා අඩු කරලා තිබෙනවා කියා සඳහන් document එකක් මට එවා තිබෙනවා. හැබැයි, අධ්‍යාපනය කියන්නේ අත්තටු කියලායි බලයට ආවේ. මේවා පිළිබඳව ඔබට අදහස් දක්වන්න පුළුවන්.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඊළඟ කාරණය. විශ්වවිද්‍යාලවල නව පීඨ ඇති කරන්න එපා, මුදල් නැහැ කියලා දන්වා ඇති බව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය විසින් සඳහන් කර එවා තිබෙනවා. ඒ අය කියන විධියට ඉතාම පොඩි මුදලක් තමයි ඒ සඳහා වියදම් වෙන්නේ. හැබැයි, මූල්‍ය ප්‍රතිපාදන හිඟයක් යැයි පෙන්වා දෙමින් නව විෂයයන් හඳුන්වා දීම, අධ්‍යයන අංශ හෝ පීඨ ඇති කිරීම නවත්වන්න කියා දන්වා තිබෙන බවත් ඒ අය සඳහන් කර තිබෙනවා. මෙයද අධ්‍යාපනයේ අත්තවූ කියලා මම අධ්‍යාපන ඇමතිතුමියගෙන් අහන්න කැමැතියි. සල්ලි තිබෙනවා, වියදම් කර ගන්න බැහැ; වියදම් කරන්න මිනිස්සු ඉන්නවා, සල්ලි දෙන්නේ නැහැ. ඊත් කියනවා, "අධ්‍යාපනය තමයි අත්තවූ" කියලා.

ඊළඟ කාරණාව, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා වූ අතිරේක මාසික දීමනාව අහිමි කිරීම පිළිබඳවයි. පොට්ටනියේ ඇති වෙන්න මුදල් තිබෙනවා කියලා පසුගිය දවස්වල දිගින් දිගටම social mediaවල පළ වුණා. හැබැයි, මේ විධියට යම් skill එකක් තිබෙන මිනිස්සු,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු සභාපතිතුමනි, මට තවත් විනාඩියක කාලයක් ගන්න පුළුවන්ද, කථාව අවසන් කරන්න?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Take just 30 seconds.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ අතිරේක දීමනා වැඩි කරන්නේ නැතුව ඒ මිනිස්සු ඒක ඇතුළේ රඳවා ගන්නේ කොහොමද කියලා මම අහන්න කැමැතියි.

අවසාන වශයෙන්, අධ්‍යාපන ඇමති ධුරය දරන කෙනාගෙන්මයි මට මේ ප්‍රශ්නය අහන්න තිබෙන්නේ. එක පැත්තකින් ඔබ ගුරුවරයෙකු ලෙස සේවය කරන අතරතුර, විපක්ෂ නායකතුමා Open University එකේ ලියාපදිංචි වෙලා තිබියදීත් ඔබට කියන්න බැරි වුණා, ඔහු G.C.E. O/L සමත් වුණු කෙනෙක් කියලා. මම ගුරුවරයෙකු නිසා කියනවා, මගෙන් ඉගෙන ගන්න ළමයින්ගේ ගෞරවය පිළිබඳව අප විශ්වාස කරන බව. ඒ මිනිසුන්ට ගෞරවය දෙන්න ඕනෑ කියලා මම කියනවා. ඔබ ඒ තරමටවත් දෙයක් කරන්න පුළුවන් කෙනෙක් නොවෙයි. ඒ තරමටම ඔබ ඒ කාරණා ඇතුළේ අසාර්ථකයි. මම නැවත කියනවා, විශේෂයෙන්ම,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම තත්පර කීපයකින් අවසන් කරන්නම්, ගරු සභාපතිතුමනි.

මම ආණ්ඩුවට යෝජනා කරනවා, සුදුසු කෙනෙක් අධ්‍යාපන ඇමති ධුරයට පත් කරලා මේ රටේ අධ්‍යාපනය මීට වඩා ඉහළ නංවන්න කියලා.

මට කථා කරන්න කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Prime Minister, you have 12 minutes.

[අ.භා. 6.14]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු සභාපතිතුමනි, අතිශයින් වැදගත් මාතෘකාවකට අදාළව පවත්වන අතිශයින් වැදගත් මේ විවාදයට සම්බන්ධ වීම පිළිබඳවත්, අද දවස තුළ ඉතාම වටිනා අදහස් බොහොමයක් අපට මතු කර දීම පිළිබඳවත් ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලු මැති ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, මෙතැන සිටින සියලුදෙනාටම රටේ අධ්‍යාපනය පිළිබඳව හැඟීමක් තිබෙනවා කියලා, අදහස් තිබෙනවා කියලා. එම නිසා ඒ සාධනීය විවේචන සහ යෝජනා ඉදිරිපත් කළ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් සියලුදෙනාටම මම නැවත වරක් ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, වෛරයෙන් කථා කරන, එහෙම නැත්නම් නොදැනුවත්කමින් කථා කරන අයත් එක්ක සංවාදයක් කරන්න බැහැ, ඒවාට ප්‍රතිචාර දක්වන්නත් බැහැ. වෛරයයි, නොදැනුවත්කමයි දෙකම එකතු වුණාම ඒක ඇත්ත වශයෙන්ම අතිශය භයානකයි. ඒක අතිශයින් භයානක දෙයක්. වෛරය සහ නොදැනුවත්කම එකතු වුණු කාරණා ඇත්තටම මෙවැනි විවාදයකට සුදුසු ඒවා නොවන නිසා මම ඒවාට ප්‍රතිචාර දක්වන්නේ නැහැ. අතළොස්සක් -ඉතාම කුඩා පිරිසක්- තමයි අද එලෙස කථා කළේ. අප ඔවුන්ට අනුකම්පා කරනවා හැරෙන්න, වෙන කරන්න දෙයක් නැහැ කියලා තමයි මා නම් හිතන්නේ.

ගරු සභාපතිතුමනි, මම නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා, මහජන නියෝජිතයන් හැටියට තමන්ගේ ප්‍රදේශවල තිබෙන ප්‍රශ්න මතු කරපු, යෝජනා ඉදිරිපත් කරපු සියලු දෙනාටම. ඒ මතු කරපු කාරණා සියල්ල අමාත්‍යාංශයක් හැටියට අපි අපේ අවධානයට ගන්නවා. ඒ වාගේම ඉදිරිපත් කරපු සාධනීය යෝජනා සහ විවේචන සියල්ල ගැන අප සලකා බලනවා කියන එකත් මම කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අප 2026 අවුරුද්ද තුළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන ප්‍රතිසංස්කරණ පිළිබඳව ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් බොහෝ දෙනෙක් මෙතැනදී අදහස් මතු කළා. මම ලොකු කාලයක් ගන්නේ නැහැ, ඒවා නැවත නැවත මතු කරන්න. අපි එහි concept paper එක, website එකේ පළ කරලා

තිබෙනවා. Ministerial Consultative Committee එකේදීත් ඒ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ඒ ගැන තවත් සාකච්ඡා කිරීමට අපට අවස්ථාව ලබා ගන්න පුළුවන්. නමුත්, මට කාරණා දෙකතුනක් කියන්න ඕනෑ. මේක ඉතාම ක්‍රමානුකූලව, පියවරෙන් පියවර ක්‍රියාත්මක කරන ගමන් ඉදිරියට යන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. මෙහිදී මම එක කාරණයක් ගැන ටිකක් පැහැදිලි කරන්න ඕනෑ. විශේෂයෙන්ම කථා බහට ලක් වෙලා තිබෙනවා, පාසල් වේලාව පැය භාගයකින් වෙනස් කිරීම පිළිබඳව; පස්වරු 01.30 සිට 02.00 දක්වා දීර්ඝ කිරීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, අප ගත්තු ඒ තීරණය පරිපාලනමය තීරණයක් නොවෙයි. මේ ප්‍රතිසංස්කරණය තුළ අප හඳුන්වා දෙන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට සුදුසු වන විධියේ ව්‍යුහයක් අපට අවශ්‍යයි. ඒ කියන්නේ, පන්ති කාමරය තුළ ගුරුවරයාත්, දරුවනුත් පහසුවෙන්, සැහැල්ලුවෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට සහභාගී වෙන්න ඕනෑ නිසාත්, ගුරුවරයාට අධික පීඩනයකින් තොරව ඇගයීම් කටයුතු පන්ති කාමරය තුළදීම කර ගන්න වෙලාවක් අවශ්‍ය වන නිසාත්, විශේෂයෙන්ම ඉගෙනුම් ක්‍රියාවලිය තුළ team work, group work කියන එකට තැනක් දෙන නිසාත් ජාතික අධ්‍යාපන කොමිසම විසින් නිර්දේශ කරපු වෙලාව අනුව අප එකඟතාවකට ඇවිල්ලා තමයි ඒ විනාඩි 30 වැඩි කරලා තිබෙන්නේ. ඒ අනුව අමාත්‍යාංශය විසින් guidelines නිකුත් කරලාත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි ප්‍රවාහන අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරමින් යනවා, timetable එක වෙනස් කිරීම තුළ අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීම පිළිබඳව. ඒ වාගේම මම ස්තුතිවන්ත වෙනවා, ප්‍රවාහන අමාත්‍යාංශයටත්, ගරු ප්‍රවාහන අමාත්‍යවරයාටත්, මේ වෙනුවෙන් අපත් එක්ක ඉතාම සාධනීයව මැදිහත් වීම පිළිබඳව.

ගරු සභාපතිතුමනි, අපි මේ වනකොට 2026ට සූදානමක් හැටියට අලුත් modules 106ක් print කරලා තිබෙනවා. පළමු ශ්‍රේණියටත්, හයවන ශ්‍රේණියටත් අවශ්‍ය වන modules 106ක්, print කරලා ඉස්කෝලවලට distribute කරන්න දැන් පටන් ගෙන තිබෙනවා. විෂයන් 32කට TOT සම්පූර්ණ කරලා ඉවරයි, පළමු ශ්‍රේණියටත්, හය ශ්‍රේණියටත් අදාළව. ගුරුවරුන් 140,000ක් පුහුණු කරන්න පටන්ගෙන තිබෙනවා. එය මේ අවුරුද්ද අවසන් වනකොට අවසන් වීමට නියමිතයි. විදුහල්පතිවරුනුත් ඒ සම්බන්ධයෙන් දැනුවත් කරලා තිබෙනවා. ඒ වාගේම පළමු ශ්‍රේණියේ සහ හය ශ්‍රේණියේ දෙමව්පියන්ටත් ඒ අදාළ දැනුවත් කිරීම කරන්නත් අපි සැලසුම් කර තිබෙනවා. අපි දැනුවත් කිරීමේ වැඩසටහන් 1,642ක් මේ වනකොට කරලා තිබෙනවා. Consultations 2,033කට මේ වන කොට සහභාගී වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, අපි මෙය පෙර පාසල් අධ්‍යාපනයේ සිටම ගෙන යන දෙයක් කියලා. අපේ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියත් මෙහිදී මේ ගැන මතක් කළා. අපි සතියකට විතර කලින් Early Childhood Education Curriculum Framework එකක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳ training එක 2026දී පටන් අරගෙන, ඒ අලුත් curriculum එක 2027 සිට ක්‍රියාත්මක කිරීමටත් අපි සැලසුම් කර ගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි මෙතැන කරුණු මතු වුණා, උසස් අධ්‍යාපනයේදී විශේෂයෙන්ම වෛද්‍ය උපාධිය සඳහා යන ප්‍රතිශතය අඩුයි කියන කාරණය. මේ සංඛ්‍යාලේඛන ගැන කියනකොට අපට හිතුණා, ලංකාවේ විතරයි මෙහෙම තත්ත්වයක් තිබෙන්නේ කියලා. එහෙම නොවෙයි ගරු සභාපතිතුමනි. ඇත්තටම ඔබතුමාත් දන්නවා, වෛද්‍ය උපාධියකට ඇතුළු වෙන එක ගෝලීය වශයෙන් කොච්චර තරගකාරිද කියන එක. UKවලත් qualify වෙන ප්‍රමාණය සියයට නවයයි. UKවලත් සියයට නවයයි වෛද්‍ය උපාධියකට ඇතුළු වෙන්න පුළුවන්කම තිබෙන්නේ; ඒක එච්චරටම competitive. ඉතින්, අපි මොකක්ද කරන්නේ හදන්නේ? වෛද්‍ය උපාධියට විතරක් නොවෙයි, උසස් අධ්‍යාපනයට තිබෙන අවස්ථා පුළුල් කරන්න තමයි අපි මේ හදන්නේ. එක විෂයය ධාරාවකට විතරක් නොවෙයි, කිසි කෙනෙකු අත හැරෙන්නේ නැති, කිසි කෙනෙකුට යන්න මාවතක් පෙනෙන්නේ නැති අධ්‍යාපනයක් වෙනුවට, හැම කෙනෙකුටම යන්න පුළුවන් මාර්ගයක් විවෘත කරන, ඒ අවස්ථා විවෘත කරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් තමයි අපි යෝජනා කරලා තිබෙන්නේ. ඒ නිසාම තමයි අපි අලුත් විෂයන්, අලුත් විෂය ධාරා වාගේම, විශේෂයෙන්ම වෘත්තීය අධ්‍යාපනය පාසල් අධ්‍යාපනයට එකතු කරන්නත් බලාපොරොත්තු වෙන්නේ.

අලුත් විෂය මාලාව හඳුන්වා දීමට අමතරව, අපි 2025 සිටම යටිතල පහසුකම් දියුණු කිරීම, පරිපාලනමය ප්‍රශ්නවලට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඇති කිරීම, ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කරන්න ගත යුතු ක්‍රියාවලි ගණනාවකුත් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒවා ඉදිරියටත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, ඇත්තටම ඒකේ ප්‍රතිඵලයක් ලෙස 2025 Budget එකෙන් අවුරුදු ගණනාවකට පස්සේ විභාග දෙපාර්තමේන්තුවට වෙන් කරපු මුදල් වැඩි කිරීමේ ප්‍රතිඵල ඔබතුමාට මේ අවුරුද්ද තුළ දකින්න පුළුවන් වුණා. විභාග දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි වෙලා තිබෙනවා. වෙනදාට වඩා ඉක්මනින් අපි විභාග ප්‍රතිඵල නිකුත් කරලා තිබෙනවා. ජාතික විභාග 71ක් මේ අවුරුද්ද තුළ තියලා අපි ඉතාම ඉක්මනින් ඒවායේ ප්‍රතිඵලත් නිකුත් කරලා, විභාග දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව ඉහළ නංවමින් වැඩ කරලා තිබෙනවා. ඒ වාගේම අලුත් ඇගයීම් ක්‍රමය හඳුන්වා දීමට ගුරුවරුන්ට අවශ්‍ය දැනුම ලබා දෙන්නත්, විභාග දෙපාර්තමේන්තුවට අවශ්‍ය පහසුකම් වැඩි කරන්නත් අපි සැලසුම් කර ගෙන යනවා.

ගරු සභාපතිතුමනි, ඩිජිටල් පහසුකම් පිළිබඳව ගත්තොත්, Digital Task Force එක තුළින් විශාල වැඩ කොටසක් කරමින් ඉන්නවා. ඒ Task Force එක යටතේ සියලු ද්විතීයික පාසල් පිළිබඳව අධ්‍යයනයක් කරලා, ඒ සියලු ද්විතීයික පාසල්වලට අවශ්‍ය connections මෙන්ම devices ලබා දෙමින් අවම වශයෙන් එක smart classroom එකක් හදන්න මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වැඩත් අපි ආරම්භ කරලා තිබෙන්නේ.

එක පැත්තකින් කථා කරනවා, 21වන ශත වර්ෂයේදී තාක්ෂණය යොදා ගන්න ඕනෑ කියලා. අනෙක් අතට කියනවා, modulesවල QR Code එකක් තිබෙනවා, ඒකත් එක්ක වැඩ කරන්නේ කොහොමද කියලා. ගරු සභාපතිතුමනි අපි විශ්වාස කරනවා, සියලු දරුවන්ට හොඳම දේ ලැබිය යුතුයි කියලා. ඒ නිසාම තමයි සියලු දරුවන්ට අලුත් තාක්ෂණය හඳුන්වා දෙන්න අපි වැඩ පිළිවෙළක් යොදලා තිබෙන්නේ. අපි ඒක පොතට සීමා කරලා නැහැ. ඒකට අවශ්‍ය යටිතල පහසුකම් ද ඒ හා සමානවම දියුණු කරමින් ඉන්නේ. මොකක් හරි පාසලකට අවශ්‍ය online පහසුකම් එක වෙලාවේම ගන්න බැරි වුණොත් ඒකටත් අපි විකල්ප ක්‍රමත් හඳුන්වා දීලා තිබෙනවා.

දැන් මේ reforms ගැනත් කථා කරනවා නේ ගරු සභාපතිතුමනි. මේක අපේ ආණ්ඩුවේ හෝ අගමැතිතුමියගේ හෝ අධ්‍යාපන අමාත්‍යතුමියගේ එකක් නොවෙයි. මේක රටක් තුළ සිද්ධ වෙන දෙයක්. මේකට නිලධාරින්, බුද්ධිමතුන්, විශේෂඥයන් විශාල පිරිසක් සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැන කියනකොට ආණ්ඩුවට පහර ගහන්න ඕනෑ පළියට නිකම් දමලා ගහන්න එපා කියලා මම ඉල්ලීමකුත් කරනවා. මොකද, මේ පිළිබඳව කාලයක් තිස්සේ සාකච්ඡා වෙමින්, සංවාදයක් පවත්වමින් තිබුණා. රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට අපට දැක්මක් තිබෙනවා. අපට ප්‍රතිපත්ති සහ මූලධර්ම තිබෙනවා.

[ගරු හරිනි අමරසූරිය]

සමානාත්මතාව, ගුණාත්මකභාවය සහිතව සියලු දරුවන්ට හොඳම දේ ලබා දීමට තිබෙන අවශ්‍යතාව මෙන්ම, පාසල් අතරේ, දරුවන් අතරේ තිබෙන විෂමතාවට ආමන්ත්‍රණය කිරීම කියන මේවා තමයි අපේ මූලධර්ම.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

*ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.*
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දිනට නියමිත කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී. - [ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது. - [மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee. - [THE HON. SPEAKER in the Chair.]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු සභාපතිතුමනි, අපි ඒ යටිතල පහසුකම් පිළිබඳවත් අවධානය යොමු කරමින් ඒවාට අවශ්‍ය සියලු වැඩ කටයුතු කරමින් ඉන්නේ.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීය ක්ෂේත්‍ර 5ක් තිබෙනවා. ඒ ක්ෂේත්‍ර පහේම වෘත්තීයභාවය ආරක්ෂා කිරීමටත්, ඒක දියුණු කිරීමටත් වැඩ පිළිවෙළක් අපි යොදාගෙන තිබෙනවා. ඔබතුමා දන්නවා, අවුරුදු ගණනාවකින් ඒවායේ පුරප්පාඩු පුරවලා නැහැ කියලා. නමුත් මේ අවුරුද්ද තුළත් -2025- ඒ ක්ෂේත්‍ර පහේම පුරප්පාඩු තිබෙනවා. ඒ සමහර විභාග 2017, 2018, 2019 තිබිලාත් බඳවා ගැනීම් සිද්ධ වෙලා තිබුණේ නැහැ. නමුත් අපි ඒවා සියල්ල විසඳා ගනිමින් අවුරුදු ගණනක් තිස්සේ තිබුණු පුරප්පාඩු පුරවන්න කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒවාට අදාළව අවුරුදු ගණනක් තිස්සේ අධිකරණයේ තිබුණු නඩු අපට 2025 තුළ ඉවර කරන්න පුළුවන් වුණා. අපි ඒකට අධිකරණ අමාත්‍යතුමාටත්, නීතිපති දෙපාර්තමේන්තුවටත් ස්තුතිවන්ත වෙනවා. ඒවා නිකම් බලාගෙන ඉඳලා සිද්ධ වෙච්ච දේවල් නොවෙයි. Motions දාලා, ඒ නඩු දින වෙනස් කරගෙන තමයි අපට මේ අවුරුද්ද තුළ ඒ නඩු ටික අවසන් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ නිසාම ලබන අවුරුද්දේ ජනවාරි, පෙබරවාරි මාස වෙනකොට අවුරුදු 5කට විතර පස්සේ උපාධිධාරීන්, ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන්න අපි කටයුතු ලෑස්ති කරමින් ඉන්නේ.

ගරු සභාපතිතුමනි, ජාතික විද්‍යාපීඨවල curriculum එක අවුරුදු ගණනාවකින්, අවුරුදු 16කින්, වෙනස් කරලා නැහැ. අපි අලුත් curriculum එකක් මාර්තු මාසයේ හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. අවුරුදු ගණනාවකින් ඒ විද්‍යාපීඨවල යටිතල පහසුකම්වලට ශතයක් වියදම් වෙලා නැහැ. ඒවාට ගිහිල්ලා බැලුවොත්, ඇත්තටම ඛේදනීය තත්ත්වයක් තිබෙන්නේ. ළමයින්ට උගන්වන්න ඉන්න ගුරුවරුන්ට තිබෙන පහසුකම් මොනවාද කියන එක ගැන අපි ඇත්තටම රටක් හැටියට ලජ්ජා වෙන්න ඕනෑ. ඒ නිසාම තමයි 2025 තුළ අපි බිලියන 22කට මුදල් වෙන් කරලා තිබෙන්නේ. අලුත් ව්‍යාපෘති 240ක් විද්‍යාපීඨ තුළත්, ගුරු පුහුණු මධ්‍යස්ථානවලත් අපි ආරම්භ කරලා තිබෙනවා. 2026දී ගුරු පුහුණුව සහ විද්‍යාපීඨවල යටිතල පහසුකම් සහ අනෙක් පහසුකම් දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 8,604ක් වෙන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි එක පැත්තකින් වැටුප් වර්ධනයක් සිද්ධ කරන අතර, ගරු ජනාධිපතිතුමා වැටුප් විෂමතා නිරාකරණය කිරීමට වැටුප් කොමිසමක් යෝජනා කරලා තිබෙන්නේ. ඒ හරහා කාලයක් තිස්සේ පැවත එන වැටුප් විෂමතාවලට අපි විසඳුම් හොයන අතර, මේ සේවාවල ගුණාත්මකභාවය වර්ධනය කිරීමටත් අපි මැදිහත් වෙනවා. අපි ඒ සඳහා අලුත් විෂයමාලා - curriculums - සකස් කරන එකත්, ලබන අවුරුද්ද තුළ අධ්‍යාපන කවුන්සලය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියත් ආරම්භ කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මෙතැනදී කථා වුණා, අපේ dropout rate එක ගැන. මම ඒක ගැනත් පොඩ්ඩක් කියන්න ඕනෑ. මොකද, නැත්නම් ඒක ගැන වැරදි අදහසක් යන්න පුළුවන්. ඇත්තවශයෙන්ම අපේ රටේ dropout ratesවල ඒ කියන විධියේ ලොකු ප්‍රශ්නයක් නැහැ. එක දරුවෙක් හරි අධ්‍යාපනයෙන් අයින් වෙනවා නම් ඒක අපට ප්‍රශ්නයක් තමයි. නමුත් අපේ transition rate එක ඇත්තටම නරකම නැහැ. ගෝලීය මට්ටමින් ගත්තාම, අපි හොඳ තැනක ඉන්නේ. ප්‍රාථමික ඉඳන් ද්විතියික තත්ත්වයට යන ප්‍රමාණය සියයට 98.66යි.

Lower secondary එකේ ඉඳන් secondary යන ප්‍රමාණය සියයට 97.55යි. 10 වසරේ සිට 11 වසරට යන ප්‍රමාණය සියයට 96.58යි. මේක ඉතාම හොඳයි. නමුත්, අපට මේක තවත් දියුණු කරන්න පුළුවන්. යම් යම් තැන්වල ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. ග්‍රාමීය පාසල්වල ප්‍රශ්නයක් තිබෙනවා; ටිකක් වැඩියි. පිරිමි දරුවන් අතර මේක ටිකක් වැඩියි. සියයට 1ක් වාගේ තිබෙනවා. ගෝලීය මට්ටමෙන් බලනකොට ලොකු දෙයක් නොතිබුණාට, අපට ලොකුයි. ඒ නිසා අපි ඒවාත් අඩු කරන්න මැදිහත් වෙමින් ඉන්නවා.

අද කථා වුණා, A/L විභාගයේ ආර්ථික විද්‍යාව question paper එක පිළිබඳව. මේ වෙනකොටත් විභාගය පවත්වා ගෙන යන නිසා මේ පිළිබඳව වගකීම් සහගතව ප්‍රකාශ නිකුත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. අපට මේ පිළිබඳව දැනුවත් වීම සිද්ධ වෙච්ච වහාම අපි පර්යේෂණයක් පටන් ගෙන තිබෙනවා. අපි ඒක CID එකට භාර දී තිබෙනවා. මේ වෙනකොට chief examinersලා ඒ ගැන සොයමින් ඉන්නවා; ගන්න ඕනෑ actions අපි ගනිමින් ඉන්නවා. නමුත්, මේ වෙලාවේ විභාගයට පෙනී සිටින දරුවන්ට අගතියක් සිදු වෙන්න හොඳ නැහැ. ඔවුන් මානසිකව අවුල් කරන්න හොඳ නැහැ. ඒ නිසා මම සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව කථා කරනකොට තොරතුරු,

කරුණු ඇතුව කථා කරන්න; gossips මත කථා කිරීමෙන් වැළකී සිටින්න කියලා. මොකද, දරුවන් තවම විභාගය ලියනවා. අපි පර්යේෂණ කරමින් ඉන්නවා. පර්යේෂණ කරන්න CID එකට භාර දී තිබෙනවා. මොකක් හරි වැරැද්දක් තිබෙනවා නම් අපි ඒකට මැදිහත් වෙනවා කියන එකත් මම මේ වෙලාවේ කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, මෙතැන මතු වෙච්ච තවත් වැදගත් කාරණයක් තමයි පෞද්ගලික ක්ෂේත්‍රයේ නියාමනය කියන එක. ඔව්, ඒක විය යුතු දෙයක්. දැනට non-State sector එකේත්, උසස් අධ්‍යාපනයේත්, පාසල් මට්ටමේත් regulation එකක් හරියාකාරව සිද්ධ වෙන්නේ නැහැ. මේකත් අවුරුදු ගණනක් තිස්සේ පැවතිච්ච ප්‍රශ්නයක්. ඒ නිසා මේ පිළිබඳව අධ්‍යයනයක් කරලා, සියලුම පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලා, අපට නිර්දේශ ලබා දෙන්න කියලා අපි ජාතික අධ්‍යාපන කොමිසමට භාර දී තිබෙනවා. ඔවුන් ඒ කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. අපි ඒකත් කරමින් යන්නේ. ඒ අනුව අපි උසස් අධ්‍යාපනය පිළිබඳව රාජ්‍ය නොවන ආයතන නියාමනය කරන යන්ත්‍රණය ශක්තිමත් කරලා තිබෙනවා. එම ඒකකය අපි ශක්තිමත් කරලා තිබෙනවා. එතැනත් ගුණාත්මකභාවය තහවුරු වෙන විධියට වැඩ කරන්න අපි පියවර ගණනාවක් අරගෙන තිබෙනවා. ජාතික අධ්‍යාපන කොමිසමෙන් එම නිර්දේශ ලැබුණු වහාම ඒවාත් සාකච්ඡාවට බඳුන් කරලා ක්‍රියාත්මක කරන්න අපි කිසිසේත්ම පැකිළෙන්නේ නැහැ කියන එකත් මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කරන දේවල් කොච්චර වැදගත්ද කියන එක අපි සියලු දෙනාම දන්නවා. ඒක, පාරක් හදනවා වාගේ කටයුත්තක් නොවෙයි. පාර හදන එකත් ඉතාම වැදගත්. ඒකේ ප්‍රතිඵල අපට අවුරුද්දකින් දෙකකින් බලන්න පුළුවන්. නමුත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරන දේවල්වල ප්‍රතිඵල අපට අවුරුදු 10කින්, 15කින්, 20කින් එහාට තමයි දකින්න ලැබෙන්නේ. ඒ නිසාම තමයි අපි මේ වගකීම ඉතාම බැරෑරුම් ලෙස භාර ගෙන තිබෙන්නේ. මම මේක ඉතාම සතුටින් කියන්නේ. මේ වගකීම අපි කණ්ඩායමක් ලෙස, සාමූහික වගකීමක් ලෙස භාර අරගෙන තිබෙනවා.

මම මේ වෙලාවේ මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් සියලුදෙනාම රෑ දවල් බලන්නේ නැතිව, සතියේ සෙනසුරාදා, ඉරිදාද කියලා බලන්නේ නැතිව, මේකේ වැදගත්කම තේරුම් අරගෙන විශාල සහයෝගයක්, කැපවීමක් දක්වනවා. සාමූහිකව එකතුවෙලා මේ සම්බන්ධයෙන් වගකීම් ගන්නවා. මේක devolved subject එකක් වුණත්, පළාත් මට්ටමෙන් ඒකට අදාළ නිලධාරින්ගේ, ආණ්ඩුකාරවරුන්ගේ විශාල සහභාගිත්වයක්, සහයෝගයක් අපට දක්වා තිබෙනවා. මෙය, ජාතික අධ්‍යාපන කොමිසම, UGC එක, ජාතික අධ්‍යාපන ආයතනය, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යන සියලු දෙපාර්තමේන්තු, ආයතන එක කණ්ඩායමක් ලෙස වැඩ කරමින් මෙහි බැරෑරුම්කම, වැදගත්කම, වගකීම දැනී ඉස්සරහට යන ගමනක්.

හදාගන්න ගොඩක් දේවල් තිබෙනවා. වැරදුණු තැන් තිබෙනවා, අපි ඒවා නිවැරදි කරගෙන යනවා. එම යෝජනා, එම සංවාද අපි ඉතාම කැමැත්තෙන් භාර ගන්නවා. අධ්‍යාපනය වැනි විෂයයක් වෙනස් කරන්න යනකොට, පරිවර්තනයකට ලක් කරනකොට සංවාදය අවශ්‍යයි. ඒ සංවාදය අපි ගොඩක් අගය කරනවා. ඒ සංවාදය හරහා අපි තව පෝෂණය වෙනවා. හැබැයි, මේක අපේ සාමූහික වැඩක්. ඒ නිසා, ඒ සියලු දෙනාටම රජය හැටියට අපේ ස්තුතිය පිරිනමන්න මම මේක අවස්ථාවක් කරගන්නවා.

අපේ නියෝජ්‍ය අමාත්‍යවරුන් දෙදෙනාත් ඔවුන්ට භාරව තිබෙන විෂයයන් පිළිබඳව විශාල කැපවීමක් දක්වනවා. ඒ වාගේම අපි තිදෙනාගේම පෞද්ගලික කාර්ය මණ්ඩලය අපිත් එක්ක ඉතාම කිට්ටුවෙන්, සහයෝගයෙන් සහ කැපවීමෙන් වැඩ කරනවා. මම ඒ සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් අපේ ජනාධිපතිතුමාගේ නායකත්වය, එතුමාට මේ ගැන තිබෙන උනන්දුව අපි අගය කරනවා. එතුමා මුදල් අමාත්‍යවරයා විධියට විතරක් නොවෙයි, ජනාධිපතිවරයා විධියටත් අධ්‍යාපනයේ වැදගත්කම තේරුම් ගත් නිසා තමයි අපට මේක බයක් නැතිව, confidently ඉදිරියට ගෙනයන්න පුළුවන් වෙලා තිබෙන්නේ, ගරු සභාපතිතුමනි. එතුමාටත් මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අපේ සහෝදර අමාත්‍යවරු කැබිනට් එකේදී වාගේම සෑම අවස්ථාවකදීම මේ විෂයයට දක්වන සහයෝගය ගැනත්, අපේ මන්ත්‍රී කණ්ඩායම මේ වෙනුවෙන් පෙනී සිටීම ගැනත් මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා අදත් දකින්න ඇති, කණ්ඩායමක් හැටියට කොහොමද මේ විවාදයට අපි සූදානම් වුණේ කියලා. විෂයයන් බෙදාගෙන, තොරතුරු සොයාගෙන, ඒ ඉදිරිපත් වීම තුළින් අපේ සාමූහිකත්වය පෙන්නුම් කරනවා. අපි රට භාර ගන්නකොට අධ්‍යාපනය තිබුණු තැන ඉඳලා, අපි මේ රට ඊළඟ පරපුරට භාර දෙනකොට අධ්‍යාපනය තිබෙන තැන ගැන අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. අපි මේක වෙනස් කරනවා, ගරු සභාපතිතුමනි. ඒක ගැන කිසිම සැකයක් තියාගන්න ඕනෑ නැහැ. ඊළඟට මේක භාර ගන්න කට්ටියට අපට තිබුණු ලෙඩේ වෙන්නේ නැහැ. ඉතාම හොඳ තැනකින් මේක තවත් ඉදිරියට ගෙනයන්න පුළුවන් වෙයි කියන එක ගැන අපි හොඳ විශ්වාසයෙන් තමයි වැඩ කරන්නේ. ඒ සඳහා සහයෝගය දුන් සියලු දෙනාට නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින්, කාලය ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

| | |
|---|---|
| Recurrent | Rs. 231,000,000,000 |
| Capital | Rs. 70,000,000,000 |

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, on behalf of the Minister of Finance, I move the following Amendment at the Committee Stage of the Appropriation Bill, 2026.

"In page 25, leave out all words in line 8 and insert:
'Recurrent Rs. 233,850,000,000' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Does the Committee agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 233,850,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 233,850,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 233,850,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

"126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 41,948,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 6,739,000,000

"126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 6,739,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය

126 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 41,948,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 6,739,000,000

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 6,739,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 41,948,000,000, for Head 126, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 6,739,000,000

Question, "That the sum of Rs. 6,739,000,000, for Head 126, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 90,461,000,000; මූලධන වියදම, රු. 51,352,000,000**

**நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 90,461,000,000; மூலதனச் செலவு, ரூபாய் 51,352,000,000**

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 90,461,000,000; Capital Expenditure, Rs. 51,352,000,000

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I move the Amendment to Programme 02 of Head 126 at the Committee Stage of Appropriation Bill, 2026.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Does the Committee agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"In page 25, leave out all words in line 13 and insert:
'Programme 02
Development Activities Rs.91,311,000,000 Rs. 51,352,000,000' "

[The Hon. (Dr.) Harini Amarasuriya]

(The effect of this Amendment is to increase the Recurrent provision by Rs. 850,000,000 of the Expenditure Head 126 - Minister of Education, Higher Education and Vocational Education - to implement Budget Proposal Nos. 28 and 53.)

"126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 91,311,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 51,352,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

126 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 91,311,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 51,352,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 126, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 91,311,000,000, for Head 126, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the sum of Rs. 51,352,000,000, for Head 126, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 126, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**212 වන ශීර්ෂය.- විභාග දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 11,815,000,000

"212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 11,815,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 862,000,000

"212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 862,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

212 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**213 වන ශීර්ෂය.- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 137,000,000

"213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 137,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 34,000,000

"213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 34,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

213 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 212.- பரீட்சைகள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 11,815,000,000

“தலைப்பு 212, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 11,815,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 212, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 862,000,000

“தலைப்பு 212, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 862,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 212, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 213.- கல்வி வெளியீட்டுத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 137,000,000

“தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 137,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 34,000,000

“தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 34,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 213, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 212.- DEPARTMENT OF EXAMINATIONS

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 11,815,000,000

Question, "That the sum of Rs. 11,815,000,000, for Head 212, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 212, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 862,000,000

Question, "That the sum of Rs. 862,000,000, for Head 212, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 212, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 213.- DEPARTMENT OF EDUCATIONAL PUBLICATIONS

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 137,000,000

Question, "That the sum of Rs. 137,000,000, for Head 213, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 213, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 34,000,000

Question, "That the sum of Rs. 34,000,000, for Head 213, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 213, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**214 වන ශීර්ෂය.- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 83,000,000,000; මූලධන වියදම, රු. 10,500,000,000**

**தலைப்பு 214.- பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு**

**நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 83,000,000,000; மூலதனச் செலவு, ரூபாய் 10,500,000,000**

HEAD 214.- UNIVERSITY GRANTS COMMISSION
Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 83,000,000,000; Capital Expenditure, Rs. 10,500,000,000

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I move the Amendment to Programme 02 of Head 214 at the Committee Stage of Appropriation Bill, 2026.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Does the Committee agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"In page 25, leave out all words in line 19 and insert:

'Programme 02
Development Activities Rs. 85,000,000,000 Rs. 10,500,000,000' "

[The Hon. (Dr.) Harini Amarasuriya]

(The effect of this Amendment is to increase the Recurrent provision by Rs. 2,000,000,000 of Expenditure Head 214 - University Grants Commission - to implement Budget Proposal Nos. 28 and 29.)

"214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 85,000,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 10,500,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

214 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 85,000,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 10,500,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 214, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 85,000,000,000, for Head 214, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 214, Programme 02, Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the sum of Rs. 10,500,000,000, for Head 214, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 214, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**215 වන ශීර්ෂය.- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 485,700,000

"215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 485,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 109,800,000

"215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 109,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,076,300,000

"215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,076,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන. -සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 391,200,000

"215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 391,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

215 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**335 වන ශීර්ෂය.- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 77,000,000

"335 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 77,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

335 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 12,000,000

"335 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 12,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

335 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 215.- தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 485,700,000

“தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 485,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 109,800,000

“தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 109,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,076,300,000

“தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 3,076,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 391,200,000

“தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபாய் 391,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 215, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 335.- தேசிய கல்வி ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 77,000,000

“தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 77,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 12,000,000

“தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 12,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 335, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 215.- DEPARTMENT OF TECHNICAL EDUCATION AND TRAINING

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 485,700,000

Question, "That the sum of Rs. 485,700,000, for Head 215, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 109,800,000

Question, "That the sum of Rs. 109,800,000, for Head 215, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 3,076,300,000

Question, "That the sum of Rs. 3,076,300,000, for Head 215, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 391,200,000

Question, "That the sum of Rs. 391,200,000, for Head 215, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 215, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 335.- NATIONAL EDUCATION COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 77,000,000

Question, "That the sum of Rs. 77,000,000, for Head 335, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 335, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 12,000,000

Question, "That the sum of Rs. 12,000,000, for Head 335, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 335, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු සභාපතිතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 6.40ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***
***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 26වන බදාදා.***

*பி.ப. 6.40 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 நவம்பர் 26, புதன்கிழமை.*

*At 6.40 p.m., the Chairman left the Chair to report Progress.*
*Committee report Progress; to sit again on Wednesay, 26th November, 2025.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to inform this House that Heads 126 and 214 have been passed with Amendments and Heads 212-215 and 335 have been passed without Amendments in the Committee.

## රුහුණ විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2022)
## ருகுணு பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கை (2022)
## UNIVERSITY OF RUHUNA: ANNUAL REPORT (2022)

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, I move,

"That the Annual Report of the University of Ruhuna 2022 together with the observations of the Auditor-General for the year ended 31.12.2022 and presented on 17.12.2024 under Section 110 of the Universities Act, No. 16 of 1978, be approved.

(Considered by the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education on 07.03.2025 and presented its report to Parliament on 17.03.2025)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා නැඟෙනහිර විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2022)
## இலங்கை கிழக்குப் பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கை (2022)
## EASTERN UNIVERSITY OF SRI LANKA: ANNUAL REPORT (2022)

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, I move,

"That the Annual Report of the Eastern University of Sri Lanka 2022 together with the observations of the Auditor-General for the year ended 31.12.2022 and presented on 07.01.2025 under Section 12 of the National Audit Act, No. 19 of 2018, be approved.

(Considered by the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education on 07.03.2025 and presented its report to Parliament on 17.03.2025)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2022)
## இலங்கை ரஜரட்ட பல்கலைக்கழகம்: வருடாந்த அறிக்கை (2022)
## RAJARATA UNIVERSITY OF SRI LANKA: ANNUAL REPORT (2022)

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, I move,

"That the Annual Report of the Rajarata University of Sri Lanka 2022 together with the observations of the Auditor-General for the year ended 31.12.2022 and presented on 18.02.2025 under Section 110 of the Universities Act, No. 16 of 1978, be approved.

(Considered by the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education on 06.08.2025 and presented its report to Parliament on 09.09.2025)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය: වාර්ෂික වාර්තාව (2023)

## பேராதனைப் பல்கலைக்கழகத்தின் விவசாயப் பட்டப்பின் படிப்பு நிறுவகம்: ஆண்டறிக்கை (2023)

## POSTGRADUATE INSTITUTE OF AGRICULTURE OF THE UNIVERSITY OF PERADENIYA: ANNUAL REPORT (2023)

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, I move,

"That the Annual Report of the Postgraduate Institute of Agriculture of the University of Peradeniya 2023 together with the observations of the Auditor-General for the year ended 31.12.2023 and presented on 07.01.2025 under Section 110 of the Universities Act, No. 16 of 1978, be approved.

(Considered by the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education on 07.03.2025 and presented its report to Parliament on 17.03.2025)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය: වාර්ෂික වාර්තාව (2023)

## பேராதனைப் பல்கலைக்கழகம்: ஆண்டறிக்கை (2023)

## UNIVERSITY OF PERADENIYA: ANNUAL REPORT (2023)

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, I move,

"That the Annual Report of the University of Peradeniya 2023 together with the observations of the Auditor-General for the year ended 31.12.2023 and presented on 22.02.2025 under Section 110 of the Universities Act, No. 16 of 1978 and Section II of the Finance Act, No. 38 of 1971, be approved.

(Considered by the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education on 06.08.2025 and presented its report to Parliament on 09.09.2025)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

*එකල්හි වේලාව අ.භා. **6.30** පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. **6.43**ට, **2025** නොවැම්බර් **13**වන දින සභා සම්මතිය අනුව, **2025** නොවැම්බර් **26**වන බදාදා පූ.භා. **9.00** වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.43க்கு, பாராளுமன்றம் அதனது 2025 நவம்பர் 13ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 26, புதன்கிழமை மு.ப. 9.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.43 p.m. until 9.00 a.m. on Wednesday, 26th November, 2025, pursuant to the Resolution of Parliament of 13th November, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.